# මහා-සී

## විපස්සනා භාවනා ක්‍රමය

## විපසසනා නයපපකරණය



බුරුමයේ අති පූජ්‍ය මහා-සී සයාඩෝ ස්වාමීන් වහන්සේ



අති පූජ්‍ය මහා සී සයාඩෝ
ස්වාමීන්වහන්සේ,

බුරුම රට (මියන්මාරයෙහි) අද ප්‍රචලිතව ඇති, එසේම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල සිටිවණක් පිරිස බහුලව අනුගමනය කරනු ලබන "විපස්සනා භාවනා ක්‍රමය" හඳුන්වා දුන් ගුරුවරයාණෝ මහා-සී සයාඩෝ හිමිපාණෝය. උන්වහන්සේ බුරුම රට අරණ්‍ය වාසී අභිඥාලාභී රහතන් වහන්සේලාගේ පරපුරෙහි විසූ ශ්‍රේෂ්ඨතම කර්මස්ථානාචාර්න් වහන්සේය.

බුරුම රට පැවති හයවැනි ධර්ම සංඝායනාවෙහි පඤ්හා පුච්ඡක (ප්‍රශ්න ඇසීමේ) තනතුර හෙබවූ උන්වහන්සේ සම්භාවනීය ග්‍රන්ථ කීපයක කතුවරයාණෝ ද වනසේක. මහා සී සයඩෝ හිමිපාණන්ගේ සම්භාවනීය ග්‍රන්ථ අතර පාලිභාෂාවෙන් "විපසසනා නයපපකරණය", විදර්ශනා භාවනා ක්‍රමය මැනවින් විස්තර කර ඇති ග්‍රන්ථයකි.

ශ්‍රී ඥානාරාම ස්වාමීන්ද්‍ර අනුස්මරණ ග්‍රන්ථ මාලා -අංක 14

# මහා-සී විපස්සනා භාවනා ක්‍රමය

බුරුම ජාතික


අතිපූජ්‍ය මහා-සී සයාඩෝ

ස්වාමීන් වහන්සේ විසින්


බුරුම බසින් රචනා කරන ලද

## විපස්සනා නයප්පකරණය

නම් භාවනා ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

## දෙවන භාගය

දෙවන කොටස (පරිච්ඡේද අංක 6 සහ 7)


පරිවර්තනය

පූජ්‍ය උඩර්රියගම ධමමජීව ස්වාමීන් වහන්සේ



ප්‍රකාශනය

මීතිරිගල නිස්සරණ වනය සංරක්ෂණ මණ්ඩලය

*සබ්බ දානං ධම්ම දානං ජිනාති.*

Lithira

මහා-සී විපස්සනා භාවනා ක්‍රමය
විපස්සනා නයප්පකරණය
නම් භාවනා ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

ප්‍රථම මුද්‍රණය
ශ්‍රී. බු. ව. 2552 ව්‍ය. ව. 2008

ප්‍රකාශනය
මීතිරිගල නිස්සරණ වනය
සංරක්ෂණ මණ්ඩලය

මුද්‍රණය

ලිතිර ප්‍රින්ටින් ඉන්ඩස්ට්‍රීස්
Lithira PRINTING INDUSTRIES
#306, ඇඹුල්දෙණිය, නුගේගොඩ.
lithira2008@yahoo.com
0716829491

*ධර්ම දානය වශයෙන් නොමිළයේ බෙදා හැරීම පිණිසයි.*

අපවත් වී වදාළ,
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්‍ය,
මීතිරිගල නිස්සරණ වන ආරණ්‍යයේ ප්‍රථම සේනාසනාධිපති,
කර්මස්ථානාචාර්‍ය, මහෝපාධ්‍යාය, අතිපූජ්‍ය

මාතර ශ්‍රී ඥානාරාමාභිධාන මාහිමිපාණන් වහන්සේට

සහ

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ
ගරු සමුත්පාදක හා ප්‍රධාන අනුශාසක,
ගල්දූවේ ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානාධිපති,
රාජකීය පණ්ඩිත, අතිපූජ්‍ය

කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මාහිමිපාණන් වහන්සේට

ප්‍රාප්තිදාන පිණිස

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක,
ත්‍රිපිටකාචාර්‍ය, මහා කම්මට්ඨානාචාර්‍ය

අතිපූජ්‍ය නා උයනේ අරිය ධම්ම ස්වාමීන් වහන්සේට

"මහා-සී විපස්සනා භාවනා ක්‍රමය"

(විපස්සනා නයප්පකරණය)

නම් වූ මෙම ග්‍රන්ථය
සාතිශය ගෞරවයෙන් පිළිගැන්වෙයි.

# පෙරවදන

මහා-සී විපස්සනා භාවනා ක්‍රමය හෙවත් විපසසනා නයප්පකරණය නමින් එළි දක්වන්නට යෙදුනු මෙම සිංහල පරිවර්තනයට මුල් වූ බුරුම ජාතික අති පූජනීය මහා-සී සයාඩෝ ස්වාමීන් වහන්සේගේ කෘත්‍යය වනාහි එම ස්වාමීන් වහන්සේ අතින් රචිත සියලුම කෘතීන් අතර ඉතාමත් වැදගත් වූත් ඉතිහාස ගත වූත් කෘත්‍යයයි.

මෙම ග්‍රන්ථය මගින් සමස්ථ ලෝකයටම ඉදිරිපත් කරන ලද පණිවිඩය ක්‍රමයෙන් නමුත් ප්‍රායෝගිකවම නොසැලී ඉදිරියටම යෑම නිසා මේ වන විට ශුද්ධ විපස්සනාවට ස්වෛරිව ස්වාධීනව තනිව සිටගෙන සිටීමට හැකියාවක් ඇති බව ලොවට කියා දි හමාරය. එය මෙමගින් ලැබුනු එක් ආනිශංසයකි. එසේම මෙය ඉදිරිපත් කොට ඇති අභියෝගශීලී ප්‍රබුද්ධ න්‍යාය ක්‍රමය අනුව විශාල ගිහි-පැවිදි පිරිසක් මේ ක්‍රමය අත්හදා බැලීමට පෙළඹී බොහෝ කල් ගත වී ඇත. මෙතෙක් පැවති සීමා, වැට-කඩුලු බිඳ ලමින් විවිධ රටවල ගිහි පිරිස් මෙම විපස්සනා භාවනාව කරනවාක් මෙන්ම උපදෙස් ලබාදිය හැකි ගිහි ආචාර්යයවරු පිරිසක් ද මේ වන විට මෙමගින් ලොවට දායාද කොට ඇත. මේ කාරණා දෙක නිසා බටහිර ලෝකයට පර්යාප්ත බුද්ධ ධර්මය මෙන්ම ප්‍රතිපත්ති ශාසනය මේ වන විටත් සජීවිව සංක්‍රමණය වි හමාරය.

කාලයට ගැලපෙන තාලයට මෙන්ම වට පිටාවට යා දෙන ලෙසට හැඩ ගැසීමේ ඉඩකඩ ඇතිව සරල මෙන්ම ඍජු ප්‍රතිඵලදායි ක්‍රමවේදයක් ගෙනහැර දක්වන මෙහි අන්තර්ගතයට දොස් කියන සම්ප්‍රදායන් ද නැත්තේ නොවේ. කෙසේ නමුත් යුගයේ ඉල්ලුමට සරිලන ලෙසට ථේරවාදයේ සීමා ඇතුළත

පිහිටා මෙමගින් සම්පූර්ණ විසඳුම් ඉදිරිපත් කරන ආකාරය නම් අපූරුය. ඒ සඳහා කෙරෙන මූලධම්මය මෙන්ම ප්‍රායෝගික හැදෑරීම් විෂයයෙහි මෙම ග්‍රන්ථය මගින් කෙරෙන සේවාව අසීමිතය.

ක්‍රමයෙන් ගැඹුරු බවක් හඟවමින් මෙම පොතේ අවසාන කොටස රචනා වී ඇත්තේ ගැඹුරු විපස්සනාමය අත්දැකීම් වලින් සරු යෝගාවචරයනට මෙන්ම ඒ පිළිබඳව කමටහන් දීමෙහි නියැලී සිටින උපදේශකයනට වඩාත් ගෝචර වන ආකාරයටය.

මෙතෙක් මෙම සත් කාර්යය සඳහා වසර ගනණාවක් ගතවී ඇති අතර ඒවාට නන් අයුරු උපකාර කළ සියලුම දෙනා ඒ ඒ අනුව මේ වන විටත් ධම්මය ඕජාව රස විඳ ඇත. චාරිත්‍රයක් වශයෙන් ඒ සියලුම දෙනා මෙහිලා ශාසනික ගෞරවයෙන් යුක්තව යළි සිහිපත් කරමු.

විශේෂයෙන් මෙම හතරවන කොටස එළි දැක්වීමෙහිලා මුලින්ම බුරුම බසින් සිංහලට නැඟීමේදී දිනපතා මීතිරිගල නිස්සරණ වනයට වැඩම කරමින් බුරුම පොත කියවා තේරුම් කරදුන් බුරුම ජාතික උ. අග්ගඤ්ඤ ස්වාමීන් වහන්සේ කළ උපකාර නැවත නැවතත් සිහිපත් කළ යුතුව ඇත. ඒ වන විට එළි දක්වා තිබුනු මුල් බුරුම පොතේ පාලි පරිවර්තනය (පූජනීය අග්ග මහා පණ්ඩිත භදන්තා කුමාරාභිවංස ස්වාමීන් වහන්සේගේ බුරුම අකුරු පොත) අර්ථ මතුකර ගැනීමේදී මහෝපකාරී විය. එසේම මුල්ම සිංහල අත්අකුරු පිටපත නැවත පිරිසිදු ලෙස ලියා දුන් පූජ්‍ය විලානගම පියරතන ස්වාමීන් වහන්සේටත් සෝදුපත් කියවීමේදී වෙහෙස නොබලා කටයුතු කළ පූජ්‍ය පාතේගම ධම්මසුමන ස්වාමීන් වහන්සේටත් කාගේත් ස්තුතිය හිමිවිය යුතුය.

මෙම හතරවන කොටස සඳහා බරපැන ඉසිළුනු ලබන්නේ සජිත් පීරිස් මහත්මායි. එතුමාගේ සියළු ප්‍රර්ථනා සමෘධි වෙවායි! මෛත්‍රී පූර්වකව ප්‍රර්ථනය කරමි.

පසුගිය මාස කිහිපය තුළ දැඩි සත්කාර යටතේ අසනීපයෙන් ගත කළ අප මීතිරිගල නිස්සරණ වන සංරක්ෂණ මණ්ඩලයේ හිටපු සභාපති මෙන්ම 'ලිහිර' හි අධිපති කමල් ඇඹුල්දෙණිය මහත්මා අතින් සිදුවිය යුතුව තිබූ මෙහි අවසාන පියවර කිහිපය උනන්දුවෙන් සොයා බලා, පමා වීමකට ඉඩ නොතබා කටයුතු කළ චම්පා ඇඹුල් දෙණිය මහත්මියත්, මාලිනී පෙරේරා මහත්මියත්, 'ලිහිර' සියලු කාර්යය මණ්ඩලයත් ශෝභන ලෙස පොත මුද්‍රණය කිරීමෙහි ලා දැරූ වෙහෙස මෙහිලා සිහිපත් කරන්නේ කෘතඥතා පූර්වකවය. කමල් ඇඹුල්දෙණිය මහත්මාට ද මෙ පින් බෙලෙන් ඉක්මන් සුවය ලැබේවායි මෛත්‍රියෙන් යුක්තව ආශීර්වාද කරමු.

මීට කලින් එළි දැක්වූ කොටස් වල මෙන්ම මෙහිදී ද යම් මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ අඩුපාඩු හෝ උද්‍ධෘත සම්බන්ධ ගැටළු ඇතොත් සමාව භජනය කරන මෙන් ඉල්ලා සිටින්නේ පුද්ගලිකව ම ය. එසේම වරදක් ඇතොත් දන්වා එවීමෙන් අපට අනුග්‍රහ කරන මෙන්ද මෙයින් කරුණාවෙන් යුක්තව සිහිපත් කරමු.

මෙසේ මේ නිමාව දකින්නේ විශාල සත්පුරුෂ මණ්ඩල වල සහයෝගයෙන් එළි දැක්වූ භාවනාව සම්බන්ධ ඉතිහාසගත වටිනා කමකින් යුක්ත පොත් පෙළක සිංහල අනුවාදයයි. මෙම සත් ක්‍රියාවේ ආනිශංස හේතුවෙන් ලක්දිව බුදු සසුන බැබලේවායි එක්ව පතමු.

මෛත්‍රීයෙනි,

**උ. ධම්මජීව හිමි**
නිස්සරණ වනය,
මීතිරිගල.
11742

# අප ද භාග්‍යවන්තයන් විමු.

මෙවැනි උතුම් ධර්ම ග්‍රන්ථයක් මුද්‍රණය කර ධර්ම දානයක් ලෙසින් පිළිගැන්වීමට ලැබීම.

බුරුමයේ වැඩ සිටි මහා-සී සයාඩෝ මා හිමිපාණන් විසින් ලොවට දායාද කළ අති උතුම් මහා-සී භාවනා ක්‍රමය ප්‍රගුණ කර නිවන් අවබෝධ කර ගත් පිරිස අති මහත්ය.

අප රටේ ද මෙම භාවනා ක්‍රමයෙන් වැඩගත් පිරිස බොහෝය. නමුත් මෙම මහා-සී භාවනා ක්‍රමය ගැන ලියවුන පත පොත බොහෝ විරලය මෙවැනි සංෂිප්ත ග්‍රන්ථයන් ඉතා විරලය.

ඉතා වෙහෙස වී තම කාලය මේ වෙනුවෙන් කැප කොට බුරුම රටේදි මෙම භාවනා ක්‍රමය ප්‍රගුණ කර බුරුම බසින් පළ වූ මුල් පොත් සිංහලයට පරිවර්තනය කරන්නට යෙදුනු මීතිරිගල වැඩ වාසය කරන පූජ්‍ය උඩඊරියගම ධම්මජීව හිමිපාණන්ට මෙහි පූර්ණ ගෞරවය ප්‍රණාමය හිමි විය යුතුය. උන් වහන්සේ සිදු කරන ලද්දේ සම්මානනීය කර්තව්‍යයකි. මෙම කුසලානිශංස බෙලෙන් නිදුක් නීරෝගි චිර ජීවනයත් ලැබ නිර්වාණය සාක්ශාත් කර ගැනීමට හැකි වේවායි ඉත සිතින් පතමු.

මෙම මහත් සත්කාරයට උඩඊරියගම ධම්මජීව හිමිපාණන්ට උපකාර කළා වූ බුරුම ජාතික අගගඤඤ හිමිපාණන් ඇතුළු නිස්සරණ වනයේ වැඩ වාසය කරන සියළු සබ්‍රහ්මචාරින් වහන්සේලාටත් උතුම් චතුරාර්‍ය සත්‍ය අවබෝධ වේවා.

මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් ලැබෙන්නා වූ යම්තාක් කුසලයක් ඇත්නම් එය අප නමින් මිය පරලොව ගිය ඥාතී බන්දු වර්ගයාට නිවන් අවබෝධ වීම පිණිස හේතු වේවා. අපගේ දෙමාපියන් දෙපලත් මාගේ ආදරණීය බිරිද අමරාංගි ඇතුළු දරුවන්ටත් නිදුක් නීරෝගි සැප ලැබ සුවසේ පාරමිතා සම්පූර්ණ කර නිවන අරමුණ කර ගැනීමට මෙම ධර්ම දානමය කුසලය හේතු වේවා.

මෙම ග්‍රන්ථය මුද්‍රණය කර දුන් ලිතිර හි කමල් ඇඹුල්දේණිය මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට නිවන අරමුණු වේවා. සියළු සත්ත්වයෝ නිදුක් වෙත්වා. නිවනින් සැනසීමට ලැබේවා.

44, ස්ට්‍රේඩියම් සර්කිට්,
මල්ග්‍රේව්, වික්ටෝරියා,
3170 ඕස්ට්‍රේලියා.
දුර. 61395608241.

මෙයට. ශාසන ලැති
**සජිත් පීරිස්**

ဗုဒ္ဓသာသနာနုဂ္ဂဟအဖွဲ့ချုပ်
မဟာစည်သာသနာ့ရိပ်သာ
အမှတ်-၁၆၊သာသနာ့ရိပ်သာလမ်း၊ဗဟန်းမြို့နယ်၊ရန်ကုန်မြို့။

ဖုန်း - ၅၄၅၉၁၈
၅၄၁၉၇၁
ဖက်စ် - ၂၈၉၉၆၀
၂၈၉၉၆၁
သံကြိုးလိပ်မူ-မဟာစည်

**Buddha Sāsana Nuggaha Organization**
**MAHASI SĀSANA YEIKTHA**
16, Sāsana Yeiktha Road, Yangon.(MYANMAR)

Phone: 545918
541971
Fax-No. 289960
289961
Cable: MAHĀSI

Email - Mahasi-ygn@mptmail.net.mm


Date ၁၅ August, 2002

# To Whom it may concern

Mahāsi Meditation Centre Yangon, Myanmar, has no objection to the publication of the late Venerable Mahāsi Sayādaw's book intitled Vipassanā Shuni Kyan ( The Method of Vipassanā Meditation) translated by the Venerable Dhammajiva of Sri Lanka to be published in the Sinhalese Version.

( U Tin Wan )
The President
Buddha Sāsana Nuggaha Organization
Mahāsi Sāsana Yeiktha
Yangon Myanmar.

# ග්‍රන්ථ සංකේත නිරූපණය

| | | | | |
|---|---|---|---|---|
| ම. නි. | - | මජ්ඣිම නිකාය | - | බු. ජ. |
| ස. නි. | - | සංයුත්ත නිකාය | - | " |
| අං. නි. | - | අංගුත්තර නිකාය | - | " |
| උ. පා. | - | උදාන පාලි | - | " |
| ඉ. වු. | - | ඉති වුත්තක | - | " |
| ධ. ස. | - | ධම්ම සඞ්ගනී | - | " |
| ප. ම. | - | පටිසම්භිදා මග්ග | - | " |
| දී. අ. | - | දීඝ නිකාය අට්ඨ කථා | - | ස. හේ. |
| ම. අ. | - | මජ්ඣිම නිකාය අට්ඨ කථා | - | " |
| ස. අ. | - | සංයුක්තනිකාය අට්ඨ කථා | - | " |
| ධ. ස. අ. | - | ධම්ම සංගනි අට්ඨ කථා | - | " |
| ධ. අ. | - | ධම්මපද අට්ඨ කථා | - | " |
| උ. අ. | - | උදාන අට්ඨකථා | - | " |
| වි. ම. | - | විසුද්ධි මග්ග | - | " |
| දී. ටී. | - | දීඝනිකාය ටීකා | - | " |
| මහා ටී. (සි) | - | මහා ටීකා සිංහල අකුරු | - | සි. අ. |
| මහා ටී. (බු) | - | මහා ටීකා බුරුම අකුරු | - | " |
| මූල ටී. (බු) | - | මූල ටීකා බුරුම අකුරු | - | " |

| | | |
|---|---|---|
| බු. ජ. | - | බුද්ධ ජයන්ති මුද්‍රණය |
| ස. හේ. | - | සයිමන් හේවාවිතාරණ මුද්‍රණය |
| සි. අ. | - | සිංහල අකුරු |
| බු. අ. | - | ඡට්ඨ සංගීති බුරුම අකුරු මුද්‍රණය |

මූලාශ්‍ර දැක්වීමට මෙම ග්‍රන්ථයෙහි යොදා ඇති කෙටි ක්‍රමය මෙසේය:
[*ග්‍රන්ථ සංකේතය / ග්‍රන්ථ කාණ්ඩය / පිටු අංකය*]

උදා: [සං. නි. 4/32] යනුවෙන් දැක්වෙන්නේ, සංයුක්ත නිකායෙහි 4 වන කාණ්ඩයෙහි 32 වන පිටුවය.

අදාළ ග්‍රන්ථය කාණ්ඩවලට බෙදා නැත්නම්, [*ග්‍රන්ථ සංකේතය/පිටු අංකය*] වශයෙන් දැක්වෙනු ඇත.

උදා: [වි. ම. 331]= [විසුද්ධි මග්ග : 331 පිට]

# පටුන

## පරිච්ඡේද අංක 6


| | |
|---|---|
| භංග ඤාණ ආදිය සහ පටිපදා ඤාණ දස්සන විසුද්ධි | 01 |
| ඇතිවීම නැතිවීම ප්‍රකට නම් ත්‍රිලක්‍ෂණය ප්‍රකට වීම | 02 |
| භංග ඤාණය | 04 |
| භංග ඤාණයට පත්වීමට විශේෂයෙන් මෙනෙහි කළ යුත්ත | 04 |
| භය, ආදීනව, නිබ්බිදා ඤාණ | 19 |
| මුඤ්චිතුකම්‍යතා, පටිසංඛා, සංඛාරුපෙක්ඛා ඤාණ | 31 |
| අනිත්‍ය ආකාරයන් | 36 |
| දුක්ඛ ආකාරයන් | 38 |
| අනත්ත ආකාරයන් | 42 |
| ද්වි කොටික භාවනා ක්‍රමය | 48 |
| චතුක්කොටික භාවනා ක්‍රමය | 49 |
| සයාකාර භාවනා ක්‍රමය | 53 |
| අටාකාර භාවනා ක්‍රමය | 54 |
| දසාකාර භාවනා ක්‍රමය | 55 |
| ද්වා දසාකාර භාවනා ක්‍රමය | 57 |
| අනුලෝම, ගොත්‍රභූ, මාර්ග, ඵල ඤාණ | 73 |
| වුට්ඨාන ගාමිණී විපස්සනා | 74 |
| 'ද්වත්තිංසය' නිවැරදි කිරීම | 81 |
| ගොත්‍රභූ ඤාණය | 83 |
| මාර්ග ඤාණ-ඵල ඤාණ | 84 |
| පච්චවෙක්ඛණ ඤාණ | 103 |
| ප්‍රත්‍යවේක්‍ෂා එකක් පමණක් ද පහළවිය හැකි බව | 105 |
| දුරු කළ යුතු කෙලෙස් | 108 |
| සෝතාපන්න පරීක්‍ෂණය | 123 |
| ධම්මාදාස සූත්‍රය | 123 |
| ආර්යයන්ගේ අචල ශ්‍රද්ධාව | 133 |
| සුප්පබුද්ධ වස්තු | 133 |

ධනඤ්ජානි වත්‍ථු 136
සූරම්බට්ඨ වත්‍ථු 138
ආර්ය උතුමන්ගේ සීලයේ පිවිතුරුකම හා තහවුරු බව 140
ආර්ය උතුමන්ගේ සැක 142
මහා පච්චවෙක්ඛණ හත 149
ආර්යයන් වහන්සේලාට සිදුවිය හැකි ආපත්ති 153
ඵල සමාපත්තියට සමවදින හැටි 159
ඵල සමාපත්තියේ ආනිශංස 163
ඵල සමාපත්තියට පත්වන ආකාරය 163
ආර්යයන් වහන්සේලාගේ විපස්සනාව උදයබ්බය
ඤාණයෙන් පටන් ගනී 164
සමාපත්තියේ ස්ථිතිය 167
ඵල සමාපත්තියේදී නිවන හැර වෙන කිසිවක්ම නොදනී 168
සමාපත්තියෙන් නැඟී සිටීම 173
සබ්බසංගාහික කථා 173
අපිරිසිදු ඵල සමාපත්තීන් ද ඇති බව 175
විශේෂ උධෘතයක් 176
සතත විහාරී නො සතත විහාරී 176
නිබ්බාන කථා 179
නිවන හා අභාව ප්‍රඥප්ති සම නොවන බව 185
සංඛාර හා නිබ්බාන එකිනෙක ප්‍රතිපක්ෂ වන හැටි 191
සඋපාධිසෙස හා අනුපාධිසෙස නිබ්බාන 194
කිලෙස ස්කන්ධ නිබ්බානයෙද පරමාර්ථ වේ 203
නිවන අභාව ප්‍රඥප්තියක් නොවේ 204
මාර්ග ඵලයන්ට අරමුණ වන නිවන 205
නිවන මහා ප්‍රභාෂ්වරයක් නොවේ 213

*7 වන පරිච්ඡේදය*

අට්ඨාරස විපස්සනා 219
අනිච්චානුපස්සනා 223
දුරු කෙරෙන කෙලෙස් 247

| | |
|---|---|
| ආරම්මණානුසය | 247 |
| දුක්ඛානුපස්සනාව | 279 |
| දුක්ඛානුපස්සනා තුන්වර්ගීය | 280 |
| අනත්තානුපස්සනාව | 285 |
| සන්තතිය බිඳීමෙන් අනාත්ම ලක්ෂණය ප්‍රකට වන ආකාරය | 289 |
| සමූහ ඝන | 290 |
| කිච්ච ඝන | 292 |
| ආරම්මණ ඝන | 294 |
| අනුපස්සනා තුන - විශේෂතා | 301 |
| නිබ්බිදානුපස්සනාව | 305 |
| විරාගානුපස්සනාව | 307 |
| නිරෝධානුපස්සනාව | 313 |
| පටිනිස්සග්ගානුපස්සනාව | 321 |
| සංක්ෂේප දර්ශනය | 327 |
| ඛයානුපස්සනාව | 333 |
| වයානුපස්සනාව | 337 |
| විපරිණාමානුපස්සනාව | 341 |
| මෙනෙහි කිරීම ප්‍රථම ක්‍රමය | 341 |
| අනුමාන මනසිකාරය දෙවන ක්‍රමය | 343 |
| විශේෂ වාද | 344 |
| අනිමිත්තානුපස්සනාව | 347 |
| අප්පණිහිතානුපස්සනාව | 353 |
| සුඤ්ඤතානුපස්සනාව | 355 |
| අධිපඤ්ඤා ධම්ම විපස්සනාව | 357 |
| යථාභූත ඤාණ දස්සනය | 361 |
| ආදීනවානුපස්සනාව | 363 |
| පටිසංඛානුපස්සනාව | 367 |
| විවට්ටානුපස්සනා | 371 |
| විශේෂ වාද | 374 |
| නිගමන ගාථා | 376 |

*නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///*

# භංග ඤාණ ආදිය සහ පටිපදා ඤාණ දස්සන විසුද්ධි

ඇතිවන-නැතිවන තාක් රූප-නාම හුදු මෙනෙහි කිරීම් වශයෙන් මෙනෙහි කොට දැනගනිමින් එම පිළිවෙල අනුව යන විශේෂ ඤාණ ආලෝක ප්‍රභාව ආදියට ගරු නොකොට, නොබැඳීගන්නා නිසා උපක්කිලේසයන්ගෙන් මිදුනා වන්නේය. වටහා ගතයුතු ඇතිවීම්-නැතිවීම් වටහා ගනිමින් සිටින නිසාම උපක්කිලේසයන්ගෙන් මිදුනා වන්නේය. වටහාගතයුතු ඇතිවීම්- නැතිවීම් වටහා ගනිමින් සිටින නිසා නියම සම්‍යක් මාර්ගයට පිළිපන් උදයබ්බය ඤාණය යැයිද කියනු ලැබේ. මෙම ඤාණයේ සිට අනුලොම ඤාණය දක්වා විපස්සනා ඤාණ නවය පටිපදා ඤාණදස්සන විසුද්ධි නම් වේ. ආර්ය මාර්ගයට පත්වීමට ප්‍රතිපදාව වන්නා වූ පිරිසිදු වූ උතුම් ඤාණය නම් වේ. මෙම විසුද්ධිය, මෙනෙහි කටයුතු රූප-නාමයන්ගේ ඇතිවීම-නැතිවීම පිරිසිදුව දැන ගන්නා නිසා අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්ෂණයන් හොඳින් දැක දැන ගන්නා අවස්ථාවේ පටන් පහළ වේ. ඇතිවීම-නැතිවීම සෘජුව දැන ගැනීමෙන් ම අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්ෂණයන්ගේ ප්‍රකට වන ආකාරය හත්වන පරිච්ඡේදයේලා මතු දක්වන්නා වූ සාධකයන් මඟින් ද, පහත සඳහන් මහා ටීකා දැක්වීම මඟින් ද අදහාගත යුතුවේ.

## ඇතිවීම-නැතිවීම ප්‍රකට නම් ත්‍රිලක්ෂණය ප්‍රකට වීම

උදයවයෙ පන පටිවිධෙධ අනිච්ච ලක්ඛණං පාකටං හුත්වා උපට්ඨාති. තතො යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තාති ඉතර ලක්ඛණම්පි. අථවා උදයබ්බයගහණෙන හුත්වා අභාවාකාරො, අභිණ්හ සම්පටිපීළනාකාරො අවසවත්තනාකාරො ච විභූතතරො හොති. [මහා ටීකා (බු.) 2/436]

| | | |
|---|---|---|
| උදයවයෙ පටිවෙධෙ | = | ඇතිවීම් නැතිවීම් ප්‍රත්‍යක්ෂ ලෙස දැනගැනීමෙන් |
| අනිච්ච ලක්ඛණං | = | අනිත්‍යයැයි මෙනෙහි කරන ලක්ෂණය |
| පාකටං හුත්වා | = | ප්‍රකට වී |
| උපට්ඨාති | = | පැනේ |
| තතො | = | එයින් ඉක්බිති |
| යං අනිච්චං | = | යම් අනිත්‍ය ධර්මයක් වේ ද |
| තං දුක්ඛං | = | එය දුක්මයැ |
| යං දුක්ඛං | = | යම් ධර්මයක් දුක ද |
| තං අනත්තා | = | එම ධර්මයෙහි වසඟයෙහි පැවැත්විය හැකි ආත්මයක් නොමැත |
| ඉති | = | මෙසේ |
| ඉතර ලක්ඛණම්පි | = | දුක්ඛ ලක්ෂණය, අනත්ත ලක්ෂණය |
| පාකටං හුත්වා | = | ප්‍රකට වී |
| උපට්ඨාති | = | පැනේ |
| අථවා | = | ප්‍රකට වන ආකාරය වෙනත් ලෙසකින් දක්වතොත් වනාහී |
| උදයබ්බයගහණෙන | = | ඇතිවීම්-නැතිවීම් මෙනෙහි කොට දැනගන්නා බැවින් |
| හුත්වා අභාවාකාරො | = | පහළ වී නැතිවීම, විනාශ වී යෑම යන අනිත්‍ය ලක්ෂණ ආකාරය ද |

අභිඤ්ඤා

| | | |
|---|---|---|
| සම්පටිපීළනාකාරො | = | ඇතිවීම් - නැතිවීම් දෙකින් අතරක් නොතබා පෙළීම නම් වූ දුක්ඛ ලක්ෂණය ද දුක්ඛ ආකාරය ද |
| අවසවත්තනාකාරො ච | = | නොවේවා යි සිතුවද එසේ සිතූ පරිදි නොවී, විනාශ නොවේවායි සිතුවා ද එසේ නොසිටින තම කැමැත්ත පරිදි නොසිටීම නම් වු අනත්ත ලක්ෂණ ආකාරය ද |
| විභූතතරො | = | විශේෂයෙන් ප්‍රකට |
| හොති | = | වේ |

සෑම ඇතිවීමක්-නැතිවීමක් පාසා රූප-නාමයන් මෙනෙහි කොට දැනගෙන අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්ෂණයන් හොඳින් ප්‍රකට වූ පුද්ගලයාට උදයබ්බය ඤාණය සම්පූර්ණයෙන් තියුණු වූ කල් හී මෙනෙහි කිරීම යුහුසුළු මෙන්ම බලවත් ද වේ. ඉබේම මෙන් වැටහෙමින්, වැටහෙමින් ඉදිරියට රැගෙන යන්නාක් සේ වේ. වැටහීම යුහුසුළු නිසා, මෙනෙහි කොට දැනගැනීමට ගැළපෙන, පහළවන අවස්ථාවේ ආරම්මණ සංස්කාර යන මේවා වහ වහා පැනේ. එම අවස්ථාවේ ආරම්භය නම් වූ උත්පාදය හා මාධ්‍යම වූ ඨිතිය ද මනසිකාරයට හසු නොවේ. අතරක් නො තබා ඇදහැලෙන දිය ඇල්ලක් සේ අඛණ්ඩව එක දිගට පහළ වෙමින් පවතින්නා වූ රූප-නාම සන්තතිය ද මනසිකාරයට හසු නොවේ. (යට යට රූප හා මතු මතු රූප ද යට යට සිත් හා මතු මතු සිත් ද වෙන් වෙන් නොවී එකට ම පවතින්නාක් මෙන් ඤාණයේ ප්‍රකට නො වේය යන්න අදහසයි.) සතෙකුගේ ඉරියව්වක්, ද්‍රව්‍යයක සටහන් ඇත්තාක් මෙන් පෙනෙන සංඛාර නිමිති වලට ද මනසිකාරය නො යයි. (උපමාවකට අනුව... නවන, දිගහරින විට පෙර පැවති අත පය සටහන් ප්‍රකට වූ ලෙසද දැන් වනාහී ප්‍රකට නොවේයැයි යන්න අදහසයි.) මෙනෙහි කරන කරන අවස්ථාවේ බිඳී බිඳී යන්නේයැයි දැනගැනීම = ඤාණය පමණක් පහළ වේ. එම අවස්ථාවෙහි භංගඤාණය පහළවේ.

## භංග ඤාණය

### භංග ඤාණයට පත්වීමට විශේෂයෙන් මෙනෙහි කළ යුත්ත

තයිදං සබ්බම්පි අයං යොගාවචරො උපක්කිලෙස විනිමුත්තෙන වීථි පටිපන්න විපස්සනා සංඛාතෙන උදයබ්බයානුපස්සනා ඤාණෙන යථාව-සරසතො සල්ලක්ඛෙති. තස්සෙවං සල්ලක්ඛෙත්වා පුනප්පුනං අනිච්චං දුක්ඛං අනත්තාති රූපා රූප ධම්මෙ තුලයතො තීරයතො තං ඤාණං තික්ඛං හුත්වා වහති. සංඛාරා ලහුං උපට්ඨහන්ති. ඤාණෙ තික්ඛෙ වහන්තෙ සංඛාරෙසු ලහුං උපට්ඨහන්තෙසු උප්පාදං වා ඨිතිං වා පවත්තං වා නිමිත්තං වා න සම්පාපුණාති. ඛය - වය - භෙද- නිරොධෙයෙව සති සන්තිට්ඨති. තස්සෙවං උප්පජ්ජිත්වා එවං නාම සංඛාරගතං නිරුජ්ඣතීති පස්සතො එතස්මිං ඨානෙ භංගානුපස්සනා නාම විපස්සනා ඤාණං උප්පජ්ජති [වි. ම. 480-481]

| | | |
|---|---|---|
| තං ඉදං සබ්බම්පි | = | පඤ්චස්කන්ධය හා ත්‍රිලක්ෂණය යන මේ සියල්ල ද |
| අයං යොගාවචරො | = | මේ යොගාවචර තෙමේ |
| උපක්කිලෙස විනිමුත්තෙන | = | උපක්ලෙශ වලින් මිදුණු වීථි පටිපන්න |
| විපස්සනා සංඛාතෙන | = | නියම මාර්ගයට පිළිපන් විපස්සනාව යැයි කිව යුතු |
| උදයබ්බයානු පස්සනා ඤාණෙන | = | ඇතිවීම, නැතිවීම මෙනෙහි කොට බලන ඤාණයෙන් |
| යාථාව සරසතො | = | සම්‍යක් ලෙසට හෝ තත්වාකාරයෙන් |
| සල්ලක්ඛෙති | = | හොඳින් මෙනෙහි කරයි |
| එවං සල්ලක්ඛෙත්වා | = | මෙලෙස හොඳින් මෙනෙහි කොට |
| රූපා රූප ධම්මෙ | = | රූප නාම ධර්මයෝ |
| අනිච්චං දුක්ඛං අනත්තා ති | = | අනිත්‍යයැ, දුක්යැ අනාත්ම යැයි |
| පුන පපුනං | = | නැවත නැවතත් |

| | | |
|---|---|---|
| තුලයතො තීරයතො | = | ගලපා විනිශ්චය කරන |
| තස්ස | = | එම යොගාවචරයාගේ |
| තං ඤාණං | = | එම මෙනෙහි කරන ඤාණය |
| තික්ඛං හුත්වා | = | තීක්ෂණ වී |
| වහති | = | සිටී (උසුලයි) |
| වා | = | ඔසවාගත යන්නාක් සේ වේ. |
| සංඛාරා | = | භාවනා කළයුතු රූප - නාම සංඛාරයෝ |
| ලහුං උපට්ඨහන්ති | = | යුහුසුළුව පැනේ |
| ඤාණෙ තික්ඛෙ වහන්තෙ | = | ඤාණය තියුණු වී ඉබේම ගෙනයන්නාක් සේ වන අවස්ථාවේ |
| සංඛාරෙසු ලහුං උපට්ඨහන්තෙසු | = | සංඛාරයන් යුහුසුළුව පැණෙන අවස්ථාවේ |
| උප්පාදං වා | = | මෙනෙහි කටයුතු රූප නාමයන් හී ආරම්භය වන උත්පාදය ද |
| ඨිතිං වා | = | මැද වන ඨිතිය ද |
| පවත්තං වා | = | අතරක් නොතබා පහළ වන රූප - නාම පැවැත්ම ද |
| නිමිත්තං වා | = | සත්ත්ව, ද්‍රව්‍ය සටහන් ඇත්තාක්සේ පිළිඹිබු කරන සංඛාර නිමිත්ත ද |
| න සම්පාපුණාති | = | නො එළවයි (මනසිකාරය නො පවත්වයි, සළකා නො බලයි යැයි අදහස් කෙරේ) |
| සති | = | අප්‍රමාදය නම් වන සතිය |
| වා | = | මෙනෙහිකොට දූන ගන්නා ඤාණය |
| ඛය - වය - භෙද - නිරොධ යෙව | = | ක්ෂයවීම, වියොවීම, බිඳීයෑම නම් වූ නිරෝධයේ ම |
| සන්තිට්ඨති | = | මනාකොට පිහිටයි. |

[අනුප්පාද නිරෝධය නොවේයැ යි දැන ගැනීමට, ඛය-වය-භෙද පදයන්ගෙන් 'නිරෝධ' පදය විශේෂණය කරයි.]

**සති සීසෙන ඤාණමාහ** [මහා ටීකා]

| | | |
|---|---|---|
| **තස්ස** | = | එම යෝගී හට |
| **සංඛාරගතං** | = | සංඛාර ගත ධර්මයෝ |
| **එවං උප්පජ්ජිත්වා** | = | මෙලෙස ඉපිද |
| **එවං නාම නිරුජ්ඣතීති** | = | මෙසේ නිරුද්ධ වී යයි යැයි |
| **පස්සතො** | = | මෙනෙහිකොට බලන විට |
| **එතස්මිං ඨානෙ** | = | මේ ස්ථානයේදී |
| **භංගානුපස්සනා නාම** | = | භංගානුපස්සනා නම් වූ |
| **විපස්සනා ඤාණං** | = | විපස්සනා ඤාණය |
| **උප්පජ්ජති** | = | උපදී |

(මෙම පාළියට අනුව උදයබ්බය ඤාණයේ සිට භංග ඤාණයට මාරුවන ආකාරය විශේෂයෙන් අවධානය කරයි)

මෙම භංග ඤාණය පහළ වන ආකාරය පටිසම්භිදා මග්ගයෙහි සවිස්තරව දේශනා කරයි. මෙහිලා දතයුතු යැයි හැගෙන එක්තරා ප්‍රදේශයක් පමණක් උද්‍ධෘත කොට දක්වන්නෙමු.

**ආරම්මණං පටිසංඛා භංගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං** [ප. ම. 01]

**ආරම්මණ පටිසංඛාති යං කිඤ්චි ආරම්මණං පටිසංඛාය ජානිත්වා ඛය තො වයතො දිස්වාති අත්‍ථො, භංගානුපස්සනෙ පඤ්ඤාති තස්ස ආරම්මණං ඛයතො වයතො පටිසංඛාය උප්පන්නස්ස ඤාණස්ස භංගං අනුපස්සනෙ යා පඤ්ඤා, ඉදං විපස්සනෙ ඤාණං** [වි. ම. 481]

පාළියෙහි අර්ථය

| | | |
|---|---|---|
| **ආරම්මණං පටිසංඛා** | = | එක්තරා අරමුණක් බිඳීගියේ යයි වියෝ වී යයි දැක දැනගෙන |

| | | |
|---|---|---|
| භංගානුපස්සනෙ පඤ්ඤා | = | දැක දැන ගත් එම ඤාණයේ බිඳීයෑම - වියෝ වී යෑම නැවත දැක දැන ගන්නා ප්‍රඥාව |
| විපස්සනෙ ඤාණං | = | භංග ඤාණ යැයි කියනු ලබන විපස්සනා ඤාණය වේ. |

## විසුද්ධි මග්ග අර්ථය...

| | | |
|---|---|---|
| 'ආරම්මණ පටිසංඛා' | = | ආරම්මණ පටිසංඛාත යන්න |
| යං කිඤ්චි ආරම්මණං | = | යම් කිසි අරමුණක් |
| පටිසංඛාය ජානිත්වා | = | නුවණින් දැනගෙන |
| ඛයතො | = | ක්‍ෂයවී යැයි |
| වය තො | = | වයෝ වී යැයි |
| දිස්වා | = | දැක |
| ඉති අත්ථො | = | මේ වනාහී පටිසංඛා යන පදයෙහි අර්ථයයි |
| භංගානුපස්සනෙ පඤ්ඤාති= | | 'භංගානුපස්සනෙ පඤ්ඤා' යන්න |
| ආරම්මණං ඛයතො වයතො පටිසංඛාය | | |
| උප්පන්නස්ස | = | අරමුණක් ක්‍ෂයවී යැයි වියෝ වී යැයි දැක දැන පහළ වූ |
| තස්ස ඤාණස්ස | = | එම ප්‍රථම ඤාණයේ |
| භංගං | = | බිඳී යෑම - වියෝ වී යෑම |
| අනුපස්සනෙ | = | නැවතත් දැක දැනගන්නා |
| යා පඤ්ඤා | = | යම් ඒ දැක දැන ගන්නා ප්‍රඥාවක් |
| අත්ථි | = | ඇත්තේය |
| ඉදං | = | මේ දැනීම දැකීම |
| විපස්සනෙ ඤාණං | = | විපස්සනා ඤාණය නම් වේ. |

පටිසම්භිදා මග්ග අට්ඨකථාහීදු මෙලෙසට ම විවරණය කෙරෙයි

## පැහැදිලි කිරීම

මේ විසුද්ධි මාර්ගයෙහි පටිසංඛාය ජානිත්වා - යන විවරණය මඟින් "පටිසංඛා" පදයෙන් 'දැනගත්' යන අර්ථය පමණක් ගන්න. 'සළකා බලා' යන අර්ථය නොගනු මැනවැයි දක්වයි. ඛයතො වයතො දිස්වාති අත්ථො යන දෙවැනි දැක්වීම මඟින් 'දැනගෙන' යැයි කීමේදී ද භංග ඤාණ අවස්ථාවේ සිටින බැවින් සාමාන්‍ය දැක දැන ගැනීම යැයි නොගත යුතුය. මෙනෙහි කොට දැන ගැනීම මාර්ගයෙන් වියෝ වන්නේයැ, ක්ෂය වන්නේ යැයි දැක ගත යුතු'යැයි ප්‍රකටව දක්වයි.

මේ පාළි අට්ඨ කථාවන්හී අර්ථය වනාහී; භංග ඤාණයට පත්වූ යෝගී තෙම පිම්බීම - හැකිළීම, හිඳීම, සිටීම, යෑම, නැවීම, දිගහැරීම, දැකීම, ඇසීම, සිතීම ආදී අවස්ථාවන්හි පහළ වෙමින් පවතින රූප- නාම අරමුණක් පාසා මෙනෙහි කරමින් මෙනෙහි කරමින්ම "ක්ෂයවේ, වියෝ වේ" යැයි දැක දැන ගනී. මේ දැක දැන ගැනීම නම් වූ නාම ධර්මය ද එළෙසින්ම "ක්ෂය වීයැයි, වියෝ වී යැයි" නැවත වරක් දැක දැන ගනී. මෙලෙස අරමුණක් ප්‍රකට වන වාරයක් වාරයක් පාසා එම අරමුණ හා මෙනෙහි කොට දැන ගැනීම යන මේ දෙක එකකට පසු එකක් වශයෙන් ක්ෂය වී, වියෝ වී යන්නේ යැයි දැක දැන ගන්නා මේ ඤාණ දෙක භංගානු පස්සනාව යැයි කියනු ලබන විපස්සනා ඤාණය නම් වේ. යැයි අදහස් කෙරේ.

**රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති. තං ආරම්මණං පටිසංඛා තස්ස චිත්තස්ස භංගං අනුපස්සති. වෙදනාරම්මණතා සඤ්ඤාරම්මණතා සංඛාරම්මණතා විඤ්ඤාණරම්මණතා.., චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති. තං ආරම්මණං පටිසංඛා තස්ස චිත්තස්ස භංගං අනුපස්සති** [ප. ම. 110]

| | | |
|---|---|---|
| **රූපාරම්මණතා චිත්තං** | = | රූපය අරමුණු කරන සිත |
| **උප්පජ්ජිත්වා භිජ්ජති** | = | ඉපද බිඳී යයි |
| **තං ආරම්මණං** | = | එම අරමුණ |
| **පටිසංඛා** | = | ක්ෂයවී-වැයවී යැයි දැක දැන ගෙන |
| **තස්ස චිත්තස්ස** | = | ක්ෂයවී වැයවී යැයි කියා දැක ගත් එම විපස්සනා සිතෙහි |

| | | |
|---|---|---|
| භංගං | = | බිඳී යෑම- වියෝ වී යෑම |
| අනුපස්සති | = | නැවත නැවතත් මෙනෙහි කොට දකගනී |

(තං රූපාරම්මණං පටිසංඛාය ජානිත්වා ඛයතො වයතො දිස්වාති අත්ථො - එම රූපාරම්මණය දැනගෙන, ක්ෂයවී- වියෝ වී යයි කියා දැක..., මෙය වනාහී, **තං ආරම්මණං පටිසංඛා...** යන පදයේ මුල අර්ථය සපයයි. **යෙන චිත්තෙන තං රූපාරම්මණං ඛයතො වයතො දිට්ඨං තස්ස චිත්තස්ස අපරෙන චිත්තෙන භංගං අනුපස්සතීති අත්ථො** - එම රූපාරම්මණය ක්ෂය වී - වියෝවී යයි කියා එම විපස්සනා සිතෙන් දකී. එම දැන ගන්නා විපස්සනා සිතෙහි ක්ෂයවීම - වියෝවීම තවත් පසු සිතකින් නැවත වරක් මනසිකාරය යොදා බලයි. මෙය වනාහී, **තස්ස චිත්තස්ස භංගං අනුපස්සති** යන පදයෙහි මූල අර්ථයවේ. [වි. ම. 481]

| | | |
|---|---|---|
| **වෙදනාරම්මණතා චිත්තං** | = | වේදනාව අරමුණු කරන සිත |
| **සඤ්ඤාරම්මණතා චිත්තං** | = | සඤ්ඤාව අරමුණු කරන සිත |
| **සංඛාරාරම්මණතා චිත්තං** | = | සංස්කාරයන් අරමුණු කරන සිත |
| **විඤ්ඤාණරම්මණතා චිත්තං** | = | විඤ්ඤාණය අරමුණු කරන සිත |
| **උප්පජ්ජිත්වා භිජ්ජති** | = | ඉපිද බිඳී යයි |
| **තං ආරම්මණං පටිසංඛා** | = | එම විඤ්ඤාණ අරමුණ ක්ෂයවී යයි - වියෝවී යයි යැයි දැක දැන ගෙන |
| **තස්ස චිත්තස්ස** | = | දැක දැන ගත් එම විපස්සනා සිතේ |
| **භංගං** | = | බිඳීයෑම, ක්ෂයවී යෑම |
| **අනුපස්සති** | = | නැවත භාවනා කොට බලයි |

## අර්ථය වනාහී...

පිම්බීම රූප, හැකිළීම රූප, සිටින රූප, නවන රූප, දිගහරින රූප, ඇසේ ප්‍රසාද රූපය, වර්ණ රූපය ආදී රූප පහළ වන අවස්ථාවේදී ම මෙනෙහි කොට බලා "ක්ෂයවී යයි, බිඳී යයි, වියෝ වී යයි යැ"යි දැක දැන ගනී. මෙම දැක දැන ගැනීම ඤාත නම් වූ අරමුණේ බිඳීම දන්නා ප්‍රථම භංග

ඤාණය නම් වේ. මෙම දැක දැන ගැනීමද "ක්‍ෂයවී යයි, බිඳීයයි, වියෝවී යයි යැ"යි අනතුරුවම නැවත දැක දැන ගනී. මෙලෙස නැවත දැකීම ඤාත නම් වූ ප්‍රථම ඤාණයේ බිඳීයෑම නැවත ද දැනගන්නා දෙවැනි ඤාණය භංග ඤාණ නම් වේ. විපස්සනාවම නැවත වරක් මෙනෙහිකොට භාවනා කිරීම සිදුවන බැවින් එම ඤාණයට පටි විපස්සනා යැයිද කියනු ලැබේ. රූපාරම්මණයක් ප්‍රකට තාක් මේ ලෙසට ම සිදුවේ. රූපයේ බිඳීම දැක දැන ගන්නා ප්‍රථම භංග ඤාණය එම දැක දැන ගැනීමේ සිත බිඳීයෑම යළි දැක දැනගන්නා දෙවැනි භංග ඤාණය යනාදී ලෙසට භංග ඤාණය යුගල යුගල වශයෙන් පහළ වේ.

වේදනා ආදී විඳීම් ප්‍රකට අවස්ථාවන්හි 'වේදනා' ආදී ලෙසට මෙනෙහි කොට එම වේදනාව බිඳීයන්නේ යැයි දැක දැන ගනී. ඤාත = අරමුණේ බිඳීම දැනගන්නා ප්‍රථම භංග ඤාණයයි ඒ. එම දැක දැන ගැනීමද මෙය "බිඳීයයි- වියෝ වී යයි යැ"යි අනන්තරවම නැවත දැක දැනගනී. ඤාණ = ප්‍රථම භංග ඤාණයේ බිඳීයෑම දැන ගන්නා දෙවැනි භංග ඤාණය, පටි විපස්සනාව වේ. මෙලෙස වේදනාව ප්‍රකට අවස්ථාවෙහි භංග ඤාණය යුගල යුගල ලෙස පහළ වේ. අනෙකුත් නාම ධර්ම ප්‍රකට අවස්ථාවන්හී ද මේ ක්‍රමයටම භංග ඤාණය යුගල යුගල ලෙසටම පහළ වේ. එම අවස්ථාවෙහි අරමුණක් පහළ වන පහළ වන අවස්ථාවෙහි මෙනෙහි කොට දතයුතු අරමුණ හා එය දැක දැන ගැනීම යන මේ දෙකම පෙර-පසු ගළපමින් ඉතා යුහුසුළුව බිඳී-විනාශ වී යෑම අඛණ්ඩව දැක දැන ගනිමින් පවතී. මෙලෙස අරමුණේ බිඳීම හා විපස්සනා සිතෙහි බිඳීම යන මේවා අතරක් නො තබා දැකිය හැක්කේ නම් භංග ඤාණය පහළ වී යැයි පිළිගෙන තීරණය කරයි. මෙහිලා බිඳී යෑම යනු, කැඩී විසිරී යෑමක් අදහස් නොකෙරේ. ඇත්ත වශයෙන් වනාහි, වියෝවී යෑම, විනාශ වී යෑමම අදහස් කරන බව තරයේ සිතතබා ගතයුතු. එම නිසාම, අට්ඨකථා හී ඛය-වය භෙද-නිරොධයෙව යැයි ද ඛයතො වයතො දිස්‌වා යැයි ද දක්වයි. සැළකිල්ලෙන් සිත තබාගත යුතු.

පාළියෙහි ද්වාර හය, අරමුණු හය, විඤ්ඤාණ හය ආදිය ද චක්ඛාරම්මණතා චිත්තං ආදිය මගින් වෙන වෙන ම ගෙනහැර විස්තර

ලෙස දක්වයි. අනුපස්සති - පදය අනුපස්සනා හත මඟින් විවරණය කරයි. එම අනුපස්සනා හත, හත්වන පරිච්ඡේදයේ ප්‍රකට කොට දක්වන්නෙමු.

**වත්ථු සංකමනා චෙව - පඤ්ඤාය ච විවට්ටනා**
**ආවජ්ජනා බලඤ්චෙව - පටිසංඛා විපස්සනා** [ප. ම. 110]

| | | |
|---|---|---|
| **වත්ථු සංකමනා චෙව** | = | මෙනෙහි කොට දත යුතු අරමුණෙ බිඳීයෑම, එම මෙනෙහි කොට දැනගන්නා විපස්සනා සිතේ බිඳීයෑම තෙක් මාරුවී දැක දැනගත හැකිවීම ද, |
| **පඤ්ඤාය විවට්ටනාච** | = | මෙනෙහි කොට දැනගන්නා ප්‍රඥා වෙන් උපැද්ම ඉක්මවා බිඳී බිඳීයෑම මත පමණක් පිහිටා සිටීමද |
| **ආවජ්ජනා බලඤ්චෙව** | = | අරමුණක බිඳීයෑම මෙනෙහිකොට දැනගත් අනතුරුව ම එම මෙනෙහි කරන සිතෙහි බැඳීයෑම දත දැක ගැනීමට කෙළින් ම ආවර්ජනය කළහැකි ශක්තිය ද |
| **එනා** | = | යන මෙම අංග තුනෙන් සම්පූර්ණ ඤාණය |
| **පටිසංඛා විපස්සනා.** | = | අරමුණෙහි බිඳීයෑම දැක දැන ගත්පසු, විපස්සනාවෙහි බිඳීයෑම නැවතත් දැක දැන ගන්නා භංග ඤාණය නම්වේ. |

අරමුණක බිඳීයෑම දැක දැන ගැනීමත් සමඟම අතරක් නොතබා, දැක දැනගන්නා එම සිතෙහි බිඳීයෑම වෙත නැවත හැරී විත් දැක දැන ගැනීම එකකි, උදයබ්බය ඤාණය අවස්ථාවේදීමෙන් උදය අවස්ථාව නොබලා, වය පමණක්ම බලන්නට හැකිවීම එකකි, අරමුණක බිඳීයෑම දැක දැන ගෙන, දැක දැනගන්නා එම සිතේ බිඳීයෑම නැවතත් දැක දැන ගැනීමට, අතරක් නොතබා ම කෙළින් ම ආවර්ජනය කළ හැකි (යොනිසෝ මනසිකාර යැයි කියන) ආවජ්ජනය පහළ වී ඒම තවත් අංග එකකි. මේ අංග තුන අතින් සම්පූර්ණ වී නම් භංග ඤාණය පහළ වී යැයි තීරණය කළ යුතුය. මෙම අංග තුන අතුරින් තුන්වන අංගය හා පළමු වන අංගය යන දෙක මෙනෙහි කොට දැනගැනීමත් හා සමඟම යෙදෙන්නා වූ පූර්වාංගමය හා

පශ්චිමය වන්නාහුය. ආවජ්ජනය වනාහී අතරක් නොතබා කෙළින්ම සළකා බැලීම වන්නේ නම්, දැනීම = ඤාණය ද වනාහි කෙළින් හැරිවිත් දැක දැන ගැනීම ම වේ.

**වත්ථු සංඛමනාති රූපාදීසු එකෙකස්ස භංගං දිස්වා, පුන යෙන චිත්තෙන භංගො දිට්ඨො තස්සාපි භංගදස්සන වසෙන පුරිම වත්ථුතො අඤ්ඤං වත්ථු සංකමනා, පඤ්ඤාය ච විවට්ඨානාති උදයං පහාය වයෙ සන්තිට්ඨානා, ආවජ්ජනා බලඤ්ඤෙවාති රූපාදීසු එකෙකස්ස භංගං දිස්වා, පුන භංගාරම්මණස්ස චිත්තස්ස භංගදස්සනත්තං අනන්තර මෙව ආවජ්ජන සමත්ථතා** [ප. ම. අ. (බු) 1/230 110]

| | | |
|---|---|---|
| **වත්ථු සංඛමනාති** | = | වත්ථු සංඛමනාති යනු |
| **රූපාදීසු එකෙකස්ස** | = | රූප ආදිය තුළින් එක්තරා අරමුණක (විශුද්ධිමාර්ගයෙ හි වනාහි රූපස්ස යැයි දැක්වේ උපලක්ඛණ, නිදස්සන නය ක්‍රමයට කියන්නේ යැයි සළකා ගන්න) |
| **භංගං දිස්වා** | = | බිඳීම දැක |
| **යෙන චිත්තෙන** | | |
| **භංගො දිට්ඨො** | = | යම් මෙනෙහි කරන සිතකින් භංගය දුටුවේ ද, |
| **තස්සාපි** | = | එම මෙනෙහි කරන සිතෙහි ද |
| **පුන භංගදස්සනවසෙන** | = | නැවත බිඳීම දැකීම් වශයෙන් |
| **පුරිම වත්ථුතො** | = | අරමුණෙ බිඳීම නම් වූ පෙර වස්තුවෙන් |
| **අඤ්ඤං වත්ථු සංකමනා** | = | මෙනෙහි කරන සිතේ බිඳීම නම් වූ පසු වස්තුවට මාරු වීම |
| **පඤ්ඤාය ච විවට්ඨානාති** | = | පඤ්ඤාය ච විවට්ඨනා යන්න |
| **උදයං පහාය** | = | උදය පක්ෂය බැහැර කොට |
| **වයෙ සන්තිට්ඨානා** | = | වය පක්ෂය මත පමණක් පිහිටීම (ඇතිවීම කෙරෙහි මනසිකාරය නොයොදා නැතිවීම මත පමණක් මනසිකාරය යොදා දැක දැන ගැනීම යැයි අදහස් කෙරේ) |
| **ආවජ්ජන බලඤ්ඤෙවාති** | = | ආවජ්ජන බලඤ්ඤෙව යන්න |

| | | |
|---|---|---|
| රූපාදීසු එකෙකස්ස | = | රූපාදී එක්තරා අරමුණක (වි. ම. හි වනාහි රූපස්ස-යැයි දක්වීම වනාහී උපලක්ඛණ නිදස්සන වශයෙන් දක්වීමකි) |
| භංගං දිස්වා | = | බිඳී යෑම දැක |
| භංගාරම්මණස්ස | | |
| චිත්තස්ස | = | බිඳීයෑම අරමුණු කළ, මෙනෙහි කොට දැන ගන්නා සිතේ |
| පුන භංග දස්සනත්ථං | = | බිඳීයෑම නැවත දැකීමට |
| නන්තර මෙව | = | අරමුණේ බිඳීයෑම මෙනෙහිකොට දැනගත් අනතුරුවම |
| ආවජ්ජන සමත්ථතා | = | ආවර්ජනය කළ හැකිවීම වේ. |

විශේෂයෙන් සිත තබාගත යුත්තක්...

අතරක් නොතබා ආවර්ජනය කළ හැක්කේ යැයි කියන තැන, භවාංගයට නොවැටී ආවජ්ජනය පහළ විය නොහැකි බැවින් වෙනත් දෙයක් අරමුණු කරන වීථි වශයෙන් අතරක් නොතබා යැයි වටහා ගත යුතුය. තව දුරටත් වත්ථු සංකමනා යන පාළියට අනුව, අනන්තරමෙව යන අට්ඨ කථාව මත පිහිටා "වෙනත් අරමුණක් මත බොහෝ වාර ගණනක් එකක් මත එකක් වශයෙන් විපස්සනා කිරීම අවශ්‍ය නොවේ. අරමුණු එක එකක් මත එක වරක් පමණක් මෙනෙහි කිරීම (බැලීම) අවශ්‍යයැ"යිද තරයේ සිතට ගත යුතු. තවදුරටත්. මෙම භංග ඤාණයට අදාල පාළි අට්ඨ කථාවන් උපුටා රූප-නාම ඉරියව් එක එකකට ඇතුළත් ධර්මයන් ඇතිතාක් වෙන වෙනම සම්පූර්ණ වන ලෙස බෙදමින්, ගණන් කරමින් බැලීම වනාහී අවශ්‍ය නොවේ. ප්‍රකටවන ධර්මයක්ම ප්‍රධාන කොට භාවනා කොට බැලීම අවශ්‍යයැ"යි ද, එක වීථියක් හා සම්බන්ධ පෙර වීථීන් පසු වීථීන්ද වෙන වෙන ම බෙදමින් බැලීම වනාහී අවශ්‍ය නොවේ. මුළු වීථියම පිඩුකොට ගෙන බැලීම පමණක් අවශ්‍ය වේ යැයි ද, අතීත, අනාගත හා අප්‍රකට ධර්මයන් සොයා යමින් අනුමාන කරමින් බලනවා නොවේ. වර්තමානව ප්‍රකට වී ඇතිවෙමින්, නැතිවෙමින් යන්නා වූ රූප- නාමයන් පමණක් ඇස් පනාපිට භාවනා කළ යුතුයැ"යිද යන මේ කාරණා ගැඹුරින් සිත තබා ගත යුතුය.

ආරම්මණ අන්වයෙන - උභො එක ව‌වත්ථානා

නිරොධ අධිමුත්තතා - වයලක්ඛණා විපස්සනා [ප. ම. 110]

| | | |
|---|---|---|
| ආරම්මණ අන්වයෙන | = | මෙනෙහිකොට බලා ප්‍රත්‍යක්‍ෂ ලෙස දැකගත් පච්චුප්පන්න අරමුණ අනුගමනය කරමින් ගලපන අනුමාන ඥාණයෙන් |
| උභො | = | වර්තමානව දතයුතු, එළඹි අරමුණ හා වර්තමානව දැකිය නොහැකි අතීත-අනාගත අරමුණු යන අරමුණු වර්ග දෙක |

[උභොති දිට්ඨාදිට්ඨ භාවෙන ද්වෙපි ආරම්මණානි - මහා ටීකා (බු) 2/334]

| | | |
|---|---|---|
| එක ව‌වත්ථානා | = | බිඳීයෑම නම් වූ විශේෂ ස්වභාවය අනුව පමණක් ව්‍යවස්ථාපනය කළ හැකි බව |
| වා | = | මොහොතකින් බිඳීයා හැකි ස්වභාවය අතින් සියල්ල සමාන යැයි ව්‍යයවස්ථාපනය කළ හැකි වීම ද |

[ඛණ භංගුරතාය සමානාති ව‌වත්ථාපන - (මහා ටීකා)]

| | | |
|---|---|---|
| නිරොධෙ | = | නිරුද්ධවීමෙහි |
| අධිමුත්තතා | = | සැලකිල්ලෙන් මනසිකාරය යොමු කිරීම ද |
| එසා | = | මේ අංග දෙකින් සම්පූර්ණ ඥාණය |
| වය ලක්ඛණා විපස්සනා | = | ලක්‍ෂණය භාවනා කොට බලන භංග විපස්සනා ඥාණය නම් වේ |

ආරම්මණ අන්වයෙන උභො එක ව‌වත්ථානාති පච්චක්ඛතො දිට්ඨස්ස ආරම්මණස්ස අන්වයෙන අනුගමනෙන "යථා ඉදං තථා අතීතෙපි සංඛාරගතං භිජ්ජිත්ථ, අනාගතෙපි භිජ්ජිස්සතීති" එවං උභින්නං එකසභාවෙනෙව ව‌වත්ථාපනන්ති අත්ථො වුත්තම්පි චෙතං පොරාණෙහි:

සංවිජ්ජමානම්හි විසුද්ධ දස්සනො
තදන්වයං නෙති අතීත - අනාගතෙ
සබ්බෙපි සංඛාරගතා පලොකිනො
උස්සාව බින්දූ සූරියෙව උග්ගතෙති [වි. ම.]

| | | |
|---|---|---|
| ආරම්මණ -පෙ- වවත්ථානාති | = | ආරම්මණ -පෙ- වවත්ථානා යනු |
| පච්චක්ඛතො | = | ප්‍රත්‍යක්ෂ වශයෙන් |
| දිට්ඨස්ස | = | දැක දැනගත්තහුගේ |
| ආරම්මණස්ස | = | ප්‍රත්‍යුත්පන්න අරමුණට |
| අන්වයෙන අනුගමනෙන | = | නය පිළිවෙළ අනුව යමින් අනුමාන කරන අනුමාන ඥාණයෙන් |
| ඉදං යථා | = | මේ බිඳීයමින් පවතින වර්තමාන සංඛාර යම්සේ ද |
| තථා | = | එසේම |
| අතීතෙපි | = | අතීතයෙහිදු |
| සංඛාරගතං | = | සංඛාර ධර්මයන් සියල්ල |
| භිජ්ජිත්ථ | = | බිඳී ගියේය |
| අනාගතෙපි | = | අනාගත කාලයෙහි ද |
| සංඛාරගතං | = | සංඛාර ධර්ම සියල්ල |
| භිජ්ජිස්සතීති | = | බිඳීයනු ඇත. |
| එවං | = | මෙලෙස |
| උභින්නං | = | ඇස්පනාපිට වන හා ඇස්පනාපිට නොවන යන |
| එක සභාවෙනෙව | = | විනාශ වීම නම් වූ එකම ස්වභාවය වශයෙන් පවතී |
| ඉති අත්ථො | = | යන මෙම අර්ථය |
| ච සච්චං | = | ඇත්තය |
| පොරාණෙහි පි | = | පැරණි ආචාර්යවරු ද |
| සංවිජ්ජමානම්පි -පෙ- උග්ගතෙති | = | සංවිජ්ජමානම්පි -පෙ-උග්ගතෙ යන |
| එතං | = | මේ ගාථාවන් |
| වුත්තං | = | කියන ලදි. |

## පොරාණ ගාථාහි අර්ථය

| | | |
|---|---|---|
| සංවිජ්ජ මානම්පි | = | ඉදිරිපත්ව පවතින සංඛාරයන්හි |
| ච | = | ඇස්පනාපිට දකින පච්චුප්පන්න සංඛාරයන්හි |
| විසුද්ධ දස්සනො | = | විශේෂයෙන් පැහැදිලි වූ භංග ඥාණ දර්ශනය ඇති |

(පච්චක්ඛතො උපලබ්භමාන පච්චුප්පන්නෙන සුවිසුද්ධ භංග දස්සනො = ටීකා දැක් වීමයි)

| | | |
|---|---|---|
| යොගාවචරො | = | යෝගාවචර තෙමෙ |
| තදන්වයං | = | පච්චුප්පන්න සංඛාරයන්ගේ භංගය දකින එම පච්චක්ඛ ඥාණය අනුගමනය කරන අනුමාන ඥාණය |
| අතීතානාගතෙ | = | අතීත සංඛාර අනාගත සංඛාර යන ධර්මයන් මතට |
| නෙති | = | පමුණුවයි පහළ කරවයි. |

[තස්ස පච්චුප්පන්නං සංඛාර භංග දස්සිනො ඥාණස්ස අන්වයං අනුගත භූතං ඥාණං පවත්තෙති - (ටීකා විවරණය)]

| | | |
|---|---|---|
| කතං | = | කෙසේ වී දැයි යත් |
| සූරියෙ උග්ගතෙ | = | ඉර නැඟි කල්හි |
| උස්සාව බිංදු විය | = | පිණි බිඳු (මෙන්) |
| පලොකිනො ඉව | = | වියැලී, වියෝ වී යන්නා සේ |
| සබ්බෙපි | = | අතීත අනාගත පච්චුප්පන්න වශයෙන් සියල්ලම ද |
| සංඛාරගතා | = | සංඛාර ධර්මයෝ |
| පලොකිනො | = | වියෝ වී, විනාශවී යන ස්වභාව ඇත්තාහ |
| ඉති | = | මෙසේ අනුමාන ඥාණය පහළ කරවයි. |

විශේෂයෙන් සැළකිය යුත්තක්:

මේ පාළි අට්ඨ කථාවන් මත පිහිටා "විපස්සනා යෝගීතෙම අතීත අනාගත ධර්මයන්ගෙන් පටන්ගෙන නොබැලිය යුතු. වර්තමාන වශයෙන් ඇස්පනාපිට පහළවන, නැතිව යන පච්චුප්පන්න ධර්මයන්ගෙන් භාවනාව ආරම්භ කරයි. පච්චුප්පන්න ධර්මයන් පැහැදිළිව පිරිසිදුව ඇස්පනාපිට දැකගත් අවස්ථාවෙහි ඤාණය විනිවිද යනසුළු පැහැදීමේ ස්වභාවයට පත්වීම අනුව අතීත අනාගත ධර්මයන් සළකා බලා තීරණය කරන අනුමාන ඤාණය, ධර්ම ස්වභාවයට අනුව ඉබේ ම මෙන් පහළ වේ. පහළ වූ එම අනුමාන ඤාණය ම අතීත අනාගත ධර්ම ක්ෂෙත්‍රයෙහි විහිදේ. එම අතීත අනාගත ධර්ම හිතාමතා සොයා බලා හෝ හිතා මතා ව්‍යාපාර කරමින් සළකා බලා සිටීමක් අවශ්‍යනොවේ යැ"යි තදින් සිත තබා ගත යුතුවේ.

භංග ඤාණය බලවත්ව පවතින පුද්ගලයා "කබලක දමා බදින තල ඇට චිට-චිට-චිට... හඬින් බිඳී යන්නා සේ" මෙනෙහි කරන සංස්කාර අරමුණ හා එය මෙනෙහි කොට දැනගන්නා විපස්සනා සංස්කාරයන්ගේ එකකට පසු එකක් වශයෙන්, බිඳී යෑම, විනාශ වී යෑම,. නිරීක්ෂණය කොට බලා සිටින්නාක් සේ දිගටම දකිමින් සිටී. තද වැස්සක වැහි බිංදු මඟින් ජල කඩක මතුවන දිය බුබුලු වහා වහා බිඳී බිඳී යන්නාක් සේ, අරමුණු සංස්කාර හා එය මෙනෙහි කොට දැනගන්නා සංස්කාරයෝ ද එකකට පසු එකක් ලෙස වහ වහා බිඳී බිඳී යන්නා වූ බවම අතරක් නොතබා දකිමින් සිටී. වහ වහා නලියමින් දඟලමින් තිබෙන මිරිඟුවක් සේ, වහ වහා විනාශ වෙමින් වියෝවෙමින් පවතින බව අතරක් නොතබා දකිමින් සිටී. මෙලෙස දකින්නා වූ යොගාවචරයකු සළකා පහත දැක්වෙන ධම්ම පද ගාථාව දේශනාකරන ලද්දේ යැයි විශුද්ධි මග්ගය කියයි.

**යථා බුබ්බුලකං පස්සෙ - යථා පස්සෙමරීචිකං**
**එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති.**

[ධ. ප. 170 ගාථාව]

බුබ්බුලකං = දිය බුබුලක්

| | | |
|---|---|---|
| පස්සෙ යථා | = | වහා වහා බිඳෙමින් විනාශ වෙමින් යන බව දකින්නාක් සේ |
| මරීචිකං | = | මිරිඟුවක් |
| පස්සෙ යථා | = | වහා වහා බිඳෙමින් විනාශ වෙමින් යන්නා වූ බව දකින්නාක් සේ |
| එවං | = | මෙසේ |
| ලොකං | = | පඤ්චස්කන්ධ ලෝකය |
| මච්චුරාජා | = | මාරයාට |
| අවෙක්ඛන්තං | = | වහ වහා බිඳෙමින් විනාශ වෙමින් යන්නේ යැයි දැක දැනගනිමින් සිටින්නා |
| න පස්සති | = | දැකගත නොහැක්කේය. |

විනාශ වී යැයි, භංග ඤාණයෙන් දැක දැනගත් අරමුණක් පාසා සළකා 'අවිජ්ජා, තණ්හා, උපාදාන, කම්ම යන නව භවයේ ස්කන්ධයන් පහළ විය නොහැක්කේය. එබැවින් පහළ වීමට නුසුදුසු නව භවයේ ස්කන්ධයන් සඳහා මරණය සංසිද්ධවන්නේයැයි ද, භංගය දකින භංගඤාණය ආදිය වශයෙන් ක්‍රමානුකූලව භාවනාකොට අරහත්ත ඵලයට පත්වූ අවස්ථාවෙහි නව භවය හා සම්බන්ධ මරණය සම්පූර්ණයෙන් සංසිඳීම ද සළකා මාරයාට 'දැකිය නොහැක්කේයැයි' කියයි.

*භංග ඤාණය නිමියේ යැ.*

# භය, ආදීනව, නිබ්බිද ඤාණ

භංග ඤාණය මුදුන්පත් වී "පෙර රූප- නාම ධර්මයෙන් බිඳී විනාශ වී ගියෝය. දැනුදු බිඳෙමින් පවතී, පසුව ද මෙලෙසට ම බිඳෙමින් පවතිනු ඇත්තාහ" යැයි හොඳින් වටහා ගත් අවස්ථාවෙහි "රූප-නාම සංඛාරයන් බියවීමට කාරණයකි යැ'යි දැක දැන ගනිමින් භය ඤාණය පහළ වේ.

**තස්ස අතීතා සංඛාරා නිරුද්ධා, පච්චුප්පන්නා නිරුජ්ඣන්ති, අනාගතෙ නිබ්බත්තනක සංඛාරාපි එව මෙව නිරුජ්ඣිස්සන්ති'ති පස්සතො එතස්මිං ඨානෙ භයතුපට්ඨාන ඤාණං නාම උප්පජ්ජති** [වි. ම. 484]

| | | |
|---|---|---|
| **තස්ස** | = | භංග ඤාණය මුදුන්පත් වූ එම යෝගීහට |
| **අතීතා සංඛාරා** | = | අතීත සංඛාරයන් |
| **නිරුද්ධා** | = | බිඳී නිරුද්ධ වීය |
| **පච්චුප්පන්නා** | = | වර්තමාන සංඛාරයන් |
| **නිරුජ්ඣන්ති** | = | නිරුද්ධ වෙමින් පවතී, බිඳෙමින් පවතී. |
| **අනාගතෙ නිබ්බත්තනක සංඛාරාපි** | = | අනාගතයෙහි ද පහළ වන්නා වූ සංඛාරයන් ද |
| **එව මෙව** | = | මේ ක්‍රමයට ම |
| **නිරුජ්ඣිස්සන්ති** | = | නිරුද්ධ වීම වන්නාහ. |

**ඉති** = මෙසේ

**පස්සතො** = දකින

**එතස්මිං ඨානෙ** = මේ තැන

**භයතුපට්ඨාන**
**ඤාණං නාම** = බිය වීමට කාරණයක් යැයි සැලකීම නම් වූ භය ඤාණය

**උප්පජ්ජති** = උපදී

එම අවස්ථාවෙහි මෙනෙහි කරන කරන වාරයේ බිඳී බිඳී යන්නා වූ සංඛාරයන් මත බිය ස්වභාවය සහිත වූ විශේෂ ඤාණය උපදී. සළකා බලන අරමුණු මතද 'බියවීමට කරුණක් යැ'යි හඟින්නා වූ විශේෂ ඤාණය පහළ වේ. එම නිසා මෙනෙහි කරන සිත උදයබ්බය ඤාණය, භංග ඤාණය පහළ වූ අවස්ථාවන්හි මෙන් සිත යුහුසුළු පැහැදිළි පිරිසිදු බව නොමැතිවී දුර්වල, බෙලහීන බවක් මෙන් පැවතිය හැක්කේය. නමුදු සතුරකු, අවතාරයක් හමුවී බියවන්නා සේ හිත පපුව සැලෙනසුළු අමනාප බවක්, දොම්නස් බවක් සහිතව බියක් වනාහී නොවන්නේය. බියවීමට කරුණකැයි යථාර්ථය දැන ගැනීමෙන් අමනාප බවක් පමණක් පහළවීම සිදුවේ.

**භයතුපට්ඨාන ඤාණං පන භායති න භායතීති, න භායති, තඤ්හි අතීත සංඛාර නිරුද්ධා, පච්චුප්පන්නං නිරුජ්ඣන්ති. අනාගතා නිරුජ්ඣිස්සන්තීති තීරණමත්තමෙව හොති**

**භයතුපට්ඨාන ඤාණං** = භය ඤාණය

**භායති න භායතීති** = බියවන්නක් ද බිය නොවන්නක් ද යන ප්‍රශ්ණයට

**න භායති** = ඇත්ත වශයෙන්ම 'බිය විය යුත්තක් නොවන්නේ යැ'යි පිළිතුර සපයයි.

**හි** = ඇත්තය

| | | |
|---|---|---|
| තං | = | එම භය ඤාණය |
| අතීතා - පෙ- | | |
| නිරුජ්ඣිස්සන්තීති | = | 'අතීත සංඛාරයන් බිඳී නිරුද්ධ වී ගියෝය. පත්‍යුත්පන්න (වර්තමාන) සංඛාරයන් බිඳෙමින් වියෝ වෙමින් පවතින්නාහ. අනාගත සංඛාරයන් බිඳී වියෝ වී යනු ඇත යැ'යි |
| තීරණ මත්තමෙව | = | සළකා බලා තීරණය කිරීම මාත්‍රය පමණක් |
| හොති | = | වන්නේය. |

මේ හංග ඤාණය මෝරා ගොස් ආදීනව ඤාණය පහළ වේ. එවිට මෙනෙහි කරමින් සිටින සංඛාරයන් මත මෙන්ම, සළකා බලන සංඛාර භවයන් මතද කැමති විය යුතු, සුභ, උත්තම, සාර, හරයක් ඇත්තේ යැයි නොසිතා මෙනෙහි කරන කරන වාරයේ, ආවර්ජනය කරන කරන වාරයේ පිළිකුල් බව පමණක් හමුවන්නේ යැයි හඟියි. නරක තැනක රළු දේ පමණක් ඇත්තේ යැයි හඟියි. පහතින් වනාහී දැක්වෙන්නේ භය, ආදීනව ඤාණ පහළ වන ආකාරය දක්වන පටිසම්භිදා මග්ග උදෘතයන්ය.

**උප්පාදෙ භයන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං. පවත්තං භයන්ති නිමිත්තං භයන්ති, ආයූහනා භයන්ති, පටිසන්ධිභයන්ති ගති, නිබ්බත්ති, උප්පත්ති, ජාති, ජරා, ව්‍යාධි, මරණං, සොකො, පරිදෙවො උපායාසො භයන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං** [පඨම වාර]

**උප්පාදෙ දුක්ඛන්ති භයතු පට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං. පවත්තං - පෙ - උපායාසො දුක්ඛන්ති භයතු පට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං** [දුතිය වාර]

**උප්පාදෙ සාමිසන්ති - පෙ - උපායාසො සාමිසන්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං** [තතිය වාර]

**උප්පාදෙ සංඛාරාති - පෙ - උපායාසො සංඛාරාති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං** [චතුත්ථ වාර]

**උප්පාදෙ** = මෙම භවයෙහි ආරම්භයේ පහළ වීම

**භයන්ති** = බියවීමට කාරණයකි යැයි

**භයතුපට්ඨානෙ පඤ්ඤා** = බියවීමට හේතුවන දෙයක් යැයි හඟින ඤාණය

**ආදීනව ඤාණං** = ආදීනව ඤාණය නම් වේ (පවත්තං ආදී පසු පදයන් මත ද පාළි අර්ථ අතින් සියල්ලට සමාන යැයි දත යුතු)

**පවත්තං** = නොනවතින ලෙස අතරක් නොතබා පහළ වීම

**භයන්ති** = බයක් යැයි

(යට යට දෑ බිඳී වියෝ වී ගියේ නමුදු, මතු මතු පහළ වෙමින් පවතින රූප-නාම සන්තතිය බියක් යැයි හඟී)

**නිමිත්තං** = සත්ත්වයෙක්, දෙයක්, ද්‍රව්‍යයක් නොමැතිව සත්ත්වයෙක්, දෙයක්, ද්‍රව්‍යයක් ඇත්තාක මෙන් මතුවී ඇති පිම්බීම-හැකිලීම, හිඳීම, නැවීම දිගහැරීම, දැකීම, ඇසීම ආදී සංඛාර නිමිති.

**නිමිත්තන්ති සබ්බම්පි සංඛාර නිමිත්තං** [අට්ඨ කථා]

**සංඛාර නිමිත්තන්ති සංඛාරානං සමූහාදි ඝන වසෙන නකිච්ච පරිච්ඡෙදතාය ච සවිග්ගහානං විය උපට්ඨානං** [වි. ම. ටීකා]

**ආයූහනා** = සුඛෝපභෝගී ලෙස සෞභාග්‍ය ලෙස විසීමට කැමැත්තෙන් ව්‍යායාම කිරීම නම් වූ කුසල කම්, අකුසල කම්

**පටිසන්ධි** = නැවත වරක් ප්‍රතිසන්ධිය ලැබීම

**ගති** = නරක තිරශ්චාන, ප්‍රේත, මනුෂ්‍ය, දේව භවය ආදියට පත්වන ගතිය

**නිබ්බත්ති** = නිපැද්ම

| | | |
|---|---|---|
| උපපත්ති | = | උපදින භවය |
| ජාති | = | පහළ වීම |
| ජරා | = | දිරීම |
| බ්‍යාධි | = | රෝග |
| මරණං | = | මිය යෑම |
| සොකො | = | සෝක තැවීම් |
| පරිදෙවො | = | හැඬීම් |
| උපායාසො | = | දැඩි වෙහෙස |
| භයන්ති | = | බියවීමට කරුණකැ යි |
| භයතුපට්ඨානෙ පඤ්ඤා | = | බියවීමට හේතුවන කාරණයකැ යි හඟින ඥාණය |
| ආදීනවෙ ඤාණං | = | ආදීනව ඥාණය නම් වේ. (පඨම වාරයේ අර්ථය මෙතකින් සම්පූර්ණය) |
| උප්පාදො | = | මේ භවයෙහි උපැද්ම හටගැනීම |
| දුක්ඛන්ති | = | දුකක්මයැ'යි |
| භයතු පට්ඨානෙ පඤ්ඤා | = | බිය වීමට කරුණකැයි හඟින දැනීම |
| ආදීනව ඤාණං | = | ආදීනව ඥාණය නම්වේ. |

['ගිම්හාන සෘතුවෙහි ගිනිගන්නා සුළු දේවල් වලින් පිරි ගෙයක සිටින්නෙක්, ගෙට ගිනි ගනීදැයි සංකාවෙන් පසුවන්නාක් සේ, කෙලෙස් ගිනි සඳහා ඉන්ධන වන්නා වූ වට්ටදුක කාම ගුණයන් හා සමඟ පවත්නා වූ බැවින් ශංකා සහිත බිය සහිත යැයි ද, (ද්‍රුතීය වාරය) ඉඳුල් බත් - ව්‍යාංජන තැවරුණු අතක් මෙන් කෙලෙසිය හැකි දූෂිත කළ හැකි කෙලෙස් ආහාර සමඟ වන බැවින්, පිළිකුල් සහිත වූ, අප්‍රිය ජනක වූ යැයිද හඟියි' යන්න මෙහි අදහසයි. ඉතිරි පාළි අර්ථ ප්‍රථම වාරයට අනුව දැනගන්න. තතිය වාරය මෙතෙකින් සම්පූර්ණ වේ]

| | | |
|---|---|---|
| උප්පාදෙ | = | මෙම භවයේ ආරම්භය සිදුවීම |
| සංඛාරාති | = | සාන්ත සීතල නොවන්නා වූ සංඛාරයන් යැයි |

**භයතුපට්ඨානෙ පඤ්ඤා** = බියවීමට හේතු කරුණක් යැයි හඟින ඤාණය

**ආදීනවෙ ඤාණං** = ආදිනව ඤාණය නම් වේ

(ඉතිරි පාළි අර්ථය ප්‍රථම වාර පාළියට අනුව වටහා ගන්න. චතුත්ත වාරය මෙතෙකින් සම්පූර්ණවේ.)

## අර්ථය වනාහී...

මෙනෙහි කොට දතයුතු නාම-රූප සහ ඒවා මෙනෙහි කොට දැනගන්න විපස්සනා යන මේවායේ නොනැවතී බිඳී බිඳී යමින් පවතින බව ඇස්පනාපිට හමු වී දැක "බියවීමට කාරණයකි" යැයි පැහැදී ගත් පුද්ගලයා එම රූප-නාමයන්ගේ ආරම්භය වුනා වූ මේ භවයේ පටිසන්ධිය සළකා බලන්නේ නම් එම ආරම්භය සිදුවීමත් "බියවීමට තැනක් යැ"යි හඟී. මෙලෙසට හඟින්නා වූ විශේෂ ඤාණය; භය ඤාණ, ආදීනව ඤාණ නම් වේ. මෙලෙස මේ ආකරයට ඤාණය පහළවීම දත යුතුය. විශේෂය වනාහි, **පවත්ත නිමිත්ත** යන මේවා මත වෙන වෙනම සළකා බැලීමක්, ප්‍රත්‍යවේක්ෂාවක් නොකර, හුදු මෙනෙහි කිරීමෙන් පමණක් බියවීමට කාරණයක් යැයි යන හැඟීම ලද හැකි වීමයි.

**උප්පාදය** නම් වූ ආරම්භය, **උපායාස** නම් වූ කෙළවර අතර ඇති පර්ව පහළොව තුළින් **උප්පාද, පවත්ත, නිමිත්ත, ආයූහනා, පටිසන්ධි** යන මේ පද පහ පමණක් මඟින් භය, ආදීනව ඤාණය යන මේවා පහළ වීමට මූලික අරමුණ වන බව දක්වන කථාවකි මේ. ගති ආදී පද දහය වනාහී පාළි වොහාර වශයෙන් සමාන බැවින් ද ඤාණය පුළුල් වූ ඇත්තන් විශේෂයෙන් එම වෝහාරයන් ප්‍රත්‍යවේක්ෂා කොටද පහළ විය හැකි බැවින් ද, අතිරේක ලෙස නැවතත් දේශනා කරන ලද සේක. එම පද දහය තුළින්, **නිබ්බත්ති, ජාති** යන පද දෙක **උප්පාද, පටිසන්ධි** යන පද දෙක හා අර්ථ වශයෙන් සමානවේ. ගති, **උපපත්ති** යන මේ පද දෙක වශයෙන් සමානවේ. **ගති, උපපත්ති** යන මේ පද දෙක **පවත්ත** පදය හා අර්ථ අතින් සමාන වේ. ජරා ආදී පද හය **නිමිත්ත** පදයටම ඇතුළත් වේ. එබැවින් **උප්පාද** ආදී පද සම්බන්ධයෙන් හැඟීමක් පහළ වී නම් එයම ප්‍රමාණවත් යැයි සැළකිය යුතුවේ.

තත්ථ භයාකාරෙන පවත්තං ඤාණං භයතුපට්ඨාන ඤාණං ඉතරාකාර වසෙන පවත්තං ආදීනව ඤාණන්ති දට්ඨබ්බං [මහා ටී.]

| | | |
|---|---|---|
| තත්ථ | = | එම භයාකාර ආදියෙහි |
| භයාකාරෙන | = | බිය වීමට කාරණයකැ යි වශයෙන් |
| පවත්තං ඤාණං | = | පහළවන ඤාණය |
| භයතු පට්ඨාන ඤාණං | = | භය ඤාණය නම් වේ |
| ඉතරාකාර වසෙන | = | ඉතිරි දුක්ඛ, සාමිස, සංඛාර යැයි හඟින ස්වභාව |
| පවත්තං ආදීනව ඤාණං | = | ආදීනව ඤාණය නම් වේ |
| ඉති දට්ඨබ්බං | = | මෙලෙස දත යුතුය. |

මේ ටීකාවට අනුව පාළි වාර හතර තුළින්, භයන්ති යන පදය සමඟ පඨම වාරයෙන් භය ඤාණය පහළ වන ආකාරය දක්වයි ඉතිරි වාර තුන මඟින් ආදීනව ඤාණය පහළ වන ආකාරය දක්වයි, වෙන් කොට දත යුතුය.

උප්පාද ආදීන් භය, දුක්ඛ, සාමිස, සංඛාර යැයි හඟින යොගීහට අනුත්පාදය, අප්‍රවෘත්තිය, සංඛාර නිමිති නැතිවීම, ආයුහන (=කර්මය) නැවත පහළ නොවීම යන මේවා වනාහී ඛෙම යැයි ද, සුඛ යැයි ද, වට්ටදුක-කාම ගුණ - කෙලෙස් යන ආහාරයෙන් මිදීම, නිවීම යැයි, නිවන අනුමාන කොට ප්‍රතිවිරුද්ධ ලෙසට සළකා බලන ඤාණය ද පහළ වේ. එබැවින් පටිසම්භිදා මග්ගයෙහි,

අනුප්පාදෙ ඛෙමන්ති සන්තිපදෙ ඤාණං - ආදී වශයෙන් ද

අනුප්පාදෙ සුඛන්ති සන්තිපදෙ ඤාණං - ආදී වශයෙන් ද

අනුප්පාදෙ නිරාමිසන්ති සන්තිපදෙ ඤාණං - ආදී වශයෙන් ද

අනුප්පාදෙ නිබ්බානන්ති සන්තිපදෙ ඤාණං - ආදී වශයෙන් ද

සන්තිපද ඤාණ වාර හතරක් ද දිගට දේශනා කරයි. මේ වාර හතර මාර්ගයෙන් දක්වන ලද සන්තිපද ඤාණය වනාහි භය ආදීනව ඤාණ නොවේ. එම ඤාණයන් ගෙන් පැවත එන ධර්ම ස්වභාව වශයෙන් පහළ වන ආනිශංස ඤාණයන් පමණක් වන්නේය.

ආදීනව ඤාණය බලවත් වූ කළ නිබ්බිද ඤාණය පහළ වේ. එම අවස්ථාවේ ආදීනව ඤාණය මඟින් ආදීනව දැකීමේ බලයෙන් මෙනෙහි කරන කරන වාරයේ නීරස අමිහිරි බව පමණක් හඟී. කල්පනා කිරීම සළකා බැලීම කරන්නේ නමුදු නීරස - අමිහිරි බවම හඟී. අඩුතරමින් කල්පනා කිරීම, සිතා බැලීම් පවා නීරස අමිහිරි කර යැයි හඟී. මේ ඤාණය පහළ වන ආකාරය ධම්මපදයෙහි මෙසේ දක්වා ඇත.

**සබ්බෙ සංඛාරා අනිච්චාති - යද පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා,**

**සබ්බෙ සංඛාර දුක්ඛාති - යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා**

**සබ්බෙ ධම්මා අනත්තාති - යද පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා** [ධ. ප.]

**සබ්බෙ සංඛාරා** = සියලු සංස්කාර

**අනිච්චාති** = අනිත්‍ය යැයි

**යද** = භංග ඤාණය මුදුන්පත් වූ අවස්ථාවෙහි

**පඤ්ඤාය** = පච්චක්ඛ ඤාණය තුළින් පහළ වූ (අන්වය විපස්සනා ඤාණය මඟින්)

**පස්සති** = දකී.

**අථ** = එලෙස දුටු අවස්ථාවෙහි

(මහා ටීකා දක්වීමට අනුව යද - යම් කලෙක **පඤ්ඤාය** - සම්මසන ඤාණයෙන් **පස්සති සම්මසති** = භාවනා කොට බැලීම් වශයෙන් සම්මසනය කරයි. අථ **පච්ඡා** - සම්මසනයට පසු කාලෙයහි, යන ලෙසට අර්ථ දෙයි)

**දුක්ඛෙ** = භය ඤාණය, ආදීනව ඤාණය මඟින් බියක් යැයි හැඟීමෙන් පසු ආදීනව දුටු කල්හී රූප - නාම දුක් මත

**නිබ්බින්දති** = කුටු පහටු නොවී සිත කළකිරෙයි.

**එස** = මෙලෙස කළ කිරවන ඤාණය

| | | |
|---|---|---|
| **විසුද්ධියා** | = | කෙලෙස් කසටින් පිරිසිදුවීම සඳහා (විසුද්ධත්ථාය වොදානත්ථාය - අට්ඨ කථා විවරණයයි) |
| **මග්ගො** | = | මාර්ගයයි. |
| **සබ්බෙ සංඛාරා** | = | සියලු රූප නාම සංඛාරයන් |
| **දුක්ඛාති** | = | දුක යැයි, නරක යැයි (ඉතිරිය ප්‍රථම ගාථාව හා සමාන යැ) |
| **සබ්බෙ ධම්මා** | = | සියලු නාම - රූප ධර්ම ස්වභාවයන් |
| **අනත්තා ති** | = | වසඟයෙහි පැවතිය හැකි ආත්මයක් නැත. මමෙක් නොමැත්තේ යැයි (ඉතිරිය ප්‍රථම ගාථාව හා සමානය) |

**භය - ආදීනව - නිබ්බිද** = යන මේ ඥාණ තුන නොමේරූ - මධ්‍යම හා මේරූ වශයෙන් පමණක් තුනට බෙදා දක්වයි. සංඛාරයන්ගේ ආදීනව ප්‍රකටව දැක - දැනගන්නා ස්වභාවය වශයෙන් වනාහි එකම ඥාණයක් වන්නේය. එම නිසාම සමහරෙකුට භය ඥාණය පහළ වී ක්ෂණයකින් ම ආදීනව ඥාණ, නිබ්බිදා ඥාණ යන මේවා දිගින් දිගට පහළ විය හැක්කේය. තවදුරටත් ඉහළ ඥාණයන් වෙත ඉක්මනින් දියුණු වන සමහර යොගාවචරයන්ට භය - ආදීනව - නිබ්බිදා ආකාර අතරින් එකක් දෙකක් පමණක් ප්‍රකට වීමද සිදුවිය හැක්කේය.

**තෙනා හු පොරාණා භයතු පට්ඨානං එක මෙව තීණි නාමානි ලභි, සබ්බ සංඛාරෙ භයතො අද්දසති භයතුපට්ඨානං නාම ජාතං, තෙසු යෙව සංඛාරෙසු ආදීනවං උප්පාදෙසීති ආදීනවානුපස්සනා නාම ජාතං, තෙසු යෙව සංඛාරෙසු නිබ්බින්දමානං උප්පන්නන්ති නිබ්බිදානුපස්සනා නාම ජාතන්ති. පාළියම්පි වුත්තං, යාච භයතුපට්ඨානෙ පඤ්ඤා යඤ්ච ආදීනවෙ ඤාණං, යාච නිබ්බිදා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති.**

[වි. ම.]

| | | |
|---|---|---|
| තෙන | = | එම නිසා |
| පොරාණා | = | පෙර ආචාර්යවරු විසින් |
| ආහු | = | කියන ලදී |
| භයතුපට්ඨානං එකමෙව | = | එකම භය ඤාණය ම |
| තීණි නාමානි | = | නම් තුනක් |
| ලභි | = | ලැබීය |
| සබ්බ සංඛාරෙ | = | සියලු සංස්කාරයන් |
| භයතො අද්දස | = | බයක් යැයි දකින ලදී |
| ඉති | = | මේ හේතුව නිසා |
| භයතුපට්ඨාන නාම | = | භය ඤාණය යැයි නම් විය |
| තෙසු යෙව සංඛාරෙසු | = | බියට කරුණකැයි දුටු එම සංඛාරයන් මතම |
| ආදීනවං | = | ආදීනව |
| උප්පාදෙසි | = | ප්‍රකට වීය. |
| | | (පාත්වාකාසි විභාවෙසි - ටීකා විවරණයයි) |
| තෙසු යෙව සංඛාරෙසු | = | ආදීනව දුටු එම සංඛාර මත ම |
| නිබ්බින්දමානං උප්පන්නං | = | කළකිරීම පහළ වේ. |
| ඉති | = | මේ නිසා |
| නිබ්බිදානුපස්සනා නාම ජාතං | = | නිබ්බිදා ඤාණ යැයි නම් විය |
| ඉති | = | මෙසේ පොරාණ ආචාර්යවරයන් වහන්සේලා විසින් කියනු ලැබීය. |
| පාළියම්පි | = | පටිසම්භිදා මග්ග පාළියෙහිද |
| යාච භයතුපට්ඨානෙ පඤ්ඤා | = | යම් වූ ඒ භය ඤාණය ද |
| යඤ්ච ආදීනවෙ ඤාණං | = | යම් වූ ඒ ආදීනව ඤාණය ද |

| | | |
|---|---|---|
| යාව නිබ්බිදා | = | යම් වූ ඒ නිබ්බිදා ඤාණය ද |
| අත්ථි | = | ඇත්තේය. |
| ඉමෙ ධම්මා | = | මෙම ඤාණයන් තුමූ |
| එකත්ථා | = | එකම ධර්ම ස්වභාවයක් ඇත්තාහ |
| බ්‍යඤ්ජන මෙව | = | ව්‍යාංජන වශයෙන් පමණක් |
| නානං | = | විවිධ වේ. |
| ඉති වුත්තං | = | මෙලෙස දේශනා කරන ලදී. |

*භය, ආදීනව, නිබ්බිද ඤාණ නිමියේ යැ.*

# මුඤ්චිතුකම්‍යතා, පටිසංඛා, සංඛාරුපෙක්ඛා ඤාණ

ඉමිනා පන නිබ්බිදාඤාණෙන ඉමස්ස කුල පුත්තස්ස නිබ්බින්දන්තස්ස උක්කණ්ඨන්තස්ස අනභිරමන්තස්ස සබ්බ භව යොනි ගති විඤ්ඤාණට්ඨිති සත්තාවාසගතෙසු සභෙදකෙසු සංඛාරෙසු එක සංඛාරෙපි චිත්තං න සජ්ජති න ලග්ගති න බජ්ඣති, සබ්බස්මා සංඛාරගතා මුඤ්චිතුකාම නිස්සරිතුකාමං හොති -පෙ- සබ්බ සංඛාරෙසු විගතාලයස්ස සබ්බසංඛාරගතා මුඤ්චිතුකාමස්ස උප්පජ්ජති මුඤ්චිතුකම්‍යතා ඤාණං [වි. ම. 489]

| | | |
|---|---|---|
| ඉමිනා පන නිබ්බිදාඤාණෙන | = | මේ නිබ්බිදා ඤාණය මගින් |
| නිබ්බින්දන්තස්ස උක්කණ්ඨන්තස්ස අනභිරමන්තස්ස | = | නිබ්බිදාව, උකටලී බව, අභිරමණ නොකරන බව ඇති |
| ඉමස්ස කුල පුත්තස්ස | = | මේ කුල පුත්‍රයා හට |
| සබ්බ භව -පෙ- සංඛාරෙසු | = | තුන්භවය, යෝනි සතර, පඤ්ච ගති, විඤ්ඤාණට්ඨිති හත, සත්තවාස නවය යන සියලු තන් හී පිහිටියා වූ බිදෙන සුළු වූ බොහෝ සංඛාර තුළ |

| | | |
|---|---|---|
| එක සංඛාරෙපි | = | එකක් වූ සංඛාරයක් මත ද |
| චිත්තං | = | සිත |
| න සජ්ජති න ලග්ගති | | |
| න බජ්ඣති | = | නො ඇලේ, නොලැගේ, නොබැඳේ. |
| සබ්බස්මා සංඛාරගතා | | |
| මුඤ්චිතුකාමං | = | සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති වේ |
| නිස්සරිතු කාමං හොති | = | හැර දැමීමට, වෙන්ව යාමට, පිටත් වීමට කැමති වේ. |
| අථ | = | එම අවස්ථාවෙහි |
| සබ්බ සංඛාරෙසු එවං | | |
| විගතාලයස්ස | = | සංඛාර සියල්ල කෙරෙහි මේ දක්වූ ක්‍රමයට ද බැඳීම දුරුවී ගියා වූ |
| සබ්බස්මා සංඛාරගතා එවං | | |
| මුඤ්චිතු කාමස්ස | = | සියලු සංස්කාර කෙරෙන් මේ දක්වූ ක්‍රමයට මිදෙනු කැමති වූ |
| අස්ස | = | එම කුල පුත්‍රයාට |
| මුඤ්චිතුකම්‍යතා ඤාණං | | |
| උප්පජ්ජති | = | මුඤ්චිතුකම්‍යතා ඤාණය උපදී |

*තුන් භවය යනු; කාම භවය, රූප භාවය, අරූප භවය යන මේවාය*

*සතර යෝනිය යනු; අණ්ඩජ බිත්තරවලින් උපන් සතුන්, ජලාබුජ = දරු ගැබින් උපන් සතුන්, සංසේදජ= කුණු කසල වලින් උපන් සතුන්, ඔපපාතික= ලගට හදිසියේම ඇදවැටුනා සේ පූර්ණව වැඩුණු කයක් ඇතිව වහාම පහළ වූ වර්ගයක සතුන් යන මේ හතර වර්ගයවේ.*

*ගති පහ යන්න; නරකය, තිරච්ඡාන යෝනිය, ප්‍රේත යෝනිය මනුෂ්‍යයෝනිය හා දේව නිකාය යන මේ පසය*

*විඤ්ඤාණට්ඨිති හත යන්න; මනුෂ්‍යයෝ ද, කාමාවචර දෙවියෝ ද එකිනෙකා වශයෙන් කාය වශයෙන් ද සමාන නැත. ප්‍රතිසන්ධි සංඥාව අතින් ද සමාන නැත. මනුෂ්‍යයන් එකිනෙකා වෙනස්කම් නැත දෙවියන් එකිනෙකා වශයෙන් වෙනස් නැත. එම නිසා*

1. **නානත්ත කාය නානත්ත සඤ්ඤී** නම් වේ. ප්‍රථම ධ්‍යාන බ්‍රහමයෝ, ද අපාගත සත්ත්වයෝ ද එකිනෙකා කය වශයෙන් වෙනස්ය. සඤ්ඤා නමුත් සමාන බැවින්

2. **නානත්තකාය - එකත්ත සඤ්ඤී** නම් වේ. ද්‍විතිය ධ්‍යාන බ්‍රහමයෝ, කය වශයෙන් එකිනෙකට සමානය. සඤ්ඤා වශයෙන් වෙනස්වේ. එබැවින්

3. **එකත්ත කාය - නානාත්ත සඤ්ඤී** නම් වේ. තතිය ධ්‍යාන බ්‍රහමයෝ ද වෙහප්ඵල බ්‍රහ්මයෝ ද එකිනෙකා වශයෙන් කයින් වෙන්ව සඤ්ඤාව යන දෙක අතින්ම සමාන බැවින්

4. **එකත්ත කාය - එකත්ත සඤ්ඤී** නම් වේ. සුද්ධාවාස බ්‍රහමයෝ ද මෙම චතුත්ථ විඤ්ඤාණට්ඨිතියෙහිලා ඇතුළත් වේ.

ආකාසානඤ්චායතන බ්‍රහමයෝ ද

5. **ආකාසානඤ්චායතන සඤ්ඤී** නම් වේ. විඤ්ඤාණඤ්චායතන බ්‍රහමයෝ

6. **විඤ්ඤාණඤ්චායතන සඤ්ඤී** නම් වේ. ආකිඤ්චඤ්ඤායතන බ්‍රහමයෝ ආකිඤ්චඤ්ඤායතන බ්‍රහමයෝ

7. **ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤා** නම් මේ හතයි.

මේ හතෙහි අසඤ්ඤසඤ්ඤී සහ නෙවසඤ්ඤානාසඤ්ඤා යන මේවාද යෙදෙන්නේ නම් සත්ත්වයන්ගේ ස්ථාන සත්තාවාස නවය බවට පත්වේ. යෝගී පුද්ගලයාගේ ඤාණය වනාහී අධ්‍යයන කළ, සිත තබාගත් ඇසූතාක් සියල්ල පමණක් සළකා බලා ප්‍රත්‍යාවෙක්ෂා කොට බැලිය හැක්කේය. සිතට නොවැටුනු ධර්මයන් වශයෙන් වනාහි කෙලෙස් ද පහළවිය නොහැක්කේය. ඤාණය ද පහළ විය නොහැක්කේය. නමුදු අඩු තරමින් තුන්භවය මත නිබ්බිදාව ඤාණය පහළ වී නම් විපස්සනාව සම්පූර්ණ වූවා වන්නේමය. මක්නිසාද යත් යෝනි-ගති ආදි නම් වනාහි එම තුන් භවයන්ටම පරියාය වූ ව්‍යවහාර පමණක් වන අතර නමින් පමණක් වෙනස් වන බැවිනි.

යම් තැනක ආදීනව දැක අභිරමණය නොකොට, කලකිරී නිබ්බිදාව පහළ කළ තැනැත්තාට එම තැනින් පිටත්ව යෑමට කැමැතිවීම එම ස්ථානය අතහැර දැමීමට කැමතිවීම සෑම විටම සිදුවන ධර්මතාවයකි. එබැවින් මෙනෙහි කළ යුතු අරමුණු-සංඛාර මත හා මෙනෙහි කරන විපස්සනා සංඛාර ද ප්‍රත්‍යවේක්ෂා කරන භව - යොනි - ගති ආදී සංස්කාරයන් ද අතහැරීමට කැමැති ස්වභාවය, වැඩිකල් නොගොස් පහළවේ. මෙම මිදීමේ කැමති, අතහැර දැමීමේ කැමති ස්වභාවය මුඤ්චිතුකම්‍යතා ඤාණය වේ. ඒ අවස්ථාවෙහි යෝගී තෙමේ යෑම, හිඳීම, නිදීම, නැවීම, දිගහැරීම ආදී කායික ඉරියව් සියල්ලද, දැකීම, ඇසීම, විඳීම සිතීම යන සිතේ ඉරියව් සියල්ලද, මනුෂ්‍ය භවය, දිව්‍ය භවය, පිරිමි බව, ස්ත්‍රී බව, බ්‍රහ්ම භවය ආදී ඇතිතාක් භවයන්ද, ඉවත දැමීමට, එයින් මිදීමට කැමති වේ. ඒවායින් මිදුණු වෙනත් තැනකට යෑමට කැමති වන්නේය. එම නිසා ම සමහර කෙනෙක් මෙනෙහි නොකර මනසිකාරය නොයොදා සිටීම වනාහී හොඳයැයි සළකා බලා කල්පනා කරයි. එළෙස සළකා බලන ආකාරයට ද මෙනෙහි නොකර නතර වී සිටීමට හැක්කේය.

## පටිසංඛා ඤාණ

සො එවං සබ්බ භව යොනි ගති ඨිති නිවාස ගතෙහි සභෙදකෙහි සංඛාරෙහි මුඤ්චිතුකාමො සබ්බසමා සංඛාරගතා මුඤ්චිතුං පුන තෙ යෙව සංඛාරෙ පටිසංඛානුපස්සනාඤාණෙන තිලක්ඛණං ආරොපෙත්වා පරිග්ගණ්හාති ... [වි. ම. 89]

| | | |
|---|---|---|
| සබ්බභව -පෙ- සංඛාරෙහි | = | සියලු භව යෝනි-ගති-ඨිති සත්තාවාසයන්හී පිහිටියා වූ බිඳෙන බව ඇති සංඛාරයන්ගෙන් |
| එවං මුඤ්චිතුකාමො | = | මේ දැක්වූ ආකාරයට මිදීමට කැමති වූ |
| සො | = | එම කුලපුත්‍රයා |
| සබ්බසමා සංඛාරගතා මුඤ්චිතුං | = | සියලු සංස්කාරයන්ගෙන් මිදීමට |

| | | |
|---|---|---|
| තෙ යෙව සංඛාරෙ | = | මෙනෙහිකොට දැනගත් එම සංස්කාරයන් ම |
| පටිසංඛානුපස්සනාඤාණෙන | = | නැවත භාවනා කරන පටිසංඛ්‍යා ඤාණයෙන් |
| තිලක්ඛණං ආරොපෙත්වා | = | ත්‍රිලක්ෂණයන්ට නංවමින් |
| පුන පරිග්ගණ්හාති | = | නැවත පරිග්‍රහ කොට බලයි |

සංඛාර ධර්මයන් මත නිච්ච, සුඛ, අත්ත යැයි බැඳීම සම්පූර්ණයෙන් දුරු කළේ නම් සංඛාරයන්ගෙන් මිදුනා වූ නිවනට වර්තමානව ම පත්වේ. එවන් පුද්ගලයා පරිනිබ්බානයට පත්වීමට කලින් ද, එම සංඛාරයන් සම්බන්ධයෙන් ව්‍යාපාර කිරීම, පශ්චාත්තාප වීම, චෛතසිකව දුක් විඳීමක් නොකරන්නේය. එම සංඛාරයන්ගෙන් මිදීම ද සිදු කළේය. පරිනිබ්බානයට පත්වූ විට එම සංඛාරයන්ගෙන් මිදේ යන්න අමුතුවෙන් කිවයුත්තක් නැත. එබැවින් සංඛාරයන්ගෙන් මිදුනේ නම් ඊට අමතරින් මිදීමක් අවශ්‍ය නොවේ. එම සංඛාරයන්ට අනිච්ච-දුක්ඛ-අනත්ත යැයි දක්ෂ ලෙස සූර ලෙස දැක දැන උපෙක්ෂකව බැලිය හැකිවනතෙක් දිගින් දිගට අතරක් නොතබා මෙනෙහි කිරීම පමණක් අවශ්‍යවේ. එබැවින් මුඤ්චිතු කම්‍යතා ඤාණයේ ශක්තිය නිසා සංඛාරයන්ගෙන් මිදීමට කැමති යෝගී තෙම ඇතිවන නැතිවන වාරයක් පාසා එම සංඛාරයන් ම නැවත නැවතත් දිගින් දිගට අතරක් නොතබා මෙනෙහි කළ යුතුවේ. මෙලෙස නැවත නැවතත් මෙනෙහි කරන විට අනිත්‍ය ආකාර දහය, දුක්ඛ ආකාර විසි පහ, අනත්ත ආකාර පහ යන මේ චත්තාලීසකාරයන් අතරින් එක් එක් ආකාරයක්, එසේ මෙනෙහි කරන වාරයක් පාසා යථා පරිදි ප්‍රකට ලෙස වැටහීම වේ. සංක්ෂේපයෙන් වනාහී අනිච්ච ලක්ෂණය, දුක්ඛ ලක්ෂණය, අනත්ත ලක්ෂණය යන මේ ත්‍රිලක්ෂණය තුළින් ගැළපෙන (යථා) පරිදි එකක මෙනෙහි කරන වාරයක් පාසා ප්‍රකටව පවතී. මෙලෙස දැකීම නැවත බැලීමක් නැවත දැන ගැනීමක් වන නිසා පටිසංඛඤාණ නම් වේ.

## අනිත්‍ය ආකාරයන්

යෝගීතෙම සමහර විටෙක මෙනෙහි කරමින් සිටින රූප-නාම සංඛාරයන්ට අනිච්චන්තික කෙළවර ඉක්මවිය නොහැක්කේය. එහිම වියෝ වන්නේය. ක්‍ෂය වී යන්නේයැයි දැක දැන පහදී.

(අ) සමහර විටෙක තාවකාලික එක මොහොතක් තරම පවතින්නේය. ක්‍ෂණයකට පමණක් පවත්නේ යැයි දැක දැන පහදී.

(ආ) සමහර විටෙක **උප්පාද වය පරිච්ඡින්නං**-ඇතිවීම නැතිවීම දෙකින් පිරිසිඳින ලදී. ඇතිවීම හා නැතිවීම යන මේ දෙක අතර පමණක් පිහිටන්නේය. ඇතිවී වහා නැතිවී යන්නේය. පහළ වීමට කලින්ද නොපැනේ, නැතිවී ගිය පසුද නොපැනේ. මේ දෙක අතරවාරයේ පමණක් පැනේ යැයි දැක දැන පහදී.

(ඇ) 1. වරෙක **අනිත්‍යයෙ**ය - නිත්‍ය නැතැයි දැනගනී

2. වරෙක **පලොක** - ජරා-ව්‍යාධි-මරණ යන මහා විනාශ භාවයන්ට පත්විය හැක්කේය.

ගං ඉවුර සේදී සේදී යමින් ඇදහැලෙමින් පවතිනා සේද. කඩදාසියක් ඉරන අවස්ථාවේ පැහැදිලිව ඉරී ඉරී යන්නා සේද ගින්නකට ජලය වත්කරන විට සූ, සූ හඬින් නිවී යන්නාසේ ද දූමකට සුලඟ වදින අවස්ථාවේ පාවී පාවී විසිරී විනාශ වී යන්නාසේ ද මෙනෙහි කරන කරන වාරයේ අරමුණ විශාල ලෙස විනාශ වී යාම දැක දැන ගන්නා අවස්ථාව මේ **පලොකානුපස්සනා**වට ඇතුළත්වේ.

3. වරෙක චල - ජරාවට පත්වෙයි, ලෙඩවෙයි, මියයයි. අතරක් නොතබා එකම චලනයක චලනය වෙමින් පවතින්නේ යැයි දැන ගනී. ඇතිවීම - නැතිවීම හා දිගින් දිගට බිඳී බිඳීයමින් පැවතීම මෙනෙහි කිරීමක් පාසා දැක ගෙන "කිසිවක් අචල නොවේ, ස්ථිර නොවේ. එකම චලනයක පවතින්නේ යැ"යි දැක දැන ගැනීමද **චලනානුපස්සනා**ව යැයි කිව යුතුවේ.

4. වරෙක පභංගු = ඉතාමත් පභංගුරය - මෙනෙහි කිරීම නොකල ද විනාශ වෙමින් විනාශ වෙමින්ම පැවතිය හැක්කේ යැයි දැන ගනී.

5. වරෙක අධුව - කොයි වේලාවේ හෝ විනාශ වී යා හැකිය. සථිර තාවයක් නැත්තේ යැයි දැන ගනී.

6. වරෙක විපරිණාම ධම්ම - මුල් ප්‍රකෘති ස්වරූපයෙන් නොතිබී ජරා, ව්‍යාධි, මරණ ආදියෙන් විපරීත භාවයට පත්විය හැක්කේය. මුල් ආරම්භය හා සමාන නොවී මේරී විනාශ වී ගොස් විපරීත වී යා හැක්කේයැයි දැනගනී.

7. වරෙක අසාරක - සාර වූ අරටුවක් හරයක් නැත්තේ යැයි දැන ගනී.

8. වරෙක විභව - සශ්‍රීක වීමක් වර්ධනයක් නැත්තේ යැයි දැන ගනී.

## අර්ථය වනාහී...

සන්තති ඝනය බිඳීමට කලින් "බිජුවටින් පැලයක්, පැලයකින් දළුපත්‍ර, අතු වැඩී ඒකකයක් වශයෙන් වැඩීමක් වර්ධනය වන්නාක් සේ මේ කය හා සිත ද ළමා කාලයේ සිට ක්‍රම ක්‍රමයෙන් සරුව වැඩෙමින් අද පවතින තත්ත්වයට පත්වන තෙක් අඛණ්ඩව පැවතියේ යැයි කල්පනා කරයි. සන්තති ඝනය බිඳී මේ අවස්ථාවේ වනාහී එලෙස නොසිතයි. පෙර පෙර කායික චෛතසික ඉරියව් එකකි. පසු පසු ඉරියව් හැසිරීම් තව එකකි, පෙර පෙර ඉරියව් පසු පසු ඉරියව් තෙක් පත් නොවී බිඳී, බිඳී ගියේය. පසු පසු ඉරියව් හැසිරීම් ද පෙර පෙර ඉරියව් වලින් පැන නැංගා නො වේ. එක එකක වූ රූප-නාමයකින් ඊට වෙනත් රූප-නාම පහළ වී සශ්‍රීක වී වර්ධනය වීමක් නැතැයි දැක දැන ගනී. මෙලෙස වටහා ගැනීමක් අදහස් කරන මුත් හේතු රූප-නාම නිසා ඵල රූප නාම පහළ නොවේයැයි අදහස් නොකෙරේ.

9. විටෙක සංඛත - කම්ම, චිත්ත, ඍතු, ආහාර, ආදී අදාල හේතුන්ගේ සමෝධානයෙන් ගොඩනැගේ. හේතු සමෝධානයෙන් පහළ වේ යැයි දැන ගනී.

10. වරෙක මෙනෙහි කරනවිට **මරණ ධම්ම** = මිය යා හැකි, විනාශ වී යා හැකි යැයි දැක දැන පහදී. මේවා වනාහී යථා පරිදි දැක දැන ගන්නා **අනිච්ච** = අනිත්‍ය ආකාරයන් වන්නාහ.

ඒ තුළින් අනිත්‍ය ස්වභාව පද දහය පමණක් පටිසම්භිදා මග්ගයෙහි අනිත්‍ය ආකාර වශයෙන් අනුපිළිවෙලින් දේශනා කොට ඇති පද වන්නාහ. (ආ.) (ආ.) (ඇ.) වශයෙන් මුලින් දක්වන ලද පද වනාහී අට්ඨකථා හී දක්වන ලද පදයෝය. එම පදතුන අනිත්‍ය පදයට ඇතුළත් කොට අනිත්‍ය ආකාර දහය ගණන් ගත යුතුය. **දුක්ඛ** සහ **අනත්ත** ආකාරයන් හිදු මුල් මුල් පද තුන මෙලෙසට ම යැයි සිත තබා ගතයුතු

## දුක්ඛ ආකාරයන්

යෝගී තෙම, වරෙක, මෙනෙහි කරමින් සිටින විට, රූප-නාම සංඛාරයන් **අභිණ්හ සම්පටිපීලන** = අතොරක් නොතබා ඇතිවීම්-නැතිවීම් දෙකින් දිගට පෙළමින් පවතී, උදය-වය දෙකින් දිගින් දිගට පෙළමින් පවතී යැයි දැක දැන පහදී

(අ) වරෙක **දුක්ඛම** - නොදැරිය හැකි යැයි දනී

(ආ) වරෙක **දුක්ඛ වත්ථු** - විවිධ දුක් දරන, මතුකරන තැනකැයි දැනගනී

(ඇ)1. වරෙක **දුක්ඛ** - දුක්යැ. නරකයැයි දැනගනී

2. වරෙක **රොග** - සම්පූර්ණයෙන් සුවනොවී නැවත නැවත නිතර නිතර මතුවන්නා වූ රෝගයක් හා සමාන යැයිද අසාධ්‍ය රෝගයක් හා සමාන යැයි දැනගනී.

3. වරෙක **ගණ්ඩ** - ගෙඩියක්, ගෝලයක් ලෙසට මතුවී ආ ගඩුවක් හා සමාන යැයි දැනගනී.

නොදැරිය හැකි බව, අනිත්‍ය බව, විපරිනාම වන බව යන වේදනා දුෂ්කරතාවකින් පෙළෙමින් සිටීම නිසාද ගඩුවකට හා සමාන වේ. මෙනෙහි කොට දතයුතු රූප-නාමයන් පහළ වී ආයේ නම් ක්ෂණයක් පමණක්

පැවතී විනාශ වී යන බැවින්ද, ඉදිමී ගිය ගෙඩියක් ඇගේ මතු වී විත් වැඩී ගොස් සැරව පිරී පුපුරු ගසා පැලී යාමෙන් වන තුවාලයකට සමාන වේ. සැරව පිරී පිළිකුල් බවට පත්වූ ගඩුවකට සමාන වූ කෙලෙස් ද ඉතිරී වැගිරෙන ස්වභාවය ඇති බැවින්ද තුවාලයකට, ගඩුවකට සමාන යැයි කියැවේ.

4. වරෙක සල්ල - ඇනීගත් උලක්, ඊයක් හා සමාන යැයි මෙහි අදහසයි.

ඉවසිය නොහැකි ලෙසට දුක් පීඩා ගෙන දිය හැකි නිසා ද කය සිත කාගෙන විනිවිද ගොස් දුක් ගෙනදිය හැකි බැවින්ද, උගුලුවා දැමීම දුෂ්කර හා වේදනාකාරී බැවින්ද ඇනීගත් ඊයක් මෙනැයි කියැවේ.

5. වරෙක අඝ - ගැරහිය යුතු හෙයින් පාප වශයෙන් යැයි අදහස් කෙරේ.

ආර්යයන් වහන්සේලා විසින් ගරහන ලද බැවින්ද ඇවැඩ දායක දෙයක් බැවින්ද නරක දෙයක් හා සමානවේ. අඝ වස්තුවන බැවින් හෙවත් නරක දෑයෙහි වාසස්ථානය වන බැවින්ද නරකයැ.

6. වරෙක අඝමූල - එවන් නරකට, පවට මුල්වන හෙයින් යැයි අදහස

7. වරෙක ආබාධ - ආබාධයකට හා සමානවේ යනුයි. රෝග පිණ්ඩයක් යැයි දැන ගනී.

තමා කැමති සේ නිදහසක් නොදී පෙළන බැවින්ද විවිධ රෝග ව්‍යාධි, ආදී ඇති කරවිය හැකි ආසන්නම කාරණය බැවින්ද රෝගයකට ආබාධයකට සමානවේ යැයි අදහසයි.

8. විටෙක ඊති = ඤාති ව්‍යසන ආදී නොයෙක් ව්‍යසනයන් ගෙනදිය හැකි බැවින් ඉදිරිපත් වූ බියක් සතුරෙක් හා සමාන යැයි දැනගනී.

9. විටෙක උපද්‍රව - නොඇසුවිරූ මහත් අනර්ථ පමුණුවන හෙයින් හදිසියේ පැමිණ පෙළීම නම් වූ උපද්‍රව හා සමානවේ. රාජ දණ්ඩණයන්ගේ ආශ්‍රය ස්ථානය වන බැවින්, රාජ ආදී බලවතුන් ගෙන් පැමිණෙන උපද්‍රව හා සමානවේ යැයි දැනගනී

10. විටෙක භය - බිය ජනක යැයි දැන ගනී. බියවන ආකාරයක් මෙන් වන බැවින්ද දුකින් මිදුනු නියම සුඛය වන්නාවූ නිවනෙහි ප්‍රතිපක්‍ෂය වන බැවින්ද බිය ජනකයැයි දැන ගනී.

11. වරෙක උපසග්ග - ඤාති ව්‍යසන ආදී බාහිර උපද්‍රව, දරුණු රෝග ආදී අභ්‍යන්තර අනර්ථ හා බැදී පවතී, රාක්‍ෂසී, යක්‍ෂණී බහිරව යක්‍ෂණී ආදී අමනුෂ්‍යන්ගේ ආවේෂයන් නිසා සිදුවන අනර්ථ මෙන්, ඉවසිය නොහැකි බැවින්, අමනුෂ්‍ය දෝෂ වලින් පෙළීමක් හා සමාන යැයි දැනගනී.

12. වරෙක අතාණ - දුක්, බිය නොවනු පිණිස ආරක්‍ෂාව ලබා දීමට පොහොසත් නොවන බැවින්, ක්‍ෂේම බව නොලැබිය හැකි යැයි දැනගනී.

13. වරෙක අලෙණ - එසේම ආරක්‍ෂක ස්ථාන සොයන්නවුන්ට ඒ සඳහා ලෙනක්සේ ආරක්‍ෂාවක් නොදෙන්නේ යැයි දැනගනී.

14. වරෙක අසරණ - ජාත්‍යාදී දුක් බිය නැසීමෙන් ආරක්‍ෂාව සැලසිය නොහැකි හෙයින් අසරණ යැයි දැනගනී. මොනතරම් ප්‍රණීත වූ නාම-රූප නමුත් පහළ වීමෙන් ජාති ආදී දුක් නිවීමක් කළ නොහැකි බැවිනි. නාම - රූප සංඛාරයෝ ඇති තාක් තාණ, ලෙණ, සරණ නොවන්නාහ. දුක් බිය නිවාදැමීමට කැමති පුද්ගලයාට ආරක්‍ෂාවක් ලබාදීමට නොහැක්කේය. දුක් බිය නිවාදැමීමට කැමති පුද්ගලයාට ක්‍ෂෙමය සඳහා වන ආරක්‍ෂක ස්ථානයක් නොවේ. විශ්වසනීය බවක් නැතැයි යන්න අදහස් කෙරේ.

15. වරෙක ආදීනව - අතරක් නොතබා පහළ වෙමින් පවතින විවිධ දුක් ගොඩක් ම වන බැවින්, ආදීනව ගොඩක් ම වේ. අඛණ්ඩව දුකට විපරිනාමයට පත් කළ හැකි බැවින් ආදීනව ඇත්තේය. නීච බැගෑ බැවින් පවතී යැයි දැනගනී

16. වරෙක වධක - බිඳීයෑමක් පාසා මරණයට පත්කළ හැකි බැවින් වධකයකු හා සමාන යැයි දැනගනී

17. වරෙක **සාසව** = ආශ්‍රවයනට හේතු වන්නේ යැයි දැනගනී.

18. වරෙක **මාරාමිස** - මාරයාට ගොදුරු යැ, ක්ලෙශයන් හි ආහාර යැයි දනී.

19. වරෙක **ජාති ධම්ම** - ජාති ස්වභාවය ඇත්තේය, නැවත මතු පහළ කළ හැකි ස්වභාවය ඇත්තේ යැයි දැන ගනී.

20. වරෙක **ජරා ධම්ම** = ජරාව ස්වභාවය ඇත්තේ යැයි දැනගනී

21. වරෙක **ව්‍යාධි ධම්ම** - ව්‍යාධි ස්වභාවය ඇත්තේ යැයි දැනගනී

22. වරෙක **සොක ධම්ම** - ශෝක ස්වභාවය ඇත්තේ යැයි දැනගනී

23. වරෙක **පරිදෙව ධම්ම** - පරිදෙව ජනක බව ඇත්තේ යැයි දැනගනී

24. වරෙක **උපායාස ධම්ම** - උපායාස ජනක බව ඇත්තේ යැයි දැනගනී

25. වරෙක **සංකිලෙසික ධම්ම** - සංක්ලෙශයනට විෂය වන හෙයින්ද සිත කෙලෙසන ස්වභාවයැයි දැක දැන වටහා ගනී.

මේවා වනාහී යථා පරිදි දැක දැන ගතයුතු දුක්ඛ ආකාර 25 වන්නාහුය.

විශේෂයෙන් සළකාගත යුත්ත නම්...

යට සම්මසනඥාණ පහළ වන අවස්ථාවෙහි ද, මෙම පටිසංඛා ඥාණ තරුණ අවස්ථාවේදී ද ඖලාරිකව ප්‍රකට වන විවිධ අපහසුතා, නොඉවසිය හැකි වූ අපහසුතා වර්තමානව දැක ගෙන **දුක්ඛමතො, දුක්ඛ වත්‍ථු තො, දුක්ඛතො, රොගතො, ගණ්ඩතො, සල්ලතො, අඝතො, ආබාධතො"** ආදීන්ට අනුව යොගී තෙම දුක්ඛ ආකාර බොහොමයක් දැක දැන පැහැදිය හැක්කේය. එම නිසාම විසුද්ධි මග්ගයෙහි; සම්මසන ඥාණ, පටිසංඛා ඥාණ යන මේ දෙතන්හී මේ ආකාරයෙන් සවිස්තරව දක්වන්නේ යැයි සළකා ගතයුතුවේ. විශේෂයෙන් වනාහී සම්මසන අවස්ථාවෙහි එක් එක් ආකාරයක දුක්ඛ වේදනාවන් පිරිසිඳ දත නොහැක්කේය. දැන් මෙම ඥාණ මට්ටමේදී මෙනෙහි කරන කරන වාරයේ වෙන් වෙන්ව පිරිසිඳ දැන ගනී. වෙනස මෙයයි.

අනත්ත ආකාරයන්

යෝගී තෙම වරෙක, මෙනෙහි කරන අවස්ථාවේ රූප - නාම සංඛාරයන් **අස්සාමික** - ස්වාමියෙකු නොමැති වූ ධර්ම ස්වභාවය පමණකැයි දැක දැන පහදී.

(අ) වරෙක **අනිස්සර** - යටතෙහි පැවැත්විය නොහැකි සබාව වූ ධර්ම ස්වභාව පමණක් ඇත්තේ යැයි දැක දැන පහදී.

(ආ) වරෙක **අවසවත්ති** - තම කැමැත්ත පරිදි වසඟයෙහි පැවැත්විය නොහැකි හුදු ධර්ම ස්වභාවයක් පමණක් යැයි දැක දැන පහදී

(ඇ) 1. වරෙක **අනත්ත** - ස්වාමී වූ ආත්මයක් නොවන්නේය.

- සදාකාලික ආත්මයක් නොවන්නේය.
- යෑම, දැකීම ආදිය කළහැකි ආත්මයක් නොවෙන්නේය.
- කැමති පරිදි පැවැත්විය හැකි ආත්මයක් නොවනනේය, ධර්ම ස්වභාවය පමණකැයි දැනගනී.

2. වරෙක **පර** - තම රුචිය පරිදි ද නොපවතී.

- වයසට නොයාවා ලෙඩ නොවේවා, නොමියේයා යැයි පාලනය කළ නොහැක බැවින්
- **අනුන්ගේ, නන්නාඳුනන්නකුගේ** ධර්ම සේ යැයි දැනගනී

3. වරෙක **රිත්ත** - නොනස්නා බවක් නැත, සුබවත් බවක් ද නැත, ශෝභන බවක් ද නැත, ආත්ම භාවයක් ද නැති නිසා ශූන්‍ය වූ හුදු ධර්මතාවයක් යැයි දැනගනී.

4. වරෙක තුච්ඡ - ද්‍රව්‍යාත්මක බවත් නැති, අල්ප වූද ධර්මයක් යැයි, ලාමක ධර්මයැයි දැනගනී.

5. වරෙක සුඤ්ඤ- ආත්ම භාවය අතින් ශූන්‍ය වූ ධර්මයකැයි දැනගනී.

අත්ත යන්න "පඤ්චස්කන්ධයාගේ හිමිකරුයැ. පඤ්චස්කන්ධ කුඩුවේ සදාකාලිකව සිටින්නකු, යැම දැකීම ආදිය කළහැකි සමෘධ කළ හැකි තැනැත්තායැ, හොඳ නරක විදිය හැක්කේයැ, කෙසේ කෙසේ විය යුතුදැයි වසඟයෙහි පැවැත්විය හැක්කේයැ, තමා කැමති පරිදි කළහැක්කේයැ"යි කල්පනාකොට පිළිගෙන බැඳීගන්නාවූ ආත්මයක්, සත්ත්වයෙක්, විඤ්ඤාණයක්, මමෙක් නොමැති හුදු ධර්ම ස්වභාවයකැයි දැක දැන පහදී. මේ වනාහී යථා පරිදි දත යුතු අනත්ත ආකාර පහ වෙත්.

මේ අනිච්ච, දුක්ඛ, අනත්ත ආකාර හතලිස අනිච්චතො, දුක්ඛතො, ආදී ලෙසට දේශනා කොට ඇති බැවින් චත්තාලීසාකාර විපස්සනා භාවනාව යැයි කියනු ලැබේ. එම ආකාර සතලිස මගින් ලබන ඤාණයන්ට ද **විපස්සනා සතලිස** යැයි කියනු ලැබේ. මෙම ආකාරයන්, සාමාන්‍ය බුද්ධිය, සුතමය ඤාණය අතින් දුර්වල අයට ප්‍රකට වීම දුර්වලය. සාමාන්‍ය බුද්ධිය මෝරා ඇති බොහෝ ඇසූපිරූ තැන් ඇති ඇත්තන්ට වනාහී ප්‍රකට භාවය ප්‍රබල විය හැක්කේය. ඉහළ මාර්ගයන් හී විපස්සනා අවස්ථාවන්හී වඩ වඩාත් බහුල ලෙස, වඩාත් ප්‍රකට පිරිසිදු ලෙස විය හැක්කේය. නමුදු **පඤ්චක්ඛන්ධෙ අනිච්චතො පස්සන්තො අනුලොමිකං ඛන්ති පටිලභති පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති** යනාදී දැක්වෙන පටිසම්භිදා දැක්වීම් වලට අනුව වුට්ඨාන ගාමිණී විපස්සනාව මගින් එක් එක් ආකාරයක් පමණක් හොඳින් දැක ගැනීමත් සමගම, මග්ගඤාණ පහළ වීමේ ස්වභාවය ඇති නිසා "ආකාර එකක් හොඳින් දැක දැන පහදි නම් මග්ග ඤාණයට ළඟාවීමට තරමට විපස්සනා ඤාණය සමෘධ වේ" යැයි අවිවාදයෙන් පිළිගත යුතු වන්නේ ම ය.

මේ පටිසංඛාඤාණය සමහර කෙනෙකුට එක් ක්ෂණයෙක් තුළම මෝරා ආ හැක්කේය. සමහරෙකුට එක් දිවාකාලයක්, එක් රාත්‍රියක්, එක්

දවසක්, දෙදවසක්, තුන් දවසක්, වශයෙන් මේවා කිසියම් කාලයක් ගත කිරීමෙන්ම බලවත් විය හැක්කේය. මේ ඤාණය ආරම්භයේ, තරුණ අවස්ථාවේ අභණ්හ සමපටිපීළනතො, දුක්ඛමතො ආදියට අනුව සංඛාරයන්ගේ ප්‍රිය මනාප බවක් නොමැති, නොඉවසිය හැකි ස්වභාවය විශේෂයෙන් ප්‍රකටව දැකගත හැකි බැවින් ද සංඛාරුපෙක්ඛාව මෙන් සමලෙස භාවනා කළ නොහැකි නිසාද, මෙනෙහි කොට දැනගන්නා දේ හොඳ නමුත් නරකම යැයි වැටහී යා හැක්කේය. අසතුටු විය හැක්කේය. මේ ඤාණය බලවත් වූ අවස්ථාවෙහි වනාහි මෙනෙහි කොට දැන ගැනීම විශේෂයෙන් හොඳ වී ආයේයැයි වටහාගත හැක්කේය. උදයබ්බය ඤාණ අවස්ථාවේ උපක්කිලේස හා මිශ්‍ර වූ ඤාණය, උපක්කිලේසයන් ගෙන් මිදුනු ඤාණය යන දෙවර්ගය අතර පවතින වෙනස මෙන්, මෙම පටිසංඛා ඤාණ අවස්ථාවේද, නොරුස්නා නොඉවසන බව හා මිශ්‍ර වූ අසතුටු දායක වූ මෙනෙහි කොට දැනගන්නා ඤාණය, නොරුස්නා බැවින් දුරුවූ සතුටුදායක වූ යුහුසුළු වූ මෙනෙහි කොට දැන ගැනීම හොඳ ඤාණය යන ලෙසට දෙවර්ගය බෙදා දැක්වේ. භංග ඤාණයේදී ද විහිදී විසිරී ගිය අසතුටුදායක දුෂ්කර ඤාණය, සමාහිතව මෙනෙහි කොට ලබන සතුටුදායක ඤණය යැයි දෙකොටසකට බෙදේ.

## සංඛාරුපෙක්ඛා ඤාණය

පටිසංඛා ඤාණය සම්පූර්ණයෙන් බලවත් වූ අවස්ථාවේ වනාහී ඇති නැති වෙමින් පවතින සංඛාර අරමුණ ලුහුබැඳ මෙනෙහි කිරීමට විශේෂ ව්‍යාපාර කිරීමක් අවශ්‍ය නොවේ. මෙනෙහි කරන වාරයක් වාරයක් පාසා සංඛාර අරමුණ බිඳි බිඳී යන ලක්ෂණය හා අනිත්‍ය, දුක්ඛ, අනත්ත යන ස්වභාව වලින් එකක් ප්‍රකටව දැනගැනීමට විශේෂයෙන් කළයුතු ව්‍යාපාරයක් නැත. සංඛාරාව සංඛාරෙ විපස්සන්ති - යන්නට අනුව ඉබේම මෙනෙහි කරමින් කරමින් දැනගනිමින් සිටින්නාක්සේ මෙනෙහි කිරීම ජවාධිකව බොහෝ කාලයක් පවතී. මෙනෙහි කරන වාරයේ බිඳෙන බව අනිච්ච, දුක්ඛ, අනත්ත බව යන තුනෙන් එකක් පැහැදිළිව ප්‍රකටව දකිමින් දනිමින් සිටී. විසුද්ධි මග්ගයෙහි සංඛාරුපෙක්ඛා ඤාණ කොටසෙහි දක්වන

ද්විකොටික භාවනා ක්‍රමය ආදියෙහි දක්වෙන ආකාරයට ද විශේෂ ඤාණය පහළවේ. පෙර ඤාණයන් පහළ වූ අවස්ථාවන්හී මෙන්, සංඛාරයන්ගේ ආදීනව දැකීම, කළකිරීම, මිදෙනු කැමැත්ත නුවණින් සළකා බැලීම, මෙනෙහි කිරීම හොඳ නැතැයි අසතුටුවීම යනාදී කිසිත් නොමැත්තේය. සංඛාර - වස්තු -ප්‍රත්‍යයක් විනාශ වන්නේ නමුදු පශ්චාත්තාප සිත් නරක් වීම් නොමැත්තේය. භය ඤාණයට අනුවද බියක් පහළ නොවේ. සිත ද ඉතාමත් පිවිතුරුය. කිසිකලෙකත් නොසිතුවිරූ සුඛයක් විඳින්නාක්සේ දැනේ. නමුදු මේතාක් සිත, විශේෂිත වූ ප්‍රසන්න වූ නමුදු, උදයබ්බය ඤාණ ආරම්භයේ මෙන් ප්‍රනීත සතුටක් නොපවතී. එළෙස වූ වින්දනයක් පහළ නොවේ. සාන්ත, සියුම් භාවනාමය දැනීමක් පමණක් අතරක් නොතබා, එක දිගට, බොහෝ කාලයක් පහළ වෙමින් පවතී.. එම අවස්ථාවෙහි විශේෂ ව්‍යාපාර කිරීමකින් තොරව ඉබේම මෙන් දිගින් දිගට දැකගනිමින් දැන ගනිමින් සියුම්ව පවත්නා විශේෂ ඤාණය සංඛාරුපෙක්ඛා ඤාණය නම් වේ.

**එවමෙව යං සබ්බ සංඛාරෙහි මුඤ්චිතුකාමො හුත්වා පටිසංඛානුපස්සනාය සංඛාරෙ පරිග්ගණ්හන්තො "අහං මමා"ති ගහෙතබ්බං අදිස්වා භයඤ්ච නන්දිඤ්ච විප්පහාය සබ්බසංඛාරෙසු උදාසීනො හොති මජ්ඣත්තො. තස්ස එවං ජානතො එවං පස්සතො තීසු භවෙසු චතුසු යොනිසු පඤ්චසු ගතිසු සත්තසු විඤ්ඤාණට්ඨිතිසු නවසු සත්තාවාසෙසු චිත්තං පටිලීයති, පටිකුටති පටිවත්තති, න සම්පසාරියති, උපෙක්ඛා වා පාටිකුල්‍යතා වා සණ්ඨාති. ඉච්චස්ස සංඛාරුපෙක්ඛා ඤාණං නාම උප්පන්නං හොති**

[වි. ම. 493]

එව මෙව = මහත් වූ දෝෂ දැක ගත් බැවින්, ඉතාමත් ආදරණීය වූ මනාප වූ ප්‍රියම්භිකාව නිරාලයෙන් බැහැර කළ පසු ඇය තවත් එක්තරා පුරුෂයෙක් සමඟ සම්බන්ධකම් පවත්වනවා දැක දැන ගත්තේ නමුදු සිත නරක් වීමක්, නොඉවසිය හැකි බවක්, දොම් -නස් වීමක් නොමැතිව, ගණන් නොගෙන උපෙක්ෂකවන පුරුෂයකුට හා සමානව (උදාසීනො මජ්ඣත්තො යන්න හා ගලපන්න)

| | | |
|---|---|---|
| අයං | = | මේ යෝගීතෙම |
| සබ්බ සංඛාරෙහි මුඤ්චිතුකාමො හුත්වා | = | සියළු සංස්කාරයන්ගෙන් මිදීමට කැමති වී |
| සංඛාරෙ | = | සංස්කාරයන් |
| පටිසංඛානු පස්සනාය පරිග්ගණ්හන්තො | = | නැවත මෙනෙහිකොට බලන පටිසංඛා ඤාණයෙන් පරිග්‍රහ කොට භාවනා කොට බැලූ කල්හී |
| අහං මමාති ගහෙතබ්බං අදිස්වා | = | මමය, මාගේ යැයි ගතයුතු, සිතිය යුතු යමක් නොදකින බැවින් |
| භයඤ්ච | = | උපේක්ෂාව නොමැති කල සංස්කාර වස්තූන්ගේ විනාශය ආදිය සම්බන්ධයෙන් පහළ විය හැකි බිය ද භය ඤාණය වශයෙන් පහළවන බිය ද |
| නන්දිඤ්ච | = | උපේක්ෂාව නොමැති විට, ප්‍රාර්ථනාදිය සමෘධ වීම, හරියෑම හා සම්බන්ධ වී පහළ විය හැකි ප්‍රියමනාප සතුටු බවද, භාවනාව සමෘධ වීම නිසා පහළ විය හැකි සතුටු මනාප බවද, |
| විප්පහාය | = | දුරුකොට (විශේෂ ව්‍යාපාරකොට දුරු කිරීමක් නොවේ, මතු නොවීමත්, ඉබේම දුරුවී යාමත් මෙයින් අදහස් කෙරේ) |
| සබ්බ සංඛාරෙසු | = | මෙනෙහිකොට සළකා බලන සියලු සංස්කාරයන් කෙරෙහි |
| උදාසීනො | = | ප්‍රිය, අප්‍රිය බව නොමැතිව සමව මෙනෙහි කිරීම, උපේක්ෂකව බැලීම |
| මජ්ඣත්තො | = | ප්‍රිය, අප්‍රිය බැවින් තොරව මැදහත් ස්වභාවය පහළවීම |

හොති = වේ.

එවං ජානතො
එවං පස්සතො තස්ස = මෙලෙස දැක දැනගත් එම යොගී හට

තීසු භවෙසු -පෙ-
නව සත්තාවාසෙසු = තුන් භවය, යෝනි සතර, පඤ්ච ගතිය, විඤ්ඤාණ ඨිති සත සහ සත්තාවාස නවය කෙරෙහි

චිත්තං = සිත

පටිලීයති = සැඟවී ගනී

පති කුටති = හැකිලේ

පතිවත්තති = නැවත හැරී එයි

න සම්පසාරියති = එදෙසට ප්‍රසාරණය වී නොයයි*

උපෙක්ඛා වා = සමබර දැනීම, අපක්ෂපාත බවද

පාටිකුල්‍යතා වා = පිළිකුල්, අප්‍රිය අමනාප බවද

සණ්ඨාති = මෙනෙහි කරන සිත මෙහි පිහිටයි

ඉති = මෙලෙස වූ විට

අස්ස = එම යෝගී හට

සංඛාරුපෙක්ඛා
ඤාණං නාම = **සංඛාරුපෙක්ඛා** නම් වූ ඤාණය පහළ වුනා වේ

(මෙහිලා දිව්කෝටික භාවනා ක්‍රමය ආදිය ද බහුශ්‍රැත භාවය සඳහා දක්වන්නෙමු)

---

*'න සම්පසාරියති' යන්න වනාහි කම්මකත්තා පදයයි. එවන් අවස්ථාවෙහි අරමුණු බොහොමයක් මෙනෙහි කරන්නේ නමුත් ඒ දෙසට නොදුවයි. ඉබ්බා මෙන් මනා ජවයකින් මෙනෙහි කරන මූල කර්මස්ථානයම දිගටම දැනගනිමින් පවතී. නතර වී භවය ආදිය සලකා බලන්නේ නමුදු මොන තරම් ප්‍රිය මනාප අරමුණක් වුව සිත ඉදිරියට නොදුවයි. හැකිලී සිටී. උත්සුක බවක් උනන්දු බවක් නොමැත. දිගින් දිගට සලකා බැලීම් කල්පනා කිරීම් කළ නොහැක. මෙනෙහි කොට දැන ගැනීම් විෂයට නැවත නැවතත් පැමිණේ. මෙයාකාර සිතක් පහළ වීම මෙහි දක්වන අදහසයි.

## ද්විකෝටික භාවනා ක්‍රමය

**පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටිසඤ්චික්ඛති - සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා** [ම. නි. 3/84]

මේ මජ්ඣිම නිකාය උපරිපණ්ණාසක ආනෙඤ්ජ සප්පාය සූත්‍රය ආදියට අනුව දෙයාකාරයකට, අන්ත දෙකකට වශයෙන් ශූන්‍ය බව භාවනා කරන ආකාරය විශුද්ධි මාර්ගයෙහි දක්වයි.

එම පාළියෙහි අර්ථය වනාහි,

| | | |
|---|---|---|
| **භික්ඛවෙ** | = | මහණෙනි, |
| **පුනච පරං** | = | නැවත ද භාවනා කරන ක්‍රමයක් වශයෙන් වනාහි |
| **අරිය සාවකො** | = | ආර්ය ශ්‍රාවක තෙමෙ |
| **වා** | = | ශ්‍රාවක යෝගී තෙම |
| **ඉති පටිසඤ්චික්ඛති** | = | මෙලෙස භාවනාකොට බලයි |
| **ඉදං** | = | මේ නාම-රූප |
| **අත්තෙන වා සුඤ්ඤං** | = | ආත්ම භාවයක්, මමෙක් වීම අතින් ශූන්‍ය යැ |
| **අත්තනියෙන වා** | | |
| **සුඤ්ඤං** | = | මගේ යන වස්තුවක් අතින් ද ශූන්‍ය යැ |
| **ඉති** | = | මෙලෙස භාවනාකොට බලයි. |

(**චක්ඛු ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා ති එවමාදීසු අත්තභාවෙන වා අත්තනිය භාවෙනවා ති අත්ථො. ඉතරථා හි චක්ඛු අත්තාවා අත්තනියං වාති අඤ්ඤෝ සිද්ධමෙව සියා** -යන රතන සූත්‍ර විවරණයේ යෙදෙන ඛුද්දක පාඨ අට්ඨ කථාව ඇසුරු කොට භාවාර්ථ හා සමඟ අර්ථය සම්බන්ධ කොට ගෙන ඇත.)

යෝගී තෙම මෙනෙහි කරන, සළකා බලන අවස්ථාවේ මෙනෙහි කරන, සළකා බලන රූප-නාමයන් තමා කැමති පරිදි සම්පූර්ණ කළ හැකි බව, තමා කැමති පරිදි පැවැත්විය හැකි බව යන ආත්ම භාවයෙන් ශූන්‍ය යැ, ආත්මයක් නොවන්නේය යැයි ද, ආත්මීය වස්තු යන බැවින් ද ශූන්‍ය යැ යැ=

ආත්මයක් හා සම්බන්ධ නැති හුදු ධර්මතා පමණකැයි ද ප්‍රකටව දැක පහදී. මෙලෙස ප්‍රකටව දකීනම්, ද්විකොටික භාවනා ක්‍රමය හා සමවී යැයි දත යුතු, මේ කොටස් දෙක තුළින් ආත්මයක් ඇතැයි සිතන්නේ නම් මට අයිති වස්තු ඇතැයි ද සිතිය හැක්කේය. ආත්මයක් ද නොමැත්තේ යැයි සිතන්නේ නම් ආත්මීය වස්තු ගැන සිතීමක් විය නොහැක. එබැවින් මමෙක්, ආත්මයක් නැතැයි මනාකොට දැක දැන ගත්තේ නම්, මගේ වස්තු නොවේ, මගේ වස්තු නැතැයි දෙවැනි භාගය වශයෙන් භාවනාකොට බැලීමද සම්පූර්ණ වේය.

## චතුෂ්කෝටික භාවනා ක්‍රමය

**පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටිසඤ්චික්ඛති. නාහං කවනි කස්සචි කිඤ්චි න තසමිං. නච මම කවචනි කිසමිඤ්චි කිඤ්චි නත්ථීති.**

මේ ආනෙඤ්ජ සප්පාය සූත්‍රය ආදියට අනුව චතුෂ්කෝටික භාවනා ක්‍රමය ද විසුද්ධි මාර්ගයෙන් උපුටා දක්වමු.

එම පාළියේ අර්ථය මනාහි

| | | |
|---|---|---|
| **භික්ඛවෙ** | = | මහණෙනි |
| **පුනච පරං** | = | නැවත ද භාවනා කරන ක්‍රමයක් ලෙස මනාහි |
| **අරිය සාවකො** | = | ආර්ය ශ්‍රාවක තෙමේ |
| **වා** | = | බුද්ධ ශ්‍රාවක යෝගීතෙම |
| **ඉති පටිසඤ්චික්ඛති** | = | මෙලෙස භාවනා කොට බලයි |
| **අහං** | = | මම |
| **කවචනි න අසමිං** | = | කිසිම තැනක නොමැත. කිසිම කාලයක නොමැත. කුමන ධර්මයේවත් නැත |
| **අහං** | = | මම |
| **කස්සචි** | = | කිසිවෙකුගේ |
| **කිඤ්චනතා- කිඤ්චනභාය** | = | ව්‍යාපාර කරන බවක් |
| **න අසමිං** | = | වීමක් නොමැත (නොවේ) |

(අධිප්පායතන විවරණය කරන අදාල අට්ඨ කථා ටීකාවන් ද, **කිඤ්චනං වුච්චති පලිබොධො සො න හොමි** යන තිකඞ්ගුත්තර අට්ඨ කථාද පිහිට කොට ගෙන **සඳ්‍යථය** ක්‍රමානුකූලව දක්වන අර්ථයවේ. **කිඤ්චනාති කොචි අප්පමත්තකො** යන පඤ්චඞ්ගුත්තර අට්ඨ කථාවට අනුව **කිඤ්චන** පදය අසාකල්‍යතන නිපාත පද යැයිද, **තසමිං හි** න යන්න ආගමයක් යැයිද ගෙන අහං **මම කසසචි** කිසිවෙකුගේ **කිඤ්චන** න අසමිං දෙයක් නොවේ. කිසිවක් හා සම්බන්ධ නැත යන මේ අර්ථය ගැනීම වටී )

**පරොච** = අනුන්ද

**කචචනි න අත්ථි** = කොතැනකවත් නැත, කොයිම කාලයකවත් නැත, කුමන ධර්මයේවත් නැත.

**සො** = එම අනෙකා

**කිසමිඤ්චි** = කිසිම තැනක

**මම කිඤ්චනතා**

**කිඤ්චනතාය** = මගේ ව්‍යාපාර කිරීම් බවක්

**න අත්ථි** = ඇත්තේ නොවේ, වන්නේ නොවේ. (**පරසස අත්තා** යන්න යොදාද, **මම** පදය පසු පදය හා බැඳීද **අධිප්පායතන** වශයෙන් විවරණය කරන අට්ඨ කථාවට අනුව **සඳ්දත්තය** සඳහා ක්‍රමානුකූලව ව්‍යාකරනානුකූලව ගොඩනැඟිය යුතු අර්ථය වේ. මෙහිදී ද **කිඤ්චන** පදය '**න**' ආගමය ගෙන "**සො** = එම අනෙකා **කිසමිඤ්චි** - කිසියම්ම හේතුවක් **මම කිඤ්චන** = මගේ වස්තු කිසිවක්, මා හා සම්බන්ධ කිසිවෙක්

**න අත්ථි** = නැත්තේය. මා හා කිසිම සම්බන්ධ කෙනෙක් නොවේ යන අර්ථය ද ගැළපේ.

## අර්ථය වනාහි

එම අවස්ථාවේ යෝගී තෙම මෙනෙහි කරන කරන වාරයේ බිඳී බිඳී යන ස්වභාවය පමණක් දක ගනී. තම අභිමතය පරිදි සම්පූර්ණ කළ හැකි ආත්මයක් - මමෙක් වනාහි දකගත නොහැක්කේය. එමනිසා ආත්මයක් මමෙක් කය ඇතුළත ද නැත. බාහිරයේ ද නැත. කිසිතැනෙකුදු නැත.

ඊයේද නොතිබිනි. දැනුදු නැත. අනාගතයේ ද නැත. කිසි ම කාලයක නොමැත. රූපයන් තුළ ද නැත. නාම තුළ ද නැත. යන, සිටින, හිඳින, හොවින, නවන දිගහරින ආදී කායික ඉරියව් වලද නැත. දැකීම, ඇසීම, පහස ලැබීම, කල්පනා කිරීම ආදී චෛතසික ඉරියව් වලද නැත. විවිධ හොඳ - නරක වේදනා වලද නැත. විවිධ සඤ්ඤා වලද නැත. විවිධ උත්සාහ කිරීම් - සකස්කිරීම් වලද නැත. මොනම ධර්මයකවත් මමෙක් නැතැ"යි නිශ්චිත ලෙස දැක දැන පහදී. මේතාක් දැක දැන ගැනීම් මඟින් ද එක් භාගයක් වශයෙන් ආත්ම ශූන්‍ය භාවය භාවනාකොට බැලීම සිදුවේ. ප්‍රථම භාගය වශයෙන් භාවනා කොට බැලීම සම්පූර්ණයැ.

තවදුරටත් මෙනෙහි කරන අවස්ථාවේ හෝ, මෙනෙහි කිරීම අනුව යමින් ප්‍රත්‍යවේක්‍ෂා කරන විට හෝ මෙලෙස බිඳෙන ස්වභාවය පමණක් ඇත්තේය, මමෙක් සතෙක් නැත්තේයැ'යි නොදැනීම නිසා මගේ පියායැ මගේ පුත්‍රයා යැ, මගේ අයියා යැ, මගේ මල්ලී යැ, මගේ ඤාති පුතා යැ ආදී වශයෙන් අනෙක් ඇත්තන් තමා හා සම්බන්ධ කොට ව්‍යාපාර කරත්. ඇත්ත වශයෙන් වනාහි මෙලෙස අනෙක් ඇත්තන් සම්බන්ධ කොට ව්‍යාපාර කරන මමෙක්ද නැත්තේ යැ"යි ද දැක දැන පහදී. මෙලෙස දැක දැන ගැනීමද ඉතිරි කොටස (භාගය) වශයෙන් ආත්ම ශූන්‍ය භාවය භාවනා කොට බැලීම වේ.

(කිඤ්චන යන්න පුද්ගලයකු ගෙන අර්ථය දක්වීමේදී "කිසියම් බාහිර කෙනෙකුගේ පියා, පුතා, අයියා, මල්ලී, ඤාති පුතා ආදීන් වන්නා වූ මම නම් වූ, කෙනෙක් නොමැත්තේ යැ, කිසිවක් නොමැත්තේය, බාහිර කෙනෙක් හා මම කිසිසේත්ම සම්බන්ධ නැතැයි දැක දැන ගනිඃ යන අර්ථය ගන්න). දෙවැනි භාගය වශයෙන් භාවනා කරන ක්‍රමය නිමියේයැ.

තවදුරටත් අනෙකෙකුගේ රූපය දකින විට, හෝ කටහඬ අසන අවස්ථාව හෝ මෙනෙහි කොට හෝ වේවා, මෙනෙහි කොට දැනගත්දේ අනුව ගොස් සළකා බලා හෝ වේවා, මෙසේ දැක දැනගනී. අනෙකෙකුගේ යැයි කිව යුතු ආත්මය= සත්ත්වයා කයෙහිද නැත, කයෙන් පිටද නැත. කොතැනකවත් නොමැත, පෙරද නැත, දැනුදු නැත, පසුවට ද නැත. කොයි කාලයේත් නැත. රූපයන්හි ද නැත. නාමයන්හී ද නැත, දැකීම් වල,

ඇසීම්වල ද නැත. රූප වල, සද්ද වලද නැත. කුමන ධර්මයක මුත් අනෙකෙක්, සතෙක් කිසිවෙක් නැතැයි නිපුන ලෙස දැක දැන පහදී. මෙලෙස දැක දැන ගැනීම්ද අනෙකෙකු (බාහිර කෙනෙකු) වශයෙන් ආත්මභාවයෙන් ශූන්‍ය බව භාවනා කොට බැලීම වේ. තුන්වන භාගය වශයෙන් භාවනා කොට බැලීම වේ.

තව දුරටත් "මෙලෙස බිඳෙමින් පවතින ධර්මය පමණක් ඇත්තේය. ආත්මයක් - සත්ත්වයෙක් නොමැත" යැයි පෙර නොදැන සිටි බැවින් "මම ව්‍යාපාර කළ යුතු මව, පියා, අයියා, මල්ලී, පුතා දුව ආදී අන්‍යයෙක් කෙනෙක් ඇත්තට ම ඇතැයි සිතාගෙන සිටියෙමි. ඇත්ත වශයෙන් නම් දැන් මෙන් බිඳෙමින් පවතින ස්වභාවය පමණක් පැවතියේය. මම සිත කරදර ගතයුතු කළ යුතු බාහිර කෙනෙක් තැනැත්තෙක් කිසිවෙක් ඇත්තේම නැත" යැයිද දැක දැන පහදී. මෙලෙස දැක දැන ගැනීමද බාහිර කෙනෙක් වශයෙන් ආත්ම ශූන්‍යභාවය භාවනාකොට බැලීම වේ. (කිඤ්චන - පදය ගෙන අර්ථ දැක්වීමේදී " මා හා බැඳුනු අනෙක් ඇත්තන් මෙන්ම දේවල් හා සම්බන්ධව මොනම හේතුවක් වත් නැත. දේවල් යාන්තම් වත් නැතැ"යි දැක දැන ගැනීම සළකා ගන්න, හතරවන භාගය වශයෙන් භාවනා කොට බලන ආකාරය මෙතෙකින් නිමියේය.

## සංක්ෂේපයෙන්

තම අභිමතය පරිදි පාලනය කළ හැකි මගේ ආත්මයක්ද නැත. අන්‍ය ආත්මයක්ද නැත, මා හා බැඳුනු අනෙකෙක්ද නැත. අන්‍යයන්ට බැඳුනු ආත්මයක්ද නැතැයි දැක දැන පැහැදීම හතර කොටඨාශයකට අනුව ආත්මය නම් ශූන්‍ය යැයි භාවනා කොට දැන ගැනීම නම් වේ. මෙම කොට්ඨාශ හතර තුළින්ද "ආත්මයක් නැතැ"යි නිපුන ලෙස දැක දැන පැහැදීමට ප්‍රධාන කාරණය වේ. මක්නිසාද යත්, ඇස්පනා පිටම "මමෙක් නැතැ"යි නිපුන ලෙස දැක දැන ගත හොත් මමෙක් නොමැති ලෙසින්ම අනෙකෙක් ද නැත, මා හා බැඳුනු බාහිර කෙනෙක් නැත. අනෙකෙකුට බැඳුනු ආත්මයක්ද නැතැයි පහසුවෙන්ම විභාග කොට විනිශ්චය කළ හැකි බැවිනි.

## සයාකාර භාවනා ක්‍රමය

සයාකාර ආදී භාවනා ක්‍රම නිදෙදස පාළියෙන් ගෙන විසුද්ධි මග්ගයෙහි දක්වයි. ඒවා මෙම ග්‍රන්ථයෙහි පාළි අර්ථය ගළපමින් දක්වන්නෙමු.

| | | |
|---|---|---|
| චක්ඛු | = | ඇස (චක්ඛු ප්‍රසාද රූපය) |
| අත්තෙන සුඤ්ඤං | = | ආත්ම භාවයෙන් ශූන්‍යවේ |
| අත්තනියෙන වා සුඤ්ඤං | = | මට අයිති භාවයෙන් ද ශූන්‍යවේ |
| නිච්චෙනවා සුඤ්ඤං | = | නිත්‍ය භාවයෙන්ද ශූන්‍යයැ |
| ධුවෙනවා සුඤ්ඤං | = | සථිර භාවයෙන්ද ශූන්‍යයයැ |
| සස්සතෙන | = | ස්ථාවරව සදාකාලික බැවින්ද ශූනය යැ |
| විපරිනාම ධම්මෙනවා සුඤ්ඤං | = | නොපෙරළී, මුල් ආකාරයටම තහවුරුව නොපවතින බැවින්ද ශූන්‍ය වේ. |
| ඉති | = | මෙලෙස භාවනා කොට බලයි. |

(මේ වනාහි චක්ඛු ද්වාරයෙහි භාවනාකොට බලන ආකාරයයි ඉතිරි ද්වාර, ආරම්මණ, විඤ්ඤාණ, ඵස්ස, වේදනා ආදීයෙහිදු භාවනා කොට බලන ක්‍රමය මේ හා සමානයැ.)

## අර්ථය වනාහි

දකින දකින අවස්ථාවෙහි මෙනෙහි කොට, දැකීමේ කෘත්‍යය සඳහා ඇසුර ලබාදෙන චක්ඛු ප්‍රසාද රූපය අභිමතය පරිදි පැවැත්වීමට හැකිවීම නම් වූ ආත්මභාවයක් නැති බැවින් ශූන්‍යවේ. මගේ ආත්මයද නොවේ. මගේ ආත්මයේ කොටස් වශයෙන්ද ශූන්‍යය. මගේ වස්තුවද නොවේ. නිත්‍ය භාවය අතින්ද ශූන්‍යයැ. නිත්‍ය නොවේ. ස්ථිර නොවේ. ස්ථාවරව සදාකාලිකවද පවතිනවා නොවේ. මුල් ස්වරූපයෙන්ද නොපවතියැ යි දැක දැන පහදී. අසන අවස්ථාව ආදියෙහි මෙනෙහි කොට සොතප්‍රසාද රූප ආදියෙහිද දැක දැන ගන්නා ආකාරය මේ ක්‍රමයට ම විස්තර වශයෙන් දැන ගන්න. මේ භාවනා කොට බලන ආකාරයෙහි **නිච්ච, ධුව සස්සත, අවිපරිණාම ධම්ම** යන මේ පද හතර ව්‍යවහාර වශයෙන් පමණක් වෙනස්

වේ. මූලික අර්ථය වශයෙන් සමානයැ. ආකාර වශයෙන් හය ආකාරයකට ආත්ම ශූන්‍ය භාවය භාවනා කොට බැලීම මෙතෙකින් නිමියේයැ.

## අට ආකාර භාවනා ක්‍රමය

| | | |
|---|---|---|
| **රූපං** | = | රූප |
| **නිච්චසාර සාරෙන වා** | = | නිත්‍ය සාර නම් සාර වශයෙන්ද |
| **අසාරං නිස්සාරං** | | |
| **සාරාපගතං** | = | අසාරයැ, සාරය නැත සාරයෙන් තොරයැ, |
| **ධුව සාර සාරෙන වා** | = | සථිර සාර නම් වූ සාර වශයෙන්ද අසාරයැ. සාරය නැත, සාරයෙන් තොරයැ. |
| **සුබ සාර සාරෙන වා** | = | සුබ සාර නම්වූ සාර වශයෙන් අසාරයැ, සාර නොවේ. සාරයෙන් තොරයැ. |
| **අත්ත සාර සාරෙන වා** | = | ආත්ම සාර නම් වූ සාර වශයෙන් අසාරයැ. සාරය නොවේ. සාරයෙන් තොරයැ. |
| **නිච්චෙන වා** | = | නිත්‍ය වශයෙන් ද අසාරය, සාරය නොවේ, සාරයෙන් තොරයැ |
| **ධුවෙන වා** | = | සථිර සාර බව වශයෙන් ද අසාරයැ, සාරය සාර නොවේ, සාරයෙන් තොරයැ |
| **සස්සතෙනවා** | = | සදාකාලික සාර භාවය වශයෙන් ද අසාරයැ, සාරය නොවේ, සාරයෙන් තොරයැ. |
| **අවිපරිනාම ධම්මෙනවා** | = | මුල් ස්වරූපයෙන් තහවුරු සාර බව වශයෙන් ද අසාරයැ, සාරය නොවේ. සාරයෙන් තොරයැ. |
| **ඉති** | = | මෙසේ භාවනාකොට බලයි |

(මේ වනාහි රූපස්කන්ධයේ ආකාර අට වශයෙන් ශූන්‍ය බව භාවනා කොට බලන ක්‍රමය වේ. නාම ස්කන්ධ හතර හා ද්වාර ආරම්මණ, විඤ්ඤාණ, ඵස්ස, වේදනා ආදිය කෙරෙහිද භාවනා කොට බලන ක්‍රමය මෙසේ මැයි. **මේ ක්‍රමයෙහි නිච්ච සාර, ධුව සාර, නිච්ච ධුව, සස්සත, අවිපරිණාම, ධම්ම** යන මේ පද හය ව්‍යවහාර අතින් පමණක් වෙනස්වේ.)

## දස ආකාර භාවනා ක්‍රමය

| | | |
|---|---|---|
| රූපං | = | රූප |
| රිත්තතො පස්සති | = | නිත්‍ය බව, සුඛ බව, සුභ බව, ආත්ම බව යන මේවායින් ශූන්‍යයැයි බලයි. |
| තුච්ඡතො | = | නිත්‍ය, සුඛ, සුභ, ආත්ම යන සාරයක නොමැති බැවින් තුච්ඡ-ප්‍රයෝජනයක් නොමැත්තේයැයි බලයි. |
| වා | = | කිසිම වටිනා දෙයක් ද්‍රව්‍යයක් නොවේ. තුනී හීන බැවින් වැදගැම්මකට නැති ධර්ම යැයි බලයි. |
| සුඤ්ඤතො | = | තමාගේ අභිමතය පරදි කළ හැකි ආත්ම සාරයක් අතින් ශූන්‍යයැයි බලයි. |
| අනත්තතො | = | තමාගේ අභිමතය පරිදි පාලනය කළ හැකි ආත්මයක් නැතැයි බලයි. |
| අනිස්සරියතො | = | තමාට නතුකරගෙන පාලනය කළ නොහැකි යැයි බලයි. |
| අකාමකාරියතො | = | තමා කැමති පරිදි පැවැත්විය නොහැකි, තමා කැමති පරිදි පැවැත්විය හැකි ඉරියව් නැතැයි බලයි. |

(පෙන පිඬුවකින් කෝප්පයක් වැනි භාජනයක් තැනීමට කැමති තැනැත්තාට එසේ එම භාජන කළ නොහැක්කාක් මෙන් රූප ධර්ම නිච්ච ලෙස, සුඛමත් ලෙස, සුභ ලෙස, ආත්ම ලෙස, පැවැත්වීමට කැමති තැනැත්තාට එසේ නිත්‍ය ලෙස, සුඛ ලෙස, සුභ ලෙස, ආත්ම ලෙස පැවැත්වීමට නොහැක්කේය. එබැවින් රූප වනාහී ආකාමකාරිය කැමති පරිදි පැවැත්විය නොහැකි, සම්පූර්ණ කළ නොහැකි ධර්ම නම් වේ. වෙනත් ආකාරයකට වනාහි අදාල හේතු ධර්ම එළඹ සිටි කල්හිම යෑම, සිටීම, හිඳීම, හොවීම, නැවීම, දිග හැරිම, උෂ්ණය, සිසිලස, ඇසේ ඔපය ආදී කිසියම් රූප ඉරියව්වක් පහළ විය හැක්කේය. තමාගේ රුචිය අනුව වනාහි එලෙස වූ කිසියම් රූපාකාරයක් පහළ කළ නොහැක්කේය. එබැවින්ද රූප වනාහි

අකාමකාරිය= කැමැත්ත පරිදි පැවැත්විය නොහැකි ධර්ම නම්වේ. ටීකා විවරණය අනුවයි.)

| | | |
|---|---|---|
| **අලබ්භනීයතො** | = | මෙලෙසට පමණක් සිද්ධවේවා හෝ එලෙස නොවේවායි බලාපොරොත්තු විය නොහැකි යැයි බලයි. |
| **අවසවත්තනතො** | = | කැමැත්ත පරිදිද සිදුනොවේ. කැමැත්ත පරිදි තම වසඟයෙහි පැවැත්විය හැකිද නොවේ යැයි බලයි. |
| **පරතො** | = | පරිපාලනයක් කොට ලබාගත නොහැකි බැවින් ආගන්තුක, බාහිර ධර්මයක් යැයි බලයි. |
| **විවිත්තතොපස්සති** | = | හේතු ධර්ම තුළද ඵල ධර්ම නැත. ඵල ධර්ම තුළද හේතු ධර්ම නැති බැවින් හේතු හා ඵල එකිනෙකින් වෙන්ව විසිතුරුව පවතීයැයි බලයි. |

**(කම්මාදි විය කාරණෙහි ඵලෙන ච විවිත්තතො, නහි කාරණෙන ඵලං, ඵලෙනවා කාරණං සාගබ්භං තිට්ඨති** - කර්ම හා විපාක යන දෙක එකිනෙකට අනුපූරක භාවයෙන් තොරය.)

**"කම්මං නත්ථි විපාකම්හි,**
**පාකො කම්මෙ න විජ්ජති**
**අඤ්ඤමඤ්ඤං උභොසුඤ්ඤා**
**නච කම්මං විනා ඵලං"**

යැයි දැක්වූ ආකාරයට ම එකිනෙකින් ස්වාධීන වන්නා සේ හේතු වලින් ද, ඵලයන්ගෙන් ද එකිනෙකා ස්වාධීනව පවතීයැයි බලයි. මේ වනාහි අර්ථයයි. ඇත්තය. ඵල ධර්ම වනාහි හේතු ධර්ම තුළ ගැබ්ගෙන, නිලීන ලෙස සැඟවී පවත්වනවා නොවේ. හේතු ධර්මද ඵලධර්මයන් ගැබ්ගත්තාක්සේ, නිලීනව සඟවාගන පවත්වන්නාක් සේ තබාගන්නවා නොවේ. ටීකා විවරණයයි.

අර්ථය පැහැදිලි වීම සඳහා (දෙවැනි භාගයේ පළමුකොටසේ පිටු අංක 91) පච්චය පරිග්ගහ ඤාණ දක්වන තැන ගාථාවේ අර්ථය නැවත

බලන්න. වේදනා සඤ්ඤා ආදීන් සම්බන්ධයෙන් ද භාවනා කොට බලන ක්‍රමය මෙලෙසට ම යැ. නිද්දෙස පාළියෙහි

**අපි ච දසහාකාරෙහි සුඤ්ඤතො ලොකං අවෙක්ඛති, රූපං රිත්තතො, තුච්ඡතො, අනත්තතො, අසාරකතො, වධකතො, විභවතො, අසමූලතො, සාසවතො සංඛතතො,**

මෙලෙස දසාකාර භාවනා ක්‍රම දක්වයි. අට්ඨ කථා හී දක්වන දසාකාරයෙහි මුල් හතර ආකාර මෙම පාලියට අනුව සමාන වේ. ඉතිරි හයාකාරයන් ශබ්දය හා අර්ථය අනුව පමණක් බෙදී ඇත.

## විශේෂයෙන් සැළකිය යුත්තක්

මෙම පාළියම ආධාර කරගෙන දසාකාර භාවනා ක්‍රම උපුටා දක්වන අට්ඨ කථාව පාළිය හා සම නොවී, වෙනස් වන ආකාර දක්වන අවස්ථාවෙහි මෙවන් විශේෂ අර්ථ සිත තබාගත යුතු. පාළි-අට්ඨ කථාහි දක්වන ලද භාවනා ක්‍රම ඇති තාක් දක්වා ඇති ලෙසට කටපාඩම්කොට හරියටම භාවනා කළ හැකි විට කෘත්‍යය, අර්ථය සමෘධ වනවා නොවේ. එළෙස කඩපාඩම් කරගෙන ඒ අනුවම භාවනා කිරීම සඳහා දක්වනවා නොවේ. ඇත්ත වශයෙන් වනාහි අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්‍ෂණයන්ට ඇතුළත්වන එම දක්වන ලද ක්‍රම වලින් ක්‍රම එකක් වේවා, ක්‍රම බොහෝමයක් වේවා හොඳින් දැන දැක පහදී නම් කටයුත්ත සමෘධ වේ. එක් එක් පුද්ගලයාගේ පාරමී ඤාණ හා අජ්ඣාසයන්ට අනුව දැක දැන ගන්නා වටහා ගන්නා ආකාර දැක්වීමට මෙහිලා කෙරේයැ"යි යන මේ අදහස තදින් සිත තබාගත යුතු.

## ද්වා දසාකාර භාවනා ක්‍රමය

| | | |
|---|---|---|
| **රූපං** | = | රූපය |
| **න සත්තො** | = | ආත්ම, ජීව, විඤ්ඤාණ, ආදී වශයෙන් සැළකිය යුතු සත්ත්වයකු නොවේ. |
| **න ජීවො** | = | ජීවියෙක් විඤ්ඤාණයක්, ආත්මයක් නොවේ. |
| **න නරො** | = | නරයෙක් නොවේ |

| | | |
|---|---|---|
| **න මාණවො** | = | මානවකයෙක් නොවේ. |
| **න ඉත්ථී** | = | ස්ත්‍රියක් නොවේ |
| **න පුරිසො** | = | පුරුෂයෙකු නොවේ |
| **න අත්තා** | = | වසඟයෙහි පැවැත්විය හැකි ආත්මයක් නොවේ. |
| **න අහං** | = | මමෙක් නොවේ. |
| **න මම** | = | මට අයිතිය ඇති වස්තු නොවේ. මට කිසිම සම්බන්ධයක් නැත. |
| **න අඤ්ඤස්ස** | = | අනෙකුගේ වස්තුවක් නොවේ. අනෙකෙකු හා කිසිම සම්බන්ධතාවක් ද නොමැත. |

**(නිද්දෙස පාළියෙහි මෙහිලා න කොචි** = කෙනෙක් නොවේ යැයි දැක්වේ)

| | | |
|---|---|---|
| **න කස්සචි** | = | තවත් කෙනෙකුගේ වස්තුවක් නොවේ කෙනෙක් හා කිසිම සම්බන්ධයක් නැත |
| **ඉති** | = | මෙසේ භාවනා කොට බලයි. |

(මේ වනාහි රූපයන් මත භාවනා කරන ආකාරයයි. වේදනා, සඤ්ඤා ආදිය මතද මෙලෙසටම භාවනා කොට බලන්න.)

මේ භාවනාකොට බලන ආකාරයෙහි **න අහං** - තෙක් පෙර පද අට ඇතිවීම්-නැතිවීම් නොමැතිව ශරීර කුඩුව තුළ නිත්‍ය ලෙස ඇත්තේ යැයිද, යෑම, හිඳීම,-සිටීම, හොවීම ආදිය කැමති පරිදි කළහැකි යැයිද යන ලෙසට වරදවා ගෙන තදින් ගන්නා ආත්මය, ජීවය, විඤ්ඤාණය, සත්ත්වයා යන මේ සියල්ල හැර දැමීමට කැමතිව දක්වන ලද පදයන් වෙත්. ලෝකයෙහි ව්‍යවහාරයේ පවතින සම්මුති සත්ත්වයා ආදිය වනාහි දුරු කිරිම සඳහා දක්වන්නක් නොවේ. **න අත්තනියා** ආදී පසු පද හතර එම ආත්මයට අයිතිදේ නොවේ. එම ආත්මය හා කිසිම සම්බන්ධතාවක් නැතැයි දක්වයි. ලෝකයෙහි ව්‍යවහාරයේ පවතින ඔහුගේ දේ, මගේ වස්තුව, ඔහුගේ අත-පය, මගේ අත-පය ඔහුගේ දූ දරුවෝ, මගේ දූ දරුවෝ යනාදී ලෙසට පවතින ව්‍යවහාරය වනාහි බැහැර කිරිම සඳහා නොවේ.

සමහරෙක් මෙයාකාර අට්ඨ කථා දැක්වීම් දැක මෙලෙස කියත් "බුද්ධ දේශනාවේ, පාළියෙහි සාමී-නිවාසී ආදී වශයෙන් බැඳීගන්නා ආත්මය

පමණක් බැහැර කරයි. බුද්ධඝොෂ ස්වාමීන් වහන්සේගේ අට්ඨ කථාවේ වනාහි මනුෂ්‍යයින්ගේ ව්‍යවහාරයේ පවතින ස්ත්‍රිය, පුරුෂයා, සත්ත්වයා ආදීන්ද බැහැර කරයි. එබැවින් අට්ඨ කථාව පාළිය හා නොගැළපේ" යැය දෝෂ දර්‍ශණයට ලක් කරයි. අට්ඨ කථාව ඇසුරු කළ නිදෙදස පාළියෙහි මුල් අදහස නොදැනීම හා අට්ඨ කතාචාර්‍ය්‍යයන්ගේ අභිමතය නොදත් බැවින් මෙය වැරදි ලෙස දක්වීමක්, වරදවා කීමක් පමණක්වේ. ඇත්ත වශයෙන් වනාහී. අට්ඨ කථාවන් හි අනත්ත සම්බන්ධයෙන් දක්වන ලද තාක් කථා සාමි-නිවාසී ආදී වශයෙන් බැඳීගත් එම ආත්මය ම බැහැර කරන කථාවක් ම වේ. එම නිසා ම විසුද්ධිමග්ග සම්මසන ඤාණ සම්බන්ධයෙන් (**අසාරට්ඨෙනාති සාමි නිවාසි කාරකො වෙදකො සයංවාසීති එවං පරිකප්පිතස්ස අත්තසාරස්ස අභාවෙන. සාමි නිවාසී කාරක වෙදකාධිට්ඨායක විරහිතතාය සුඤ්ඤතො, සයඤ්ච අසාමික භාවාදීතාය අනත්තතො** යැයි සහතික ලෙසට විවරණය කරන ලදි. මෙහිලා ද පාළි අට්ඨ කථාවන්හි අභිමතිය දන්නා මහා ටීකා ආචාර්‍ය්‍යය තෙම පහත දක්වෙන ලෙසට විවරණය කරයි.

**රූපං න සත්තොති ආදීසු යො ලොක වොහාරෙන සත්තො, රූපං සො නහොතීති අයමත්ථො ඉධ නාධිප්පෙතො තස්සාවුත්ත සිද්ධත්තා න හි ලොකො රූපමත්තං 'සත්තො'ති වොහරති, බාහිරක පරිකප්පිතො පන අත්තා 'සත්තො'ති අධිප්පෙතා, සොහි තෙහි රූපාදීසු සත්ත විසත්ථතාය, පරෙ ච සඤ්ජාපනට්ඨෙන සත්තොති වුච්චති, රූපං සො න හොතීති අත්ථො, සුඤ්ඤතා පටිග්ගණ්හන ඤාතත්ති, එස නයො 'න ජීවො' ති ආදිසුපි**

[මහා ටීකා (බු.) 2/357]

**රූපං න සත්තොති ආදීසු** = රූපය සත්ත්වයා නොවේ යනාදි ලෙසට බලා භාවනා කරන ක්‍රමයේදී

**ලොක වොහාරෙන යො සත්තො** = ලොකයා ව්‍යවහාර කරන ආකාරයට නම් යම් සත්ත්වයෙක් ඇත.

**රූපං සො න හොතීති** = රූපය එසේ ඒ කියන සත්ත්වයා නොවේ යැයි

| | | |
|---|---|---|
| අයං අත්ථො | = | මේ අර්ථය |
| ඉධ න අධිප්පෙතො | = | ආත්මයෙන් ශූන්‍ය බවට භාවනා කොට බලන මෙතැනදී නොකියැවේ. |
| කස්මා | = | මක්නිසා එසේ නොකියන්නේ ද යත් |
| තස්ස අවුත්ත සිද්ධත්තා | = | රූපය ඒ කියන සත්ත්වයා නොවේය යන එම අර්ථය විශේෂයෙන් නොකියාම ඉබේම ප්‍රකට කෙරෙන බැවිනි. |
| හි | = | ප්‍රකටය, ඇත්තය. |
| රූප මත්තං | = | රූප මාත්‍රය ම |
| සත්තොති | = | සත්ත්වයා යැයි |
| ලොකො න වොහරති | = | ලෝකයා ව්‍යාවහාර නොකරයි |
| පන | = | ඇත්ත වශයෙන් වනාහි |
| බාහිරක පරිකප්පිතො | = | බුද්ධ ශාසනයෙන් පිට බාහිර සාසනගත පුද්ගලයන් සිතා බලා බැඳීගන්නා |
| අත්තා | = | ආත්මය, විඤ්ඤාණය, යැයි කියන ආත්ම භාවය |
| සත්තොති අධිප්පෙතො | = | සත්ත්වයා යැයි කියනු ලැබේ. |
| හි | = | ඇත්තය |
| රූපාදීසු | = | රූප ආදියෙහි |
| සත්ත විසත්තාය ච | = | තමාටම ඇලී ගැලී බැඳී ගත හැකි බැවින්ද |
| පරෙ සඤ්ඤාපනට්ඨෙන ච | = | අන්‍යයන් තමා හා ඇලී බැඳී තබාගන්නා නිසාද |

සො = ආත්ම, විඤ්ඤාණ, ජීවය යැයි කියන එම ආත්මයට

සත්තොති = සත්ත්වයා යැයි

තෙහි වුච්චති = එසේ බාහිරක සාසනවල පුද්ගලයන් විසින් කියනු ලබත්

රූපං = මෙනෙහි කරන විටම බිඳී යන්නේ යැයි දැක දැන ගන්නා රූප

සො න හොති = එසේ ආත්මය -සත්ත්වයා නොවේ

ඉති අත්‍ථො = මෙය චනාහී හුවා දැක්වීමට අවශ්‍ය කරන අර්ථයයි

හි = එම කථාව ඇත්තය

එතං රූපං න සත්තො = 'රූපය සත්ත්වයා නොවේ යැ'යි බලා භාවනා කිරීම

සුඤ්ඤතා පරිග්ගණ්හනං = ආත්මය-මම යන මෙයින් ශූන්‍ය බව පරිග්‍රහ කරන ඤාණයයි

ඉති = මෙසේ දත යුතු

න ජීවොති ආදිසුපි = ජීවියක් නොවේ ආදී ලෙසටද භාවනා කොට බැලීමද,

එස නයො = 'න සත්තො' යන තැන දක්වන ලද මේ ක්‍රමයට මැයි

කතං මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං;

උප්පාදං මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං. පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං -පෙ- උපායාසං මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං. උප්පාදො දුක්ඛන්ති. -පෙ- භයන්ති. -පෙ- සාමිසන්ති. -පෙ- උප්පාදො සංඛාරාති -පෙ- උපායාසො සංඛාරාති මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං (ඤාණ තුන් ආකාරයන් දක්වන පටිසම්භිදා මග්ගය 114පිට)

### මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා පඤ්ඤා

මුලින් බැහැරකොට මැද දී බැහැර කිරීම සඳහා නැවත භාවනා කොටබලා අගදී විශේෂ ව්‍යාපාර නොකර උපේක්ෂකව භාවනා කොට සත්‍ය වශයෙන් හොඳින් ප්‍රතිපදාවෙහි පිහිටා දැන ගැනීම නම් වූ ප්‍රඥාව

| | | |
|---|---|---|
| **සංඛාරුපෙක්ඛා ඤාණං** | = | සංඛාරුපෙක්ඛා ඤාණය නම් වේ. |
| **තං** | = | එම ඤාණය |
| **කතං** | = | කෙසේ පහළවේද යත් |
| **උප්පාදං** | = | ප්‍රථමයෙන් පහළවීම |
| **වා** | = | ප්‍රථමයෙන් පහළවන සංස්කාර සමූහය |
| **මුඤ්චිතු කම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා පඤ්ඤා** | = | මුලින් බැහැරකොට, මැද දී බැහැර කිරීම සඳහා නැවත භාවනා කොට අගදී විශේෂ ව්‍යාපාර නොකර උපේක්ෂකව බලා සන්තතියක් ලෙස මනාකොට දැක පිහිටි ප්‍රඥාව |
| **සංඛාරුපෙක්ඛා ඤාණං** | = | සංඛාරුපෙක්ඛා ඤාණය නම් වේ. |
| **පවත්තං** | = | අවසානයක් කෙළවරක් නොමැතිව අඛණ්ඩව පහළවන සංඛාර ස්කන්ධය |
| **නිමිත්තං** | = | දෙයක්, කෙනෙක්, ද්‍රව්‍යයක් මෙන් පෙනුම්ඇති සංස්කාර රාශිය |
| **ආයූහනං** | = | සෞභාග්‍යය, සුබ ප්‍රාර්ථනාවෙන් උත්සාහ කොට එකතු කරන සංස්කාර රාශිය |
| **පටිසන්ධිං** | = | දිගින් දිගට පහළවීම සහිත අලුත් බව නමැති සංස්කාර රාශිය -පෙ- |
| **උපායාසං** | = | දැඩිලෙස ආයාසකරන |

මුඤ්චිතුකම්‍යතා පටිසංඛා
සන්තිට්ඨානා පඤ්ඤා = මුලදී බැහැර කොට, මැදදී බැහැර කිරීම සඳහා නැවත භාවනා කොට බලා අගදී විශේෂ ව්‍යාපාර නොකර මධ්‍යස්ථ ලෙස උපේක්ෂකව බලා සන්තතියක් ලෙස මනාකොට පවතින ප්‍රඥාව

සංඛාරුපෙක්ඛා ඤාණං = සංඛාරුපෙක්ඛා ඤාණය නම් වේ.

උප්පාදො = භවයෙහි මුල් පටන් ගැනීම

වා = ආරම්භයේ පටන් පහළවී ඇති වර්තමාන සංස්කාර සමූහය

දුක්ඛං = දුකයැ

ඉති = මෙසේ දැක දැන -පෙ-

භයන්ති = භය ජනක යැයි දැක දැන -පෙ-

සාමිසන්ති = වට්ටදුක, කාම ගුණ කෙළෙස් යන ආහාර සමග මිශ්‍රව පවතින්නේ යැයි දැක දැන -පෙ-

සංඛාරාති = නිශ්චල ශාන්ත නොවන සංස්කාර යැයි දැක දැන

මුඤ්චිතුකම්‍යතා පටිසංඛා
සන්තිට්ඨානා පඤ්ඤා = මුලදී බැහැරකොට, මැදදී බැහැර කිරීමට නැවත වරක් භාවනාකොට බලා අගදී විශේෂ ව්‍යාපාර නොකර සමලෙස උපෙක්ෂකව සන්තතිය වශයෙන් මනා ලෙස පිහිටා ඇති දැනීම = ප්‍රඥාව

සංඛාරුපෙක්ඛා ඤාණ = සංඛාරුපෙක්ඛා ඤාණය නම් වේ.

තත්ථ මුඤ්චිතුකම්‍යතා ච සා පටිසංඛා ච සන්තිට්ඨානා චාති මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා. ඉති පුබ්බභාගෙ නිබ්බිදා ඤාණෙන

නිබ්බින්දන්තස්ස උප්පාදීනි පරිච්චජිතු කාමතා මුඤ්චිතුකම්‍යතා මුඤ්චනස්ස උපායකරනත්ථං මජ්ඣෙ පටිසංඛානං පටිසංඛා, මුඤ්චිත්වා අවසානෙ අජ්ඣුපෙක්ඛණා සන්තිට්ඨනා [වි. ම. 496]

| | | |
|---|---|---|
| තත්ථ | = | එම පටිසම්භිදා මග්ග පාළියෙහි |
| මුඤ්චිතුකම්‍යතා ච | = | මිදෙනු කැමති ප්‍රඥාව යන්න ඇත්තය. |
| සා | = | එම ප්‍රඥාව |
| පටිසංඛා ච | = | නැවත භාවනා කරන ප්‍රඥාව යන්නද ඇත්තය |
| සන්තිට්ඨානාව | = | මනාකෙට පිහිටි ප්‍රඥාව යන්නද ඇත්තය. |
| ඉති | = | මේ තුන් ආකාර ශක්ති නිසා |
| මුඤ්චිතුකම්‍යතා පටිසංඛා | | |
| සන්තිට්ඨානා | = | මුඤ්චිතුකම්‍යතා පටිසංඛා සන්තිට්ඨානා නම් වේ. |
| ඉති | = | එසේ හෙයින් |
| පුබ්බභාගෙ | = | මුල් අවධියේ |
| නිබ්බිදා ඤාණෙන | | |
| නිබ්බින්දන්තස්ස | = | නිබ්බිදාඤාණයෙන් කලකිරුන තැනැත්තාට |
| උප්පාදාදීනි | = | උප්පාද ආදීන් මගින් දක්වන ලද සංස්කාරයන් |
| වා | = | උප්පාද ආදිය හා බැඳුනු සංස්කාරයන් |
| පරිච්චජිතුකම්‍යතා | = | මුදාලනු කැමැත්ත |
| මුඤ්චිතුකම්‍යතා | = | මුඤ්චිතු කම්‍යතා නම්වේ. |

(උප්පාද පවත්තා දී අපදෙසෙන වුත්තෙන සංඛාරෙ - තප්පටි බද්ධ ඡන්දරාග පහානෙනවිස්සජ්ජිතුකාමතා= උප්පාද ආදිය බැහැර කිරීම යැයි කියන තැන උප්පාදයෙන් පැවැත්ම ආදි පමණක් බැහැර කරයි යැයි නොගයුතු. උප්පාද පවත්ත යන මේවා හා බැඳුනු සංස්කාරයන් ද බැහැර කරනු කැමැත්ත යැයි ගතයුතු. බැහැර කරනු කැමැත්ත යන්නද එම සංස්කාර හා බැඳුනු ප්‍රියමනාප බව හා ඒ සඳහා ව්‍යාපාර කරන බැවින් මිදෙනු කැමැත්තම වේ. ටීකා

විවරණයේ අර්ථය මේ අට්ඨ කථා ටීකා විවරණයන්ද උප්පාදං ආදි කම්පදද සහිත පාළිය ද, උද්ධෘතකොට සකම්මක ධාතු වලින් සම්පූර්ණ මුඤ්චිතුකම්‍යතා පදයම මුල්පදය යැයි දත යුතු.)

**මුඤ්චනස්ස උපාය**

| | | |
|---|---|---|
| **කරනත්ථං** | = | මුදාලීමට හේතුව සම්පූර්ණ කරනු කැමතිව, |
| **මජ්ඣෙ පටිසංඛානං** | = | මධ්‍යයේ නැවත වරක් කරන භාවනාව |
| **පටිසංඛානං** | = | පටි සංඛා ඤාණය නම් වේ. |
| **මුඤ්චිත්වා** | = | බැහැර කොට |
| **අවසානෙ** | = | අවසානයේ |
| **අජ්ඣුපෙක්ඛණ** | = | විශේෂ ව්‍යාපාර නොකර සන්තතිය ලෙසට දැනීම ම පමණක් පහළ වී උපෙක්ෂකව බැලීම |
| **සන්තිට්ඨාන** | = | මනාකොට පිහිටි ප්‍රඥාව නම් වේ |

**(යාව නිබ්බානසම්පක්ඛන්දනා න ඉජ්ඣති - තාව විචිනනෙපි උදාසිනතාය ඤාණස්ස සන්තානවසෙන පවත්තිං සන්ධායාහ** = පටිසංඛා ඤාණය සම්පූර්ණලෙස බලවත් වූ තැන් පටන් නිවනට වැදගන්නා ගෝත්‍රභූ ඤාණයට යොමුව පවත්වන අතර වාරයේ සංස්කාරයන් විමසා සළකා බැලිය හැකි නමුදු විශේෂ ව්‍යාපාර නොකර හුදු දැනගැනීම් පමණක් සහිතව උපේක්ෂකව බලා, පවතින සන්තතිය පරිදි එක දිගටම දීර්ඝ කාලයක් දැනීම, ඤාණය පහළ වීම සළකා අජ්ඣුපෙක්ඛණා සන්තිට්ඨානා යැයි අට්ඨකථාහි දක්වයි යන්නයි)

මේ ඤාණ තුන මුල, මැද, අග- තරුණ,මධ්‍යස්ථ බලව වශයෙන් පමණක් වෙනස්වේ. අරමුණ හා මෙනහි කොට දැනගැනීම, සංඛාර ස්වභාවය පමණකැයි දැක දැන පැහැදීමේ ලක්‍ෂණ වශයෙන් වනාහි එකම ආකාරයක ඤාණයක්ම වේ. එබැවින් පටිසම්භිදාමග්ගයෙහිද පහත දැක්වෙන ලෙසට දක්වයි.

**යාච මුඤ්චිතුකම්‍යතා යා ච පටිසංඛානුපස්සනා යාච සංඛාරුපෙක්ඛා ඉමෙ ධම්මා එකත්තා බ්‍යඤ්ජන මෙව නානං** [වි. ම. 496]

| | | |
|---|---|---|
| යා ච මුඤ්චිතුකම්‍යතා | = | යම් මුඤ්චිතු කම්‍යතා ඤාණයක් වේද |
| යා ච පටිසංඛානුපස්සනා | = | යම් වූ ඒ පටිසංඛානුපස්සනා ඤාණයක් වේද |
| යා ච සංඛාරුපෙක්ඛා | = | යම් වූ සංඛාරුපෙක්ඛා ඤාණයක් වේද |
| ඉමෙ ධම්මා | = | මෙම ඤාණයන් |
| එකත්තා | = | සමාන ධර්ම ස්වභාවයන් වෙති |
| බ්‍යඤ්ජන මෙව | = | ව්‍යඤ්ජන වශයෙන්, නම් වශයෙන්, පමණක් |
| නානං | = | වෙනස් වේ. |

ස්වභාවය ලෙස එකම ඤාණයක් වන නිසාම සමහර පුද්ගලයන්ට මුඤ්චිතුකම්‍යතා, පටිසංඛා ඤාණ යන මේවා පහළවීමට පසු කල් නො යවා ක්‍ෂණයකින් ම සංඛාරුපෙක්ඛා ඤාණය පහළ විය හැක්කේය. මෙම සංඛාරුපෙක්ඛා ඤාණයට පත්වූ අවස්ථාවේ සමහර පුද්ගලයනට පමණක් අනුලොම, ගෝත්‍රභූ, මාර්ග ඤාණ, ඵල ඤාණ වහ වහා පහළවිය හැකිය. සමහරෙකුට වනාහී සංඛාරුපෙක්ඛා ඤාණය පමණක් වරෙක ඉතාමත් හොඳින්ද වරෙක එතරම් හොඳින් නොමැතිව ද දීඝ කාලයක් පහළ වෙමින් පැවතිය හැක්කේය එම නිසා විශුද්ධි මාර්ගයෙහි පහත සඳහන් ලෙසට දක්වයි.

**එව මෙව සචෙ සංඛාරුපෙක්ඛා ඤාණං සන්තිපදං නිබ්බානං සන්තතො පස්සති, සබ්බං සංඛාරප්පවත්තං විස්සජ්ජෙත්වා නිබ්බාන මෙව පක්ඛන්දති, නො චෙ පස්සති පුනප්පුනං සංඛාරාරම්මණ මෙව හුත්වා පවත්තති. තදිදං සුප්පග්ගෙ පිට්ඨං වට්ටියමානං විය, නිබ්බට්ටිතකප්පාසං විහනමානං විය නානාප්පකාරතො සංඛාරෙ පරිග්ගහෙත්වා භයඤ්ච නන්දිඤ්ච පහාය සංඛාර විචිනනෙ මජ්ඣත්තං හුත්වා තිවිධානුපස්සනා වසෙන තිට්ඨති.**

[වි. ම. 493]

---

නිරාලයභාවපච්චතියා අපෙක්ඛාවිස්සජ්ජන වසෙන විස්සජ්ජිත්වා ටීකා දක්වීමයි. පටිසංඛා ඤාණය බලවත්වී නම් සංඛාරයන් කෙරෙහි පෙර මෙන් ඇලෙන බැඳෙන ගතිය, ව්‍යාපාරකරන ගතිය නොමැත්තේය. දුරු කරයි. මෙලෙස ඇලුම් බැඳුම් වලින් වෙන්වීමම ඇලුම් බැඳුම් වලට පාදක වන සංස්කාරයන් ද බැහැර කළා නම් වේ.

එව මෙව - පෙර කාලයේ සමුද්‍ර තරණය කරන්නා වූ නාවිකයන් මුහුද මැදදී ආසන්න වෙරළ පිහිටි දිසාව අනුමාන කළ නොහැකි අනතුරු අවස්ථාවලදී ආසන්න වෙරළ ඇති දිසාව පරීක්ෂා කිරීම සඳහා ලිහිණියකු හෝ පරෙවියකු නැවෙන් නිදහස් කරන්නේ එම පක්ෂියා වෙරළක් දකින්නේ නම් එම වෙරළ දිසාවට ම පියාඹා යන්නේය. වෙරළක් පෙනෙන තෙක් මානයේ නැත්නම් නැවත නැවට ම හැරී එන්නේය. යන මේ උපමාවට අනුව

| | | |
|---|---|---|
| **සංඛාරුපෙක්ඛා ඤාණං** | = | සංඛාරුපෙක්ඛා ඤාණය |
| **සන්තිපදං** | = | රූප නාම සංස්කාරයන්ගේ සංසිඳීමෙන් මාර්ග - ඵල ඤාණ මඟින් ළඟාවිය යුතු |
| **වා** | = | සංස්කාරයන් ද සංසිඳීමට ළඟාවීම සඳහා සුදුසු වූ |
| **නිබ්බානං** | = | නිවනට |
| **සන්තතො** | = | සංඛාර සංසිඳීම් වශයෙන් |
| **සචෙ පස්සති** | = | ඉදින් දකින්නේ ද |
| **එවං සති** | = | මෙලෙස දකින්නේ නම් |
| **සබ්බං** | = | සියළු |
| **සංඛාර පවත්තං** | = | අතරක් නොතබා නොසිඳ පහළ වෙමින් පවතින සංස්කාර නම් වූ අරමුණ |
| **විස්සජ්ජෙත්වා** | = | ඉවත දමා, අතහැර |
| **නිබ්බානමෙව** | = | සංස්කාරයන්ගේ සංසිඳීම නම් වූ නිවන් අරමුණට ම |

| | | |
|---|---|---|
| පක්ඛන්දති | = | වැදගනී (නිවන් අරමුණට වා - සංස්කාර සංසිඳීම සංස්කාරයන්ගේ විරමණ ස්වභාවයට වැදගන්නාසේ සිත පහළ වේය යන්න කියැවේ.) |
| නො ච පස්සති | = | ඉදින් නොදකින්නේ ද |
| එවං සති | = | මෙසේ නොදකින්නේ නම් |
| සංඛාරම්මණමෙව හුත්වා | = | ඇති වෙමින් නැතිවෙමින් පවතින සංස්කාරයන්ම අරමුණු කොට මනසිකාරය පවත්වා දැන ගෙන |
| පුනප්පුනං පවත්තති | = | නැවත නැවතත් පහළ වේ |
| තදිදං | = | එම සංඛාරුපෙක්ඛා ඤාණය |
| සුප්පග්ගෙ | = | කුල්ලෙහි |
| වට්ටියමානං පිඨං විය | = | පොළනු ලබන කල්හි කුලු අග පොළනු ලබන පිටි සියුම් වී යන්නාක් මෙන් |
| විහට්ටීයමානං නිබ්බට්ටිත කප්පාසං විය | = | (කපු පොළන දුන්නෙන් පොළා) ඇට හරන ලද කපු පුළුනක් මෙන්ද) |
| හුත්වා | = | වී |

(මෙ උපමා දෙක මගින් නැවත නැවතත් මෙනෙහි කොට භාවනා කිරිම බහුල කළ කල්හී ඤාණය වඩ වඩාත් තියුණුවී සියුම් වී යැම දක්වයි)

| | | |
|---|---|---|
| සංඛාරෙ | = | මෙනෙහි කරන කරන වාරයේ බිඳී බිඳී යන්නා වූ සංස්කාරයන් |
| න නානප්පකාරතො පරිග්ගහෙත්වා | = | නා නා ක්‍රමයෙන් පරිග්‍රහ කොට මෙනෙහි කොට |
| භයඤ්ච | = | කාමාරම්මණ වස්තූන්ගේ විනාශ වීම හා බැඳී බිය වීම සන්ත්‍රාස වීම, භය ඤාණය වශයෙන් බියවීම ද |

| | | |
|---|---|---|
| නන්දිඤ්ච | = | කාමාරම්මණ වස්තු වලින් සමෘධ වීම හා බැඳීගත් ආශාව ද ඇලීම, බැඳීම, මෙනෙහිකොට දැනගැනීම හොඳ නිසා පහළ විය හැකි ආශාව මනාපය ද |
| පහාය | = | ප්‍රහානය කොට දුරු කොට |
| සංඛාර විචිනෙනෙපි | = | සංස්කාරයන් විමසා බලා මෙනෙහි කොට දැනගැනීමෙහිදු |
| මජ්ඣත්තං හුත්වා* | = | විශේෂ ව්‍යාපාර නොකර, සම්පූර්ණයෙන් ව්‍යාපාර කිරීම නතර නොකර, මධ්‍යස්ථ සමබර ස්වභාවයට පත්වී |
| තිවිධානුපස්සනා වසෙන | = | අනිච්ච දුක්ඛ අනත්තානුපස්සනා යන අනුපස්සනා තුන වශයෙන් |
| තිට්ඨති | = | පිහිටයි |

මෙම අට්ඨ කථාහි දැක්වෙන සංඛාරුපෙක්ඛා ඤාණයට වනාහි නිවන දැකිය හැක්කේයැයි කීම අනුලොම ඤාණය පහළ වන තාක් වුට්ඨාන ගාමිණී වශයෙන් ක්‍රමයෙන් බලවත්වීම සළකා කියන ලද කියමනකි. එම ඤාණයෙන්ම පටන් ගෙන නිවනට වැදගනී යැයි කීමද අනුලොම ඤාණය ගෝත්‍රභූ ඤාණ යන ඤාණයන් ද සහිතව සාමූහිකව එකම ඤාණයන් වී එකත්ත නය ක්‍රමයට දැක්වීමකි. කෙළින්ම දක්වනවා නම් සංඛාරුපෙක්ඛා ඤාණය බොහෝ වාරයක් පහළ වී විශේෂයෙන් තියුණු පැහැදිලි වී සුර වී මුදුන් පත් වූයේ නම් අනුලොම ඤාණය පහළ වේ. එම අනුලෝම ඤාණයේ වේගය නිසා ගෝත්‍රභූ ඤාණය පහළ වී නිවන දැක ගනී. එම නිවන් අරමුණට වැදගනී යැයි කියනු ලැබේ. පහත දැක්වෙන්නේ අදාල මහා ටීකා විවරණයයි.

තික්ඛ විසද සූරභාවෙන සංඛාරෙසු අජ්ඣුපෙක්ඛණෙ සිජ්ඣමානෙ තං සංඛාරුපෙක්ඛා ඤාණං අනෙක වාරං පවත්තමානං පරිපාක ගමනෙන අනුලොම ඤාණස්ස පච්චය භාවං ගච්ඡන්තං "නිබ්බානං සන්තතො පස්සති නාම", තථාභූතඤ්ච සංඛාරපවත්තං විස්සජ්ජෙත්වා නිබ්බානමෙව පක්ඛන්දති නාම" තයිදං ඉධ ඤාණං අනුලොම ගොත්‍රභූ ඤාණෙන සද්ධිං එකත්තං නෙත්වා වුත්තං එකත්ත නය වසෙන [මහා. ටීකා. (බු.) 2/456]

| | | |
|---|---|---|
| තික්ඛ විසද සූර භාවෙන | = | තියුණු පැහැදිළි සූර භාවයෙන් |
| සංඛාරෙසු අජ්ඣුපෙක්ඛණෙ | | |
| සිජ්ඣමානෙ | = | ආරම්මණ සංස්කාර, විපස්සනා සංස්කාරයන්හි විශේෂ ව්‍යාපාර නොකොට භය හා නන්දිය දුරකොට මධ්‍යස්ථ ලෙස භාවනා කොට බැලීම අනුව සම්පූර්ණ කරන ලද |
| තං සංඛාරුපෙක්ඛා ඤාණං | = | එම සංඛාරුපෙක්ඛා ඤාණය |
| අනෙක වාරං පවත්ත මානං | = | බොහෝ වාරයක් පහළ වන කල්හී |
| පරිපාක ගමනෙන | = | පූර්ණ-බලවත් භාවයට පත්වූ බැවින් |
| අනුලොම ඤාණස්ස පච්චය | | |
| භාවං ගච්ඡන්තං | = | අනුලොම ඤාණයට ආධාර කළ හැකි භාවයට පත්වූ |
| නිබ්බානං සන්තතො | | |

---

* පච්චයස්ස සිඛාපත්තතාය සංඛාරෙසු විය තෙසං විචිනනෙපි උදාසීනං හුත්වා = සංඛාරුපෙකඛා ඤාණය බලවත්වූ කළ විමසා බලා භාවනා කිරීම මස්තකප්‍රාප්ත වී ඇති බැවින් විශේෂ ව්‍යාපාර නොකර මෙනෙහි කොට දතයුතු සංඛාරාරම්මණයන්ද ඉබේම මෙන් ප්‍රකට වෙමින් ප්‍රකට වෙමින් පවතී. එවා විමසා බලා මෙනෙහි කොට දැන ගැනීමද ඉබේම මෙන් පහළ වෙමින් පහළ වෙමින් පවතින් දතයුතු අරමුණුද ඉබේම මෙන් ප්‍රකටවී, දැන ගැනීමද ස්වකීය ජවය අනුව තමාම ඉබේම සිදුවෙමින් පවතින්නේ යැයි ප්‍රකට වේ. එම නිසා" සංස්කාරයන් කෙරෙහි විශේෂ ව්‍යාපාර නොකර බිය - හෝ මනාප බව යන දෙකම ප්‍රහානය කොට මධ්‍යස්ථ ලෙස භාවනා කළ හැකිසේ එම සංස්කාරයන්ගේ භංගය අනිත්‍යභාවය ආදිය වටහා ගැනීමට විශේෂ ව්‍යාපාර නොකර මධ්‍යස්ථව භාවනා කළ හැක්කේය යන්න අදහසයි. ටීකා දැක්වීමයි.

| | | |
|---|---|---|
| පස්සති නාම | = | නිවන, සංස්කාරයන්ගේ නිවීම ශාන්ත වශයෙන් දකී නම් වේ. |
| ච | = | මෙපමණක් නොව |
| තථාභූතං | = | එලෙස වූ ඤාණය |
| සංඛාර පවත්තං විස්සජ්ජෙත්වා නිබ්බාන මෙව පක්ඛන්දති නාම | = | නිමාවක් නොමැතිව පහළ වන සංස්කාර පැවැත්ම බැහැරකොට නිවනට ම වැදගනී නම් වේ. |
| තයිදං ඤාණං | = | එම සංඛාරුපෙක්ඛා ඤාණය |
| ඉධ | = | මෙහිලා |
| අනුලෝම ගොත්‍රභූ ඤාණෙහි සද්ධිං එකත්තං නෙත්වා | = | අනුලොම ඤාණය, ගොත්‍රභූ ඤාණ යන මේවාද සමඟ එකම ඤාණයක වශයෙන් ගෙන |
| එකත්ත නය වසෙන වුත්තං | = | එකත්ත න්‍යාය වශයෙන් කියනු ලබයි. |

*මුඤ්චිතු කම්‍යතා, පටිසංඛා, සංඛාරුපෙක්ඛා ඤාණ නිමියේ යැ*

## අනුලෝම, ගොත්‍රභූ, මාර්ග, ඵල ඥාණ

දක්වන ලද ක්‍රමයට අනුලෝම ඥාණය පහළ කළ හැකි වන මට්ටමට සංඛාරුපෙක්ඛා ඥාණය සම්පූර්ණ වූ විට, බලවත් වූ විට අධිමොක්ඛ ශ්‍රද්ධාව විශේෂයෙන් ශක්තිමත් වී, එම ශ්‍රද්ධාවේ බලය නිසා මෙනෙහි කොට දැනගන්නා සිත ඉතාමත් විසද භාවයට පත්වේ. තවදුරටත් අධික- අවම නොවී මධ්‍යස්ථ ලෙස උත්සාහ කරන වීර්‍යයද තහවුරුවේ. එළඹ සිටි සතිය ද මනාකොට පිහිටයි. සිත ද මෙනෙහි කටයුතු අරමුණ මත මනාකොට බැසගන සිටී. දැන ගැනීම කරන සංඛාරුපෙක්ඛා ඥාණය ද විශේෂයෙන් තියුණු විසද බවට පත්වේ. එම නිසා මෙනෙහි කොට දැන ගැනීම සූර වී ප්‍රකට වී හොඳින් දියුණු වී ඇතැයි ප්‍රකටව තමාටම වැටහේ.

එම අවස්ථාවෙහි ඇතිවෙමින් - නැතිවෙමින් යන සංස්කාරයක් අනිච්ච -දුක්ඛ -අනත්ත යන තුන් ආකාරයන් තුළින් එක් ආකාරයක් වශයෙන් භාවනා කොට බලා සදිසානුපස්සනා විරීය අඩුතරමින් දෙතුන් වතාවක් පහළවේ. පහළවන ආකාරය වනාහිඃ එම දෙතුන් වතාව තුළින් ප්‍රථම වතාවේ අනිත්‍ය යැයි බලන්නේ නම් දෙවැනි තුන්වන වතාවන්හී ද 'අනිත්‍ය යැ'යි ම බලයි. ප්‍රථම වතාවේ 'අනත්ත' යැයි ඉදින් බලන්නේ නම් දෙවැනි තුන්වන වතාවේද අනත්ත යැයි බලයි. එසේ නොමැතිව ප්‍රථම වතාවේ 'දුක්ඛ' යැයි බලන්නේ නම්, දෙවැනි තුන්වන වතාවේද දුක්ඛ යැයි භාවනා කොට බලයි මෙලෙස එක් ආකාරයකින්ම දැක දැනගෙන දෙතුන් වතාවක් භාවනා කොට බලයි යන්න අදහසයි. අනිච්ච ආකාරය යන්න කියන තැන

දක්වන ලද අනිත්‍ය ආකාර දහය තුළින් එක් ආකාරයක් ගනී. දුක්ඛ අනත්ත ආකාරයන් යැයි කියන තැන්හීදීද දක්වන ලද දුක්ඛ ආකාර විසිපහ හෝ අනත්ත ආකාර පහ යන මේවායින් එක් ආකාරයක් ගනී

## වුට්ඨාන ගාමිනී විපස්සනා

අවසානය වන්නා වූ මෙම **සඞ්ඛාරුපෙක්ඛා** වීථි දෙවතාව තුන් වතාව තුළ ඇතුළත් සංඛාරුපෙක්ඛා ඤාණය මුදුන්පත් වන බැවින් **සිඛා පත්ත සංඛාරුපෙක්ඛා** යැයිද නම්වේ. මාර්ගය හා සම්බන්ධවී මාර්ගයට පත්විය හැකි බැවින් **වුට්ඨාන ගාමිණී විපස්සනාව** යැයිද කියයි. මාර්ගය විපස්සනාවේ අරමුණ වන්නා වූ සංඛාර නිමිත්ත අරමුණු නොකරයි. එබැවින් නිමිත්තෙද වුට්ඨානය වේ. පහළ විය හැකි ඒ ඒ කෙලෙස්, කම්, විපාක කියන පවත්තයන්ද නැවත නොඑන ලෙසට නිවාදැමිය හැක්කේය. එබැවින් පවත්තතයෙන්ද වුට්ඨානය වේ. මේ නිමිත්ත-පවත්ත යන දෙකින්ම වුට්ඨානය වන බැවින් මාර්ගඤාණය වුට්ඨාන නම්වේ. මුදුන්පත් වූ සංඛාරුපෙක්ඛා, අනුලොම, ගොත්‍රභූ යන මේ ඤාණ තුන වුට්ඨාන නම් ලත් මාර්ගය හා අනුක්‍රමයට පහළ වන බැවින් වුට්ඨාන ගාමිණී මාර්ග ඤාණයට පත්වන විපස්සනා නම් වේ. එබැවින් අභිධම්මත්‍ථ සංග්‍රහයෙහි මෙසේ දක්වයි,

**යා සිඛාප්පත්තා, සා අනුලොමා සංඛාරුපෙක්ඛා වුට්ඨාන ගාමිනී විපස්සනාති ච වුච්චති.**

**යදි වුට්ඨානගාමිනී විපස්සනා අනත්තතො විපස්සති සුඤ්ඤතො විමොක්ඛො නාම හොති මග්ගො. යදි අනිච්චතො විපස්සති, අනිමිත්තො විමොක්ඛො නාම. යදි දුක්ඛතො විපස්සති අප්පණිහිතො විමොක්ඛො නාම.**

## අර්ථය සුගමයි

කෙටි තේරුම පමණක් උපුටා දක්වන්නෙමු. අනුලෝම ඤාණය හා මුදුන්පත් සංඛාරුපෙක්ඛා ඤාණය වුට්ඨාන ගාමිණී විපස්සනාව යැයි ප්‍රථම ඡේදයෙන් දක්වයි. එම වුට්ඨාන ගාමිණී විපස්සනාවෙන් 'අනත්ත' යැයි භාවනා කොට බලන්නේ නම් යන කථාවෙන් **සඤ්ඤානුපස්සනා** පහළ වීම දක්වයි. සංඛාරුපෙක්ඛාව ද 'අනත්තයැයි' බලයි. අනුලෝම ඤාණය ද

'අනත්ත යැයි බලයි යන්න එයින් අදහස් කෙරේ. 'අනිච්චා යැයි' බලයි, දුක්ඛ යැයි බලයි යන කථාවෙන් ද මේ ක්‍රමයට ම දක්වයි. දුක්ඛ යැයි බලයි යන කථාවෙන් ද මේ ක්‍රමයටම දක්වයි මේ ගැන ගැඹුරින් සලකා බලන්න.

**සික්ඛාපත්ත විපස්සනාති වා වුට්ඨානගාමිනීති වා සංඛාරුපෙක්ඛාදි ඤාණත්තයස්සෙව එතං නාමං, සා හි සිඛං උත්තම භාවං පත්තත්තා සිඛාපත්තා වුට්ඨානං ගච්ඡතීති වුට්ඨාන ගාමිනී, වුට්ඨානං වුච්චති බහිද්ධ නිමිත්තභූතතො අභිනිවිට්ඨ වත්ථුතො චෙව, අජ්ඣත්ත පවත්තතො ච වුට්ඨාහනතො මග්ගො, තං ගච්ඡතීති වුට්ඨාන ගාමිනී, මග්ගෙන සද්ධිං ඝටීයතීති අත්ථො.**

[වි. ම. 496 ]

| | | |
|---|---|---|
| **සික්ඛාපත්ත විපස්සනාති වා** | = | සික්ඛාපත්ත විපස්සනා කියා හෝ |
| **වුට්ඨානගාමිනීති වා** | = | වුට්ඨානගාමිනීති කියා හෝ |
| **එතං නාමං** | = | මෙම නම් දෙක |
| **සංඛාරුපෙක්ඛාදි** | | |
| **ඤාණත්ත යස්සෙව** | = | සංඛාරුපෙකඛා, අනුලෝම, ගොත්‍රභූ යන ඤාණ තුන පොදුවේ නම් කරයි. |

**(සංඛාරුපෙකඛා, අනුලොම, ගොත්‍රභූ සඞ්ඛාතත්තය ඤාණස්ස ටීකා දැක්වීම)**

| | | |
|---|---|---|
| **හි** | = | ඇත්තය |
| **සා** | = | එම විපස්සනා ඤාණ තුන |
| **උත්තමභාවං** | = | උත්තම භාවය |
| **සිඛං** | = | මුදුන් පත් බවට, ශිඛරයට |
| **පත්තත්තා** | = | පත්වූ බැවින් |
| **සිඛාපත්තා** | = | **සිඛා පත්තා නම් වේ.** |
| **වුට්ඨානං ගච්ඡතීති** | = | නැඟී සිටීමට පත්වූ, ගමන් කළ බැවින් |
| **වුට්ඨානගාමිනී** | = | වුට්ඨානගාමිනී නම් වේ. |
| **බහිද්ධානිමිත්තභූතතො** | = | භාවනා කටයුතු බාහිර විපස්සනා අරමුණක් නිමිත්තක් ලෙස |

| | | |
|---|---|---|
| අභිනිවිට්ඨ වත්ථුතො චෙව | = | මනසිකාරය පැවැත්විය යුතු භාවනා කටයුතු අජ්ඣත්තික- බාහිර සංස්කාර වස්තු වලින්ද 1* |
| අජ්ඣත්ත පවත්තතො ච | = | ස්ව සන්තානයෙහි පහළවිය හැකි කෙලෙස් ප්‍රවාහය, විපාකස්කන්ධ ප්‍රවාහයෙන් ද |
| වුට්ඨහනතො | = | අරමුණු නොකිරීම, නැවත පහළ නොකරවීම වශයෙන් බහාතැබිය හැකි බැවින් 2* |
| මග්ගො | = | මාර්ගයට |
| වුට්ඨානං | = | වුට්ඨාන යැයි |
| වුච්චති | = | කියනු ලැබේ |
| තං ගච්ඡතීති | = | එම වුට්ඨාන නම් වූ මාර්ගයට යාගතහැකි, පත්විය හැකි, බැවින් |
| වුට්ඨාන ගාමිනී | = | වුට්ඨානගාමිනී නම් වේ. |
| මග්ගෙන සද්ධිං ඝටීයති | = | මාර්ගය හා සම්බන්ධ වේ |
| ඉති අත්ථො | = | මේ වනාහි වුට්ඨාන ගාමින හි අර්ථයයි 3* |

---

1* මෙහිලා බහිද්ධා යන්න වනාහි අනුන්ගේ සන්තාන, අනින්ද්‍රිය බද්ධ වූ දේවල් පමණක්ම අදහස් කරනවා නොවේ. විපස්සනා ඤාණවලින් පරවූ = බාහිරවූ ධර්ම යන්නද භාවනා කොට බැලිය යුතු බැවින්, ස්වසන්තාන ගත මූල කර්මස්ථානයෙන් පරිබාහිර ධර්මයන් ද විපස්සනාවට අරමුණු වන්නේ නම් ඒවාද බාහිරම වන්නේය. ටීකා විවරණය බලනු මැනවි.

2* වුට්ඨහනඤ්ච නෙසං ආරම්මණ කරණං ආයතිං අනුප්පත්ති ධම්මතා පාදනඤ්ච = නැගිටීම යනු සංස්කාරයන් අරමුණු නොකිරීම, කෙලෙස්, විපාකස්කන්ධ යන මේවා මතු නොපවත්නා තත්වයට පත්වීමම වේ. (ටීකා විවරණයයි) තුවාලයක් සුව වූ කෙනෙක් තුවාලයෙන් නැගී සිටියේ යැයි කිව හැකි වන්නාක්සේ සංස්කාර අරමුණු, කෙලෙස්, විපාක ධර්ම යන මේවායේ නිවීමම ඒවායින් නැගී සිටීම යැයි කියනු ලැබේ. විශේෂ පාලි යෙදුමකි.

3* මෙම විසුද්ධි මග්ගයෙහි ගොත්‍රභූ ඤාණයටද වුට්ඨානගාමිනී යැයි කියනු ලැබේ. සදිසානුපස්සනා දක්වන තැන වනාහි එය වුට්ඨාන ගාමිනියට ඇතුළත් කොට නොගත යුතු

වුට්ඨානගාමිනී විපස්සනාහි ඇතුළත් වූ මෙම සිඛාපත්ත සංඛාරුපෙක්ඛා - සදිසානුපස්සනාව වීථි සිත් වශයෙන් මෙසේ වෙන් කොට හඳුනා ගත යුතු. භවංග චලන දෙවාරය, මනොද්වාරාවජ්ජන වාරය මහා කුසල ඤාණ සම්ප්‍රයුක්ත ජවන වාර හත, අනතුරුව භවංග සිත් යන මේ පිළිවෙළින් දෙවතාවක්, තුන් වතාවක් දිගට පහළ වීම හඳුනාගත යුතු. මෙහිලා **"තිලක්ඛණාරම්මණික (බලව) විපස්සනාය තදාරම්මණං න ලබ්භති"** යැයි යන විභංග අට්ඨ කථාවට අනුව බලව විපස්සනා ජවනයන්ට අනතුරුව තදාරම්මණ නොවැටෙන බව සළකාගත යුතු.

මෙම සදිසානුපස්සනා වීථි දෙවතාවක් තුන් වතාවක් දිවීමේදී අවසාන වාරයේදී සත්වන ජවනයට අනතුරුව භවංග සිත් සුදුසු තාක් පහළ වූ පසු එම අවස්ථාවේ ධර්මයන් වේවා මොහොතකට පෙරාතුව වීථි දෙක්හි හෝ වීථි තුනෙහි අරමුණු කරන ලද ආකාරයට ම අනිච්ච-දුක්ඛ-අනත්ත යන ලක්ෂණ අතරින් එකක් සළකා බලා මනෝද්වාරාවජ්ජන සිත් පහළ වේ. එම සිතට අනතුරුව එම නාම-රූප එකක් ම මොහොතකට පෙර වීථි දෙක-තුන තුළ වතාහි භාවනා කොට බැලූ ක්‍රමයට ම සමානව භාවනා කෙට බලා විපස්සනා ජවන සිත් තුන්වතාවක් පහළ වේ. එම ජවන තුන තුළින් ප්‍රථම ජවනය **පරිකම්ම** යයිද දෙවැනි ජවනය **උපචාර** නම් වේ. තුන්වන ජවනය **අනුලොම** නම් වේ.

**පරිකම්ම** = සූදානම් කරවීම වශයෙන් පෙරාතුව සකස් කරන ජවනය.

**උපචාර** = මග්ග අප්පනාවෙහි ආසන්නයට ළංවී පහළ වන ජවනය.

**අනුලෝම**= උදයබ්බයඤාණය ආදී පෙර ඤාණයන්ද මග්ගවිත්තුප්පාදයෙහි යෙදෙන පසු බොධි පක්ඛිය ධර්මයන් ද ගැළපෙන, පහළ වන ජවන යැයි කියනු ලැබේ. මේවා එම ජවන තුනෙහි විශේෂිත නාමයෝය. විශේෂිත-ලෙස නොගෙන දක්වතොත් එම ජවන තුනට ආසෙවන ජවන යැයි කිව හැක්කේය. **පරිකම්ම** ජවන යැයිද **උපචාර** ජවන යැයිද, **අනුලෝම** ජවන යැයිද කිවහැක්කේය. මෙම අනුලෝම ජවන තුනෙහි යෙදෙන්නාවූ දැනීම **අනුලෝම ඤාණය** නම් වේ. ආවජ්ජනය ද සහිත මෙම අනුලෝම ජවන තුන යොගී හට මෙනෙහි කිරීම් එකක් ලෙසට පැනේ. වෙන වෙනම තුන්වතාවක් ලෙසට ප්‍රකට නොවේ. උපමාවක් ලෙස පෙර දකිනවා

අසනවා යන ලෙසට මෙනෙහි කරන අවස්ථාවෙහි වරෙකට ආවජ්ජන හා ජවන තුනක් වෙන වෙනම නොපැනී එකක්ම ලෙසට පහළ වී ප්‍රකට වන්නාක් සේය.

විපස්සනා ජවන හත, සදිසානුපස්සනා වීථි දේවතාවක් තුන්වතාවක් යැයි දක්වෙන තැන ඇසුර ලබන සාධකයන් පහත සඳහන් කරන්නට යෙදෙන අට්ඨකථා ටීකා ලෙසට වේ.

**තස්සදානි මග්ගො උප්පජ්ජිස්සතීති සංඛාරුපෙක්ඛා සංඛාරෙ අනිච්චාතිවා දුක්ඛාතිවා අනත්තාති වා සම්මසිත්වා භවංගං ඔතරති. භවංගානන්තර සංඛාරුපෙක්ඛාය කතනයෙනෙව සංඛාරෙ අනිච්චාති වා දුක්ඛාතිවා අනත්තාතිවා ආරම්මණං කුරුමානං උප්පජ්ජති මනො ද්වාරාවජ්ජනං, තතො භවංගං ආවට්ටෙත්වා උප්පන්නස්ස තස්ස කිරියචිත්තස්සානන්තරං අවීචිකං චිත්ත සන්තති මනුප්පබන්ධමානං තථෙව සංඛාරෙ ආරම්මණං කත්වා උප්පජ්ජති පඨම ජවන චිත්තං, යං පරිකම්මනති වුච්චති,** [වි. ම. 503]

| | | |
|---|---|---|
| **තස්ස** | = | එම යෝගී හට |
| **ඉදානි මග්ගො** | | |
| **උප්පජ්ජිස්සතීති** | = | දැන් මාර්ගය පහළ වනු ඇතැයි ආසන්නව පවතින අවස්ථාවෙහි |
| **සංඛාරුපෙක්ඛා** | = | සංඛාරුපෙක්ඛාව |
| **සංඛාරෙ** | = | සංස්කාරයන් |
| **අනිච්චාති වා** | = | අනිත්‍ය යැයි හෝ |
| **දුක්ඛාති වා** | = | දුක් යැයි හෝ |
| **අනත්තාති වා** | = | අනාත්ම යැයි හෝ |
| **සම්මසිත්වා** | = | සම්මර්ශනය කොට |
| **භවංගං ඔතරාති** | = | භවංගයට බැසගනී |
| **භවංගානන්තරං** | = | භවංගයට අනතුරුවම |
| **සංඛාරුපෙක්ඛාය කත** | | |
| **නයෙනෙව සංඛාරෙ** | | |
| **අනිච්චාති වා දුක්ඛාති වා,** | | |
| **අනත්තාති වා ආරම්මණං** | | |

| | | |
|---|---|---|
| කුරුමානං | = | සංඛාරුපෙක්‍ෂාව පහළ කරගත් ආකාරයෙන් ම සංස්කාරයන් අනිත්‍ය ලෙස හෝ දුක් ලෙස හෝ අනාත්මලෙස හෝ අරමුණු කොට |
| මනොද්වාරාවජ්ජනං | | |
| උප්පජ්ජති | = | මනොද්වාරාවජ්ජන සිත පහළ වේ. |
| තතො | = | එම ආවජ්ජනයට පසුව |
| භවංගං ආවට්ටෙත්වා | | |
| උප්පන්නස්ස | = | භවංගය යට කරගෙන පහළ වූ |
| තස්ස කිරිය චිත්තස්ස | = | එම ආවජ්ජන ක්‍රියා සිතට |
| අනන්තරං | = | අනතුරුව ම |
| සන්තතිං | = | චිත්ත සන්තතිය |
| අවිච්කං | | |
| අනුප්පබන්ධමානං | = | අතර ඉඩක් නොවෙන සේ සම්බන්ධ කොට |
| තථෙව | = | පෙර වීථි දෙක, තුන තුළ සංඛාරුපෙක්ඛා අවස්ථාවේ භාවනා කොට බැලූ ක්‍රමයට ම සමානව |
| සංඛාරෙ ආරම්මණං | | |
| කත්වා | = | සංස්කාරයන් අරමුණු කොට |
| පඨම ජවන චිත්තං | | |
| උප්පජ්ජති | = | ප්‍රථම ජවන සිත උපදී |
| යං | = | එම ප්‍රථම ජවන සිතට |
| පරිකම්මං | = | පරිකම්ම යැයි |
| වුච්චති | = | කියනු ලැබේ. |

අනිච්චාති වා දුක්ඛාති වා අනත්තාතිවා සම්මසිත්වා භවංගං ඔතරතීති අනිච්චාදීසු එකෙනාකාරෙන සම්මසන්ති සත්තක්ඛත්තුං පවත්තිත්වා භිජ්ජන්ති. භවංගං ඔතිණ්ණො නාම හොති තතො පරං භවංගස්ස වාරොති කත්වා

තථෙවාති යථා අතීතාසු ද්වත්තී ජවනවීථිසු සංඛාරුපෙක්ඛා අනිච්චාතිවා දුක්ඛාතිවා අනත්තානි වා සංඛාරෙ ආරම්මණමකාසි තථෙව

[මහා ටී. (බු.) 2/479 ]

අනිච්චාතිවා දුක්ඛාතිවා අනත්තාතිව සම්මසිත්වා භවංගං ඔතරති යනු,

අනිච්චාතිවා දුක්ඛාතිවා අනත්තාතිවා සම්මසිත්වා භවංගං ඔතරතීත

| | | |
|---|---|---|
| අනිච්චාදීසු | = | අනිච්ච ආකාර ආදියෙහි |
| එකෙන ආකාරෙන | = | එක් ආකාරයකට |
| සම්මසති | = | සම්මර්ශනයකොට |

(මෙම විවරණයෙහි අනිච්චාතිවා යන්නෙහි වා ශබ්දය සමුච්චයත්ථ ජෝතක නොවේ. විකප්පනත්ථ ජෝතක යැයි දත යුතු)

| | | |
|---|---|---|
| සත්තක්ඛත්තුං | = | සත් වතාවක් |
| පවත්තිත්වා | = | පහළ වී |
| භිජ්ජන්ති | = | බිදෙත් |
| වා | = | බිඳෙන සංඛාරුපෙක්ඛාව |

| | | |
|---|---|---|
| භවංගං ඔතිණ්ණා නාම හොති | = | භවංගයට වැටී නම් වේ |

(සංඛාරුපෙක්ඛාව නිම වීමෙන් පසු භවංගය පහළ වීමටම සංඛාරුපෙක්ඛාවෙන් භවංගය පහළ වුනා මෙන් එකත්තනය ක්‍රමයෙන් අභෙද කොට කියයි. මුඛ්‍යාර්ථය නොවේ යන්න අදහසයි. කුමක් නිසා ජවනයට අනතුරුව තදාරම්මණය නොදක්වා භවාංගයට දක්වන්නේද යන මෙම ප්‍රශ්ණයට තතො පරං යනාදියෙන් පිළිතුරු දේ.)

| | | |
|---|---|---|
| තතො | = | වුට්ඨානගාමිනී බලව විපස්සනාව වන්නාවූ එම සංඛාරුපෙක්ඛා ජවනයෙන් |
| පරං | = | පසු |
| භවංගස්සවාරො | = | භවාංගයෙහි වාරයෙ වේ. |
| ඉති | = | 'මෙලෙස මනසිකාරය පවත්වා' යැයි කියයි |
| තථෙවාති | = | 'තථෙ ව' යන්න |
| අතීතාසු | = | ගත වූ |
| ද්වත්ති ජවනවීථීසු | = | ජවන වීථි දෙකක තුනක |
| පරියා පන්නා | = | ඇතුළත් වූ |

| | | |
|---|---|---|
| සංඛාරුපෙක්ඛා | = | සංඛාරුපෙක්ඛාව |
| සංඛාරෙ | = | සංඛාරයන් |
| අනිච්චාතිවා | = | අනිත්‍යයැයි හෝ |
| දුක්ඛාති වා | = | දුක් යැයි හෝ |
| අනත්තාතිවා | = | අනාත්ම යැයි හෝ |
| ආරම්මණං | | |
| අකාසි යථා | = | අරමුණුකොට මෙනෙහි කරන්නාසේ |
| තථෙව | = | එසේම |

## 'ද්වත්තිංසය' නිවැරදි කිරීම

වර්තමාන කාලයේ බුරුම භාෂාවෙන් කළ ටීකා පාළි පොත්වල 'ති' යන ස්ථානයෙ ඡත්තිංස යැයි නිග්ගහිතය හා 'ස' අක්ෂරය යන මේවා අමතර කොට වරදවා ලීමෙන් අර්ථය හානිකර ඇත. එම හානි කරන ලද පාළියම නිවැරදි යැයි භාර ගතහොත් අෂ්ඨ සමාපත්තීන්-පටිපදා-අභිඤ්ඤා මඟින් ගුණ කිරීම ආදියෙන් ලැබිය යුතු සංඛාරුපෙකඛා 32 ආකාරයන් ම එම ඡත්තිංස යන ස්ථානයේ පහළවේ යැයි කල්පනා කොට නිගමනය කරත්. නමුදු ජවන වීථි යැයි කියන විශේෂ්‍ය සංඛ්‍යා පදය හා බැඳෙන එම සංඛ්‍යා විශේෂන පදය ජවන වීථීන්ගේ ප්‍රමාණය - සංඛ්‍යාව ම දක්වත්. සංඛාරුපෙකඛා විවිධ වර්ග ප්‍රමාණය දක්වනවා නොවේ. එබැවින් එම ආචාර්යයන් වහන්සේලා කල්පනා කළ සංඛාරුපෙක්ඛා දෙතිස් ආකාරය ජවන වීථිසු යන ටීකා කථාව වෙනුවට අධිප්පෙතත්ථ -අවශ්‍යකරන සංඛ්‍යය අර්ථය නොවේමය. තවදුරටත් සදිසානුපස්සනා වීථි තිස්දෙක (32) යැයිද කියනු ලැබේ. එම කථාවට ද බොහෝ අට්ඨ කතා ටීකා හි සදිසානුපස්සනා වීථි 32 වතාවක් පහළ වන බවට දක්වන උපකාරක සාධක කිසිත් නැතිවාක් පමණක් නොව චතුත්ථ ධ්‍යාන විවරණය දක්වන පහත දැක්වෙන මහා ටීකාව ද සමාන නොමැති බැවින් නොගැළපෙන්නේ මය.

තාදිසාය ආසෙවනාය ඉච්ඡිතබ්බත්තා යථා මග්ගවීථිතො පුබ්බෙ ද්වෙ තයො ජවනවාරා සදිසානුපස්සනාව පවත්තන්ති" එවම්ධාපි අප්පනා වාරතො පුබ්බෙ ද්වෙ තයො ජවනවාරා උපෙක්ඛා සහගතාව පත්තනති වදන්ති (මහා ටීකා)

| | | |
|---|---|---|
| තාදිසාය | = | එම ස්වභාවය ඇති |
| ආසෙවනාය | = | නැවත නැවතත් භාවිතා කිරීමෙන්, ආශ්‍රයෙන් |
| ඉච්ඡිතබ්බත්තා | = | කැමතිවිය යුතු බැවින් |
| මග්ගවීථීතො | = | මාර්ග වීථියට |
| පුබ්බෙ | = | පෙර |
| සදිසානුපස්සනා එව | = | සමාන ආකාරයෙන් භාවනා කරන බැවින් සදිසානුපස්සනාව ම වන්නා වූ |
| ද්වෙ තයො | | |
| ජවනවාරො | = | දෙතුන් වතාවක් ජවන වාර වීථි වාර |
| පවත්තන්ති යථා | = | අඛණ්ඩව පවතින්නාසේ |
| එවං | = | මෙලෙස |
| ඉධාපි | = | මෙම මහග්ගත උපෙක්ඛා ධ්‍යාන අවස්ථාවෙහිදු |
| අප්පනා වාරතො | = | උපෙක්ඛා සහගත අප්පනා ධ්‍යාන වාර, වීථි වාරයන්ට |
| පුබ්බෙ | = | පෙර |
| උපෙක්ඛා | | |
| සහගතා එව | = | උපෙක්ෂා සහගත වන්නා වූම |
| ද්වෙ තයො | | |
| ජවන වාර | = | දෙතුන් වතාවක් වන උපචාර ධ්‍යාන ජවන වාර, වීථි වාර |
| පවත්තන්ති | = | අඛණ්ඩව පහළවෙත් |
| ඉති | = | මෙසේ |
| වදන්ති | = | ආචාර්‍යවරයෝ කියත් |

## සාකච්ඡාවේ විනිශ්චය

ඉහත දැක්වූ ටීකා හි එව මිධාපි - පෙ- පවත්තන්ති යන උපමෙය්‍ය සාධ්‍ය කථාව ආචරිය වාද වෙයි. එම වාදය තාදිසාය ආසෙවනාය

**ඉච්ඡිතබ්බත්තා** යන කථාවෙන් හේතු දක්වයි. "**යථා මග්ග වීථිතො පුබ්බෙ ද්වෙ තයො ජවන වාර සදිසානුපස්සනාව පවත්තන්ති**" යන උපමා සාධක කථාව මඟින් සංසන්දනය කොට පිළිගන්වයි. තහවුරු කරවයි. එමනිසා මෙම උපමාන සාධක කථාව වනාහි ආචරිය වාද නොවේ. ටීකා චාර්යයන් වහන්සේ ඇතුලු සියලු ආචාර්යයන් වහන්සේලා එකඟවී පිළිගත යුතු වාදම වන්නේය. මේ සම්මත වාද පක්ෂයෙහි **ද්වෙ තයෙ** = දෙතුන් වාරයක් යැයි ම ඇත්තේය. **දවත්තිංස**=32 වාර යැයි වනාහි නැත්තේය. තවදුරටත් **ද්වෙ තයො** යන පාළිය පිටපත් කිරීමේදී වරදවා ලියන ලද්දක්යැයි කිව හැකි නොවේ. මක් නිසාද යත් **ද්වත්තිංස** පදය හා **ද්වෙතයො** යන පාලි පද සමාන රූපි නොවනවාටත් වඩා, වීථි දෙකක් - තුනක් කීමෙන් ආසෙවනය වීමට ප්‍රමාණවත් වන බැවින්ය. එමනිසා මෙම සම්මතවාද උපමාන පක්ෂය හා ගළපා බලා, සාකච්ඡා කොට බලන්නේ නම් මෙහිලා **ද්වත්තිංස** යන පාළිය දිගින් දිගට පිටපත් කිරීමේදි නිග්ගහිතය හා 'ස' අක්ෂරය වරදවා අමතරින් එක් කිරීම නම් වූ ප්‍රමාද ලේඛණයක් විය හැකි බැව්ද ප්‍රකටයැ. **ද්වත්ති** යන පාලියට ටීකාචාර්යයන් වහන්සේ ලියනා ලද මූල පාළියම වූ බවද ප්‍රකටය. ලංකාවේ සිංහල ටීකා පාළියෙහිද **ද්වත්ත** යැයිම දක්වේ. එබැවින් **ද්වත්ති ජවනවීථිසු** = දෙතුන්වතාවක් වූ ජවන වීථීන්හී යැයි දක්වූ පාළියේ අර්ථය නියම නිවැරදි අර්ථය යැයි සැක හැර දැනගනිත්වා.

## ගොත්‍රභූ ඥාණය

අනුලොම ඥාණයට අනතුරුව මෙනෙහි කොට දැනගනිමින් සිටින සංඛාරාරම්මණය බැහැර කොට සංස්කාරයන්ගෙන් තොර නිවීම නම් වූ නිවන අරමුණු කොට ගොත්‍රභූ ජවන චිත්තය පහළවේ. මේ ජවන චිත්තය හා යෙදෙන දැනීම ගොත්‍රභූ ඥාණය නම් වේ. මෙහිලා 'අරමුණු කරයි' යැයි කියන්නේ නමුත් පෙර භාගයේ සිත් මෙන් අරමුණට බැහැරින් සිට දැනගන්නා ආකාරයක් නොවේ. සංස්කාර අරමුණින් මිදී සංස්කාර යන්ගෙන් තොරවූ නිරොධ වූ ස්වභාවයට වැදගන්නාක්සේ දැනගැනිමයි. එබැවින,

පටිසම්භිදා මගගයෙහි උප්පාදං අභිභුය්‍යිත්වා අනුප්පාදං පක්ඛන්ධතීති ගොත්‍රභූ. බහිද්ධා සංඛාර නිමිත්තං අභිභුය්‍යිත්වා නිරොධං නිබ්බානං පක්ඛන්ධතීති ගොත්‍ර යනාදී ලෙසට ලියා දක්වයි.

| | | |
|---|---|---|
| උප්පාදං අභිභුය්‍යිත්වා | = | උප්පාද ස්වභාවය ඇති සංස්කාර අරමුණ අභිභවනය කොට |
| අනුප්පාදං පක්ඛන්ධතීති | = | උප්පාදයෙන් තොරවූ ස්වභාවයට වැදගත හැකි බැවින් |
| ගොත්‍රභූ | = | ගෝත්‍රභූ නම් වේ. |
| බහිද්ධා සංඛාර නිමිත්තං අභිභුයිත්වා | = | බාහිර, ආගන්තුක ධර්ම වශයෙන් භාවනා කොට බැලිය යුතු බැවින් බාහිරයෙහි පවතින සංස්කාර අරමුණ මැඩපවත්වා |
| නිරොධං | = | සංස්කාරයන් නිරුද්ධවන ස්වභාවය ඇති |
| නිබ්බානං | = | නිවන් අරමුණට |
| පක්ඛන්ධති | = | වැදගන්නා බැවින් |
| ගොත්‍රභූ | = | ගෝත්‍රභූ නම් වේ. |

## මාර්ග ඥාන - ඵල ඥාන

ගොත්‍රභූ සිතට අනතුරුව නිවනම ඇස්පනා පිට අරමුණු කොට මගග ජවන සිත එක වරක් පහළවේ. මගග චිත්තය සමඟ යෙදෙන දූනීම මගග ඤාණය වේ. ඤාණදස්සන විසුද්ධිය යැයිද කියනු ලැබේ. මාර්ගයට අනතුරුව ම නිවනම අරමුණු කොට ඵල සිත දෙවරක් පහළ වේ. තික්ඛ පඤ්ඤ පුද්ගලයෙකු වන්නේ නම් පෙර භාගයේ අනුලෝම ජවනය දෙවතාවක් පමණක් පහළ වී මාර්ගයට අනතුරුව මෙම ඵල සිත තුන් වතාවක් පහළ වේ. ඵල සමාපත්තියට සමවැදුනු අවස්ථාවෙහි වනාහි.

මෙම ඵල සිත ප්‍රමාණ විරහිතව බොහෝ වාර ගණනක් පහළ විය හැක්කේය. මෙම ඵල සිත්හී යෙදෙන දැනීම ඵල ඥාණය නම් වේ. මෙම මාර්ග ඵලයන් අරමුණු කිරීමද බාහිරින් සිට අරමුණු කරන්නාසේ නොවේ. සංස්කාරයන්ගෙන් තොර නිරුද්ධ ස්වභාවයට ඇතුලත්වන්නා සේ දැනගැනීමයි. එම නිසා මග ඵල ධර්මයන් "අප්පනා" නිවනට පත්වූ ධර්මය, නිවන් අරමුණට ඇතුළත්ව සිටින්නාසේ වන්නා වූ ස්වභාවය යැයි කියනු ලැබේ. දෙතුන් වතාවක් ඵල සිත පහළ වීමට පසු භවාංග සිත් සුදුසු ප්‍රමාණයක් පහළවේ. පසුව ප්‍රත්‍යවේක්ෂා කරන ප්‍රත්‍යවේක්ෂා සිත් පහළ වේත්.

මාර්ග වීථියෙහි නිවනම අරමුණු කොට පහළවන්නා වූ මෙම ගොත්‍රභූ -මග-ඵල සිත්වල පහළ වන කාලය එකම ක්ෂණයක්වේ. එබැවින් එම සිත් තුන් වර්ගය යෝගීනට වෙන වෙනම කොටසින් කොටස වෙනස්ව ප්‍රකට නොවේ. ප්‍රකට විය නොහේ. යමක් පහළ වූ බව පමණක් ප්‍රකට වේ. ප්‍රකට වන ආකාරය වනාහි, මෙනෙහි කොට දැනගන්නා සංස්කාර අරමුණු හා දැනගැනීම නම් වූ සංස්කාර යන මේවායින් මිදී සංස්කාර නිරෝධ ස්වභාවයට ප්‍රථමයෙන් පැමිණී ආකාරය ද ප්‍රකටයැ. එම සංස්කාර නිරොධ ස්වභාවයට ඇතුළත් ව සිටින්නාක්සේ එක ක්ෂණයක් පිහිටි ආකාරය ද ප්‍රකටයැ. එම සංස්කාරයන් නිරුද්ධ වන ස්වභාවයට පත්වූ විට ප්‍රත්‍යවේක්ෂා කරන පච්චවෙක්ඛනය පහළ වීමද ඇඳමත ම නින්දෙන් අවදි වූ විගස ලෙසට ද, ජලය මතට ක්ෂණයකින් මතුවුනා සේද ප්‍රකට වේ. එම නිසා ඇසුවිරූ බව බහුශ්‍රැත බව ඇත්තකු වී නම් සංස්කාර නිරොධයට ප්‍රථම වතාවට පත්වූ ස්වභාවය ගොත්‍රභූ යැයිද, සංස්කාර අරමුණින් මිදී එක මොහොතක් පමණක් පැවති මැද භාගයේ ස්වභාවය මාර්ගයැයිද, සළකා බැලීමක් ප්‍රත්‍යවේක්ෂාවක් සිදුවීමට කලින් සංස්කාර අරමුණින් මිදී ගත කරන අවසාන කොටස ඵල යැයිද වෙන වෙනම විභාග කොට ගත හැකිවේ. මේ තාක් පහළවීම් වැටහීයනු පිණිස විසුද්ධි මාර්ගයේ උපමා සහිත පහත සඳහන් උධෘතය දක්වන්නෙමු.

යථා හි මහාමාතිකං ලඞ්ඝිතුකාමො පරතීරෙ පතිට්ඨාතුකාමො පුරිසො වෙගෙන ධාවිත්වා මාතිකාය ඔරිමතීරෙ රුක්ඛ සාඛාය බන්ධිත්වා ඔලම්බිතං

රජ්ජුං වා යට්ඨිං වා ගහෙත්වා උල්ලංඝිත්වා පරතීරනින්නපොණපබ්භාරකායො හුත්වා පරතීරස්ස උපරිභාගෙ පත්තො තං මුඤ්චිත්වා, වෙධමානො පරතීරෙ පතිත්වා සනිකං පතිට්ඨාති, එවමායං යොගාවචරො විභවයොනිගති ඨිති නිවාසනං පරතීරභූතෙ නිබ්බානෙ පතිට්ඨාතු කාමො උදයබ්බයානුපස්සනාදිනා වෙගෙන ධාවිත්වා අත්තභාව රුක්ඛ සාඛාය බන්ධිත්වා ඔලම්බිතං රූප රජ්ජුං වා වෙදනාදිසු අඤ්ඤතර දණ්ඩං වා අනිච්චන්තිවා දුක්ඛන්තිවා අනත්තාති වා අනුලොමාවජ්ජනෙන ගහෙත්වා තං අමුඤ්චමානොව පඨමෙන අනුලොම චිත්තෙන, උල්ලඞ්ඝිත්වා දුතියෙන "පරතීර නින්න පොණපබ්භාර කායො විය" නිබ්බාන නින්න පොණ පබ්භාර මානසො හුත්වා තතියෙන "පරතීරස්ස උපරිභාගං පත්තො විය" ඉදානි පත්තබ්බස්ස නිබ්බාණස්ස ආසන්නො හුත්වා තස්ස චිත්තස්ස නිරොධෙන තං සංඛාරාරම්මණං මුඤ්චිත්වා, ගොත්‍රභූ චිත්තෙන විසංඛාරෙ පරතීර භූතෙ නිබ්බානෙ පතති. එකාරම්මණෙ පන අලද්ධාසෙවනතාය "වෙධමානො සො පුරිසො විය" න තාව සුප්පතිට්ඨිතො හොති. තතො මග්ගඤාණෙන පතිට්ඨාත [වි. ම. 505 ]

## සිංහල තේරුම

ඉතා විශාල දිය ඇල්ලක් පැන එතෙර පිහිටනු කැමති පුරුෂයෙක් වහා දිවැවිත් ඇල මෙතෙර සිට වෘක්ෂ ශාඛයෙහි බැඳී එල්බෙන රැහැනක් හෝ දිග දණ්ඩක් ගෙන උඩින් පැන පර තීරයට බරවූන කය ඇතිව පර තීරයේ මතුභාගයට පැමිණ එම රැහැන හෝ දිග දණ්ඩ හෝ අතහැර දමා වෙවුලමින් පරතෙර පතිතව සෙමෙන් පිහිටයි. මෙසේ භව යෝනි, ගති ඨිති නිවාස යන්නේ පරතෙ වූ නිවනෙහි පිහිටනු කැමැත්ත එම යෝගීද උදයවය ඤාණ ආදී ඤාණ අටෙහි වේගයෙන් දිවැවිත් තම ආත්මභාව නමැති වෘක්ෂ ශාකයෙහි බැඳ එල්වන ලද රූප නමැති රැහැන හෝ වේදනා නමැති දිග දණ්ඩ හෝ අනුලෝම ඤාණයට පෙර පිහිටි ආවජ්ජන සිතින් අනිච්චයැයි හෝ දුක්ඛ යැයි හෝ අනත්ත යැයි හෝ සළකා ගෙන එම අරමුණ අත නොහැරම ප්‍රථම අනුලෝම සිතින් උඩ නැගී (පරිකම්ම ජවනය වේ යැයි කියනු ලැබේ.) පර තෙරට නැවුනු කය ඇත්තාක් සේ දෙවැනි අනුලොම සිතින් නිවනට නැවුනු සිත ඇතිව (උපචාර ජවනයෙන්,

සංඛාරයන් මත බැඳිගන්නා ස්වභාවයෙන් මනාකොට මිදුණු බැවින්ද නිවනට පැමිණීමට මනාකොට ආසන්න වූ බැවින්ද මෙසේ කියනු ලැබේ. මේ අවස්ථාව තෙක් නිවන අරමුණු නොකරන ලදි) පර තීරයට පත්වන්නාසේ තුන්වන අනුලෝම සිතින් දුන් දුන් පැමිණිය යුතු නිවනට ආසන්න වී එම සිත නිරුද්ධ වීමත් සමඟම එම සිතේ නිරොධයක් සමඟම දැනගනිමින් පවතින සංඛාර අරමුණ හැර පියා විසංඛාර වූ පරතීරය වූ නිවනට ගොත්‍රභූ සිත වශයෙන් පතිත වේ. නමුදු නිවනෙහි ආසෙවනය නොලද බැවින් වෙවුලමින් සිටින එම පුරුෂයා මෙන් මනාලෙස ප්‍රතිෂ්ඨාව නොලබයි. අනතුරුවම මාර්ග ඥාණයෙන් ස්ථිරව පිහිටයි.

[සිංහල වි. ම. 1067]

මෙම අට්ඨ කථාවෙහි දක්වන උපමා උපමේය යොගීන්ගේ අත්දැකීම් හා බොහෝකොට ගැළපෙන්නේය. අදාළය. උපමා උපමේය සම්බන්ධයෙන් නැවත නැවත සළකා බලන්න. මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාස පාළියෙහි මහා මාලුඞ්ක්‍ය පුත්ත සුත්ත හා නවංගුත්තර පාළියෙහි මහාවග්ග පඤ්චම සුත්ත ආදීන් හී මග්ග ඤාණය පහළ වන ආකාරය පහත සඳහන් ලෙසට දේශනා කොට ඇත.

**ඉධානන්ද භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්චෙච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීති සුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, සො යදෙව තත්ථහොති රූප ගතං වෙදනාගතං සඤ්ඤා ගතං සංඛාරගතං විඤ්ඤාණගතං තෙ ධම්මෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො සමනුපස්සති, සො තෙහි ධම්මෙහි චිත්තං පටිපාදෙති (පතිට්ඨාපෙති යැයිද පෙනේ) සො, තෙහි ධම්මෙහි චිත්තං පටිපාදෙත්වා (පතිට්ඨාපෙත්වා යැයිද යෙදී ඇත.) අමතා ධාතුයා චිත්තං උපසංහරති එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති.**

| | | |
|---|---|---|
| ආනන්ද | = | ආනන්දය |
| ඉධ | = | මේ ශාසනයෙහි |

| | | |
|---|---|---|
| භික්ඛු | = | භික්ෂුව |
| විවිච්චෙව කාමෙහි | = | කාමයන්ගෙන් වෙන්ව ම |
| විවිච්ච අකුසලෙහි ධම්මෙහි | = | අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ම |
| සවිතක්කං | = | විතක්ක සහිත |
| සවිචාරං | = | විචාර සහිත |
| විවේකජං පීති සුඛං | = | නීවරණයන්ගේ දුරුවීම නිසා පහළ වූ ප්‍රීතිය ද චිත්ත සුඛය ද ඇති |
| පඨමං ඣානං | = | ප්‍රථම ධ්‍යානයට |
| උපසම්පජ්ජ විහරති | = | පත්ව-එළඹ වාසය කරයි. |
| තත්ථ | = | එම ප්‍රථම ධ්‍යානය පහළවන ක්ෂණයෙහි |
| යදෙව රූප ගතං<br>වේදනාගතං සඤ්ඤා ගතං<br>සංඛාරගතං විඤ්ඤාණ ගතං | = | යම් රූප, වේදනා, සංඥා සංඛාර විඥ්ඥාණයක් |
| හොති | = | පහළ වේද, |
| වා | = | ඇති වේද |
| තෙ ධම්මෙ | = | එම රූප, වෙදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණයන් |
| සො | = | එම භික්ෂුව |
| අනිච්චතො සමනුපස්සති | = | අනිත්‍ය ලෙස භාවනාකොට බලයි |
| දුක්ඛතො | = | දුක් ලෙස භාවනාකොට බලයි |
| රොගතො | = | සම්පූර්ණ ලෙස සුවනොවන යාප්‍ය රොගයක් මෙන් යැයි බලයි |
| වා | = | මූල රෝග හා සමාන යැයි බලයි |
| ගණ්ඩතො | = | ගඩුවක් ලෙසට භාවනා කොට බලයි |

| | |
|---|---|
| සලලතො = | ඇනුනු හුලක් ලෙසට භාවනා කොට බලයි |
| අඝතො = | අනර්ථය ගෙනදිය හැකි නරක ධර්මයකැයි භාවනා කොට බලයි |
| ආබාධතො = | උණ රෝගයක් ලෙස පෙළිය හැකි යැයි භාවනා කොට බලයි |
| පරතො = | ආගන්තුක බාහිර ධර්මයකැයි භාවනා කොට බලයි. |
| පලොකතො = | හුදු පළුදුවන, විනාශවී යන ධර්මයකැයි භාවනාකොට බලයි |
| සුඤඤතො = | ස්වාමියෙකු, සත්වයකු යන මෙයින් ශූන්‍ය යැයි භාවනාකොට බලයි. |
| අනතතතො සමනුපසසති = | ආත්මයක් නොවන්නේ යැයි භාවනා කොට බලයි. |
| සො = | මෙලෙස භාවනාකොට බලන භික්ෂුවගේ |
| චිතතං = | සිත |
| තෙහි ධමෙමහි = | භාවනාකොට බැලිය යුතු එම ස්කන්ධ රූප - නාම ධර්මයන් කෙරෙන් |
| පටිපාදෙති1* = | හැකිලෙයි |
| සො = | එම භික්ෂුව |
| චිතතං = | සිත |

---

1[*] නිපඵනන වසෙන නිවතෙති. කෘත්‍යය නිම කිරීම් වශයෙන් හැරී එයි. අංගුත්තර අටඨකථා විවරණයයි. අනුලොම ඤාණය තෙක් විපසසනා වැඩීම නිමකොට, ගොත්‍රභූ සිත පහළ වී එම සංස්කාරාරම්මණයෙන් හැරී වෙන්වීම "යොගී භික්ෂුව හැරී එයි යැයි" කියනු ලැබේ. පටිසංහරති මොවෙති අපනෙති = නැවත මුදාහැරී ඉවතට යයි (ම. නි. අටඨකථා) **පටිසංහරතීති තපපටිබදධඡනදරාගාදි උපකකිලෙස විකඛමභනෙන විපසසනා චිතතං පටිසංහරති** (එම ටීකාවයි) භාවනා කොට බැලීමට කලින් සංස්කාරයන් මත ඡන්ද රාග ආදිය පහළ විය හැක්කේය. භාවනා කොට බලන විට එලෙස සංස්කාරයන් මත එසේ පහළවිය නොහැක්කේය. එබැවින් භාවනා කරන කරන වාරයේ අනුලොම තෙක් විපස්සනා සිත් ඡන්දරාග ආදියෙන්ද එහි අරමුණ වන්නාවූ සංඛාර අරමුණු කෙරෙන්ද යොගී භික්ෂුව හැකිලෙයි. නම් වේ. මිදුනේ වෙයි. ඉවත් වෙයි නම් වේ. මේ අටඨකථා අර්ථය සෘජුයැයි ද, මෙපමණකින් පැහැදිලියැයි සිතන්නෙමු.

| | | |
|---|---|---|
| තෙහි ධම්මෙහි පටිපාදෙත්වා | = | භාවනා කටයුතු එම රූප-නාම කෙරෙන් හැකිලී |
| අමතාය ධාතුයා | = | මිය යෑමෙන් විනාශ වී යෑමෙන් තොර වූ නිර්වාන ධාතුව කෙරෙහි |
| වා | = | නිර්වාන ධාතුවට |
| චිත්තං | = | සිත |
| උපසංහරති | = | පමුණුවයි |
| කථං | = | කෙසේ පමුණුවත් ද යත් |
| සබ්බසංඛාර සමථො | = | සියළු සංස්කාරයන්ගේ සංසිඳීම වන |
| සබ්බූපධි පටිනිස්සග්ගො | = | සියළු උපාධීන් අතහැර දැමීමද වන |
| තණ්හක්ඛයො | = | තෘෂ්ණාව ක්ෂය කිරීමද වන |
| විරාගො | = | ඇලීමෙන් තොරවූ |
| නිරොධො | = | සංස්කාරයන්ගේ නිරෝධය වන |
| යදිදං නිබ්බානං | = | සංස්කාරයන්ගෙන් නිවීම නම් වූ නිවනක් |
| අත්ථි | = | ඇත්තේය |
| එතං | = | එම සංස්කාරයන්ගේ නිවීම නම් වූ නිවන |
| සන්තං | = | ශාන්තය |
| එතං | = | මෙම නිවන මෙසේ |
| පණීතං | = | ප්‍රණීතය, මිහිරිය |
| ඉති | = | මෙසේ පමුණුවයි |

මාර්ග සිත පහළවන අවස්ථාවේ "**එතං සන්තං එතං පණීතං**" යැයි විශේෂයෙන් සළකා වචනයට නඟනවා නොවේ. සංස්කාරයන්ගේ සංසිඳීම ස්වභාවයට "ඇතුළු වී, හමු වී දැන ගත්තාක් සේ" ශාන්ත උත්තම වශයෙන් ඇස්පනාපිට හුදු දැක දැනගැනීම පමණක් වේ. "සංස්කාරයන්ගේ සංසිඳීම ස්වභාවය ශාන්තය, ප්‍රනීතය, උතුම්"යැයි මෙවන් දැනීම වනාහි නැවත සළකා බැලීම ප්‍රත්‍යවේක්ෂා කාලයේම ප්‍රකටව පහළවේ. පහත දැක්වෙන අට්ඨ කථාවේ:

මගගචිත්තං නිබ්බානං ආරම්මණ කරණවසෙන එතං සන්තං එතං පණීතං න එවං වදති, ඉමිනා පන ආකාරෙන තං පටිවිජ්ඣතො තත්‍ථ චිත්තං උපසංහරති [ම. නි. අ. 100]

| | | |
|---|---|---|
| නිබ්බානං ආරම්මණ කරණ වසෙන | = | නිවන අරමුණු කිරීම් වශයෙන් |
| මගග චිතතං උප සංහරති | = | මාර්ග සිතට පමුණුවයි |

(නිවන අරමුණු කිරීම වශයෙන් මාර්ග සිත පහළ වීමට සිත පමුණුවයි" යැයි කියනු ලැබේ)

| | | |
|---|---|---|
| එතං සනතං එතං පනීතං | = | මේ නිවන ශාන්තය මේ නිවන මිහිරි යැ |
| එවං | = | මේ වනාහි |
| න වදති | = | මාර්ග චිත්තය පහළ වන අවස්ථාවේ වචනයෙන් කියමින් සිටිනවා නොවේ. |
| පන | = | එසේ වචනයෙන් නොකියන මුත් |
| ඉමිනා ආකාරෙන | = | ශාන්ත වූ, මිහිරි වූ ආදී මේ ආකාරයෙන් |
| තං | = | එම නිවන |
| පටිවිජකධනෙතා | = | සෘජුව ඇස්පනාපිට විනිවිද දැක දැන ගන්නා තැනැත්තා |
| තතථ චිත්තං උපසංහරති | = | 'එම නිවනට සිත පමුණුවයි' නම් වේ. |

පටිසම්භිදා මගගයෙහි අනිච්ච ආකාර දසය (10) දුක්ඛ ආකාර විසි පහ (25) අනත්ත ආකාර පහ (5) යන මේ ආකාර තුළින් එක එකක් ආකාර අනුව මනසිකාරය පවත්වා අනුලෝම ඤාණය පහළ වී නම් එම ආකාරයන්ට ප්‍රතිවිරුද්ධ ආකාරය වශයෙන් නිවන දැක දැන මාර්ග ඤාණය පහළ වීමද කොටස් 40ක් ලෙසට විභාග කොට දේශනා කරයි. එම කොටස් සතළිස (40) තුළින් හයක් (06) පමණක් උද්‍ධෘත කොට මෙහිලා දක්වන්නෙමු.

පඤ්චක්ඛන්ධෙ අනිච්චතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති. පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති. [ප. ම. 2/228 ]

| | | |
|---|---|---|
| පඤ්චක්ඛන්ධෙ | = | පඤ්චස්කන්ධය |
| අනිච්චතො | = | අනිත්‍ය ලෙස |
| පස්සන්තො | = | දකිමින් සිටින්නහුට |
| වා | = | දකින අවස්ථාවේ |
| අනුලොමිකං ඛන්තිං පටිලභති | = | අනුලෝම ඤාණයට පත්වේ |
| පඤ්චන්නං ඛන්ධානං නිරොධො | = | පඤ්ච ස්කන්ධයන්ගේ නිරෝධය |
| නිච්චං නිබ්බානං | = | නිවන නිත්‍ය යැයි |
| පස්සන්තො | = | දකිමින් සිටින්නහු |
| වා | = | දකින අවස්ථාවේ |
| සම්මත්ත නියාමං ඔක්කමති | = | ආර්ය මාර්ගයට බැස ගනී. |

මෙම පාළියෙහි 'පඤ්චක්ඛන්ධෙ' යැයි සාමාන්‍ය ලෙස සාමූහිකව දේශනා කරන ලද කථාව සබ්බ සංගාහික= විවිධ පුද්ගලයන් භාවනා කටයුතු සියළු ස්කන්ධයන් පිඩුකොටගෙන දක්වන කථාවක්ම වේ. පඤ්චස්කන්ධයම එක වැර එකට භාවනා කරයි යන්න නමුත් අදහස් නොකෙරේ. ඇත්ත වශයෙන්, පඤ්චස්න්ධයන්ගෙන් එක ස්කන්ධයක්, එක් රූපස්කන්ධයක්. එක් නාම ස්කන්ධයක්ම ඇස්පනාපිට භාවනා කොට අනුලෝම ඤාණය පහළ වේ යැයි දැක්වීම අදහසයි. එම නිසාම යට දැක්වූ විසුද්ධි මග්ගයෙහි රූප රජ්ජං වා වෙදනාදීසු අඤ්ඤතර දණ්ඩ වා යන පාළියෙන් "රූපයම මත වේවා වෙදනා-සඤ්ඤා-සංඛාර විඤ්ඤාණ යන මෙවායින් එකක් වන නාමයක්ම මත වේවා භාවනා කොට අනුලෝම ඤාණය පහල වන බව" දැක්විය. තවදුරටත් බොහෝ අට්ඨ කථාවන්හිදු රූපාවුට්ඨාති අරූපාවුට්ඨාති යන පාළියෙන් රූප මත භාවනා කොට ලත්

අනුලොම ඤාණයට, නාම මත භාවනා කොට ලත් අනුලොම ඤාණයට අනතුරුවම ගොත්‍රභූ-මග්ගඤාණ පහළ වන බව දක්වා ඇත්තේය. රූප-නාම සියල්ල එකට භාවනා කරන ඤාණයට අනතුරුව ගොත්‍රභූ, මග්ග ඤාණ පහළවන බව වනාහි මෙහි මුඛ්‍යාර්ථය නොවේ. **එකප්පහාරෙන පඤ්චහි ඛන්ධෙහි වුට්ඨාති** යන කථාව ද නිප්පරියාය = මුඛ්‍යාර්ථය නොවේ. ඤාණය අතිත් තීක්ෂණ පුද්ගලයනට එක පයිඩකයක එක මොහොතක යුහුසුළුව විපස්සනා ඤාණ මග්ග ඤාණ පහළ වීමම සළකා කරන ලද **සන්ධාය භාසිත**= පරියාය කථාම වේ. අර්ථය මහා ටීකා හි "**අඤ්ඤදත්‍ථා එකෙනෙව ලොකියචිත්තෙන පඤ්චන්නං ඛන්ධානං පරිග්ගහ පරිජානනාදීනං අසම්භවතො, නහි සනිදස්සන සප්පටිඝාදි එකච්චං ආරම්මණං කාතුං සක්කා**" හී ඛ්‍යාතිරෙක කාරණා සහිතව විවරණය කරයි.

එබැවින් මෙම පටිසම්භිදා මග්ග පාළියෙහි අපේක්ෂිත අර්ථය මෙලෙස දතයුතු වේ. එනම්, දිගින් දිගට ඇතිවෙමින් නැතිවෙමින් පවතින නාම - රූප ස්කන්ධ එකක් අනිත්‍ය යැයි භාවනා කරන්නේ නම් අනුලෝම ඤාණය පහළ වේ. එම ඤාණයට අනතුරුව එම අනිත්‍ය වූ නාම-රූප ඇතිතාක් නිරෝධ වන ස්වභාවය නිත්‍ය වශයෙන් ඇස් පනාපිට දක දැන ගොත්‍රභූ ඤාණයද සහිත මාර්ග ඤාණය පහළ වේ යැයි "යන මේ අර්ථය දතයුතු. විපස්සනා ඤාණ පහළ වන අවස්ථාවේ මෙනෙහි කොට දත යුතු රූප-නාමයන්ගේ මුල - අග, ඇතිවීම - නැතිවීම ඇස් පනාපිට දකගෙන අනිත්‍ය යැයි පැහැදිලිව නිවන අරමුණු කරන ගොත්‍රභූ, මාර්ග, ඵල අවස්ථාවන්හී වනාහි ඇතිවීම - නැතිවීම දකගත නොහේ. සංස්කාරයන්ගේ නිරෝධ ස්වභාවය පමණක් ප්‍රකට වේ. එබැවින් නිර්වාන ස්වභාවය තුළ ඇතිවීම-නැතිවීම යන දෙකින් තොරව නිත්‍ය ස්වභාවයෙන් දක දැන ගත හැක්කේය. යට ඡේදයන්හීද අනුලොම ඤාණ-මාර්ග ඤාණ-ඵල ඤාණ පහළ වන ආකාරය මෙලෙසටම වටහා ගත යුතු.

**පඤ්චක්ඛන්ධෙ පලොකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපලොකධම්මො නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති.** [ප. ම. 2/230]

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ | = ස්කන්ධයන් පහ |
| පලොකතො | = ප්‍රකට ලෙස විනාශ වේ යැයි, විශාල ලෙස විනාශ වේයැයි |
| පස්සන්තො | = දකිමින් සිටින්නා හු |
| අනුලොමිකං ඛන්තිං පටිලභති | = අනුලෝම ඤාණය ලබයි |
| පඤ්චන්නං ඛන්ධානං නිරොධො | = පඤ්චස්කන්ධයන්ගේ නිරෝධය |
| අපලොකධම්මො නිබ්බානන්ති | = විනාශවන ස්වභාවය නැති, පළුදුවන බව නැති නිවන යැයි |
| පස්සන්තො | = දකිමින් සිටින්නා |
| සම්මත්ත නියාමං ඔක්කමති | = ආර්ය මාර්ගයට පත්වේ. |

පඤ්චක්ඛන්ධෙ දුක්ඛතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති. පඤ්චන්නං ඛන්ධානං නිරොධො සුඛං නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති [ප. ම. 2/230]

| | |
|---|---|
| පඤ්චක්ඛන්ධෙ | = පඤ්චස්කන්ධය |
| දුක්ඛතො පස්සන්තො | = දුකක්යැයි දකින්නා හු විසින් |
| අනුලොමිකං ඛන්තිං පටිලභති | = අනුලෝම ඤාණය ලබයි. |
| පඤ්චන්නං ඛන්ධානං නිරොධෙ | = පඤ්චස්කන්ධයෙහි නිරෝධය |
| සුඛං නිබ්බානන්ති | = නිවන් සුඛයැයි |
| පස්සන්තො | = දකින්න හු |
| සම්මත්ත නියාමං ඔක්කමති | = ආර්ය මාර්ගයට පත්වේ. |

පඤ්චක්ඛන්ධෙ භයතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අභයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති [ප. ම. 2/230]

පඤ්චක්ඛන්ධෙ = පඤ්චස්කන්ධය

භයතො පස්සන්තො = බිය ජනක යැයි දකින්නාහු

අනුලොමිකං ඛන්තිං
පටිලභති = අනුලෝම ඤාණයට පත්වේ

පඤ්චන්නං ඛන්ධානං
නිරොධො = පඤ්චස්කන්ධයන්ගේ නිරෝධය

අභයං නිබ්බානන්ති = බියෙන් තොරවූ නිවන යැයි

පස්සන්තො = දකින්නහු

සම්මත්ත නියාමං
ඔක්කමති = ආර්ය මාර්ගයට පත්වේ.

පඤ්චක්ඛන්ධෙ අනත්තතො පස්සන්තො නුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමත්ථං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති. [ප. ම. 2/230]

පඤ්චක්ඛන්ධෙ = පඤ්චස්කන්ධය

අනත්තතො = ස්වාමියෙක්, ආත්මයක් නොමැති
ධර්ම පමණකැයි

පස්සන්තො = දකින්නා හු

අනුලොමිකං ඛන්තිං
පටිලභති = අනුලෝම ඤාණය ලබයි

පඤ්චන්නං ඛන්ධානං
නිරොධො = පඤ්චස්කන්ධයේ නිරෝධය

පරමත්ථ නිබ්බානන්ති = පරමාර්ථ වූ නිවන යැයි

පස්සන්තො = දකින්නහු

සම්මත්ත නියාමං
ඔක්කමති = ආර්ය මාර්ගයට පත්වේ

(ප්‍රති විරුද්ධාර්ථය දැක දන මාර්ග ඥාණය පහළ වේ යැයි යට දක්වූ දක්වීම වනාහි සාමාන්‍ය දක්වීමකි. මෙම **අනත්තතො** යන කොටසේ **පරමත්තං නිබ්බානං** යැයි ප්‍රතිවිරුද්ධාර්ථය දේශනා නොකිරීම වන්නාසේ **පරතො** කොටසේදී **අපරපච්චයං නිබ්බානං** = බාහිර හේතු නොමැතිවූ නිවන යැයිද, **සුඤ්ඤතො** කොටසේදී **පරම සුඤ්ඤං නිබ්බානං** = සංස්කාරයන්ගෙන් තොර වූ පරම ශූන්‍යවූ නිවන යැයිද ප්‍රතිවිරුද්ධාර්ථය දේශනා නොකිරීම දැකිය හැක්කේය.)

**පඤ්චක්ඛන්ධෙ තුච්ඡතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති. පඤ්චන්නං ඛන්ධානං නිරොධො අතුච්ඡං නිබ්බානන්ති පස්සන්තො සම්මත්ත නියාමං ඔක්කමති** [ප. ම. 2/230]

| | | |
|---|---|---|
| **පඤ්චක්ඛන්ධෙ** | = | පඤ්චස්කන්ධය |
| **තුච්ඡතො** | = | හිස්, පුහු, නිසරු කිසිවක් නැති ස්වභාවයක් පමණක් යැයි |
| **පස්සන්තො** | = | දකින්නහු |
| **අනුලොමිකං ඛන්තිං පටිලභති** | = | අනුලෝම ඥාණයට පත්වේ. |
| **පඤ්චන්නං ඛන්ධානං නිරොධො** | = | පඤ්චස්කන්ධයන්ගේ නිරෝධය |
| **අතුච්ඡං නිබ්බානං** | = | නොසිස් වූ සරු වූ, ප්‍රයෝජනවත් උත්තම වූ නිවන යැයි |
| **පස්සන්තො** | = | දකින්නහු |
| **වා** | = | දකිමින් සිටිනවිට, දැක |
| **සම්මත්ත නියාමං ඔක්කමති** | = | ආර්ය මාර්ගයට බැසගනී. |

මෙම පාළි ඡේද හය තුළින් ප්‍රථම දෙක අනුලොම ඥාණය මගින් අනිච්ච ලක්ෂණය දැක අනිමිත්ත මාර්ගය පහළවන ආකාරය දක්වයි. දෙවැනි යුගලය දුක්ඛ ලක්ෂණය දැක අප්‍රණිහිත මාර්ගය පහළ වනාකාරය දක්වයි. තුන්වන යුගලය අනත්ත ලක්ෂණය දැක සුඤ්ඤත මාර්ගය පහළවන ආකාරය දක්වයි. ඉතිරි පාළි ඡේද තිස් හතර පටිසම්භිදා මග්ග විපස්සනා කථාහි

බලා සිත තබාගත යුතු. සංක්ෂිප්තයෙන් දැන ගැනීමට කැමැත්තේ නම් පටිසංඛානු ඤාණ අවස්ථාවේ දැක්වූ ආකාර සතලිස බලනු මැනවි. එම සතලිස අනුලොම ඤාණයෙන් ද දත යුතු ආකාරයෝය.

මිලින්ද පඤ්හ හි ඇස්පනාපිට මග-ඵල ඤාණ පහළ වන ආකාරය පහත දැක්වෙන ලෙසට දේශනා කොට ඇත්තේය.

**තස්ස තං චිත්තං අපරාපරං මනසිකරොතො පවත්තං සමතික්කමිත්වා අප්පවත්තං ඔක්කමති අප්පමත්තමනුප්පත්තො මහාරාජ සම්මා පටිපන්නො නිබ්බාන සච්ඡිකරොතීති වුච්චති** [මි. ප. (බු) 311]

| | | |
|---|---|---|
| **අපරා පරං** | = | පියවරින්, පියවර |
| **මනසිකාරතො** | = | සිත යොදා භාවනා කරන විට |
| **වා** | = | සිත යොදා භාවනා කරන |
| **තස්ස** | = | එම යෝගීගේ |
| **තං චිත්තං** | = | එම භාවනා කරන සිත |
| **පවත්තං** | = | කෙළවරක් නොමැතිව අඛණ්ඩව පහළ වෙමින් පවතින රූප-නාම ප්‍රවාහය |
| **සමතික්කමිත්වා** | = | ඉක්මවා |
| **අප්පවත්තං** | = | අඛණ්ඩව පහළ වෙමින් පවතින්නා වූ රූප නාම ප්‍රවාහයෙහි ප්‍රතිවිරුද්ධ ස්වභාවයට හෙවත් නැවැත්මට |
| **වා** | = | ඇතිවීම් කැලම නැති ස්වභාවය |
| **ඔක්කමති** | = | බැසගනී |
| **මහරාජ** | = | මිලිඳු මහරජතුමනි, |
| **සම්මාපටිපන්නො** | = | මනාලෙස ප්‍රතිපත්ති පුරා |
| **අප්පවත්තං** | | |
| **අනුප්පත්තො** | = | රූප-නාම කැලම පහළ නොවන ස්වභාවයට පත්වූ පුද්ගලයා |
| **නිබ්බානං** | | |
| **සච්ඡිකරොතීති** | = | නිවන ප්‍රත්‍යක්ෂ ලෙස සාක්ෂාත් කරයි යැයි |
| **වුච්චති** | = | කියනු ලැබේ |

දිගින් දිගට අතරක් නොතබා ගලන ජල ප්‍රවාහයක් දෙස බලා සිටින්නාක් මෙන්, විපස්සනා ඤාණ පහළ වෙමින් පවතින අවස්ථාවේ. එකකට පසු එකක් කෙළවරක් නැති ලෙසට ඇතිවෙමින්-නැතිවෙමින් ප්‍රකට වෙමින් පවතින රූප-නාම ප්‍රවාහයට පියවරින් පියවර සිතයොදා මනසිකාරය යොදා බලමින් මෙනෙහි කරමින් සිටී. මෙලෙස මෙනෙහි කරමින් සිටින විට විශේෂයෙන් යුහුසුළුව ප්‍රකටවන වුට්ඨාන ගාමිනී ඤාණය පහළ වී නම් යෝගී සිත මෙනෙහි කරන රූප-නාම ප්‍රවාහයට සිත නොයොදා එම කෙළවරක් නොමැතිව පහළ වෙමින් පවතින රූප - නාම ප්‍රවාහයෙහි ප්‍රතිවිරුද්ධ ස්වභාවයට වැදගන්නාසේ බැසගනී. කෙළවරක් නැතිව පහළ වෙමින් පවතින රූප - නාම ප්‍රවාහයෙන් ප්‍රතිවිරුද්ධ ස්වභාවය යනු අතරක් නොතබා පහළ වෙන රූප-නාම අරමුණ හා ඒවා එකිනෙකක් මෙනෙහි කොට දැන ගැනීම යන මේවායේ සංසිඳීම ම නිරොධය ම වේ. වැටී යන සිත යන්නද ගොත්‍රභූ සිත-මාර්ග සිත - ඵල සිතම වේ. මෙලෙස පත්වී නම් එම පුද්ගලයා නිවන ප්‍රත්‍යක්‍ෂ ලෙස දැකගත්තේ යැයි කියනු ලැබේ.

බොහෝ සූත්‍ර පාළි දැක්වීම් වල මාර්ග ඤාණය පහළ වන ආකාරය **ධම්ම චක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති** යනුවෙන් දැක්වේ. (දී. ආදිය)

| | | |
|---|---|---|
| **සමුදය ධම්මං** | = | යමක් පහළ කරවන ස්වභාවය ඇති |
| **වා** | = | පහළ කරවිය හැකි |
| **යං කිඤ්චි** | = | යම්කිසි ධර්මයක් |
| **අත්ථි** | = | ඇත්තේ ද, |
| **තං සබ්බං** | = | එම පහළවනතාක් ධර්ම සියල්ල |
| **නිරොධ ධම්මං** | = | නිරොධ වන ස්වභාවය ඇත්තේ ම ය |
| **ඉති** | = | මෙලෙස දැක දැනගත් ආකාර වශයෙන් |
| **ධම්ම චක්ඛුං** | = | මාර්ගය දැක දැන ගැනීම නම් වූ ඤාණ ඇස |
| **උදපාදි** | = | පහළ විය. |

මාර්ගය පහළ වන ක්ෂණයෙහි "පහළ කරවන ස්වභාවය ඇති ධර්ම සියල්ල නිරුද්ධ වන ස්වභාවය ඇත්තේය"යි මනසිකාරය යොදනවා, සලකා බලනවා නොවේ. ඇත්ත වශයෙන් වනාහි පහළ වන ස්වභාවය ඇති සියලු සංස්කාරයන්ගේ නිරුද්ධවීම නම් වන නිවන ප්‍රත්‍යක්ෂ ලෙස දැන ගැනීමට වේ. නමුදු මාර්ග ක්ෂණයෙහි එළෙස දැනගෙන පහළ වන බැවින් ප්‍රත්‍යවේක්ෂණයේ යෙදී සිත සළකා බලන අතර වාරයේ අරමුණ හා මෙනෙහි කොට දැනගන්නා විපස්සනා නම් වන පහළ විය හැකි සියලු සංස්කාරයන්ගේ නිරුද්ධ වීමට පත්වේ යැයිද දැනගනී - අනුපාදිසෙස නිර්වාන ධාතුවට පත්වූ අවස්ථාවෙහි "පහළ විය හැකි සියලු සංස්කාරයන් නිරුද්ධවේ" යැයිද දැක දැන පහදී. තවදුරටත් "පහළ වන තාක් සංස්කාරයන් නිරුද්ධ වීම ම නොපෙනී යෑම-වේ. " යැයිද දැක දැනගත හැක්කේය. එම නිසා ම මාර්ග-ඵල වෙතට පත්වූ පුද්ගලයා මෙසේ සළකා බැලීමට පසු මෙනෙහි කළ ක්‍රමයට ම මෙනෙහි කරමින් දිගට ම භාවනාව පැවැත්වූව හොත් ඇතිවීම -නැතිවීම දැක දැන ගැනීම දැක දැන ගත්තා උදයබ්බයේ සිත තැන්පත්වේ. යට දැක්වෙන්නේ එම පාළියෙහි අට්ඨ කථා විවරණයයි.

**ධම්ම චක්ඛුන්ති එත්ථ සොතාපත්ති මග්ගො අධිප්පෙතො. තස්ස උප්පත්ති ආකාර දස්සනත්ථං "යං කිඤ්චි සමුදය ධම්මං, සබ්බන්තං නිරොධ ධම්මන්ති" ආහ. තඤ්හි නිරොධං ආරම්මණං කත්වා කිච්චවසෙන එවං සබ්බ සංඛතං පටිවිජ්ඣන්තං උප්පජ්ජති.** [දී. අ. 1/195]

**ධම්ම චක්ඛුන්ති** = "ධම්ම චක්ඛුං" යන පදයෙන්

**එත්ථ** = මෙම අම්බට්ඨ සූත්‍රයෙහි එන ලෙසට

**සොතාපත්ති මග්ගො** = සෝතාපත්ති මාර්ගය

**අධිප්පෙතො** = අදහස් කරන ලදි.

(බ්‍රහමායු සූත්‍රයෙහි උපරි මාර්ග ඤාණ තුනද, රාහුලෝවාද සූත්‍රයෙහි මාර්ග සත්‍යය සතරම ධම්ම චක්ඛු යැයි දේශනා කරන ලදී.)

**තස්ස** = එම මාර්ගයේ

**උප්පත්ති ආකාර**
**දස්සනත්ථං** = පහළ වන ආකාරය දැක්වීමට

යං කිඤ්චි සමුදය ධම්මං

සබ්බං තං නිරොධ ධම්මන්ති = යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති යැයි

ආහ = දේශනා කළ සේක.

(මාර්ගය වනාහි අසංඛත ධර්මයම අරමුණු කරයි. සංඛතය වනාහි අරමුණු නොකරයි. එම නිසා "යං කිඤ්චි සමුදය ධම්මං සබ්බන්තං නිරොධ ධම්මං" යැයි දැක දැන මාර්ග පහළවන බව කුමක් නිසා කියන ලද්දේද යන මේ ප්‍රශ්නයට කිඤ්චි නම් වූ වචනයෙන් පිළිතුරු දෙයි.)

හි = උප්පත්ති ආකාර දස්සනත්ථං යැයි කීමට හේතුව වනාහි

තං = එම මාර්ග ඥාණය

නිරොධං = සියලු සංස්කාරයන්ගේ නිරෝධයෙන් වන නිවන

ආරම්මණං කත්වා = අරමුණු කොට

කිච්ච වසෙන = මෝහයෙන් තොරවූ දැන ගැනීමේ කෘත්‍යය සම්පූර්ණ කිරීම් වශයෙන්

සබ්බ සංඛතං = සියළු සංස්කාර ධර්ම

එවං = යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං" යැයි දැන ගත් ආකාරය වශයෙන්

පටිවිජ්ඣන්තං = සෘජුවම සම්පූර්ණ ලෙස විනිවිද දැන ගැනීම

උප්පජ්ජති = පහළ වේ

## විශේෂයෙන් සැළකිලිමත් විය යුත්තක්

මාර්ග වීථිය යෙදෙන ආකාරය දැක්වීම අට්ඨ කථාවන් හි මෙන්ම, මෙම ග්‍රන්ථයෙහි ද හුදු බහුශ්‍රැත භාවය සඳහා දක්වනු ලැබේ. එක වීථියක් තුළ සමාන ආරම්මණික චිත්ත ක්‍ෂණ ප්‍රමාණය මෙපමණක්

වන්නේ යැයි හරියටම වෙන් වෙන් වශයෙන් ගණන් වශයෙන් ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දැනගැනීම කළ නොහැක්කකි. එම නිසා මග්‍ග වීථි පහළවන අවස්ථාවෙහි කුමන ජවන චිත්ත, කොපමණක් ජවන චිත්ත පහළ වන්නේදැයි ආදී වශයෙන් පරීක්‍ෂා කළ නොහේ. පෙරාතුව අනුලෝම ඤාණය තෙක් විපස්සනා ඤාණයන් පිළිවෙලින් පහළ වී එන ආකාරයද, විශේෂිත වුට්ඨාන ගාමිනී විපස්සනාවේ පහළ වීම් ආකාරයද, අනුලෝම යැයි කියන අවසාන ලෙස මෙනෙහි කොට දැනගැනීමත් සමගම නිවන් අරමුණට ඉබේම මාරුවීම්-ගමන් කිරීම් ආකාරයද. ඉන්පසු සළකා බලන ප්‍රත්‍යවේක්‍ෂා ඤාණ පහළවන ආකාරයද යන මේ කාරණා පමණක් විශේෂයෙන් සළකා පාළි අට්ඨ කථාවන්ට අනුලොම් බව විලොම බව සළකා ගලපා බැලිය යුතුය.

***අනුලෝම, ගොත්‍රභූ, මග්ග ඤාණ නිමියේ යැ***

# පච්චවෙක්ඛණ ඤාණ

මාර්ග ඤාණ, ඵල ඤාණ මගින් නිවන ප්‍රත්‍යක්ෂ ලෙස දැකගත් පුද්ගලයා ප්‍රථමයෙන් තමා සාක්ෂාත් කළ මඟ, ඵල, නිවන් පිළිබඳව නැවත සළකා බලයි. බහුශ්‍රැත පුද්ගලයෙක් වන්නේ නම් දුරු කළ හා බැහැර කළ, කෙළෙස් දුරු නොකළ හා බැහැර නොකළ කෙළෙස් පිළිබඳව ඉදිරියට සළකා ප්‍රත්‍යවේක්ෂා කරයි. මෙම සළකා බැලීමේදී යෙදෙන ඤාණය පච්චවෙක්ඛණ ඤාණය නම් වේ. යට දැක්වෙන්නේ විශේෂයෙන් සිත තබා ගත යුතු අභිධම්මත්ථ සංග්‍රහයෙහි දැක්වෙන ගාථාවකි.

**මග්ගං ඵලං ච නිබ්බානං පච්චවෙක්ඛති පණ්ඩිතො**
**හීනෙ කිලෙසෙ සෙසෙ ච පච්චවෙක්ඛති වා නවා**

| | | |
|---|---|---|
| පණ්ඩිතො | = | නිවන සාක්ෂාත් කළ පණ්ඩිත තෙමේ. |
| මග්ගඤ්ච | = | පෙරාතුව මෙනෙහි කොට දැනගත් විපස්සනා මාර්ගය හා සංස්කාර නිරොධය තෙක් පැමිණි ආර්ය මාර්ග ධර්මය ද |
| ඵලඤ්ච | = | මාර්ගයට අනතුරුව එළෙසටම සම්බන්ධවී පහළ වූ ඵල ධර්මය ද |
| නිබ්බානඤ්ච | = | සියලු සංස්කාරයන්ගෙන් ශූන්‍ය වූ නිරුද්ධ වූ ශාන්ත වූ නිර්වාන ධර්මය ද |

| | | |
|---|---|---|
| පච්චවෙක්ඛති | = | ප්‍රත්‍යවේක්ෂා කරයි |
| හීනෙ පහීනෙ | = | බැහැර කළ - දුරු කළ |
| කිලෙසෙච | = | කෙලෙස්ද |
| සෙසෙච | = | ඉතිරි වූ කෙලෙස්ද |
| පච්චවෙක්ඛති වා | = | ප්‍රත්‍යවේක්ෂා කිරීමද |
| න පච්චවෙක්ඛති වා | = | ප්‍රත්‍යවේක්ෂා නොකිරීම ද වේ |

මාර්ගීය ප්‍රත්‍යවේක්ෂා කිරීම, ඵලය ප්‍රත්‍යවෙක්ෂා කිරීම, නිවන ප්‍රත්‍යවේක්ෂා කිරිම යන මේ ප්‍රත්‍යවේක්ෂා තුන ඒකාන්තයෙන් පහළ වේ. දුරු කළ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කිරිම, දුරු නොකළ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කිරිම සිදුවන අවස්ථාද ඇත, සිදු නොවන අවස්ථාද ඇත. ඒකාන්තයෙන් සිදුවනවාම නොවේ. අනෙකාන්ත වේ. කුමන මාර්ග ඥාණයක් කුමන කෙලෙස් ප්‍රමාණයක් දුරු කරයිද යන්න ඇසූ පිරූ තැන් ඇත්තන්ට පමණක් පහළ වේ. එසේ නැති ඇත්තන්ට පහළ නොවීමද විය හැක්කකි. බොහෝ අට්ඨ කථාවන්හී මේ ලෙසටම දක්වත්. සමහර ප්‍රත්‍යවේක්ෂාවන් පහළ නොවීම මතු දැක්වෙන ම. නි. මූල පණ්ණසක අට්ඨ කථාවේ මූල දුක්ඛක්ඛන්ධ සූත්‍ර පාළි අටඨ කථාවන් මගින් දත යුතුය.

**තස්ස මය්හං භන්තෙ එවං හොති. කොසු නාම මෙ ධම්මො අජ්ඣත්තං අප්පහීනො. යෙන මෙ එකදා ලොභ ධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති. දොස ධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති. මොහ ධම්මාපි චිත්තං පරියාදාය තිට්ඨන්ති. සො එව ඛො තෙ මහානාම ධම්මො අජ්ඣත්තං අප්පහීනො**

[ම. නි. 1/214]

| | | |
|---|---|---|
| භන්තෙ | = | ස්වාමීන් වහන්ස, |
| තස්ස මය්හං | = | ලෝභ, දෝස මෝහ යන මේවා වලට යටවී තිබෙන ඒ අපට |
| එවං | = | මෙලෙස සිත විසිරි යෑම (විචිකිච්ඡා) |
| හොති | = | පහළ වේ. ස්වාමීන් වහන්ස, |
| කිනති | = | කෙසේ පහළ වන්නේද යත් |
| යෙන | = | දුරු නොකළ කෙලෙස් ධර්ම නිසා |

| | | |
|---|---|---|
| එකදා | = | වරෙක |
| ලොභ ධම්මාපි | = | ලෝභ ධර්මයෝද |
| මෙ | = | මගේ |
| චිත්තං | = | පිරිසිදු සිත |
| පරියාදාය | = | හාත්පසින් මැඩගත |
| තිට්ඨන්ති | = | සිටිත්. |
| දොස ධම්මාපි -පෙ- | | |
| තිට්ඨන්ති | = | ද්වේෂ ධර්මය ද පිරිසිදු සිත හාත්පසින් මැඩගත සිටිත් |
| මොහ ධම්මාපි -ප- | | |
| තිට්ඨන්ති | = | මෝහ ධර්මය ද පිරිසිදු සිත හාත්පසින් මැඩගෙන සිටිත් |
| මේ අජ්ඣත්තං | = | මගේ අධ්‍යාත්මික සන්තානයෙහි |
| අප්පහීනො | = | දුරු නොකළ |
| සො ධම්මො | = | එම කෙලෙස් ධර්ම |
| කොනාම | = | කුමන ධර්මය ද යැයි |
| එවං හොති | = | මෙලෙස සිත විසිරීම්, විචිකිච්ඡා පහළ වේ |
| ඉති | = | මෙලෙස අසයි. |
| මහානාම | = | මහානාම රජ |
| තෙ අජ්ඣත්තං | = | තොපගේ ආධ්‍යාත්මික සන්තානයෙහි |
| අප්පහීනො | = | ප්‍රහානය නොකරන ලද ධර්මයෝ |
| සො එව ඛො ධම්මො | = | සිත හාත්පසින් මැඩගෙන සිටින එම ලෝභ දොස මෝහ ධර්මයක්ම වෙත්යැයි බුදුරජාණන් වහන්සේ පිළිතුරු දේශනා කළ සේක. |

## ප්‍රත්‍යවේක්ෂා එකක් පමණක් ද පහළවිය හැකි බව

"අයං කිර රාජා සකදාගාමී මඤ්ඤෙන ලොභ දොස මොහ නිරවසෙසා පහීයන්ති"ති සඤ්ඤී අහොසි, අයං "අප්පහීනං මෙ අත්ථි" තිප ජානාති. අප්පහීනකං උපාදාය පහීනකං පුන පච්චනොවා වත්තතීති සඤ්ඤී හොති. අරිය සාවකස්ස එවං සන්දෙහො උප්පජ්ජතීති, ආම උප්පජ්ජතීති. කස්මා

පණ්ණත්තියා අකොවිදත්තා "අයං කිලෙසො අසුක මග්ග වජ්ඣො"ති ඉමිස්සා පණ්ණත්තියා අකොවිදස්ස හි අරිය සාවකස්සාපි එවං හොති කිං තස්ස පච්චවෙක්ඛණා නත්ථීති, අත්ථි, සා පන න සබ්බෙසං පරිපුණ්ණා හොති එකොහි පහීන කිලෙස මෙව පච්චවෙක්ඛති, එකො අවසිට්ඨ කිලෙස මෙව, එකො මග්ග මෙව, එකො ඵලමෙව, එකො නිබ්බාන මෙව, ඉමාසු පඤ්චසු පච්චවෙක්ඛණාසු එකොවා. ද්වෙ වා නො ලද්ධුං න වට්ටති

[ම. නි. අ. 2/51]

| | | |
|---|---|---|
| අයං රාජා | = | සකදාගාමි මග්ග ඵලස්ථ මෙම මහානාම රජ |
| සකදාගාමි මග්ගෙන | | |
| පහීයන්තීති සඤ්ඤී | = | ලොභ, දොස, මොහ, යන මේවා සකදාගාමී මාර්ගයෙන් ඉතිරි නොකර දුරු කරයි යැයි හැඟීම |
| අහොසි කිර | = | පහළවිය. |
| අයං | = | මෙම රජතුමා |
| 'අප්පහීනං මේ අත්ථීතිපි | = | මා තුළ දුරු නොකළ කෙලෙස් ඇත්තේ යැයි ද |
| ජානාති | = | දනී |
| අප්පහීනකං උපාදාය | = | අප්‍රහීන කෙලෙස් මත පිහිටා |
| පහීනකං | = | ප්‍රහීන කළ කෙලෙස් |
| පුන පච්ඡතොවා වත්තතීති | | |
| සඤ්ඤී | = | නැවත පසු කාලයක නැවත පහළවේ යැයි හැඟීම |
| හොති | = | වේ |
| අරිය සාවකස්ස | = | ආර්ය ශ්‍රාවකයනට |
| එවං සන්දෙහො | = | මෙලෙස විචිකිච්ඡා |
| උප්පජ්ජතීති | = | පහළවිය හැකිදැයි යන ප්‍රශ්නයට |
| ආම උප්පජ්ජති | = | එසේය, පහළවිය හැකියැයි කියයුතු |
| තස්මා | = | කුමක් නිසා පහළ විය හැකිද යත් |
| පණ්ණත්තියා | | |
| අකොවිදත්තා | = | දේශනා, ප්‍රඥප්ති විෂයෙහි අදක්ෂ, නොදැනුවත්කම නිසාය |
| හි | = | විස්තර කර දක්වතොත් |

අයං කිලෙසාඅසුක
මග්ග වජ්ඣොති
ඉමිස්සා පණ්ණත්තියා

| | | |
|---|---|---|
| අකොවිදස්ස | = | කුමන ක්ලේශයක් කුමන මාර්ගයෙන් ප්‍රහීන වේදය යන දේශනාව නොතේරෙන |
| අරිය සාවකස්සාපි | = | ආර්ය ශ්‍රාවකයාට ද |
| එවං | = | මෙලෙස වූ විචිකිච්ඡා පහළ විය හැක්කේය |
| තස්ස | = | එම ආර්ය ශ්‍රාවකයාට |
| පච්චවෙක්ඛනා | = | සළකා බලන ප්‍රත්‍යවෙක්ෂාව |
| නත්ථි කින්ති | = | නොමැත්තේදැයි යන ප්‍රශ්නයට |
| අත්ථි | = | ඇත්තේය යනු පිළිතුරයි |
| පන | = | නමුදු |
| සා | = | එම ප්‍රත්‍යවෙක්ෂාව |
| සබ්බසං | = | සියළු ආර්යයන් වහන්සේලාට |
| පරිපුණ්ණා න හොති | = | පිරිපුන් වෙනවාම නොවේ. |
| හි | = | සම්පූර්ණ නොවන ආකාරය දක්වතොත් |
| එකො | = | සමහර ආර්යයන් වහන්සේලා |
| පහීන කිලෙසමෙව | = | ප්‍රහීන කෙලෙස් පමණක් ප්‍රත්‍යවේක්ෂා කරයි |

(මෙහිලා 'එව' ශබ්දයෙන් ඉතිරි සතර ස්ථානයන් ද ප්‍රත්‍යවේක්ෂා නොකරන බව දක්වයි. පසු ඡේදයන් සඳහාද මේ ක්‍රමයට මැයි)

| | | |
|---|---|---|
| එකො | = | එක් ආර්යයන් වහන්සේ නමක් |
| අවසිට්ඨ කිලෙසමෙව | = | අවශිෂ්ඨ කෙලෙස් පමණක් ප්‍රත්‍යවේක්ෂා කරයි |
| එකො | = | තවත් කෙනෙක් |
| මග්ගමෙව | = | මාර්ගය පමණක් ප්‍රත්‍යවේක්ෂා කරයි |
| එකො | = | තවත් කෙනෙක් |
| ඵල මෙව | = | ඵලය පමණක් ප්‍රත්‍යවේක්ෂා කරයි |
| එකො | = | එක් කෙනෙක් |
| නිබ්බානමෙව | = | නිවන පමණක් ප්‍රත්‍යවේක්ෂා කරයි |

ඉමාසු පඤ්චසු

| | | |
|---|---|---|
| පච්චවෙක්ඛනාසු | = | මෙම පස් ආකාර ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙහි |
| එකො වා | = | එකක් වේවා |
| ද්වෙ වා | = | දෙකක් වේවා |

(වට්ටන්ති යන්නෙහි කතෘත් වෙති)

| | | |
|---|---|---|
| නොලද්ධුං න වට්ටති | = | නොලැබීම වනාහි සිදුනොවේ. ලැබීම සිදුවේ. |

(පච්චවෙක්ඛණා එකක් වේවා දෙකක් වේවා, ඒකාන්තයෙන් පහළ විය යුතු යැයි යන්න අදහසයි.)

අනෙකුත් අට්ඨ කථාවන්හි "මග, ඵල, නිවන ඒකාන්තයෙන් පච්චවෙක්ඛණා කිරීමත්, දුරුකළ, නොකළ කෙලෙස්, අනෙකාන්තව පච්චවෙක්ඛනා කරයි" යැයි සෘජු ලෙසට දක්වති. මෙම ම. නි. මූල පණ්ණාස අට්ඨ කථාවෙහි පච්චවෙක්ඛණා එකක් ම පහළ වන බව දක්වයි එම නිසා මෙය අනෙකුත් අට්ඨ කථාවන් අතර විශේෂයැ. නමුදු පච්චවෙක්ඛනා එකක් ම ඇති ආර්යයන් වහන්සේලා ඇත්ද නැත්ද යන්න විනිශ්චය කිරීම සාමාන්‍ය පුද්ගලයන්ගේ ක්‍ෂේත්‍රයේ පවතින්නක් නොවේ. ශාසනයේ ඇති තාක් ආර්යයන් වහන්සේලාගේ සිත් පහළ වන ආකාරයන් ඉතිරි නොකර දැනගත හැකි උතුමන්ගේ විෂය ක්‍ෂේත්‍රය වන්නේය. එමනිසා මෙම මූලපණ්ණාස අට්ඨ කථා දැක්වීමද ඉතා සැලකිල්ලෙන් ගෞරවයෙන් සිත තබාගත යුතුවේ.

## දුරුකළ යුතු කෙලෙස්

මෙහිලා **පණ්ණත්තිකොවිද** වීම සඳහා මාර්ග සතර, මගින් වනාහී සුදුසු ලෙස දුරුකළ යුතු, සංසිඳලිය යුතු කෙලෙස් දැන ගැනීම පිණිස සංක්‍ෂිප්ත ලෙස ලියා දක්වන්නෙමු.

**සංයොජනෙසු තාව සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො අපායගාමිනීයාච කාමරාග පටිඝාති එතෙ පඤ්ච ධම්මා පඨම ඤාණ වජ්ඣා, සොසා කාම රාග, පටිඝ, ඔළාරිකා දුතිය ඤාණ වජ්ඣා සුඛුමා තතිය ඤාණවජ්ඣා, රූප රාගාදයො පඤ්චපි චතුත්ථ ඤාණවජ්ඣා එව පහීනකං**

[වි. ම. 514]

සංයෝජන දහය අතරින් වනාහී සක්කාය දිට්ඨි, විචිකිච්ඡා සීලබ්බත පරාමාස හා ආපයට පමුණුවන සුළු කාම රාග හා පටිඝ යන මේ සංයෝජන පහ ප්‍රථම මාර්ගයෙන් දුරුකරයි. අපාය ගාමිනී නොවන කාම රාග හා පටිඝ යන මේ දෙකින් ඕලාරික වූ කාම රාග හා පටිඝය දෙවැනි මාර්ගයෙන් දුරු කරයි. සුඛුම කාම රාගය හා පටිඝය තුන්වන මාර්ගයෙන් දුරු කරයි. රූප රාග, අරූප රාග මාන, උද්ධච්ච, අවිජ්ජා යන මේ උද්ධම්භාගිය සංයෝජන පහ වනාහී අර්හත් මාර්ගයෙන් දුරු කරයි.

## සටහන

පාළියෙහි 'එව' යන ශබ්දය = 'ම' යන ශබ්දය යන මේවා මගින් සීමා නොකර ඉහළ මාර්ග වලින් දුරුකරයි යැයි කියන තැන "එම කෙලෙස්වල අපාය ගාමිනී කොටස ප්‍රථම මාර්ගයෙන් දුරුකරයි. අපාය ගාමිනී නොවන ඕලාරික කොටස දෙවැනි මාර්ගයෙන් දුරු කරයි. සුඛුම කොටස තුන්වන මාර්ගයෙන් දුරුකරයි. මෙලෙසට දුරු කළ යුතු කොටස යට යට මාර්ගයන්ගෙන් ද දුරු කරන්නේය" යැයි දතයුතු.

**කිලෙසෙසු දිට්ඨි විචිකිච්ඡා පඨම ඤාණ වජ්ඣා දොසො තතිය ඤාණ වජ්ඣා ලොභ, මොහ, මාන, ථීන, උද්ධච්ච අහිරික අනොත්තප්පාති චතුත්ථ ඤාණ වජ්ඣාති.**

කෙලෙස් දහය තුළින් දිට්ඨි දෙක විචිකිච්ඡා, ප්‍රථම මාර්ගයෙන් දුරු කරයි. දෝසය ත්‍රිතීය මාර්ගයෙන් දුරුකරයි. ලෝභ, මෝහ මාන, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන මේවා අර්හත් මාර්ගයෙන් දුරු කරයි.

(මෙහිලා 'එව' ශබ්දය = 'ම' ශබ්දය යනමේවා මගින් සීමා නොකරන ලද බැවින් දෝසයෙහි අපාය ගාමිනී කොටස, ඕලාරික කොටස ප්‍රථම ද්විතීය මාර්ග දුරුකරයි. ලෝභ මෝහ ආදී කෙලෙස් හතෙහි අපාය ගාමිනී කොටස හා ඕලාරික කොටස කාමය හා බැඳුනු සුඛුම කොටස් පහත දැක්වෙන මාර්ග තුනෙන් දුරුකරයි යැයි දත යුතු (මතු දැක්වෙන ඡේදයන් සම්බන්ධයෙන් ද මෙලෙසටම යැයි දතයුතු.)

**මිච්ඡත්තෙසු -මිච්ඡාදිට්ඨි, මුසාවාදො, මිච්ඡා කම්මන්තො, මිච්ඡා ආජීවොති ඉමෙ පඨම ඤාණවජ්ඣා, මිච්ඡා සංකප්පො, පිසුනා වාචා**

ඵරුසා වාචාති ඉමෙ තතිය ඤාණවජ්ඣා, චෙතනා යෙව චෙත්ථවාචාති වෙදිතබ්බා. සම්පප්ඵලාප, මිච්ඡා වායාම සති සමාධි විමුත්ති ඤාණානි චතුත්ථ ඤාණ වජ්ඣානි [වි. මා. 514]

| | | |
|---|---|---|
| මිච්ඡත්තෙසු | = | මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප, මිච්ඡා වාචා, මිච්ඡා කම්මන්ත, මිච්ඡාආජීව, මිච්ඡා වායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධි මිච්ඡා ඤාණ, විමුක්ති යන මිච්ඡා ධර්ම දහය තුළින් |
| මිච්ඡා දිට්ඨි මුසාවාදො, මිච්ඡා කම්මන්තො මිච්ඡා ආජීවොති ඉමෙ | = | මිච්ඡා දිට්ඨි, මිච්ඡා වාචා, මුසාවාදා මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව යන මේ ධර්මයන් |
| පඨමා ඤාණවජ්ඣා | = | ප්‍රථම මාර්ග ඤාණයෙන් දුරු කරන ලදී. |
| මිච්ඡා සංකප්පො, පිසුනා වාචා, ඵරුසාවාචාති ඉමෙ | = | මිච්ඡා සංකප්පො, පිසුනා වාචා, ඵරුසා වාචා යන මේ ධර්මයන් |
| තතිය ඤාණවජ්ඣා | = | තෘතිය ඤාණයෙන් දුරු කරනු ලැබේ. |
| ච | = | යට දැක්වූ කථාවෙහි වරදවා වටහා ගැනීමට ඇති ඉඩ ඇහිරීම සඳහා |
| එත්ථ | = | මේ මිච්ඡා වාචා, පිසුණා වාචා, ඵරුසාවාචා යැයි කියන තැන |
| චෙතනා යෙව | = | අනර්ථය පිණිස කථා කරන චෙතනාවම |
| වාචාති | = | කථාව යැයි |
| වෙදිතබ්බා | = | දතයුතු |

කථා කරන ශබ්දයම මුඛ්‍ය ලෙස වාචා නම් වේ. නමුදු එම කථා ශබ්ද රූපය වාචා යන්න වනාහි මාර්ගයෙන් දුරු කළයුතු පහාතබ්බ ධර්මය නොවේ. එබැවින් මෙතැන එම අකුසල චෙතනාවම මිච්ඡා වාචා, පිසුණා වාචා, ඵරුසා වාචා, යැයි කියනුලැබේ. මෙම චෙතනා පමණක් මාර්ගයෙන් දුරුකරයි. හුදු කථා ශබ්දය පමණක් මිච්ඡා වාචා, පිසුනා වාචා, ඵරුසා

වාචා යැයි නොකියනු ලැබේ. එම කථා ශබ්දය වනාහි මාර්ගයෙන් ද දුරුකරනවා නොවේ. නමුදු චෙතනාව නැතිනම් එම චෙතනා හා බැඳුනු කථා කිරීම් ද බොහෝ සෙයින් නැතිව යයි. පිළිඥවඹ මහාථෙර මෙන් අනෙකුත් ඉතා සුළු ප්‍රමාණයක් පුද්ගලයන්ට අකුසල් චිත්ත චෙතනා නොමැතිව පුරුද්ද අනුව කථා කිරීම පහළ විය හැක්කේය.

**සම්ඵප්පලාප මිච්ඡා වායාම සති සමාධි විමුත්ති ඤාණනි = මිච්ඡා වාචා තුළ වනාහි සම්ඵප්පලාප, මිච්ඡා වායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධි මිච්ඡා විමුත්ත මිච්ඡා ඤාණ යන මේවා**

**චතුත්ථ ඤාණ වජ්ඣා** = අර්හත් මාර්ග ඤාණයෙන් දුරුකරයි.

මෙම **මිච්ඡත්ත** දහය තුළ වචීදුශ්චරිත හතර, අකුසල් චෙතනා මිච්ඡාවාචා නම් වේ. කාය දුශ්චරිත තුන අකුසල චෙතනා මිච්ඡා කම්මන්ත නම් වේ. ආජීවය හා සම්බන්ධ කාය වචී දුශ්චරිත හත අකුසල් චෙතනා මිච්ඡා ආජීව නම් වේ. පුතා, බිරිය යන අය පිළිබඳ මතක් වීම, පෙර විඳින ලද කාම පහස පිළිබඳව මතක් වීම, ආරවුල් කලහයන් පිළිබඳව මතක්වීම, ආදී වශයෙන් ලෞකික වස්තු සම්බන්ධ කටයුතු යටගියාව පිළිබඳව නැවත මෙනෙහි වීම් වශයෙන් පහළවන අකුසල් චිත්තුප්පාද මිච්ඡා සති නම් වේ. නරක කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ක්‍රම හා විධි කල්පනා කිරීම වශයෙන් නරක ක්‍රියා කළ පසු එම නරක කටයුත්ත හොඳ යැයි නැවත කල්පනා කිරීමෙන් පහළ වන මොහය මිච්ඡා ඤාණය නම් වේ. කෙලෙස් වලින් නොමිදීම මිදුනා යැයි කල්පනා කිරීම ද, කෙලෙස් වලින් නිදහස් නොවූ ධර්මයන්ට නිදහස් ධර්ම යැයි කල්පනා කිරීමද, මිච්ඡා විමුක්ති නම් වේ. මූලික වශයෙන් මේවා ලොභ චිත්තුප්පාදයෙන්ම වේ. අපාය ගාමිනී වන්නා වූ මේ මිච්ඡා විමුක්තිය ප්‍රථම මාර්ගයෙන් දුරු කරයි. අපාය ගාමිනී නොවන්නා වූ ඖලාරික සුඛුම කාමරාග හා බැඳුනු මිච්ඡා විමුක්තීන් දෙවැනි තෙවැනි මාර්ග වලින් දුරු කරයි. භව රාග හා බැඳුනු මිච්ඡා විමුක්ති අර්හත් මාර්ගයෙන් දුරුකරයි. ඉතිරි මිච්ඡත්තයන් පිළිබඳව අර්ථ ප්‍රසිද්ධයැ.

**ලොක ධම්මෙසු පටිඝො තතියඤාණ වජ්ඣා අනුනයො චතුත්ථ ඤාණ වජ්ඣො, යසෙච පසංසාය ච අනුනයො තතිය ඤාණ වජ්ඣොති එකෙ** [වි. ම. 514 ]

අෂ්ට ලෝක ධර්මයන් ගෙන් අලාභය, අයස, නින්දා, දුක නිසා පහළ විය හැකි ද්වේෂය අනාගාමී මාර්ගයෙන් දුරු කරයි. ලාභ ලැබීම, යසස, සුඛ, ප්‍රශංසා යන මේවා නිසා පහළ විය හැකි සතුට, ලෝභය අර්හත් මාර්ගයෙන් දුරු කරයි. එකෙ වාද ක්‍රමයට යසස ප්‍රශංසා යන මේවා සම්බන්ධව ලෝභය තෘතිය මාර්ගයෙන් දුරුකරයි. (ග්‍රන්ථයන්හි මෙම එකෙවාදා කෙෂත්‍රයන් චතුත්ථ ඤාණවජෙඣා යැයි ම දක්වයි. එම පාළියෙහි දැක්වෙන ලෙසට ලාභ සුඛ යන මේවාට අනුව සතුටුවීම තතිය මාර්ගයෙන් දුරු කරයි යැයි අදහස් කෙරේ. නමුදු සුඛය හා සතුට තෘතිය මාර්ගනේ දුරු කිරීම සිදු විය නොහේ. එම නිසා මෙහිලා තතිය ඤාණවජෙඣා යන මූලික පාළිය හරි යැයි හඟිමු.)

පූජනීය ස්ථානය, පිරිවෙන, සේනාසන ගොඩනැඟිලි කාමර, ආදී තමා වසන ස්ථානයේ වෙනත් කෙනෙක් පැමිණ විසීම නොඉවසිය හැකි කම, පැමිණීම නොකමැතිවීම, පැමිණ සිටින පුද්ගලයන් වෙනත් තැනකට යනවා දකීමට කැමතිවීම යන මේවා **ආවාස මච්ඡරිය** නම් වේ. නමුදු සතුරු, අමනාප කෙනෙක් ආදී කොට ඇති නරක පුද්ගලයන්ගේ පැමිණීම සමඟ විසීම කැමති නොවීම යනු = මසුරුකම මච්ඡරිය නොවේ.

**භණ්ඩන කාරකාදීනං පන තත්ථ වාසං අනිච්ඡතො ආවාස මච්ඡරියං නාම න හොති.** (අත්ථ සාලිනී....)

තමාගේ ප්‍රත්‍ය දායක දායිකාවන්, ඥාතීන් වැනි සමීප ඇත්තන් වෙතට අනෙක් පුද්ගලයකු එළඹීම නොඉවසිය හැකි බව, අකමැතිවීම **කුල මච්ඡරිය** නම් වේ. නමුදු කෲර නරක පුද්ගලයෙකු එසේ සමීපයට එළඹීම නොඉවසිය හැකිබව, අකමැති බව මච්ඡරිය නොවේ.

**පාප පුග්ගලසස පන උපසඞ්කමනං අනිච්ඡනෙතාපි මච්ඡරිනාම න හොති** (අතථ සාලිනී)

තමාම පමණක් වස්තු ලබනු කැමති වී අනුනට එසේ ලැබීම අකමැතිවන බව **ලාභ මච්ඡරිය** නම් වේ. නමුදු සද්ධාදෙය්‍ය විනිපාතන ආදී වශයෙන් ප්‍රත්‍යය නාස්ති කරන විනාශ කරන පුද්ගලයනට ද ප්‍රත්‍යය අතින් සමෘධ වී අනුනට හිංසාකරන-අසාධාරණ කම් කරන පුද්ගලයනට

ද ලැබීම අකමැතිවීම මච්ඡරිය නොවේ. තවදුරටත් තමා ලද සම්පත්ති පූජාහී පුද්ගලයන් වන සීලවන්ත සබ්‍රහමචාරීන්ට නොදීම, දීමට කැමති නොවීම, ලාභ මච්ඡරියම වේ. නමුදු ඉතාමත් ලබැදි, ප්‍රියමනාප වස්තුවක් තවෙකෙකුට නොදීම මච්ඡරියම නොවේ. ලොභයම නිසා විය හැක්කේය. "තම වස්තුව අනුන් සමඟ සාධාරණ වන බව නොඉවසිය හැකි බව, මච්ඡරියෙහි ලක්‍ෂණයයි. තම වස්තුව දීමට අතහැරීමට නොහැකිව ඇලී බැඳී ගැනීම ලොභයේ ලක්‍ෂණයයි" මේ විශේෂතා ද දත යුතු. තව දුරටත් නැතිවම බැරි, ඇත්තටම ප්‍රයෝජන ගනිමින් පවතින වස්තුවක් දීමට නොහැකි බව පටිසංඛා ඤාණ අවස්ථාවේ පහළ විය හැක. පරිච්ඡේද අංක හතරෙහි සංයොජන දක හැඳින ගන්නා තැන නැවත වරක් බලන්න.

අනුන්ගේ ලස්සන, හැසිරීම්, ආදී ගුණ හෙළි කිරීමට අකමැත්ත ඇසීමට අකමැත්ත ද, තමා ලඟ ඇති ගුණ අනුන් තුළ සම්පූර්ණ වනවා දකීමට අකමැති බව ද, වණ්ණ මච්ඡරිය නම් වේ. නමුදු නැති ගුණ වර්ණනා කිරීම නොරිස්සීම, ඇසීමට අකමැතිකම මච්ඡරිය නොවේ. තමා හැදෑරූ දනගත් පොත්-පත්- ග්‍රන්ථ අන්‍යයන් දනගන්නවාට කැමති නොවීම ධම්ම මච්ඡරිය නම් වේ. නමුදු හොඳ හිත නැති දුෂ් ප්‍රාඥ කෙනෙක් ප්‍රගුණ වීම හෝ උගෙනීම කෙරෙහි අකමැතිවීම, වනාහී මච්ඡරිය නොවේ මේ පස් ආකාර මච්ඡරිය සෝතාපත්ති මාර්ගයෙන් පහ කෙරේ. මච්ඡරියානි පඨම ඤාණ වජ්ඣානි [වි. ම. 514 ]

විපල්ලාසෙසු අනිච්චෙ නිච්චන්ති අනත්තනි අත්තාති ච සඤ්ඤා චිත්ත දිට්ඨි විපල්ලාසා, දුක්ඛෙ සුඛං අසුභෙ සුභන්ති දිට්ඨි විපල්ලාසා, චාති ඉමෙ පඨම ඤාණවජ්ඣා අසුභෙ සුභන්ති සඤ්ඤාචිත්ත විපල්ලාසා තතිය ඤාණවජ්ඣා, දුක්ඛෙ සුඛන්ති සඤ්ඤා චිත්ත විපල්ලාසා චතුත්ථ ඤාණවජ්ඣා [වි. ම. 514 ]

විපල්ලාස දොළස අතරින් අනිච්ච වූ රූප - නාමයන් නිච්ච යැයි සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස යන මේ තුන, ආත්ම නොවන රූප -නාම ආත්ම යැයි සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස යන තුන, දුක්වූ රූප - නාම සුඛයැයි දිට්ඨි විපල්ලාසය සහ අසුභ වූ රූප ධම් සුභ යැයි යන දිට්ඨි විපල්ලාසය යන මේ විපල්ලාස අට

ප්‍රථම මාර්ගයෙන් දුරුවේ. අසුභ වූ රූප ධර්ම මත සුභ යැයි සඤ්ඤා විපල්ලාසය, චිත්ත විපල්ලාසය යන මේ විපල්ලාස දෙක තුන්වන මාර්ගයෙන් දුරු කරයි. දුක්වූ රූප - නාම සුඛ යැයි සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස යන මේ විපල්ලාස දෙක අර්හත් මාර්ගයෙන් දුරුවේ.

සෝතාපන්න, සකදගාමී යන අවස්ථාවල තම ශරීරය හෝ අන්‍යයන්ගේ ශරීරය මත "සුභය සුඛයැයි වරදවා වටහා ගැනීම නම් වූ සඤ්ඤ විපල්ලාස හා චිත්ත විපල්ලාස යන මේවා තවම දුරුවී නැත. එමනිසා කාම ගුණ වස්තු අරමුණු මත පහස, අභිරමණය, සතුට පහළ කරත්. නමුදු ඇත්තටම සුභයැය ඇත්තටම සුඛයැයි නිත්‍ය ලෙස දැඩිව වරදවා වටහා ගැනීම නම් වන දිට්ඨි විපල්ලාස වනාහී නොමැත්තේය. එම නිසා සිත කල්පනා කරන විට "සුභ - සුඛ" යැයි කියන ලද වස්තු හමුනොවී යන්නේය. අනාගාමී ඇත්තන්ට ද සුඛයැයි වන සඤ්ඤා විපල්ලාස චිත්ත විපල්ලාස යන මේවා දුරු නොවී පවතී. එම නිසා තම ස්කන්ධයේ ඇලී බැඳී ගෙන රූප භව- අරූප භව යන්හී සිත බඳී.

විනිශ්චය කිරීම, දේවල් බෙදා හැරීම, පැසසුම්, නින්දා, අනුශාසනා කිරීම, අනුග්‍රහ දැක්වීම ආදිය සිදුකරන අවස්ථාවේ තම ප්‍රියමනාප පැත්තට විශේෂයක් සළකා දීම ඡන්දාගති නම් වේ. විරුද්ධ වාදී පැත්තට අඩුවෙන් සළකා අසාධාරණකම් කිරීම දෝසාගති නම් වේ. නොදන්නා නොතේරෙන බැවින් තේරුම් නොගෙන අසාධාරණකම් කිරීම මොහාගති නම්වේ. බිය සහිත පුද්ගලයෙකුගේ පැත්ත ගෙන අසාධාරණ කම් කිරීම භයාගති නම් වේ. මෙම ගති සතර සෝතාපත්ති වශයෙන් දුරුකරයි. අගති පඨම ඤාණ වණ්ණනාව [වි. ම. 514]

කාමාසව හා භවාසවයන් සූත්‍රාන්ත ක්‍රමයට පහත දැක්වෙන ලෙස විභාග කොට හඳුනාගනී. පහක් වූ කාමගුණ ආරම්මණ වස්තු මත කැමති වන ප්‍රියමනාප වන ලෝභය කාමාසව නම් වේ. රූප භව, අරූප භව, රූප ධ්‍යාන, අරූප ධ්‍යාන, කෙරෙහි කැමැත්ත රුචිය කරන ලෝභයද, සස්සත දිට්ඨිය සමඟ වන ලෝභයද, මනුෂ්‍ය, දේව, නාග, සුපණ්ණ, ස්ත්‍රිය, පුරුෂයා ආදී වශයෙන් කාම භවයෙහි කැමතිවන රුචි කරන ලෝභයද, භවාසව නම් වේ. මේ වනාහී සූත්‍රාන්ත ක්‍රමයට අනුව විභාගයයි. අභිධම්ම ක්‍රමයට

අනුව වනාහී "**භවාසවො චතූසු දිට්ඨිගත විප්පයුත්ත ලොභසහගත චිත්තුප්පාදෙසු උප්පජ්ජති**" යන ධම්ම සංගණී පාළි හා "**රූපාරූප සංඛාතෙ කම්මතො උපපත්තිතො ච දුවිධෙ භවෙ ආසවො භවාසවො**" යන අත්ථ සාලිනී දැක්වීමට අනුව රූප භව අරූප භව, රූප ධ්‍යාන, අරූප ධ්‍යාන යන මේවා කෙරෙහි කැමති වන රුචිකරන බව වශයෙන් පහළ වන දිට්ඨි විප්‍රයුක්ත ලෝභයම භවාසව නම් වේ. අනාගාමී උතුමන්ගේ සන්තානයෙහි ද ඇති අර්හත් මාර්ගයෙන් දුරු කළ යුතු රාගය භව රාගයම වේ.

**කාමාසවො අට්ඨසු ලොභසහගත චිත්තුප්පාදෙසු උප්පජ්ජති**" යන ධම්මසංගණී පාළිය ද, **පඤ්චකාම ගුණික රාගොති උක්කට්ඨ වසෙන වුත්තං භවාසවං ඨපෙත්වා සබ්බො ලොභො කාමාසවොති යුත්තං සියා**" යන මූල ටීකාව හා "**තත්ථ කාමභව පත්ථනාය තාව කාමා සභාවො හොතු, රූපාරූප භවෙසු සස්සතාභිනිවෙස සහගත රාගස්ස කථන්ති? සොපි යථා වුත්ත විසයෙ කාමෙනවසෙන පවත්තිතො කාමාසවො යෙව නාම. සබ්බෙපි හි තෙභූමකා ධම්මා කමනීයට්ඨෙන කාමානි. න චෙත්ථ අනිට්ඨප්පසංගො දිට්ඨිවිප්පයුත්ත ලොභස්ස භවාසව භාවෙන විසුං උද්ධට්ඨත්තා අවසස්සෙවෙත මෙවං විඤ්ඤාතබ්බං, ඉතරථා රූපාරූප භවෙසු උච්ඡෙද දිට්ඨි සහගතස්සාපි ලොභස්ස භවාසව භාවො ආපජ්ජෙය්‍යාති**" යන අනුටීකාවට ද අනුව එම භවාසවයෙන් බැහැර වූ ලෝභයන් සියල්ල කාමාසවයන්ම වෙත් දිට්ඨි දිට්ඨාසව නම්වේ. මෝහය අවිජ්ජාසව නම් වේ. මේ ආසවයන් හතර තුළින් දිට්ඨාසවය ප්‍රථම මාර්ගයෙන් දුරුකරයි. කාමාසවය තතිය මාර්ගයෙන් දුරුකරයි. භවාසවය හා අවිජ්ජාසවය අර්හත් මර්ගයෙන් දුරු කරයි.

**ආසවෙසු දිට්ඨාසවො පඨමඤාණ වජ්ඣො,කාමාසවො තතිය ඤාණ වජ්ඣො, ඉතරෙ ද්වෙ චතුත්ථ ඤාණ වජ්ඣා.** [වි. ම. 514]

නීවරණ පහ තුළින් විචිකිච්ඡාව ප්‍රථම මාර්ගයෙන් දුරු කරයි. සූත්‍රාන්ත ක්‍රමයට අනුව උක්කට්ඨ කාමච්ඡන්දය හා ව්‍යාපාද, කුක්කුච්ච යන මේවා තතිය මාර්ගයෙන් දුරුවේ. ථීන මිද්ධ, උද්ධච්ච යන මේවා අර්හත් මාර්ගයෙන් දුරුකරයි. අභිධර්මයෙහි වනාහි රූප රාග, අරූප රාග යන මේවාද කාමච්ඡන්ද යැයි දක්වා ඇත. අභිධම්ම ක්‍රමයට එම කාමච්ඡන්දය අර්හත් මාර්ගයෙන් ඉතිරි නොකර දුරු කරයි.

නීවරණෙ විචිකිච්ඡා නීවරණං පඨමා ඤාණ වජ්ඣං කාමච්ඡන්දො ව්‍යාපාදො කුක්කුච්චන්ති තීණි තතිය ඤාණ වජ්ඣානි. ථීන මිද්ධ උද්ධච්චානි චතුත්ථ ඤාණවජ්ඣානි [වි. ම. 514 ]

කාමච්ඡන්දස්ස අනාගාමි මග්ගෙන පහානං උක්කට්ඨ නීවරණ වසෙන වුත්තන්ති වෙදිතබ්බං. -පෙ- තස්මා සබ්බො ලොභො කාමච්ඡන්ද නීවරණන්ති අරහත්ත මග්ගෙනස්ස පහානවචනං යුත්තං [මූල ටීකා ]

උපාදානෙසු සබ්බෙසම්පි ලොකීය ධම්මානං වත්ථු කාම වසෙන කාමාති ආගතත්තා රූපා රූප රාගොපි කාමුපාදානෙ පතති. තස්මා තං චතුත්ථ ඤාණ වජ්ඣං, සෙසිස පඨම ඤාණ වජ්ඣානි [වි. ම. 514 ]

වත්ථුකාම නම් වූ ඇතිතාක් ලෞකික ධර්ම කෙරෙහි ඇලී බැඳී ගන්නා ලෝභය කාමූපාදාන නම් වේ. මෙය අර්හත්ත මාර්ගයෙන් දුරුකරයි. බල්ලෙක් හරකෙක් ආදී ලෙසට ව්‍රත සමාදන්ව රැකීම් මගින් සංසාරයෙන් මිදී පිරිසිදු වී සදාකාලික සුඛයට පත්විය හැක්කේ යැයි පිළිගැනීම සීලබ්බතුපාදනය නම් වේ. ආර්ය මාර්ග අටෙන් බැහැරව ලෞකික සීල ව්‍රත සමාදන්වීමෙන් සංසාරයෙන් මිදීමේ හැකියාව ඇතැයි ඇදහීමද මේ සීලබ්බතුපාදනයට වැටේ. සක්කාය දිට්ඨි විස්ස යන අතර දිට්ඨිය අත්තවාදුපාදානය නම් වේ. ඉතිරි මිථ්‍යා දිට්ඨි සියල්ල දිට්ඨුපාදාන නම් වේ. මේ දිට්ඨුපාදාන තුනම ප්‍රථම මාර්ගයෙන් දුරුවේ.

අනුසයෙසු දිට්ඨි විචිකිච්ඡා අනුසයා පඨම ඤාණ වජ්ඣාව. කාමරාග පටිඝානුසයා තතියඤාණ වජ්ඣා. මාන භවරාග විජ්ජානුසයාව චතුත්ථ ඤාණ වජ්ඣා [වි. ම. 14 ]

අනුසය හත තුළින් දිට්ඨි අනුසය, විචිකිච්ඡා අනුසය යන මේවා ප්‍රථම මාර්ගයෙන් දුරුකරයි. කාමරාග අනුසය, පටිඝ අනුසය යන මේවා තතිය මාර්ගයෙන් දුරු වේ. මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යන මේවා අර්හත් මාර්ගයෙන් දුරු කරයි. මෙම අනුසයන්ගේ සංසිඳීම, නොසන්සිඳීම වනාහි පරියුට්ඨාන වශයෙන් පහළ වීම, නොවීම වශයෙන් දතයුතුවේ.

අකුසල කම්ම පථෙසු පාණාතිපාතො අදින්නාදානං මිච්ඡාචාරො, මුසාවාදො, මිච්ඡාදිට්ඨීති ඉමෙ පඨමඤාණ වජ්ඣා, දිට්ඨි පිසුණවාචා ඵරුසාවාචා ව්‍යාපාදොති තයෙ තතිය ඤාණ වජ්ඣා, සම්ඵප්පලාපාභිජ්ඣා චතුත්ථ ඤාණ වජ්ඣා. [වි. ම. 514]

අකුසල කම්ම පථේසු = අකුසල කර්මපථ දසය තුළ අඩංගු

පාණාති පාතො = සතුන් මැරීම

අදින්නාදානං = හිමිකරු විසින් නොදෙන ලද්ද වස්තු සොර සිතින් ගැනීම

මිච්ඡාචාරො = අන්සතු මෛථුන කාම වස්තු කෙරෙහි වැරදි හැසිරීම

මුසාවාදො = මුසාබස් කීම

(අනුන්ට අනර්ථය සැලසුන විටම කර්මපථයක් බවට පත්වේ)

මිච්ඡාදිට්ඨි = කර්ම හා කර්ම විපාකයන් නැතැයි වරදවා වටහා ගැනීම, ඇදහීම,

ඉති = යන

ඉමේ = මේ කර්ම පථ පහ

පඨම ඤාණ වජ්ඣා = සෝතාපත්ති මාර්ග ඤාණයෙන් දුරු කළ හැකි ධර්මයෝය.

පිසුනාවාචා = විශ්වාසී වූ දෙදෙනෙකු බිඳී යනු පිණිස නුගුණ කථා කිරීම (එම දෙදෙනා විරසක වූ විටම කර්මපථය සම්පූර්ණ වේ)

ඵරුසාවාචා = කණට අමිහිරි, රූක්ෂ, කර්කශ වචන කථා කිරීම

ව්‍යාපාදො = අනුන් මැරීමට විනාශ කිරීමට කැමතිවීම

ඉති = යන

තයො = මෙම කර්මපථ තුන

තතිය ඤාණ වජ්ඣා = අනාගාමී මඟින් නසන ධර්මයන්ය.

සම්ඵප්පලාපාභිජ්ඣා = හිස් වචන, තේරුමක් නැති වචන කීම නම්වූ සම්ඵප්පලාප හා අනුන් සතු වස්තු තම සතු කරගැනීමට කල්පනා කරන දැඩි ලෝභයද යන මේවා

**චතුත්ථ ඤාණ වජ්ඣා** = අර්හත් මාර්ගයෙන් දුරුකළ හැකි ධර්මයෝ වෙත් (සම්ඵප්පලාපයත් අනුන් විසින් පිළිගතහොත් පමණක් කර්ම පථ බවට පත්වේ).

මෙහිලා තතිය, චතුත්ථ ඤාණ වජ්ඣ කර්ම පථයන් "එව" ශබ්දය මඟින් සීමා කර නොමැති නිසා අපාය ගාමිනීය වන්නා වූ පිසුනා වාචා ඵරුසා වාචා, ව්‍යාපාද, සම්ඵප්පලාප, අභිජ්ඣා යන මේවා ප්‍රථම මාර්ගයෙන් දුරු කරයි. අපායගාමිනී නොවන මෙම පස ඕලාරික, කාමරාග, ව්‍යාපාද යන මේවා සම්බන්ධ දේ ද්විතිය මාර්ගයෙන් දුරු කරයි. සූබුම කාමරාග ව්‍යාපාදයන් සම්බන්ධව තතිය මාර්ගයෙන් දුරු කරයි. භවරාගය සම්බන්ධ සම්ඵප්පලාප අභිජ්ඣා යන මේවා අර්හත් මාර්ගයෙන් දුරු කළ හැකි යැයි ව්‍යවස්ථාපනය කරයි.

**අකුසල චිත්තුප්පාදෙසු චත්තාරො දිට්ඨි සම්පයුත්තා, විචිකිච්ඡා සම්පයුත්තා චාති පඤ්ච පඨම ඤාන වජ්ඣාව. ද්වෙ පටිඝ සම්පයුත්තා තතිය ඤාණ වජ්ඣා සෙසෙ චතුත්ථ ඤාණ වජ්ඣා.** [වි. ම. 514 ]

**අකුසල චිත්තුප්පාදෙසු** = අකුසල චිත්තුප්පාද 12 අතරින්

**චත්තාරො දිට්ඨිසම්පයුත්තා** = දිට්ඨිසම්පයුත්ත චිත්තුප්පාද හතරද

**විචිකිච්ඡා සම්පයුත්තොච** = විචිකිච්ඡා සම්පයුත්ත එකම චිත්තුපාදයත්

**ඉති** = මෙලෙසට

**පඤ්ච** = පහක් වන චිත්තුප්පාදයන්

**පඨම ඤාණ වජ්ඣා එව** = පඨම මාර්ග ඤාණයෙන් දුරු කළ හැකි ධර්මයෝයැ.

**ද්වෙ පටිඝ සම්පයුත්තා** = පටිඝ සම්ප්‍රයුක්ත චිත්තුප්පාද දෙක

**තතිය ඤාණ වජ්ඣා** = තෘතිය ඤාණයෙන් දුරුකළ හැකි ධර්මයෝ යැ.

**සෙස** = ඉතිරි දිට්ඨි විප්පයුත්ත චිත්තුප්පාද හතර සහ උද්ධච්ච සහගත චිත්තුප්පාදය

චතුත්ථ ඤාණ වජ්ඣා = චතුර්ථ ඤාණයෙන් පහ කරන ධර්මයෝ යැ.

මෙහිදු තතිය චතුත්ථ ඤාණ වජ්ඣ චිත්තුප්පාදයෝ 'එව' ශබ්දය මඟින් සීමාකොට නැති නිසා "අපාය ගාමිනී වන දිට්ඨි විප්පයුත්ත හතර, දෝස මූල චිත්තුප්පාද දෙක යන මේ අකුසල් චිත්තුප්පාද හය ප්‍රථම මාර්ගයෙන් දුරු කරයි, අපාය ගාමිනී නොවන ඖලාරික කාමරාග, පටිඝ හා යෙදෙන එම චිත්තුප්පාද හයද එම ඖලාරික, කාමරාග, පටිඝ සමඟ **පහානෙකට්ඨ** වන්නා වූ උද්ධච්ච සහගත චිත්තුප්පාදයද ද්විතීය මාර්ගය මඟින් දුරු කරයි, සූක්ෂම කාමරාග, පටිඝ හා යෙදෙන එම චිත්තුප්පාද හයද එම කාමරාග පටිඝ හා **පහානෙකට්ඨ** වන්නා වූ උද්ධච්ච සහගත චිත්තුප්පාද ද තෘතිය මාර්ගයෙන් දුරුකරයි, භව රාගය හා යෙදෙන දිට්ඨි විප්පයුත්ත චිත්තුප්පාද හතරද ඉතිරි උද්ධච්ච සහගත චිත්තුප්පාදය ද සමඟ අර්හත් මාර්ගයෙන් දුරු කරයි යැ"යි සවිස්තරව සිත තබාගත යුතුයැ. **පහානෙකට්ඨ** යන්න පුද්ගලයෙකුගේ සන්තානයෙහි මාර්ග ඤාණයේ ශක්තියෙන් යම් ක්ලේශයක් සංසිඳුනේ නම් එම ක්ලේශය හා සමගාමී වන කෙලෙස් එකවරටම එකට සංසිඳෙත්. සම්ප්‍රයුක්ත නොවන්නා වූ නමුත් මෙසේ මෙලෙස එකට සංසිඳෙන කෙලෙස් **පහානෙකට්ඨ** නම් වේ. "කෙනෙකුගේ සන්තානයෙහි එක ක්ෂණයකදී එකට සංසිඳෙන ධර්මයැ"යි කියනු ලැබේ.

**චත්තාරො දිට්ඨිගත විප්පයුත්ත ලොභ සහගත චිත්තුප්පාදා, ද්වෙ දොමනස්ස සහගත චිත්තුප්පාදා, ඉමෙ ධම්මා සියා දස්සනෙන පහාතබ්බා** යන ධම්ම සංගනී පාළියට අනුව අපාය ගාමිනී වන දිට්ඨි විප්පයුත්ත හා දොසමූල චිත්තුප්පාදයෝ ද සෝතාපත්ති මාර්ගයෙන් දුරකරයි යැයි දක්වයි. **කතමෙ ධම්මා න දස්සනෙන පහාතබ්බා උද්ධච්ච සහගතො චිත්තුප්පාදො, කතමෙ ධම්මා භාවනාය පහාතබ්බා, උද්ධච්ච සහගතො චිත්තුප්පාදො** යන [ධ.ස. 552] පාළියට අනුව උද්ධච්ච සහගත චිත්තුප්පාද භාවනා නම් වූ ඉහළ මාර්ග තුනෙන්ම දුරුවේ. මෙම පාළියෙහි "අරහත්ත මාර්ගයෙන්ම දුරු කරයි" යන්න නොගත යුතු. යුක්ති වශයෙන් සකදාගාමි, අනාගාමී උතුමන්ගේ සන්තානවල ඇත්තාවූ උද්ධච්ච සහගත සිත පෘථග්ජන, සෝතාපන්න ඇත්තන්ගේ මෙන් ඖලාරික රළු නොවේ. එබැවින් උද්ධච්ච සහගත

චිත්තුප්පාදය භාවනා නම් වන ඉහළ මාර්ග තුනෙන් කිසියම් එකිනෙකින් දුරු කරයි යැයි මෙහිලා දක්වයි.

විසුද්ධිමග්ගයෙහිද මෙම පොතෙහි ද කෙළින් නොකියන ලද පහාතබ්බ කෙලෙස් බොහෝ කොට ඇත්තේය. එම අකුසල් අතරින් මූලික ලෙස වෙන වෙනම දතයුතු අකුසල ධර්මයන් දක්වන ලද සංයෝජන ආදියට සමානව දුරු කිරීම් වශයෙන් දතයුතු. මූලික ලෙස විශේෂිත නොවුන අකුසල ධර්මයන් අදාල අකුසල් චිත්තුප්පාද වලට ඇතුලත්ව මාර්ග හතර මාර්ගයෙන් ගැළපෙන ලෙසට දුරුකරන බව වටහාගන්න. එබැවින් මහාටීකා හි පහත දැක්වෙන ලෙසට දක්වයි.

**චිත්තුප්පාදග්ගහණෙන වෙස්සාපන මක්ඛ පලාස මායා සාඨෙය්‍ය පමාද ථම්භ සාරම්භාදීනං සංගහො කතොති දට්ඨබ්බං** [මහා ටී. (බු) 2/398 ]

| | | |
|---|---|---|
| **ච** | = | මූලික ලෙස විශේෂිත නොවූ අකුසල ධර්ම දුරු කරන ආකාරය කෙලෙස දත හැකි වන්නේද, යන මේ ප්‍රශ්ණයට අනුව ඉදිරියට පැහැදිලි කරමු. |
| **එත්ථ** | = | විසුද්ධි මාර්ගයේ දැක්වූ එම සංයෝජන ආදිය තුළ |
| **වා** | = | පහාතබ්බ කෙලෙස් දක්වන මෙම විසුද්ධි මග්ග කථාවෙහි |
| **චිත්තුප්පාද ගහණෙන** | = | චිත්තුප්පාද ශබ්දයෙන් |
| **වා** | = | අකුසල් චිත්තුප්පාද ගැනීම කීමෙන් **මක්ඛ -පළාස - මායා - සාඨෙය්‍ය-පමාද -ථම්භ** - ආදීකොට ඇති **පහාතබ්බ** අකුසල ධර්මයන් |
| **සංගහො** | = | සංග්‍රහ කිරීම |
| **කතොති** | = | අට්ඨ කථාචාර්ය-ස්වාමීන් වහන්සේ විසින් කරනලද්දයි |
| **දට්ඨබ්බං** | = | සලකාගත යුතු |

ම. නි. මූල පණ්ණාසක වත්ථසුත්ත ආදියෙහි අභිජ්ඣා, විසම ලොභ, බ්‍යාපාද, ක්‍රොධ, උපනාහ, මක්ඛ, පළාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද යන දහසයාකාර පහාතබ්බ උපක්කිලෙසයන් දේශනා කොට ඇත. තවදුරටත් අනෙකුත් සූත්‍රවලත් අභිධම්ම ඛුද්දක වත්ථු විභංගයෙහි ද දහසකට වඩා පහාතබ්බ අකුසල ධර්මයන් දේශනා කරන ලදී. එම අකුසල් අතරින් මූලිකව විශේෂිත නොවූ මක්ඛ, පළාස, ආදියෙහි අදාළ අදාළ අකුසල් චිත්තුප්පාදයන් ම උපුටාගෙන එම එම චිත්තුප්පාදයන් දුරු කළ හැකි මාර්ග ධර්ම මගින් දුරු කරයි යැයි දතයුතු යැයි කියවේ.

ඒ තුළින් මක්ඛ යන්න වනාහි උපකාර කළ තැනැත්තාගේ නුගුණ දක්වා කථා කරන විට සිදුකළ උපකාරය අකා මකාලන ආකාරයෙන් පහළ වන දෝමනස්ස සහගත චිත්තුප්පාද වේ. (අත්තනො පන පරෙසං ගුණෙ මක්ඛනාකාරෙන පවත්තො දොමනස්ස සහගත චිත්තුප්පාදොති දට්ඨබ්බං-ඉතිවුත්තක අට්ඨ කථා)

පළාස

යන්න සද්ධා සීල ආදී ගුණ වලින් තමාට වඩා උතුම් උතුමෙකුගේ ඒ උතුම් බව දැන දැන එතුමන්ගේ ගුණ හෙලා දකින ආකාරයෙන් තමා හා සමකොට සලකා සසඳා කීම් වශයෙන් පහළ වන දෝසමූල චිත්තුප්පාදය වේ.

මායා

යන්න තම වරද සඟවාලීමට කැමැති ආකාරයෙන් පහළවන ලෝභ මූල චිත්තුප්පාදයයි.

සාඨෙය්‍ය

යන්න තමා තුළ අප්‍රකට ගුණ කියාපාන, පුරසාරම් දොඩන ආකාරයෙන් පහළ වන ලෝභ මූල චිත්තුප්පාදය වේ.

ථම්භ

යන්න ගරු කටයුතු උතුමන්ට ගෞරව නොකරන නොනැමෙන ගොරෝසු, නොහික්මුනු, රළු ආකාරයෙන් යුත් මාන සම්ප්‍රයුක්ත

චිත්තුප්පාදයයි. (**චිත්තස්ස උද්ධතා තථාපවත්ත චිත්ත මෙවාති වදන්ති මාන විසෙසොව දට්ඨබ්බො.** මේ මූලටීකා දැක්වීමට අනුව විශේෂිත වූ මානයම යැයිද කිව හැක.)

## සාරම්භ

යන්න අනුන් කළ දේට වඩා වැඩියක් කිරීමට, ඉක්මවා, වැඩිපුර ලැබීමට කැමැත්තෙන් අහංකාර ආකාරයෙන් පහළ වන මාන ප්‍රධාන වූ දිට්ඨි විප්පයුත්ත චිත්තුප්පාදය වේ.

## පමාද

යන්න පඤ්ච කාමගුණ දුෂ්චරිත ධර්මයන් විෂයෙහි සිත උනන්දු වී, කුසල ධර්ම කෙරෙහි ප්‍රමාද වන අමතක කරන ආකාරයෙන් පහළ වන ලෝභ මූල, ද්වේෂ මූල චිත්තුප්පාදය වේ.

**සොතාපත්ති මග්ගෙන මක්ඛො පළාසො ඉස්සා මච්ඡරිය මායා සාඨෙය්‍යන්ති ඉමෙ ඡ පහීයන්ති, අනාගාමි මග්ගෙන බ්‍යාපාදො කොධො උපනාහො පමාදොති ඉමෙ චත්තාරො. අරහත්ත මග්ගෙන අභිජ්ඣා විසම ලොභො ථම්භො සාරම්භො මානො අතිමානො මදොති ඉමෙ පහීයන්ති.**

[ම. නි. අ.1/154 ]

*මෙම මූල පණ්ණාසක අට්ඨ කථාහි 'මක්ඛ, පළාස, ඉස්සා මච්ඡරිය, මායා, සාඨෙය්‍ය යන උපක්කිලෙස හය සොතාපත්ති මාර්ගයෙන් දුරු කරයි. බ්‍යාපාද, කොධ, උපනාහ සහ පමාද යන මෙම උපක්කිලෙස හතර අනාගාමි මාර්ගයෙන් දුරු කරයි. අභිජ්ඣා, විසම ලෝභ, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද යන මේ හය අර්හත් මාර්ගයෙන් දුරු කරයි' යැයි සලකා ගත යුතුය. මෙහිලා අර්හත්, අනාගාමී මාර්ග මගින් දුරු කරයි යන්න, නිරවශේෂ දුරු කිරීමම සළකා කියනු ලැබේ. එබැවින් අනාගාමි, අර්හත් මාර්ගයෙන් දුරුකළ මෙ කෙලෙස් දහයෙහි ඇතුළත් අපාය ගාමිනී කොටස යට යට මාර්ග වලින් දුරු කරන ලදයි සිතට ගත යුතු.*

# සොතාපන්න පරීක්ෂණය
# (ධම්මාදාස සුත්ත)

තස්මාතිහානන්ද ධම්මාදාසං නාම ධම්ම පරියායං දෙසෙස්සාමි. යෙන සමන්නාගතො අරිය සාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය "ඛීණනිරයොම්හි ඛීණ තිරච්ඡානයොනි, ඛීණ පෙත්තිවිසයො ඛීණාපාය දුග්ගතිවිනිපාතො, සොතාපන්නො හමස්මිං අවිනිපාත ධම්මො නියතො සම්බොධි පරායනොති". කතමො ච යො ආනන්ද ධම්මාදාස ධම්ම පරියායො, ඉධානන්ද අරියසාවකො බුද්ධෙ අවෙච්චපසාදෙන සමන්නාගතො හොති "ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජා චරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස ධම්ම සාරථී සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. සංඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති සුපටිපන්නො භගවතො සාවක සංඝො උජුපටිපන්නො භගවතො සාවක සංඝො ඤාය පටිපන්නො භගවතො සාවක සංඝො සාමීචි පටිපන්නො භගවතො සාවක සංඝො යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතො සාවක සංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිනෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති. අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි

භුජිස්සෙහි විඤ්ඤූපසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධි සංවත්තනිකෙහි, අයං ඛො සො ආනන්ද ධම්මාදාසො ධම්මපරියායො, යෙන සමන්නාගතො අරිය සාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ඛ්‍යාකරෙය්‍ය ඛීන නිරයොම්හි -පෙ- සම්බොධි පරායනො"ති [දී. සං. නි. 52/164]

| | | |
|---|---|---|
| ආනන්ද | = | ආනන්දය |
| තස්මා | = | මියගිය ඇත්තන්ගේ ගති ඥාණය පිළිබඳව ප්‍රශ්න කිරීම තථාගතයන් වහන්සේට වෙහෙසක් වන බැවින් |
| ධම්මාදසං නාම | = | ධර්ම ආදාසය නම් වූ |
| ධම්ම පරියායං | = | ධර්ම දේශනයක් |
| දෙසෙස්සාමි | = | දේශනා කරන්නෙමි. |
| යෙන | = | මූණ බලන කණ්නාඩිය හා සමාන මෙම ධර්මය |
| සමන්නාගතො | = | සහිත වූ |
| අරිය සාවකො | = | ආර්ය ශ්‍රාවක තෙමේ |
| ආකඞ්ඛමානො | = | ඉදින් කැමති වන්නේ නම් |
| අත්තනා එව | = | තමාම |
| අත්තානං | = | තමාට |
| ඛ්‍යාකරෙය්‍ය | = | කියති |
| වා | = | තීරණාත්මකට පවසනු හැකිවෙත් |

(කින්ති = කෙසේ කිව හැක්කේද යත්?)

| | | |
|---|---|---|
| අහං | = | මම |
| ඛීණ නිරයොම්හි | = | ක්ෂීණ නිරය ඇත්තෙමි |
| ඛීණ නිරච්ඡානයොනි | = | ක්ෂීණ තිරශ්චීන යෝනි ඇත්තෙමි |
| ඛීණ පෙත්ති විසයො | = | ක්ෂීණ ප්‍රේත විෂය ඇත්තෙමි |
| ඛීණාපාය දුග්ගති විනිපාතො | = | ක්ෂීණ අපාය දුර්ගති ඇත්තෙමි |
| සොතාපන්නො | = | සෝතාපන්නයකු |
| අස්මි | = | වීමි |
| අවිනිපාත ධම්මො | = | අවිනිපාත (අපායට නොවැටිය හැකි) ස්වභාවය ඇති |

| | | |
|---|---|---|
| නියතො | = | නියත වූ, ආර්ය මාර්ගයෙන් ගතිය සථිර වූ |
| සම්බොධි පරායණො | = | ඉහළ මාර්ග ඤාණ වශයෙන් තිවීම සහතික වූවෙක් වෙමි. |
| ඉති | = | මෙලෙස කිව හැක්කේය. |
| ආනන්ද | = | ආනන්දය |
| ධම්මාදාසො | = | ධර්ම ආදාසය නම් වූ |
| සො ධම්ම පරියායො | = | එම ධර්ම දේශනාව |
| කතමො ච | = | කුමක්ද යත් |
| ආනන්ද | = | ආනන්දය |
| ඉධ | = | මේ ශාසනයෙහි |
| අරිය සාවකො | = | ආර්ය ශ්‍රාවක තෙමේ |
| බුද්ධෙ | = | බුදුරජාණන් වහන්සේ කෙරෙහි |
| අවෙච්චප්පසාදෙන | = | මනාලෙස වටහා ගෙන පහළ වන ශ්‍රද්ධාවෙන් |
| වා | = | නොසැලෙන ශ්‍රද්ධාවෙන් |
| සමන්නාගතො | = | සමන්විත |
| හොති | = | වෙයි |
| කින්ති | = | කෙසේ ශ්‍රද්ධාවත් වේද යත් |
| සො භගවා | = | අප ශාස්තෘන් වහන්සේ වන එම ගෞතම බුදුරජාණන් වහන්සේ |
| ඉති පි | = | මෙලෙස සීල-සමාධි-පඤ්ඤා-විමුක්ති විමුක්ති ඤාණ දස්සන ගුණ විශේෂ වලින් සමන්වාගත බැවින්ද |
| අරහං | = | රාජ, දේවරාජ, බ්‍රහ්මරාජ ආදී සකල ලෝක ප්‍රජාවගේ පූජාවට සුදුසු වූ සේක. |
| අරහං | = | වාසනාව ද සහිතව ලෝභ හා ද්වේෂ, මෝහ ආදී කොට ඇති කෙලෙස් මලයෙන් පිරිසිදු වූ සේක. |
| සම්මා සම්බුද්ධො | = | සකල ධර්මය පරප්‍රත්‍යය විරහිතව ස්වකීයව තත්වාකාරයෙන් වටහාගත් සේක. |

| | | |
|---|---|---|
| විජ්ජා චරණ සම්පන්නො | = | මාර්ග ඵල නිර්වාණයට පත්වීමට මූලික වන චරණ, සීල ආදී සික්ෂා, විපස්සනා ආදී ඤාණ ඈ සියල්ල අතින් සම්පූර්ණ වූ සේක. |
| සුගතො | = | තත්ත්වාකාරයෙන් ඵලදායි කථා පමණක් දේශනා කළ සේක. |
| සුගතො | = | ගරුකටයුතු උතුම් ප්‍රසන්න කායික, වාචසික චෛතසික ඉරියව් අතින් සපිරුනු සේක. |
| ලොකවිදූ | = | ලෝකය පිළිබඳ තත්ත්වය සම්පූර්ණයෙන් දැක දැන ගත් සේක |
| අනුත්තරො | = | උත්තම වූ උසස්ම වූ පුද්ගල වූ සේක. |
| පුරිසධම්ම සාරථී | = | නොහික්මවිය හැකි පුද්ගලයන්ගේ හික්මීම සඳහා යොමු කළ හැකි අසම සම උත්තම ශාස්තෘන් වහන්සේය. |
| අනුත්තර පුරිසධම්මසාරථී | = | නොහික්මවිය හැකි පුද්ගලයන්ගේ ඵලදායී වීම සඳහා යොමුකළ හැකි අසම සම අනුත්තර වූ ශාසතෘන් වහන්සේය. |
| දෙව මනුස්සානං සත්ථා | = | දේව මනුෂ්‍ය බොහෝ දෙනෙකුට එකම නියම ගුරුවරයා වන සේක. |
| බුද්ධො | = | ඇතිතාක් ධර්ම සියල්ල අවබෝධ කළ සේක. |
| බුද්ධො | = | චතුරාර්ය සත්‍යය ධර්ම තත්ත්වාකාරයෙන් ස්වකීය වශයෙන් අවබෝධ කරගෙන වෛනෙය්‍ය සත්ත්වයනට ගෙනහැර දක්වා දේශනා කොට අවබෝධ කරවා වදාල සේක. |
| භගවා | = | නොගිණිය හැකි අනන්ත පුණ්‍ය ස්කන්ධයකින් හා පාරමී ශක්තියකින් සමන්වාගත වූ සේක. |
| භගවා | = | දේව මනුෂ්‍ය බ්‍රහ්ම සත්ත්වයන් බොහෝමයක් නතු වී, සමීප වී ගෞරව දක්වන ලද උත්තම පුරුෂයාණන් වන සේක |

ඉති = මෙසේ

අවෙච්චප්පසාදෙන = සම්‍යක් ඥාණයෙන් පහළවන ශ්‍රද්ධාවෙන්

වා = නොසැලෙන ඇදහීමකින් යුක්ත ශ්‍රද්ධාවෙන්

සමන්නාගතො = සමන්විත

හොති = වේ

(මේ බුදුගුණ මත ඇදහීම පැහැදීම ධර්ම ආදාස සූත්‍රයේ දැක්වෙන එක් ගුණයකි)

ධම්මෙ = උතුම් ධර්මයෙහි

අවෙච්චප්පසාදෙන = මනාලෙස දැනගෙන පහළ වන ශ්‍රද්ධාවෙන්

වා = නොසැලෙන ලෙස වැදගෙන පිළිගන්නා ශ්‍රද්ධාවෙන්

සමන්නාගතො = සමන්විත වේ.

(කිනන= කෙලෙස බැසගෙන අදහාගනී ද යත්)

භගවා = භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ

අක්ඛතො = දේශනා කරන ලද

ධම්මො = උතුම් මඟ- ඵල- නිවන් දේශනා සහිත

ස්වාක්ඛාතො = සුන්දර ලෙස දේශනා කරනලද උතුම් ධර්මයක්

සන්දිට්ඨිකො = මෙනෙහි කොට භාවනා අභ්‍යාස කරන්නේ නම් තමා වශයෙන්ම දැක දැනගත හැකි උතුම් නියම ධර්මයයි

අකාලිකො = කාලය- අවස්ථාව අනුව නොපැකිළ වර්තමානව වහාම ඵල ගෙනදිය හැකි උතුම් ධර්මයය

ඵහි පස්සිකො = 'එන්න බලන්න' යැයි, 'පරීක්ෂා කරන්න යැයි' අනුශාසනා කළහැකි උනන්දු කරවිය හැකි උතුම් ධර්මයකි.

ඔපනයිකො = කයට, සිතට තහවුරු ලෙස වැදගන්නා ලෙසට ඉදිරියට ගෙන යාහැකි උතුම් ධර්මයකි.

විඤ්ඤූහි = ධර්මය දැනගත් ආර්ය ප්‍රඥාව ඇති

පච්චත්තං = තම සන්තානයේ තම තමා වශයෙන්

වෙදිතබ්බො = දැක දැන වටහා ගතයුතු උතුම් ධර්මයක් වේ.

ඉති = මෙසේ

අවෙච්චප්පසාදෙන = තත්වූ පරිදි දැක දැන පැහැදීම අතින්

ච = නොසැලෙන ලෙස බැසගෙන අදහා ගන්නා ශ්‍රද්ධා ධර්මය අතින්

සමන්නාගතො = සමන්විත

හොති = වේ

(මේ ලෙසට ධර්මය විෂයෙහි පැහැදීම ඇදහීමත් ධර්ම ආදාස සූත්‍රයේ දැක්වෙන අංගයක් වේ.)

සංඝෙ = සංඝයා කෙරෙහි

අවෙච්චප්පසාදෙන = සත්‍යාකාරයෙන් දැනගත පහළ වන ශ්‍රද්ධාවෙන්

ච = නොසැලෙන ලෙසට බැසගත අදහාගන්නා ශ්‍රද්ධාව අතින්

සමන්නාගතො = සමන්විත

හොති = වේ.

(කිනති = කෙලෙස බැසගත අදහා ගනීද යත්)

භගවතො = භාග්‍යවතුන් වහන්සේගේ

සාවක සංඝො = නියම ශ්‍රාවක සංඝ වූ

සුපටිපන්නො = ලෝභ, දෝස, මෝහ දුරු කරලීම පිණිස මනාලෙස සම්‍යග් මාර්ගයට පිළිපන්,

(නික අංගුත්තර පාළියේ ආනන්ද වග්ග ආජීවක සූත්‍ර අනුව දක්වනලද අර්ථයයි)

උජුපටිපන්නො = කායික, වාචසික, මානසික වංක ක්‍රියාකාර කර්ම තුන දුරුකරලීම සඳහා ඍජු මාර්ගයට පිළිපන්

ඤායපටිපන්නො = දතයුතු නිබ්බානය පිණිසම පුහුණු කරන ලද

ඤායපටිපන්නො = දුක සංසිඳුවීමට ගැළපෙන නිවැරදි මාර්ගාංග පුහුණුව සම්පූර්ණ කරන ලද

| | | |
|---|---|---|
| සාමීචිපටිපන්නා | = | අනුන්ගේ ගෞරවයට සුදුසුවන අනුයාත මාර්ගය පුහුණු කරන ලද |
| සාමීචිපටිපන්නා | = | නව ලොකුත්තර ධර්ම වලට ගැළපෙන ලෙසට මාර්ගාංග පුහුණුව සම්පූර්ණ කරනලද |
| යදිදං යානි ඉමානි චත්තාරි | | |
| පුරිස යුගානි | = | මාර්ග ස්ථාන, ඵල ස්ථාන යුගල, යුගල වශයෙන් සතරාකාර පුහුණුව ලද පුද්ගල යුගලයෝ |
| අට්ඨපුරිස පුග්ගලා | = | වෙන් වෙන් වශයෙන් අටක් වන, අටදෙනෙක් වන උතුම් ආර්ය පුද්ගලයෝ |
| හොන්ති | = | වෙත් |
| භගවතො | = | භාග්‍යවතුන් වහන්සේගේ |
| සාවක සංඝො | = | නියම ශ්‍රාවක පුත්‍ර ආර්ය සංඝයා වන්නා වූ |
| එස | = | යුගල වශයෙන් හතරක් වන, වෙන් වෙන් වශයෙන් ගණනින් අට දෙනෙක් වන, මේ සංඝයා තෙම |
| ආහුනෙය්‍යො | = | දුරසිට ගෙනවුත් පූජා කිරිමට සුදුසු වූ |
| ආහුනෙය්‍යො | = | ආරාධනා කොට පූජා සත්කාර කිරිමට සුදුසු වූ |

(ආමනෙතත්වා හවනං දාහනං ආහුතං - මහා ටීකා)

| | | |
|---|---|---|
| පාහුනෙය්‍යො | = | භාවනීය, ආගන්තුක වූ වැදගත් ඇත්තන් සඳහා විශේෂයෙන් පිළියෙල කරන ලද පූජා වස්තුද පූජා කිරීමට සුදුසු වූ |
| පාහුනෙය්‍යො | = | අග්‍රඵල-අග්‍රභෝජන ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන් පූජා කිරීමට සුදුසු වූ |
| දක්ඛිනෙය්‍යො | = | සුඛ, අභිවෘද්ධිය යන ඉෂ්ට ඵල ලැබීම සඳහා සකස්කොට දෙන උතුම් දාන වස්තු පූජා ලැබීමට සුදුසු වූ |
| අඤ්ජලිකරණීයො | = | හොඳ ඵල බලාපොරොත්තුවෙන් දෙඅත් එක්කොට මුදුනට නංවා නමස්කාරය කිරිමට සුදුසු වූ |

| | | |
|---|---|---|
| ලොකසස | = | හොඳ ප්‍රතිඵල අපේක්ෂා කරන බොහෝ සත්ත්වයනට |
| අනුත්තරං | | |
| පුඤ්ඤක්ඛෙත්තං | = | හොඳ බීජ වපුරා වපිනා ප්‍රත්‍ය ඵල ලැබීම සඳහා හොඳම සරු ක්ෂේත්‍රය වන්නේය. |
| ඉති | = | මෙසේ |
| අවෙච්චප්පසාදෙන | = | මනාකොට අවබෝධ කොට පහළ වන ඇදහීමෙන් |
| වා | = | නොසැලෙන ලෙස බැසගන අදහන ශ්‍රද්ධාවෙන් |
| සමන්නාගතො | = | සමන්විත |
| හොති | = | වෙයි |

(මේ සංඝ ගුණ කෙරෙහි ශ්‍රද්ධාව පැහැදීම ධර්ම ආදාස සූත්‍රයේ දක්වෙන තවත් ගුණයකි)

| | | |
|---|---|---|
| අරිය කන්තෙහි | = | ආර්යයන් වහන්සේලා මුළු භවය පුරා වීතික්‍රමණය නොකොට සුරැකිව රැක බලාගන්නා |
| සීලෙහි | = | පඤ්ච සීලයෙන් |
| සමන්නාගතො | = | සමන්විත |
| හොති | = | වෙයි |
| (කිදිසෙහි | = | කුමණාකාරයන්ගෙන් සීලය අතින් සමන්විත වේද යත්) |
| අඛණ්ඩෙහි | = | මුල, අග, සික්ෂාපදයන් නොබිඳී බැවින් |
| අච්ඡිද්දෙහි | = | මධ්‍යස්ථයෙහි තැන, තැන සිල්පද බිඳී සිදුරු නොමැති වීතික්‍රමණය නොවූ |
| අසබලෙහි | = | සික්ෂාපද දෙක තුනක් දිගටම නොබිඳි බැවින් දූෂණය නොවූ, දුර්වර්ණ නොවූ |
| අකම්මාසෙහි | = | සික්ෂාපද එකක් එකක් අතර නොබිඳි බැවින් කැළල් ලප සහිත නොවූ |
| භුජිස්සෙහි | = | තණ්හාවේ දාස භාවයෙන් නිදහස් වූ බැවින් නිදහස්ව නැගී සිටි. |

(ලෞකිය සෞභාග්‍යය අපේක්ෂාවෙන් රකින සීලයක් නොවේ යන්න අදහසයි)

| | | |
|---|---|---|
| විඤ්ඤුපසත්ථෙහි | = | බුද්ධ ප්‍රමුඛ ප්‍රඥාවන්තයන් විසින් උසස් යැයි පිළිගත් |
| අපරාමට්ඨෙහි | = | දිට්ඨි ආදී වූ පරාමාස ධර්මයන් වනාහි මම, මගේ සීල යැයි වරදවා වටහා නොගත අල්ලා නොගත් |
| සමාධි සංවත්තනිකෙහි | = | උපචාර සමාධි, අර්පණා සමාධි, ඛණික විපස්සනා සමාධි, මාර්ග සමාධි, ඵල සමාධි පහළ කරවන |
| සීලෙහි | = | හාත්පසින් පිරිසිදු වූ පංච සීලයෙන් |
| සමන්නාගතො | = | සමන්විත |
| හොති | = | වෙයි |

(මෙම සීලය ද ධර්ම ආදාසයේ එක තවත් ගුණාංගයකි)

| | | |
|---|---|---|
| ආනන්ද | = | ආනන්දය |
| ධම්මාදාසො | = | ධර්ම ආදාසය නම් වූ |
| සො ධම්මපරියායෙන | = | දේශනා කිරීමට අපේක්ෂා කළ එම දේශනාව |
| අයං ඛො | = | මේ සද්ධා ධර්ම තුන හා සීල ධර්මයම වේ1* |
| යෙන | = | මෙම තහවුරු ශ්‍රද්ධාව, පිරිසිදු සීලයෙන් |
| සමන්නාගතො | = | සමන්විත ආර්ය ශ්‍රාවකයා |
| ආකඞ්ඛමානො | = | කැමති වන්නේ නම් |
| අත්තනා එව | = | තමාම |
| අත්තානං | = | තමාට |
| බ්‍යාකරෙය්‍ය | = | ප්‍රකාශ කරත්, තීන්දු කරත්. |
| කිනති | = | කෙසේ ප්‍රකාශ කළ හැක්කේද යත්; |
| අහං | = | මම |
| ඛීණනිරයො අම්හි | = | ක්ෂය කරන ලද නිරය ඇත්තෙක්මි, මතු නිරයට වැටීමක් නැත. |

---

* ටීකාවෙහි අරියමග්ග ඤාණය, මාර්ග ඤාණයන් යන මේවා ධම්මා දාස යැයි සාරය වශයෙන් ගනී. එය හුදු මූල ධර්මය විවරණය කිරීමක් පමණක්යැයි ගතයුතු. එය ආර්යයන් වහන්සේ නමක් හටද වනාහි එම මූල ධර්මය අනුව ධම්මාදාස අධිගම සද්ධා, සීල යන මේවායේ තහවුරු භාවය පිරිසිදු භාවයම ප්‍රත්‍යවේක්ෂා කොට දැනගත තීරණය කළ හැක්කේය. එම නිසා ඵල සද්ධා සීලයන් පමණක් සළකා මෙහිලා අර්ථ දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| සම්බොධිපරායනො | = | ඉහළ මාර්ග ඥාණ මගින් නිමකරන බවට සහතික තත්ත්වයට පත්වීම් |
| ඉති | = | මෙලෙස ප්‍රකාශ කළ හැක්කේය. |

මේ ධම්මාදාස ධර්ම සූත්‍රයට අනුව හේතු ධම්මාදාස අධිගමයේ ශක්තියෙන් තහවුරුව පිරිසිදුව පහළ වන ඵල ධම්මදාස ධර්ම හතර අනුවම තමා සමන්විත බව නැවත නැවතත් විමසා බලන්නේ නම්, ගිහි සෝතාපන්න පුද්ගලයා සභාග වූ පුද්ගලයනට ප්‍රකාශ කිරීමට කැමති වන්නේ නම් තමාටම මෙන් අනුන්ටද සෝතාපන්න බව තීරණාත්මකව ප්‍රකාශ කළ හැක්කේය. අනුන්ගේ තීරණයක් සොයා යෑම අවශ්‍ය නැත්තේය. බුදුරජාණන් වහන්සේගෙන් බාහිර පුද්ගලයෙකුට ද එසේ තීරණාත්මකව විනිශ්චය කිරීමට ඉඩක්දී නැත. නමුදු ආචාර්‍යවරයන් වහන්සේලා විපස්සනා ඥාණයන් හා මාර්ග, ඵල, පච්චවෙක්ඛනා ඥාණයන්ගේ පහළ වන ආකාරයන්ද මේ ධම්මාදාස සූත්‍රය ආදී අදාල සූත්‍ර දේශනාවන් ද ශිෂ්‍ය යෝගීනට විස්තර කර දීම යුතුකමක් වේ. කුමක් නිසා දේශනා කොට විස්තර කර දිය යුතුද යත්, සාමාන්‍ය ශ්‍රාවකයන් වන්නා වූ ආර්ය පුද්ගලයන් තමා තුළ පහළ වූ ඥාණයන්ගේ ප්‍රඥප්ති නාමයන් ද, සමන්විත වූ ගුණයන්ගේ ප්‍රමාණයන් ද, සංසිඳුනු - නොසන්සිඳුනු කෙලෙස් වල විභාගය ද, සුතමය ඥාණ නොමැතිව තමාගේ ඥාණය වශයෙන් පමණක් නොදත හැකි බැවින්, විස්තර කර දියයුතු දේවල් අතර ඒ ඒ ඥාණයන්ගේ ප්‍රඥප්ති නාම නොදන්නා බව "පෙර නොගිය විරූ ගමනක් යන්නාවූ තැනැත්තාට හමුවන්නා වූ ගම්- නගර පිළිබඳ ස්වභාවයන් නිශ්චිත වශයෙන් දැනගත හැකි නමුදු එම ගම් නගර වල නම් කෙනෙකුගෙන් නොඅසා ඉබේම දැනගත නොහැක්කාසේ" යැයි සලකා ගතයුතු. සමන්විත ගුණයන් අංග සම්පූර්ණ ලෙස නොදන්නා බැවින් අනාතපිණ්ඩික සිටුතුමා වැනි ආර්යයන්ට ගුණ කඳ අංග සම්පූර්ණලෙස ඒත්තු ගැන්වීමට සෝතාපත්ති අංග ආදී ධර්මයන් දේශනා කළ සේක. ඇහුම්කන් දුන් විට එම ගුණයන්ගෙන් තමා සමන්විත වන බවද එම ආර්ය උතුමන් වගකීමෙන් යුක්තව භාරගෙන ප්‍රකාශ කරන ලදි. එම අවස්ථාවේ මහා සාරිපුත්ත ස්වාමීන් වහන්සේ "දායකය ඔබ සෝතාපන්න ඵලය ප්‍රකාශ කළ යුතු යැයි ආදී ලෙසට වර්ණනා කළ සේක. සෝතාපන්න, සකෘදාගාමි, ආනාගාමි, උතුමන් සතර අපායෙන් නිදහස්

බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ඒ සඳහා සාධකයන් යට දක්වන්නෙමු. මෙලෙස දේශනා කිරීම මත පිහිටා සාමාන්‍ය ශ්‍රාවකයන් ආර්යයන්ගේ ගුණස්කන්ධය තමාට ඉබේම අංග සම්පූර්ණ ලෙස දැනගත නොහැක්කේ යැයි සළකා ගත යුතු. සංසිඳුනු-නොසංසිඳුනු කෙලෙස් විභාග කොට දැනගැනීමට නොහැකි බව වනාහී යට දක්වන ලද පාළි අට්ඨ කථා මඟින් ප්‍රකට විය. එබැවින් 'ඤාණ පරම්පරාව ආදී නම් වලින් ආචාර්‍යවරු සාර්ථකව භාවනා කළ ශිෂ්‍ය යෝගීනට දේශනා කරත්. උපසපන් බවට පත් ආර්යයන් වහන්සේලා භූතාරොචන ශික්ෂාපදය වීතික්‍රමණය නොවන ආකාරයට නම් තමාගේ ආර්යය භාවය ප්‍රකාශ කළ හැක්කේය.

## ආර්ය උතුමන්ගේ ශ්‍රද්ධාවේ අචල බව.

ආර්යයන්ගේ පැහැදීම, ඇදහීම නම් වූ ශ්‍රද්ධාව

1. පෙළඹවීම්, ප්‍රලෝභන කළත් වෙනස් නො වේ
2. තර්ජනය කළත් නො පෙරළේ
3. බොරුවෙන් මුලා කළත් වෙනස් නො වේ.

මේ තුළින් පෙළඹවීම්, ප්‍රලෝභන කළත් නොපෙරළෙන ස්වභාවය සුප්පබුද්ධ (කුට්ඨී) වස්තුවෙන් දත හැක්කේය.

## 1. සුප්ප බුද්ධ වතුවු

සුප්ප බුද්ධ වස්තුවේ දැක්වෙන ලෙසට සුප්ප බුද්ධ තෙමේ ශරීරය පුරාම කුෂ්ඨ රෝගයෙන් පෙළෙන බැවින් හෙතෙම නිතරම කැ ගසමින් කෙඳිරිගාමින් සිටියේය. සරණක් නොවීයැ. ළමා කාලයේ සිට කබලක් අතටගෙන හිඟාකමින් යැපුනේය. ඉතාමත් දිළිඳු කෙනෙක් විය. හෙතෙම දිනක බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරන අවස්ථාවක පිරිස කෙළවර සිට ධර්මය ශ්‍රවණය කරමින් සිටියේය. බණ අසමින්ම සෝවාන් වී තමා සාක්ෂාත් කළ ධර්මය බුදුරජාණන් වහන්සේට දැන්වීමට සිතීය. බණ අසන

පිරිස සිටින තාක් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් නොවී පිරිසත් සමඟ පිටත්ව යන්නාක් මෙන් මඳ දුරක් ගොස් නැවත බුදුරජාණන් වහන්සේ ළඟට පැමිණියේය. එම අවස්ථාවේ ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ ඔහුව පරීක්‍ෂා කිරීමට අහසේ සිට මෙලෙස කීවේය.

"ආ සුප්පබුද්ධ! ඔබ ඉතා දිළිඳු ජරා දිරාවට ගිය පුද්ගලයෙකු වේ. සරණක් පිහිටක් නැතියෙක. බොහෝ පිළිකුලට ලක්වූ පුද්ගලයෙකි. ඔබට නොමිනිය හැකි තරම් වස්තු භෝග මම දෙන්නම්, බුදුරජාණන් වහන්සේ නියම බුදුරජාණන් වහන්සේ නොවන්නේ ය, ධර්මය නියම ධර්මය නොවන්නේය, සංඝයා නියම සංඝයා නොවන්නේය, මට බුද්ධ, ධම්ම, සංඝ යන මේවායින් අර්ථයක් නැත" යැයි ප්‍රකාශ කරන ලෙසට සක් දෙව්රජ කීය.

"ඔබ කව්ද"යි සුප්පබුද්ධ තෙමේ ප්‍රශ්න කළේය.

"මම සක් දෙව්රජ" යැයි පිළිතුරු දුන්නේය

"ඕ! ලජ්ජා නැති අඥානදාණ වූ ශක්‍රය. නොකිය යුතු කථාවක් කළෙහිය. තොප මා සමඟ කථා කිරීමට තරම් නොවේ. එසේම මම දුප්පතෙකි, දිළින්දෙකැයි සරණක් නැත්තෙකැයි කුමක් නිසා කීවෙහි ද, මම බුදුරජාණන් වහන්සේගේ නියම අතිජාත පුත්‍රයෙක් නොවන්නෙම්ද? දුප්පතෙක්, වටිනාකමක් නැති දිළින්දෙක්, සරණ නැත්තෙක් නොවන්නෙමි. ඇත්ත වශයෙන් කියනවා නම් මම හොඳ උතුම් සැපවත් භාවයෙන් සැපයට පැමිණි ධනවතෙකු වන්නෙමි" යැයි ප්‍රකාශ කොට පහත සඳහන් ගාථා කීවේය.

**සද්ධා ධනං සීල ධනං - හිරි ඔත්තප්පියං ධනං**
**සුත ධනඤ්ච චාගොච - පඤ්ඤාවෙ සත්තමං ධනං**
**යස්ස එතෙ ධනා අත්ථි - ඉත්ථියා පුරිසස්සවා**
**අදලිද්දොති තං ආහු - අමොඝං තස්ස ජීවිතං**

| | | |
|---|---|---|
| **සද්ධා ධනං** | = | ශ්‍රද්ධාව නම් ධනය ද |
| **සීල ධනං** | = | සීලය නම් ධනය ද |
| **හිරි ධනං** | = | හිරි නම් ධනය ද |

| | | |
|---|---|---|
| ඔත්තප්පියං | = | ඔත්තප්ප යන ධනය ද |
| සුත ධනඤ්ච | = | සූතය නම් ධනය ද |
| චාගොච | = | පරිත්‍යාගය යන ධනය ද 1* |
| වෙ | = | සත්‍ය වශයෙන්ම |
| පඤ්ඤා | = | ප්‍රඥාව යන ධනය ද |
| සත්තමං ධනං | = | සතක් වන ධනයන් ද |
| එතෙ ධනා | = | මෙම සත්ආකාර ධනයන් |
| යස්ස ඉත්ථියාවා | = | යම් ස්ත්‍රියකගේ සන්තානයේ |
| යස්ස පුරිසස්ස | = | යම් පුරුෂයෙකුගේ සන්තානයේ |
| අත්ථි | = | ඇත්තේද |
| තං | = | එම ස්ත්‍රිය හෝ පුරුෂයා |
| අදලිද්දෙ | = | දිළින්දකු නොවේ, ධනවතකු යැයි |
| ආහු | = | බුද්ධාදී උතුමන් වහන්සේලා දේශනා කරන සේක. |
| තස්ස | = | එවැනි පුද්ගලයන්ගේ |
| ජීවිතං | = | ජීවිතය |
| අමොඝං | = | නොසිස් වූ අර්ථවත් ජීවිතයක් යැයි |
| ආහු | = | කියනු ලැබේ. |

එවිට සක්දෙව් රජ තෙමේ බුදුපියාණන් වහන්සේ ලඟට පළමුව ගොස් මෙම විස්තරය සැළකළේය. බුද්ධ - ධම්ම- සංඝ වනාහි නියම බුද්ධ - ධම්ම සංඝ නොවන්නේ යැයි ඔහු ලවා ප්‍රකාශ කරවීම සඳහා ඔබ වැනි සියයක් දහසක් ආවත් මුළා කිරීමට නොහැකි වන්නේ යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළසේක.

1*ප්‍රථම මාර්ගය මගින් ඔහු අදාළ කෙලෙස් අභිසංඛාරයන් දුරුකිරීම චාග නම්වේ. එම චාගය නිසා ආර්යයන් දියයුතු යමක් දුන් විට මුත්තචාග විය හැක්කේය. මාර්ගය මඟින් සිදු කළ මෙම අධිගම චාගය අතින් ආර්යයන් වහන්සේ සමන්විතවේ, සුසාබුද්ධයෝද සමන්විත වේ අට්ඨ කථා විවරණයයි.

සුප්ප බුද්ධ තෙමේද බුදුපියාණන් වහන්සේ ලඟට ගොස් මේ පුවත සියල්ල ප්‍රකාශ කොට හැරී ආ අවස්ථාවේ, බද්ධ වෛරයක් ඇති යක්ෂණියක් දෙනකගේ වේශයෙන් පැමිණ ඇන මරා දැමීය. අනතුරුව බණ ඇසීමෙන් ජනිත සද්ධා, සීල, සුත, චාග, ප්‍රඥා ආදී කුසල් ජවයෙන් තාවතිංස දේව ලෝකයේ බලවත් තෙදවත් දේව පුත්‍රයෙක් ලෙස පහළවිය. මනුෂ්‍ය භවයෙහි දුක්ඛිත තත්ත්වයට වැටී ගත කළත් ආර්ය මාර්ගයේ බලවත් කම අනුව දෙව්ලොව තෙදවත්ව ඉපදීමට සමත් විය. එම නිසා සමහර දෙවියන් අමනාප වී නොසතුටු අමනාප කථා කීවෝය. එම කතා අසා ශක්‍රදෙවේන්‍ද්‍රයන් "නිදුකාණනි මෙම සුප්පබුද්ධ දෙව්පුත් සමඟ අමනාපවී ඊර්ෂ්‍යා නොකරවු. හෙතෙම බුද්ධ ශාසනයෙහි සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යන මේවා ආරක්ෂා කොට රැකගත් නිසා මෙලෙස තෙදවත්වී යැ"යි අවවාද කළේය. ආර්ය මාර්ගයේ වටිනාකම ඉතා බලවත්ය. මෙම කථා වස්තුව උදාන පාළි අට්ඨකථා, ධම්ම පද අට්ඨකථා, හා සක්ක සංයුත්ත පාළියෙහිද එයි.

මෙම කථා වස්තුවේ දැක්වූ ලෙසට බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයන්ට නියම බුද්ධ - ධම්ම - සංඝ නොවන්නේ යැයිද, නැත්තේ යැයිද කියවීමට, ඉවත් කරලීමට ලෞකික ගුණ, සෞභාග්‍යය, භව-භොග වස්තු මඟින් මොන ආකාරයකින් රවටන්න උත්සාහ කළද නියම ආර්යයන් වහන්සේට එවන් පෙළඹවීමක් කිරීමට නොහැකි වන්නේය. නියම බුද්ධ-ධම්ම-සංඝ යන රත්නයන් බැහැර කළ නොහැකි වන්නේය. වෙන කෙනෙකුගේ බලපෑමක් නැතිව තමාට කල්පනා කොට සළකා බලන්නේ නමුදු කුමන ගුණයක් මත නමුත් නොපෙරළෙන ලෙස ත්‍රිවිධ රත්නයන් මත පැහැදීම, ඇදහීම තහවුරු වන බවම දැකගත හැක්කේය.

## 2 ධනඤ්ජානි වත්ථු

බිය ගැන්වීමෙන් ශ්‍රද්ධාව නොපෙරළිය හැකි බව ධනඤ්ජානි නම් බැමිණිය සම්බන්ධ වස්තුවෙන් දත හැක්කේය. එක දිනෙක තම ස්වාමියා වූ භාරද්වාජ බ්‍රාහ්මණ තෙම ධනඤ්ජානි හට මෙසේ කීවේය.

"සොඳුර හෙට අපේ ගෙදර පන්සියයක් බමුණන්ට ආහාර සඳහා ආරාධනා කළෙමි. ඔබද සිටින විටද, හිඳින විටද, කිවිසුම් යන විටද,

කැස්සක් ඇති විටද හැමතැනදී ම "නමෝබුද්ධාය" යැයි කියමින් මුදු මහණුන්ට වැඳ වැඳ සිටින්නේයැ. හෙට එක දවසට ඉල්ලීමක් කරන්නට කැමැත්තෙමි. ආගන්තුක බමුණු ගුරුවරු ආහාර ගන්නා කාලය තුළ කරුණාකර එලෙස කියමින් වඳිමින් නොසිටින්න වගබලාගන්න. ඔබගේ එම වන්දනා කිරීම බමුණන් දුටුව හොත් මා ගැන වරදවා වටහාගෙන, අමනාපව අහිතක් සිතාගනීවි" යැයි කීවේය.

"ඕ! හිමියනි බ්‍රාහ්මණයන් ඔබ සමඟ අමනාප වුවද කම් නැත. දෙවියන් ඔබ සමඟ අමනාප වුවද කම් නැත. බුදුරජාණන් වහන්සේ සිහිපත් වී නම් මට ගරු නොකර වන්දනා නොකර සිටිය නොහැක්කේ යැයි ධනඤ්ජානිය ඉල්ලීම ප්‍රතික්ෂේප කළාය.

"සොඳුර! නැවත සළකා බලනු මැනවි. ගම්දොර වුව වසාතැබිය හැක්කේය. බමුණන් වළඳන ටිකට ඔබට කට වසාගන සිටින්නට බැරිද? පුළුවන් නේ" යැයි නැවත නැවත ඉල්ලීම කළේ නමුදු ඒත්තු ගැන්වීමට නොහැකි වීයැ. එවිට භාරද්වාජ බමුණු තෙම කඩුවක් අමෝරාගෙන "බලව! හෙට බමුණු ගුරුවරුන් ආහාර වළඳන වෙලාවේ මුඩු මහණනට වන්දනා කළහොත් උඹගේ ශරීරය මේ කඩුවෙන් පාදාන්තයේ සිට කේශාන්තය දක්වා කෙසෙල් කඳක් මෙන් පෙති පෙති කපා හෙලන්නෙමි" යැයි තර්ජනය කළේය. එවිට ධනඤ්ජානිය

**සචෙ මෙ අංගමංගානි - කාමං ඡෙජ්ජසි**
**බ්‍රාහ්මණ නෙවාහං විරමිස්සාමි - බුද්ධ සෙට්ඨස්ස සාසනා**

| | | |
|---|---|---|
| **බ්‍රාහ්මණ** | = | ඕ! බ්‍රාහ්මණය, |
| **ත්වං** | = | ඔබ |
| **මෙ** | = | මගේ |
| **අංගමංගානි** | = | ලොකු කුඩා ශාරීරාංගයන් |
| **කාමං** | = | ඒකාන්තයෙන් |
| **සචෙ ඡෙජ්ජති** | = | ඉදින් සිඳින්නේ ද |
| **අහං** | = | මම |
| **බුද්ධ සෙට්ඨස්ස** | = | ශ්‍රේෂ්ඨ බුදුපියාණන් වහන්සේගේ |
| **සාසනා** | = | අවවාද ශාසනයෙහි |
| **නෙව විරමිස්සාමි** | = | දුරුව වාසය නොකරමි. |

මෙලෙස වූ ගාථා පන්සියයක් කියා ප්‍රතික්ෂේප කළාය. එවිට භාරද්වාජ බමුණු තෙම "එහෙමනම් උඹේ කැමැත්තක්" යැයි කැමැත්තට ඉඩ දුන්නේය. පසුවදා ආගන්තුක බමුණන් ආහාර වළඳමින් සිටින විට ධනඤ්ජානි බැමිණිය පය පැකිළ ඇද වැටුනාය. වැදුනු පහරින් මතුවුන තුවාල වේදනාව අධික වූ විට ධනඤ්ජානි බැමිණිය බුදුපියාණන් සිහිපත්වී දොහොත් මුදුන් දී බුදුන් වදිමින් වෙළුවන දිශාවට නැවී "නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස" යැයි තුන් වතාවක් වන්දනා කරමින් උදන් ඇනීය.

එවිට ආගන්තුක බමුණන් "ඝාජාති ඇදහීම පාවා දුන් තොපගේ බත් අපි නොවළඳන්නෙමු" යැයි සිත නරක් කරගෙන නැගිට ගියාහුය. භාරද්වාජ බමුණාද තම ක්‍රෝධය උත්සන්නව බැමිණියට නානා විධ ලෙස දෝෂාරෝපණය කොට අමනාපයෙන් බැමිණියගේ මේ ශාස්තෘන් ගෙන් ප්‍රශ්ණ අසා වාද නගන්නෙමියි සිතා බුදුරජාණන් වහන්සේ ළඟට ගොස් ප්‍රශ්ණ කළේය. බුදුරජාණන් වහන්සේ පිළිතුරු දේශනා කළ අවස්ථාවේ එම බමුණු තෙම විමුක්ති ධර්ම සාක්ෂාත් කොට ශාසනයෙහි උතුම් පැවිද්ද ලැබ නොබෝ කලකින්ම උතුම් රහත් බවට පත්වූ වග බ්‍රාහ්මණ සංයුක්ත පාළියෙහි දැක්වේ. එම නිසා 'බුද්ධ, ධම්ම, සංඝ, ශාසනය යන මේවා බැහැර කළ යුතුය. නැත්නම් නසන්නෙමියි මරන්නට හැකිකෙනෙක් තර්ජනාත්මකව කියන්නේ නමුත් නියම ආර්ය උතුමන් මේ ධනඤ්ජානි බැමිනිය මෙන් බැහැර නොකරන සුළු නොසැලෙන ශ්‍රද්ධාවෙන් ම සමන්විත වේමයැ.

## 3. සූරම්බට්ඨ වතු

බොරුවෙන් මුළාකොට ලුවත් ශ්‍රද්ධාව නොපෙරළෙන බව සූරම්බට්ඨ වස්තුවෙන් දැනගත හැක්කේය. (සූර - අම්බට්ඨ යැයිද, සූරබන්ධ යැයිද සමහර පොතක දැක්වේ.) කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර නම් සර්වඥයන් වහන්සේගේ ජීවමාන කාලයේ අවෙච්චප්පසන්න එතදග්ග ප්‍රාර්ථනාව කළ සූරම්බට්ඨ තෙම වර්තමාන ගෞතම බුද්ධ කාලයේ සාවත්ථි නගරයේ සිටුවරයෙකුව ඉපදුනේය. හෙතෙම බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට දානයක් පිළිගැන්වීයැ. දානය වළඳා බුදුපියාණන් වහන්සේ ධර්ම දේශනා කළ සේක. දේශනා අවසානයේ සූරම්බට්ඨ තෙම සෝවාන් විය.

බුදුපියාණන් වහන්සේ නැගිට පිටත් වූ පසු මාර දිව්‍යපුත්‍ර තෙමේ සූරම්බට්ඨ පරීක්ෂා කිරීමට කැමතිව බුදුරජාණන් වහන්සේ මෙන් වේශයක් මවාගන සූරම්බට්ඨගේ ගේ දොර ඉදිරිපිට පෙනීසිටියේය. ඒ අවස්ථාවේ සූරම්බට්ඨ තෙම "වැඩි වේලාවක් නොගොස් බුදුපියාණන් වහන්සේ නැවත වැඩම කිරීමට විශේෂ හේතුවක් තිබිය යුතුයැ"යි සළකා වහා ගොස් බුදුපියාණන් වහන්සේ යන සංඥාවෙන් වන්දනා කොට වැඩම කිරීමට හේතුව විමසීයැ. එවිට බුද්ධ වේශයෙන් පෙනී සිටි මාර දිව්‍ය පුත්‍ර තෙමේ ඕ! සූරම්බට්ඨය, මම තොපට ධර්ම දේශනා කරනවිට දෙයක් නොසැළකිල්ලෙන් ප්‍රකාශ කරන්නට යෙදුනි. ඒ කුමක්ද යත්, පඤ්චස්කන්ධය අනිච්ච - දුක්ඛ - අනත්ත යැයි මම දේශනා කළෙමි නමුදු මෙම පඤ්චස්කන්ධය සියල්ලම අනිච්ච-දුක්ඛ-අනත්ත නොවේ. ඇත්ත වශයෙන් නම් පඤ්චස්කන්ධයන්ගෙන් සමහරක් නිච්ච - සුඛ - ආත්ම යැයි කීය.

එම අවස්ථාවේ සූරම්බට්ඨගේ කල්පනා කිරීම අනුව - මේ කථාව ඉතාමත් බරපතල කථාවකි. බුදුවරුන්ට දෙබිඩි කථා කිරීමේ පුරුද්දක් නොමැත්තේය. මාරයා බුදුරජාණන් වහන්සේට විරුද්ධ බව මම අසා ඇත්තෙමි. මේ පුද්ගලයා ඒකාන්තයෙන් මාරයා විය හැකි යැයි සිතා "උඹ මාරයා නොවන්නේ දැ"යි ප්‍රශ්ණ කළේය.

"එසේය යැ"යි මාරයා පිළිතුරු දුන්නේය. "උඹ වගේ මාරයන් සීයයක් දහසක් පැමිණියත් මගේ ශ්‍රද්ධාව පෙරළිය නොහැක්කේය. නොසැලිය හැකි යැයි සිත තබා ගනුව, ගෞතම බුදුපියාණන් වහන්සේ මට ධර්මය දේශනා කරන විට මුලු පඤ්චස්කන්ධයම අනිච්චයැයි දේශනා කළ සේක. නුඹ මගේ ගේ ඉදිරිපිට සිටගෙන සිටීමටවත් නොවේ."යි අසුරු සැනක් ගසා මාරයා එලවා දැමීය.

මෙ හේතුවෙන්ම ජීවිතය සාක්ෂියක් කරගෙන, මෙම ශාසනයෙහි ත්‍රිවිධ රත්නයේ ගුණ තත්ත්වාකාරයෙන් දැනගන නොසැලෙන ස්ථාවර ශ්‍රද්ධාවක් ඇතිකරගත් උපාසකයන් අතරින් සූරම්බට්ඨ තෙම විශේෂ වූ උතුම් වූ පුද්ගලයෙක්යැයි එතදග්ග පාළියෙන් බුදු පියාණන් වහන්සේ වර්ණනා කළ සේක. මෙම වස්තුව අංගුත්තර අට්ඨ කථාහී පැනේ. එබැවින් නියම ආර්යය පුද්ගල තෙමේ සූරම්බට්ඨ මෙන් එතදග්ග පූජාවෙන් පිදුම්

ලැබීමට තරම් අංග සම්පූර්ණ නොවූවද බුද්ධ-ධම්ම-සංඝ මෙන්ම බුද්ධ ශාසනය බැහැර කළ නොහැකි ලෙසට ස්ථාවර ශ්‍රද්ධාවකින් සමන්විත වෙයි. කවුරුන්වුව හොඳින් ගොතා කියන බොරුවෙන් මුළා කරන්නේ නමුත්, තමාගේ අදහන සුළු එම ශ්‍රද්ධාව - නොසැලීම පවතී. සමහර සංස්කාරයන් නිච්ච - සුඛ-අත්ත යැයි බුදුපියාණන් වහන්සේ දේශනා කළ බව කෙනෙක් කීවොත් එම කථාව බුද්ධ දේශනාවක් නොවේ යැයි විනිශ්චය කළ හැක්කේය. තව දුරටත් ලෝකයෙහි ධර්ම සියල්ල දන්නා බුදුකෙනෙක් නොමැත්තේයැයි බුදුරජාණන් වහන්සේට සමහර ධර්ම නොදත හැක්කේ යැයිද මාර්ග -ඵල-නිවන් යන්න නොමැත්තේ යැයිද, ප්‍රතිපත්ති සම්පූර්ණ කරමින් භාවනා කරන්නේ නමුත් කෙළෙස් නිවීමක්, අඩුවීමක් කිසිම නැත්තේ යැයි ද හෝ විශේෂ තැන්පත් සිතට නාම රූප අනිච්ච - දුක්ඛ - අනත්ත යැයි ස්වකීය ඤාණයෙන් විශේෂයෙන් දැනගත නොහැක්කේ යැයි ද, කෙලෙස් නිවීම පිණිස හික්මෙන, හික්මුන ආර්ය පුද්ගලයන් කිසිත් නැත්තේ යැයි ද මෙලෙස වූ කථා සමහරෙක් කියන්නේ නම් එම කථාවන් ද ප්‍රතිවිරුද්ධ කථා යැයි, මිත්‍යා කථා යැයි විනිශ්චය කළ හැක්කේය.

## ආර්ය උතුමන්ගේ සීලයේ පිවිතුරුකම හා තහවුරු බව

**අරිය කන්තෙහීති අරියානං කන්තෙහි පියෙහි මනාපෙහි පඤ්ච සීලානි හි අරිය සාවකානං කන්තානි හොන්ති. භවන්තරෙහි අවිජහිතබ්බා තානි සන්ධායෙතං වුත්තං** [සං. නි. අ. 3/214 ]

| | | |
|---|---|---|
| **අරියකන්තෙහීති** | = | අරියකන්තෙහි යනු |
| **අරියානං** | = | ආර්ය උතුමන් |
| **කන්තෙහි, පියෙහි,** | | |
| **මනාපෙහි** | = | කාන්ත වූ, ප්‍රිය වූ, මනාප වූ සීලයෙන් සමන්විත වේ |
| **හි** | = | ඇත්තය! |
| **පඤ්ච සීලානි** | = | පන්සිල් |
| **භවන්තරෙහි** | | |
| **අවිජහිතබ්බතො** | = | වෙනත් භවයකදී හෝ ආර්යයන් විසින් බැහැර නොකරන බැවින් |

| | | |
|---|---|---|
| අරියානං කන්තානි | = | ආර්ය උතුමන් කැමති |
| හොන්ති | = | වෙත් |
| තානි සන්ධාය | = | ඒ පන්සිල් සළකා |
| එතං | = | අරිය කන්ත සීලයෙන් සමන්වාගත යන කථාව |
| වුත්තං | = | මේ ධම්මාදාස සූත්‍රයෙහිලා දේශනා කරන ලදි. |

**සචෙපි භවන්තර ගතං අරිය සාවකං අත්තනො අරිය භාවං අජානන්තම්පි කොචි එවං වදෙය්‍ය. ඉමං කුන්ථ කිපිල්ලකං ජීවිතා වොරොපෙත්වා සකල චක්කවාළ ගබ්භෙ චක්කවත්ති රජ්ජං පටිපජ්ජාහි"ති නෙව සො තං ජීවිතා වෙරොපෙය්‍ය. අථාපි නං එවං වදෙය්‍ය" සචෙ ඉමං න ඝාතෙස්සති සීසං තෙ ඡින්දිස්සාමාති, සීසමෙවස්ස ඡින්දෙය්‍යුං නෙව සො තං ඝාතෙය්‍ය** [ම. නි. අ. 4/75]

වෙනත් භවයක වේවා, තමා ආර්ය භාවයට පත්වූ බව නොදත වුවත් එම ආර්ය ශ්‍රාවකයාට තව කෙනෙක් විසින් "මේ කුඹියාව ජීවිතක්‍ෂයට පත්කොට (මරා) සියලු සක්වල චක්‍රවර්තී රජ බවට පත්වේවා" යැයි ඉදින් කියන්නේ නම්, එම ආර්ය උතුමා තෙමේ එම කුඹියා ජීවිතක්‍ෂයට පත් නොකරන්නේය. නොමරන්නේය. එසේ නොමැතිව, වෙනත් ආකාරයකට, "මෙම කුඹියා නොමරන්නේ නම්. තොපගේ හිස මම ගසාලන්නෙමි" යැයි මෙලෙස ආර්ය උතුමෙකුට කියන්නේ ද, එම පුද්ගලයා එසේ කියා ආර්ය උතුමන්ගේ හිස ගසා දමන්නේ නමුදු කුඹියා නොමරන්නේම ය.

අන්සතු වස්තු සොර සිතින් ගැනීම, අහිමි කාම සම්පත්ති, මෛථුන ධර්ම නොසොයන්නේය. අනුන්ට හානි කරවන බොරුකීම්, මධ්‍යසාර-මත්පැන් පානය කිරීමද ප්‍රාණඝාතය මෙන්ම ආර්ය උතුමන් විසින් නොකරනනේම ය. සිටු සම්පත්ති, රාජ සම්පත්ති, කාය ජීවිත කැප කොට නමුත් සිල්පද කෙරෙහි ඇති ප්‍රියමනාප බව රකින්නේය.

ඒ බැවින් සෝතාපන්න ආර්ය පුද්ගලයා තමා වශයෙන් සළකා බලන අවස්ථාවේද, කෙලෙස් පහළ වීමේ හේතු ධර්ම හමුවූ අවස්ථාවේද

දක්වනලද ධම්මාදාස සූත්‍රයට අනුව සද්ධා හා සීලය අතින් තහවුරුව පිහිටා ඇති බව දැකගනු ඇති. ඒ තුළින් ප්‍රථම මාර්ගයෙන් බැහැර කළ කෙළෙස් වනාහි ඊට අරමුණු ඇත්තේ නමුදු පහළ නොවී ඉබේම සංසිඳීයන අයුර ඇස්පනාපිට දැකගනු ඇති.

## ආර්ය උතුමන්ගේ සැක

ආර්ය උතුමන් සියලු දෙනාම සඋපදිසේස පුද්ගලයන් වන්නේ නමුදු සතර අපායෙන් සම්පූර්ණයෙන් නිදහස් වන්නාහුය. සඋපදිසේස අරියයන් වහන්සේලා අතරින් සෝතාපන්න, සකදාගාමී උතුමන් කාම සුගති හා රූප අරූප භවයන් හිම පහළවෙත්. කාම සුගතින්හී ද හීන දුර්භාග්‍ය සම්පන්න ජාතිවල නොඋපදී. උතුම් සෞභාග්‍ය සම්පන්න ජාතිවලම උපදී. අනාගාමී උතුමන් වනාහී රූප-අරූප භවයන්හිම පහළවෙත්. එහිලා එම ආර්ය උතුමන් තමා අපාය පරිමුත්ත = අපායෙන් සම්පූර්ණයෙන් අත්මිදුනු බව, තමාගේම ඤාණයෙන් ඉබේම දැක දැන ගැනීමට හැක්කේදැයි? අංගුත්තර නිකාය නව නිපාත සීහ නාද වග්ගයේ තුන්වන සූත්‍රයේ මේ ප්‍රශ්ණය නගා ඊට පිළිතුරු දක්වා ඇත. සාරංශය සැකෙවින් මෙහිලා උපුටා දක්වන්නෙමු.

**තෙන ඛො පන සමයෙන තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරකථා උදපාදි. "යොහි කොචි ආවුසො සඋපාදිසෙසා කාලං කරොති, සබ්බො සො අපරිමුත්තො නිරයා අපරිමුත්තො තිරච්ඡාන යොනියා, අපරිමුත්තො පෙත්ති විසයා අපරිමුත්තො අපාය දුග්ගති විනිපාතා"ති. අථඛො අහං භන්තෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිං න පටික්කොසිං, අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිං, "භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං අජානිස්සාමී"ති** [අං. අ. 2./844 ]

### පරිවර්තනය

බුදුරජාණන් වහන්ස, (පරිබ්‍රාජකයන්ගේ ආරාමයේ මම හිඳින අවස්ථාවේ) සමූහයේ සිටින විට එම අඤ්ඤ තිත්ථිය පරිබ්‍රාජකයන් අතර මෙවන් අතුරු කථාවක් පහළ විය. "ඇවැත යම් පුද්ගලයෙක් උපාදාන ඉතිරිව තිබියදී මිය ගියේ නම්, එවැනි පුද්ගලයන් සියලු දෙනා නරකයෙන

නිදහස් නොවේ. තිරිසන් යෝනියෙන් නිදහස් නොවේ. ප්‍රේත භාවයෙන්, අපාය දුගති වැටීමෙන් සම්පූර්ණයෙන් නිදහස් නොවේ යැයි යන මේ අතුරු කථාව පහළ විය. එවිට බුද්ධරජාණන් වහන්ස, එම අඤ්ඤතිත්ථිය පරිබ්‍රාජකයන්ගේ කථාව මම නොපිළිගත්තෙමි. නොම බැහැර කළෙමි. "බුද්ධරජාණන් වහන්සේ සමීපයේ මේ අතුරු කථාවේ අර්ථය තත්ත්වාකාරයෙන් දැනගන්නෙමි"යි යන සඤ්ඤාවෙන් එම කථාව නොපිළිගෙන නොම බැහැර කොට හුනස්සෙන් නැගිට ආවෙමි"යි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළ සේක.

**කෙච සාරිපුත්ත අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා බාලා අබ්‍යත්තා කෙච සඋපාදිසෙසං වා සඋපාදිසෙසොති ජානිස්සන්ති, අනුපාදිසෙසං වා අනුපාදිසෙසොති ජානිස්සන්ති, නවයිමෙ සාරිපුත්ත පුග්ගලා සඋපාදිසෙසා කාලං කුරුමානා පරිමුත්තා නිරයා පරිමුත්තා නිරච්ඡාන යොනියා පරිමුත්තා පෙත්ති විසයා පරිමුත්තා අපාය දුග්ගති විනිපාතා** [අං. අ. 2/844 ]

| | | |
|---|---|---|
| **සාරි පුත්ත** | = | සාරිපුත්‍රය! |
| **අඤ්ඤතිත්ථිය** | = | බාහිර ශාසන ඇදහිලි ඇති |
| **බාලා** | = | බාල වූ |
| **අබ්‍යත්තා** | = | අදක්ෂ වූ |
| **පරිබ්බාජකා** | = | පරිබ්‍රාජයන් (අතර) |
| **කෙච** | = | සඋපදිසෙස පුද්ගලයන්, අනුපාදිසෙස පුද්ගලයන් සම්බන්ධයෙන් අපාය ගති පරිමුත්ත භාවය දැනගැනීමට තරම් සමත් පුද්ගලයා කවරෙක්ද?1 * |
| **කෙච** | = | කුමන නම් පුද්ගලයකුහට |
| **සඋපාදිසෙසංවා** | = | උපාදාන සහිත පුද්ගලයෙකු |
| **සඋපාදිසෙසනාති** | = | උපාදාන සහිත ඇති පුද්ගලයෙකු යැයි |
| **ජානිස්සන්ති** | = | දැනගත හැක්කේද? |
| **අනුපාදිසෙසංවා** | = | උපාදාන ඉතිරි නොමැති පුද්ගලයකු |

1 * එම විශේෂ ඥාණය හා පරිබ්‍රාජකයන් කිසිම සම්බන්ධයක් නොමැත. ඔවුන්ගේ ක්ෂේත්‍රය නොවේ යැයි යන්න මෙහි අදහසයි. කෙච යන තැන යෙදෙන කිං සද්දය ගැරහීමේ අර්ථය ගෙන දේ.

| | | |
|---|---|---|
| **අනුපාදිසෙසොති** | = | අනුපාදිසෙස පුද්ගලයකු යැයි |
| **ජාතිස්සන්ති** | = | දැනගත හැක්කේද 2* |
| **සාරිපුත්ත** | = | ශාරි පුත්‍රය! |
| **සඋපාදිසෙසා** | = | උපාදාන ඉතිරි ඇතිව |
| **කලං කුරුමානං** | = | මිය ගිය |
| **ඉමෙ නව පුග්ගලා** | = | මේ කියනු ලබන්නා වූ අරිය පුද්ගල නව දෙනා |
| **නිරයා** | = | නිරයෙන් |
| **චා** | = | නිරයෙහි පහළ වීම |
| **පරිමුත්තා** | = | සම්පූර්ණයෙන් මිදුනාහු වෙත් |
| **තිරච්ඡාන යොනියා** | = | තිරිසන් යෝනියෙන් |
| **පරිමුත්තා** | = | සම්පූර්ණයෙන් මිදුනාහුය. |
| **පෙත්තිවිසය** | = | ප්‍රේත භවයෙන් |
| **පරිමුත්තා** | = | සම්පූර්ණයෙන් මිදුනාහුය |
| **අපාය දුග්ගති විනිපාතා** | = | අපාය දුර්ගතියෙන්, විනිපාතයෝ |
| **පරිමුත්තා** | = | සම්පූර්ණයෙන් මිදුනාහුය |

මෙලෙස උපදෙස් දී පසුව ආර්යයන් වහන්සේලා නව දෙනා වහන්සේලා විස්තර විභාග කොට දේශනා කළ සේක.

1. අන්තරා පරිනිබ්බායි

2. උපහච්ච පරිනිබ්බායි

---

2* පරිබ්‍රාජකයන්ට වනාහි සම්මා සම්බුද්ධ, පච්චෙකබුද්ධ, ඡළභිඤ්ඤ, පටිසම්භිදා පත්ත රහතුන් වහනසේ බවට පත්වී යැයි දැන ගත හැක්කේද? ඔවුනට කිසිවක් දැනගත නොහැක්කේ යැයි යන්න මෙහි අදහසයි. මෙම වාක්‍ය දෙක ම. නි. මූල පණ්ණාස චූල හත්ථිපදොපම සූත්‍රයෙහි දැක්වෙන පරිදි කොවාහං භො කො ච සමණස්ස ගොතමස්ස පඤ්ඤාවෙය්‍යත්තියං ජානිස්සාමි" යන වාක්‍යයන් මෙන් පහත් කොට සළකා කියන ලද කථාවකි. එබැවින් ප්‍රථම වාක්‍යයෙහි කෙව යැයිද දෙවැනි වාක්‍යයෙහි කෙව් යැයිද ඇති පාලිය සදොස් වූ පාළියකි.

3. අසඞ්ඛාර පරිනිබ්බායි

4. සසඞ්ඛාර පරිනිබ්බායි

5. උද්ධංසොත අකනිට්ඨගාමී (මේ වනාහී අනාගාමී උතුමන් වහන්සේලාය. අන්තරා පරිනිබ්බායි ආදී වන්නා වූ අනාගාමී උතුමන්, සලකා ගන්න.)

6. සකදාගාමී

7. එකබීජි සොතාපන්න

8. කොලං කොල සොතාපන්න

9. සත්තක්ඛත්තු පරම සොතාපන්න

යන මේ නව දෙනා වශයෙන් බෙදා දැක්වූ සේක. අනතුරුව පහත දැක්වෙන කථාව ද දේශනා කළ සේක. මේ එහි සාරාංශයයි සිත තබාගත යුත්තයි

**න තාවායං සාරිපුත්ත ධම්මපරියායො පටිභාසි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං තං කිස්ස හෙතු මායිමං ධම්මපරියායං සුත්වා පමාදං අහරිංසූති අපිචායං මයා සාරිපුත්ත ධම්මපරියායො පඤ්හාධි ඤායෙන භාසිතොති.** [අං. අ. 2/844]

| | | |
|---|---|---|
| **සාරිපුත්ත** | = | සාරිපුත්‍රය |
| **භික්ඛූනං** | = | භික්ෂූන්ට ද |
| **භික්ඛුනීනං** | = | භික්ෂුනීන්ට ද |
| **උපාසකානං** | = | උපාසකයන්ට ද |
| **උපාසිකානං** | = | උපාසිකාවන්ට ද |
| **තාව** | = | මේ ප්‍රශ්නය පහළවීමට කලින් |
| **අයං ධම්ම පරියායො** | = | සඋපාදිසෙස ආර්යයන් වහන්සේලා සම්පූර්ණයෙන් අපායෙන් මිදුනු බව දක්වන මේ බුද්ධ දේශනාව |

| | | |
|---|---|---|
| න පටිභාසි | = | හෙළි නොකරන ලද සේක |
| වා | = | දේශනා නොකරන ලද සේක.1* |
| තං | = | මෙලෙස ප්‍රශ්න පැන නැගීමට කලින් දේශනා නොකිරීම |
| කිස්සහෙතු | = | කුමන හේතුවක් නිසාදැයි යත් |
| ඉමං ධම්ම | | |
| පරියායං සුත්වා | = | මේ ධර්ම දේශනාව අසා |
| වා | = | ඇසීම නිසා |
| තෙ | = | එම සළපාදිසෙස ආර්ය උතුමන් |
| පමාදං මා | | |
| ආහරිංසු | = | පමාවටපත් නොපත්වා යි |
| වා | = | පමාවට නොවැටේවා යි |
| ඉති | = | මේ යන කාරණය නිසාමය 2* |
| සාරිපුත්ත | = | ශාරිපුත්‍රය |
| අපිච | = | ප්‍රමාදයට නොපත්වීමට දේශනා නොකොට නතර කළත් |
| අයං | | |
| ධම්මපරියායො | = | මේ ධර්ම පරියාය ප්‍රශ්ණයක් ඇති කල්හි උත්තරයක් ඇත්තේමයැ"යි යන ප්‍රශ්ණයේ සාමාන්‍ය ස්වභාවය අනුව |

---

1* න තාවායං සාරිපුත්ත ධම්මපරියායො පටිභාසීති අප්පටිභානං නාම භගවතො නත්ථි, න තාවාහං ඉමං ධම්මපරියායං කථෙසින්ති අයං පනෙත්ථ අත්ථො. න තාවායං සාරිපුත්ත ධම්මපරියායො පටිභාසීති - යන තැන භගවතො = බුදුරජාණන් වහන්සේට අප්පටිභාණං නාම = අප්‍රකට දෙයක් නම් නත්ථි = පන - ඇත්ත වශයෙන්ම නැත්තේය. නම් අහං =තමන්වහන්සේ ඉමං ධම්ම පරියායං =මේ ධර්ම දේශනාව තාව = ප්‍රශ්ණය පහළ වීමට කලින් න කථෙති = දේශනා නොකළ සේක ඉති අයං මේ තාක් එත්ථ =මේ විවරණයේ අත්ථො, = දැනවෙන අර්ථයයි (අට්ඨ කථා)

2* මා ඉමං ධම්ම පරියායං සුත්වා පමාදං ආහරිංසූති මයං කිර චතූහි අපායෙහි මුත්තාහි උපරි අරහත්තත්තාය විරියං අකරොන්තා මා පමාදං ආපජ්ජිංසු.

මා ඉමං ධම්මපරියායං සුත්වා පමාදං ආහරිංසූති යන්න වනාහ මයං= අපි චතූහි අපායෙහි - සතර අපායෙන්, මුත්තා කිර =මිදුනෙමු ඉති= මෙලෙස සිත යොදා උපරි අහරත්තත්තාය =ඉහළ අර්හත් ඵලය කැමැතිව විරියං අකරොන්තා =උත්සාහ නොකිරීම නම්වන පමාදං =ප්‍රමාදයට මා අපජ්ජිසසූති = නොපත් වේවා (අට්ඨ කථා)

මයා = තමන් වහන්සේ විසින්

භාසිතො = දේශනා කරන ලදි. [3*]

මෙම සූත්‍රයෙහි සළපාදිසෙස ආර්ය වන සොතාපන්න, සකදාගාමි, අනාගාමි උතුමන් තමන් අපා දුකින් සම්පූර්ණයෙන් ම මිදී ඇති බව අසා දැනගත්තේ නම් අර්හත් ඵලයට පත්වීම සඳහා උත්සාහ නොකර ප්‍රමාදයට පත්වී සිටිනු ඇතැයි කල් ඇතිව දැන, ප්‍රශ්ණයක් පැන නඟින තාක් එම දේශනාව නොකොට පමාවූ බවත් දේශනා කළ බැවින් සාමාන්‍ය සොතාපන්න, සකදාගාමි, අනාගාමි යන උතුමන්ට තම තමාගේ ගතිය නියත බව බුදුවරයන්ගේ දේශනාවෙන් ම දැනගත හැකිය. තීරණය කළ හැකි වේ. එසේම තමාගේ ඥාණයෙන් පමණක් දැන ගැනීමට තීරණය කිරීමට නොහැකි බව යන මේ අර්ථය ද ප්‍රකටයැ. මෙලෙස තමාගේම ඥාණයෙන් දැනගැනීමට නිශ්චය කිරීමට නොහැකි නිසාම සකදාගාමි වූ මහානාම රජ මතු භව ගතිය සම්බන්ධතේ සැක පහළ වූ බව මහාවග්ග සංයුක්ත පාළියේ සරණානි වග්ග යේ ප්‍රථම දුතිය සූත්‍රයන්ට අනුව දැක ගත හැක්කේය. පහත දැක්වෙන ආකාරයෙන් එය දැකගත හැක්කේය.

**තස්ස මය්හං භණෙත තස්මිං මුස්සතෙව භගවන්තං ආරබ්භ සති, මුස්සති ධම්ම ආරබ්භ සති, මුස්සති සංඝං ආරබ්භ සති, තස්ස මය්හං භණෙත එවං හොති "ඉමම්හි චාහං සමයෙ කාලං කරෙය්‍යං, කා මය්හං ගති, කො අභිසම්පරායොති. මා භායි මහානාම. මා භායි මහානාම. අපාපකං තෙ මරණං භවිස්සති, අපාපිකා කාලං කිරියා. යස්ස කස්සචි මහානාම දීඝරත්තං සද්ධා පරිභාවිතං චිත්තං, සීල, සුත, චාග පඤ්ඤා පරිභාවිතං චිත්තං, තස්ස යොහි ඛ්වායං කායො රූපි -පෙ- තං ඉමෙව කාකාවා ඛාදන්ති, ගිජ්ඣවා කුලලාවා, සුනඛාවා, සිංගාලාවා, විවිධාවා පාණක ජාතා ඛාදන්ති. යඤ්ච ඛ්වස්ස චිත්තං දීඝරත්තං සද්ධා පරිභාවිතං සීල, සුත, චාග පඤ්ඤා පරිභාවිතං තං උද්ධංගාමි හොති විසෙසගාමි**

[සං. නි. 5 (2)182]

---

3* පඤ්හාධිප්පායෙන භාසිතොති තයා පුච්ඡිතපඤ්හස්ස සභාවෙන කථිතොති දස්සෙති පඤ්හාධිප්පායෙන භාසිතොති යන කථාවෙන්, තයා පුච්ඡිත පඤ්හස්ස =තොප විසින් ප්‍රශ්න කරන ලද ප්‍රශ්ණයෙහි, සභාවෙන-උත්තර දියයුතු ස්වභාවය නිසා වා - උත්තර වශයෙන්, කථිතො= දේශනා කරන ලදී

චතුහි ඛො මහානාම ධම්මෙහි සමන්නාගතො අරිය සාවකො නිබ්බාන නින්නො හොති නිබ්බාන පොණො, නිබ්බාන පබ්භාරො

[සං. නි. 5 (2)186]

## පරිවර්තනය

"බුදුරජාණන් වහන්සේ වේවා රහතන් වහන්සේලා වේවා බැහැදක වන්දනා කිරීම සවස් කාලයේ කපිල වස්තු නගරයට ඇතුල්වන විට නොසන්සුන්ව හැසිරෙන ඇතකු සමඟත් එක්වෙමි. නොසන්සුන්ව හැසිරෙන අසකු සමඟත් එක්වෙමි. නොසන්සුන්ව හැසිරෙන රියක් සමඟත් එක්වෙමි. නොසන්සුන්ව හැසිරෙන ගැළක් සමඟත් එක්වෙමි. නොසන්සුන්ව හැසිරෙන පුරුෂයෙකු සමඟත් එක්වෙමි එසමයෙහි වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඇරබ පැවති ඒ මාගේ සිහිය මුළාවේමැයි, දහම් ඇරබ පැවති ඒ මාගේ සිහිය මුලාවේමැයි, සඟන ඇරබ පැවති ඒ මාගේ සිහිය මුලවේමැයි, වහන්ස මට මෙබඳු සිතක් විය. මෙසමයෙහි මම කලුරිය කරන්නේ නම් මාගේ ගතිය කුමක් වන්නේද, පරලොව කිමෙක් වන්නේදැ"යි මහානාම රජතුමා පැවසීය. මහානාමය, බිය නොවන්න. මහානාම, බිය නොවන්න. තොපගේ කාලක්‍රියාව ළාමක නොවන්නේය. උතුම් මරණයක් ම වන්නේය. මහානාමය, යම් කිසිවෙක් දීර්ඝ කාලයක් ශ්‍රද්ධාව හාත්පසින් වඩන ලද්දේ ද, සිත ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥායෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, එම රූපය මෙලොවදීම කවුඩො හෝ කති. ගිජුලිහිණියො හෝ, උකුස්සෝ හෝ, ශුනකයෝ හෝ, සිවල්ලු හෝ, නන් වැදෑරුම් ප්‍රාණීහු හෝ කති. නමුත් ඔහුගේ යම් සිතක් දීර්ඝ කාලයක් ශ්‍රද්ධාවෙන් හාත්පසින් වඩනා ලද්දේ ද, ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන් ප්‍රඥායෙන් හාත්පසින් වඩනා ලද්දේ ද එය උඩුකුරුව යන සුලු වෙයි. මාර්ග ඵල ධර්මයන්ටම පත් වෙයි (ප්‍රථම සූත්‍රය)

මහානාමය, බුද්ධ රත්නය විෂයෙහි නොසැලෙන ශ්‍රද්ධාව, ධර්මය විෂයෙහි නොසැලෙන ශ්‍රද්ධාව, සංඝයා විෂයෙහි නොසැලෙන ශ්‍රද්ධාව, ආර්ය කාන්ත ශීල යන මේවායින් සමන්නාගත ආර්ය ශ්‍රාවක තෙමේ

නිවනට ම නැවේ. නිවනට ම නැඹුරු වෙයි. නිවනට බර වෙයි. (දෙවැනි සූත්‍රයේ දක්වෙන විශේෂය) මේ ආදී ලෙස බුදුපියාණන් වහන්සේ දේශනා කළ සේක.

තවදුරටත් ගිතෙල් පිරුණු කළයක්, තෙල් පිරුණු කළයක් යන මේවා දියෙහි ගිල්වා බිඳලුයෙන් බිඳුනු කළ කැබිලි පතුලට ගිලාබසී. ගිතෙල්, තෙල් ආදිය ජලය මතුපිටට නඟින්නා සේ රූප ස්කන්ධය බිඳී ගිය ද ශ්‍රද්ධාදී ලෙසින් පරිභාවිතා කරන ලද සිත වනාහි පියවරින් පියවර ඉහළට යන්නාසේ ද, පෙර දිගට නැවීගත් ගසක් මුලින් කපා හෙලුවහොත් මුලින් නැවී තිබුණු පෙරදිග පැත්තට ඇද වැටෙන්නාක් සේ මුලින්ම නැවී තිබුණු නිවනටම සිත නැවීගන්නා බව ද එම සූත්‍රයන්හි ලා දේශනා කොට ඇති සේක.

මෙම සූත්‍රයන්හි **කාමස්ස ගති කො අභිසම්පරායො** යැයි ද යට විස්තර කරන ලද මූල දුක්ඛක්ඛන්ධ සූත්‍රයෙහි **කොසුනාම මෙ ධම්මො අජ්ඣත්තං අප්පහීනො** යැයිද, මහානාමයන්ගේ ප්‍රකාශනය මතු වූ බැවින් පත්වන්නා වූ ගතිය මත සැක කිරීම, දුරු නොකළ කෙලෙස් මත සැක කිරීම, සමහර සෝතාපන්නයනට හා සකෘදාගාමිනට පහළ විය හැකි බව දත යුතු. එසේ නමුදු එලෙස සැක ඇතිනිසා විචිකිච්ඡා දුරු කළේ නැතැයි නොකිව යුතු. හේතුව වනාහි, මෙවන් සැක සංකාවන් මාර්ග ඥාණයෙන් දුරුකළ විචිකිච්ඡා කෙළෙස් නිසා නොවේ. කංඛාවිතරණ විසුද්ධියෙහිලා දක්වන්නට යෙදුනු **අත්ත දිට්ඨි උපනිස්සය** ඇති අටාකාර, සොළසාකාර විචිකිච්ඡා යන මේවා පමණක් පහාතබ්බ විචිකිච්ඡා වන්නේය.

## මහා පච්චවෙක්ඛණා හත

දැන්, මජ්ඣිම. නිකාය මූල පණ්ණාස කොසම්බි සූත්‍රයෙහි එන සෝතාපන්න පුද්ගලයාගේ මහා පච්චවෙක්ඛනා හත දක්වන්නෙමු.

**කතඤ්ච භික්ඛවෙ යායං දිට්ඨි අරියා නියානිකා නියාහාති තක්කරස්ස සබ්බාදුක්ඛයාය** = මහණෙනි වරද දුරු කළ හැකි, නික්ම යාහැකි (තම කටයුත්ත සැළකිල්ලෙන් නිම කළ හැකි, පැවැත්විය හැකි) එම සොතාපත්ති

මග්ගය දැක දැන ගැනීමක් ඇත්තේය. එම දැක දැන ගැනීම එම මග්ග ප්‍රතිපදාව පුහුණු කරන්නා තත්ත්වාකාරයෙන් දුක් නිම කිරීමට කෙලෙස හික්මෙත්ද? කෙළෙස් සංසිඳුවීමට තම කෘත්‍යය සැළකිල්ලෙන් නිමකළ, පැවැත්විය හැක්කේද යත්; (අදාළ පාළි හා පරිවර්තනය)

**1. ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතොවා රුක්ඛමූල ගතොවා සුඤ්ඤාගාර ගතොවා ඉති පටිසඤ්චික්ඛති.**

**අත්ථි නුඛො මෙතං පරියුට්ඨානං අජ්ඣත්තං අප්පහීණං, යෙනාහං පරියුට්ඨානෙන පරියුට්ඨිත චිත්තො යථා භූතං නප්පජානෙය්‍යං න පස්සෙය්‍යන්ති "සචෙ භික්ඛවෙ භික්ඛු කාමරාග පරියුට්ඨිතො හොති, පරියුට්ඨිත චිත්තොවා හොති සචෙ භික්ඛවෙ භික්ඛු බ්‍යාපාද පරියුට්ඨිතො, ථීන මිද්ධ පරියුට්ඨිතො, උද්ධච්ච කුක්කුච්ච පරියුට්ඨිතො විචිකිච්ඡා පරියුට්ඨිතො, ඉම ලොක චින්තාය පසුතො, පරලොක චින්තාය පසුතො හොති. පරියුට්ඨිත චිත්තාව හොති - සචෙ භික්ඛවෙ භික්ඛු භණ්ඩන ජාතො කලහ ජාතො විවාදාපන්නො අඤ්ඤමඤ්ඤං මුඛ සත්තීහි විතුදන්තො විහරති. පරියුට්ඨිත චිත්තොවා හොති" සො එවං පජානාති, නත්ථි ඛො මෙතං පරියුට්ඨානං අජ්ඣත්තං අප්පහීණං, යෙනාහං පරියුට්ඨානෙන පරියුට්ඨිත චිත්තො යථා භූතං නප්පජානෙය්‍යං න පස්සෙය්‍යං සුප්පණිහිතං මෙ මානසං සච්චානං බොධායාති, ඉදමස්ස පඨම ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි** [ම. නි. 1/756]

මහණෙනි, මෙම ශාසනයෙහි මහණ (ආර්ය පුද්ගල තෙමේ) අරණ්‍යගතව වේවා, රුක්ඛමූල ගතව වේවා, ශුන්‍යාගාර ගතව වේවා, මෙලෙස සළකා බලයි. යම් පරියුට්ඨාන කෙලෙස් වනාහි සිතට නැගී පීඩා කිරීම නිසා මට එය තත්ත්වාකාරයෙන් දැක දැනගත හැක්කේය. මෙලෙස දැක දැන ගත නොහෙන ලෙස පීඩා කරන කෙලෙස් මගේ අජ්ඣත්තික සන්තානයේ දුරු නොවී, බැහැර නොවී, ඇත්තේදැයි සලකා බලයි. (මෙයින් මතු පුථුජ්ජන සෙක්ඛ පුද්ගලයන්ගේ සන්තානයන්හී පහළ විය හැකි පරියුට්ඨානයන් ස්වරූප ආකාරයෙන් දක්වා ඇත. ආර්ය පුද්ගලයාගේ සන්තානයෙහි එම පරියුට්ඨාන සියල්ල ඇතැයි යන්න අදහස් නොකෙරේ.)

මහණෙනි, මහණ කාමරාගය, සිතේ උත්සන්න වී නම්, කාමරාගය නැඟ උත්සන්න වීම ඇත්තේය. මහණෙනි, මහණ ව්‍යාපාදය නැඟ උත්සන්න වී නම්, ථීන- මිද්ධ නැඟ උත්සන්න වී නම්, උද්ධච්ච කුක්කුච්චය නැඟ උත්සන්න වී නම්, විචිකිච්ඡාව නැඟ උත්සන්න වී නම් එළඹ සිටි ලෝකය ගැන කල්පනා කිරීමෙහි නිමග්න වන්නේ නම්, පරලෝකය ගැන කල්පනා කිරීමෙහි නිමග්න වන්නේ නම්, බෙදුම් වාද ඇති. කළහ කාරී, විවාදයට පත්, එකිනෙකා මුඛ සැතින් පහරමින් සිටින්නේ නම් කෙලෙස් නැඟ උත්සන්න වන සිතක් ම වන්නේය (මේ තාක් පරියුට්ඨාන කෙලෙස්වල ස්වරූපය දක්වයි) එම මහණ මෙසේ දැනගනී. එම පරියුට්ඨාන කෙලෙස් සිත පෙළන නිසා මට ඇත්ත ඇති සැටියෙන් නොවැටහේ. නොදැකිය හැක. එලෙස දැක දැන ගත නොහැකි ලෙසට පෙළන පරියුට්ඨාන කෙලෙස් මා සන්තානයේ බැහැර නොවී ඉතිරිව නැත්තේමයැ. චතුරාර්‍ය සත්‍යය, නියම ධර්මය දැන ගැනීමට දැක ගැනීමට මම සිත මනාලෙස පිහිටුවන ලද්දේයැයි දැනගනී. සෝතාපන්න ආර්ය පුද්ගලයෙක් වන්නා වූ මෙම භික්ෂුව පෘතග්ජනයන් හා කිසිම සමාන කමක් නැත. ආර්යයන් හා පමණක් සම්බන්ධ ලෝකුත්තර ස්වභාවය දරණ මෙම ප්‍රථම ප්‍රත්‍යවේක්ෂා ඥාණය ලබන ලද්දේය. (පරිවර්තනය පුනරුක්ති ඉවත් කොට සමහරක් පාළි කොටස් පමණක් දක්වන ලදි. සම්පූර්ණ පාළි හා අර්ථ දැන ගැනීමට කැමැත්තේ නම් ම. නි. බලා දැන ගනිත්වා.)

(ආර්ය පුද්ගලයනට විපස්සනා භාවනා කරන විට පහළ විය හැකි සමහරක් පරියුට්ඨාන කෙලෙස් සමහර විටෙක පහළ වන්නේ නමුදු රූප නාමයන්ගේ ඇතිවීම- නැතිවීම තත්ත්වාකාරයෙන් දැනගැනීමට නොහැකි ආකාරයට බාධා කළ නොහැක්කේය. පහළ වූ එම පරියුට්ඨාන කෙලෙස්ද මෙනෙහි කරන විට වහාම බැහැර කළ හැක්කේය. එම නිසා මෙනෙහි කරමින් කරමින් තත්ත්වාකාරයෙන් දැකගත් ලෙසටම දැකගත හැක්කේය. මෙනෙහි කිරීම හා දැනගැනීම තිබුණු පරිදිම හොඳින් සිදුවේ. මෙනෙහි කළ නොහැකිව දිගින් දිගටම සිත විසිරීයැමක් නැත්තේය. විපස්සනා ජවය විශේෂයෙන් ශක්තිමත් වූ විට පරියුට්ඨාන කෙලෙස් කැලම පැන නොනගී. එබැවින් විපස්සනා භාවනා කොට නැවත සළකා බලන ආර්ය

පුද්ගල තෙමේ රූප - නාම ඇතිවීම - නැතිවීම තත්ත්වාකාරයෙන් දැනගත නොහැකි ලෙස බාධා කරන පර්යුට්ඨාන කෙලෙස් නොදකින බැවින් මෙලෙස තීරණය කළ හැක්කේය)

**2. පුනච පරං භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති, ඉමං නුඛො අහං දිට්ඨිං ආසෙවනෙතා භාවෙනෙතා බහුලීකරොනෙතා ලභාමි පච්චත්තං සමථං ලභාමි පච්චත්තං නිබ්බුති නති. සො එවං පජානාති. ඉමං ඛො අහං දිට්ඨිං ආසෙවනෙතා භාවෙනෙතා බහුලීකරොනෙතා ලභාමි පච්චත්තං සමථං, ලභාමි පච්චත්තං නිබ්බුතින්ති. ඉධමස්ස දුතියං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි** [ම. නි. 1/758]

මහණෙනි, නැවත ද සළකා බලන කල්හි ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ සළකා බලයි. මේ දැනීම දැකීම ඇසුරු කොට වඩා බොහෝ වාරයක් පුහුණු කරමින් සිටීම මම මගේ සිතෙහි සමාධියක් සමථයක් ලැබීද? (සිත විසිරී යන නීවරණ ධර්මයන්ගේ පැන නැගීම නැතිව සංසිඳීමක් ලැබීද? යන්න මෙහි අදහසයි) තම සිතෙහි කෙළෙස් සංසිඳීමක් ලැබීද? (මෙනෙහි කරන අරමුණ මත කෙළෙස් පැන නොනැගීම සාක්ෂාත් කළේදැයි යන්න අදහසයි) සළකා බලයි. එම ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ දැන ගනී. මේ දැක දැන ගැනීම ඇසුරු කොට, වර්ධනය කොට බොහෝ වාරයක් ප්‍රගුණ කරන මම තමා වශයෙන් සිතෙහි සමථය සංසිඳීම - නීවරණ සංසිඳීම ඇත්තටම ලැබීයැ, මගේ සිතෙහි අනුසය කෙලෙස් සංසිඳීම ඇත්තටම ලැබීයැ'යි දැනගනී. මේ සොතාපන්න ආර්ය ශ්‍රාවක තෙම පෘතග්ජනයන් හා කිසිම සම්බන්ධයක් නැති ආර්ය ශ්‍රාවකයන් හා සම්බන්ධ ලොකුත්තර ධර්ම පහළවන මේ දෙවැනි ප්‍රත්‍යවේක්ෂා ඤාණය පහළවේ.

(මාර්ග ඤාණ දර්ශනය ලද ආර්ය පුද්ගල තෙමේ විපස්සනා ඤාණ දර්ශනය නැවත නැවතත් පහළ කරගෙන එම මාර්ග ඤාණ දර්ශනය ඇසුරු කරයි. වඩයි. බහුලීකත කරයි. මෙලෙස කරන නිසා පර්යුට්ඨාන නීවරණ කෙලෙස් සංසිඳී යන බව ස්වකීය වශයෙන් දැකගනී. මෙනෙහි කොට දැනගත් අරමුණක් අරමුණක් පාසා කෙලෙස් පහළ නොවිය හැකි බව ද තමා වශයෙන් දැක ගනී. එබැවින් ප්‍රත්‍යවේක්ෂා කරන කාලයේ මේ දෙවැනි විශේෂ ඤාණය පහළ වේ.)

3. පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටිසඤ්චික්ඛති, යථා රූපායාහං දිට්ඨියා සමන්නාගතො, අත්ථිනු ඛො ඉතො බහිද්ධා අඤ්ඤො සමණොවා බ්‍රාහ්මණොවා තථාරූපාය දිට්ඨියා සමන්නාගතොති. සො එවං පජානාති යථාරූපායහං දිට්ඨියා සමන්නාගතො, නත්ථි ඉතො බහිද්ධා අඤ්ඤො සමණොවා බ්‍රාහ්මණොවා තතා රූපාය දිට්ඨියා සමන්නාගතොති. ඉදමස්ස තතියං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහ

[ම. නි. 1/758]

මහණෙනි, නැවත ද ප්‍රත්‍යවේක්‍ෂා කරන ආකාරයක් වනාහි, ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ සළකා බලයි. මම එසේ වූ මාර්ග ඥාණ දස්සනය අතින් සමන්විත වෙමි. (ද්වාර හයෙහි පහළ වන තාක් රූප-නාමයන් පහළ වන වන අයුරින් තත්ත්වාකාරයෙන් දැනගැනීමට භාවනා කළ යුතු) මා තුළ පහළ වූ මෙම ශාසනයෙන් බැහැර අන්‍ය වූ ශ්‍රමණයෙක්. බ්‍රාහ්මණයෙක් වේවා එලෙස වූ මාර්ග ඥාණ දර්ශනයෙන් සමන්නාගත වෙත්දැයි සළකා බලයි. එම ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ දැන ගනී. (ද්වාර හයෙහි පහළ විය හැකි රූප-නාමයන් පහළ වන වන ආකාරයට තත්ත්වාකාරයෙන් දැන ගැනීමට භාවනා කළ යුතු.) මෙම ශාසනයෙන් බැහැර අන්‍ය වූ ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, මා තුළ පහළ වූ මාර්ග ඥාණ දස්සන වර්ගය අතින් සමන්නාගත වූ කෙනෙක් නොවන්නේ යැයි දැන ගනී. මේ සොතාපන්න අරිය ශ්‍රාවක තෙමේ පෘතග්ජනයන් හා කිසිම සම්බන්ධයක් නොමැති ලෝකුත්තර ධර්මයන් අසුරු කරන මෙම තතිය ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයද පහළ වේ. (මඳක් සංක්‍ෂේප කොට පරිවර්තනය කරන ලදි.)

## ආර්යයන් වහනසේලාට සිදුවිය හැකි ආපත්ති

4 පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටි සඤ්චික්ඛති. යථාරූපාය ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථා රූපාය ධම්මතාය සමන්නාගතොති. කතං රූපාය ච භික්ඛවෙ ධම්මතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, ධම්මතා එසා භික්ඛවෙ දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස කිඤ්චාපි තථාරූපිං ආපත්තිං ආපජ්ජති, යථා රූපාය ආපත්තියා වුට්ඨානං පඤ්ඤායති, අථ ඛො නං ඛිප්පමෙව සත්ථරි වා විඤ්ඤූසුවා සබ්‍රහ්මචාරිසු දෙසෙති විවරති උත්තානි කරොති, දෙසෙත්වා

විවරිත්වා උත්තානි කත්වා ආයතිං සංවරං ආපජ්ජති, සෙය්‍යථාපි භික්ඛවෙ දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො හත්ථෙනවා පාදෙනවා අංගාරං අක්කමිත්වා ඛිප්පමෙව පටිසංහරති. එව මෙව ඛො භික්ඛවෙ ධම්මතා එසා දිට්ඨි සම්පන්නස්ස පුග්ගලස්ස කිඤ්චාපි -පෙ- සංවරං ආපජ්ජති, සො එවං පජානාති, යථා රූපාය ධම්මතාය දිට්ඨි සම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථා රූපාය ධම්මතාය සමන්නාගතොති, ඉධමස්ස චතුත්ථං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි

[ම.නි. 1/760]

මහණෙනි, නැවත ද සලකා බලන ක්‍රමයක් වනාහි; උපසම්පදාව ලද අරිය සාවක තෙමේ මෙලෙස සලකා බලයි. මාර්ග ඥාණ දර්ශනය අතින් සමන්විත පුද්ගල තෙමේ එයාකාර මූල ස්වභාවයකින් සමන්වාගත වේ. එයාකාර වූ මූල ස්වභාවයකින් මමද සමන්විත වන්නේදැයි සලකා බලයි. මහණෙනි, මාර්ග ඥාණ දර්ශනයෙන් සමන්විත පුද්ගල තෙමේ කුමනාකාර මූල ස්වභාවයකින් සමන්විත වේද යත්, මහනෙනි, මාර්ග ඥාණ දර්ශනයකින් සමන්විත භික්ෂුව පිළියම් කළ හැකි ආපත්තියකට කලාතුරකින් පත්වන්නේ නමුදු එම ආපතති ශාස්තෲන් වහන්සේ ලඟ හෝ වේවා, ප්‍රඥාවන්ත සබ්‍රහ්මචාරීන් වහන්සේ නමක් ලඟ හෝ වේවා, වහාම ප්‍රකාශ කරයි. ප්‍රකාශ කොට අනාගතයේ හික්මෙයි. උපමාවක් ලෙස යම්සේ මන්දවූ උඩුකුරුව හෝනා ලදරු කුමරෙක් අතින් වේවායි පයින් වේවයි, ගිනි අඟුරක් ඇක්මෙන්නා හා සමඟම අත-පය හකුළාගන්නේ වේද එළෙසටම පත්වූ ආපත්තිය වහාම හෙළිකොට මත්තට ආරක්‍ෂාවේ1*

මෙලෙස තම වරද වහා දේශනා කොට ආයති සංවරයෙහි පිහිටීම මාර්ග ඥාණ දර්ශනය අතින් සමන්නාගත පුද්ගලයාගේ මූල ස්වභාවයයි.

---

1* අරිය සාවකොති ආපත්තිං ආපජ්ජන්තො ගරුකාපත්තීසු කුටිකාර සදිසං ලහුකාපත්තීසු සහ සෙය්‍යාදීසු සදිසං අචිත්තකකාපත්තිං යෙව ආපජ්ජති තම්පි අසංචිච්ච නොසඤ්චිච්ච ආපන්නං න පටිච්ඡාදෙති. අරිය සාවක වන්නා වූ භික්‍ෂුව ආපත්තියකට පත්වීනම් ගරුකාපතති වශයෙන් කුටිකාර ආපතතියෙන්ද ලහුකාපතති වශයෙන් සහ සෙය්‍ය ආදී කොට ඇති චිත්තක පණ්ණත්ති වජ්ජ ආපතති වලට පමණක් පත්වේ. ඒවාද සචිත්තකව පත්නොවේමැයි. අචිත්තකවම පත්වූ ආපතතීන් නොසඟවයි. ආපත්ති පටිග්ගාහකෙක සභාගපුග්ගලෙ සති එකං දිවසං වා රත්තිං වා අනධිවාසෙත්වා රත්ති චතුරංගෙපි තමෙව සභාව භබ්බෙනො වසනට්ඨානං ගන්ත්වා දෙසෙති යෙව

ආපතතිය භාර ගැනීමට සභාග භික්‍ෂුවක් ඇත්තෙ නම් එක් දිනක් එක් රැයක් නොඉඳී පමානොවී අංග හතරකින් යුක්ත රාත්‍රී අන්ධකාරයේද ඒ සභාග භික්‍ෂුව වෙතට ගොස් ආපත්ති දේශනා කරන්නේය. (අට්ඨකථා දක්වීමයි)

ගිහි ආර්යයන්ද තම වරද නොවළහා නොසඟවා කියත්. සභාග පුද්ගලයෙක් ප්‍රශ්ණ කළහොත් තත්වාකාරයෙන් තම වරද පිළිගනී.

(යම් කිසි කාරණයක් අනුව සළකා බලා නොව ඉබේම මෙන් සිදුවන ස්වභාවය යන්න මෙහි අදහසයි)

ප්‍රත්‍යවේක්ෂා කරන එම ආර්ය ශ්‍රාවක තෙමේ මෙලෙස දැනගත් මාර්ග ඤාණ දස්සනය අතින් සමන්විත පුද්ගලයා නිත්‍යයෙන් සමන්නාගත වන්නා වූ "වරද, ආපත්තිය නොසැඟවීමට කැමැත්ත හා ආයති සංවරය නම් වූ" මෙම මුල ස්වභාවයෙන් තමා සමන්නාගත බව දැනගනී. මෙම සෝතාපන්න ආර්ය ශ්‍රාවක තෙම පෘතග්ජනයන් හා කැලම සම්බන්ධයක් නැති ආර්ය පුද්ගලයන් හා පමණක් සැසඳෙන ලොකුත්තර ධර්ම ඇසුරු කොට මෙම චතුත්ථ පච්චවෙක්ඛණා ඤාණයද ලබන්නේය (මදක් සංක්ෂිප්ත කොට පරිවර්තනය කරන ලදී)

5. පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටිසඤ්චික්ඛති, යථා රූපාය ධම්මතාය දිට්ඨි සම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථා රූපාය ධම්මතාය සමන්නාගතොති. කතං රූපාය ච භික්ඛවෙ ධම්මතාය දිට්ඨි සම්පන්නො පුග්ගලො සමන්නාගතො. ධම්මතා එසා භික්ඛවෙ දිට්ඨි සම්පන්නස්ස පුග්ගලස්ස කිඤ්චාපි යානි තානි සබ්‍රහ්මචාරිනං උච්චාවචානි කිං කරණීයානි තත්ථ උස්සුකමාපන්නො හොති, අථ ඛ්වස්ස තිබ්බාපෙක්ඛා හොති අධිසීල සික්ඛාය, අධි චිත්ත සික්ඛාය, අධි පඤ්ඤා සික්ඛාය, සෙය්‍යථාපි භික්ඛවෙ ගාවී තරුණවච්ඡා ථම්බං අලුම්පති වච්ඡකංච අපවිනතිං. එව මෙව ඛො භික්ඛවෙ ධම්මතා එසා දිට්ඨි සම්පන්නස්ස පුග්ගලස්ස කිඤ්චාපි -පෙ- අධිපඤ්ඤා සික්ඛාය, සො එවං පජානාති, යථාරූපාය ධම්මතාය දිට්ඨි සම්පන්නො පුග්ගලො සමන්නාගතො - අහම්පි තථාරූපාය ධම්මතාය සමන්නාගතොති, ඉදමස්ස පඤ්චමං ඤාණං අධිගතං හොති, අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහ [ම. නි. 1/760]

මහණෙනි නැවතත් ප්‍රත්‍යවේක්ෂා කරන ක්‍රමයකට අනුව වනාහී, ආරිය ශ්‍රාවක තෙමේ මෙලෙස ප්‍රත්‍යවේක්ෂා කරයි. මාර්ග ඤාණ දර්ශනය ඇති පුද්ගල තෙමේ නියත ලෙස සමන්නාගත වන්නා වූ මුල ස්වභාවය අතින් මමද සමන්නාගත දැයි ප්‍රත්‍යවේක්ෂා කරයි. එම මූල ස්වභාවය කෙලෙස දැයි! මහණෙනි, සබ්‍රහ්මචාරින් හා සම්බන්ධ "සිවුරු මැසීම පඬු පෙවීම්, චෛත්‍ය හුණු පිරියම් කිරීම ආදී උතුම් ක්‍රියා, මහාථෙර

වහන්සේලාගේ පා දෙවීම්, තෙල් ගැල්වීම් ආදී යටත් ක්‍රියා යන" කුමන කටයුත්තක් මම කළයුතු දැයි ප්‍රශ්ණ කොට කළ යුතු කෘත්‍යයන්හි ආර්යයන් වහන්සේ පැහැර නොහැර කළයුතු වත් ව්‍යාපාර කොට කළයුතු නමුදු අධිසීල, අධි චිත්ත, අධි පඤ්ඤා යන සික්ෂා තුන අනුව හික්මීමෙහි උත්සුක වේ. උපමාවක් ලෙස අලුත උපන් වස්සකු ඇති තරුණ දෙනක් පැහැර නොහැර තණ බුදින නමුදු වස්සා පිළිබඳව සැලකිළිමත් වන්නාසේය. පැහැර නොහැර කුඩු මහත් කෘත්‍යයන් කළයුතු නමුදු සීල- සමාධි- පඤ්ඤා අනුව හික්මීම්, උනන්දුවෙන් උත්සුක වීම, මාර්ග ඥාණ දර්ශනය ඇති පුද්ගලයා සතු මූල ස්වභාවයයි. ප්‍රත්‍යවේක්ෂා කරන එම ආර්ය ශ්‍රාවක තෙමේ මෙලෙස වටහාගනු ඇති. මාර්ග ඥාණ දර්ශනය ඇති පුද්ගලයා සමන්වාගත "සික්ෂා තුන අනුව හික්මීමට ඇති බලවත් උත්සුකභාව" නම් වන එම මූල ස්වභාවය අතින් මමද සමන්විත වන්නේමි, යි සළකා බලයි. මේ සෝතපන්න අරිය ශ්‍රාවක තෙමේ පෘතග්ජනයන් හා කැලම සම්බන්ධ නැති, ආර්යයන් වහන්සේලා සමග පමණක් සම්බන්ධ ලෝකුත්තර ධර්ම ඇසුරු කොට පහළ වන මේ පඤ්චම ප්‍රත්‍යවේක්ෂා ඥාණය ලබයි. (පහසුවෙන් අර්ථය වැටහී යනු පිණිස පිඬු කරන ලදි)

**6. පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටිසඤ්චික්ඛති යථා රූපාය බලතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය බලතාය සමන්නාගතොති, කතං රූපාය ච භික්ඛවෙ බලතාය දිට්ඨි සම්පන්නො පුග්ගලො සමන්නාගතො, බලතා එසා භික්ඛවෙ දිට්ඨි සම්පන්නස්ස පුග්ගලස්ස යං තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසිය මානෙ අට්ඨිකත්වා මනසිකත්වා සබ්බ චෙතසා සමන්නාහරිත්වා ඔහිත සොතො ධම්මං සුනාති, සො එවං පජානාති, යථා රූපාය බලතාය -පෙ- සමන්නාගතොති, ඉදමස්ස ජට්ඨං ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහ** [ම. නි. 1/762]

මහණෙනි, නැවත ද ප්‍රත්‍යවේක්ෂා කරන ක්‍රමයකට අනුව වනාහි, ආර්ය ශ්‍රාවක තෙමේ මෙලෙස ප්‍රත්‍යවේක්ෂා කරයි. ආර්යයන් වහන්සේලා නිත්‍ය ලෙස සමන්විත වන බලයන් අතින් මාද සමන්විත වේදැයි ප්‍රත්‍යවේක්ෂා කරයි. එම බලය කුමක්ද යත්; මහණෙනි, බුද්ධ දේශිත නියම ධර්ම විනය දේශනා කරන විට ආර්ය පුද්ගල තෙමේ අර්ථ කොට මෙනෙහි

කොට, මුළු සිතින් නැවත නැවතත් සළකා බලමින් යොමු කළ කන් ඇතිව ධර්මය අසයි. මෙලෙස ධර්මය ගෞරවයෙන් මනාපයෙන් යුක්තව සිත නිමග්න කොට ඇහුම් කන් දීම අතින් ආර්යයන් වහන්සේ නියත ලෙස සමන්විත වීම සම්පූර්ණ වේ. ප්‍රත්‍යවේක්ෂා කරන එම ආර්ය ශ්‍රාවක තෙමේ මෙලෙස දැන ගනී; ආර්යයන් වහන්සේලා සමන්විත වන 'ධර්මය ගෞරවයෙන් ඇහුම්කන් දීම' නම් වූ එම බලය අතින්ද මම ද සමන්විත වෙමි යැයි දැනගනී. මේ සෝවාන් ආර්ය ශ්‍රාවක තෙමෙ පෘථග්ජනයන් හා සම්බන්ධයෙන් කැලම නැති ආර්යයන් හා පමණක් සැසඳෙන ලෝකුත්තර ධර්ම ඇසුරු කොට පහළ වන ජට්ඨම ප්‍රත්‍යවේක්ෂා ඤාණය ද ලබාගනී. (දතයුත්ත පමණක් සංක්‍ෂේප කොට පරිවර්තනය කරන ලදී)

**7. පුනච පරං භික්ඛවෙ අරිය සාවකො ඉති පටිසඤ්චික්ඛති, යථාරූපාය බලතාය දිට්ඨි සම්පන්නො පුග්ගලො සමන්නාගතො, අහම්පි තථාරූපාය බලතාය සමන්නාගතොති, කතං රූපාය ච භික්ඛවෙ බලතාය දිට්ඨිසම්පන්නො පුග්ගලො සමන්නාගතො. බලතා එසා භික්ඛවෙ දිට්ඨි සම්පන්නස්ස පුග්ගලස්ස යං තථාගතප්පවේදිතෙ ධම්ම විනයෙ දෙසිය මානෙ ලභති අත්ථවේදං ලභති ධම්ම වෙදං ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං සො එවං පජානාති, යථා රූපාය බලතාය - පෙ- සමන්නාගතොති, ඉදමස්ස සත්තම ඤාණං අධිගතං හොති අරියං ලොකුත්තරං අසාධාරණං පුථුජ්ජනෙහි** [ම. නි. 1/762]

මහණෙනි, තවත් ප්‍රත්‍යවේක්ෂා කරන තවත් ක්‍රමයකට අනුව එනාහි ආර්ය ශ්‍රාවක තෙමේ මෙලෙස ප්‍රත්‍යවේක්ෂා කරයි. ආර්යයන් වහන්සේ සමන්වාගත වන බලයෙන් මම ද සමන්විත වේදෝ හෝයි. එම බලය කෙලෙසද යත්, මහණෙනි, බුද්ධ දේශිත නියම ධර්ම විනය දේශනා කරන විට ඇහුම්කන් දෙන ආර්යයන් වහන්සේ සාර අර්ථය ද ඉතා කැමැත්තෙන් අසයි. මනාපවෙයි. දේශනා පිළිවෙළ මතද පහදී, ධර්මය හා බැඳුනු ප්‍රමෝදයද ලබයි. (වරෙක ඇඟ කිළි පොලා යමින් ප්‍රමොද වීම විය හැක්කේය. පපුවෙහි හදවතෙහි ඉක්මන් ගැස්මක් සේ විශේෂ ප්‍රමෝදයක් පහළ විය හැක්කේය) බණ අසනවිට මෙලස වැටහීයෑම පැහැදීම, නවමු බවක් පහළවීම, ප්‍රමෝදවීම ආර්යයන් වහන්සේ සමන්වාගත වන බලයක් වේ. (වටහා ගත යුතු ධර්ම වැටහී යනු පිණිස දේශනා කරන විට පමණක් මෙලෙස වේ යැයි සළකා

ගත යුතු) ප්‍රත්‍යවේක්ෂා කරන එම ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ දැන ගනී. ධර්මය අසන විට සත්‍ය අර්ථය මත පැහැදී සිත අලුත් වී ප්‍රමෝදවී යෑම නම් වන ආර්යයන් වහන්සේ ගේ බලය අතින් මමද සමන්විත වෙමි. මෙම සෝවාන් ආර්ය ශ්‍රාවක තෙමෙ පෘතග්ජනයන් හා අදාළතාවයක් කැලම නැති ආර්යයන් වහන්සේ සමඟ පමණක් සැසඳෙන ලෝකුත්තර ධර්ම මත පිහිටා පහළ වන මෙම සත්තම ප්‍රත්‍යවේක්ෂා ඤාණයද ලබන්නේය (සංක්ෂේපයෙන් පරිවර්තනය කරන ලදී)

**එවං සත්තංග සමන්නාගතස්ස බො භික්ඛවෙ අරිය සාවකස්ස ධම්මතා සුසමනිට්ඨා හොති සොතාපත්ති ඵල සච්ඡිකිරියාය, එවං සත්තංගසමන්නාගතො බො භික්ඛවෙ අරිය සාවකො සොතාපත්ති ඵල සමන්නාගතො හොති** [ම නි. 1/762]

මහණෙනි මේ දේශනා කළ ක්‍රමයට මේ ප්‍රත්‍යවේක්ෂා ඤාණ හත සතු ආර්ය ශ්‍රාවක තෙමේ සොතාපත්ති ඵලය සාක්ෂාත් කළ ඤාණයෙන් ආර්යයන්ගේ නිත්‍ය ධර්මතා ස්වභාවය මනාසේ පිළිවෙලින් සම්පූර්ණ ලෙස සැලකිල්ලෙන් සොයා බැලීම කරයි. මහණෙනි මේ දේශිත ආකාරයට ප්‍රාත්‍යවේක්ෂා ඤාණ හත නම් වන අංග හතින් සමන්වාගත ආර්ය ශ්‍රාවක තෙම සෝතාපත්ති ඵලය සමන්වාගත පුද්ගලයකු වේ (මේ වනාහී දේශනා පාලිය පරිවර්තනය කළ නිගමන කථාවයි. මේ මහා ප්‍රත්‍යවේක්ෂණ හා අදාල පාළි අර්ථ සවිස්තරව දැනගැනීමට රිසි නම් වඩා හොඳින් වටහාගත් වැඩිහිටියකු වෙතින් උගත යුතු වේ)

# ඵල සමාපත්තියට සම වදින හැටි

"කා ඵල සමාපත්තීති යා අරිය ඵලස්ස නිරොධෙ අප්පනා"

[ප. ම. අ. 187]

දක්වෙන ලෙසට නාම - රූප සංස්කාර සියල්ල නිරොධ වන, සංසිඳෙන නිවන් අරමුණට සම වදින්නා සේ අරිය ඵල සිත පහළ වීම ඵල සමාපත්තිය නම් වේ.

මේ ඵල සමාපත්තිය පෘතග්ජනයනට නොලැබිය හැකි බැවින් සමවැදිය නොහැක්කේය. සියලු ආර්යයන් වහන්සේලා කල් ඇතිව ලබා ඇති බැවින් සමවැදිය හැක්කේය. නමුදු ලබා ඇති වර්තමාන එක් ඵලයකට පමණක් සමවැදිය හැක්කේය. කලින් ලබාගත් යට යට ඵලයන්ට හා නොලද ඉහළ ඉහළ ඵලයන්ට ද සමවැදිය නොහැක්කේය. මෙහිලා "සමාධිසික්ඛාව අතින් සමන්වාගත අනාගාමී හා අර්හත් උතුමන්ට පමණක් ඵලයට සමවැදිය හැක්කේය. සෝතාපන්න, සකදාගාමී උතුමන්ට වනාහී සමාධි සික්ෂාව අතින් අංග සම්පූර්ණ නොමැති නිසා සමවැදිය නොහැක්කේයැ"යි කියන කෙච්චි වාදය ගෙනහැර දක්වමින් විසුද්ධි මාර්ගයෙහි විස්තර විභාගයක් දක්වේ. පෘතග්ජන වන්නේ නමුත් තමා සාක්ෂාත් කරගත් ලෞකික සමාපත්තීන්ට සමවැදිය

හැක්කේය. ආර්යයන් වහන්සේලාට තමන් ලබාගත් ඵලයට සමවැදීමට බැරිවීමට හේතුවක් නොමැත්තේ යැ. තවදුරටත් **සොතාපත්ති ඵල සමාපත්තත්ථාය සකදගාමි ඵල සමාපත්තත්ථාය උප්පාදං අභිභුය්‍යතී ති ගොත්‍රභූ** = මෙලෙස වන්නා වූ පටිසම්භිද මග්ග පාළියට අනුව සොතාපත්ති ඵල සමාපත්ති. සකදගාමි ඵල සමාපත්ති යන මේවාද පහළ විය හැකි බව කෙළින්ම දක්වයි. එබැවින් ආර්යයන් වහන්සේ වන්නේ නමුදු තම ඵලයට සමවැදීමට හැක්කේම යැයි සැක රහිතව නිශ්චය කරන බව විසුද්ධි මාර්ගයෙහි දැක්වේ. එබැවින් ආර්ය භාවයට පත්ව ඵලයට සමවැදිය නොහැකි නම් සමාධිය හා සමඟ ඉතිරි ඉන්ද්‍රියයන් අංග සම්පූර්ණව මුදුන්පත් නොවුණු බැවින් එසේ නොහැකි වන්නේය යන්න පමණක් පිළිගත යුතුව ඇත. සමාධි ඉන්ද්‍රිය ආදිය අංගසම්පූර්ණව මුදුන්පත් වනු පිණිස විපස්සනාවම නැවත නැවතත් යළි යළිත් ප්‍රගුණ කළ යුතුවේ. බලවත්ව සම්පූර්ණ වූ විට ඵලසමාපත්තියට පත්වන්නේය. ඵල සමාපත්තියට නැවත නැවත සමවැදීමට හැකිවිටම එහි සිත තහවුරු වේ.

**විපස්සනා පනෙසා තිවිධා හොති සංඛාර පරිග්ගණ්හනක විපස්සනා ඵල සමාපත්ති විපස්සනා නිරොධ සමාපත්ති විපස්සනාති. තත්‍ථ සංඛාරපරිග්ගණ්හන විපස්සනා මන්දාවා හොතු තික්ඛාවා, මග්ගස්ස පදට්ඨානං හොති යෙව, ඵල සමාපත්ති විපස්සනා තික්ඛාවා වට්ටති මග්ගභාවනා සදිසා, නිරොධ සමාපත්ති විපස්සනා පන නාති මන්ද-නාති තික්ඛා වට්ටති** [වි. ම. 530; ප. ම. අ. 220]

මේ විපස්සනාව වනාහි මාර්ග ඥාණය කැමැත්තෙන් සංස්කාරයන් පරිග්‍රහ කරන විපස්සනාව, සහ ඵල සමාපත්තිය සඳහා වඩන විපස්සනාව නිරෝධ සමාපත්ති සඳහා වඩන විපස්සනාව යැයි තුන් ආකාරයකට වේ. ඒ තුළින් සංස්කාර පරිග්‍රහ කරන විපස්සනාව තරුණ වේවා, බලව වේවා, මාර්ගයට ආසන්නම හේතුව වන්නේය.

[ විපස්සනාව තරුණ නම් දන්ධාභිඥාවෙන් මාර්ගය සම්පූර්ණ කරයි. බලවත් නම් ඛිප්පාභිඥාවෙන් මාර්ගය සම්පූර්ණ කරයි. මේ වනාහී තරුණ - බලව භාවයන් අතර වෙනසයි. (වුට්ඨාන ගාමිණී ලක්ෂණයෙන් සමන්විත වේ නම්, විපස්සනාව මාර්ගයට හේතුව වන්නේමය. ටීකා දැක්වීමයි.]

| | | |
|---|---|---|
| **ඵල සමාපත්ති විපස්සනා** | = | ඵල සමාපත්ති සඳහා විපස්සනාව |
| **සංඛාරාම්මණෙපි සති** | = | සංස්කාරයන් අරමුණු කරන්නේ නමුදු |
| **සබ්බ සංඛාරයෙහි විනිවත්තනාකාරෙනෙව පවත්තනතො** | = | සංස්කාරයන් සියල්ලම බැහැර කරණ ආකාරයෙන්ම පහළ වන බැවින් ද |
| **මග්ගාවිය** | = | මාර්ග වීථීන් වනාහී ඵලයට උපකාර කරන මග ලෙස |
| **විසංඛාර ගතස්ස ඵලස්ස පච්චය භාවතොච** | = | සංඛාරයන්ගේ නිමාව වන නිවන අරමුණුකොට පිහිටින ඵලයට උපකාර කළහැකි ස්වභාවයෙන් ද (ටීකාවෙහි හේතු විස්තර දැක්වීම් අනුවයි) |
| **මග්ග භාවනා සදිසා** | = | මාර්ග භාවනා මෙන් |
| **තික්ඛා එව** | = | බලවත් නම් පමණක් |
| **වට්ටති** | = | වටී |

නිරෝධ සම්පත්තිය සඳහා විපස්සනාව වනාහී තරුණත් නොවී බලවත් ද නොවී මධ්‍යස්ථ වීම ගැළපේ.

මේ අවස්ථාවන්හී "ඵල සමාපත්ති සඳහා වන විපස්සනා බලවත් වීමට වටී" යන කථාව ඵලයට සමවැදීමට භාවනාරම්භ කරන විපස්සක පුද්ගලයාගේ විපස්සනාව එල්ලකොට කියන ලද කතාවකි. මක්නිසාදයත් පටිසම්භිදා මග්ගයෙහි පහත දැක්වෙන කථාවද හමුවන නිසාය.

සංඛාරුපෙක්ඛාය තික්ඛභාවෙ සති කිලෙසප්පහානෙන සමත්ථස්ස මග්ගස්ස සම්භවතො තස්සා තික්ඛාභාව දස්සනත්ථං වෙවචන පදෙහි සහ දළ්හං කත්වා මූලපදානි වුත්තානි. ඵලස්ස පන නිරුස්සහා භාවෙන සන්තසභාවත්තා මග්ගායුත්තත්තාව මන්දභූතාපි සංඛාරුපෙක්ඛා ඵලස්ස පච්චයො හොතීති දස්සනත්ථං මූල පදානෙව වුත්තානීති වෙදිතබ්බානි [ප. ස. අ. 190]

සංඛාරුපෙක්ඛාය
තික්ඛභාවෙ සති = සංස්කාර උපේක්ෂාවේ බලවත් බව ඇති නම්
වා = සංස්කාර උපේක්ෂාව බලවත් නම්
කිලෙසප්පහානෙ සමත්ථස්ස
මග්ගස්ස සම්භාවතො = කෙලෙස් දුරු කළ හැකි මාර්ගය පහළ විය හැකි නිසා
තස්ස තික්ඛභාව දස්සනත්ථං = මාර්ගයේ හේතුව වන්නා වූ එම සංඛාරුපෙක්ඛාවේ තීක්ෂණ බව දැක්වීමට
වෙවචන පදෙහි සහ = ගතිං ආදී පරියාය වේචචන පද දහය මඟින්
දළ්හං කත්වා = දැඩි කොට
මූල පදානි = උප්පාදං ආදී මුල් පද පහ
වුත්තානි = මාර්ග වාරයෙහි දේශනා කරන ලදී.
ඵලස්ස පන = ඵලය වනාහි
නිරුස්සහාභාවෙන සන්ත
සභා වත්තාව = උත්සාහ කිරීම නිම වීම් වශයෙන් නිවුනු බව තිබීම ද
මග්ගායුත්තත්තාව = ලබාගත් මාර්ගය හා බැඳී පහළ කරගත යුතු බැවින් ද [1*]
මන්දභූතාපි = තරුණව පහළ වන්නේ නමුදු[2*]
සංඛාරුපෙක්ඛා = සංඛාරුපෙක්ඛාව

---

1*. අළුතින් පහළ කරගත යුතු විශේෂ ධර්ම නොවී, ලබාගත් මාර්ගයට නිශ්‍රය කොට එයට සමානව නැවත පහළ වියයුතු නියත ධර්ම වන බැවින් යැයි අදහසයි.

2*. 'අපි' ශබ්දය ගරහජොතක අර්ථයි. තරුණ නුමුදු ඵලය පහළ කළ හැක්කේය. තීක්ෂණ වන්නේ නම් වනාහි කිවයුත්තක් නැත්තේමය.

| | | |
|---|---|---|
| **ඵලස්ස පච්චයො හොති** | = | ඵලයට ප්‍රත්‍යය වෙයි |
| **ඉති දස්සනත්ථං** | = | මෙලෙස මෙය දැක්වීමට |
| **මූල පදානි එව** | = | උප්පාදං ආදී මුල් පද පහම |
| **වුත්තානි** | = | ඵල සමාපත්ති වාරයෙහි දේශනා කරන ලදී. |
| **ඉති වෙදිතබ්බානි** | = | මෙලෙස වටහාගත යුතු |

ඵල සමාපත්තිය නැවත නැවතත් බොහෝ වාර ගණනක් සමවැදීය හැකි විට, මෙම පටිසම්භිදා මග්ග අට්ඨ කථාවට ගැළපෙන ලෙසට සංඛාරුපෙක්ඛා ඤාණය තීක්ෂණ නැත්තේ නමුදු ඵලයට පත්විය හැකි බව ඇස්පනා පිට දැක ගත හැක්කේය.

## ඵල සමාපත්තියේ ආනිශංසය

ලෝකයෙහි රජවරු දෙවිවරු තමා සතු රජ සිරිය, දෙව් සිරිය, විඳින්නාසේ ආර්යයන් වහන්සේලා තමන් සතු ඵල සුඛය නිවන් සුඛය යැයි කියන ලෝකෝත්තර සුඛයන් ඇස් පනාපිට විඳිනු සඳහා "මේතාක් කාලය තුළ ඵල සිත පමණක් පහළ කරගෙන වාසය කරන්නෙමි"යි පෙරාතුවට නියම කොට, එසේ අධිෂ්ඨාන කොට කැමති තාක් කාලයක් ඵල සම්පත්තියට සමවදී. ඵල සම්පත්තියේ සිටින විට පහළ වන, බිඳෙන, අනිත්‍යය වන සංස්කාර දුක් වලින් තොර තැනකට පත්වී ශාන්ත ලෙස විසිය හැකි වීම ආනිශංසයයි. ඊට අමතරව මාර්ග ඵලයට පත් අළුත් පුද්ගලයන්ට ඵලයට නැවත නැවතත් පත්වීම, ඵලයට පත්වී බොහෝ කාලයක් විසීම ආදියෙන් ආචාර්ය-සබ්‍රහ්මචාරීන්ට සැනසීම ලබාදීමට හැකිවීම යන ආනිශංස ඇත්තේය.

## ඵල සමාපත්තියට පත්වන ආකාරය

**ද්වෙ ඛො ආවුසො පච්චයා අනිමිත්තාය චෙතො විමුත්තියා සමාපත්තියා සබ්බ නිමිත්තානඤ්ච අමනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා මනසිකාරො.**

යන මජ්ඣිම නිකායේ මහා වේදල්ල සූත්‍ර පාළියට අනුව රූප, වේදනා, සඤ්ඤා, සංඛාර විඤ්ඤාණ යන සංඛාර නිමිති සියල්ල මෙනෙහි කොට භාවනා කරන අතර වාරයේම එම සංඛාර නිමිති අරමුණු සියල්ල බැහැරකොට සංඛාර නිමිති නිම කොට ශාන්ත වූ සීතල වූ නිර්වාන ධාතුවට සිත යොමු කරවන අවස්ථාවේ ඵල සමාපත්තියට පත් වන්නේය. සම වදින පිළිවෙල පහත දැක්වෙන විශුද්ධි මාර්ග දැක්වීමෙන් දත යුතු.

**ඵල සමාපත්තත්තිකෙන හි අරියසාවකෙන රහොගතෙන පටිසල්ලීනෙන උදයබ්බයාදිවසෙන සංඛාරා පස්සිතබ්බා. තස්සපවත්තානුපුබ්බවිපස්සනස්ස සංඛාරාරම්මණ ගොත්‍රභූ ඤාණානන්තරා ඵල සමාපත්තිවසෙන නිරොධෙ චිත්තං අප්පෙති, ඵල සමාපත්ති නින්නතාය චෙත්ත සෙඛස්සනපි ඵලමෙව උප්පජ්ජති. න මග්ගො.** [වි. ම. 526]

## ආර්යයන් වහන්සේලාගේ විපස්සනාව උදයබ්බය ඤාණයෙන් පටන්ගනී

| | | |
|---|---|---|
| **ඵල සමාපත්තත්තිකෙන අරිය සාවකෙන** | = | ඵලය ලබාගැනීමට කැමති ආර්යශ්‍රාවක තෙමේ |
| **පටිසල්ලීනෙන රාහොගතෙන** | = | පිරිසෙන් වෙන්ව තනිව වසමින් ශාන්ත නිශ්ශබ්ද තැනක තැන්පත් ව |
| **සංඛාරා** | = | ඇතිවෙමින් නැතිවෙමින් පවතින රූප-නාම සංස්කාරයන් |
| **උදයබ්බයාදිවසෙන පස්සිතබ්බා** | = | උදයබ්බය ඤාණය ආදී වශයෙන් මෙනෙහි කොට භාවනා කටයුතුය [1*] |
| **පවත්තානුපුබ්බ විපස්සනස්ස** | = | සංඛාරුපෙක්ඛාව දක්වා පහළ වූ විපස්සනා ඤාණ පිළිවෙල ඇත්තා වූ |

1.* ආර්ය පුද්ගලයන් විපස්සනා කරන්නේ නම් උදයබ්බය ඤාණයෙන් පටන්ගත පිවිසීම නියත බැවින් මෙලෙස කියනු ලැබේ.

| | | |
|---|---|---|
| චා | = | විපස්සනා ඤාණ පරම්පරාව අනුව පහළ වූ |
| තස්ස | = | එම ආර්යයන් වහන්සේට |
| සංඛාරාරම්මණ ගොත්‍රභූ ඤාණා නන්තරා | = | සංස්කාරයන් අරමුණු කරන ගොත්‍රභූ ඤාණයට අනතුරුව 2* |
| ඵල සමාපත්ති වසෙන | = | ඵලයට පත්වීම් වශයෙන් |
| චිත්තං | = | සිත |
| නිරොධං අප්පෙති | = | සංස්කාර සංසිඳුනු නිවන් අරමුණට පත්වේ |
| ච | = | දිගට දැක්වීමයි |
| එත්ථ | = | මෙහිලා |
| ඵල සමාපත්ති නින්නත්තාය | = | ඵල සමාපත්තියට නැමී සිටගත් නිසා |
| සෙක්ඛස්සාපි | = | ශෛක්‍ෂ පුද්ගලයාටද (අප ශබ්දය ගරහ ජෝතකය. අශෛක්‍ෂ රහතන් වහන්සේලා ගැන කිවයුත්තක් නැත) |
| ඵල මෙව උප්පජ්ජති | = | ඵලය පමණක්ම පහළවේ |
| න මග්ගො | = | උපරි මාර්ගය පහළ නොවේ. |

ආර්ය පුද්ගලයා විපස්සනා භාවනා කරන්නේ නම් ඇතිවීම්-නැතිවීම් දෙකින් පටන් ප්‍රකට වේ. ඇතිවීම්-නැතිවීම් දැක දැනගන්නා උදයබ්බය ඤාණයේ පටන් පිළිවෙලින් විපස්සනා ඤාණ පහළ වී නොබෝ කලකින් සංඛාරුපෙක්ඛා ඤාණය පහළ විය හැක්කේය.

---

2. පටිසම්භිදා මාර්ගය ඇසුරු කොට මෙහිලා ගොත්‍රභූ යැයි කියන ලදී. පට්ඨාන පාළියෙහි වනාහි සංඛාර අරමුණු ගන්නා මේ ඤාණය අනුලෝම ඤාණය ලෙසටම දක්වයි. එම නිසාම විසුද්ධි මාර්ගයේ අවසාන කොටසෙහි ගොත්‍රභූති වෙත්ථ අනුලොමං වෙදිතබ්බං වුත්තංහෙතං පට්ඨානෙ අරහතො අනුලොමං ඵල සමාපත්තියා අනන්තර පච්චයෙන පච්චයො, සෙඛානං අනුලොමං ඵල සමාපත්තියා අනන්තරපච්චයෙන පච්චයෙති. යැයි දිගට අනුශාසනා කරයි.

එමනිසා ඵල සමාපත්තිය උදෙසා විපස්සනා වඩන ආර්යය උතුමනට උදයබ්බය ඤාණයෙන් පටන් ගෙන පිළිවෙලින් ඤාණ පහළ වේ. සංඛාරුපෙක්ඛා බලවත් වූ විට අනුලෝම ඤාණය පහළ වී මෙනෙහි කරමින් සිටින සංස්කාර අරමුණු බැහැරකොට සංස්කාරයන් නිරොධ වී, සංසිඳී නිවන් අරමුණට වැදගන්නාසේ පහළ වේ. මෙම සිත පහළ වන ආකාරය පෙර මාර්ග චිත්තය පහළ වන ආකාරයටම සමාන වේ. පෙර පහළ වූ මාර්ගයේ ඵලය වන බැවින් එම සිතට 'ඵල සිත' යැයි කියනු ලැබේ. පෙර පහළ වූ ඵල සිත අපේක්ෂා කොට විපස්සනා වඩන බැවින් වරක් පහළ වූ ඵල සිත් වර්ගයම පහළ වේ. අපේක්ෂා නොකරන ලද ඉහළ මාර්ග සිත එම අවස්ථාවේ පහළ නොවේ. ඉහල මාර්ගයම ලැබීමේ අපේක්ෂාවෙන් විපස්සනා වඩන්නේ නම් එවිට විපස්සනා ඤාණ සම්මප්පධාන කෘත්‍ය හතර සම්පූර්ණ කරමින් පහළ වන බැවින් එය ඵලය සඳහා භාවනා කරන විපස්සනාවට වඩා විශේෂ වේ. ඉහළ ඉහළ විපස්සනා ඤාණයනට පෙර මෙන් පහසුවෙන් යාගත නොහැකි ආකාරයට ද පත්විය හැක්කේය. එබැවින් මහා ටීකාහි

අඤ්ඤදායෙව විපස්සනාචාරො අරියමග්ගාවහො. අඤ්ඤදා ඵල සමාපත්ති ආවහො = ආර්ය මාර්ගය පහළකරවිය හැකි විපස්සනාවේ පහළ වීම වෙනස්ය. ඵල සමාපත්තිය ගෙනදියහැකි විපස්සනාවේ පහළ වීම වෙනස් එකකි යැ'යි දක්වයි. එම මාර්ගය සඳහා විපස්සනා ඤාණ අනුපිළිවෙලින් දියුණු වී සංඛාරුපෙක්ඛා ඤාණය බලවත්ව තියුණුව නැඟී ආකල අපේක්ෂා කරන ලද ඉහළ මාර්ග ඤාණයම පහළ වේ. අපේක්ෂා නොකරන ලද ඵල සමාපත්තිය පහළ නොවේ. නමුදු ඉහළ මාර්ගය පහළවනු පිණිස ඤාණය නොදියුණු තාක් කල් සංඛාරුපෙක්ඛාව පමණක් නැවත නැවතත් පහළ වෙමින් පවතී. එම අවස්ථාවේ ලද ඵල ධර්මය කෙරෙහි බැඳීම නොසිඳී සමහර දෙනාට ලද ඵලයට ම සිත නැවේ. සිත නැමෙන නිසා එම ඵලයට ම සිත සමවදී. එබැවින් ඉහළ මාර්ගය සඳහා වීර්‍ය කරන යෝගී තෙම භාවනා කරන මේ කාල සීමාව තුළ ලද ඵලයට සම නොවදිමි" යැයි මනාකොට අධිෂ්ඨාන කිරීමෙන්

උක්ත බැඳීම කාලයකට නතර කොට එම කාලය තුළ සිද දැමිය යුතු. භාවනා කරන කාලය තුළ ද ලද ඵලයට සිත නොනැමීමට විශේෂයෙන් සතිමත් විය යුතු.

## සමාපත්තියේ ස්ථිතිය

**යතො ඛො ආවුසො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියා සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො අනිමිත්තායච ධාතුයා මනසිකාරො පුබ්බෙච අභිසංඛාරො** යන (ම. නි. 1/696) මහා වේදල්ල සූත්‍රයට අනුව විනාඩි පහක්-විනාඩි දහයක් වේවා. විනාඩි 15ක්, පැය භාගයක් වේවා, පැයක්-දෙපැයක් පමණ වේවා, ඵල සමාපත්තියෙහි සිටීමට කැමති ආර්ය උතුමෝ තෙම පෙරාතුවම "මෙපමණ කාල වේලාවක් ඵල සමාපත්තියේ පවතීවා"යි කාලය ප්‍රමාණ කොට අධිෂ්ඨාන කොට විපස්සනාව වැඩිය යුතුවේ. මෙනෙහි කරමින් භාවනා වඩන අතර වාරයේ කැමති වන ඵල සමාපත්තිය තහවුරු කරගැනීමට ව්‍යාපාර නොකළ යුතුය. ඒ සඳහා බලාපොරොත්තු නොවිය යුතු. අපේක්ෂා නොකළ යුතු. හුදු මෙනෙහි කිරීම කරමින් භාවනා කටයුතුය. මෙලෙසට මෙනෙහි කොට භාවනා කරන්නේ නම් සංඛාරුපෙක්ඛා ඤාණය බලවත් වූ විට පෙර අධිෂ්ඨාන කළ පරිදි කාලයක් සංස්කාර නිමිති අරමුණු සියල්ල අරමුණු නොකර සංස්කාර නිරෝධයට ම, නිර්වාන ධාතුවටම සිත වැදගන සිටී. මෙලෙස ප්‍රමාණ කළ තාක් කල් මේ ඵල සමාපත්තිය තහවුරුව පවතී. නමුදු, මෙලෙස ප්‍රමාණ කළ තාක් කාල ප්‍රමාණයක් තහවුරුවීම වනාහී විපස්සනාව සවිමත් ලෙස, ප්‍රගුණ කළ, දක්‍ෂ පුද්ගලයනට පමණක් සමෘධ වේ. විපස්සනාව බලවත් නොවූ, අදක්‍ෂ වූ, පුද්ගලයනට ප්‍රමාණ කළ කාලය සම්පූර්ණ නොවීමද විය හැක. පෙරාතුවම ප්‍රමාණ කොට අධිෂ්ඨාන නොකර සම වැදුනේ නම් බොහෝ කල් නොපැවතීම සිදුවීම බහුලය. සම වැදෙන අවස්ථාවේ ඵල සිතෙහි සංසිඳීම, සමාධිය පහළවීම දසම, එකාදසම අංගුත්තර පාළියෙහි පහත දැක්වෙන ලෙසට දේශනා කොට ඇත.

## ඵල සමාපත්තියේදී නිවන හැර වෙන කිසිවක්ම නොදනී

ඉධානන්ද භික්ඛු එවං සඤ්ඤී හොති. එතං සන්තං එතං පණීතං යදිදං සබ්බ සංඛාර සමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. එවං ඛො ආනන්ද සියා භික්ඛුනො තථාරූපො සමාධි පටිලාභො, යථා නෙව පඨවියං පඨවී සඤ්ඤී අස්ස, න ආපස්මිං ආපො සඤ්ඤී අස්ස, න තෙජොස්මිං තෙජො සඤ්ඤී අස්ස, න වායස්මිං වායො සඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතන සඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතන සඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන සඤ්ඤී අස්ස, න ඉධ ලොකෙ ඉධ ලොක සඤ්ඤී අස්ස, න පර ලොකෙ පරලොක සඤ්ඤී අස්ස යම්පි දිට්ඨං සුතං මුතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤීච පන අස්සාති [අං. නි. 6/668]

ආනන්දය, මෙම ශාසනයෙහි මෙවන් සඤ්ඤා ඇත්තෙක් වෙයි. සඤ්ඤාව පහළවන ආකාරය වනාහි එම නිවනේදී සියලු සංස්කාරයන් සමථයට පත්වී යැ යන්න ඇත්තය. සියලු—උපධි ස්කන්ධයන් බැහැර කළේය යන්නද ඇත්තය. තණ්හාව ක්‍ෂයවීම ද සත්‍යය. රාග සියල්ල නිරුද්ධවීම ද සත්‍යය. සංස්කාර සංසිඳීම දුරුවීම ද සත්‍යය. නිවීම නම් වූ නිවීම ශාන්තය, ප්‍රනීතයැයි මෙලෙස සඤ්ඤාව ඇත්තේය (මෙලෙසට ඵල සමාපත්තියට පත් වනවිට අරමුණු කරන ආකාරය දක්වයි.)

ආනන්දය, සමාපත්තියට පත්වූ භික්‍ෂුවට මෙලෙස ශාන්ත භාවයකට පත්වීම මේ දැක්වූ ලෙසට මනසිකාරය පැවැත්වීමෙන් ලබාගත හැක්කේය. මෙලෙස ශාන්ත වන අවස්ථාවේ පඨවී කසිනයෙහි පඨවී සඤ්ඤාව නොමැත්තේය. ආපො කසිනයෙහි ආපො සඤ්ඤාව නැත. තෙජො කසිනයෙහි තෙජො යන සඤ්ඤාව නැත. වායො කසිනයෙහි වායො යන සඤ්ඤාව නැත (මේ පද හතර මඟින් රූප ධ්‍යානය සම්බධ

වූ පුද්ගලයෙකුට වුවද ඵල සමාපත්තියේදී රූප ධ්‍යානයන්ගේ අරමුණු වලට සිත නොයන බව දක්වයි.)

*අනන්ත වූ ආකාශ ප්‍රඥප්තියෙහි අනන්ත වූ ආකාශය යැයි සඤ්ඤාව නැත. අනන්ත වූ විඤ්ඤාණයෙහි අනන්ත විඤ්ඤාණ යැයි යන සඤ්ඤාව නැත. ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායාතන සඤ්ඤාව නැත. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙව සඤ්ඤා සඤ්ඤාව නැත.*

(මේ දෙපදය මගින් අභිඥා සිත් ,සාමාන්‍ය සිත් යන මේවා මගින් මෙලොව පරලොව හා බැඳුනු සඤ්ඤා මතකයන්, කල්පනා කිරීම් නැති බව දක්වයි. එබැවින් ඵල සමාපත්තියේදී තම කය. සිත යන මේවායින් පටන්ගෙන වර්තමාන ලෝකය සම්බන්ධයෙන් ද සඤ්ඤා නොලබන බැවින් නොදනී. දේව ලෝකය ආදී පරලොව ගැන ද සිතීමක් නැත.) යම් අරමුණක් දුටුවේ ද, ඇසුවේ ද, ආඝ්‍රාණ, රස, පහස විඳින ලද්දේ ද කල්පනා කළේ ද, සිතින් ළඟාවී ද සොයා බැලී ද, ගොචර වී ද එම අරමුණක් වශයෙන් පිළිබඳව ද සඤ්ඤා නොමැත (මේ පදයෙන් ඵල සමාපත්තියට සමවැදී කල්හී අනෙක් අවස්ථාවල මෙන් දුටු, දැනගත් පරමාර්ථ-ප්‍රඥප්ති අරමුණු පිළිබඳව කල්පනා නොකරයි, මනසිකාරය නොයෙදේ යැයි දක්වයි. නමුදු සඤ්ඤාවක් නැත්තේ ද නොවේ. සඤ්ඤවක් ද ඇත. (මේ පදයෙන් සංඛාර සියල්ල සමථයකට පත්වන නිවන පිළිබඳ සඤ්ඤාව එහි ඇත්තේ යැයි දක්වයි) වෙනත් බාහිර අරමුණු කෙරෙහි සිත යෙදීමක්, කල්පනා කිරීම දුරුවී නිවන් අරමුණ මතම පමණක් මෙනෙහි කිරීම කල්පනා කිරීම ඇති එම සමාහිත සමාධිය මේ දක්වූ ලෙසට මනසිකාරය යොදා පහළ කරගත හැකි බව දේශනා කළ සේක. (මේ වනාහී පාළියේ පරිවර්තන යයි.)

**එතං සන්තං එතං පණීතං සන්තං සන්තන්ති අපෙක්ඛා නිසින්නස්ස දිවසම්පි චිත්තුප්පාදො සන්තං සන්තං මෙව පවත්තති. පණීතං පණීතං ති අපෙක්ඛා නිසින්නස්ස දිවසනෙතව චිත්තුප්පාදො පණීතං පණීතං නෙව**

පවත්තති. සබ්බ සංඛාර සමථොති ආදීනිපි තස්සෙව වෙවචනානි (සබ්බ සංඛාර සමථොති අපෙක්ඛිත්වා නිසින්නස්සති දිවසංපි චිත්තුප්පාදො සබ්බසංඛාර සමථො තෙව පවත්තති -පෙ-) නිබ්බානං නිබ්බානන්ති අපෙක්ඛිත්වා නිසින්නස්ස දිවසංපි චිත්තුප්පාදො නිබ්බානං නිබ්බානන්තෙව පවත්තතීති සබ්බංපෙතං ඵල සමාපත්ති සමාධිය සන්ධාය වුත්තං (අං. අ.2/817 වරහන් වලින් පිට දැක්වීම් නිකඩගුත්තර අට්ඨ කථාවෙන් ගෙන ඇතුළත්කොට සකස්කරන ලදී)

| | | |
|---|---|---|
| **එතං සන්තං එතං පනීතං** | = | එතං සන්තං එතං පනීතං යන තැන අර්ථය වනාහි |
| **සන්තං සන්තංති අපෙක්ඛිත්වා** | | |
| **නිසින්නස්ස** | = | ශාන්තය, ශාන්ත යැයි අර්පණා ප්‍රාප්ත ආර්යයන් වහන්සේගේ |
| **චිත්තුප්පාදො** | = | චිත්තුත්පාදය |
| **සන්තං සන්තන්තෙව** | = | ශාන්තය ශාන්ත යැයිම |
| **දිවසම්පි පවත්ති** | = | සම්පූර්ණ දිවාකාලයම පවත්වයි |

(ඵල සමාපත්තියේ සිටින විට ශාන්තයැ ශාන්තයැයි කිය කියා සිටිනවා නොවේ. නමුදු ශාන්ත ආකාරයට අරමුණු කොට ඵල සිත පහළ වීමට අපේක්ෂා කරන බැවින් මෙලෙස දක්වයි.)

මෙහිලා අදාළ අට්ඨ කථාව පෙර මාර්ගය පහළ වන අවස්ථාව විස්තර කරන අවස්ථාවේ දක්වන ලදි. පසු අවස්ථාවන්හී ද එලෙසටම යැයි වටහාගත යුතු.

| | | |
|---|---|---|
| **පණීතං පණීතන්ති** | = | ප්‍රනීතය ප්‍රනීතයැයි |
| **අපෙක්ඛිත්වා නිසින්නස්ස** | = | සමවැදී සිටින ආර්යයන් වහන්සේගේ |
| **චිත්තුප්පාදො** | = | ඵල චිත්තුප්පාදය |
| **පණීතං පණීතංතෙව** | = | ප්‍රණීතයැ ප්‍රණීතයැයි කියාම |
| **දිවසම්පි** | = | දවසම පවතී |

සබ්බ සංඛාර සමථොති
ආදීනිපි = සබ්බසංඛාර සමථො ආදී කොට ඇති පදයන්ද

තස්සෙව පනීතං = සන්ත පණීත නම් වූ එම නිවනම

වෙවචනානි = අර්ථ අතින් සමාන නුමුදු විවිධ වූ වචනයෙන්මයැ

හි = ඵල සිත පහළ වන ආකාරය තවදුරටත් දක්වතොත්

සබ්බ සංඛාර සමථොති
අප්පෙත්වා නිසින්නස්ස = සංස්කාර සියල්ල සංසිඳීමට පත් වී යැයි (සමාපත්තියට) සමවැදී සිටින ආර්යයන් වහන්සේගේ

සබ්බසංඛාර සමථොත්වෙව = සංස්කාර සියල්ල සංසිඳීමකට පත්වී යැයි මෙයම

දිවසම්පි පවත්ති = දවසක් වුව පවතී. පෙය්‍යාල අර්ථය විස්තර වශයෙන් දක්වතොත්

සබ්බූපධි පටිනිස්සග්ගොති අප්පෙත්වා
නිසින්නස්ස චිත්තුප්පාදො = සියලු උපධි ස්කන්ධයන් අතහැර දමන ලදැයි සමවැදී සිටින ආර්යයන් වහන්සේගේ ඵල චිත්තුප්පාදය

සබ්බූපධි පටිනිස්සග්ගො ත්වෙව = උපධි ස්කන්ධයන් සියල්ල අතහැර දැමීයැයිම

දිවසම්පි පවත්ති = දවසක් වුව පවතී

තණ්හක්ඛයොති අප්පෙත්වා
නිසින්නස්ස චිත්තුප්පාදො = පිපාසයක් බඳු තණ්හාව ක්ෂයවී යැයි සමවැදී සිටින ආර්යයන් වහන්සේගේ ඵල චිත්තුප්පාදය

| | | |
|---|---|---|
| තණ්හක්ඛයොතෙව්ව | = | තණ්හාව ක්ෂයවී යැයි ම |
| දිවසං පි පවත්තති | = | දවසම වුව පවතියි. |
| විරාගොති අපෙක්ඛා | | |
| නිසින්නස්ස චිත්තුප්පාදො | = | විරාගය යැයි සමවැදී සිටින ආර්ය උතුමන්ගේ චිත්තුප්පාදය |
| විරාගොතෙව්ව | = | විරාගය ම යැයි |
| දිවසංපි පවත්තති | = | දවසක් පුරා වුව පවතී |
| නිරොධො නිරොධොතු | | |
| අපෙක්ඛා නිසින්නස්ස | | |
| චිත්තුප්පාදො | = | සංස්කාරයන් නිරෝධ වී යැයි සමවැදී සිටින ආර්ය උතුමන්ගේ චිත්තුප්පාදය |
| නිරොධො නිරොධොතෙව්ව | = | සංඛාර නිරුද්ධවිය, නිරුද්ධවිය යැයි ම |
| දිවසංපි පවත්තති | = | දවසක් වුව පවතී (මෙපමණකින් පෙයියාල නිමයැ) |
| නිබ්බානං නිබ්බානන්ති අපෙක්ඛා | | |
| නිසින්නස්ස චිත්තුප්පාදො | = | සංස්කාර දුක නිවුනා නිවුනා යැයි සමවැදී සිටින ආර්ය උතුමන්ගේ ඵල චිත්තුප්පාදය |
| දිවසංපි පවත්තති | = | දවසක් වුව පවතී |
| ඉති | = | මෙලෙස |
| එතං සබ්බමපි | = | මේ සියල්ල ද |
| ඵල සමාපත්ති සමාධිං සන්ධාය | = | ඵල සමාපත්ති සමාධිය සලකා |
| වුත්තං | = | දේශනා කරන ලදී. |

## සමාපත්තියෙන් නැගී සිටීම

යො ඛො ආවුසො පච්චයා අනිමිත්තාය චෙතො විමුත්තියා වුට්ඨානාය සබ්බ නිමිත්තානඤ්ච මනසිකාරො අනිමිත්තාය ච ධාතුයා අමනසිකාරො යන (ම. නි. 1/696) මහා වේදල්ල සූත්‍ර දක්වීමට අනුව සංඛාර සංසිඳීමෙන් නිරෝධ වූ නිවන් අරමුණ අතහැර රූප, වේදනා සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන සංඛාර නිමිති පහ තුළින් එකක් අරමුණ කළ කල්හී ඵල සමාපත්තියෙන් නැගිටී. පහත දක්වෙන මේ පාළි විවරණය විසුද්ධි මග්ගයෙන් උපුටා ගන්නා ලදී.

## සබ්බ සංගාහික කථා

**සබ්බනිමිත්තානන්ති රූප නිමිත්ත වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ නිමිත්තානං, කාමඤ්ච න සබ්බානෙවෙතානි එකතො මනසිකරොති. සබ්බසංගාහිකවසෙනෙතං වුත්තං තස්මාතං යං භවංගස්ස ආරම්මණං හොති තං මනසිකරොතො තං මනසිකාරොති ඵල සමාපත්ති වුට්ඨානං හොති.** [වි. ම. 526]

**සබ්බ නිමිත්තානන්ති** = සියළු නිමිති සබ්බ නිමිත්තානි යැයි කියන තැන

**රූප නිමිත්ත වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ නිමිත්තානං** = රූපාරම්මණ නිමිත්ත, වේදනාරම්මණ නිමිත්ත, සඤ්ඤාරම්මණ නිමිත්ත, සංඛාරාරම්මණ නිමිත්ත, විඤ්ඤාණ ආරම්මණ නිමිත්ත යන මේවා

**ච** = මෙහි අර්ථය තවදුරටත් පැහැදිළි කරන්නේ නම්

**සබ්බ එව එතානි** = මේ සංඛාර නිමිති සියල්ලම ද

**එකතො** = එකට එක්ව

**කාමං න මනසිකරොති** = ඉදින් මනසිකාරය නොයෙදීම යන්න ඇත්තයැ

| | | |
|---|---|---|
| **පන** | = | නමුදු |
| **සබ්බ සංගාහික වසෙන** | = | සමාපත්තියෙන් නැගී සිතෙහි අරමුණ වීමට සුදුසු සියලු අරමුණු පිඬු කොට කියන කථාවක් වශයෙන් |
| **එතං** | = | **සබ්බ නිමිත්තානං** යන මේ පදය |
| **වුත්තං** | = | දේශනා කරන ලදි1* |
| **තස්මා** | = | වරකට සංඛාර නිමිති එකක්ම අරමුණු කළහැකි බව යන එම හේතුව නිසා |
| **යං** | = | කිසියම් නිමිත්තක් |
| **භවංගස්ස ආරම්මණං හොති** | = | භවංගයේ අරමුණු වෙයිද |
| **තං** | = | එම නිමිත්ත |
| **මණසිකරොතො** | = | භවංග සිත් සිඳ මෙනෙහි කරන්නා හට |
| **ඵල සමාපත්ති වුට්ඨානං** | = | ඵල සමාපත්තියෙන් නැගීම |
| **හොති** | = | වේ |

භවංග සිත් පහළ වී නම් ඵල සමාපත්තියෙන් නැගී සිටියා නම් වේ. නමුත් සාමාන්‍ය ආර්යයන් වහන්සේලාට එම භවාංග සිත ප්‍රකටව දැනගැනීම දුෂ්කරය. භවාංගයට අනතුරුව ඵලය-නිවන ප්‍රත්‍යවේක්ෂා කිරීම වේවා, වෙනත් එකකට සිත යෙදීම වේවා, කර්මස්ථානය භාවනා කිරීම වේවා දිගට පහළ වේ. ප්‍රත්‍යවේක්ෂාව, සිත යෙදීම, භාවනා යන

1* අවසාන ඵල ජවනයට අනතුරුව පහළවන භවාංග සිත සංඛාර නිමිති එකක් අරමුණු කරයි. සංඛාර නිමිති පහම එකවැර අරමුණු නොකරයි. නමුදු ඵල සමාපත්තියට සමවැදුනු ආර්යයන් වහන්සේලා සියල්ලන්ගේම සන්තානයන්හි පහළවන විවිධ භවාංගයන්හි නිමිති අරමුණු සියල්ල ඉතිරි නොකර බැලීම සලකා සබ්බනිමිත්තානං යැයි දේශනා කළ සේක. පච්චක්ඛ විපස්සනා ක්ෂෙත්‍රයේදීද රූප-නාම ස්කන්ධයන් අතරින් එකක්ම අරමුණු කළහැකි, භාවනා කළ හැකිබව සත්‍යය. සංඛාර සියල්ල භාවනාවට ලක් කරයි යැයිද, පඤ්චස්කන්ධය භාවිතාකරයි යැයිද යනාදී ලෙසට දේශනා කරන ලද පාළි අට්ඨ කථා කථාවන් ද මෙලෙසටම සබ්බ සංගාහික කථායැයි සලකාගත යුතු.

මෙම සිත්ම ප්‍රකට ලෙස දත හැක්කේය. එබැවින් එවන් සිත් පහළ වූ අවස්ථාවේ ඵල සමාපත්තියෙන් නැඟී සිටියේ යැයි සලකා ගත යුතු.

සමහරෙකුට ඵල සමාපත්තිය සඳහා භාවනා කරන්නේ නම් ඵලයට ද වහා ලංවිය හැක්කේය. ඵලයෙන් ද වහා නැඟී සිටිය හැක. ඵලය පහළවීම එක වතාවක්, භාවනාකොට ප්‍රත්‍යවේක්‍ෂා කිරීම එක් වතාවක් වශයෙන් බොහෝ වතාවක් සිදුවිය හැක්කේය. එවිට සමවැදීමට ද දක්‍ෂ නොවේ. සූතමය ඥාණය ද නැත්තකු වන්නේ නම් සාමාන්‍යයෙන් ඵල සමාපත්තියේ සිටියදීම ඒ ඒ අරමුණු කල්පනා කිරීම, සළකා බැලීම, භාවනා කිරීම යනාදිය කොට දත හැක්කේ යැයි වරදවා අදහා ගත හැක්කේය. මහා මෞද්ගල්‍යාන ස්වාමීන් වහන්සේගේ සළකා ගැනීම සේ යැයි සිතා ගත යුතු.

මහා මෞද්ගල්‍යාන මහරහතන් වහන්සේ භික්‍ෂූන් වහන්සේලාට මෙසේ දේශනා කළ සේක. 'ඇවැත්නි, මම සිඛ්ඛිනිකා ගංතෙර ආනෙඤ්ජ සමාධියට සමවැදී සිටින විට ජලයට බැස නැවත නැඟ එන ඇතුන්ගේ සතුටු හඬ ඇසුවෙමි'යි දක්වන ලදී. ආනෙඤ්ජ සමාධිය යන්නෑ රූප අරූප චතුත්ථ ධ්‍යාන පහද, එම පහ තුළින් එකක් පාදක කොට සමවැදුනු අරහත්ත ඵල සමාධිය ද ආනෙඤ්ජ සමාධිය යැයි කියනු ලැබේ යැයි උදානට්ඨ කථාහී දක්වයි. මෙම ආනෙඤ්ජ සමාධියට සමවැදී සිටින විට අකුණු විදුලි කොටන ශබ්දයද නොඇසේ. යම් බාහිර හේතුවක් නිසා කොප්‍ය නොවන, චලනය නොවන සමාධියකි. එබැවින් එම භික්‍ෂූන් එම කථාව පිළිනොගත් නිසා බුදුපියාණන් වහන්සේට දක්වන ලදී. එවිට බුදුපියාණන් වහන්සේ පහත දක්වෙන ලෙසට විනිශ්චය කරන ලදී.

## අපිරිසිදු ඵල සමාපත්තීන් ද ඇතිබව

**අත්ථෙ සො භික්ඛවෙ සමාධි සොච බො අපරිසුද්ධා=** මහණෙනි මොග්ගල්ලානයන් සමවැදුණු එම සමාධිය ආනෙඤ්ජ සමාධිය බැව් සැබෑය. නමුදු එම සමාධිය සම්පූර්ණයෙන් පිරිසිදු නැත. (වරෙක

ආනෙඤ්ජ සමාධිය ද, වරෙක සාමාන්‍ය සිත ද යන ලෙසට මිශ්‍ර වී පවතින බැවින් ඇතුන්ගේ ශබ්ද ඇසුනේ යැයි කියනු ලැබේ.)

මහා මොග්ගල්ලාන මහාථෙර පැවිදිවී සත් දිනක් ඇතුළත මහරහත් බවට පත්විය. එතැන් පටන් සමාපත්තිය වසීභාව පහ වශයෙන් ප්‍රගුණ නොකර චතුත්ථ ධ්‍යානයට සමවැදී එයින් නැගිටින අවස්ථාවල ඇතුන්ගේ ශබ්ද ඇසූ සේක. මෙලෙස ධ්‍යානයෙන් නැගී අවස්ථාවේ ම අසනලදී. සමාපත්තියට සමවැදී සිටින විට අසන ලදැයි සිතාගත් බව විනය අට්ඨ කථාහී දක්වා ඇත. මෙහිලා චතුත්ථ ධ්‍යානයැයි සාමාන්‍ය ලෙස සළකා ගත්තත් රහත් බවට පත්වූ තැන් පටන් සමවැදුනු ධ්‍යානයන් රහත් බවට පත්වූ තැන් පටන් සමවැදුනු ධ්‍යානයන් වන බැවින් අරහත්ත ඵල චතුත්ථ ධ්‍යානයම ගැනීම වටී

## විශේෂ උධෘතයක්

දක්වන ලද පාළි අට්ඨ කථා සම්බන්ධ කථාවල "ධ්‍යානයෙන් නැගී විට ඇතුන්ගේ ශබ්දය අසන ලදී. මෙලෙස ඇසීම ම සමාපත්තියට සම වැදී සිටින විට අසන ලදැයි සිතාගන්නා ලදී" යන කථාවෙන් සමාපත්තියෙන් නැගිවිට ප්‍රථමයෙන් ප්‍රත්‍යවේක්ෂා නොකර අනෙකුත් දැනීම්, සිත යෙදීම් සිදුවිය හැක්කේයැයි දතයුතු. ආර්ය පුද්ගලයෙකු පාසා තම තමාගේ ආර්යය තත්ත්වය වශයෙන් සම වුවත් කැමති කැමති ක්ෂණයක ඵලයට සමවැදිය හැකි නොහැකි බව වශයෙන් වෙනස් වන බව පහත සඳහන් ම. නි. උපරි පණ්ණාස අට්ඨ කථාවෙන් දත හැක්කේය.

## සතත විහාරි නො සතත විහාරි

**දෙ හි ඛීණාසවා සතතවිහාරී, නො සතතවිහාරී ච, තත්ථ සතත විහාරි යං කිඤ්චි කම්මං කත්වාපි ඵල සමාපත්තිං සමාපජ්ජිතුං සක්කොති නො සතත විහාරි පන අප්පමත්තකෙපි කිච්චෙ කිච්චප්පසුතො හුත්වා ඵල සමාපත්තිං අප්පෙතුං න සක්කොති** [ම. අ. 4/48]

ඛීණාසවා = ක්ෂීණාස්‍රවයන් (රහතන්) වහන්සේ

සතතවිහාරි = සතතයෙන් (අඛණ්ඩව) සමථ විපස්සනා අනුව නිතිපතා කටයුතු කරන සතතවිහාරී පුද්ගලයා ද

නොසතතවිහාරි ච = අඛණ්ඩව සමථ විපසසනා භාවනා කටයුතු නොකරන නොසතත විහාරී පුද්ගලයා ද

ඉති = මෙලෙස

ද්වෙ = දෙවර්ගයකි

තත්‍ර = එම දෙවර්ගය තුළින්

සතත විහාරී = භාවනාව සතතයෙන් (අඛණ්ඩව) වඩන භික්ෂුව

යං කිඤ්චි කම්මං

කත්වාපි = යම්කිසි කටයුත්තක් නිමකොට ද

ඵල සමාපත්තිං

සමාපජ්ජිතුං

සක්කොති = ඵල සමාපත්තියට සමවැදීමට සමත් වේ.

(කත්වාපි යන තැන 'අපි' ශබ්දය සම්භාවනා ජෝතකයයි. ලොකු - කුඩා කෘත්‍යයක් සිත යොදා කිරීමෙන් පසුද සමාපත්තියට සමවැදිය හැක්කේය. කිසිම කටයුත්තක් නොකර විවේකීව ශාන්තව සිට සමවැදිය හැකි වීම ගැන අමුතුවෙන් කිව යුත්තක් නැත.)

නො සතත විහාරී පන= භාවනාව සතතයෙන් නොකරන රහතන් වහන්සේ

අප්පමත්තකෙපි

කිච්චෙ = අල්පමාත්‍ර කෘත්‍යයක් ද

කිච්චපසුතො හුත්වා = සිද්ධකොට, උත්සාහ කොට

වා = සිදු කළ ද, උත්සාහ කළ ද

ඵල සමාපත්තිං

අප්පෙතුං = ඵල සමාපත්තියට පත් වීමට

න සක්කොති = සමත් නොවේ

මෙහි 'අපි' ශබ්දය ගරහ ජෝතකයැ. නොකිවයුතු තරම් කුඩා කෘත්‍යයක් වුව කළ කල්හී ද ඵලයට පත්වීමට නොහැක්කේය. බරපතල කෘත්‍යයක් සිදුකොට සමවැදීමට නොහැකිවීම ගැන කිවයුත්තක් නැත.

මේ අට්ඨ කථාවෙහි ම සාධක වස්තු වදන් මෙසේ දක්වයි. ශිෂ්‍ය සාමණේර සමඟ ආරණ්‍යවාසීව ගත කරන මහා ථෙර නමක් සිටිසේක. මහා ථෙර සඳහා විසීමට තැනක් විය. සාමණෙර නමට සුදුසු තැනක් නොවියැ. මහා ථෙර තැන කුඩා සාමණෙර නමට තැනක් නැති කම ගැන කල්පනා කරමින් සිටි නිසා එම වස් කාලය තුළ වරක්වත් ඵලයට සමවැදිය නොහැකිවිය. ශිෂ්‍ය සාමණේර නම වනාහී වස් තුන් මාසය පුරාම ඵල සමාපත්තියට සමවැදී සිටිමින් සතුටින් ගත කළේය. වස් පවාරණයේදී සාමණේර නම "ස්වාමීන් වහන්ස, ආරණ්‍ය වාසය සුව පහසු වී ද"යි ප්‍රශ්න කළවිට මහා ථෙර නම "මට නම් සුව පහසු නොවී යැ"යි ප්‍රකාශ කළ සේක. මේ කථාවේ වන සාමණේර නම සතත විහාරී රහතන් වහන්සේ නමකි. එම නිසා විසීමට තැනක් නැති නමුත් සිත්වූ පරිදි ඵල සමාපත්තියට සමවැදී සිටිය හැකි විය. මහා ථෙර වනාහී නො සතත විහාරී රහත් නමක් විය. එමනිසා තම ශිෂ්‍යයාට තැනක් නැතිවීම ගැන කල්පනා කරමින්, සිතින් ව්‍යාපාර කරමින් සිටි බැවින් සමාපත්තියට සමවැදිය නොහැකි විය. ඒ නිසා ඵල සමාපත්තිය තමා කැමති පරිදි සමවැදිය හැකි රහතන් වහන්සේ නමක් වීමට සතත විහාරි පුද්ගලයකු වීමට විපස්සනා භාවනාව අඛණ්ඩව උත්සාහ කරමින් සිටිය යුතු.

*ඵල සමාපත්තියට සමවදින ආකාරය නිමියේ යැ.*

# නිබ්බාන කථා*

දැන් මාර්ග ඵලයන්ට අරමුණු වන නිවන ගැන විස්තර දක්වන්නෙමු. නිවන යන්න විශාල ප්‍රාසාදයක් නොවේ. විශාල නගරයක් ප්‍රදේශයක් ද නොවේ. ආලෝකයක්, වර්ණයක් ද නොවේ. ඔපයක් ප්‍රසාදයක් ද නොවේ. සිසිල් බවකුත් නොවේ. මක්නිසාද යත් එම විශාල ප්‍රාසාද, මාළිගා, විමානයන්, නගර, ප්‍රදේශ, ආලොක, වර්ණ ඔපයන්, සිසිල් බවක් යන මේවා අසංඛත පරමාර්ථ ධර්ම නොවේ. ඒ ඒ ආකාරයන්ට ප්‍රඥප්ති ධර්ම අනුව සංඛත පරමාර්ථ ධර්මයන් පමණක් ම වන්නේය. ඇත්ත වශයෙන් වනාහි අසංඛත පරමාර්ථ ධර්මයක් වන නිවන සන්ති ලක්ඛණා යැයි කියනු ලබන "කෙළෙස් වට්ට දුක් වලින් මිදීම - දුරුවීම" ස්වභාවයයි. විසංඛාර යැයි කියනු ලබන ලෙසට නොසිඳ ඇතිවෙමින් නැතිවෙමින් පවතින රූප - නාම සංස්කාරයන්ගේ සම්පූර්ණ දුරුවීමයි, මිදීමයි. සංස්කාරයන්ගෙන් දුරුවී සංස්කාරයන්ට ප්‍රතිවිරුද්ධ වන්නා වූ නිවන සංස්කාරයන්ගේ නම්වලට ප්‍රතිවිරුද්ධ ස්වභාවයෙන් විවරණය කරයි. පහත දක්වෙන්නේ එවන් වූ පටිසම්භිදා මග්ග පාළියයි.

---

* සැ. යු. නිර්වාන යන පදයන්ගෙන් සැදුනු නිබ්බාන යන පදය - ර් නිසා ණ වර්ණයට මාරුකොට ලිවීම සුදුසුය. නමුදු ත්‍රිපිටක පාළි බොහෝමයක යෙදී ඇති ලෙසටම 'ණ' වර්ණයට මාරු නොකර ප්‍රකෘති ලෙසටම මෙහි දක්වා ඇත.

උප්පාදො සංඛාරා අනුප්පාදො නිබ්බානං
පවත්තං සංඛාරා අප්පවත්තං නිබ්බානං
නිමිත්තං සංඛාරා අනිමිත්තං නිබ්බානං
ආයූහනා සංඛාරා අනායූහනා නිබ්බානං
පටිසන්ධි සංඛාරා අප්පටිසන්ධි නිබ්බානං

| | | |
|---|---|---|
| උප්පාදො | = | ඉපැදීම ඇති ධර්මය |
| සංඛාරා | = | සංස්කාර ධර්මයෝ ය |
| අනුප්පාදො | = | ඉපැදීම නිම වූ ධර්මය |
| නිබ්බානං | = | නිවන යැ |
| පවත්තං | = | නොසිඳ පවත්නා රූප - නාම සන්තති ය |
| සංඛාරා | = | සංස්කාර ධර්මයෝ ය |
| අප්පවත්තං | = | නොසිඳ පවත්නා රූප - නාම සන්තතියක් නොමැති තැන |
| නිබ්බානං | = | නිවන යැ. |
| නිමිත්තං | = | සණ්ඨානයක් - සටහනක්, දේහයක් ඇත්තාක් සේ පැනෙන ධර්මය |
| සංඛාරා | = | සංස්කාර ධර්මයෝ ය |
| අනිමිත්තං | = | සටහනක් - දේහයක් ඇත්තාක් සේ නොපැනෙන ධර්මය |
| නිබ්බානං | = | නිවන යැ |
| ආයූහනා | = | අභිවෘද්ධිය සුභ සිද්ධිය පිණිස උත්සුකවීම |
| සංඛාරා | = | සංස්කාර ධර්මයෝ ය |
| අනායූහනා | = | උත්සුකවීමෙන් තොර ධර්මය |
| නිබ්බානං | = | නිවන යැ |
| පටිසන්ධි | = | පෙර භවය, පෙර සිත හා බැඳී පහළවීම |

සංඛාර = සංස්කාර ධර්මයෝ ය
අසාපටිසන්ධි = බැඳී පහළ වීමෙන් තොර ධර්මය
නිබ්බානං = නිවන යැ.

මේ පාළිය මගින් "ප්‍රථමයෙන් පහළවීම, නොසිඳ පහළවීම, සටහනක් - දේහයක්, ඇත්තාක් සේ ප්‍රකටවීම, ව්‍යාපාර කිරීම, පෙර සිත හා බැඳී පහළ වීම" ඇති රූප-නාම සංස්කාරයන්ගේ ඒකාන්ත දුරුවීම නිවන යැයි දක්වයි. එබැවින් "**නිබ්බන්ති ධීරා, නිබ්බාපෙන්ති රාගග්ගිං, පරිනිබ්බායති, පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බායෙය්‍ය, පරිනිබ්බායී, පරිනිබ්බායිස්සති, අන්තරා පරිනිබ්බායී, පරිනිබ්බුතො, ඛන්ධපරිනිබ්බානං**" මේ තාක්, මේ ආකාර පාළි අට්ඨකථා වල ප්‍රකට ධාතු සිද්ධ පද ගෙන හැර දක්වා **නිබ්බාන** පදයේ වචනාර්ථය පහත සඳහන් ලෙසටද දක්විය හැක්කේය.

**නිබ්බාති වට්ට දුක්ඛං එත්ථාති නිබ්බානං, නිබ්බාති වට්ටදුක්ඛං එත්ථාති එතස්මිං අධිගතෙ ති වා නිබ්බානං නිබ්බායතෙ වා නිබ්බානං.**

**එත්ථ** = මේ අසංඛත ධාතු ස්වභාවයෙන්
**වට්ටදුක්ඛං** = වට්ට තුන නම් වූ දුක
**නිබ්බාති** = නිවේ
**ඉති** = මෙලෙස වට්ට දුක් නිවීමේ ශක්තිය ඇති නිසා
**තං** = එම අසංඛත ධාතු සභාවය
**නිබ්බානං** = නිවන නම් වේ.
(වට්ට දුක නිවීම යැයි අදහස් කෙරේ.)
**වා** = වෙනත් ආකාරයකට වනාහී
**එතස්මිං** = මේ අසංඛත ධාතු සභාවය
**අධිගතෙ** = මාර්ග ඥාණයෙන් අවබෝධ කළ කල්හි
**වට්ට දුක්ඛං** = වට්ට දුක
**නිබ්බාති** = නිවෙයි
**ඉති** = මෙලෙස වට්ට දුක නිවීමේ ශක්ති ඇති නිසා

| | | |
|---|---|---|
| **තං** | = | එම අසංඛත ධාතු සවභාවය |
| **නිබ්බානං** | = | නිවන නම් වේ. |

(වට්ට දුක නිවීමේ ධර්මය යැයි අදහස් කෙරේ)

| | | |
|---|---|---|
| **වා** | = | වෙනත් ආකාරයකට වනාහි |
| **නිබ්බායතෙ** | = | නිවීම |
| **නිබ්බානං** | = | නිවීම ස්වභාවය, රූප-නාම සංඛාර නම් වූ වට්ට දුක් වලින් ඒකාන්තයෙන් නැවත නොඑන ලෙසට නිවීම, දුරුවීම ස්වභාවය යැයි කියනු ලැබේ. |

රූප - නාම සංඛාර සංඛ්‍යාත ඇතිකාක් වට්ට දුක් වල නිවීම, නිවීමට හේතු, නිවීම ස්වභාවය, යැයි කිව යුතු එම නිවන **'අතක්කාවචරො'**යි කියන ලෙසට කල්පනා කොට සළකා බැලීම් මාත්‍රයෙන් දතහැකි අභාව ප්‍රඥප්තියක් නොවේ. **ගම්භිරො දුද්දසො** - යන ආකාරයට දක්වන ලෙසට ගැඹුරු බවින් ඉතා ගැඹුරුය. ප්‍රකෘති ඥාණයෙන් වටහා ගැනීම අතින් ද දුෂ්කර වේ. **"පණ්ඩිත වෙදනීයො ති සම්මාපටිපදං පටිපන්නෙහි පණ්ඩිතෙහි වෙදිතබ්බො"** විපස්සනා ප්‍රතිපදාව පිළිපැද මඟ-ඵල ඥාණ සමන්නාගත ප්‍රඥාවන්තයන්ටම ඇස් පනාපිට දැක දැනගත හැකි අසංඛත පරමාර්ථ ධර්මය වේ. තණ්හාවේ අරමුණ නොවේ. එබැවින් එම නිවන 'වාන' නම් වූ තණ්හාවෙන් ද මිදේ. තණ්හා නොමැති වූ, දුරුවූ බව වේ. එම නිවන මාර්ග ඥාණයෙන් අවබෝධ කළේ නම් අවබෝධ කළ තැනැත්තාගේ සන්තානයේ තණ්හාව දුරුවේ. තොරවේ. එබැවින් **"වානං වුච්චති තණ්හා යො - රොගො - පෙ - ලොභො අකුසල මූලං වානප්පහානං වාන වූපසමං වාන පටිනිස්සංගං වානපටිප්පස්සද්ධං අමතං නිබ්බානං** යන මූල නිද්දෙස පාළි **තණ්හාය විප්පහානෙන නිබ්බානං ඉති වුච්චති"** යන සූත්‍රාන්ත පාළි ආදියද ඇසුරු කොට නිබ්බාන පදයේ වචනාර්ථය අටුවා කථාවල පහත දැක්වෙන ලෙසට ද දක්වත්.

වානතො නික්ඛන්තං නිබ්බානං, නත්ථි වානං එත්ථාති වා නිබ්බානං, නත්ථි වානං එතස්මිං අධිගතෙති වා නිබ්බානං

| | | |
|---|---|---|
| වානතො | = | ඒ ඒ භවයෙන් වෙනත් භවයකට ඵලය හා කර්මය සම්බන්ධ කොට දියහැකි තණ්හාවෙන් |
| නික්ඛන්තං | = | නික්මුනේය |
| නිබ්බානං | = | තණ්හාවෙන් නික්මුනු ධර්මය |
| වා | = | වෙනත් ලෙසකින් වනාහි |
| එත්ථ | = | මෙම අසංඛත ධර්ම ස්වභාවයෙහි |
| වානං | = | තණ්හාව |
| නත්ථි | = | නොමැත්තේය |
| ඉති | = | එබැවින් |
| නිබ්බානං | = | නිවන නම් වේ. |

තණ්හාව නොමැති, තණ්හාව දුරුවූ ධර්මය යැයි කියනු ලැබේ.

| | | |
|---|---|---|
| වා | = | වෙනත් ලෙසකට ද වනාහි |
| එතස්මිං | = | මේ අසංඛත ධාතු ස්වභාවය |
| අධිගතෙ | = | මාර්ග ඥාණයෙන් අවබෝධ කළ කල්හි |
| වානං | = | තණ්හාව |
| නත්ථි | = | නොමැත |
| වා | = | පහළ නොවේ. |
| ඉති | = | එබැවින් |
| නිබ්බානං | = | නිවන නම් වේ. |

තණ්හාව නොමැති, තෘෂ්ණාවෙන් තොර ධර්මය යැයි කියනු ලැබේ.

මූල ධර්ම වශයෙන් රූප-නාම නම් වූ ඇතිතාක් සංස්කාර වට්ට දුක් වලින් තොර, එයින් සංසිඳුනු ධර්මය යන නම ලබයි.

රූප-නාම සංස්කාර සහිත ඇතිතාක් වටට දුක් වල සංසිඳීම, දුරුවීම වන්නා වූ එම නිවන, අනිමිත්ත පච්චුපට්ඨානං යන්නට අනුව නිමිත්තක් සටහනක්, ද්‍රව්‍යයක්, දේහයක් වශයෙන් තොර බැවින්ම ආර්යයන් වහන්සේලාගේ ඤාණයෙහිම පහළවේ. එබැවින් නිවන අවබෝධ කළ උතුමකුට වේවා එම නිවන කුමන වර්ණයක් - සටහනක් ඇත්තේදැයි ද "කුමන වස්තුවක් හා සම දැයි" ද, ප්‍රකාශ කළ නොහැක්කේය. අතරක් නොතබා ඇතිවෙමින්, නැතිවෙමින් පෙරළෙමින් පවතින්නා වූ රූප - නාම සංස්කාරයන්හී ඉතිරියක් නොතබා දුරුවූ බව පමණක් වටහා ගනී. කීමටද කිව හැක. එම නිසා මිලින්ද පඤ්හ හි මෙලෙස දක්වා ඇත.

**අප්පටිභාගං මහාරාජ නිබ්බානං න සක්කා නිබ්බානස්ස රූපං වා සණ්ඨානං වා වයං වා පමාණං ව, ඔපම්මෙන වා කාරණෙන වා හෙතුනාවා නයෙන වා උපදස්සයිතුං** [මි. ප. 275]

| | | |
|---|---|---|
| **මහා රාජ** | = | මිලිඳු මහා රජ |
| **නිබ්බානං** | = | නිවනට |
| **අප්පටිභාගං** | = | සමාන වූ රූපකයක් නොමැත්තේය. |
| **නිබ්බානස්ස** | = | නිවනට |
| **රූපං වා** | = | වර්ණයක් හෝ රූප |
| **සණ්ඨානං වා** | = | රූපසටහනක් හෝ |
| **වයං වා** | = | වයස් ප්‍රමාණයක් හෝ |
| **පමාණං වා** | = | ප්‍රමාණයක් හෝ |
| **ඔපම්මෙනවා** | = | උපමා ලෙසකින් හෝ |
| **කාරණෙන වා** | = | උපස්ථම්භක හේතු වශයෙන් හෝ |
| **හෙතුනා වා** | = | ජනක හේතු වශයෙන් හෝ |
| **නයෙන වා** | = | දැන ගැනීමෙ නය ක්‍රමය වශයෙන් හෝ |
| **උපදස්සයිතුං** | = | ප්‍රකට කොට පෙන්වීමට |
| **න සක්කා** | = | නොහැකි වන්නේය |

## නිවන හා අභාව ප්‍රඥප්ති සම නොවන බව

සංස්කාරයන්ගේ නිවීම, දුරුවීම, පහළ නොවීම අභාව ස්වභාවය නිවන යැයිද, එම නිවනෙහි වර්ණ -රූප සටහන් - වයස්-ප්‍රමාණ නොමැති යැයිද, එම "නිවන උපමා මාර්ගයෙන් ප්‍රකට කොට දක්විය නොහැකි යැයිද කියන බැවින් නිවන යන්න මොන ලෙසකින් හෝ නොමැති දෙයකැයි" කියන අභාව ප්‍රඥප්ති හා සම යැයි සිතත්. නමුදු නිවන යන්න" මොන ලෙසකින් හෝ නොමැති" බවක් වනාහි නොමැත්තේය. සංස්කාරයන්ගේ නිවීම, දුරුවීම, පහළ නොවීම, අභාව ස්වභාවය වශයෙන් ප්‍රකට වන්නේමය. ප්‍රකට ලෙසට ඇති නිසාම එම සංස්කාර නිවෙන ස්වභාවය ඇස්පනා පිට දක මාර්ග ධර්ම - ඵල ධර්ම පහළ විය හැක්කේය. රහතන් වහන්සේගේ සුද්ධ රූප-නාම සන්තතියක් පරිනිබ්බාන චුති කාලයට පසු ඒකාන්තයෙන් පහළ වීමකින් තොරව විනාශ වී නිවී යන්නේය.

පහත දක්වෙන්නේ පරමත්ථ = ඇස්පනාපිට දැනීම් වශයෙන් නිර්වාණය ප්‍රකට ලෙසම ඇති බවට පැහැදිලිව ප්‍රකාශ කරන උදාන ඉති වුත්තක පාළියයි.

**අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං, නො චෙ තං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසංඛතං, නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ යස්මාච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසංඛතං තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායති** [උ. පා. 292 -ඉ. වු. 366]

| | | |
|---|---|---|
| **භික්ඛවෙ** | = | මහණෙනි, |
| **අජාතං** | = | නොඋපදින සුළු නිවන |
| **වා** | = | ඉපදීම දුරුකළ නිවන |
| **අභූතං** | = | ප්‍රකටව නොපැනෙන නිවන |
| **අකතං** | = | දෙයක් සිදු නොකරන නිවන |
| **අසංඛතං** | = | හේතු බොහෝමයක් සම්පාත වී පහළ කළ නොහැකි වූ නිවන |

| | | |
|---|---|---|
| අත්ථි | = | ඇත්තේය. |
| භික්ඛවෙ | = | මහණෙනි |
| අජාතං | = | නො උපන් |
| අභූතං | = | ප්‍රකට නැති |
| අකතං | = | හේතුවකින් නොකරන ලද |
| අසංඛතං | = | හේතු රාශියක් සමාහිත වී පහළ වූවක් නොවන |
| එතං | = | මේ නිවන් ධර්මය |
| නොචෙ අභිවිස්ස | = | ඉදින් නොවන්නේ නම් |
| එවං සති | = | එසේ වන කල්හි |
| ඉධ | = | මේ ලෝකයෙහි |
| ජාතස්ස | = | උපන් |
| භූතස්ස | = | ප්‍රකටව ඇති |
| කතස්ස | = | හේතු ධර්මයකින් කර දෙන පහළ කරවන |
| සංඛතස්ස | = | හේතු ධර්ම රාශියන්ගේ සමවායෙන් පහළ වන පඤ්චස්කන්ධ රූප-නාම ධර්මයන්හි |
| නිස්සරණං | = | නොමැති බව, දුරුවීම නම් වන නික්මීම |
| න පඤ්ඤායෙථ | = | පැනවිය නොහැක |
| වා | = | දැනගත නොහැක |

(අප්පවත්ති අපගමො නිස්සරණං අට්ඨකථා)

| | | |
|---|---|---|
| භික්ඛවෙ | = | මහණෙනි |
| අජාතං | = | නොඋපන් |
| අභූතං | = | ප්‍රකටව නොපැනෙන |
| අකතං | = | නොකරන ලද |

| | | |
|---|---|---|
| නිබ්බානං අසංඛතං | = | නිවන් ධර්මය හේතු රාශියක සමවායෙන් නොනිපන් |
| ඛො | = | ඇත්තටම |
| යස්මා | = | යම් හෙයකින් |
| අත්ථි | = | පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තේමද. |
| තස්මා | = | එහෙයිනි |
| නිබ්බාන | = | නිර්වාණ ධර්මය පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති නිසා |
| ජාතස්ස | = | පහළ වූ |
| භූතස්ස | = | ප්‍රකටව ඇති |
| කතස්ස | = | හේතු ධර්මයකින් කරන ලද |
| සංඛතස්ස | = | හේතු රාශියකගේ සමවායෙන් පහළ වූ පඤ්චස්කන්ධ රූප-නාම ධර්මයන්ගේ |
| නිස්සරණං | = | පහළ නොවීම, දුරුවීම, නික්මීම නිමවීම |
| වා | = | යන්න වනාහි |
| පඤ්ඤායති | = | පැනේ |
| වා | = | දත හැක්කේය. |

## අර්ථය වනාහි

රූප-නාම සංස්කාරයන්ගේ පහළ නොවී නිවීයෑම නම් වන නිර්වාණ ධර්මය, රූප - නාම ධර්ම ලෙස පහළ වීම් නොමැති නිසා, අජාත අභූත නම් වේ. හේතු ධර්මයන්ගෙන් පැන නොනැගින බැවින් අකත නම් වේ. හේතු ධර්ම රාශියක සමවායෙන් පහළ කරන ධර්මයක් නොවන බැවින් අසංඛත නම් වේ. එම නිබ්බානය නම්වන නිවීම නොමැත්තේ නම් අතරක් නොතබා ඇතිවෙමින්-නැතිවෙමින් යන රූප-නාම

ස්කන්ධයන් සන්තතිය සිඳලීමක් තිබිය නොහැක්කේය. නමුදු එම නිවන් ධර්මය අභාව ප්‍රඥප්ති ලෙස නොමැති දෙයක් නොවේ. මාර්ග ඵලයන්ට ඇස් පනාපිටම පවතින අරමුණ වශයෙන් පරමාර්ථ ලෙස ප්‍රකටව ඇත්තේම ය. ප්‍රකට ලෙසම ඇති නිසාම නියම ක්‍රමය අනුව හික්මෙන්නාගේ සන්තානයෙහි අකොරක් නැතිව පැන නගින රූප - නාම ස්කන්ධ සන්තතිය පරිනිබ්බාන චුතියට පසු කාලයෙහි නැවත පහළ නොවී සදහට ම නිවී යා හැක්කේය. මෙලෙස නිවීමක් ප්‍රකට ලෙසට පැවතිය හැක්කේ යැයි යන්න අදහසයි. ඥාණයෙන් විනිවිද දැක ගනිත්වා.

**අත්ථි භික්ඛවෙ තදායතනං යත්ථ නෙව පඨවි න ආපො, න තෙජො න වායො න ආකාසානඤ්චායතනං න විඤ්ඤාණඤ්චායතනං න ආකිඤ්චඤ්ඤායතනං න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නායං ලොකො න පරලොකො උභො චන්දිම සූරියා තත්‍රාපහං භික්ඛවෙ නෙව ආගතිං වදාමි නගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණ මෙවෙතං, එසොවන්තො දුක්ඛස්ස.**

[උ. පා. 290]

| | | |
|---|---|---|
| **භික්ඛවෙ** | = | මහණෙනි |
| **තං ආයතනං** | = | එම නිර්වානය නම් වූ ආයතනයක් |
| **අත්ථි** | = | පරමාර්ථ ඇත්තේය. |
| **යත්ථ** | = | එම නිවන නම් වන එහි |
| **නෙව පඨවි** | = | පඨවි ධාතුවද නැත |
| **න ආපො** | = | ආපො ධාතුවද නැත |
| **න තෙජො** | = | තෙජො ධාතුවද නැත |
| **න වායො** | = | වායො ධාතුවද නැත |

(ධාතු සතර නොමැති බව දැක්වීමෙන් ධාතු සතර ආශ්‍රයකරන උපාදාය රූපය නොමැති බවද රූප ඇසුරු කොට පහළ වන කාම රූප භවයන්ට අදාල නාම ධර්මයන්ද නොමැති බව දක්වයි)

න ආකාසානඤ්චායතනං = ආකාසානඤ්චායතන ධර්මයද නැත.
න විඤ්ඤානඤ්චායතනං = විඤ්ඤානඤ්චයායතන ධර්මයද නැත.
න ආකිඤ්චඤ්ඤායතනං = ආකිඤ්චඤ්ඤායතන ධර්මයද නැත.
න නෙවසඤ්ඤා
නා සඤ්ඤායතනං = නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධර්මයද නැත.

(අරූප භවය හා සම්බන්ධ ආරම්මණ ආරම්මණික සියල්ලම නැතැයි මෙයින් කියැවේ)

න අයං ලොකො = මේ වර්තමාන ලොකයද නැත
න පරලොකො = පරලෝකයද නැත

(මේලොව - පරලොව සම්බන්ධ ධර්ම සියල්ලේම නැති බව කියැවේ) එම නිසාම නිවන අරමුණු කරන මාර්ග-ඵල පහළ වන අවස්ථාවේ මේ ලොව පරලොව සම්බන්ධ සියලු අරමුණු නොදැනීම ම ඇත්තේයැ)

න උභො චන්දිම සූරියා = ඉර සඳ දෙකමද නැති බව

(රූප නැති නිසා අඳුරද නැත. එබැවින් අඳුර දුරු කිරීමට ආලෝකය අවශ්‍ය නැත. එබැවින් සඳ හා ඉර ආදී ග්‍රහ නැකත් තරුද නැතැයි දක්වයි. වෙනත් සූත්‍ර වල "තමො තත්ථ න විජ්ජති" යැයි අඳුර නැති බව කෙළින්ම දේශනා කොට ඇත්තේය.

භික්ඛවෙ = මහණෙනි

තත්‍රාපි = එම නිවන නම්වන අරමුණ කෙරෙහිද
ආගතිං = පැමිණීමක්
අහං = මම
නෙව වදාමි = නො වදාරන්නෙමි
චුතිං = චුත වීමක්
න වදාමි = නොවදාරන්නෙමි

උපපත්තිං = ලගාවී පහළ වීමක් ද

න වදාමි = නො වදාරන්නෙමි

(මනුෂ්‍ය භවයෙහි දේව භවයට වෙනත් භවයකින් පැමිණීමක් ඇත්තා සේ නිවනට පැමිණීමක් නැත.) එම නිවනින් වෙනත් තැනකට මාරුවී යෑමක් ද නැත. මනුෂ්‍ය, දේව භවයන් මෙන් එම නිවනෙහි පුද්ගල සත්තයන්ගේ පැවැත්මක් ද නැත. චුතියක්, මරණයක් ද නැත. අලුතින් පහළ වීමක් නැත මාර්ග ඵල ප්‍රත්‍යවේක්‍ෂා ඥාණ මගින් දැන ගැනීම අරමුණු කිරීම පමණක් ඇත්තේ යැයි කියනු ලැබේ.

එතං = එම නිබ්බාන නම් වන අරමුණ නිසා

අප්පතිට්ඨං එව = තහවුරුවක් පදනමක් නැත්තේමය

රූප ධර්ම නොවන බැවින් කිසියම් තැනක තහවුරුව පවතිනවා නොවේ. කිසියම් ධර්මයක් මත හෝ ඇසුර ලබා පවතිනවා නොවේ. නාම ධර්මයක්ම වන්නේ නමුදු ඵල ප්‍රත්‍යුත්පන්න ධර්මයක් නොවන බැවින් කිසිම හේතු ධර්මයක් හෝ පිහිට කොට නැතැයි කියනු ලැබේ.

අප්පවත්තං එව = අතරක් නොතබා පවතිනවාද නොවේ.

ඩා = අතරක් නොතබා ගලන රූප-නාම සන්තතිය හා ප්‍රතිපක්‍ෂ වන්නාවූ ස්වභාවයම වන්නේය.

අනාරම්මණං මෙව = නාම ධර්මවන නමුදු චිත්ත චෛතසික වැනි අරමුණු කළ හැකි ස්වභාවයක් නොවේ.

එසො එව = මාර්ග ඵලයන්ගේ අරමුණ වන මේ නිවුන ශාන්ත බවම

තදධිගමෙ සති

සබ්බදුක්ඛාභාවතො = එම නිවන දැන ගත්තේ නම් සියලු දුක් නොමැති බැවින් (අට්ඨ කථා හේතු දක්වන පද)

දුක්ඛස්ස = රූප නාම සංස්කාර යන වටට දුකෙහි

අන්තො = අන්තය වේ.

## සංඛාර හා නිබ්බාන එකිනෙකට ප්‍රතිපක්ෂ වන හැටි

**යස්මා නිබ්බානං සබ්බ සංඛාර විධුර සභාවං, තස්මා "යථා සංඛත ධම්මෙසු කස්සචි නත්ථි" තථා තත්‍රාපි සබ්බෙ සංඛත ධම්මා, නහි සංඛතාසංඛත ධම්මානං සමොධානං සම්භවති** [උ. අ. 259]

**නිබ්බානං** = සංස්කාර සමථය වන නිවන

**යස්මා** = කුමක් නිසා

**සබ්බ සංඛාර විධුර**

**සභාවං** = ගින්න හා ජලය, උණුසුම හා සිසිලස, අඳුර හා එළිය මෙන් සියලු ආකාරයෙන් එකිනෙකට ප්‍රතිපක්ෂ බවක් ඇත්තේද?

**තස්මා** = එබැවින්

**සංඛත ධම්මෙසු** = සංඛත ධර්ම කෙරෙහි

**කස්සචි** = කිසියම්

**නිබ්බානං** = සංස්කාර නිවීම නම් වූ නිවන

**නත්ථි යථා** = නොමැතිවන්නා සේ

**තත්‍රාපි** = එම සංස්කාර සංසිඳීම නම් වූ නිවනෙහි ද

**සබ්බෙ සංඛත ධම්මා** = සියලු සංඛත ධර්මයෙන් (කිසිත්)

**තථා** = එසේම නොමැත්තේය.

**හි** = ඇත්තය

**සංඛතාසංඛත**

**ධම්මානං සමොධා නං** = සංඛත ධර්ම හා අසංඛත ධර්ම යන මේ වායේ සමොධානය (එකිනෙකට ඇතුලත් වීම)

**න සම්භවති** = සිදුවිය නොහැක.

මෙම උදාන අට්ඨ කථාවට අනුව නොසිඳ පහළ වෙමින් පවතින්නා වූ සංඛාර ධර්ම තවම ඉතිරිව ඇත්තේ නම් සංස්කාර නිවීම නම් වන නිවනට පත් උනා නොවන්නේය. නිවන දැන ගනිමින් සිටින විට සංස්කාර ධර්ම එකක්වත් ප්‍රකට නැත. පරිනිබ්බානයට පත්වන අවස්ථාවෙහි සංස්කාර ධර්ම කිසිවක් පහළ නොවේ යැයි, නොමැත්තේ යැයි දත යුතු.

සංඛාර සියල්ල සංසිඳී සංස්කාර නිවීම පමණක් පහළ වන එම නිවන මාර්ග ඥාණය මඟින් දුන ගත්තේ නම් එසේ දූනගත්තහුගේ සන්තානයෙහි අපාය ගාමිනීය තණ්හා, ඖළාරික කාම තණ්හා, සුඛුම තණ්හා, රූප-අරූප තණ්හා යන මේවා පහළ විය නොහැක්කේය. ඉතිරි නොමැතිව ක්‍ෂය විය. නිරොධ විය. එම තණ්හාවන් බැහැර කරලීය. නැවත පහළ විය නොහැකි ලෙස ඈතට බැහැර කිරීමද සිදුවේ. එම තණ්හා නම් වූ බන්ධනය ලිහා දැමීම ද සිදුවේ. එම තණ්හා නම් වූ දැඩිව ඇලීම දුරුවේ. එබැවින් මාර්ග සතරෙහි අරමුණ වන්නා වූ, එම සංස්කාරයන්ගේ නිවීම නම් වන නිවන තණ්හාවේ ක්‍ෂයවීම හෙවත් නිරොධය සිදුවේ. තණ්හාව බැහැරකිරීමද සිදුවේ. තණ්හාව ඉතා ඈතට දුරලීමද සිදුවේ. එම තණ්හා බන්ධනය ලිහියෑමද සිදුවේ. එම තණ්හා ඇලීම ද ක්‍ෂයවී යෑමද සිදුවේ. එබැවින් නිවන පහත දැක්වෙන ලෙසට ද දේශනා කරන ලදී.

**කතමඤ්ච භික්ඛවෙ දුක්ඛ නිරොධො අරිය සච්චං, යො තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛ නිරොධං අරිය සච්චං,**

| | | |
|---|---|---|
| **භික්ඛවෙ** | = | මහණෙනි |
| **දුක්ඛ නිරොධො** | = | දුකෙහි නිරොධය වන්නා වූ |
| **අරිය සච්චං** | = | ආර්යයන් වහන්සේලා දූනගන්නා සත්‍යය ධර්මය |
| **කතමඤ්ච** | = | කුමක්ද යත්. |
| **තස්සායෙව තණ්හාය** | = | පිය රූපි සාත රූපි වීමට සුදුසු එම තණ්හාවේම |
| **යො අසෙස විරාග නිරොධො** | = | යම් ඉතිරි නොකොට නොඇලීම නම් වූ නිරොධයක් වේද එම සවභාවය |
| **යො චාගො** | = | යම් ත්‍යාග ස්වභාවයක් |
| **යො පටිනිස්සග්ගො** | = | යම් ඒ ඈතට දුරු කිරිමක් |

| | | |
|---|---|---|
| යා මුත්ති | = | යම් ඒ මිදියෑමක් |
| යො අනාලයො | = | යම් ඒ ඇලීමක් නැති බවක් |
| අත්‍ථි | = | ඇත්තේය |
| භික්ඛවෙ | = | මහණෙනි |
| ඉදං | = | තණ්හාවේ ඉතිරි නොකොට ක්‍ෂයවීම, නිරෝධය, නොඇල්ම නම් වන මේ ස්වභාවය |
| දුක්ඛ නිරොධො අරිය සච්චං | = | දුක්ඛ නිරෝධ ආර්යය සත්‍යයයැයි |
| වුච්චති | = | කියනු ලැබේ.1* |

තවදුරටත් මාර්ග ඥාණ හතර මගින් නිවන දැනගනී නම් එම දැන ගන්නා අවස්ථාවේදී ද සංඛාර සියල්ල ක්‍ෂය වේ. නිවන නොදන්නා කල්හී පහළ වීමට සුදුසු කෙලෙස් කඳු ද එම එය දැනගත් තැන් පටන් පහළ විය නොහැකි වේ. නිරුද්ධ වේ. එබැවින් නිවන සියළු සංස්කාරයන්ගේ නිවීම ද වේ. ඛන්ධ, කිලෙස. අභිසංඛාර, කාම ගුණ යන උපධීන් ද බැහැර කිරිම ද වේ. තණ්හාවේ දුරුකිරීමද වේ. කෙලෙස් නම්වන බැඳීම ඇලීම නිරුද්ධ වේ. දුක් ඇතිතාක් ක්‍ෂයවීමද සිදුවේ. එම නිසා නිවන පහත දැක්වෙන ලෙසටද දේශනා කල සේක.

**ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බ සංඛාර සමථො. සබ්බුපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං**

| | | |
|---|---|---|
| සබ්බ සංඛාර සමථො | = | සියළු සංස්කාරයන්ගේ සමථය වන්නාවූ |
| සබ්බුපධි පටිනිස්සග්ගො | = | සියලු උපධීන් දුරුකිරීම වන්නාවූ |
| තණ්හක්ඛයො | = | තෘෂ්ණාව ක්‍ෂයවීම වන්නාවූ |

1* සතිපි ද්වින්නං පදානං සමානාධිකරණ භාවෙ ලිංගභෙදො ගහිතො, යථා දුක්ඛ සමුදයො අරිය සච්චන්ති ආදී නවඥාණ විවරණයේදී මේ මහාටීකා දැක්වීමට අනුව නියත පුල්ලිංග වන්නා වූ නිරොධ සද්දය සච්චං පදය අනුව යමින් නපුංසක ලිංග හා නොගැලපේ. පටිසම්භිදා අට්ඨකථා වනාහි ලිංග විපල්ලාස යැයි දක්වයි. නමුදු දුක්ඛ නිරොධගාමිනී පටිපදා අරිය සච්චං යන පාලියෙහි ලිංග විපල්ලාස නොමැති බැවින් මහාටීකා දැක්වීම වනාහි යුක්ත ව්‍යාකරණය වේ.

| | | |
|---|---|---|
| විරාගො | = | කෙලෙස් නම්වන දැඩිව ගැනීම දුරු වන්නාවූ |
| නිරොධො | = | සියලු දුකෙහි නිරුද්ධ වීම |
| යදිදං නිබ්බාන | = | වාන නම් වන තණ්හාවෙන් මිදෙන එම ස්වභාවය |
| වා | = | දුක් නිවෙන එම ස්වභාවය |
| අත්ථි | = | ඇත්තේය |
| ඉදම්පි ඛො ඨානං | = | මේ නිවන නම් වන ස්ථානයද |
| දුද්දසං | = | දැකීමට දුෂ්කරය |

## සඋපාදිසෙස හා අනුපාදිසෙස නිබ්බාන

මග්ග ඵලයන්හි අරමුණ වන්නාවූ එම නිවන රූප - නාම සංස්කාර වට්ට දුක් සියල්ලෙහි නිවීම නම් වන ලක්ෂණ ස්වභාව වශයෙන් එකක්ම වන්නේ නමුදු ස්කන්ධ ඉතිරිව ඇති බව නැති බව යන වෙනස්කම් ඇති බැවින් පරියාය වශයෙන් **සඋපාදිසෙස නිබ්බානය, අනුපාදිසෙස නිබ්බානය** යැයි දෙවිධියකට බෙදා දක්වයි. ඒ තුළින් පරිනිබ්බානයට පත්වීමට කලින් රහතන් වහන්සේගේ සන්තානයෙහි කෙලෙස් නැවත කැලම නොපහළ වන ලෙසට නිවී යෑම සඋපදිසෙස නිබ්බානය 1* නම් වේ. ස = සහිත වන්නාවූ, ඇතිව **උපාදි** = තණ්හා ආදීය වනාහි (අතීත කර්මවල) ඵල වශයෙන් පහළ වන ස්කන්ධ ඵල ස්කන්ධයන් සෙසා = සහිත වූ **නිබ්බාන** = නිවීම = **සඋපාදිසෙස නිබ්බාන** = ඵල ස්කන්ධයන් ඉතිරිව තිබියදීම කෙලෙස් නිවුන ස්වභාවය යැයි කියනු ලැබේ.

රහතන් වහන්සේට පරිනිබ්බාන චුතියට පසු කාලයෙහි රූප නාම සංස්කාරයන්ගේ පහළවීම සිදු නොවී කැලම නිවී යෑම අනුපාදිසෙස නිබ්බානය නම් වේ.

අන = නොමැති

1* තණ්හාදීහි ඵලභාවෙන උපාදියති උපාදි, ඛන්ධපඤ්චකං, උපාදියෙව සෙසෙති උපාදිසෙසො සහ උපාදිසෙ සනාති සඋපාදිසෙසා [ඉ. වු. අ. 131]

උපාධි = ඵල ස්කන්ධයන්
සෙස = ඉතිරිව
නිබ්බාන = නිවීම
අනුපාදිසෙස නිබ්බාන = පරිනිබ්බාන චුතියට පසු කාලයේ කෙළෙස් වලින් ඉතිරි වූ ඵල ස්කන්ධයන් හෝ නොමැතිව සංඛාරයන්ගේ කැලම නිවී යෑම ස්වභාවය යැයි කියනු ලැබේ.

කතමාච භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බාන ධාතු. ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතාව කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණ භව සංයොජනො සම්මදඤ්ඤා විමුත්තො. තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි, යෙසං අවිඝාතත්තා මනාපාමනාපං පච්චනුභොති සුඛ දුක්ඛං පටිසංවෙදෙති තස්සසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බාන ධාතු. කතමාච භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බාන ධාතු, ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති -පෙ- සම්මදඤ්ඤා විමුත්තො, තස්ස ඉධෙව භික්ඛවෙ සබ්බ වෙදයිතානි අනභිනන්දිතානි සීති භවිස්සති අයං වුච්චති භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බාන ධාතු

දුවෙ ඉමෙ චක්ඛුමතා පකාසිතා
නිබ්බාන ධාත අනිස්සිතෙන තාදිනා
එකාහි ධාතු ඉධ දිට්ඨ ධම්මිකා
සඋපාදිසෙසා භවනෙත්ති සංඛයා

අනුපාදිසෙසා පන සම්පරායිකා
යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො
යෙ එතදඤ්ඤාය පදං අසංඛතං
විමුත්ත චිත්තා භවනෙත්ති සංඛයා
තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා
පහංසු තෙ සබ්බභවානි තාදිනො [ඉ. වු. 368]

භික්ඛවෙ = මහණෙනි

සඋපාදිසෙසා = තණ්හා ආදියෙහි ඵල වශයෙන් ගත් ස්කන්ධ ඉතිරිව ඇත්තාවූ

වා = තණ්හා උපාදාන කර්ම යන මේවායේ ඵල වන්නාවූ ස්කන්ධයන් ඉතිරිව ඇත්තාවූ

නිබ්බාන ධාතු = නිබ්බාන ධාතුව

කතමා ච = කුමක්ද යත්

භික්ඛවෙ = මහණෙනි

ඉධ = මේ ශාසනයෙහි

භික්ඛු = මහණ තෙම

අරහං = කෙලෙස් කෙරෙන් දුරින්ම දුරුවී

වා = සත්ත්වයන්ගේ වන්දනා පූජාවන් පිළිගැනීමට සුදුසු වූ

ඛීණාසවො = ආශ්‍රව ධර්මයන් ක්‍ෂය කළ

වුසිතාවා = පිළිපදින ලද

කත කරණීයො = කළයුත්ත මාර්ග ඥාණ හතරින් සිදුකළ

ඔහිත භාරො = කෙලෙස්, ඛන්ධ, අභිසංඛාර යන බර පොදි තුන බිම හෙලූ (කෙලෙස්, අභිසංඛාර වැනි දෑ පහළ විය හැකි නව භව ස්කන්ධයන්ද අර්හත් මාර්ගයෙන් නිවී ගියේය. එබැවින් ඛන්ධ බර බහා තබන ලදැයි කියනු ලැබේ)

අනුප්පත්ත සදත්ථො = අර්හත් ඵලය නම්වන තම අර්ථ සිද්ධියට පත්වූ

පරික්ඛීන භව සංයොජනො = භවයන්හි බැඳීම් ඇතිකරන සියලු සංයෝජන ක්‍ෂය කළ

සම්මදඤ්ඤා විමුත්තො = මනාලෙස දැනගන කෙලෙස් වලින් මිදුනු

තස්ස = එම අර්හත් උතුමන්ගේ

| | | |
|---|---|---|
| පඤ්ච ඉන්ද්‍රියානි | = | චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය යන පහක් වූ ඉන්ද්‍රියයන් |
| තිට්ඨන්ති එව | = | වර්තමාන අවසාන භවය පහළ කළ කර්ම ශක්තිය නොනිමීතාක් කල් දිගින් දිගට පහළ කරමින් පිහිටන බැවින් ඒවා ඇත්තේමය. |
| යෙසං | = | එම පඤ්චෙන්ද්‍රියයන් |
| අවිඝාතත්තා | = | නැවත පහළ නොවන ලෙස චුත කරනු කැමති නමුත් චුත නොවී පවතින බැවින් |
| සො | = | එම රහත් උතුමන් |
| මනාපාමනාපං | = | මනාප අමනාප අරමුණ |
| පච්චනුභොති | = | විඳියි |

(තස්ස තිට්ඨන්තෙව යන තැන පටන් මේතාක් ස්කන්ධයන් ඉතිරි පවතින අයුරු දක්වයි. තස්සයො රාගක්ඛයො. ආදියෙන් වනාහි සඋපාදිසෙස නිබ්බානය දක්වයි)

| | | |
|---|---|---|
| තස්ස | = | තණ්හා උපාදාන කර්ම යන මේවායේ ඵල වන්නාවූ ස්කන්ධයන් තවම ඉතිරිව තිබෙන රහතන් වහන්සේගේ සන්තානයෙහි |
| යො රාගක්ඛයො | = | යම් රාගයක ක්‍ෂයවීමක්, අභාවයක් අත්‍යන්ත නොඉපැද්මක් යන මෙය |

(රාගක්ඛයො ඛීණාකාරො අභාවො අච්චන්ත මනුප්පාදො අට්ඨකථා දැක්වීමයි)

| | | |
|---|---|---|
| යො දොසක්ඛයො | = | යම් ද්වේෂයක ක්‍ෂයවීමක්, අභාවයක් අත්‍යන්ත නොඉපැද්මක් යන මෙය |
| යො මොහක්ඛයො | = | යම් මෝහයක ක්‍ෂයවීමක් අභාවයක් අත්‍යන්ත නොඉපැද්මක් යන මෙය |

| | | |
|---|---|---|
| අත්ථි | = | ඇත්තේය. |
| භික්ඛවෙ | = | මහණෙනි |
| අයං | = | රාගාදියේ අත්‍යන්ත නොඉපැද්ම නම් වන මෙම කෙලෙස් සංසිඳීම, නිවීම |
| සඋපාදිසෙසා නිබ්බාන ධාතු | = | සඋපාදිසෙස නිබ්බාන ධාතු යැයි |
| වුච්චති | = | කියනු ලැබේ |
| (රාගාදික්ඛයො | = | සඋපාදිසෙසා නිබ්බාන ධාතුති දස්සිතො-අටඨකථා විවරණයයි. කෙලෙස් පරිනිර්වානයයි) |
| භික්ඛවෙ | = | මහණෙනි |
| අනුපාදිසෙස | = | ස්කන්ධ ඉතිරිව නැති |
| නිබ්බාන ධාතු | = | නිර්වාණ ධාතුව |
| කතමා ච | = | කුමක්ද යත් (කෙලෙසද යත්) |
| භික්ඛවෙ | = | මහණෙනි |
| ඉධ | = | මේ ශාසනයෙහි |
| භික්ඛු | = | භික්ෂුව |
| අරහං | = | කෙලෙස් දුරින්ම දුරුකළ |
| වා | = | දෙව් මිනිසුන්ගේ වන්දනා පූජා පිළිගැනීමට සුදුසුවූ -පෙ- |
| සම්මාදඤ්ඤා විමුත්තො | = | මනාකොට දැනගත කෙලෙස් වලින් මිදීම |
| හොති | = | වේ |
| තස්ස | = | එම රහත් උතුමන්ගේ |
| සබ්බ වෙදයිතානි | = | සියලු විඳීම් අබ්‍යාකත වේදනා |
| අනභිනන්දිතානි | = | තණ්හා මාන දිට්ඨි වශයෙන් අභිනන්දනය නොකොට භාර නොගෙන |

| | | |
|---|---|---|
| ඉධ එව | = | මෙම වර්තමාන භවයෙහිදීම |
| **සීතිභවිස්සන්ති** | = | සිසිල් වන්නේය |
| වා | = | තවදුරටත් සම්බන්ධවී දිගට පහළවීමක් නොමැති බව නිරෝධ වීම වශයෙන් නිරුද්ධ වන්නේය 1* |
| **භික්ඛවෙ** | = | මහණෙනි |
| අයං | = | නව භවයක ස්කන්ධයන් පහළ නොකර වර්තමාන භවයේදීම රහතන් වහන්සේගේ ස්කන්ධයන් නිවී යෑම, |
| වා | = | පරිනිබ්බාන චුතියේ නිවීමට පසු නව ස්කන්ධයන් ඉදිරියට පහළ නොකර සදාකාලිකව නිවී යෑමට **අනුපාදිසෙස නිබ්බාන ධාතු** යැයි |
| **වුච්චති** | = | කියනු ලැබේ. |

මේ අනුපාදිසෙස නිබ්බානය ස්කන්ධන්ධ පරිනිර්වානයයි. මග්ග භාවනාව නොවැඩුවේ නම් පහළ විය හැකි වූ නව භවයේ ස්කන්ධයන් මග්ග භාවනාව වැඩූ හේතුවෙන් පරිනිබ්බාන චුතියට පසු පහළ නොවී නිවී යත්. එබැවින් මෙම ස්කන්ධ පරිනිර්වානයද අර්හත් මාර්ග ක්ෂණයේදීම සම්‍ෘධ වේ. නමුදු නිවීයෑම අලුතින් පහළ කළ හැකි ස්වභාවය නොවන

1* අවිජ්ජාය වූපසමෙන සංඛාර දරථ පරිළාහදරථා සීතලී භවිස්සන්ති, අප්පටිසන්ධික නිරොධෙන නිරුජ්ඣිස්සන්තීති අත්ථො. න කෙවලං වෙදයිතානි යෙව, සබ්බෙපි පන ඛීණාසව සන්තානෙ පඤ්චක්ඛන්ධා නිරුජ්ඣිස්සන්ති. වෙදයිත සීසෙන දෙසනා කථා (අටථ කතා විවරණයයි) සීති- වනාහි අබ්භූතතබ්භා යන තැන විපච්චයනක අබ්‍යය පදයයි. වෙදනාව ප්‍රධාන කොට දේශනා කරන ලද එකක් බැවින් මෙයාකාර අර්ථයක් ගත යුතු. රහතන් වහන්සේගේ සන්තානයේ ඇත්තාවූ වේදනා ආදී පඤ්චස්කන්ධයෝ තණ්හා මාන, දිට්ඨි වශයෙන් බැඳී නොගන්නා අතර කෙලෙස්, කර්ම, නව භවයක ස්කන්ධ කිසිවක් පහළ කළ නොහැකකේය. එබැවින් ඉන්ධන අලුතින් නොලද ගින්නට අලුතින් ගින්න පහළ කළ නොහැකිව ඇතිදේ දැවීමෙන් පසු නියම ලෙස නිවී යෑමට යන්නා සේ, පෙර කර්ම නිසා පහළ වූ රහතන් වහන්සේගේ ස්කන්ධයන්ද අලුත් භවයක ස්කන්ධ පහළ කිරීමෙන් තොරව ස්වකීය පහළ වීමෙන් පසු නියමාකාරයෙන් නිවීයෑමට යෙත් පරිනිබ්බාන චුති ස්කන්ධයන් නිවී ගියාට පසු කිසි යම් ස්කන්ධයක් අලුතින් පහළ නොවේ. එබැවින් රහතන් වහන්සේගේ සන්තානයෙහි පෙර කර්ම නිමවූ නිසා පහළ වෙමින් පවතින ස්කන්ධයෝ නව ස්කන්ධයන් ඉදිරියට පහළ නොකර මේ භවයෙහිදීම නිවීයයි යැයි කියැවේ.

බැවින් කුමන කාලයේ පහළ වේදැයි යන්න නොකිව හැක්කෙකි තවදුරටත් පැහැදිලි කරන්නෙමු, මග්ග භාවනාව නොවැඩුවේ නම් කෙලෙස් හා හේතු ධර්ම නොනිමිතාක් කල් නව භවයේ ස්කන්ධයන් නැවත නැවත පහළ විය හැක්කේය. පහළ වීමේ ශක්තිය ඇත. එම පහළ විය හැකි කෙලෙස් ස්කන්ධය නොඋපන් බැවින් අතීත නොවේ. පහළ වී නොමැති නිසා ප්‍රත්‍යුත්පන්න ද නොවේ. එසේම ඒකාන්තයෙන් පහළ වන්නේ නැති නිසා අනාගතද නොවේ. තුන් කාලයෙන්ම තොර කාල විමුත්ත ධර්මයෝම වෙත්. කාල විමුත්ත වන්නාවූ එම කෙලෙස් ස්කන්ධයන්ගේ නිවීමක් නැති බව, ඇත්තටම පහළ නොවීම අතීත ද නොවේ. අනාගත ද නොවේ. පච්චුප්පන්න ද නොවේ. හුදෙක් කාල විමුක්ත ධර්මයක්ම වේ. මෙලෙස සඋපාදිසෙස = කෙලෙස් පරිනිබ්බානය, අනුපාදිසෙස= ස්කන්ධ පරිනිබ්බානය යන මේ දෙකම කාල විමුක්ත ධර්මම වන බැවින් " කුමන කාලයක පහළ වී දැයි" යන්න කිව නොහැක. තවදුරටත් කාල විමුත්ත වන්නාවූ කෙලෙස් ස්කන්ධයන් හෙවත් නිවීයෑම පහළ නොවීම ස්වභාවය ඇති බැවින්ද "කුමන කාලයක පහළ වීද" යැයි කිව නොහැක්කේය. තවදුරටත් පහළවිය හැකි කෙලෙස් ස්කන්ධයන්ගේ නිවීයෑම, අභාවය, නියම ලෙස පහළ නොවීම නම්වූ නිවන තුන්කාලයෙන්ම විමුක්ත වූ කාල විමුත්ත ධර්මයක් වන නිසා ගොත්‍රභූ ක්‍ෂණයෙහිදී අනාගත නිවන අරමුණු කරන්නේ ද මාර්ග ක්‍ෂණයෙහි පච්චුප්පන්න නිවන අරමුණු කරන්නේ ද අනාගත සකන්ධනිබ්බානය අරමුණු කරන්නේ ද යන ප්‍රශ්න-විවේචන නොගැළපෙන්නේමය. ගැඹුරින් සළකා බලන්න.

| | | |
|---|---|---|
| දිට්ඨ ධම්මික | = | වර්තමාන ආත්මභාවයේ සම්පූර්ණවූ |
| භවනෙත්ති සංඛ්‍යා | = | භව තණ්හාව ක්‍ෂයවීම යැයි කිවයුතු |
| සඋපාදිසෙසා | = | ස්කන්ධයන් ඉතිරිව තිබියදී පහළවන |
| එකා ධාතු | = | එකම නිර්වාන ධාතුව |
| ඉධ | = | මේ වර්තමාන භවයෙහි |
| සිද්ධා | = | සමෘධ විය |
| යම්හි | = | මෙම එම අනුපාදිසෙස නිර්වානයේ |

භවානි = කාම - රූප - අරූප භවයන්
(ලිංග විපල්ලාසය)

සබ්බසො = ඉතිරියක් නැතිව සමස්ථයක් වශයෙන්

නිරුජ්ඣති = නිරුද්ධ වේ

වා = පහළ නොවේ

(නිවීයෑමම නිවීම කොට කියන ලදැයි සළකා ගන්න)

අනුපාදිසෙස = ස්කන්ධ ඉතිරි නොමැතිවූ

සා පන නිබ්බාන ධාතු = එම නිර්වාන ධාතුව

සම්පරායික = පරිනිබ්බාන චුතියට පසු නිමාවට
පත්වේ-සම්පූර්ණ වේ.

ඉති = මෙසේ

ද්වෙ = දෙයාකාර වූ

ඉමා නිබ්බාන ධාතු = මේ නිර්වාන ධාතු

චක්ඛුමතා = පස් ආකාර ඥාණ ඇස් ඇත්තාවූ

අනිස්සිතෙන = කිසියම් ධර්මයක් තණ්හා දිට්ඨි
වශයෙන් ඇසුරු නොකොට

තාදිනා = හොඳ නරක යන අරමුණු දෙක මත
විකසිත-මුකුලිත යන දෙකට
නොපැමිණ මධ්‍යස්ථව සමබර ලෙස
බැලිය හැකි බුදු රජාණන් වහන්සේ

පකාසිතා = විවරණය කොට පණවනලද සේක1*

යෙ = යමෙක්

අසංඛතං = කම්ම චිනා උතු ආහාර ආදී හේතූන්
සමූහ වී පහළ නොකරන ලද

වා = සිදුකරන ලද සංස්කාරයන්ගෙන්
ප්‍රතිපක්ෂයෙහි වන්නාවූ

---

අනිස්සිතෙන යන තැන අසිතෙන, එකාභි ධාතු යන තැන එකොභි ධාත, සඋපාදි යන තැන සොපාදි අනුපාදි යනතැන නොපාදි යමහි යන තැන යසමිං යැයි යෙදුනේ නම් ඉඳවංස ඡන්දස් ලක්ෂණ අනුවයයි.

| | | |
|---|---|---|
| පදං | = | මාර්ග ඤාණ, ඵල ඤාණ මගින් ළඟා විය යුතු |
| එතං නිබ්බාන ධාතුං | = | සඋපාදිසෙස, අනුපාදිසෙස වශයෙන් බෙදා දේශනා කළ මෙම නිර්වාන ධාතුව |
| අඤ්ඤාය | = | මාර්ග ඤාණ හතර මගින් ප්‍රකටව දැන |
| භව නෙත්ති සංඛයා | = | භව තණ්හා ක්‍ෂය කළ බැවින් |
| විමුත්ති චිත්තා | = | කෙලෙස් වලින් විමුක්ත වූ සිත් ඇති |
| හොන්ති | = | වෙත් |
| තෙ | = | කෙලෙස් වලින් විමුක්ත සිත් ඇති එම පුද්ගලයෝ |
| ධම්මසාරාධිගමා | = | ධර්ම සාරය වන්නා වූ අර්හත් ඵලය ලබාගත් බැවින් |
| ඛයෙ | = | රාගාදීන්ගේ ක්‍ෂයවීම, ක්‍ෂයවීමේ ස්වභාව ඇති අනුපාදිසෙස නිබ්බාන ධාතුවෙහි |
| රතා | = | අභිරමනය, රතිය කරත් |
| (තෙ | = | නිවනට සැපත් එම පුද්ගලයන් |
| තෙහි නිබ්බාන පත්තා | = | යන සංවණ්ණනා ආකාරයට පරිවර්තනය කරයි |

"තෙහි නිපාතමත්තං" යන ජටඨ සංගායනා ආකාරයට තෙ සද්දය අර්ථයට ඇතුළත් නොකොට පරිවර්තනය මෙහි ලැබේ)

| | | |
|---|---|---|
| තාදිනො | = | හොඳ නරක අරමුණු දෙක විකසිතව, මුකුලිතව නොවී සමව මධ්‍යස්ථව දැකිය හැකි වූ හෙතෙම |
| සබ්බ භවානි | = | සියලු භවයන් |
| පහංසු | = | පරිනිබ්බාන චුතියට පසු කැලම පහ කළාහුය |

## කිලෙස ස්කන්ධ නිබ්බානයෝ ද පරමාර්ථම වේ

මේ ගාථාවෙහි යෙ එතදඤ්ඤදය පදං අසංඛතං යන පදය විශේෂ සැළකිල්ලෙන් සළකා බලන්න. සඋපාදිසෙස අනුපාදිසෙස වශයෙන් වෙන් වෙන්ව දේශනා කරන ලද, කෙලෙස් ස්කන්ධයන්ගේ නිවීම ස්වභාවය හේතු ධර්මයන්ගෙන් සකස් කරන ලද ධර්මයක් නොවන බැවින් අසංඛත නම් වේ. ගින්දර හා ජලය, උණුසුම හා සිසිල, අඳුර, ආලෝකය, වන වදුලක් හා එළිමහනක් මෙන් අබන්ධව ඇතිවෙමින් නැතිවෙමින් පවතින සංස්කාරයන් හා ප්‍රතිවිරුද්ධ පැත්තේ පවතින බැවින්ද අසංඛත නම් වේ. මාර්ග - ඵල ඥාණ වශයෙන් ඇස් පනාපිට දැනගන ළඟාවිය යුතු බැවින් පද යැයිද නම් වේ. සඋපාදිසෙස අනුපාදිසෙස යැයි බෙදා දක්වන අසංඛත පද නම් වූ කෙලෙස් ස්කන්ධයන්ගේ නිවීම නම් වූ මේ නිවනම ආර්යයන් මාර්ග ඵල ඥාණයෙන් දැනගනී යැයි මේ පදයෙන් කෙළින්ම දක්වයි. එබැවින් මාර්ග ඵලයන් ගේ අරමුණ වන්නා වූ සන්ති ලක්ඛණා ඇති පරමාර්ථ නිබබාන හේතු නිර්වානය එකකි සඋපාදිසෙස නම් වූ කෙලෙස් පිරිනිවීම අනුපාදිසෙස නම් වූ ස්කන්ධ පරිනිර්වානය නම්වන ඵළ නිර්වානය එකක යැයි මෙලෙස බෙදා දැක්වීම නොගැළපෙන්නේය. බෙදා දක්වතොත් මෙම පාළියට විරුද්ධ වේ. පහත දැක්වෙන අභිධම්මත්ථ සංඝහ අට්ඨ කථාවටද විරුද්ධ වේ

**තදෙතං සභාවතො එකවිධම්පි සඋපාදිසෙසා නිබ්බාන ධාතු අනුපාදිසෙසා නිබ්බාන ධාතු චෙති දුවිධං හොති කාරණ පරියායෙන**

| | | |
|---|---|---|
| **තං එතං** | = | මාර්ග ඵලයන්ගේ අරමුණ වන්නා වූ එම නිවන (එක විධම්පි දුවිධං හොති යන්න හා බැඳේ) |
| **සභාවතො** | = | සන්ති ලක්ඛණා යන නම ස්වභාවය වශයෙන් |
| **එක විධම්පි** | = | එකම ආකාරයක් ඇත්තේ නමුත් |
| **වා** | = | එකක්ම වන්නේ නමුදු |

| | | |
|---|---|---|
| සඋපාදිසෙස නිබ්බාන ධාතුච | = | සඋපාදිසෙස නිබ්බාන ධාතුද |
| අනුපාදිසෙස නිබ්බානධාතු ච | = | අනුපාදිසෙස නිබබාන ධාතුවද |
| ඉති | = | මෙලෙස |
| කාරණ පරියායෙන | = | බෙදා දැක්වීමේ ඉගියක් වශයෙන් |
| ද්විධං | = | දෙආකාරයක් |
| හොති | = | වන්නේය |

මග-ඵල ඥාණයන්ට අරමුණ වන්නාවූ එම නිවන සන්ති ලක්ඛණය වශයෙන් එකක්ම වේ. සන්ති ලක්ඛණ ඇති නිවන, සන්ති ලක්ඛණ නැති නිවන යැයි දෙයාකාර නොවේ. නිවනට සන්ති ලක්ෂණය ඇත්තේමය. නමුදු උපාදිසෙස ඇති බව නැති බව යන බෙදීම අනුව බෙදිය හැකි බවට ඉගියක් වශයෙන් වනාහි මග ඵලයන්ට අරමුණු වන එම නිවනම සඋපාදිසෙස නිබ්බාන ධාතු, අනුපාදිසෙස නිබ්බාන ධාතු යැයි දෙකකට බෙදා දක්වන්නේ යැයි යන්න අදහසයි. මෙලෙස දැක්වීමේ දී තදෙතං ද්විධං හොති යන කථාවෙන් මග ඵලයන්ට අරමුණු වන නිවනම දෙකකට බෙදා දක්වන බව ප්‍රකටය. එබැවින් සඋපාදිසෙස අනුපාදිසෙස නිවන් මග ඵලයන්ට අරමුණු වන නිවනින් වෙන් කළහොත් අභිමතත්‍ථ සංග්‍රහ කථාවටද අසම වේ.

## නිවන අභාව ප්‍රඥප්තියක් නොවේ

එතෙකුදු පමණක් නොවේ. එසේ වෙන්කළ හොත් මග ඵල සඳහා අරමුණු වන නිවන සන්ති ලක්ෂණය ඇති පරමාර්ථ ධර්මයක් වන බැවින් එයින් වෙන්වූ සඋපාදිසෙස අනුපාදිසෙස නිවන් යන මේවාට සන්ති ලක්ෂණය නොමැත්තේ යැයි ද පරමාර්ථ වශයෙන් ප්‍රකට නොවූ ප්‍රඥප්ති ධර්මයක් යැයි ද පිළිගත්තා වන්නේය. සමහරෙක් සඋපාදිසෙස අනුපාදිසෙස නිවන අභාව ප්‍රඥප්ති ධර්මයක්ම යැයි කියත්. එසේ නම් ප්‍රඥප්ති ධර්ම යන්න සිතේ හෙවත් මනො විඥ්ඥාණයේ අරමුණක් පමණක්ම වේ. පරමාර්ථ වශයෙන් ප්‍රකට නොවේ. එබැවින් සඋපාදිසෙස නිබ්බාන යැයි කියන කෙලෙස් නිවීම අනුපාදිසෙස නිබ්බාන යැයි කියන ස්කන්ධ නිවීමද අත්තදිට්ඨිය හා බැඳීගත් ආත්මයක් ලෙස සිතේ, හෙවත් මනො විඥ්ඥාණයේම අරමුණක්ම යැයි කීමට සම වන්නේය.

පහළ විය හැකි කෙලෙස් ස්කන්ධයන්ගේ නියම නිවීමක් හෝ පහළ නොවීමක් බවට නොම යන්නේය. එසේ නම් රහතන් වහන්සේගේ සන්තානයේ කෙලෙස් තිබූ ආකාරයටම පවතිනවා වන්නේය. පරිනිබ්බාන චුතියට අනතුරුවද ස්කන්ධයන් තිබූ ආකාරයටම පවතිනු ඇත. කිසිවෙකුටත් සංසාර වට්ට දුකින් මිදෙනු නොහැකි වනු ඇත. මේ වනාහි සඋපාදිසෙස-අනුපාදිසෙස නිවන්, මග ඵල නිවන් හි අරමුණින් වෙන් කොට ගෙන අභාව ප්‍රඥප්තියක් වශයෙන් ගැනීමේ ආදීනවයයි. එම නිවන් දෙකෙහි සන්ති ලක්‍ෂණය නැතැයි කීමෙන් ප්‍රඥප්ති ධර්මයන් යැයි කියන පැත්තට යන නිසා දක්වන ලද ආදීනව ලැබීමටත් වඩා සන්ති ලක්‍ෂණය ඇති නිවනද සහිතව නිවන් තුනකට බෙදා දැක්වීමේ වරදට ද බැදේ. එබැවින් පහත සඳහන් ලෙසටම නිශ්චිත ලෙස තීරණය කරයි.

## මාර්ග ඵලයන්ට අරමුණ වන නිවන

මාර්ග ඵලයන්හට අරමුණ වන්නාවූ නිවන සාමාන්‍ය නිවනයි. **සඋපාදිසෙස, අනුපාදිසෙස** යන නිවන් එම සාමාන්‍ය නිවනෙහිලා ගැනෙන විශේෂ නිවන්ය. එබැවින් මාර්ග-ඵල ඤාණ පහළ වන අවස්ථාවේ **සඋපාදිසෙස අනුපාදිසෙස** වශයෙන් බෙදා අරමුණු කරනවාත් නොවේ. රාගයේ නිවීම, දෝසයේ නිවීම, මෝහයේ නිවීම, රූපයේ නිවීම, වේදනාහී නිවීම, යනාදි වශයෙන්ද විශේෂයෙන් බෙදා වෙන් කර ගෙන අරමුණු කරනවා නොවේ. දැන් නිවීම, පසුව නිවීම යැයි කොටස් කොට අරමුණු කරනවා, නොවේ. නිවන්, නිවීමත් කෙලෙස් නොමැති ස්කන්ධ නැමැති සංඛාර නොමැති යන නාම ප්‍රඥප්තින් වශයෙන් ද අරමුණු කරනවා නොවේ. ඇත්ත වශයෙන්ම වනාහි මෙනෙහි කොට දැනගත යුතු රූප - නාම සංස්කාර, මෙනෙහි කිරීම කරන සංස්කාරයන්ගේ පහළ නොවීම, නිවීයෑම, නිරුද්ධ වීම, ක්‍ෂයවීම ස්වභාවය අරමුණු කිරීම හෙවත් දැන ගැනීම වේ. මෙලෙස වටහා ගත යුතු අරමුණු ස්වභාවයෙහි රූප-නාම සියල්ල නිරුද්ධ වීම

නම් වූ නිවීම සිදුවන බැවින් කෙලෙස් නිවීම නම් වන සඋපාදිසෙස නිවන ද මෙහි ඇතුළත් වේ. ස්කන්‍ධයක් නිවීම නම් වන අනුපාදිසෙස නිවනද ඇතුළත් වේ. මෙහිලා දැක්විය යුතු කෙලෙස් ස්කන්ධයන්ගේ නිවීම නැතිවීම නොහොත් පහළ නොවීම අභාව ප්‍රඥප්තියක් ම යැයිද, නොගැඹුරු යැයිද යන ලෙසට සිතා ගැනීම්, කල්පනා කිරීම් ඇත්නම්, අල්ලා ගැනීම් ඇති බැවින් ගැඹුරු නිසාම මට නියමාකාරයෙන් වටහා ගත නොහී යැයිද, නියමලෙස නොදත් නිසා අභාව ප්‍රඥප්තියක් යැයිද, මම සිතා සිටීම පමණක්යැයිද යන ලෙසට සළකාගත යුතු. මෙපමණකින් නොසෑහේ නම්, තම සන්තානයේ කෙලෙස් මතු නොවී නියම ලෙසට නිවන භාවනා කොට බලන්න. චුතියට අනතුරුව නව භවයක ස්කන්‍ධ පහළ නොවී සදාකාලිකව නිවීයනු පිණිස භාවනා කොට බලන්න. එවිට පහළ විය හැකි කෙලෙස් වල නිවීම නව භවයක ස්කන්‍ධයන්ගේ නිවීම හෙවත් ඇත්තටම පහළ නොවීමේ ස්වභාවය සිතා කල්පනා කොට දතයුතු අභාව ප්‍රඥප්තියක් නොවේ යැයිද, පරමත්‍ථ වශයෙන් ප්‍රකටවම ඇති අසංඛත ස්වභාව ධර්මයන්ම යැයිද,

| | | |
|---|---|---|
| ගම්භීරො වත | = | ගැඹුරු බැවින්ම ගැඹුරු වූ ධර්මයක් වන්නේද යැයි |
| දුද්දසො වත | = | තම සන්තානයේ සම්පූර්ණයෙන් දැකීමට දුෂ්කර වූ ධර්මයක් යැයිද, |
| අතක්කාවචරො වත | = | තර්කයෙන් පමණක්, අනුමානයෙන් පමණක් ළඟාවිය නොහැකිවන තර්කයේ විෂය ක්ෂේත්‍රය ඉක්මවන ධර්මයක් යැයිද පිළිගනු ඇත. |

සමාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්‍ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති, රූප සඤ්ඤාච විරජ්ජති, සෙ ආයතනෙ වෙදිතබ්බො, යත්‍ථ සොතඤ්ච නිරුජ්ඣති සද්ද සඤ්ඤාච විරජ්ජති, සෙ ආයතනෙ වෙදිතබ්බ, යත්‍ථ ඝානඤ්ච නිරුජ්ඣති, ඝානසඤ්ඤාච විරජ්ජති, සෙ ආයතනෙ වෙදිතබ්බ, යත්‍ථ ජිව්හාච නිරුජ්ඣති, රස සඤ්ඤාච විරජ්ජති

යෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්ථ කායොච නිරුජ්ඣති පොට්ඨබ්බ සඤ්ඤාච විරජ්ජති, සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ මනො ච නිරුජ්ඣති, ධම්ම සඤ්ඤා ච විරජ්ජති, සෙ ආයතනෙ වෙදිතබ්බෙ,

[ස. නි. 4/206]

භික්ඛවෙ = මහණෙනි

තස්මා = නිවන, මාර්ග සතරින් නොදක්නේ නම් ඒ තාක් කෙලෙස් වල අරමුණු වලට නොයෑම අනුව සිතේ ආරක්ෂාව වන්නාවූ අප්පමාද ධර්මය, සති ධර්මය පහළ කිරීම දැනගත් විට වනාහි ආදාළ ඒ ඒ කෙලෙස් අරමුණු වෙත නොයනු පිණිස අප්පමාද සති ධර්මය පහළ කිරීම අවශ්‍ය බව නම් වන හේතුව නිසා

සෙ ආයතනෙ = තං ආයතනං, නිබ්බාන නම්වන එම අරමුණු සම්බන්ධව

වෙදිතබ්බෙ = දත යුතු

වා = මාර්ග සත්‍ය සතර මඟින් දැන ගැනීම පිණිස උත්සාහ කළ යුතු.

යත්ථ = එම නිවනෙහි

චක්ඛුච = චක්ඛු ප්‍රසාදය රූපද

නිරුජ්ඣති = නිරුද්ධ වේ.

සෙ ආයතනෙ = චක්ඛුව හා රූප සඤ්ඤාවන්හී නිරුද්ධවීම, නිවන යන එම අරමුණ

චක්ඛුව හා රූප සඤ්ඤාවේ නිරුද්ධවීම ස්වභාවය "යමහි නිරුජ්ඣනති භවානි" යැයි දේශනා කළා සේ නිරුද්ධවන තැන දේශනා කළා යැයි සලකා ගත යුතු. [ඉ. 68]

දැකීම හා සම්බන්ධ සංස්කාරයන් මෙනෙහි කිරීමත් දැනගැනීමත් අනුව නිවන දැනගන්නා යෝගාවචරයා චක්ඛුව හා රූප සඤ්ඤාව යන මේවායේ නිරුද්ධ වීම, ක්‍ෂයවීම ස්වභාවය විශේෂයෙන් දැනගනී. එබැවින් එවන් පුද්ගලයා දැනගන්නා නිවන චක්ඛුව හා රූප සඤ්ඤාව යන ආයතන දෙකේ නිරුද්ධ වීම මඟින් විශේෂ කොට දක්වන ලදැයි ගතයුතු. යත්ථ චක්ඛුච නිරුජ්ඣති රූප සඤ්ඤාච නිරුජ්ඣති සෙ ආයතනෙ වෙදිතබ්බෙති එත්ථ අභිඤ්ඤං ආයතනං පටික්ඛෙපන නිබ්බානං

දස්සිතං යන පඤ්චායතන සූත්‍ර විවරණය දක්වන ම. නි. උපරි පණ්ණාස අට්ඨ කථා අනුවයි. එහිදූ චක්ඛුවේ නිරුද්ද වීම ප්‍රකට නිසා චක්ඛුව හා එකට පහළ වන රූපයන්ගේ නිරෝධය ද ප්‍රකටයැ රූප සඤ්ඤාවේ නිරෝධය ප්‍රකට නිසා වාසනා සම්ප්‍රයුක්ත චෛතසිකයන්ගේ නිරෝධය ද ප්‍රකටයැ. එම සඤ්ඤාවේ අරමුණ වන්නා වූ රූපාරම්මණයේද නිරෝධය ප්‍රකටයැ. චක්ඛුව හා රූප සඤ්ඤාවේ නිරෝධය ප්‍රකට නිසා දැකීම සම්බන්ධව සංස්කාරයන් මෙනෙහි කොට දැනගන්නා විපස්සනාවන්ගේ නිරෝධය ද ප්‍රකට වේ. මේ සියල්ල ලද විශේෂයෙන් ප්‍රකට වේ යැයි සළකාගත යුතු සාමාන්‍ය ලෙසට මාර්ගයෙන් දතයුතු එම නිවනෙහි සංස්කාරයන් සියල්ලෙහි නිරෝධය ද ප්‍රකටමයැ. එබැවින්ම මාර්ග ඵලයන් පහළ වන ක්ෂණයෙහිදී රූප නාම ස්කන්ධ සංස්කාර ඇති තාක් දේවල නොදැනිමද ඇත්තේය. පසු පදයන් ද මේ ලෙසටම යැයි වටහා ගත යුතු.

| | | |
|---|---|---|
| යත්ථ | = | යම් ඒ නිවනෙහි |
| සොතඤ්ච | = | සෝත ප්‍රසාද රූපය ද |
| නිරුජ්ඣති | = | නිරුද්ධ වේ |
| සද්දසඤ්ඤා ච | = | සද්දයැයි හැඳිනීම ද නිරුද්ධවේ |
| විරජ්ජති | = | නැති වේ. |
| සෙ ආයතනෙ | = | සෝත හා සද්ද සඤ්ඤාවන්හී නිරුද්ධ වන නිවන නම් වන එම අරමුණු ධර්මය |
| වෙදිතබ්බ | = | දත යුතු |
| යත්ථ | = | නිවනෙහි |
| ඝානඤ්ච | = | ඝාන ප්‍රසාද රූපය ද |
| නිරුජ්ඣති | = | නිරුදධ වේ |
| ගන්ධසඤ්ඤා ච | = | ගන්ධ සඤ්ඤාවද |
| විරජ්ජති | = | නැති වේ |
| සෙ ආයතනෙ | = | ඝාන හා ගන්ධ සඤ්ඤාවේ නිරුද්ධවීම නිවන නම්වන එම අරමුණු ධර්මය ද |
| වෙදිතබ්බ | = | දත යුතු |
| යත්ථ | = | එම නිවනෙහි |
| ජිව්හා ච | = | ජිව්හා රූපය ද |
| නිරුජ්ඣති | = | නිරුද්ධ වේ |

| | | |
|---|---|---|
| රස සඤ්ඤාච | = | රස සඤ්ඤාව ද |
| විරජ්ජති | = | නිරුද්ධ වේ |
| සෙ ආයතනෙ | = | එම ජිව්හා හා රස සඤ්ඤාවන්හී නිරුද්ධ නිවන නම් වන එම අරමුණු ධර්මය |
| වෙදිතබ්බ | = | දත යුතු |
| යත්ථ | = | එම නිවනෙහි |
| කායො ච | = | කාය ප්‍රසාද රූපය ද |
| පොට්ඨබ්බ සඤ්ඤාච | = | ස්පර්ශ සඤ්ඤාව ද |
| විරජ්ජති | = | නැති වේ |
| සෙ ආයතනෙ | = | එම කාය රූප හා ස්පර්ශ සඤ්ඤාවගේ නිරුද්ධවීම නම්වන නිවන් අරමුණ |
| යත්ථ | = | එම නිවනෙහි |
| මනොච | = | මන ද |
| නිරුජ්ඣති | = | නිරුද්ධ වේ |
| ධම්ම සඤ්ඤාච | = | ස්වභාව ධර්ම සඤ්ඤාව ද |
| විරජ්ජති | = | නැති වේ |
| සෙ ආයතනෙ | = | මනස හා ධර්ම සඤ්ඤායතයන්හී නිරුද්ධ වීම, නිවන නම් වන අරමුණු ධර්මය |
| වෙදිතබ්බ | = | දතයුතු |

මේ සූත්‍රයෙහි ඡේද හයක් මඟින් එක් එක් වශයෙන් විශේෂයෙන් ප්‍රකට ආයතන දෙක තුනක නිරුද්ධ වන ස්වභාවය නිවන යැයි දක්වයි. සම්පූර්ණ සූත්‍රය ආයතන සියල්ලෙහි නිරුද්ධවීම, නිරුද්ධ වන ස්වභාවය නිවන යැයි දක්වයි. එම නිසා මෙම සූත්‍රය විග්‍රහ කරන ආනන්ද ස්වාමීන් වහන්සේ පහත දැක්වෙන ලෙසට දක්වයි

**සළායතන නිරොධං ඛෙ එතං ආවුසො භගවතා සන්ධාය භාසිතං**

| | | |
|---|---|---|
| ආවුසො | = | ඇවැත්නි |
| සළායතන නිරොධං | = | හයාකාර අජ්ඣත්තිකායතන, හයාකාර බාහිරායතනයන්ගේ නිරුද්ධ වීම, නිරුද්ධවන ස්වභාවය වන නිවන |
| සන්ධාය | = | අරමුණුකොට ඒ සඳහා |

| | | |
|---|---|---|
| එතං තදසමාහිත භික්ඛවෙ සෙ | | |
| ආයතනේ වෙදිතබ්බ | = | යන මේ සූත්‍රය |
| භගවතා | = | භාග්‍යවතුන් වහන්සේ විසින් |
| නො | = | අපට |
| භාසිතං | = | දේශනා කරන ලදි. |

(සළායතන නිරොධො වුච්චති නිබ්බානං තං සන්ධාය භාසිතන්ති අත්ථො - අට්ඨ කථා විවරණය)

තතො ත්වං බාහිය නෙව ඉධ, න හුරං න උභය මන්තරෙන එසෙවන්තො දුක්ඛස්ස යන මේ පාළි (උ. පා. 144) විවරණය කරන උදාන අට්ඨ කථාවෙහි ආයතන සියල්ල නිරුද්ධවීම යන මේ නිවනම අරමුණු කොට අන්‍ය ආචාර්‍ය්‍යයන් විස්තර කරන ආකාරය පහත දැක්වෙන ලෙසට වේ.

අඤ්ඤෙ ඉධාති අජ්ඣත්තිකායතනානි, හුරන්ති බාහිරායතනානි, උභයමන්තරෙනාති චිත්ත චෙතසිකාති [උ. අ. 62]

| | | |
|---|---|---|
| ඉධාති | = | 'ඉධ' යන පදයෙන් |
| අජ්ඣත්තිකායතනානි | = | අධ්‍යාත්මික ආයතනයන් |
| වුත්තානි | = | දේශනා කරන ලදි |
| හුරන්ති | = | හුරං යන පදයෙන් |
| බාහිරායතනානි | = | බාහිර හයක් වූ ආයතනයන් |
| වුත්තානි | = | දේශනා කරන ලදි |
| උභයමන්තරෙනාති | = | 'උභයමන්තරෙන' යන පාළියෙන් |
| චිත්ත චෙතසිකා | = | චිත්ත චෛතසික |
| වුත්තා | = | දේශනා කරන ලදී. |
| ඉති | = | මෙසේ |
| අඤ්ඤෙ | = | අන්‍ය ආචාර්යවරු |
| වදන්ති | = | කියත් |

මේ විවරණයට අනුව පාළියේ අර්ථය වනාහි

| | | |
|---|---|---|
| බාහිය | = | බාහිය |
| තතො | = | දකින රූපය |

අසන සද්දය, ආඝ්‍රානය කළ ගන්ධය, රසය, පහස කල්පනා කොට ගත් ස්වභාව අරමුණු වල කෙලෙස් අනුව නොපිහිටි එම අවස්ථාවෙහි,

| | | |
|---|---|---|
| තවං | = | තොප |
| නෙව ඉධ | = | ඇස, කණ, නාසය, දිව කය සිත යන මේ අජ්ඣත්තික ආයතනයන් හී ද නැත. |
| න හුරං | = | වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහස, ස්වභාව යන එම බාහිර ආයතයන් හී ද නැත. |
| උභයමන්තරෙන | = | අජ්ඣත්තික බාහිර ආයතන දෙවර්ගය හැර වූ විඤ්ඤාණ හය නම් වූ චිත්ත චෛතසික ධම් වලද |
| න | = | නොමැත්තේය |
| එසෙ එව | = | මේ ද්වාර- ආරම්මණ චිත්ත- චෛතසික යන මේවායේ තොප නැති බව හෙවත් ද්වාර ආරම්මණ චිත්ත චෛතසික යන මේවායේ ප්‍රකට නොවීමම |
| දුක්ඛස්ස | = | කෙලෙස් දුක්, වට්ට දුක් යන මේවායේ |
| අන්තො | = | අවසානයයි, නිවනයි. |

යොගී තෙම විපස්සනා භාවනා කරන විට ද්වාර හය, අරමුණු හය, චිත්ත, චෛතසික යන මේවායින් ප්‍රකට ධම්යන් අතරක් නොතබා මෙනෙහි කර දැනගනිමින් සිටී. මාර්ග-ඵල ක්ෂණයෙහිදී එම ද්වාර, ආරම්මණ, චිත්ත, චෛතසික ධම් තුළ එකක්වත් ප්‍රකට නොවී, එම ධම් සියල්ලෙහි නිරෝධයම දැනගනී. මෙලෙස දැනගත යුතු නිරුද්ධ වන ධම්යටම සියලු දුක් කෙරෙහි සම්පූර්ණ නිරුද්ධ වීම නිවීම නම් වෙයැයි කියනු ලැබේ. විශේෂයෙන් සිත තබාගත යුතු ආයතන සියල්ල නිරුද්ධ වේ නම් සංඛාර සියල්ලම ද නිරුද්ධ වේ. එබැවින් පහත සූත්‍රයන්හි

සංඛාර සියල්ල බැහැර කිරීම සංඛාර සියල්ලෙහි ප්‍රතිවිරුද්ධ ස්වභාවය නිවන යැයි දේශනා කරයි.

> **යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති**
> **අතො සරා නිවත්තන්ති-එත්ථ වට්ටං න වත්තති**
> **එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති** [ස. නි. 1/30]

| | | |
|---|---|---|
| **යත්ථ** | = | යම් නිවනෙක |
| **ආපො ච** | = | වැගිරෙන, ආබන්ධන ලක්‍ෂණ ඇති ආපො ධාතුව ද |
| **පඨවී** | = | තද, බර, ගොරෝසු, මුදු, සිනිදු, සැහැල්ලු, පඨවි ධාතුව ද |
| **තෙජො** | = | උණුසුම්, සිසිල තෙජො ධාතුව ද |
| **වායො** | = | දරන, සැලෙන, වායො ධාතුව ද |
| **න ගාධති** | = | නො පිහිටයි, නො පවතියි |
| **අතො** | = | ධාතු සතර නොමැති වූ මෙම නිවන |
| **සරා** | = | ස්කන්ධ ප්‍රවාහය, සංසාරය නම්වන ගඟ, දොළ වැව් පොකුණු, දිය දහරාවෝ |
| **නිවත්තන්ති** | = | නතර වෙත් |
| **වා** | = | අතරක් නොතබා පහළ වීමක් නොමැතිව නතර වේ 1* |
| **එත්ථ** | = | එම නිවනෙහි |
| **වට්ටං** | = | කෙලෙස්, කම්, විපාක යන වට්ට තුන |
| **න වත්තති** | = | නො පෙරළේ, නො පවතී. |
| **එත්ථ** | = | එම නිවනෙහි |
| **නාමඤ්ච** | = | අරමුණු කෙරෙහි නතුවිය හැකි නාම ධර්ම්ද |
| **රූපඤ්ච** | = | රුප්පන පෙරළන බවට පත් විය හැකි රූප ධර්ම්ද |

---

1* ශබ්දකොෂයෙහි දිය වෙල්ල යැයි කියන තැන සර ශබ්දයම ඇතත් මෙහිලා සමුද්ද පරමා සරා, වුටයී වෙ පරමා සරා යන තැන්හී වල මෙන් ජල ප්‍රවාහය, ධාරාව හා අර්ථය ගතයුතු

අසෙසං = ඉතිරි නොකොට
උපරුජ්ඣති = නිරුද්ධ වෙත්

එත්ථ පන සංඛාර පටිපක්ඛෙන නිබ්බානං දස්සිතං [සං. නි. අ.3 /25]

විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පහං එත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති. එත්ථ දීඝං ච රස්සං ච අණුං ථූලං සුභාසුභං එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති

විඤ්ඤාණං = උත්තම ආර්ය මාර්ගයෙන් ඇස්පනා පිට දතයුතු
යං නිබ්බානං = යම් නිබ්බානයක1*
අනිදස්සනං = දැකිය යුතු රූප වර්ණ, දැකිය හැකි වර්ණ රූප ද නොමැතිව
වා = ගලපා දක්විය හැකි උපමා - රූපක නොමැති
අනන්තං = ඇතිවීම, පැවතීම, විනාශවීම යන බෙදීමක් නොමැති
සබ්බතො පහං = තිස් අටක් වූ කමටහන් අතරින් එක් කමටහන් විවරයකින් ඇතුළුව නිවනට පත්විය හැකි බැවින් ඇතිතාක් කමටහන් මගින් බැස ගැනීමට තොටක්ද ඇත්තේය.
වා = නියම ක්‍රමයට භාවනා කරන්නේ නම් කොයි තැනදී නමුත් නිවන අවබෝධ කළ හැකි බැවින් සියලු දිශාවන්හී ප්‍රකටව ඇත්තේය.
වා = සියළු තැන්හී සර්වාකාරයෙන් ආලෝකමත් වේ.

## නිවන මහා ප්‍රභාෂ්වරයක් නොවේ

මෙහිලා සබ්බතො පහං පදයෙහි අර්ථ තුන තුළින් දෙවන තුන්වන අර්ථයන්හී ම.නි. මූල පණ්ණාසක බ්‍රහ්ම නිමන්තන සූත්‍ර අටුවාවෙහ

1* විඤ්ඤාණතබ්බන්ති විඤ්ඤාණං නිබ්බානස්සෙතං නාම (අට්ඨ කථා) විඤ්ඤාතබ්බන්ති විසිට්ඨෙන ඤාතබ්බං ඤාණුත්තමෙන අරියමග්ග ඤාණෙන පච්චක්ඛතො ජානිතබ්බන්ති අත්ථො (ටීකා)

දක්වේ. සීලක්ඛන්ධ (දී. නි) අට්ඨ කථාවෙහි එම අර්ථ නොමැතිව, එහි නිවන ප්‍රභාෂ්වර යැයි කියන තැන කිසියම් උපක්ලේසයක් සමඟ අර්ථ සම්බන්ධයක් නොමැති නිසා යැයි අර්ථ ගත යුතු. **පඤ්ඤා ආලොකො පඤ්ඤා ඔභාසො පඤ්ඤා පජ්ජොතො** කියන තැන ප්‍රඥාව ආලොකයක් ප්‍රභාෂ්වරයක් යැයි කියන ලෙසට, **පභස්සර මිදං භිකඛවේ චිත්තං** යැයි කියන තැන උපක්ලේශ නොයෙදෙන සිත ප්‍රභාෂ්වර යැයි කියන ලෙසට සළකා ගත යුතු.

**විසුද්ධට්ඨෙන වා සබ්බතො පභං කෙනචි අනුපක්කිලිට්ඨතාය සමන්තතො පභස්සරන්ති අත්ථො** (සීලක්ඛන්ධ ටීකා)

| | | |
|---|---|---|
| **වා** | = | වෙනත් ලෙසකට අර්ථය වනාහි |
| **විසුද්ධට්ඨෙන** | = | විශේෂයෙන් පිරිසිදු වූ අර්ථයෙන් |
| **සබ්බතො පභං** | = | සියලු ආකාරයෙන් ප්‍රභාෂ්වර වේ |
| **කෙනචි** | = | කිසියම් උපක්කිලෙස ධම්යකින් |
| **අනුපක්කිලිට්ඨතාය** | = | පීඩා නොකරන බැවින්, කිළිටි නොකරන බැවින් |
| **සමන්තතො පභස්සරං** | = | හාත්පසින් ප්‍රභාෂ්වරය |
| **ඉති අත්ථො** | = | මෙය වනාහි අර්ථයයි. |

තේරුම වනාහි, ප්‍රභාෂ්වර වූ මූලික ස්වභාවය ඇති චිත්ත ධම්, ප්‍රඥා ධම් යන මේවා වනාහි කෙලෙසන ධම් සමඟ මිශ්‍රවී වේවා, පෙර පසු වශයෙන් පිරිවරාගැනීම නිසා වේවා, පීඩා කරන කිළිටි කරන බව ඇත්නම් ප්‍රභාෂ්වර නොවීමද විය හැක්කේය. නිවන වනාහි කෙලෙස් සංස්කාරයන්ගේ සංසිඳීම වන බැවින්, කෙළෙසන ධම් සමඟ කිසියම් සම්බන්ධයක් තිබිය නොහැක. හමුවිය නොහැක. එබැවින් නිවනට එම ධම් මගින් කිසිම ක්‍රමයකින් පීඩා කළ නොහැක. නොකෙළසිය හැක. අවකාශයේ දූළි ගෑ නොහැක්කා සේමය. එමනිසා නිවන හාත්පසින් සම්පූර්ණයෙන් ප්‍රභාෂ්වර යැයි කියනු ලැබේ. කෙටියෙන් දක්වන්නේ නම් කෙළෙසන ධම් සමඟ කිසිම සම්බන්ධයක් නැතිව කුණු කසල වලින් සම්පූර්ණයෙන් පිරිසිදුයැ යන මේ අර්ථය අට්ඨ කථා ටීකා වන්හී දක්වේ.

ඉරු එළිය, සඳ එළිය, තරු එළිය, විදුලි එළිය වැනි ආලෝක මෙන් ආලෝකය ප්‍රභාව දේ, එවන් ප්‍රභාවක් මාර්ග ඵල ඥාණ මගින් දැක දැන ගැනීම යැයි නොගත යුතු. එලෙස පිළිගතහොත් අනිදස්සන යන යට පදය සමඟ ප්‍රතිවිරුද්ධ වේ. අනිමිත්ත පච්චුපට්ඨානයන් සමඟ ද ප්‍රතිවිරුද්ධ වේ. දක්වන ලද මිළින්ද පඤ්හා උද්‍ෘත සමඟද ප්‍රතිවිරුද්ධ වේ. නිවනෙහි රූප ධම් නැතැයි කියන පාළි අට්ඨ කථා සියල්ල සමඟද ප්‍රතිවිරුද්ධ වේ. තවදුරටත් පහළ විය හැකි කෙලෙස් ස්කන්ධයන්ගේ නියම පහළ නොවීම වනාහි සංසිඳීම ස්වභාවය ප්‍රභාෂ්වරය විය නොහැක්කේය. සත්‍යය එය නම් නිවන යන්න ප්‍රභාෂ්වරම යැයි පහසුවෙන් පාළි අට්ඨ කථා වල ඍජුවම දක්වනු ඇති. රාගක්ඛයො ආදී වශයෙන් ද, සබ්බසංඛාර සමථො ආදියෙන් ද අනුප්පාදො ආදියෙන් ද කෙලෙස් සංස්කාර යන්ගෙන් ප්‍රතිවිරුද්ධ බව වැනි දුෂ්කර වූ නම් නොදැක්විය යුතුය. ගැඹුරින් සළකා බලන්න)

| | | |
|---|---|---|
| එත්ථ | = | මේ නිවනෙහි |
| ආපො ච | = | ඉන්ද්‍රියාබද්ධ ආපො ධාතුව ද |
| පඨවී ච | = | ඉන්ද්‍රියාබද්ධ පඨවි ධාතුව ද |
| තෙජො ච | = | ඉන්ද්‍රියාබද්ධ තෙජො ධාතුව ද |
| වායො ච | = | ඉන්ද්‍රියාබද්ධ වායො ධාතුව ද |
| නගාධති | = | නොරඳයි |
| වා | = | හේතු ක්ෂය වී දාරකයක් නොමැතිව නිරුද්ධ වේ |
| එත්ථ | = | මේ නිවනෙහි |
| දීඝඤ්ච | = | දිග සටහන් යැයි කියන උපාදා රූප ද |
| රස්සඤ්ච | = | කෙටි සටහනක් යැයි කියන උපාදා රූප ද |
| අණුංච | = | ඉතා කුඩා යැයි කිවයුතු වර්ණ රූප ද |
| ථූලඤ්ච | = | මහා යැයි කිවයුතු වර්ණ රූපය ද |
| සුභංච | = | සුන්දර ලස්සන යැයි සිතන ඉට්ඨාරම්මණ රූප ද |
| අසුභංච | = | අසුන්දර අවලස්සන යැයි සිතන අනිට්ඨාරම්මණ රූප ද |
| උපරුජ්ඣති | = | නිරුද්ධ වේ |

එත්ථ = මේ නිවනෙහි
නාමඤ්ච = නමනු ලක්ෂණ වූ, දැනගන්නාවූ නාම ධර්මද
රූපඤ්ච = රූප්පන ස්වභාව ඇති, පෙරළෙන ස්වභාව ඇති රූප ධර්ම ද
අසෙසං = ඉතිරියක් නැතිව
උපරුජ්ඣති = නිරුද්ධ වේ.

(උපාදින්නක ධම්ම ජාතං නිරුජ්ඣති අප වත්තං හොති) අට්ඨකතා නිරුද්ධ වේ යැයි කියන මේ තැන අලුතින් පහළ නොවී ක්ෂයවී යෑමම දක්වයි.

මේ තාක් නිරුද්ධ වීමම නිවන දක්වයි පසු වාක්‍ය මගින් නිරුද්ධ වීමට හේතුව දක්වයි.

විඤ්ඤාණස්ස = පරිනිබ්බාන චුති සිත හා අභිසංඛාර විඤ්ඤාණය නම්වන විඤ්ඤාණ දෙකෙහි
නිරොධෙන = නිරුද්ධ වීම, පහළ නොවී නිරුද්ධවීම නිසා
එතං සබ්බං = එම දක්වන ලද උපාදින්නක රූප-නාම ධර්ම සියල්ල
එත්ථ = මේ නිවනේදී
උපරුජ්ඣති = නැවත අලුතින් පහළ නොවී නිරුද්ධ වේ.

පරිනිබ්බාන චුති සිත නිරුද්ධ වන නිසා, වර්තමාන රූප-නාම සියල්ල චුත වේ. කැපී යයි. ඵල ගෙන දිය හැකි අභිසංඛාර විඤ්ඤාණ නැති නිසා රූප-නාම අලුතින් පහළ නොවී චුතවේ. නිරුද්ධ වේ. එබැවින් තිරය, තෙල් හා ගිනි දැල්ල යන මේවා නිම වී ගියාසේ රූප නාම සියල්ලම

නිබ්බාන = නිවීම ස්වභාවය ප්‍රකටව ඇති නිසා එම නිවීම සළකා නිරුද්ධ වී ක්ෂයවී නොපෙනී ගියා යැයි කියනු ලැබේ.
එත්ථාපි = සංඛාර පටික්ඛෙපෙනෙව නිබ්බානං දස්සිතං පඤ්චත්තය සූත්‍ර විවරණයයි [ම. අ. 4/9]

කෙටි සංලක්‍ෂය

නිස්සෙස සංඛාර විවෙක ලක්ඛණං
සකල සංඛත විදූර සභාවං
නිබ්බාන මෙතං සුගතෙන දෙසිතං
ජානෙය්‍ය සංඛාර නිරොධ මත්තකං

| | | |
|---|---|---|
| නිස්සෙස සංඛාර විවෙක ලක්ඛණං | = | ඉතිරියක් නොතබා සියලු සංස්කාර යන්ගේ විවේක ස්වභාවය සිතේ සළකුණු කොට |
| සකල සංඛත විදූර සභාවං | = | සියලු සංස්කාරයන් හා ඉතා සුලුවෙන් හෝ සමාන නොවී, ඊට ප්‍රතිවිරුද්ධව වෙනස්ව සම්පූර්ණයෙන් ප්‍රතිපක්‍ෂව |
| සුගතෙන දෙසිතං | = | සුගතයන් වහන්සේ විසින් දේශිත |
| එතං නිබ්බානං | = | ශාන්ති ලක්‍ෂණය ඇතිවේ යැයි එසේ දේශනා කරන ලද නිසා |
| පඤ්ඤාදාවා | = | ප්‍රඥාව ඇත්තා |
| සංඛාර නිරොධ මත්තකං | = | හේතු ඵල දෙක එකිනෙකට ගළපමින් නොසිඳ පවත්වන්නා වූ රූප - නාම ස්කන්ධ සංස්කාරයන්ගේ සම්පූර්ණ වියෝව ක්‍ෂයවීම නිරොධ ස්වභාවයමැ යි* |
| ජානෙය්‍ය | = | සැකයකින් තොරව සංකාවෙන් තොරව කෙළින්ම සරලව මෙනෙහි කොට තහවුරුලෙස දත යුත්තේය |

*ඉන්දවංස දුන පද යන ආකාර දෙක සම්බන්ධව උපජාති ගාථා නිබ්බානකථා නිමියේ යැ.*

*අංක 6 පරිච්ඡේදය නිමි.*

---

අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධා ආදී කොට ඇති පාළියෙන් නිවන දේශනා කරන ලදැයි දක්වන අට්ඨ කථාව ගැනද සැළකිලිමත් විය යුතු.

# අට්ඨාරස විපස්සනා

***පරිච්ඡේද අංක 7***

අට්ඨාරස මහාවිපස්සනා නාම අනිච්චානුපස්සනාදිකා පඤ්ඤා. යාසු

01. අනිච්චානුපස්සනං භාවෙන්තො නිච්චසඤ්ඤං පජහති,
02. දුක්ඛානුපස්සනං භාවෙන්තො සුඛසඤ්ඤං පජහති,
03. අනත්තානුපස්සනං භාවෙන්තො අත්තසඤ්ඤං පජහති,
04. නිබ්බිදානුපස්සනං භාවෙන්තො නන්දිං පජහති,
05. විරාගානුපස්සනං භාවෙන්තො රාගං පජහති,
06. නිරොධානුපස්සනං භාවෙන්තො සමුදයං පජහති,
07. පටිනිස්සග්ගානුපස්සනං භාවෙන්තො ආදානං පජහති,
08. ඛයානුපස්සනං භාවෙන්තො ඝනසඤ්ඤං පජහති,
09. වයානුපස්සනං භාවෙන්තො ආයූහනං පජහති,
10. විපරිණාමානුපස්සනං භාවෙන්තො ධුවසඤ්ඤං පජහති,
11. අනිමිත්තානුපස්සනං භාවෙන්තො නිමිත්තං පජහති,
12. අප්පණිහිතානුපස්සනං භාවෙන්තො පණිධිං පජහති,
13. සුඤ්ඤතානුපස්සනං භාවෙන්තො අභිනිවෙසං පජහති,
14. අධිපඤ්ඤාධම්මවිපස්සනං භාවෙන්තො සාරාදානාභිනිවෙසං පජහති,
15. යථාභූතඤාණදස්සනං භාවෙන්තො සම්මොහාභිනිවෙසං පජහති,

16. ආදීනවානුපස්සනං භාවෙන්තො ආලයාභිනිවෙසං පජහති,

17. පටිසඞ්ඛානුපස්සනං භාවෙන්තො අප්පටිසඞ්ඛං පජහති,

18. විවට්ටානුපස්සනං භාවෙන්තො සංයොගාභිනිවෙසං පජහති.

## සිංහල අර්ථය

01. සංස්කාරයන් අනිත්‍ය වශයෙන් නැවත නැවත නුවණින් දැකීම (=අනිච්චානුපස්සනාව) වඩන්නා සංස්කාර නිත්‍යය යන (වැරදි) සංඥාව (=නිච්ච සඤ්ඤාව) තදංග වශයෙන් දුරු කරයි.

02. සංස්කාරයන් දුක් වශයෙන් නැවත නැවත නුවණින් දැකීම (=දුක්ඛානුපස්සනාව) වඩන්නා සංස්කාර සුඛයැයි යන (වැරදි) සංඥාව (සුඛ සඤ්ඤාව) තදංග වශයෙන් දුරු කරයි.

03. සංස්කාරයන් ආත්ම සවභාවයෙන් තොර බව නැවත නැවත නුවණින් දැකීම (අනත්තානුපස්සනාව) වඩන්නා සංස්කාර ආත්ම ස්වභාවයෙන් යුක්තය යන (වැරදි) සංඥාව (=අත්ත සඤ්ඤාව) හැර දමයි.

04. සංස්කාරයන් පිළිබඳව හටගන්නා කලකිරීම නැවත නුවණින් දැකීම (=නිබ්බිදානුපස්සනාව) වඩන්නා සංස්කාරයන් පිළිබඳ ප්‍රීති සහගත තෘෂ්ණාව (නන්දිය) හැර දමයි.

05. සංස්කාරයන් කෙරෙහි නොඇලීම නැවත නැවත නුවණින් දැකීම (=විරාගානුපස්සනාව) වඩන්නා සංස්කාරයන් පිළිබඳ ඇලීම (=රාගය) හැර දමයි.

06. සංස්කාරයන් නිරුද්ධ වීම නැවත නැවත නුවණින් දැකීම (නිරෝධානු පස්සනාව) වඩන්නා සංස්කාරයන් නැවත නැවත ඉපදීම හෙවත් ඒ සඳහා හේතු වන කැමැත්ත (=සමුදය) හැර දමයි.

07. සංස්කාරයන් අතහැර දැමීම නැවත නැවත නුවණින් දැකීම (=පටිනිස්සග්ගානු පස්සනාව) වඩන්නා සංස්කාරයන් ග්‍රහණය කිරීම (=ආදානය) හැර දමයි.

08. සංස්කාරයන්ගේ ක්ෂය වීම නැවත නැවත නුවණින් දැකීම (=ඛයානු පස්සනාව) වඩන්නා සංස්කාරයන් ඒකත්වයෙන් සැලකීම (=ඝන සඤ්ඤාව) හැර දමයි.

09. සංස්කාරයන්ගේ වැයවීම නැවත නැවත නුවණින් දැකීම (=වයානු පස්සනාව) වඩන්නා සංස්කාර හෙවත් කර්ම රැස්කිරීම (=ආයූහනය) හැර දමයි.

10. සංස්කාරයන්ගේ වෙනස්වීම නැවත නැවත නුවණින් දැකීම (=විපරිනාමානුපස්සනාව) වඩන්නා සංස්කාර ස්ථිරය යන හැඟීම (=ධුව සඤ්ඤාව) හැර දමයි.

11. සංස්කාරයන් නිත්‍ය නිමිති වලින් තොර බව නැවත නැවත නුවණින් දැකීම (=අනිමිත්තානුපස්සනාව) වඩන්නා සංස්කාර නිත්‍ය නිමිති සහගත ලෙස ඒකත්වයෙන් ගැනීම (නිමිත්ත) හැර දමයි.

12. සංස්කාරයන්ගේ පැතිය යුතු බවක් නැති බව නැවත නැවත නුවණින දැකීම (=අප්පණිහිතානුපස්සනාව) වඩන්නා ආත්ම දෘෂ්ඨියට බැස ගැනීම (=අභිනිවේසය) හැර දමයි.

13. සංස්කාරයන්ගේ ආත්ම ස්වභාවයෙන් ශූන්‍ය බව නැවත නැවත නුවණින් දැකීම (සුඤ්ඤතානුපස්සනාව) වඩන්නා ආත්ම දෘෂ්ඨියට බැසගැනීම (=අභිනිවේසය) හැර දමයි.

14. අධිප්‍රඥා සංඛ්‍යාත සංස්කාර ධර්මයන් පිළිබඳ විපස්සනාව, නැවත නැවත නුවණින් දැකීමේ භාවනාව වඩන්නා සංස්කාරයන් සාර ලෙස දැඩිව ගෙන වැද ගැනීම (=සාරාදාභි නිවේසය) අත් හරියි.

15. සංස්කාරයන්ගේ යථා ස්වභාවය නැවත නැවත නුවණින් දැකීම (=යථාභූතඤාන දස්සනය) වඩන්නා සංස්කාරයන් පිළිබඳ දැඩි මුළාවට බැසගැනීම (=සම්මෝහාභිනිවේසය) හැර දමයි.

16. සංස්කාරයන්ගේ දොස් නැවත නැවත නුවණින් දැකීම (ආදීනවානු පස්සනාව) වඩන්නා සංස්කාරයන් කෙරෙහි ආලයෙන් වැදගැනීම (=ආලයාභිනිවේසය) හැර දමයි.

17. සංස්කාරයන්ගේ පොදු ලක්ෂණ- ත්‍රිලක්ෂණ නැවත නැවත නුවණින් දැකීම (=පටිසංඛානුපස්සනාව) වඩන්නා මෝහය(=අප්පටිසංඛාව) හැර දමයි.

18. සංස්කාරයන් කෙරෙන් පෙරළී නිවනට යොමුවීම නැවත නැවත නුවණින් දැකීම (විවට්ටානුපස්සනාව) වඩන්නා සංස්කාරයන් හා සංයෝග වී තදින් වැද ගැනීම (=සංයෝගාභිනිවේසය) හැර දමයි.

# 01. අනිච්චානුපස්සනාව

නාම-රූප සංස්කාරයන් ඒවායේ ස්වභාව ලක්ෂණ වශයෙන් ප්‍රත්‍යක්ෂව දැනගැනීම සඳහාම, ඒවායේ අනිච්චතාව දැකගත හැකිවන්නේයැයි යන අදහසින්, අනිත්‍ය අනුව භාවනා කරන ක්‍රමය අනිච්චානුපස්සනා ඥාණය නම් වේ.

ඒ අතර ද්වාර හයෙහි ඇතිවෙමින්-නැතිවෙමින් පවතින්නා වූ ස්කන්ධ පඤ්චකය සහ  නාම-රූප ධර්මයන් යන මේවා ඇතිවීම්- පැවතීම්- නැතිවීම් ලක්ෂණ සහිත නිසා අනිත්‍ය ධර්ම නම් වෙත්. වෙනත් ආකාරයකට දක්වන්නේ නම් ඇතිවූ සැනින් නැතිවී යන හෙයින්, නිතර වියෝවීම- දුරුවීම සිදුවෙමින් පවතින හෙයින් අනිත්‍ය ධර්මයකි. මේ ඇතිවන- දිරන- නැතිවන ස්වභාවය මෙනෙහි කොට වටහාගත යුත්තක් බැවින් ලක්ෂණය නම් වේ. මේ ලක්ෂණය ඇතිවීමත් හා සමඟම නැතිවී යන බැවින්, විනාශ වී යන බැවින් අනිත්‍ය ලක්ෂණය නම් වේ. එසේ මෙනෙහි කොට භාවනා කිරීමෙන් එම අනිත්‍ය ලක්ෂණය මතුකර ගෙන අනිත්‍යයැයි දිගට මනසිකාරය පැවැත්විය යුතු ඥාණයට *අනිච්චානුපස්සනාව* යැයි කියනු ලැබේ.

**අනිච්චන්ති ඛන්ධ පඤ්චකං කස්මා? උප්පාදවයඤ්ඤථත්ත භාවෙන හුත්වා අභාවතොවා උප්පාදවයඤ්ඤථත්තං අනිච්ච ලක්ඛණං හුත්වා අභාව සංඛාතො වා ආකාර විකාරො.** [වි. මා. 472]

අනිත්‍යය නම් ස්කන්ධ පඤ්චකයයි- කුමක් හෙයින්ද යත්ඃ විනාශය අන්‍යතාත්වය යන ස්වභාව සහිතව ඇතිව නැතිව යන හෙයින් හෝ මෙයාකාර විකාර ස්වභාවය හෝ අනිත්‍ය ලක්ෂණයයි.

අනිච්චතාති තෙසංයෙව උප්පාදවය ඤ්ඤථත්තං හුත්වා අභාවො වාඤ්ඤ නිබ්බත්තානං එතෙනෙවාකාරෙන අට්ඨත්වා ඛණභංගෙන භෙදොති අත්‍ථො. අනිච්චානුපස්සනාති තස්සා අනිච්චතාය වසෙන අනිච්චන්ති අනුපස්සනා. [වි මං 214]

| | | |
|---|---|---|
| අනිච්චතාති | - | 'අනිච්චතා' යනු |
| තෙසංයෙව | - | එම පඤ්චස්කන්ධයන්ගේ ම |
| උප්පාදවයඤ්ඤථත්තං | - | උත්පාද-වය, අඤ්ඤතාත්වය |
| වා | - | එසේ නොමැති නම් |
| හුත්වා අභාවො | - | ඇතිවී වහා නැතිවී යෑම |
| වා නිබ්බත්තානං | - | හෝ ඇති වූ දෙයක් |
| එතෙනෙවාකාරෙන | - | එම ආකාරයෙන් ම |
| අට්ඨත්වා | - | නොපිහිටා |
| ඛණභංගෙන | - | ක්ෂණ මාත්‍ර ලෙස බිඳීමෙන් |
| භෙදො | - | බිඳීම යෑ |
| ඉති අත්‍ථො | - | මෙම අර්ථය |
| අනිච්චානුපස්සනාති | - | "අනිච්චානුපස්සනා" යි |
| තස්සා අනිච්චතාය වසෙන | - | පඤ්චස්කන්ධය අනිත්‍යය වශයෙන් |
| අනිච්චන්ති අනුපස්සනා | - | අනිච්චං යැයි නැවත නුවණින් සළකා බලයි. |

දක්වන ලද අනිත්‍ය ලක්ෂණ දෙක තුළින් හුත්වා අභාව- පහළ වී අභාවප්‍රාප්ත වීම නම් වූ ඇතිවූ සැනින් නැතිවී යෑම යැයි කියන දෙවැනි ලක්ෂණය මතු භංගඤාණ ආදී ස්ථානයන්හි විශේෂයෙන් විස්තර වන නිසා වඩා උතුම් කොට සැළකේ. එම ලක්ෂණය හොඳින් දැක දැන ගත්තේ නම් අනිච්චානුපස්සනා ඤාණය වඩාත් තහවුරු වේ. එම නිසා ටීකාවෙහි එය මෙසේ සටහන් කොට ඇත.

භූත්වා අභාවයේනාති ඉදං ඉතරෙසං චතුන්නං ආකාරානං සංගහකත්තා විසුං වුත්තං [මූල ටීකා (බු.) 2/37]

| | | |
|---|---|---|
| ඉතරෙසං | - | 'භූත්වා අභාව' යන්නෙන් පරිබාහිර වූ |
| චතුන්නං ආකාරානං | - | කියන ලද හතරාකාරයන්ගෙන් |
| සංගහකත්තා | - | සියල්ල එකටම සංග්‍රහ කොට දැක්විය හැකි නිසා |
| භූත්වා අභාවයේනාති ඉදං | = | භූත්වා අභාවයේනාති යන මේ කථාව |
| විසුං වුත්තං | = | අට්ඨ කථාචාර්යයන් විසින් මෙසේ විශේෂ කොට කියන ලදී. |

## සාමාන්‍ය අර්ථය

මෙම සම්මෝහ විනෝදනී අට්ඨ කථාවෙහි ඇතිව නැතිව යෑම අනුව අනිත්‍යයැයි දක්වා අනෙකුත් හේතු කරුණු හතරත් ගෙනහැර පාමින් අනිත්‍යතාවය පෙන්වා දෙයි. මෙලෙස හේතු වශයෙන් කරුණු පහක් වෙන වෙනම නොදක්වා එකම හේතුව වශයෙන් 'භූත්වා අභාවටේඨන' යැයි පමණක් ගෙනහැර දක්වන අට්ඨ කථාචාර්යායන්ගේ අදහස නැතහොත් කරුණු දැක්වීම මෙසේය.

විපස්සනා යෝගී තෙමෙ 'භූත්වා අභාව' යන්නෙන් දැක්වෙන ඇතිවී වහා නැතිවී යන ස්වභාවය අනුව අනිත්‍යයැයි කීම නම් වූ විනාශය, අන්‍යතාත්වය ඇස්පනා පිට දැක දැනගෙන එම මෙනෙහි කළ නාම-රූප එසේම;

| | | |
|---|---|---|
| 01 උප්පාදවයවන්තතා | = | ඉපිද බිඳී යන ස්වභාවය අනුවත්, |
| 02 විපරිණාම | = | මුල් ස්වභාවයෙන් නොසිට වෙනස් තත්ත්වයකට වෙනස්වන පෙරළෙන බව අනුවත්, |
| 03 තාවකාලික | = | එකම හුදු චිත්තක්ෂණයකට සීමාවන තාවකාලික බව අනුවත්, |
| 04 නිච්ච පටික්ඛෙප | - | නිත්‍ය බව ප්‍රතික්ෂේප කරන බව කියාපාන සුළු නිසාත් |

යන අතිරේක කාරණා හතර අනුව තවදුරටත් වටහා ගන්නා නිසාය. කරුණු එසේ හෙයින් 'හුත්වා අභාව' යන්නෙන් දක්වෙන ඇතිවී වහා නැතිවී යන ස්වභාවය නම් වූ අනිත්‍ය ලක්ෂණය අනෙකුත් ඉහත දැක්වූ ලක්ෂණ සියල්ලෙහි පිඬු කිරීමක් ලෙසට මෙහි දක්වයි.

මෙම කාරණා අනුව මෙම විවිධ ලක්ෂණ එකිනෙකින් වෙන්කොට දැක්වීම පිණිස අට්ඨ කථාචාර්යයන් විසින් මෙසේ පහකට බෙදා කියන ලදැයි සිතට ගත යුතු.

**කිඤ්චාපි උප්පාදාදී තිවිධම්පි සංඛත ලක්ඛණත්තාය අනිච්ච ලක්ඛණං තථාපි ජාති ජරාදිසු න දිට්ඨාසු තථා අනිච්ච ලක්ඛණං පාකටං හුත්වා උපට්ඨාති යථා වයලක්ඛණෙහි ආහ 'භංගො නාම අනිච්චතාය පරමා කොඨීති'**

[මහා ටීකා (බු) 2/330]

| | | |
|---|---|---|
| **උප්පාදාදී** | = | උත්පාදය මුල් කොට ඇති |
| **තිවිධම්පි** | = | උත්පාද ඨීති භංග යන මේ තුන ද |
| **සංඛත ලක්ඛණත්තාය** | = | සංඛත ධර්මයන්ගේ ලක්ෂණ වන බැවින් |
| **අනිච්ච ලක්ඛණං** | = | අනිත්‍ය ලක්ෂණයන් ම වන බව |
| **කිඤ්චාපි හොති** | = | එක අතකින් සත්‍යය වේ |
| **තථාපි** | = | එසේම |
| **යථා** | = | එම උත්පාද- ඨීති- භංග යන මේ තුන පමණක් අනිත්‍ය ලක්ෂණය යන්න සත්‍යය නමුත් |
| **වය ලක්ඛණෙහි** | = | වය ක්ෂණයෙහි අනිත්‍යය ලක්ෂණය වඩා ප්‍රකටව පැනෙන්නා සේ |
| **දිට්ඨාසු** | = | දකින ලද |
| **ජාති ජරාදිසු** | = | උත්පාදය ජරාව ආදියෙහි |
| **අනිච්ච ලක්ඛණං** | = | අනිත්‍ය ලක්ෂණය |

න තථා පාකටං හුත්වා

උපට්ඨාති = යම්සේ කි පරිදි ප්‍රකටව නොපැනේද

ඉති = එම හේතුවෙන්

භංගො නාම අනිච්චතාය

පරමා කොටීති = බිඳීම නම් අනිත්‍යතාවයේ උත්කෘෂ්ඨම කෙළවර යැයි

ආහ = අට්ඨ කථාචාර්යයෝ කියති.

## සාමාන්‍ය අර්ථය

හේතු ධර්ම රාශියකගේ සමවායෙන් පෙන්නුම් කරන ස්වභාවයට සංස්කාර ධර්ම යැයි කියනු ලැබේ. ඇති තාක් මෙම සංඛත සියල්ල උප්පාද-ඨිති-භංග යන ධර්මතාවයට යටත් වන්නේය. මෙලෙස ජාති-ජරා-මරණ යැයිද කිවහැකි එම උප්පාද-ඨිති-භංග ලක්ෂණ තුන සංඛත භාවය හුවා දක්වන බැවින් සංඛත ලක්ෂණ යැයි කියනු ලැබේ. අනිත්‍යය=වෙනස්වන බව යැයි කියන තැනදී ද දැනවන්නේ මෙම සංඛත ධර්මයන්ම වේ. කරුණු මෙසේ හෙයින් උප්පාද-ඨිති-භංග වශයෙන් පාලියෙහි දක්වෙන උපැද්ම-පැවැත්ම හා බිඳී යෑම යන මෙම සංඛත ලක්ෂණ තුනම අනිත්‍ය ධර්මයැයි කියන කියමන තාත්ත්වික හෙයින් එසේ යෙදීම යුක්ති යුක්තය. එසේ නමුදු එම සංඛතයන්ගේ උපැද්ම හා පැවැත්ම යන කාරණා දෙක පමණක් දුටු පමණින් ඒවායේ අනිත්‍යතාව කෙනෙකුට ප්‍රකට නොවීමට ඉඩ තිබේ. උපැද්ම හා පැවැත්ම තුල අනිත්‍යතාව ගැබ් වී ඇත්තේ නමුත් එය දැනගත හැක්කේ සුදු ධර්මතාවයක් වශයෙන් පමණි. මක් නිසාද යත් සාමාන්‍ය උපැද්ම හා පැවැත්ම තුළ ඇති අනිත්‍යතාව කෙනෙකුට බැලූ බැල්මට ප්‍රකටව වැටහෙන්නක් නොවන නිසාය. නමුත් අරමුණු බිඳී යන, වියොවී යන, විනාශ වී යන අවස්ථාවල සංඛත ධර්ම වශයෙන් ඒවායේ අනිත්‍ය තාව ප්‍රකටව පැනේ. එම නිසා එම බිඳී යන අවස්ථාවේ ඇති අනිත්‍යය ප්‍රකට බව වෙන අවස්ථා වලට වඩා කැපී පෙනේ. මෙලෙස උප්පාද-ඨිති-භංග යන අවස්ථා තුනෙන් භංග අවස්ථාවෙහි බිඳීම දැක්වෙන, භංග අවස්ථාවෙහි විපරිණාම ස්වභාවය දක්වන මේ අනිත්‍යතාව විශේෂයෙන් ප්‍රකටව පැනෙන නිසා එම භංගයට අනිත්‍ය ලක්ෂණයෙහි වඩාත් ප්‍රකට

අවස්ථාව යැයි අට්ඨ කථාචාර්යයන් වහන්සේ මෙසේ දක්වන්නේ යැයි යන්න මෙහි අදහසයි.

මෙලෙස දක්වූ ආකාරයට අනිත්‍ය ධර්මය සහ අනිත්‍ය ලක්ෂණය යන මේවා වෙන් වෙන්ව පැනෙන නමුත් අනිත්‍ය වූ නාම-රූප ස්කන්ධයන්ගේ ස්වභාව ලක්ෂණයන් ප්‍රකට වන ප්‍රකට වන ආකාරයට මෙනෙහි නොකර අනිත්‍ය ලක්ෂණය අනුව පමණක් සිත යොදමින් කල්පනා කරමින් ප්‍රඥප්ති අනුව බලන නිසා නියම අනිච්චානුපස්සනා ඥාණය පහළ විය නොහැක්කේය. ඇත්ත වශයෙන් ම නාම-රූප ස්කන්ධයන්ගේ ස්වභාව ලක්ෂණ මතුකර ගැනීම සඳහා ඒවායේ ස්වභාව ලක්ෂණ මෙනෙහි කොට ප්‍රකටවන ඒ ඒ අනිත්‍ය ලක්ෂණය දැක දැන ගැනීමෙන්ම නියම අනිච්චානුපස්සනාව පහළ වේ. එම නිසා අත්ථසාලිනි අට්ඨ කථාවෙහි පහත දක්වෙන ලෙසට විවරණය කොට ඇත්තේය.

**වුට්ඨානගාමිනී පන විපස්සනා කිමාරම්මණාති? ලක්ඛණාරම්මණාති. ලක්ඛණං නාම පඤ්ඤත්තිගතිකං න වත්තබ්බධම්මභූතං යො පන අනිච්චං දුක්ඛමනත්තාති තිණි ලක්ඛණානි සල්ලක්ඛෙති, තස්ස පඤ්චක්ඛන්ධා කණ්ඨෙ බද්ධකුණපං විය හොන්ති. සඞ්ඛාරාරම්මණමෙව ඤාණං සඞ්ඛාරතො වුට්ඨාති. යථා හි එකො භික්ඛු පත්තං කිණිතුකාමො පත්තවාණිජෙන පත්තං ආභතං දිස්වා හට්ඨපහට්ඨො ගණ්හිස්සාමීති චින්තෙත්වා වීමංසමානො තීණි ඡිද්දානි පස්සෙය්‍ය, සො න ඡිද්දෙසු නිරාලයො හොති, පත්තෙ පන නිරාලයො හොති, එවමෙව තීණි ලක්ඛණානි සල්ලක්ඛෙත්වා සඞ්ඛාරෙසු නිරාලයො හොති. සඞ්ඛාරාරම්මණෙනෙව ඤාණෙන සඞ්ඛාරතො වුට්ඨාතීති වෙදිතබ්බං. දුස්සොපමායපි එසෙව නයො.**

| | | |
|---|---|---|
| **වුට්ඨානගාමිනී විපස්සනා** | = | වුට්ඨාන ගාමිනී විපස්සනාව |
| **කිමාරම්මණා** | = | කුමක් අරමුණු කරයිද |
| **ති?** | = | යන මේ ප්‍රශ්ණයට |
| **ලක්ඛණාරම්මණා** | = | අනිච්ච දුක්ඛ අනත්ත යන ත්‍රිවිධ ලක්ෂණයන් |
| **ති.** | = | යන්න පිළිතුරයි. |
| **ලක්ඛණං නාම** | = | ලක්ෂණ යනු |

පඤ්ඤත්තිගතිකං = ප්‍රඥප්ති ස්වභාව ඇති

න වත්තබ්බධම්මභූතං = කාම ධර්ම, මහග්ගත ධර්ම යැයි නොකිව මනා, නොකිය යුතු ධර්මයෝය.

පන = නමුදු

යො = යමෙක්

අනිච්චං දුක්ඛමනත්තාති = අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන

තීණි ලක්ඛණානි = ලක්ෂණ තුන

සල්ලක්ඛෙති = මෙනෙහි කොට බලයි නම්

තස්ස = එලෙස මෙනෙහි කරන්නාහට

පඤ්චක්ඛන්ධා = මෙනෙහි කොට බලන පඤ්ච ස්කන්ධයන්

කණ්ඨෙ බද්ධකුණපං විය = ගෙලෙහි බැඳි සර්ප කුණක් සේ

හොන්ති = වන්නේය.

සඞ්ඛාරාරම්මණමෙව = සංස්කාර ධර්මයන් අරමුණු කිරීමෙන්ම පහළ වන

ඤාණං = ඥාන

සඞ්ඛාරතො = සංස්කාරයන් කෙරෙන්

වුට්ඨාති = නැඟී සිටී.

හි = උපමාකාරයෙන් දක්වතොත්

පත්තං කිණිතුකාමො = පාත්‍රයක් මිලදී ගනු කැමති

එකො භික්ඛු = එක් භික්ෂුවක් තෙමේ

පත්තවාණිජෙන

පත්තං ආභතං = පාත්‍ර වෙළෙන්දෙකු විසින් රැගෙන ආ පාත්‍රයක්.

දිස්වා = දැක

හට්ඨපහට්ඨො = තුටු පහටුව

ගණ්හිස්සාමීති

චින්තෙත්වා = මිලදී ගනිමියි සිතා

වීමංසමානො = විමසා බලනුයේ

තීණි ඡිද්දානිපස්සෙය්‍ය = එහි ඇති පලුදු තුනක් දැක

සො ඡිද්දෙසු = එම පලුදු තුන කෙරෙහි

නිරාලයො = අමනාපයක්

න හොති = පහළ නොකරයි.

පන = ඇත්ත වශයෙන්ම වනාහි

යථා = යම්සේ

පත්තෙ නිරාලයො = පාත්‍රය කෙරෙහි අකමැත්තක්

හොති = වන්නේය

එවමෙව = එසේම

තිණි ලක්ඛණානි = ත්‍රිලක්ෂණයන්

සල්ලක්ඛෙත්වා = දැක

සංඛාරෙසු = සංස්කාරයන් කෙරෙහි

නිරාලයෙං = අකමැත්ත, නිරාලය

හොති = වන්නේය

සඞ්ඛාරාරම්මණෙනෙව = සංස්කාර ධර්මයන් අරමුණු කිරීමෙන්ම ලබන්නා වූ

ඤාණෙන = විපස්සනා ඥානයෙන්

සඞ්ඛාරතො = සංස්කාරයන් කෙරෙන්

වුට්ඨාතීති = නැගී සිටී යැයි

වෙදිතබ්බං = දතයුතුය.

දුස්සොපමායපි = රෙදි පටක් මිලදී ගැනීමේ උපමාව ද.

එසෙව නයො = මෙලෙසටම ය.

## සාමාන්‍ය අර්ථය

මස්ථකප්‍රාප්ත සංඛාරානුපෙක්ඛාව හා අනුලෝම ඤාන නම් වූ වුට්ඨානගාමිණී විපස්සනාවට අනුව (**කක්ඛලත්ත**= කර්කශ ගතිය **ඵුසන**= අරමුණ සහ සිත යන දෙකේ හැපීම **විජානන**= අරමුණ දැනගැනීම ආදී කොට ඇත්තා වූ) ස්වභාව ලක්ෂණ වශයෙන් සංස්කාරයන් මෙනෙහි කොට එම සංස්කාරයන්ගේ අනිත්‍යතාවද දැකගෙන අනිත්‍ය, දුක්ඛ, අනත්ත යන ත්‍රිලක්ෂණයන් අතරින් එක ලක්ෂණයක් මත භාවනා කරයි. මෙලෙස

මෙනෙහි කොට භාවනා කරන්නාහට එම භාවනා කරන ලක්ෂණ හා සම්බන්ධ සංස්කාරයන් පිළිකුල් කටයුතු, බැහැර කටයුතු දෙයක් ලෙසටම වැටහේ. උපමාවක් ලෙස කෙනෙකුගේ ගෙලෙහි සර්ප කුණක් හෝ මිනී කුණක් එල්ලුවහොත් යම් සේ හෙතෙම එය පිළිකුල් කරයිද, ලජ්ජාවට පත් වෙයිද, නින්දාවක් කොට සළකයි ද එලෙසිනි. එසේම හෙතෙම එම කුණ ඉවත් කිරීමට මොන තරම් ඉක්මන් වෙයිද? එලෙසින් එම සංස්කාරයන් මත භාවනා කරන්නාගේ ඤාණයට පිළිකුල් කටයුතු, බැහැර කටයුතු දෙයක් ලෙසටම ඒවා වැටහේ. මෙලෙස ලක්ෂණ මත පමණක් නොව සංස්කාරයන්ද සම්බන්ධ කරගෙන භාවනාවට ගොදුරු කරගන්නා බැවින් එම සංස්කාරයන් අනිච්ච ආදි වශයෙන් මෙනෙහි කොට පහළ වන අනුලෝම ඤාණයට අනතුරුවම පහළ වන ගෝත්‍රභූ හා මග්ග ඤාණ යන මේවා එම සංස්කාරයන්ගෙන් පරිබාහිරවම පහළ වේ. පරිබාහිරව යනු එම සංස්කාරයන් ඉක්මවා- අරමුණු නොකොට සංස්කාරයන්ගෙන් තොරවූ නිර්වාන අරමුණට වැදගනී යන්නය. ලක්ෂණයන් දැක දැනගෙන එම ලක්ෂණ හා බැඳුනු සංස්කාර බැහැර කිරිම සම්බන්ධයෙන් උපමාවක් ලෙස; පාත්‍රයක් ලබා ගැනිමට කැමැත්තෙකු පාත්‍ර විකුණන්නකු විසින් පෙන්වන ලද පාත්‍රයක් පරීක්ෂා කොට බලනුයේ ඒ ගැන පැහැද මිලදී ගනිමියි සිතාගෙන තවදුරටත් බලනුයේ එහි ඇති සිදුරු තුනක් දැක සිදුරු සහිත නිසා එම පාත්‍රය මත වූ කැමැත්ත බැහැර කරයි. මෙවන් අවස්ථාවක පාත්‍රය මිලදී ගැනිමට කැමැත්තෙන් සිටි තැනැත්තා සිදුරු දැකිමට කලින් එම පාත්‍රය ගැනීමට කැමති විය. එබැවින් සිදුරු දකින අවස්ථාවේ පාත්‍රය ගැනීමට ඇති වූ අකමැත්ත පාත්‍රය හා කෙළින්ම සම්බන්ධය. සිදුරු තුන පිළිබඳව වූ කමැත්තක දුරුවීමක් මෙයින් නොකියවේ. මක් නිසාද යත්? එම සිදුරු දැකීමට කලින් පවා එම සිදුරු පිළිබදව කිසිම කැමැත්තක් නොතිබුන බැවිනි. මෙලෙසටම යෝගාවචරයාද ලක්ෂණ තුන දැකීමට පෙරාතුව සංස්කාරයන් පිළිබඳව ලොකු බැඳීමක් ඇතිව පසුවිය. අනිච්ච- දුක්ඛ- අනත්ත යන මේ ලක්ෂණ තුන සම්බන්ධයෙන් කිසිම විටෙක කැමැත්තක් නොවිය. එම නිසා මෙම පිළිකුල හා බැහැර කිරිමේ කැමැත්ත එම ලක්ෂණ හා බැඳී ඇති සංස්කාර සම්බන්ධයෙන්ම විශේෂිත වු බැහැර කිරිමේ කැමැත්තකි. එසේ නැතිව එම ලක්ෂණ මුණ නොවේ. මෙලෙස ලක්ෂණද

සහිතව අදාළ සංස්කාරයන් බැහැර කිරීමේ අදහසින් මෙනෙහි කොට භාවනා කොට පහළ වූ විපස්සනාවක් නිසා ඒ හා සමඟම නිවන අරමුණු කොට පහළ වන ගෝත්‍රභූ සහ මාර්ග ඥාණ යන මේවා සංස්කාරයන් සමඟ කිසිම සම්බන්ධයක් නැති බව මෙහි මුඛ්‍ය අර්ථයයි. අටුවාවේ දැක්වෙන මෙමම අදහස විශුද්ධි මාර්ග මහා ටීකාවෙහි දැක්වෙන්නේ මෙසේය.

**අනිච්චන්ති ආදිනා සංඛාරෙසුපවත්තමානෙන ඤාණෙන ලක්ඛණානිපි පටිවිද්ධානි හොන්ති. තදාකාරසංඛාරගහනතොති ආහ ලක්ඛණාරම්මණාති. සංඛාරා ලක්ඛණාරම්මණා එව යථාවුත්තාධිප්පායෙන ලක්ඛණාරම්මණතාති වුත්තාති දස්සෙන්තො ලක්ඛණං නාමාති ආදිමාහ. අනිච්චතා දුක්ඛතා අනත්තතාති හි විසුං ගය්හමානං ලක්ඛණං පඤ්ඤත්තිගතිකං පරමත්ථතො අවිජ්ජමානං. අවිජ්ජමානත්තා එව පරිත්තාදිවසෙන න වත්තබ්බධම්මභූතං. තස්මා විසුං ගහෙතබ්බස්ස ලක්ඛණස්ස පරමත්ථතො අභාවො අනිච්චං දුක්ඛං අනත්තාති සංඛාරෙ සභාවතො සල්ලක්ඛෙන්තොව ලක්ඛණානි සල්ලක්ඛෙති නාමාති ආහ. යො පන අනිච්චං දුක්ඛං අනත්තාති තීණි ලක්ඛණානි සල්ලක්ඛෙතීති. යස්මා ච අනිච්චන්ති ආදිනා සංඛාරාව දිස්සමානා. තස්මා තෙ කණ්ඨෙ බද්ධ කුණපං විය පටිනිස්සජ්ජනීයා හොන්ති.**

[මූල ටී. (බු) 1/115]

| | | |
|---|---|---|
| **අනිච්චං** | = | අනිත්‍යය |
| **ඉති ආදිනා** | = | මේ ආදි |
| **සංඛාරෙසු** | = | සංස්කාරයන් කෙරෙහි |
| **පවත්තමානෙන ඤාණෙන** | = | පවත්නාකාර ඥාණය |
| **ලක්ඛණානිපි** | = | අනිත්‍ය-දුක්ඛ-අනාත්ත යන ලක්ෂණයන්ද |
| **පටිවිද්ධානි** | = | විනිවිද දැක ගත්තා |
| **හොන්ති** | = | වෙත් |
| **තදාකාරසංඛාරගහනතො** | = | එයාකාර සංස්කාරයන් පිළිබඳ වැටහීම නිසා |
| **ඉති** | = | මෙසේ සංස්කාරයන් අනිත්‍ය-දුක්ඛ-අනාත්ත යැයි දැනගන්නා ඥාණයෙන් ලක්ෂණයන්ද දැකගන්නා නිසා |

| | | |
|---|---|---|
| ලක්ඛණාරම්මණාති | = | වුඨානගාමිණී විපස්සනාව ලක්ෂණයන් අරමුණු කරන්නේ යැයි |
| ආහ | = | අට්ඨකතාචාර්යයවරයෝ කීහ |
| සංඛාරා ලක්ඛණාරම්මණා එව | = | සංස්කාරයන් අරමුණු කිරීමෙන්ම සිදුවන විපස්සනාව |
| යථාවුත්තාධිප්පායෙන | = | සංස්කාරයන් අනිත්‍ය-දුක්ඛ-අනාත්ම යැයි දැනගන්නා ඤාණයෙන් ලක්ෂණයන්ද දැකගන්නේ යැයි දැක්වීමේ අදහස ඇතිව |
| ලක්ඛණාරම්මණතාති වුත්තාති | = | 'ලක්ඛණාරම්මණතා' යි කියනු ලබන කීම |
| දස්සෙතුං | = | හුවා දැක්වීමට |
| ලක්ඛණං නාමාති ආදිං | = | 'ලක්ඛණං නාම' ආදි පාඨ |
| ආහ, | = | කියන ලදි |
| හි | = | විස්තර කොට දක්වන්නේ නම් |
| අනිච්චතා | = | මේ අනිත්‍යතාවය හුදු සිතා-මතා දැනගන්නා ලද අනිත්‍යයක් බැවින් |
| දුක්ඛතා | = | මේ දුක්ඛතාවය හුදු සිතා-මතා දැනගන්නා ලද දුක්ඛතාවයක් බැවින් |
| අනත්තතාති | = | මේ අනාත්මතාවය හුදු සිතා-මතා දැනගන්නා ලද අනාත්මයක් බැවින් |
| ඉති විසුං | = | ඒ අනුව |

---

සංස්කාරයන් ඇති සැටියෙන් මෙනෙහි කරන්නේ නම් අනිත්‍ය-දුක්ඛ-අනත්ත යැයි දැනගන්නා ඤාණය මගින් අනිත්‍ය-දුක්ඛ- අනත්ත ලක්ෂණයන් ද වටහා ගන්නා බැවින්ම මෙයට ලක්ඛණාරම්මණ යැයි කියන ලදි. සංස්කාරයන්ගේ මූල ස්වභාවය අනුව ඇතිවනවාත් සමගම මෙනෙහි කොට ඇස්පනාපිටම ඇතිසැටිය වටහා ගැනීමකින් තොරව අනිත්‍ය-දුක්ඛ-අනත්ත ලක්ෂණයන් පමණක්ම අරමුණු කරන බැවින් මෙසේ 'ලක්ඛණාරම්මණතා' යි කියනු නොලැබේ.)

ගය්හමානං = ගන්නා, සිතා ගන්නා

ලක්ඛණං = ත්‍රිලක්ෂණයන්

පඤ්ඤත්තිගතිකං = ප්‍රඥප්ති ස්වභාවය ගති

පරමත්ථතො = පරමාර්ථ වශයෙන්

අවිජ්ජමානං = විද්‍යමාන වන්නක් නොවේ.

අවිජ්ජමානත්තා එව = මෙසේ අවිද්‍යමාන බැවින්ම

පරිත්තාදිවසෙන = කාමාවචර ධර්මයකි ආදී වශයෙන්

න වත්තබ්බධම්මභූතං = කීමට තරම් නොවේ. කිව නොහැකිය.

තස්මා විසුං ගහෙතබ්බස්ස

ලක්ඛණස්ස පරමත්ථතො

අභාවො = වෙන් වෙන් වශයෙන් සළකා බැලිය යුතු ලක්ෂණයන් වනාහි පරමාර්ථ වශයෙන් නොපැවැත්මේ හේතුවෙන්

සංඛාරෙ = නාම-රූප සංස්කාරයන්

සල්ලක්ඛෙන්තොව = මෙනෙහි කොට භාවනා කරන්නේ නම් පමණක්

වා = එසේ මෙනෙහි කරන්නා හටම

අනිච්චං දුක්ඛං අනත්තාති = අනිත්‍ය-දුක්ඛ-අනාත්ත යැයි

ලක්ඛණානි = අනිත්‍ය-දුක්ඛ-අනාත්ත ලක්ෂණයන්

සභාවතො සල්ලක්ඛෙති

නාම = නියම ලෙස මෙනෙහි කරන්නේ නම් වේ යැයි

ඉති = මෙම කාරණය

ආහ = කියන ලදි.

අනිච්චන්ති = අනිච්චං

ආදිනා = ආදි වශයෙන්

සංඛාරාව = සංස්කාරයන්ම

යස්මා = යම් හෙයකින්

| | | |
|---|---|---|
| **දිස්සමානා** | = | භාවනා කරයිද |
| **තස්මා** | = | එසේ සංස්කාරයන්ම අනිත්‍ය-දුක්ඛ-අනත්ත යැයි භාවනා කොට බලන නිසා |
| **තෙ** | = | මෙලෙස භාවනාවට නංවන ලද එම සංස්කාර |
| **කණ්ඨෙ බද්ධ කුණපං විය** | = | තම ගෙලෙහි බැඳි මළ කුනක් සේ |
| **පටිනිස්සජ්ජනීයා** | = | බැහැරකරන සුළු පිළිකුල් කරන සුළු |
| **හොන්ති** | = | වෙත් |

මෙම අට්ඨ කථා ටීකා දැක්වීම් වලට අනුව ඉදිරිපත් වන නාම-රූප සංස්කාරයන් ඒවායේ ස්වභාව ලක්ෂණ අනුව මෙනෙහි කිරිමෙන් යට දක්වන ලද අනිච්ච ලක්ෂණය ආදී එකක් ප්‍රකට වී එම ප්‍රකටවීම අනුව අනිත්‍ය යැයි දැනගන්නා ඤාණය අනිච්චානුපස්සනා ඤාණය නම් වේ. ස්වභාව ලක්ෂණයන් මෙනෙහි කොට භාවනා කිරිමෙන් පහළ වූ නාම-රූප පරිච්ඡෙද ඤාණය- පච්චය පරිග්ගහ ඤාණය යන ඤාත පරිඤ්ඤා අවස්ථාවේ පවතින මේ අනුපස්සනා ඤාණය, ආරම්භක ස්වභාවයෙන් පමණක් දැනගන්නා අවස්ථාවේ පවතින නිසා නියම අනිච්චානුපස්සනාව යැයි කිව නොහැක. සම්මසන ආදී ඉහළ ඤාණ අවස්ථාවන්හිදී පමණක් අනිච්ච දුක්ඛ අනත්ත ලක්ෂණයන්ද දැක දැනගන්නා නිසා අනිච්චානුපස්සනා ආදී නම් යෙදෙති. එම අවස්ථාවෙහි වෙනස්වනසුලු ස්වභාවය වශයෙන් දැනගන්නේ නම් අනිච්චානුපස්සනා නම් වේ. දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා යන නම් නොවෙත්, එනයින් පෙළන සුළු බව වශයෙන් දැන ගන්නේ නම් දුක්ඛානුපස්සනා නම් වේ. පාළනය කළ නොහැකි බව වසගයෙහි පැවැත්විය නොහැකි බව වශයෙන් දැක දැන ගන්නේ නම් අනත්තානුපස්සනා නම් වේ. අනෙකුත් වූ දුක්ඛානුපස්සනා ආදිය නොයෙදේ. පහත දැක්වෙන්නේ විභංග මූල ටීකා උද්ධෘතයෙකි.

**අනිච්චාදිහි අනිච්චලක්ඛණාදීනං අඤ්ඤත්තවචනං රුප්පනාදිවසෙන පවත්ත රූපාදිග්ගහනතො විසිට්ඨස්ස අනිච්චාදිග්ගහණස්සසබ්භාවා. න හි නාමරූප පරිච්ඡෙද මත්තෙන කිච්චසිද්ධි හොති අනිච්චාදයො ච රූපාදීනං ආකාරො දට්ඨබ්බා අනිච්චන්ති ච ගණ්හනෙතා දුක්ඛං අනත්තාති න ගණ්හාති තථා දුක්ඛාදිග්ගහණෙ ඉතරස්සාග්ගහානං.** [මූල ටී. (බු) 2/35]

| | | |
|---|---|---|
| අනිච්චාදිහි | = | අනිච්ච දුක්ඛ අනත්ත නම් වූ ස්කන්ධයන්හි |
| අනිච්චලක්ඛණාදිනං | = | අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්ෂණයන් |
| අඤ්ඤත්ත වචනං | = | තිබියදී වෙනත් දෙයක් කීම |
| රුප්පනාදිවසෙන පවත්ත රූපාදිගහනතො | = | රුප්පන ලක්ෂණය ආදි වශයෙන් ඇති රූප ආදිය ගැනීම- පිළිගැනීමට වඩා |
| විසිට්ඨස්ස | = | විශේෂ වූ |
| අනිච්චාදිගහණස්ස | = | අනිත්‍ය ලක්ෂණය ආදිය ගැනීම-දැන ගැනීමේ |
| සබ්භාවා | = | ස්වභාවය යි |
| හි | = | තවදුරටත් විස්තර වශයෙන් දක්වන්නේ නම් |
| නාමරූප පරිච්ඡෙද මත්තෙන | = | නාම-රූප පරිච්ඡේද කළ පමණින් |
| කිච්චසිද්ධි | = | අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා යන මේ කෘත්‍යයන් සාධනය |
| න හොති | = | නොවේ |
| රූපාදීනං | = | රූපාදී ස්කන්ධයන් ගේ |
| අනිච්චාදයො ආකාරො ච | = | අනිත්‍යාදී ආකාරයන්ද |
| දට්ඨබ්බා | = | මෙලෙසටම මෙනෙහි කොට භාවනා වෙන් දත යුතුයි. |

පඤ්චස්කන්ධය එහි ස්වභාව ලක්ෂණ වශයෙන්ම දැක-දැන ගැනීම එක් ආකාරයකි. එම ස්කන්ධයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණයන් ද සහිතව දැක-දැන ගැනීම වෙනත් එකකි. මෙලෙස මෙම විශේෂ ඤාණ විස්තර වශයෙන් බෙදා වෙන්කොට දක්වා ඇති බැවින් අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම නම් වූ ස්කන්ධයන්ගෙන් වෙන් කොට අට්ඨ කථාවල මෙලෙස දක්වනු ලැබේ. ඉදින් මෙලෙස

විස්තර වශයෙන් විභාග නොකොට වෙන්කොට දක්වන්නේ නැති නම් නාම-රූප වෙන්කොට දැනගත් පමණින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යැයි දැනගැනීම සම්පූර්ණ වන්නේද? එය එසේ වන්නක් නොවේ. එසේ සම්පූර්ණ නොවන නිසාම එම ස්කන්ධයන් අනිච්ච දුක්ඛ අනත්ත වශයෙන් තීරණ පරිඥ්ඥාව සිදුවන්නා වූ මතු සම්මසන ඥාණ ආදී ක්‍රමයට මෙනෙහි කොට දිගට භාවනාව කරගෙන යා යුතුව ඇත. එම නිසා අනුටීකාවෙහිඃ 'තමෙව භෙදං ඤාත තීරණ පරිඤ්ඤා විසයතාය පාකටං කාතුං 'නහි'ති ආදිමාහ' යනුවෙන් විස්තර කරයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම නම් වූ ස්කන්ධයන් ඥාත පරිඥ්ඥාවේ භූමිය- පදනම වේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණයන් ආදිය තීරණ පරිඥ්ඥාවේ භූමියයි. මෙලෙස පිරිසිදුව කාරණය වටහාගත යුතුය.

| | | |
|---|---|---|
| ච | = | තවදුරටත් |
| අනිච්චන්ති ගණ්හනෙතා | = | අනිත්‍යය මෙනෙහි කොට වටහා ගන්නා තැනැත්තේ |
| වා | = | අනිත්‍ය යැයි මෙනෙහි කිරීමෙන් |
| දුක්ඛං අනත්තාති | = | දුක්යැ අනාත්මය යැ යි |
| න ගණ්හාති | = | භාවනාව නොවේ |
| තථා | = | එලෙසටම |
| දුක්ඛාදිග්ගහණෙ | = | දුක්ඛ ලක්ෂණය ආදිය මෙනෙහි කොට වටහා ගැනීමෙන් |
| ඉතරස්ස | = | අනෙකුත් ඉතිරි අනිත්‍ය ලක්ෂණය ආදිය පිළිබඳව |
| අග්ගහානං | = | භාවනානුකූල වැටහීම නොවන බව |
| වෙදිතබ්බං | = | වටහාගත යුතුය. |

## අනිච්චානුපස්සනාව සිදුවන අවස්ථාව

පහළ වන, පහළ වන නාම-රූප ඒවායේ ස්වභාවික ආකාරයෙන් ම මෙනෙහි කරමින් භාවනා කරන යෝගාවචරයාහට සන්තති ඝනය බිඳින තරමට විපස්සනා ඤාණය මුහුකුරා ගියවිට මෙම අනිච්චානුපස්සනාව පහළ වේ. විස්තර වශයෙන් දක්වන්නේ නම්; පහළ වන නාම-රූප ඒ මතුවන මතුවන ක්ෂණයෙහි මතුවන මතුවන ආකාරයට මෙනෙහි කිරීම සිදුනොවන්නේ නම් එම නාම-රූපයන්ගේ ප්‍රකෘති ස්වභාවය දැනගත නොහැක්කේය. එම නාම-රූපයන්ගේ ඇතිවීම-නැතිවීම දැකගත නොහැකි වන්නේ යැයි අමුතුවෙන් කිව යුත්තක් නැත. මෙලෙස මෙනෙහි කරමින් භාවනා නොකරන නිසා නාම-රූපයන්ගෙ නියම ඇතිවීම-නැතිවීම පිළිබඳ වැටහීමක් නැති සාමාන්‍ය පුද්ගලයා සක සන්තානයේ ඇති රූප ප්‍රවාහය නැවත නැවත දක්නා කල්හි පෙර පෙර දක්නා ලද රූප ප්‍රවාහය සහ පසු පසු දකින රූප ප්‍රවාහය එකක්ම යැයි වරදවා වටහා ගනී. සද්දයක් ඇසීමේදී ආදියෙහිදීද ක්ෂණයක් ක්ෂණයක් පාසා මතුවන ශබ්ද තරංග ප්‍රවාහය එකක්ම ලෙස වරදවා වටහා ගනී. පෙර පෙර දැකීම් පසු පසු දැකීම් සමඟ ගළපා එකක්මයැයි වරදවා වටහා ගනී. පෙර පෙර ඇසීම් පසු පසු ඇසීම් සියල්ල එකක්ම ලෙස වරදවා වටහා ගනී. තම සන්තානයේ සිදුවන දැකීම් ඇසීම් ආදි සියලු දැනීම් සියල්ල එකක්ම ලෙස දිගින් දිගට වරදවා වටහා ගනී. මෙලෙස එකක්ම ලෙස වන තරමට අතරක් නොතබා දිගින් දිගට පහළ වෙමින් පවතින නාම-රූපයන්ගේ සන්තතිය **සන්තති ඝන** නම්වේ. මෙම **සන්තති ඝන**යෙන් වැසී ආවරණය වී ඇති නිසා සාමාන්‍ය පුද්ගලයාට 'යමක් පහළ වී නම් එය ඒකාන්තයෙන් විනාශ වී යන්නේයැයි ' කියන අනිත්‍ය ලක්ෂණය ප්‍රකට නොවේ. **සන්තති ඝන**යෙන් ආවරණය වීම යනු අඛණ්ඩව පවතින රූප-නාම සන්තතියක් ප්‍රකටවම පිළිගැනීම වන්නේය. සදාතනිකවම පවතින්නේයැයි සිතින් සිතා ගැනීම වන්නේමය. මෙම **සන්තති ඝන**ය වනාහි අඛණ්ඩව ඇතිවෙමින් නැතිවෙමින් පවතින නාම-රූපයන්ගේ එම ඇතිවීම-නැතිවීම අසතිමත්ව- නුවණින් මෙනෙහි නොකොට සිටීම නිසාම ඇතිවන මුළාවකි. මෙලෙස සන්තති ඝනයෙන්

වැසි ඇති නිසා සාමාන්‍ය පුද්ගලයෙකුට යමක් 'ඇතිවූ සැනින් විනාශ වී යන්නේය, යන අනිත්‍ය ලක්ෂණය ප්‍රකටව නොපැනේ. **සන්තති ඝනය** යනු අතරක් නොතබා දිගින් දිගට සිදුවන රූප-නාම සන්තතියේ පහළ වීම පමණක් දැකීමය. එසේම එය දිගටම අඛණ්ඩව පවතින්නේය යැයි සිතින් සිතා ගැනීමයි. මෙම **සන්තති ඝනය** ඇතිවෙමින්-වැනසෙමින් පවතින නාම-රූපයන්ගේ එම උයද-වය වෙත එළඹි සිහියකින් තොරව මෙනෙහි නොකර සිටීම නිසා වැසි පවතී. නාම-රූපයන්ගෙ මූල උපැදිම-අග වියෝව පිළිබඳව එළඹ සිටි සිහියෙන් යුක්තව මතුවන මතුවන වාරයේ මෙනෙහි කරමින් භාවනා කරන්නා හට එක එකක් රූප එක එකක් නාම පවා ඇතිවන අවස්ථාවේ එකකි. වියෝවී යන අවස්ථාවේ වෙනත් එකකි යැයි විසිතුරුව විස්තර සහිතවම ප්‍රකටව පැනේ. එසේම 'පෙර පෙර පහළ වූ රූප එකක් වන අතර පසු පසු පහළ වන රූප ඊට හාත් පසින්ම වෙනස් ඒවා බව- පෙර පෙර පහළ වූ නාම එකකි පසු පසු පහළ වන නාම ඊට හාත්පසින්ම වෙනස් ඒවායැ' යි ඉතා සජීවීව විසිතුරුව වැටහෙන්නට පටන් ගනී. දිගටම අඛණ්ඩව පවතින යමක් ලෙස- ඒකකයක් ලෙස නොපැනේ. එසේ මෙනෙහි කරමින් භාවනා කරන්නාහට මෙනෙහි කරන රූප-නාමයන් පෙර හා පසු සම්බන්ධතාවයකින් තොරව ඇතිවෙමින් නැතිවෙමින් පවතින්නක් ලෙසටම වැටහේ. මෙලෙස යෝගාවචරයාට ඇති සැටිය වැටහෙන නිසා පවතික එකක් ලෙස ගැනීමකට තුඩු දෙන **සන්තති ඝනය** යන්න බිඳියයි. එවන් අවස්ථාවට එම සන්තති ඝනය බාධා නොකරන නිසා ආවරණය නොකරන නිසා මෙනෙහි කරන නාම-රූපයන්ගේ ඇතිවීම-දිරීම-නැතිවීම නම් වූ අනිත්‍ය ලක්ෂණය මෙන්ම මතුවූ සැනින් බිඳී යන්නේය, විනාශ වී යන්නේය කියන්නා වූ අනිත්‍ය ලක්ෂණය ඉබේටම වැටහෙන්නට පටන් ගන්නේය. එතෙක් **සන්තති ඝනය** බිඳළු තැන් පටන් හෙවත් ඉබේටම නියම ආකාරයෙන් අනිත්‍යය අනුව දැක දැන ගන්නා තැන් පටන් නියම අනිච්චානුපස්සනාව පහළ වේ.

## අතිරේක තොරතුරු

මෙලෙස නියම අනිච්චානුපස්සනාව ප්‍රකටව දැක දැනගත් තැන පටන් මතුවන මතුවන නාම-රූප ධර්ම 'අනිච්චං-අනිච්චං හෝ වෙනස්වේ-වෙනස්වේ' යැයි කැමති නම් මෙනෙහි කොට බැලීමද කළ හැක්කේය. මෙලෙස සුවිශේෂී ලෙස දුක්ඛ, අනත්ත ලක්ෂණයන් ප්‍රකටවන අවස්ථාවේ එලෙසටම මෙනෙහි කොට බැලීමට කැමති වන්නේ නම් 'දුක-දුක යැයි හෝ අනාත්ම-අනාත්ම' යැයි මෙනෙහි කළද වරද නැති නමුත් නිකං කටපාඩමින් කීම හෝ 'අනිච්චං-දුක්ඛං- අනත්තං' යැයි සිතින් සිතාගෙන බැලීම මෙයින් අදහස් නොකෙරේ. මෙනෙහි කරන කරන වාරයේ නියම අනිච්ච-දුක්ඛ අනත්ත ලක්ෂණයන් ප්‍රකට වීම අනුව ඇස්පනා පිට දැක දැනගෙන එහි පැහැදීමම මෙහිලා වැදගත් කාරණයයි. අනිච්ච-දුක්ඛ අනත්ත යැයි මෙනෙහි නොකළත් සිතින් නොකිවත් මෙනෙහි කරන කරන වාරයේ නියම අනිච්ච- දුක්ඛ- අනත්ත ලක්ෂණයන් ප්‍රකටව දැක දැන ගන්නේ නම් අනිච්චානුපස්සනාව ආදි ඤාණ පහළවන්නේමය. තව දුරටත් අනිච්ච-දුක්ඛ අනත්ත යැයි විශේෂයෙන් සිත යොදා එයටම මනසිකාරය යෙදුවහොත් අනිච්ච- දුක්ඛ-අනත්ත ලක්ෂණයන් භාවනාවෙන් ප්‍රකට නොවුනත් සිතේ ඇති සංඥාවට අනුව ඇත්තටම වැටහුනා සේ වරදවාගත හැක්කේය. එම සංඥාවම ඤාණය යැයි වරදවා වටහා ගැනීම සිදු විය හැක්කකි. එම නිසා මෙනෙහි කිරීම කරන ආකාරය පෙන්වා දුන් පස්වන පරිච්ඡේදයේ 'අනිච්ච-දුක්ඛ-අනත්ත' යැයි සිතයොදා මෙනෙහි කිරීමක් නොදක්වා ඇතිව නැතිව යන සුලු නාම-රූප මතුවන මතුවන ආකාරයට දැන ගැනීම සඳහා මතුවනවාත් හා සමගම මෙනෙහි කිරීම පමණක් දක්වන ලදි. මේ වනාහි විශේෂයෙන් සිතතබා ගතයුතු කාරණයයි.

අනිච්ච ලක්ඛණං තාව උදයබ්බයානං අමනසිකාරා සන්තතියා පටිච්ඡන්නත්තා න උපට්ඨාති උදයබ්බයං පන පරිග්ගහෙත්වා සන්තතියා විකොපිතාය අනිච්ච ලක්ඛණං යාථාව සරසතො උපට්ඨාති

[ වි. ම. 480]

| | | |
|---|---|---|
| තාව | = | ප්‍රථමයෙන් |
| අනිච්ච ලක්ඛණං | = | අනිච්ච ලක්ෂණය |
| උදයබ්බයානං අමනසිකාරා | = | උදය වය දෙකට මනසිකාරය නොයොදන නිසා |
| සන්තතියා පටිච්ඡන්නත්තා | = | එකම සන්තතියක් යැයි වරදවා වටහාගන්නා වූ අඛණ්ඩව සම්බන්ධ වෙමින් පහළ වන පෙර පසු රූප - නාම යන්ගේ ප්‍රවාහය නිසා පිළිසන් කරන බැවින් |
| න උපපට්ඨාති | = | ප්‍රකට නොවේ. |
| පන | = | ප්‍රකට වන ආකාරය වනාහි |
| උදයබ්බයං පරිග්ගහෙත්වා | = | උදය-වය දෙක පරිග්‍රහ කොට බලා |
| සනකතියා විකොපිතාය | = | පෙර පසු රූප - නාම සන්තතිය බිඳලූ |
| අනිච්ච ලක්ඛණං | = | අනිත්‍ය යැයි නිවැරදිව මෙනෙහි කිරීම නිසා පහළ වූ අනිච්ච ලක්ෂණය |
| යථාව සරසතො | = | යථා ස්වරූපයෙන් |
| උපට්ඨාති | = | ප්‍රකට වේ. |

සන්තතියා හි සස පටිච්ඡන්නත්තා අනිච්ච ලක්ඛණං න උපට්ඨාති සාච සන්තති උදයබ්බයා මනසිකාරෙන ජාතා උදයබ්බයං පස්සතො න උදයාවත්ථා වයාවත්ථං පාපුණාති, වයාවත්ථා ච උදයාවත්ථං අඤ්ඤාච උදයක්ඛණො. අඤ්ඤා වයක්ඛණොති එකොපි ධම්මො ඛණ වසෙන භෙදතො උපට්ඨාති - පගෙව අතීතාදිකොති ආහ උදයබ්බයං පන - පෙ- උපට්ඨා තීති. තත්ථ සන්තතියා විකොපිතා යාති පුබ්බාපරියෙන පවත්තමානානං ධම්මානං අඤ්ඤාඤ්ඤභාව ලක්ඛණෙන සන්තතියා උගඝටිතාය, නහි සම්මදෙව උදයබ්බයං සල්ලක්ඛෙන්තස්ස ධම්මා සම්බන්ධභාවෙන උපට්ඨහන්ති, අථඛො අයො සලාකා විය අසම්බන්ධ භාවෙනාති සුට්ඨුතරං අනිච්ච ලක්ඛණං පාකටං හොති

[මහා ටී. (බු.) 2/436-437]

| | | |
|---|---|---|
| සන්තතියා | = | සන්තතියෙන් |
| පටිච්ඡන්නත්තා | = | පිළිසන් බැවින් |
| අනිච්ච ලක්ඛණං | = | අනිච්ච ලක්ෂණය |
| අස්ස | = | එම මෙනෙහි නොකරන්නාට |
| න උපට්ඨාති | = | ප්‍රකට නොවේ. |
| සාච සන්තති | = | එම සන්තතිය ද |
| උදයබ්බයාමනසිකාරෙන | = | උදය - වය දෙකට අනුව මනසිකාරය නොපැවැත්වීම නිසා |
| පටිච්ඡාදිකා | = | පිළිසන් කළ හැකි |
| ජාතා | = | වේ |

(උදය - වය දෙක මෙනෙහි නොකරන නිසා සන්තතිය පිළිසන් විය හැක. සන්තතිය පිළිසන්ව ඇති බැවින් අනිච්ච ලක්ඛණය අප්‍රකටවම පවතින්නේ යැයි කියැවේ.)

| | | |
|---|---|---|
| උදයබ්බයං | = | උදය වය දෙක |
| පස්සතො | = | දකින කෙනාට |
| උදයාවත්ථා | = | උදය අවස්ථාව |

| | | |
|---|---|---|
| වයාවත්‍ථං න පාපුණාති | = | වය අවස්ථාවට නොපැමිණේ |
| වයවත්‍ථා වා උදයා | | |
| වත්‍ථං න පාපුණාති | = | වය අවස්ථාව ද නැවත උදය අවස්ථාවට පත් නොවේ. |
| උදයක්‍ඛණො | = | උදය ක්‍ෂණය |
| අඤ්ඤො එව | = | වය ක්‍ෂණයෙන් වෙනසි. |
| වයලක්‍ඛණො | = | වය ලක්‍ෂණය |
| අඤ්ඤො එව | = | උදය ක්‍ෂණයෙන් වෙනස් වේ. |
| ඉති | = | මෙසේ |
| එකොපි ධම්මො | = | එකම වූ රූපි ධම් එකම වූ නාම ධම් ද |
| ඛණ වසෙන | = | උදය ක්‍ෂණය, වය ක්‍ෂණය වශයෙන් |
| භෙදතො | = | වෙනස්ව |
| උපට්ඨාති | = | ප්‍රකට වේ. |
| අතීතාදිකො | = | අතීත ආදී ධම් |
| පගව | = | වෙනස්ව පැණෙන බව විශේෂයෙන් කිව යුතු නොවේ. |

(අතීතය හා පච්චුප්පන්නය, පච්චුප්පන්න හා අනාගත යන කාල වශයෙන් බෙදීම ඉතාමත් පැහැදිළිව පැනෙයි යන්න මෙයින් අදහස් කෙරේ.)

| | | |
|---|---|---|
| ඉති | = | මෙසේ වෙනස්ව පැණෙන නිසා |
| උදයබ්බයං පන-පෙ- | | |
| උපට්ඨාතීති | = | උදය-වය වශයෙන් පැනේ යැයි ආභ අට්ඨකථාචාර්යයන් වහන්සේ දක්වයි. |
| තත්‍ථ | = | එම කථාවෙහි |
| සන්තතියා | | |
| විකොපිතායාති | = | 'සන්තතියා විකොපිතායාත' යන්න වනාහි |
| පුබ්බාපරියෙන | = | පෙර පසු වීම් වශයෙන් |
| වා | = | පෙර පසු සම්බන්ධවීම් වශයෙන් |

| | | |
|---|---|---|
| පවත්තමානානං ධම්මානං | = | පහළ වූ නාම-රූපයන්ගේ |
| අඤ්ඤාඤ්ඤ භාව | | |
| ලක්ඛණෙන | = | අන්‍යෝන්‍ය බව මෙනෙහි කරන බැවින් |
| වා | = | එකක් එකක් බැගින් වෙන වෙනම මෙනෙහි කරන බැවින් |
| සන්තතියා | = | රූප නාමයන් අඛණ්ඩව එකිනෙක සම්බන්ධව පවතින සන්තතිය |
| උග්ඝාටිතාය | = | වැසුම් හළ බව, උඩුකුරු කළ බව |
| හි | = | ඇත්තය |
| උදයබ්බයං | = | උදය-වය දෙක |
| සම්මදෙව | = | සම්‍යක් ලෙස |
| සල්ලක්ඛෙන්තස්ස | = | මෙනෙහි කරන්නාට |
| ධම්මා | = | රූප ධර්ම - නාම ධර්මයෝ |
| සම්බන්ධභාවෙන | = | සම්බන්ධවීම් වශයෙන් |
| න උපට්ඨහන්ති | = | නොපැණේ |
| අථ ඛො | = | ඇත්ත වශයෙන් වනාහි |
| අයො සලාකා විය | = | පිළවෙලට තබන ලද යකඩ කූරුමෙන් එකිනෙකට නොපටලැවී වෙන වෙනම, තනි තනිව පැනෙන්නාසේ |
| අසම්බන්ධ භාවේන | = | සම්බන්ධ නොවී වෙන වෙනම වීම වශයෙන් |
| උපට්ඨහන්ති | = | ප්‍රකට වේ පැනේ. |
| ඉති | = | මෙසේ පැණෙන බැවින් |

---

මේ කථාවෙන් "සන්තතිය බිඳීම යන්න, එකම ප්‍රවාහයක් ලෙස ප්‍රකට වූ රූප - නාම ප්‍රවාහය වැසුම් හැර, පියන් පත් අහක් කිරීමද, එම වැසුම් හැරීමද "පෙර පෙර රූප - නාමයන්ගෙන් පසු පසු රූප නාම වෙනම වෙනම පහළ වීමද පසු පසු රූප නාමයන්ගෙන් පෙර පෙර රූප - නාම වෙන වෙනම පහළ වීමද මෙනෙහි කොට දැන ගැනීම දක්වයි. තහි සම්මදෙව ආදී පසු කථාව මඟින් "ඇතිවීම - නැතිවීම මෙනෙහි කිරීමෙන් බාහිරව විශේෂයෙන් සන්තතිය විවර කිරීමක් නැතැයි යන්න දක්වූ කථාවම තහවුරු කරයි.

| | | |
|---|---|---|
| **අනිච්ච ලක්ඛණං** | = | අනිත්‍ය යැයි මෙනෙහි කොට දැනගත් බැවින් පහළ වූ අනිච්ච ලක්ෂණය |
| **සුටඨුතරං** | = | වඩාත් හොඳින් |
| **පාකටං** | = | ප්‍රකට |
| **හොති** | = | මේ |

මේ අට්ඨ කථා ටීකාවනට අනුව මතුවන තාක් රූප නාම පහළ වන පහළ වන ක්ෂණයෙහි අත නැර මෙනෙහි කොට භාවනා කරන යෝගී හට වෙනස් වූ රූප ධර්ම=වෙනස් වූ නාම ධර්ම ද මුල-ආරම්භය, අග-වියෝවීම වශයෙන් වෙන්ව ප්‍රකට වී පෙර පෙර රූප-නාම පසු පසු රූප-නාම එකක් එකක් වශයෙන් වෙන් වෙන්ව ප්‍රකට වේ. එකිනෙකට සම්බන්ධව ඒකකයක් ලෙස ප්‍රකට වී, උදය -වය මෙනෙහි කිරීමෙන් එකට "සම්බන්ධව-ඒකකයක් ලෙස පෙර ප්‍රකට වූ සන්තති ප්‍රඥප්තිය" බිඳී විනාශ වීම සිදු වේ. මෙසේ සන්තති ප්‍රඥප්තිය බිඳීගිය පුද්ගලයනට උපැද්ම, දිරීම, වියෝවීම නම් වූ අනිත්‍ය ලක්ෂණය, පහළ වී නැතිවී විනාශ වීම යෑම වූ අනිත්‍ය ලක්ෂණය වශයෙන් යන මේ දෙක තුළින් එක් අනිත්‍ය ලක්ෂණයක් තත්ත්වාකාරයෙන් ඉබේම ප්‍රකට වේ. මෙලෙස ප්‍රකට වූ නියම අනිච්ච ලක්ෂණය දැකගනී. පහළවනතාක් රූප-නාමයෝ අනිත්‍ය යැයි දැක දැනගන්නා ඤාණය නියම අනිච්චානුපස්සනාව යැයි සිත තබාගත යුතු. මෙම නියම අනිච්චානුපස්සනාව පහළ වන පහළ වන වාරයේ රූප-නාමයන් නිත්‍ය යැයි සලකාගන්නා නිත්‍ය සංඥාව ද එම සංඥාවෙන් දිගට පහළ වන්නා වූ කෙලෙස්, කර්ම, විපාක ස්කන්ධ යන වට්ට දුක ද දුරු කරයි.

**අනිච්චතො අනුපස්සනෙතා නිච්ච සඤ්ඤං පජහති** [ප. ම. 110]

| | | |
|---|---|---|
| **අනිච්චතො** | = | අනිත්‍ය යැයි |
| **අනුපස්සනෙතා** | = | විපස්සනා කරන්නහු |
| **නිච්ච සඤ්ඤං** | = | නිත්‍ය යැයි සළකා ගැනීම |
| **පජහති** | = | දුරු කරයි, පහ කරයි. |

මෙම පාළියෙහි සංඥාව දුරුකරයි යන කථාව ප්‍රධාන කථාවයි. එම නිසා රජතුමා මාළිගයෙන් පිටත්වී යැයි කීවහොත් රජතුමාගේ රාජ පිරිවරත් පිටත් වී යැයි කියවෙන්නාක් සේ සංඥාව අනුව යන දිට්ඨි විපල්ලාස (=වැරදි ලෙස වටහා ගැනීම) ආදී සියලු අකුසලයන්ද බැහැර කරයි යන්න ගත යුතුය. එම නිසා මහා ටීකා හී පහත සඳහන් ලෙසට විස්තර දක්වයි.

**නිච්ච සඤ්ඤන්ති නිච්ච ගාහං සඤ්ඤා සීසෙන නිද්දෙසො. සුඛ සඤ්ඤං අත්ත සඤ්ඤන්ති එත්ථාපි එසෙව නයො** [මහා. ටී. 3]

| | | |
|---|---|---|
| **නිච්ච සඤ්ඤන්ති** | = | "**නිච්ච සඤ්ඤා**" යන්න |
| **සංඛත ධම්මා** | = | සංඛත ධර්මයො |
| **නිච්චාති** | = | නිත්‍ය යැයි |
| **සස්සතාති** | = | ශාස්වත යැයි |
| **එවං පවත්තාය** | = | මෙලෙස පහළ වූ |
| **මිච්ඡා සඤ්ඤාය** | = | මිත්‍යා සලකුණු ගැනීම් |
| **සඤ්ඤා ගහණෙනෙව** | = | සංඥා ගැනීමෙන් ම |
| **දිට්ඨි චිත්තානම්පි** | = | දෘෂ්ඨි හා සිත් |
| **ගහණං** | = | ගැනීම |
| **දට්ඨබ්බං** | = | දත යුතු, සළකාගත යුතු |
| **ඉතො** | = | මෙම අනිච්චානුපස්සනාවේ පටන් |
| **පරාසු** | = | පසු අනුපස්සනාවන් කෙරෙහිද |
| **එසනයො** | = | මේ ආකාරයටම යැ |

අනිච්චානුපස්සනාවෙන් දුරුකළ යුතු නිච්ච සඤ්ඤා යන්න දැකීම, ඇසීම ආදී සංඛාරයන් නිත්‍යයැ, දිගටම පවතින්නේ යැයි සළකාගන්නා මිත්‍යා සංඥාවයැ. මෙම සංඥා විපල්ලාස දුරු කළාම යැයි සලකාගත යුතු යැ. දුක්ඛ, අනත්තානුපස්සනා යන මේවා සුඛ, අත්ත සංඥාවන්

දුරුකරයි යන තැනද මේ ක්‍රමයටම සළකා ගත යුතු යැයි අදහස් කෙරේ.

## දුරු කෙරෙන කෙලෙස්

මෙහිලා අනිච්චානුපස්සනාව මගින් දුරුකළ යුතු නිච්ච සංඥා ආදිය අතීතද? අනාගතද? යත්, අතීත කෙලෙස් වනාහි පහළ විය නිරුද්ධ විය. නිරුද්ධ වී අවසන් වූ එම අතීත කෙලෙස් නැවතද දුරු කිරීමක් අවශ්‍ය නැත. එම නිසා අතීත කෙලෙස් ද දුරු කරනවා නොවේ. අනාගත කෙලෙස් යන්නද විපස්සනා වඩන අවස්ථාවේ නොමැත්තේය. පසුව ඒකාන්තයෙන්ම අනාගතයේ පහළ වන්නා වූ කෙලෙස් වන්නාහ. එම නිසා අනාගත කෙලෙස් ද දුරුකරනවා නොවේ. අනිත්‍ය යැයි භාවනා කරන විපස්සනා කරන පත්‍යුත්පන්න ක්‍ෂණය ද විපසසනා කුසල් පමණක් පහළ වෙමින් පවතින්. දුරුකළ යුතු කෙලෙස් යන්න නොමැත්තේය. එම නිසා පච්චුප්පන්න කෙලෙස් ද දුරු කරනවා නොවේ. ඇත්ත වශයෙන් වනාහි ද්වාර හයෙහි පහළ වන ප්‍රකට වන රූප - නාම සංඛාරයන් අනිත්‍ය යැයි නියමාකාරයෙන් භාවනා කිරීමට කලින් සුදුසු අවස්ථාවේ එම සංඛාරයන්ම නිත්‍ය යැයි සළකා ගෙන එම ක්ලේශයෝ පහළ විය හැක්කේය. සුදුසු අවස්ථාවේ පහළ විය හැකි මෙම කෙලෙස් දුරු කරන්නේ යැයි දත යුතු.

## ආරම්මණානුසය

නිසි අවස්ථාවේ පහළ විය හැකි මේ පහළ වූ කෙලෙස් ද, අතීත කෙලෙස්ද නොවේ. ඒකාන්තයෙන් පහළ වන්නේය යන්න නොවන බැවින් අනාගතද නොවේ. පහළ වෙමින්ද නොපවතින බැවින් ප්‍රත්‍යුත්පන්නද නොවේ. තුන් කාලයෙන් මුක්ත වූ අනුසය කෙලෙස්යැ මේ අනුසය කෙලෙස්ද සන්තානයෙහි තැන්පත්ව පවතී. අරමුණක් මත "පවතී". නිත්‍යව යන ලෙසට දෙයාකාරය. ඒ දෙක තුළින්, මාර්ග ඤාණයෙන් දුරු නොකළ බැවින් පෘතග්ජන සෙඛ පුද්ගලයාගේ

සන්තානයන් හී ඕනෑම වේලාවක සුදුසු අවස්ථාවේ පහළ වියහැකි කෙලෙස් රාශිය සන්තානයෙහි තැන්පත්ව ඇති **සන්තානුසය** නම් වේ. මෙම පෘථග්ජන, සෙඛ ඇත්තන්ගේ විපසසනා භාවනා නොකර 'අනිච්ච - දුක්ඛ - අනත්ත' යැයි නිවැරදිව නොදන්නා අරමුණක් පාසා සුදුසු ඕනෑම වේලාවක පහළ විය හැකි නිච්ච - සුඛ - අත්තයැයි නැවත සළකාබලමින් පහළ වන කෙලෙස් රාශිය, මෙනෙහි නොකරන අරමුණුවල තැන්පත්ව පවතින බැවින් ආරම්මණානුසය නම් වේ. මෙයටම ආරම්මණාධිගගහිතුපපනන යැයිද කියනු ලැබේ. විපස්සනාව වනාහි මෙම ආරම්මණානුසය කෙලෙස් පමණක් දුරුකරන්නේ යැයි දතයුතු වඩා තහවුරු ලෙස සිත තබාගැනීම සඳහා සාධක පාළිද දක්වන්නෙමු.

**සත්තානුසයා, කාමරාගානුසයො පටිඝානුසයො, මානානුසයො, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො, භවරාගානුසයො අවිජ්ජානුසයො, යං ලොකෙ අප්පිය රූපං අසාතරූපං එත්ථ සත්තානං රාගානුසයො අනුසෙති යං ලොකෙ අප්පියරූපඤ්ච අසාත රූපං එත්ථ සත්තානං පටිඝානු සං අනුසෙති. ඉති ඉමෙසු ද්වෙසු ධම්මෙසු අවිජ්ජා අනුපතිතා, තදෙකට්ඨො මානො ච, දිට්ඨී ච, විචිකිච්ඡා ච දට්ඨබ්බං** [විභ 2/186]

| | | |
|---|---|---|
| **අනුසය** | = | හේතු සම්පූර්ණ වී නම් පහළ වීමට හැකි අනුසය කෙලෙස් |
| **කාමරාගානුසයො** | = | කාම අරමුණුවලට බැඳෙන අනුසයද |
| **පටිඝානුසයො** | = | අරමුණ විනාශකිරීම් කැමැත්ත වශයෙන් එරෙහිව පහර දෙන අනුසයද |
| **දිට්ඨානුසයො** | = | වරදවා දැකීමට, වරදවා පිළිගැනීමට යොමුවන අනුසයද |
| **විචිකිච්ඡා අනුසයො** | = | සැක කළහැකි අනුසයද |
| **භවරාග අනුසයො** | = | භවයට බැඳිය හැකි අනුසයද, |

| | | |
|---|---|---|
| අවිජ්ජානුසයො | = | සත්‍ය දත නොහැකි වන, අසත්‍ය පමණක් දැනගත හැකිවන අනුසය ද, |
| ඉති | = | මේ |
| සත්ත | = | හතක් වූ (අනුසයන්) |
| ලොකෙ | = | සංඛාර ලෝකයෙහි |
| යං පිය රූපං | = | යම් ප්‍රිය ස්වභාවයක් |
| යං සාත රූපං | = | යම් මනාප ස්වභාවයක් |
| අත්ථි | = | ඇත්තේය. |
| එත්ථ | = | මෙම ප්‍රිය මනාප ස්වභාවයෙහි |
| සත්තානං | = | සත්ත්වයන්ගේ |
| රාගානුසයො | = | කාම රාග, භව රාග යැයි කියන රාගානුසය |
| අනුසෙති | = | තැන්පත් වේ. නිදන්ගත වේ. |
| ලොකෙ | = | ලෝකයෙහි |
| යං අප්පිය රූපං | = | යම් අප්‍රිය වූ ස්වභාවයක් |
| යං අසාත රූපං | = | යම් අමනාප සවභාවයක් |
| අත්ථි | = | ඇත්තේය. |
| එත්ථ | = | එම අප්‍රිය වූ අමනාප වූ ස්වභාවය මත |
| සත්තානං | = | සත්ත්වයන්ගේ |
| පටිසානුසයො | = | දෝෂය නම් වූ පටිසානුසය |
| අනුසෙති | = | තැන්පත්වේ. නිදන්ගත වේ |
| ඉති | = | මෙලෙස තැන්පත් වූ |
| ඉමේසු ද්වීසු ධම්මෙසු | = | මෙම හොඳ - නරක ධම් දෙක්හි |
| අවිජ්ජා | = | අවිජ්ජානුසය |
| අනුපතිතා | = | තැන්පත් වේ. |

| | | |
|---|---|---|
| මානො ච | = | මනානුසය ද |
| තදෙකට්ඨා | = | එම අවිද්‍යාව හා එකට බැඳී සිතක පිහිටයි යැයි |
| දට්ඨබ්බා | = | දත යුතු |
| දිට්ඨි ච | = | දිට්ඨි අනුසය ද |
| විචිකිච්ඡා ච | = | විචිකිච්ඡානුසය ද |
| තදෙකට්ඨා | = | එම අවිද්‍යාව සමඟ එකට යෙදී සිතක පිහිටයි යැයි |
| දට්ඨබ්බා | = | දත යුතුය. |

හොඳ - ස්වභාවික නෛසර්ගික අරමුණ **සභාව ඉට්ඨාරම්මණ** යැයි කියනු ලැබේ. එය මුඛ්‍ය මූලික ස්වභාවය වශයෙන්ම ඉෂ්ට වූ මනාප වූ අරමුණක් යැයි යන්න අදහසයි. ඇත්තටම ලස්සන පෙනුම කන්කළු කටහඬ ආදිය අනුව වටහාගන්න. අසූචි, මළ බලු කුණක් ආදී අරමුණු මුඛ්‍ය ලෙස නරක වූවත්, බල්ලා, ඌරා, ගිජු ලිහිණියා ආදී සත්ත්වයන් හොඳ ලෙසට කල්පනා කරන සිතන මතන බැවින් හොඳ අරමුණක්, කැමති අරමුණක් වනු ඇත.

මෙලෙස නොහොඳ අරමුණක් වූවත් හොඳ ලෙසට සළකා සිතන මතන කල්හි **පරිකප්පඉට්ඨාරම්මණ** නම්වේ. සළකා බැලීමෙන් කල්පනා කිරීමෙන් පසු හොඳ බවට පත්වූ, කැමති වීමට සුදුසු අරමුණක් යැයි අදහස් කෙරේ. තාත්වික හා අතාත්වික වූ ඉෂ්ඨාරම්මණ වන්නා වූ මෙම **සභාව ඉට්ඨාරම්මණ, පරිකප්ප ඉට්ඨාරම්මණ** යන දෙකම **පිය රූප - සාත රූප** නම්වේ. මෙම ඉෂ්ට වූ ලෞකික ධර්මයන්හී කාමරාග අනුසය, භාවරාග අනුසය නිදන්ගත වේ. එලෙසටම ස්වභාවිකවම නරක වූ අරමුණ **සභාව අනිට්ඨාරම්මණ** නම් වේ. එය නෛසර්ගිකවම නොකමැති බවට සුදුසු, අමනාප අරමුණකැයි අදහස් කෙරේ. අරමුණ හොඳ වී නමුත් නරක ලෙසට සළකන සිතන මතන තැනැත්තාට නරක වන්නා වූ අරමුණ **පරිකප්ප අනිට්ඨාරම්මණය** නම් වේ. කල්පනා

කිරීමෙන් නරක් වූ අකමැති බවට ගිය අරමුණක් යැයි අදහස් කෙරේ. තාත්වික හා අතාත්වික අනිෂ්ඨාරම්මණ වන්නා වූ මේ සභාව අනිට්ඨාරම්මණ හා පරිකප්ප අනිට්ඨාරම්මණ යන දෙකම අප්‍රිය රූප-අසාත රූප නම් වේ. මේ අනිට්ඨාරම්මණ වන්නා වූ ලෝකී ධම්යන් හී පටිඝානුසය නිදන්ගත වේ. මෙම ඉෂ්ඨාරම්මණ අනිෂ්ඨාරම්මණ වන්නා වූ අරමුණුවල රාග-ද්වේෂ නිදන්ගත වන වාරයක් පාසා අවිජ්ජානුසය ද නිදන්ගත වේ. අවිජ්ජාව නිදන්ගත වී නම් එකම සිතක අවිද්‍යාව හා යෙදී තිබෙන පුරුද්ධ ඇති මාන - දිට්ඨි - විචිකිච්ඡාවන් ද නිදන්ගත වේ යැයි අදහස් කෙරේ. නිදන්ගතවේ යන්නද තැනෙක සැඟවී පවතිනවා යැයි අදහස් නොකෙරේ. ඇත්ත වශයෙන් වනාහි විපස්සනා ඤාණ, මාර්ග ඤාණ යනාදිය මගින් තවම දුරු නොකළ බැවින් සුදුසු හේතු ධම් එළඹි කළ එම නිදන්ගත වූ අරමුණ හා සම්බන්ධ වී පහළ වීමට සුදුසු වීමම නිදන්ගත වීම යැයි අදහස් කෙරේ.

**එතථ සත්තානං රාගානුසයො අනුසෙතීති එතස්මිං ඉට්ඨාරම්මණෙ සත්තානං අප්පහීනට්ඨෙන රාගානුසයො අනුසෙති** [විභ. අ.]

**එතථ සත්තානං**

| | | |
|---|---|---|
| **රාගානුසයො අනුසෙතීති** | = | රාගානුසයො අනුසෙතීති යනු එතථ සත්තානං |
| **එතස්මිං ඉට්ඨාරට්මණෙ** | = | මේ ඉෂ්ඨ අරමුණෙහි |
| **සත්තානං** | = | සත්ත්වයන්ගේ |
| **රාගානුසයො** | = | රාගානුසය |
| **අප්පහීණට්ඨෙන** | = | විපස්සනා ඤාණ, මාර්ග ඤාණ යන මේවා මගින් දුරු නොකළ නිසා |
| **අනුසෙතීති** | = | නිදන්ගතවේ. ('නිදන්ගත වේ' යන්න දුරු නොකළේය යන අදහස දේ) |

ආරම්මණ සන්තානානුසයනෙසු ඉට්ඨාරම්මණෙ ආරම්මණානුසයෙන අනුසෙති. [මූල ටී. (බු) 213]

ආරම්මණ සන්තානානුසයනෙසු = අරමුණෙහි තැන්පත්වීම සන්තානයෙහි තැන්පත් වීම යන දෙකින්

ඉට්ඨාරම්මණෙ = ඉටු අරමුණෙහි

ආරම්මණානුසයනෙන = අරමුණෙහි තැන්පත්වීම වශයෙන්

අනුසෙති = තැන්පත්වේ. (=නිදන්ගත වේ.)

ආරම්මණ සන්තානානුසයනෙසූති ආරම්මණානුසයනං සන්තානානුසයනන්ති ද්වීසු අනුසයනෙසු යථා හි මග්ගෙන අසමුච්ඡින්නො රාගො කාරණලාභෙ උප්පජ්ජනාරහො ථාමගතට්ඨෙන සන්තානෙ අනුසෙතීති වුච්චති, එවං ඉට්ඨාරම්මණෙපීති තස්ස ආරම්මණානුසයනං දට්ඨබ්බං [අදාල අනුටීකා විවරණයයි ]

ආරම්මණ සන්තානානුසයනෙසූති = ආරම්මණ සන්තානානුසයනෙසු යනු

ආරම්මණානුසයානං = ආරම්මණයෙහි තැන්පත්වීම

සන්තානානුසයානං = සන්තානයෙහි තැන්පත්වීම

ඉති ද්වීසු අනුසයනෙසු = මේ දෙකක් වූ තැන්පත් වීම් (නිදන්ගතවීම්) දෙකෙහි

හි = තැන්පත් වන ආකාර දක්වයි

මග්ගෙන අසමුච්ඡින්නො = මාර්ග ඥාණයෙන් ඉතිරි නොකොට දුරු නොකළ නිසා

කාරණලාභෙ උප්පජ්ජනාරහො = හේතු සම්පාත වීමෙන් පහළවිය හැකි

| | | |
|---|---|---|
| රාගො | = | රාගය තෙම |
| ථාමගතට්ඨේන | = | පහළවීමේ ශක්තිය බලවත්ව ඇති ස්වභාවය වශයෙන් |
| සන්තානෙ අනුසෙතීති | = | සන්තානයෙහි තැන්පත් වේ යැයි |
| වුච්චති යථා | = | කියන්නාක් සේ |
| එවං | = | එසේම |
| විපස්සනා මග්ගෙහි | | |
| අසමුච්ඡින්නෙනා | = | විපස්සනා හා මාර්ග ඥාණ මඟින් ඉතිරි නොකොට දුරු නොකළ බැවින් |
| කාරණලාභෙ උප්පජ්ජනාරහො | = | හේතු සපැමිණීමෙන් පහළ විය හැකි |
| රාගො | = | රාගය තෙම |
| ථාමගතට්ඨේන | = | පහළ විය හැකි ශක්තිය බලවත්ව ඇති ස්වභාවය වශයෙන් |
| ඉට්ඨාරම්මණෙපි අනුසෙතීති | = | ඉෂ්ඨාරම්මණයෙහිද තැන්පත් වේ යැයි. |
| වුච්චති | = | කියනු ලැබේ |
| ඉති | = | මෙලෙස කිව හැකි බැවින් |
| තස්ස | = | ඉෂ්ඨාරම්මණයෙහි නිදන්ගත වූ එම රාගය |
| ආරම්මණානුසයනං | = | අරමුණෙහි නිදන්ගත වීම |
| දට්ඨබ්බං | = | දත යුතු |

විපස්සනා ඥාණ, මාර්ග ඥාණ වශයෙන් තත්වාකාරයෙන් තවම නොදත් අරමුණක් පාසා, කෙලෙස් පහළ විය හැකි බව = කෙලෙස් පහළවීම නිම නොවීමම "එම අරමුණෙහි කෙලෙස් නිදන්ගත විය"

යැයි අදහස් දක්වන බව ඉහත සඳහන් අට්ඨකථා ටීකා වන්හි ප්‍රකටය. අරමුණෙහි තැන්පත්වන=නිදන්ගතවන මෙම අනුසයට ආරම්මණානුසය යැයි කියනු ලැබේ.

එම නිසා

**සුඛාය භික්ඛවේ වේදනාව රාගානුසයො පහාතබ්බො, දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො අදුක්ඛම සුඛාය වේදනාය අවිජ්ජානුසයො පහාතබ්බො** = මහණෙනි! සුඛ වේදනාවෙහි රාගානුසය පහකළ යුතු, දුක්ඛ වේදනාවෙහි පටිඝානුසය පහකළ යුතු, අදුක්ඛම සුඛ වේදනාවෙහි අවිජ්ජානුසය පහකළ යුතු" යැයි යනාදී වේදනා සංයුක්තයේ සගාථක වග්ගයේ තුන්වන සූත්‍රය විවරණය කරන අට්ඨ කථාව.

"**ඉමස්මිං සුත්තෙ ආරම්මණානුසයො කථිතො** = මෙම තුන්වන සූත්‍රයේ ආරම්මණානුසය දේශනා කරන ලදී" යැයි අනුශාසනය කරයි. එම වග්ගයෙහිම ජට්ඨ සූත්‍ර විවරණයේ, ආරම්මණානුසය ගැන දේශනා කළ බව, එලෙසටම දක්වයි. මෙම ආරම්මණානුසයම උප්පන්න වර්ග හතර බෙදා දක්වන අට්ඨ කථාවෙහි **ආරම්මණාධිග්ගහිතුප්පන්න** - දැක්වෙන්නේ ඒ පහත සඳහන් ලෙසටයි.

**චක්ඛාදීනං පන ආපාථගතෙ ආරම්මණෙ පුබ්බභාගෙ අනුප්පජ්ජමානම්පි කිලෙසජාතං ආරම්මණස්ස අධිග්ගහිතත්තා එවං අපර භාගෙ එකන්තෙන උප්පත්තිතො, ආරම්මණාධිග්ගහිතුප්පන්නන්ති වුච්චති.**

| | | |
|---|---|---|
| **චක්ඛාදීනං** | = | චක්ඛුද්වාර ආදියට |
| **ආපාතගතෙ ආරම්මණෙ** | = | රූපාරම්මණ ආදී ආරම්මණයක් ප්‍රකට වූ කල්හි |
| **පුබ්බභාගෙ** | = | ආරම්මණය පැමිණි පූර්ව භාගයේ |
| **අනුපජ්ජමානම්පි කිලෙසජාතං** | = | තවම පහළ නොවූ කෙලෙස් සමූහය ද (එම අවස්ථාවේ පහළ වූ කෙලෙස් ගැන කුමන කථාද) |

| | | |
|---|---|---|
| ආරම්මණස්ස අධිගහිතත්තා එව | = | අරමුණ ප්‍රකටව දැඩිව ගත් ස්වභාවය ඇති බැවින්ම |
| අපර භාගෙ | = | නැවත සළකා බැලීම ආදී වශයෙන් හේතු සම්පාත වූ පසු කාලයෙහි |
| එකන්තෙන උප්පත්තිතො | = | ඒකාන්තයෙන් පහළවිය හැකි බැවින් |
| ආරම්මණාධිගහිතුප්පන්නන්ති | = | ආරම්මණාධිගහිතුප්පන්න යැයි |
| වුච්චති | = | කියනු ලැබේ. |

## අදහස වනාහි

ඉෂ්ඨ අනිෂ්ඨ වන්නා වූ වර්ණ රූප, සද්ද, ගන්ධ, රස, ස්පර්ෂ, ධර්ම ස්වභාව යන අරමුණු හය ප්‍රකටව දැක, අසා, විඳ රසබලා, පහසලැබ දැනගත්තේ නම් එම ක්ෂණයෙහිම ලොභ-දෝස ආදී කෙළෙස් පහළවීමද වේ. පහළ නොවීම ද වේ. එම ක්ෂණයෙහිම කෙලෙස් පහළ වූයේ නම් වනාහි පසුව ඒ අනුවම දිගට පහළ වීම ප්‍රකටය. යොනිසෝමනසිකාරය ආදිය නිසා එම ක්ෂණයෙහි වනාහි කෙළෙස් පහළ නොවුනද අරමුණ ප්‍රකටව, පැහැදිලිව සළකුණුගත් තැනැත්තාට, පසු අවස්ථාවෙහි නැවත සිතනවිට, ඒ හා සමාන අරමුණක් හමුවීම සිදුවනවිට, විරුද්ධ පාක්ෂික අරමුණක් හමුවන විට, අනුන් විසින් සිහිපත්කරවන විට යනාදී හේතු එළඹි විට තදින් සළකුණුගත් එම අරමුණ හා සම්බන්ධවී කෙලෙස් පහළවීම ඒකාන්තය. මක්නිසා එසේ පහළ වන්නේද යත්: අරමුණෙහි තදින් සළකුණු ගත් බැවිනි. එම නිසා අරමුණ පැහැදිලිව ප්‍රකටව සළකුණු ගැනීම නිසා පහළවීමේ සූදානම ඇති එම කෙලෙස් වර්ගය **ආරම්මණාධිගහිතුප්පන්න** යැයි කියනු ලැබේ. මෙහිලා **ආරම්මණස්ස අධිගහිතත්තා එව** යන හේතුදක්වන කථාවම විශේෂ අවධානය ලක් කළයුතු. අරමුණ දැඩිව ප්‍රකටව හඳුනාගත් නිසා එම අරමුණ හා බැඳී පසුකාලයේ කෙළෙස් පහළවේ. එසේ නොවේනම් කෙළෙස් පහළ නොවේ යැයි යන මේ අදහසද දතයුතු.

මාර්ග ඥාණ යෙන් කෙළෙස් ඉතිරි නැතිව දුරුකළ ආර්යයන් වහන්සේට ආරම්මණානුසය කෙළෙස් දුරුවීම ගැන සැකයක් නැත්තේය. විපස්සනා මාර්ගයෙන් කෙසේ දුරු කරන්නේ ද ද්වාර හයෙහි ප්‍රකටව පැනෙන අවස්ථාවේ රූප-දැකීම, සද්ද-ඇසීම ආදී අරමුණු අනිත්‍යය වේවා, දුක්ඛ වේවා, වශයෙහි පැවැත්විය නොහැකි අනාත්ම ස්වභාවය හෝ වේවා මෙනෙහි කොට භාවනාවෙන් දැක දැනගන්නා පුද්ගලයාට එම මෙනෙහි කොට දැන ගන්නා අවස්ථාවෙහි ද, නැවත කල්පනාකරන පසු අවස්ථාවන් හීද එම මෙනෙහි කොට දැනගත් අරමුණ නිත්‍ය, සුඛ, ආත්ම යැයි සළකාගන්නා බැඳීගන්නා කෙළෙස් පහළවිය නොහැක්කේය. පහළ වීමට අවසර නොලබයි. මෙලෙස කෙළෙස් සඳහා අවසර නොලබන බැවින් "මෙනෙහි කොට දැනගත්තාක් අරමුණු විෂයෙහි කෙළෙස් තැන්පත් නොවේ යැයිද" ආරම්මණාධිගහිතුප්පත්ත නම් වූ ආරම්මණානුසය දුරුවේයැ" යිද, ආරම්මණානුසය දුරුවීනම් එම අනුසය ඇතිවිට පහළ වන්නාවූ පරියුට්ඨාන වීතික්කම කිළෙස්ද සහිතව කුසල කර්ම - අකුසල කර්ම සහිතව විපාක කර්මයෙන්ද සාකල්‍යයෙන් දුරුවෙත්. තත්ත්වාකාරයෙන් දැක දැනගන්නා විපස්සනාව නිසා වරදවා දැක දැනගන්න කෙලෙස් කම්, විපාක පහළ විය නොහැකි බව, දුරුවීම, විපසසනා මඟින් දුරුකිරීමම වේ. පහත දැක්වෙන්නේ මහා ටීකා විවරණයයි.

**අනිච්චානුපස්සනා තාව තදඞ්ගප්පහාන වසෙන නිච්ච සඤ්ඤං පරිච්චජති, පරිච්චජන්තිච තථා අප්පවත්තියං යෙ නිච්චන්ති ගහනවසෙන කිලෙසා, තම්මූලකා අභිසංඛාරා තදුභයමූලකා චවිපාකා ඛන්ධා, අනාගතෙ උප්පජ්ජෙය්‍යුං තෙ සබ්බෙපි අප්පවත්තිකරණවසෙන පරිච්චජති - තථා දුක්ඛානුපස්සනාදයො, තෙනාහ විපස්සනා තදඞ්ගවසෙන සද්ධිං ඛන්ධාභිසංඛාරෙහි කිලෙසෙ පරිච්චජති**

| | | |
|---|---|---|
| **තාව** | = | ප්‍රථමයෙන් |
| **අනිච්චානුපස්සනා** | = | අනිච්චානුපස්සනාව |

| | | |
|---|---|---|
| නිච්ච සඤ්ඤං | = | නිත්‍යයැයි සලකුණු ගැනීම |
| තදංගප්පහාන වසෙන | = | තදංග ප්‍රහාන වශයෙන් |
| පරිච්චජති | = | දුරුකරයි. |
| ච | = | දිගට දක්වන්නෙමු |
| සා | = | එම අනිච්චානුපස්සනාව |
| පරිච්චජති | = | දුරුකරයි. |
| ච | = | දිගට දක්වන්නෙමු |
| සා | = | එම අනිච්චානුපස්සනාව |
| පරිච්චජන්ති | = | නිත්‍ය සඤ්ඤාව දුරු කළ (පරිච්චජති හා බැදේ) |
| තථා අප්පවත්තියං | = | අනිත්‍ය යැයි භාවනා කරන එම ස්වභාවය වශයෙන් අනිච්චානුපස්සනා සිදුනොවන්නේ (න උප්පජ්ජෙය්‍යුං හා බැදේ) |
| නිච්චන්ති ගහණවසෙන ච | = | නිත්‍යයැයි ගැනීම් ස්වභාව වශයෙන් |
| යෙ කිලෙසාච | = | යම් වූ ක්ලේශයන් ද |
| තම්මූලකා | = | එම ක්ලේශය මුල් වූ |
| යෙ අභිසංඛාරා ච | = | කුසල කර්ම අකුසල කර්ම යන යම් වූ අභිසංඛාරයන් ද |
| තදූභය මූලකා | = | එම දෙකක් වූ ක්ලේශ හා කර්ම නම් මුල් ඇති. |
| යෙ විපාකක්ඛන්ධං | = | යම් වූ නව භවයේ විපාකස්කන්ධයෝ ද |
| අනාගතෙ | = | අනාගතයෙහි |
| උප්පජ්ජෙය්‍යුං | = | උපදින්නේය. ඉපදිය හැක්කේය. |
| තෙ සබ්බෙපි | = | එම ඉපදිය හැකි කිළෙස, කර්ම, විපාක ස්කන්ධයන් සියල්ලම ද |

**අප්පවත්තිකරනවසෙන** = නොපැවැත්වීම සිදුකිරීම් වශයෙන්

**වා** = පහළ නොවිය හැකි ලෙසට කිරීම් වශයෙන්

**පරිච්චජති** = දුරුකරයි.

**දුක්ඛානුපස්සනාදයො** = දුක්ඛානුපස්සනා ආදිය

**තථා** = එම අනිච්චානුපස්සනාව මෙන්ම දුරුකරයි

**තෙන** = එබැවින්

**විපස්සනා තදංග වසෙන සද්ධිං ඛන්ධාභිසංඛාරෙහි කෙලෙස පරිච්චජතීති** = විපස්සනාව වනාහි විපාක ස්කන්ධය, අභිසංඛාරයන් හා සමඟ ක්ලේශයො තදංග වශයෙන් දුරුකරයි යැයි

**ආහ** = අට්ඨ කථා හි කියයි.

## අර්ථය වනාහි

හය ද්වාරයන්හි ප්‍රකට වූ අරමුණු අනිත්‍ය යැයි දක දනගැනීම සිදුවීමට කලින් එම අරමුණ නිත්‍යයැයි සළකා හාරගන්නා කෙළෙස් පහළ වීමට අවසර ලැබේ. මෙලෙස පහළ වීමට අවසර ලබන බැවින්, අනිත්‍යයැයි නොදකින නොදන්නා එම අරමුණෙහි කෙළෙස් නිදන්ගත වේ.

මෙලෙස නිදන්ගත වන බැවින් පසු කාලයෙහි හේතු සම්පූර්ණ වූ වාරයක් වාරයක් පාසා එම අරමුණ නිත්‍ය වශයෙන් සළකයි සිතයි මතයි. මෙලෙස සිතන මතන බව පරියුට්ඨාන කෙළෙස් වේ. නැවතුදු හේතු කරුණු එළඹී කල්හී, නිත්‍ය වශයෙන් සළකාගත් එම අරමුණ ලබාගැනීමට, වඩා ගැනීමට, විනාශ කිරීමට හෝ වෙවා උත්සාහ කරයි. මෙම උත්සාහය "නිත්‍ය යැයි සළකා කෙළෙස් දිගට පහළවන නිසා"

එම කෙලෙස් මුල සහිත වූ අභිසංඛාරම වේ. කුසල කම් අකුසල කම් නම්වන මෙම අභිසංඛාර නිසා හේතු සම්පූර්ණවන අවස්ථාවෙහි පටිසන්ධි විඤ්ඤාණය ආදී භවයේ නව විපාක ස්කන්ධයෝ පහළ වෙත්.

මෙලෙස සිදුවන බැවින් අලුත් භවයේ විපාක ස්කන්ධයෝ අභිසංඛාර නම්වූ කම් හේතු ඇති විටම පහළ විය හැක්කේය. කම් නොමැත්තේ නම් පහළ විය නොහැක්කේය. කම්යන් ද නිත්‍ය යැයි සිතන මතන ක්ලේශයන් නොමැතිවිට පහළ නොවෙත්. කෙලෙස් ද නිත්‍ය යැයි සිතා භාරගන්නා බව නොමැති විට පහළ විය නොහැක්කේය. ද්වාර ප්‍රකටවන ක්ෂණයෙහි එම අරමුණ නිත්‍ය යැයි තත්ත්වාකාරයෙන් දැනගත් විට වනාහි. නිත්‍යයැයි සිතන මතන බවට අවසර නොලැබෙන්නේමය. එබැවින් ද්වාර හයෙහි ප්‍රකටවන මොහොතේ අරමුණ අනිත්‍ය යැයි තත්ත්වාකාරයෙන් දැනගන්නා අනිච්චානුපස්සනාව පහළ වී නම් එම අරමුණ නිත්‍යයැයි සිතා බැඳී ගැනීම නම් වූ අනුසය කෙලෙස් ද දුරුවේ. නිත්‍ය යැයි සිතන මතන පරියුට්ඨානද දුරුවේ. එම අරමුණ හා සම්බන්ධයෙන් ව්‍යාත්‍රික්‍රමය = **වීතික්කම** රැස්කිරීම = **අභිසංඛාර** ද දුරුවේ. අභිසංඛාර පවා නොමැති බැවින් කම්යේ විපාක වන අලුත්භව ස්කන්ධයෝද පහළ නොවීම් වශයෙන් සංසිඳේ. මෙලෙස අනුසයෙන් පටන්ගන අලුත් භව ස්කන්ධයන් තෙක් පහළ නොවීම් වශයෙන් දුරු කිරීම් කළ හැකි බැවින් "**අනිච්චානුපස්සනාව** වනාහි එම කෙලෙස් කම් විපාක ස්කන්ධයෝ දුරුකරයි" යැයි දක්වයි. දුරු කරයි යන්න නිවීම, පහළ නොවීම, පහළවීම අවසර නොදීමම වන්නේය. දුක්ඛා - අනත්තා අනුපස්සනාවෝ ද සුඛ, අත්තයැයි සළකා පහළ විය හැකි ක්ලේශයන් පිළිවෙලින් මේ ලෙසටම දුරුකරයි. එබැවින් අට්ඨ කථාහි "විපස්සනාව වනාහි විපාක ස්කන්ධයෝ, අභිසංඛාරයන් ද සහිත කෙලෙස් තදංග ප්‍රහාණ වශයෙන් දුරුකරයි" යැයි දක්වයි යන්න වටහාගත යුතුයි.

## සන්තානානුසය

පෘතග්ජන, සොතාපන්න සකදාගාමි අනාගාමි යන ඇත්තන්ගේ සන්තානයන්හි මාර්ග ඥාණයෙන් තවම දුරු නොකළ කෙළෙස් ඇති නිසා, අදාල හේතු සම්පූර්ණ වී නම් කවර වේලාවක නමුදු පහළවිය හැකි කෙළෙස් සමූහය සන්තානානුසය නම් වේ. එම පුද්ගලයන්ගේ සන්තානවල පහළවීම සූදානම්ව පවතින කෙලෙස් නිදන්ගතව පවතින කෙළෙස් යැයි දක්වේ. උපමාවක් ලෙස... උණ රෝගය සම්පූර්ණයෙන් සුව නොවනු තැනැත්තා "දැන් සනීපදැයි" ප්‍රශ්න කළහොත් එම ප්‍රශ්නකරන මොහොතෙහි උණ නැග නොතිබෙන්නේ නමුදු පෙරද උණ තිබුණේය. පසුවද උණ ගැනෙනු ඇති බැවින් "උණ තියෙනවා" යැයි කීම ගැලපෙන්නාක් මෙන්, මස්-මාළු වළඳන කෙනෙකුගෙන් මස්-මාළු වළඳනවාදැයි ඇසුව හොත්, එම ප්‍රශ්න කරන අවස්ථාවේ මස් -මාළු කෑමක් නොපැනුනත් පෙරද වැළඳුවෙහිය, පසුවද වළඳනු ඇති බැවින් "මස්-මාළු වළඳනවා" යැයි උත්තර දෙන්නාක් සේද, පෘතග්ජනයන්ගේ සන්තාන වල අනුසය කෙළෙස් හත, සොතාපන්න, සකෘදාගාමි උතුමන්ගේ සන්තාන වල දිට්ඨි - විචිකිච්ඡා හැර ඉතිරි අනුසය කෙළෙස් පහ, අනාගාමි උතුමන්ගේ සන්තානයන්හි භව රාග - මාන - අවිජ්ජා යන අනුසය තුන යන මේ කෙළෙස් උප්පාද, ඨිති භංග වශයෙන් පහළ වෙමින් පවතින්නේ නැති නමුදු පෙරද පහළ වී පසුවටද හේතු කරුණු පෙළ ගැසුණු විට පහළවනු ඇති බැවින්, පහළ වීම දුරුනොවුන නිසා එක් එක්කෙනෙක් වූ පුද්ගලයකුගේ සන්තානයන්හි පහළ වීමට අවසර තිබේ. නිදන්ගතව තිබේ යන්න නම් වේ. පහත දක්වෙන්නේ යමකප්පකරණ පාළියයි.

**අනාගාමිසස අවිජ්ජානුසයොච මානානුස යොච භවරාගානුසයොච අනුසෙනති -පෙ-දව්නනං පුගගලානං අවිජ්ජානුසයොච කාමරාගානුසයොච පටිඝානුසයොච මානානුසයොච භවරාගානුසයොච අනුසෙනති නොච තෙසං දිට්ඨානුසයොච විචිකිච්ඡානුසයෙයාචා අනුසෙන්ති පුථුජ්ජනසස අවිජ්ජානුසයොච අනුසෙති කාමරාගානුසයොච පටිඝානුසයොච මානානුසයොච දිට්ඨානුසයොච විචිකිච්ඡානුසයොච භාවරාගානුසයොච අනුසෙනති**

| | | |
|---|---|---|
| අනාගාමිස්ස | = | අනාගාමි උතුමාගේ සන්තානයෙහි |
| අවිජ්ජානුසයො ච | = | අවිජ්ජානුසය ද |
| මානානුසයො ච | = | මානානුසයද |
| භවරාගානුසයො ච | = | භවරාගානුසයද |
| අනුසෙන්ති | = | නිදන්ගතව වෙත් |
| ද්වින්නං පුග්ගලානං | = | සෝතාපන්න සකදාගාමි යන පුද්ගලයන් දෙදෙනාගේ සන්තානවල |
| අවිජ්ජානුසයොච | = | අවිජ්ජානුසය ද |
| කාමරාගානුසයො ච | = | කාමරාග අනුසය ද |
| පටිඝානුසයො ච | = | පටිඝ අනුසය ද |
| මානානුසයො ච | = | මානානුසය ද |
| භවරාගානුසයො ච | = | භවරාගානුසය ද |
| අනුසෙන්ති | = | නිදන්ගත වෙත්. |
| තෙසං | = | එම සෝතාපන්න, සකදාගාමි උතුමන්ගේ සන්තාන වල |
| දිට්ඨානුසයො ච | = | දිට්ඨි අනුසය ද |
| විචිකිච්ඡානුසයො ච | = | විචිකිච්ඡානුසය ද |
| නො අනුසෙන්ති | = | නිදන්ගත නොවෙත් |
| පුථුජ්ජනස්ස | = | පෘතග්ජනයන්ගේ සන්තානවල |
| අවිජ්ජානුසයොච | = | අවිද්‍යානුසය ද |
| අනුසෙන්ති | = | නිදන්ගත වෙත්, |
| කාමරාගානුසයො ච | = | කාම රාගානුසයෝ ද |
| පටිඝානුසයො ච | = | පටිඝ අනුසය ද |
| මානානුසයො ච | = | මාන අනුසය ද |
| දිට්ඨානුසයො ච | = | දිට්ඨි අනුසය ද |

විචිකිච්ඡානුසයො ච = විචිකිච්ඡා අනුසයොව

භව රාගානුසයො ච = භවරාගානුසය ද

අනුසෙනාති = තැන්පත්වේ.

මේ පාළියෙහි දක්වන ලද කෙළෙස් වර්ග හත තුළත් භවරාග හා කාම රාගයන් ද රාගය හා පටිස විචිකිච්ඡාවෝ ද පටිසය සමඟ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, රාගා යෝ ද මාන හා දිට්ඨි, විචිකිච්ඡා, පටිස යන මේවාද දිට්ඨි හා විචිකිච්ඡා භවරාග මානාදිය ද උප්පාද වශයෙන් සියල්ල එකට පහළවිය නොහැක්කේ ය. මෙලෙස එකට පහළ විය නොහැකි කෙලෙස්ද "අනුසය වශයෙන් සියල්ල නිදන්ගතවෙත්, පහළවෙත්". එබැවින් අනුසය කෙළෙස් යැයි කියන තැන පරියුට්ඨාන, විතික්කම යනාදිය මෙන් උප්පාද, ඨිති, භංග අවස්ථාවන්ට අනුව මිශ්‍රව පහළ වනවා යැයි අදහස් නොකෙරේ. ඇත්ත වශයෙන් වනාහි මාර්ග ඥාණයෙන් දුරු නොකළ බැවින් ඒ ඒ පුද්ගලයනගේ සන්තානයන් හී හේතු කරුණු සම්පූර්ණ නම් පහළවිය හැකිය, කියන "ථාමගතභාව යට අනුව නිදන්ගත වේ" යැයි කිව යුතු, පහළ විය හැකි කෙළෙස් වෙත් යැයි සිත තබාගත යුතු. පහත සඳහන් වන්නේ කාමරාග, පටිස එකට නිදන්ගතව පවතින ආකාරය, පහළ වන ආකාරය පෙන්වන යමකප්පකරණ පාළියයි.

**යස්ස කාමරාගානුසයො අනුසෙති තස්ස පටිඝානුසයො අනුසෙතීති ආමන්තා. යස්ස කාමරාගානුසයො උප්පජ්ජති, තස්ස පටිඝානුසයො උප්පජ්ජති ආමන්තා.**

යස්ස = යමෙකුගේ සන්තානයක

කාමරාගානුසයො = කාමරාග අනුසය

අනුසෙති = නිදන්ගතව පවතී නම්

වා = සුදුසු හේතු එළඹි කල්හී පහළවිය හැකි වන්නේද.

| | | |
|---|---|---|
| **තස්ස** | = | ඒ පුද්ගලයාගේ සන්තානයෙහි |
| **පටිසානුසයො** | = | පටිසානුසය |
| **උප්පජ්ජතීති** | = | පහළ වේද්ද'යි |
| **ඉති** | = | මෙලෙස ප්‍රශ්ණයක් වන්නේ නම් |
| **අමන්තා** | = | "ඔව්" යැයි පිළිතුරු දියයුතු |

**යම්හි සන්තානෙ අනුසයා අප්පහීනා, යම්හි වා පන තෙසං සන්තානෙ උප්පත්ති පච්චයෙ සති උප්පත්ති අනිවාරිතා. තත්ථ අනුප්පජ්ජනකඛණෙපි උප්පන්නපුබ්බත්තෙව ච කාලන්තරෙ උප්පජ්ජමානත්තෙව උපාදාය යස්ස කාමරාගානුසයො උප්පජ්ජති තස්ස පටිසානුසයො උප්පජ්ජතියෙව නාම** [ප. ප. අ.]

## යමක අට්ඨකථා පදගත අර්ථ

| | | |
|---|---|---|
| **යම්හි සන්තානෙ** | = | යමෙකුගේ සන්තානයෙහි |
| **අනුසයා** | = | අනුසයන් |
| **අප්පහීනා** | = | මාර්ග ඥාණයෙන් දුරු නොකළතාක් |
| **පන** | = | මාර්ගයෙන් තවම දුරුනොකළ තාක්, කෙළෙස් ඇතිතාක්, නිදන්ගතව පවතීද? යන ප්‍රශ්ණ අනුව දිගට විවරණය කරන්නෙමු. |
| **යම්හි සන්තානෙ** | = | යමෙකුගේ සන්තානයෙහි |
| **තෙසං** | = | එම අනුසයන්ගේ |
| **උප්පත්තිපච්චයෙ සති** | = | පහළ වීමට හේතු ධර්ම ඇත්තේ වී නම් |
| **උප්පත්ති** | = | එම අනුසයන්ගේ පහළවීමද |
| **අනිවාරිතා** | = | වැළැක්විය නොහැක්කේය. අනිවාර්යය. |

(මේ පසු වාක්‍යයෙන් "පහළවීම හේතු සම්පූර්ණ වූ අවස්ථාවෙහි කෙළෙස් පහළ වීම නොවැළැක්විය හැකි සන්තානයෙහි, එම කෙළෙස්

පහළ වීමෙ ශක්‍යතාව (ඇතිවී) ථාමගතවේ. මෙම ථාමගත කෙළෙස් හත පමණක් නිදන්ගත යැයි කියනු ලැබේ. අනුසය නම්වේ" යැයි විවරණය කරයි. ථාමගත වීම අනුසය හත හා බැඳේ. බාහිර කෙලෙස් හා සම්බනධ නැතැයි මූල ටීකාහි දක්වේ එබැවින් "මාර්ග ඤාණයෙන් දුරුනොකලේ වී නමුදු ථාමගත නොවන්නා වූ බාහිර කෙළෙස් අනුසය නම් නොවේ." යැයි යන මේ අදහස වැටහෙන්නේ යැයි පිළිගැනේ. වෙනත් ආකාරයකට වනාහී:)

| | | |
|---|---|---|
| පන | = | මාර්ග ඤාණයෙන් දුරු නොකළ කෙළෙස් පමණක් නිදන්ගත වේදැයි යන ප්‍රශ්ණය දිගට විස්තර කරන්නෙමු. |
| **යමෙහි සනතානේ** | = | යමෙකුගේ සන්තානයේ |
| **තෙසං** | = | එම අනුසයන්ගේ |
| **උප්පත්ති පච්චයෙ සති** | = | පහළ වීමට හේතු ඇත්තේ නම් |
| **උප්පත්ති** | = | එම අනුසයනගේ පහළවීම |
| **අනිවාරිතාවා** | = | සමථ, විපසසනා මගින් දුරු කොට නොමැති බවද |
| **හොති** | = | වේ. |

(මේ අර්ථය "**සමථ විපස්සනානං අඤ්ඤතර වසෙන අවික්ඛම්භිතං කිලෙස ජාතං චිත්ත සනතතිං අනාරුළ්හමපි උප්පත්ති නිවාරකසස හෙතුනො අභාවා අවික්ඛම්භිතුප්පන්නං නාම**" යනු විසුද්ධිමග්ග උද්ධෘතයයි. මේ අනුසාරයෙන් "මාර්ග ඤාණයෙන් තවම දුරු නොකළ කෙළෙස් අසමූහතුප්පන්න වන පමණින් අනුසය නම් නොවේ. සමථ, විපස්සනා මගින් නොවැළැක් වූ **අවික්ඛම්භිතුප්පන්න** කෙලෙස් ද අනුසය නම් වේ මැයි" දක්වයි.

**යම්හි සනතානෙ අනුසයා අප්පහීනා** යන ප්‍රථම වාක්‍යයෙන් කියන දේ වනාහි "**සමථ-විපසසනා වසෙන පන වික්ඛම්භිතමපි**

අරියමග්ගෙන අසමූහතත්තා උප්පත්තිධම්මතං අනතීතාය අසමූහතුප්පන්නන්ති වුච්චති" යන විසුද්ධිමග්ග දැක්වීමට අනුව අසමූහතුප්පන්න පමණක් දක්වන්නේ යැයි පිළිගත යුතු.)

| | | |
|---|---|---|
| තත්ථ | = | අනුසයන් තවම දුරු නොකළ, තවම නොවැලැක් වූ එම සන්තානයෙහි |
| උප්පන්නපුබ්බසෙව ච කාලන්තරෙ | = | පෙර පහළ වූවන් ද |
| උප්පජ්ජමානසෙව | = | පසුව වෙනත් කාලයක පහළ වන්නා වූ ද |
| උපාදාය | = | සළකාගෙන |
| අනුප්පජ්ජනක්ඛණෙපි | = | උප්පාද, ඨිති, භංග අවස්ථාවට පත්වී කෙළෙස් පහළ නොවන ක්ෂණයන්හී ද |
| යස්සකාමරාගානුසයො උප්පජ්ජති | = | යමෙකුට කාමරාගානුසය පහළ වෙමින් පවතී ද |
| තස්ස | = | ඔහුගේ සන්තානයේ |
| පටිඝානුසයො | = | පටිඝානුසය |
| උප්පජ්ජති යෙව නාම | = | පවතින්නේම යැයි නම්වේ. |

මෙම යමක පාළි අට්ඨ කථාවන්ට අනුව දක්වන ලද අනුසය හත, පහ, තුන යන මේවා පෘතග්ජන සෙක්ඛ පුද්ගලයන්ගේ සන්තානවල ඕනෑම වේලාවක නිදන්ව පවතින්නේ ම යැයි කියැවේ. කුසල, විපාක, පටිසන්ධි, භවංග, චුති යන මේවා පවතින කාලයන්හීදු නිදන්ව පවතින් නේ ම යැයි කියවේ. අසඤ්ඤසත්ත සන්තානයන් හීදු නිදන්ගතව පවතින්නේ ම යැයි කියැවේ. අකුසල සිදුකරන අවස්ථාවන්හී විශේෂයෙන් කිවයුත්තක් නැත. මෙලෙස පැවතීම නිම නොවූ තාක්, හේතු කරුණු සම්පූර්ණ වී නම් පරියුට්ඨාන වශයෙන් ඉස්මතු විය හැක්කේය යන කාරණය නිසා පෘතග්ජන, සෙක්ඛ යන ඇත්තන්ගේ සන්තානවල නිදන්ගතව, පවතී" යැයි කිව යුතු වේ. කෙලෙස් 7,5,3

යන මේවා සන්තානානුසය නම් වේ. මේ සන්තානානුසය මාර්ග ඤාණයෙන් පමණක් ඉතිරි නොකොට දුරුකළ නොහැක්කේ **සමථ විපස්සනාවසෙන පන වික්ඛම්භිතම්පි** යන විසුද්ධි මග්ග දක්වීමට අනුව වික්ඛම්භන වශයෙන් දුරස් කිරීම පමණක් කළ හැක්කේය.

එබැවින් අනිච්චානුපස්සනාව වනාහි නිච්ච සංඥාව දුරු කරයි කියන තැන දක්වන ලද නය ක්‍රමයට අනුව **ආරම්මණාධි ගහිතුප්පන්න** නම් වූ ආරම්මණානුසය හා එයට අදාල පරියුට්ඨාන වීතික්කම, කම්ම, විපාකස්කන්ධය යන මේ ධර්මයෝ පමණක් තදංග ප්‍රහාන වශයෙන් දුරු කරයි සමනය කරයි යැයි සැළකිය යුතුය. මෙයම අදහස් කොට විසුද්ධි මග්ගයෙහි **අනිච්චානුපස්සනං භාවෙන්තො නිච්ච සඤ්ඤං පජහති** යැයි දක්වයි.

මෙහිලා "අනිත්‍ය වටහා ගත්තේ නම් දුක්ඛ: -අනාත්ම යන මේවාද වටහා ගත්තාම වන්නේය.

මෙහිලා "අනිත්‍ය යැයි දැනගත් අරමුණ මත නිත්‍යයැයි වරදවා වටහා ගැනීමක් බැඳීමක් සිදුනොවීම ප්‍රකටයැ. නමුදු අනිත්‍ය යැයි වටහාගත් එම අරමුණ මත සුඛ යැයිද, මම යැයිද යනාදී වූ කෙලෙස් පහළ විය හැක්කේද?" ප්‍රශ්ණයක් වන්නේ නම්, සිදුවිය නොහැක්කේ යැයි ම විනිශ්චය කළ හැක්කේය. මක්නිසාදයත්; පහළ වී පසුව නොපෙනී, දුරුවී යෑම කියන නියම අනිත්‍ය ලක්ෂණය ප්‍රකටව දැක, අනිත්‍ය යැයි දැක වටහාගත් යෝගී තෙම එම අනිත්‍ය අරමුණම, සුඛ යැයි ද, මගේ වසයෙහි පවතී, යැයිද, සත්ත්වයෙකි යැයිද සැළකීමක් නොකරයි. ඇත්ත වශයෙන් වනාහි "පහළ වී පසු වහාම නොපෙනී දුරු වී යයි" යැයි දැනගත් ධර්ම සියල්ලම මත නැවත කල්පනා කොට බැලුව හොත් අනිත්‍ය යැයි වටහාගත් ඤාණානුභාව බලයෙන් "ඇතිවීම - නැතිවීම නොනිම්ව පවතින නිසා දුක්ඛ ධර්ම" යැයිද, තමා කැමති පරිදි නොපවතින ධර්ම, ආණ්ඩු මට්ටු කළ නොහැකි ධර්ම, ස්වාමියෙකු නොමැති ධර්ම, තම ස්වභාවය අනුව රිසිසේ ඇතිවෙමින් නැතිවෙමින්

යන ධම් යැයිද යන මේ ආකාරයන්ට අනුව තීරණය කළ හැක්කේය. මෙහිලා පහත දක්වෙන අංගුත්තර නිකාය නවක නිපාත ප්‍රථම සම්බොධි සූත්‍ර පාළිය බලවත් සාධකයකි.

අනිච්ච සඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන සමුග්ඝාතාය අනිච්ච සඤ්ඤිනො භික්ඛවෙ අනත්තසඤ්ඤා සණ්ඨාති අනත්තසඤ්ඤී අස්මිමාන සමූග්ඝාතං පාපුණාති දිට්ඨෙව ධම්මෙ නිබ්බානං [අං. නි. 5/371]

| | | |
|---|---|---|
| අස්මිමාන සමුග්ඝාතාය | = | මම ම යැයි කැපී පෙනෙන මානය සමූල ඝාතනය පිණිස |
| අනිච්චසඤ්ඤා | = | අනිත්‍ය සඤ්ඤාව |
| භාවෙතබ්බා | = | භාවිතා කළ යුතුය |
| භික්ඛවෙ | = | මහණෙනි |
| අනිච්ච සඤ්ඤිනො | = | අනිත්‍ය සඤ්ඤාව ඇත්තාට |
| අනත්ත සඤ්ඤා | = | ආත්මයක් නැතැයි යන සඤ්ඤාව |
| සණ්ඨාති | = | මනාකොට පිහිටුවයි. |
| වා | = | ඉබේ හෝ පහළ වේ. |
| අනත්ත සඤ්ඤී | = | ආත්ම නොවේ යැයි සඤ්ඤා ඇත්තා |
| අස්මි මාන සමූග්ඝාතං | = | මම ම යැයි කැපී පෙනෙන මානය සමූල ඝාතන මට්ටමට |
| පාපුණති | = | පත්වේ. |
| දිට්ඨෙව ධම්මෙ | = | දිටු දැමියෙහිම (මෙලොවදීම) |
| නිබ්බානං | = | කෙලෙස් නිවීමට |
| පාපුණාති | = | පත්වේ. |

මේ පාළියෙහි අනිච්ච සඤ්ඤිනො භික්ඛවෙ අනත්ත සඤ්ඤා සණ්ඨාති යන මේ පදය පමණක් මෙහිලා දැක්වීමට අවශ්‍ය වී ඇත්තේය. ඉතිරි කොටස් ඒ හා එකට බැඳී පවතින නිසා දැක්වීම මෙලෙස විය. මෙම කොටසෙහි අඩංගු අසම්මාන යන්න සොතාපන්න, සකදාගාමී, අනාගාමි උතුමන්ගේ සන්තාන වලද, තම උතුම් ගුණ සලකා මම යැයි කැපී පෙනෙන යාථාවමානය වේ. එම ආර්යය උතුමන් දෘෂ්ඨිය ඉතිරි නොකොට දුරුකොට ඇති නිසා අත්ත, සත්ත, ජීව, වශයෙන් පෘතග්ජනයන් ඇලී බැඳී ගන්නා මමෙක් නොමැති බව ඒකාන්තයෙන් ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ ම ය. නමුදු, තමන් සතු ගුණ නිසා දැක-දැනගැනීම්, ප්‍රකාශ කිරීම්, ක්‍රියා කිරීම් ආකාර තදින්ගෙන එම අසම්මාන වශයෙන් කැපී පෙනී "මට දැනගත හැක," මට කිව හැක, මට කළහැක යනාදී ලෙසට කල්පනාකිරීම්, ප්‍රකාශ කිරීම්, කටයුතු කිරීම් පුරුදු ඇත්තාහ. ආර්යයන්ගේ සන්තාන වල පහළ වන මෙම මානය "සක්කාය දිට්ඨිය හා පහළ වන ආකාරය අතින් සමාන නිසා" "දිට්ඨිය හා මිශ්‍රවී පහළ වන ආකාරය අතින් සමාන නිසා" දිට්ඨි මාන යැයිද කිව හැක්කේය. ඉහළ මාර්ග ඤාණයන්හී අඩංගු සම්මාදිට්ඨිය වනාහි මිච්ඡාදිට්ඨිය දුරු කරයි යැයි කියන තැන මේ මානයටම, මිච්ඡාදිට්ඨිය යැයි කියයි. අසම්මානය අර්හත් මාර්ග ඤාණයෙන් පමණක් ඉතිරි නොකොට දුරු කළ හැක්කේය. අනිත්‍ය යැයි මනාකොට දකින්නේ නම්, අනත්ත යැයිද ඒ අනුව දැකිය හැක්කේ ම ය. අනත්ත යැයි මනාකොට දක්නේ නම් මම ම යැයි කැපී පෙනීමේ කැමැත්ත ඇති අසම්මානය අර්හත් මාර්ගය මගින් ඉතිරි නොකොට දුරුකළ හැක්කේ ම ය. එබැවින් මෙම අසම්මානය දුරු කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ අනිච්ච සඤ්ඤාව වැඩිය යුතු යැයි දේශනා කළසේක. පහත දැක්වෙන්නේ අදාල අට්ඨ කථාවයි.

**අනත්ත සඤ්ඤා සණ්ඨාතීති අනිච්ච ලක්ඛණෙ දිට්ඨෙ අනත්ත ලක්ඛණං දිට්ඨමෙව හොති, එතෙසු හි තීසු ලක්ඛණෙසු එකෙකස්මිං දිට්ඨෙ ඉතර ද්වයං දිට්ඨමෙව හොති, තෙන වුත්තං "අනිච්ච සඤ්ඤිනො භික්ඛවෙ අනත්ත සඤ්ඤා සණ්ඨාතී" ති** [අං. අ. 2/792]

| | | |
|---|---|---|
| අනත්ත සඤ්ඤා | | |
| සණ්ඨාතී ති | = | අනත්ත සඤ්ඤා සණ්ඨාත යනු |
| අනිච්ච ලක්ඛණෙ | = | අනිච්ච ලක්ෂණය |
| දිට්ඨෙ | = | දුටු කල්හි |
| අනත්ත ලක්ඛණං | = | අනාත්ම ලක්ෂණය |
| වා | = | අනාත්ම ලක්ෂණය තෙම |
| දිට්ඨමෙව | = | දුටුවා ම |
| හොති | = | වේ |
| හි | = | ඇත්තය. |
| එතෙසු තීසු ලක්ඛණෙ | = | මේ තුනක් වූ අනිච්ච, දුක්ඛ, අනත්ත ලක්ෂණයන් අතරින් |
| එකෙකස්මිං | = | එක එක ලක්ෂණයක් |
| දිට්ඨෙ | = | දුටු කල්හි |
| ඉතර ද්වයං | = | එයින් බාහිර වූ ලක්ෂණ දෙකම ද |
| දිට්ඨමෙව | = | දුටුවාම |
| හොති | = | වන්නේය |
| තෙන | = | එලෙස ලක්ෂණයක් දුටුවිට ඉතිරි ලක්ෂණ දෙකම දැක ගත හැකි බව |
| අනිච්ච සඤ්ඤිනො භික්ඛවෙ අනත්ත සඤ්ඤා සණ්ඨාතීති | = | මහණෙනි, අනිච්ච සඤ්ඤාව ඇත්තා ම අනත්ත සඤ්ඤාව ඉබේම දැනගනී, හොඳින් දැනගනී යැයි |
| වුත්තං | = | දේශනා කළසේක. |

අනිච්ච, දුක්ඛ, අනත්ත යන ලක්ෂණයන් තුළින් එකක් වටහා ගතහොත් ඉතිරි ලක්ෂණ දෙකද වටහා ගත්තාම වන්නේ යැයි දක්වන

මේ පාළි අට්ඨ කථාවනට අනුව විපසසනා යෝගීතෙම අනිත්‍ය යැයි භාවනා කළ අරමුණ මත නැවත සළකා බැලුවහොත් දුක්ඛ, අනත්ත ස්වභාවයන් පමණක් ම දැකීම ස්වභාවයයි. සුඛ-අත්ත ස්වභාවයන් වනාහි දැකීම ස්වභාවය නොවේ. එබැවින් අනිත්‍ය යැයි වටහාගත් ප්‍රත්‍යක්ෂ අරමුණ මත නිත්‍ය යැයි ඇලී බැඳීගෙන පහළ විය හැකි කෙළෙස් පමණක් සංසිඳනවා නොවේ. දැක්වූ ක්‍රමයට දුක්ඛ-අනත්ත යැයිද වටහා ගැනීමට හැකි නිසා සුඛ-අත්ත යැයි ඇලී බැඳීගෙන පහළවිය හැකි කෙළෙස්ද සංසිදේ, නිවේයැයි සැළකිය යුතුය.

මෙහිලා අනෙකුත් පොත් වල සඳහන් කරුණු දැඩි සංසන්දනාත්මකව සඳහන් කරනු කැමැත්තෙමු. සම්මෝහ විනෝදනී අට්ඨ කථා හි මෙලෙස දක්වේ. කුඩා කලයක් වේවා, කුඩා භාජනයක් වේවා, වෙන යමක් වේවා. අතින් ගිලිහී බිම වැටී බිඳී ගියහොත් " අනේ! අනිච්චං" යැයි කියයි. මෙලෙස මෙම අනිත්‍ය ලක්ෂණය ප්‍රකටය. ශරීරයේ බිබිලි තුවාල පිපී ආවේනම් හෝ වේවා උලක් කටුවක් ඇණුනවිට හෝ වේවා ඕ! දුකයි යැයි කියයි. මෙලෙස දුක්ඛ ලක්ෂණය ප්‍රකට වේ. අනත්ත ලක්ෂණය වනාහී ප්‍රකට නොවේ. මුවහ වී පවතී. පහසුවෙන් මතුනොවේ. වටහා ගැනීමට දුෂ්කරයැ. විස්තර කිරීමට අපහසුය. ප්‍රකට කොට දක්වීමට දුෂ්කරයැ. බුදෙධාත්පාද කාලයක වේවා, නොවන කාලයක වේවා, අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් වනාහි ප්‍රකටයැ. අනත්ත ලක්ෂණය වනාහි බුද්ධොත්පාද කාලවලහැර අනෙකුත් කාල වලදී අප්‍රකටයැ. බුද්ධොත්පාද කාල වල පමණක් ප්‍රකටයැ. ඉතා ආනුභාව සම්පන්න සරභංග බෝසත්තුමා ආදීකොට ඇති, ඍෂිවරුන් ද පරිබ්‍රාජකයන් ද අනිච්ච, දුක්ඛ යන්න පමණක් දේශනා කළ හැක්කේය. අනත්ත යන්න දේශනා කළ නොහැක්කේය. මෙසේ දේශනා කළ නොහැකි වීමට හේතු කරුණු වනාහි;

එම බාහිර ශාසනයන්ට එළඹෙන, පැමිණෙන පිරිසට අනත්ත යන්න දේශනය කළ හැක්කේ නම්, එම එළඹෙන පිරිසට ද මාර්ග - ඵලයන්ට පත්විය හැකි වන්නේය.

අනත්ත ලක්ඛණ පඤ්ඤාපනඤ්හි අඤ්ඤස්ස කස්සචි අවිසයො, සබ්බඤ්ඤු බුද්ධානමෙව විසයො, එව මෙතං අනත්ත ලක්ඛණං අපාකටං, තස්මා සත්ථා අනත්ත ලක්ඛණං දස්සෙන්තො අනිච්චෙන වා දස්සෙති. දුක්ඛෙන වා අනිච්චදුක්ඛෙහි වා [අභි. අ. 2]

අනාත්ත ලක්‍ෂණය පැනවීම, දේශනා කිරීම අනෙක් බාහිර කෙනෙකුගේ කටයුත්තක් නොවේ. සංඛ්‍යඥත බුදුරජාණන් වහන්සේගේ ම විෂය ක්‍ෂෙත්‍රය වේ. මෙලෙස මේ අනාත්ත ලක්‍ෂණය ප්‍රකට නොවේ. එම නිසා බුදුරජාණන් වහන්සේ අනාත්ත ලක්‍ෂණය දේශනා කරන විට අනිච්ච ලක්‍ෂණය මාර්ගයෙන් ද දුක්ඛ ලක්‍ෂණය මාර්ගයෙන් ද අනිච්ච, දුක්ඛ ලක්‍ෂණයන් දෙක වශයෙන්ද ගෙනහැර දක්වන සේක යැයි දක්වයි.

මෙලෙස දක්වීමේදී බාහිර ශාසනයන්හී පුද්ගලයන්ට ද ප්‍රකටව වටහාගෙන විස්තර කළ හැකිවන්නේ යැයි කියන අනිච්ච-දුක්ඛ ලක්‍ෂණයන් අදහස් නොවෙත්. ඒවා වනාහි සම්මුති ප්‍රඥප්තීන් හා බැඳේ. එබැවින් නියම අනිත්‍ය ලක්‍ෂණය නොවේ. මරණාවස්ථාදියේ අනිච්ච යැයි දැන ගැනීම ද එම ඕලාරික අනිත්‍ය ලක්‍ෂණයම දැනගනී. කුවාල වීම, පයේ උලක් ඇනීම ආදී නො ඉවසිය හැකි දුක්ඛ ලක්‍ෂණයන්ද සාමාන්‍ය පුද්ගලයනට පරමාර්ථ ධර්ම ස්වභාවන් ලෙස වැටහෙනවා නො වේ. පුග්ගල ප්‍රඥප්තීන් හා බැඳීගෙනම "මට දුකයි - මට රිදෙයි" යන ලෙසට ප්‍රකට වේ. එබැවින් විපස්සනා ඥාණයන් මගින් දත යුතු පරමාර්ථ රූප - නාම හා සම්බන්ධයක් නැත. ඒවා, සත්ත්වයා යන ප්‍රඥප්තීන් හා සම්බන්ධයෑ. එබැවින් නියම දුක්ඛ ලක්‍ෂණය නො වේ. මෙලෙස විපස්සනා ඥාණයෙන් දතයුතු නියම අනිච්ච, දුක්ඛ ලක්‍ෂණයන් නො දැන සිටි බැවින් *සරභංග* වැනි බාහිර ශාසනික ආචාර්‍ය්‍යවරයනට නියම අනිත්‍ය ලක්‍ෂණයන් දැනගත නො හැක්කේය. දේශනා කළ නො හැක්කේ යයි දත යුතු.

යට දැක්වූ අංගුත්තර පාළි අට්ඨ කථා මගින් කියැවුණු කථාව වනාහි විපස්සනා ඥාණයන් මගින් පමණක් දත හැකි වූ "හුත්වා අභාව

උදයබ්බය පටි පීළන අවසවනාකාර" යනු අනිච්ච- දුක්ඛ- අනත්ත ලක්ෂණයන් පමණක් දක්වන කථාවකි. මේ නියම ලක්ෂණ තුන තුළින් එකක් දැනගත්තේ නම් ඉතිරි ලක්ෂණ දෙකද දැක දැන ගත හැක්කේය. එබැවින් ම දැක්වූ සම්මෝහ විනොදනී අට්ඨ කථාව ද අනත්ත ලක්ෂණය අනිච්ච, දුක්ඛ, ලක්ෂණයන් මාර්ගයෙන් දේශනා කරන බවට විවරණය කරයි. මෙලෙස දැක්වීමේදී අනත්ත ලක්ෂණය වටහා ගැනීම සඳහා වන අනිච්ච දුක්ඛ ලක්ෂණයන් විපස්සනාවෙන් දතයුතු නියම ලක්ෂණයන් වෙත්. අනත්ත ලක්ෂණය මෙන්ම මේවාද දැනගැනීමට දුෂ්කර වේ. මේවාද සර්වඥයන් වහන්සේ හැර වෙන කෙනෙකුන්ට දේශනා කළ නොහැක්කේය. එබැවින් මූල ටීකාහි පහත දැක්වෙන ලෙසට විස්තර කෙරේ.

**අනත්තලක්ඛණපඤ්ඤාපනස්ස අඤ්ඤස්සං අවිසයතතා අනත්ත ලක්ඛණදීපකානං, අනිච්ච දුක්ඛ ලක්ෂණානඤ්ච පඤ්ඤාපනස්ස අවිසයතා දසිතාහොති, එවං පන දුපඤ්ඤාපනතා එතෙසං දුරුපධාන තාය හොති.** [මූල ටී. 2]

| | | |
|---|---|---|
| **අනත්තලක්ඛණපඤ්ඤාපනස්ස** | = | අනත්ත ලක්ෂණය පැණවීම |
| **වා** | = | දේශනා කිරීම |
| **අඤ්ඤස්සං අවිසයතතා** | = | බුදුරජාණන් වහන්සේගෙන් බාහිර වූ කෙනෙකුගේ විෂය ක්ෂෙත්‍රය නොවන බැවින් |
| **අනත්ත ලක්ඛණ දීපකානං** | = | අනත්ත ලක්ෂණය දක්වන |
| **අනිච්ච දුක්ඛ ලක්ඛණානං** | = | නියම අනිත්‍ය ලක්ෂණය, නියම දුක්ඛ ලක්ෂණය යන මේවා |
| **පඤ්ඤාපනස්ස** | = | පැණවීම, දේශනා කිරීමද |
| **අවිසයතා** | = | බුදුරජාණන් වහන්සේගෙන් පරිබාහිර පුද්ගලයන්ගේ ක්ෂේත්‍රය නොවන බවට |
| **දසිතා** | = | අට්ඨ කථා ආචාර්යවරයාගේ දැක්වීම |

| | | |
|---|---|---|
| හොති | = | වේ. |
| එවං දුප්පඤ්ඤාපනතා පන | = | මෙලෙස දැනගැනීමට, දැක්වීමට දුෂ්කරවීම |
| එතෙසං | = | එම නියම අනිත්‍ය දුක්ඛ, අනත්ත යන නියම ලක්ෂණයන්හි |
| දුරුපට්ඨානතාය | = | ඤාණයෙහි ප්‍රකට වීම දුෂ්කර බව නිසා |
| හොති | = | වේ. |

## අදහස වනාහි

අනෙකෙකුට අනාත්ම ලක්ෂණය වනාහි දේශනා කිරීම කළ නොහැක්කේය, බුදුන් වහන්සේට පමණක් දේශනා කළ හැක්කේ යැ"යි එම වටහා ගැනීමට දුෂ්කර අනත්ත ලක්ෂණය, අනිච්ච ලක්ෂණය, දුක්ඛ ලක්ෂණයන් මගින් දක්වන්නේ යැයි කියන අට්ඨ කථා කියමනෙන්, "නියම අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් නොදැනීම නිසාම අනත්ත ලක්ෂණයන් නොදනීයි. නියම අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් දැන ගැනීමෙන් ම වනාහි අනත්ත ලක්ෂණය ද දැන ගන්නේ යැ"යිද, බුදුරජාණන් වහන්සේගෙන් පරිබාහිර අනෙකුත් පුද්ගලයන් අනත්ත ලක්ෂණය නොදත හැක්කොසේ නියම අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් ද තමාටම වටහාගත නොහැක්කේය. එම නිසා අනත්ත ලක්ෂණය වටහා දීමට හැකියාව ඇති අනිච්ච දුක්ඛ ලක්ෂණයන් ද බුදුරජාණන් වහන්සේ හැර අනෙක් පුද්ගලයන්ට වනාහී දේශනා කළ නොහැක්කේය. බුදුරජාණන් වහන්සේට පමණක් දේශනා කළ හැක්කේයැ"යි යන ලෙසටද අදහසක් දක්වයි. නියම අනිච්ච, දුක්ඛ අනත්ත ලක්ෂණයන් දේශනා කිරීමට දුෂ්කර වන්නේ එම නියම ලක්ෂණයන් ලෙහෙසියෙන් නොපැණෙන නිසා යැයි යන අදහසයි.

මෙම ටීකාවෙහි අනත්ත ලක්ෂණය දැක්විය හැකි නියම අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් යන්න, විපස්සනාවෙන් දත යුතු නියම අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් වේ. එම මැටි බඳුනක් බිඳී යෑමේදී, පයේ උලක් ඇණුනු

අවස්ථාව ආදියේදී දැනගන්නා අනිච්ච හා දුක්ඛ ලක්ෂණයන් වනාහි අනත්ත ලක්ෂණය ඒකාන්තයෙන් ගෙනහැරදක්වීමට හේතු නොවන්නේ ම ය. එබැවින් අනුටීකාහි පහත සඳහන් වේ.

න හි සටභෙද-කණ්ඨක වෙධාධිවසෙන ලබ්භමානා අනිච්ච දුක්ඛතා සත්තානං එකන්තතො අනත්තාධිගමහෙතු හොන්ති, පච්චයප්පටිබද්ධතා අභිණ්හසම්පටිපීළන, දිවසෙන පන ලබ්භමානා හොන්ති, තථාහි චක්ඛාදිනි කම්මාදි මහාභූතාදි පච්චයප්පටිබද්ධ වුත්තීනි, තතො එව අහුත්වා සම්භවන්ති හුත්වා පටිවෙන්ති අනිච්චානි අභිණ්හසම්පටිපීලිතත්තා දුක්ඛානි, එවම්භූතානිච අවසවත්තනතො අනත්තකානීති පරිග්ගහෙ ධීතෙහි සමුපචිත ඤාණ සම්භාරෙහි පස්සිතුං සක්කා [අනු. ටී. (බු) 2/34]

| | | |
|---|---|---|
| හි | = | නියම අනිච්ච, දුක්ඛ ලක්ඛණයන්ට වනාහි අනත්ත ලක්ෂණය දක්විය හැක්කේය. එම නියම ලක්ෂණයන් ගෙනහැර දක්වීම වනාහි බුදුරජාණන් වහන්සේට පමණක් කළ හැක්කක. යන මූල ටීකා කථාව ඇත්තය. |
| සටභෙද කණ්ඨක | | |
| වෙධාදිවසෙන | | |
| ලබ්භමානා | = | කලයක් බිඳීම, උලක් ඇනීම, ආදිය අනුව වටහාගත් |
| අනිච්ච දුක්ඛතා | = | අනිච්ච ලක්ෂණ දුක්ඛ ලක්ෂණය යනාදිය |
| සත්තානං | = | සත්ත්වයන්ගේ |
| එකන්තතො | | |
| අනත්තාධිගම හෙතු | = | ඒකාන්තයෙන් අනත්ත ලක්ෂණය දැනගැනීමට හේතූන් |
| න හොන්ති | = | නොවෙත් |

පච්චයපටිබද්ධතා
අභිණ්හසම්පටිපීළනාදි වසෙන = හේතු හා බැඳුන බව, අතරක් නොතබා පෙළෙන බව ආදීන් වශයෙන් වටහාගතයුතු අනිච්ච, දුක්ඛ ලක්ෂණයන් වනාහි

(මෙහි ආදී ශබ්දයට ගැනෙන්නේ උප්පාද වය පරිච්ඡින්නතා තාවකාලිකතා, අනිච්චන්තිකතා, විපරිණාමතා ආදිය සහ දුක්ඛතො දුක්ඛ වත්ථුතා ආදීයයි)

ඒකන්තතො අනත්තාධිගම හෙතු = ඒකාන්තයෙන් අනාත්ම ලක්ෂණය වටහා ගැනීමට හේතු

හොන්ති = වෙත්

යථාහි = යම්සේ වනාහි

චක්ඛාදීනි = ප්‍රසාද චක්ෂුය ආදී කොට ඇති නාම-රූප ආයතනයන්

කම්මාති මහාභූතාදී පච්චය
පටිබද්ධවුත්තීනි = කර්මය ආදී අතීත හේතු නිසා, මහා භූත ආදී පච්චුප්පන්න හේතු හා බැඳී පහළවේ ද

තතො එව = මෙලෙස හේතු හා බැඳී පහළ වීම නිසාම

අහුත්වා සම්භවන්ති = පෙර නොතිබී, අලුතින් පහළ වීම-පහළ වී නැවත විනාශ වී යෑම යන මේ හේතුවෙන්

අනිච්චාති = අනිත්‍යයැ

ඉති = මෙලෙසට ද (පස්සිතුං හා බැඳේ)

අභිණ්හ සම්පටිපීළිතත්තා = ඇතිවීම නැතිවීම මගින් අතරක් නොතබා පෙළන සුළු බැවින්

| | | |
|---|---|---|
| දුක්ඛාති | = | දුක යැ |
| ඉති | = | මෙලෙස (පස්සිතුං හා බැඳේ) |
| ච | = | මෙපමණකුදු නොවේ |
| එවම්භූතානි | = | මෙලෙස අනිත්‍ය, දුක්ඛවූ ආයතනයෝ |
| අවසවත්තනතො | = | නිත්‍ය බව කැමති වන නමුත් තම කැමැත්ත අනුව නොපිහිටා-ඇති වෙමින්, නැතිවෙමින් යන බැවින් |
| අනත්තකානි | = | වසයෙහි පැවැත්විය හැකි ආත්මයක් නැත |
| වා | = | කිසිවකුගේ මනාපය පරිදි වසඟයෙහි පැවැත් වීමක් නැත |
| ඉති | = | මෙලෙසට ද (පස්සිතුං හා බැඳේ) |
| සමුපචිතඤාන සමභාරෙහි | = | ළඟා කරගත් විපස්සනා ඤාණයන්හි පදනම වන්නා වූ |
| වා | = | විපස්සනා ඤාණ සම්භාරයේ පදනම සහිත වූ, පාරමී සපුරාගත්, රූප-නාම පරිග්‍රහ කොට භාවනා කිරීමෙහි පිහිටා සිටි පුද්ගලයාට |
| පස්සිතුං | = | දැකීමට |
| සක්කා | = | හැක්කේය. |

## අනිච්චානුපස්සනා සංක්ෂෙප

ද්වාර හයෙහි ප්‍රකටව පැණුනු රූප-නාම අරමුණ, පහළවන මුල් ප්‍රකෘති ස්වභාව වශයෙන් (සභාව ලක්ෂණ වශයෙන්) මෙනෙහි කරමින් සිටින විට ඇතිවීම, නැතිවීම යන දෙකම දැකගෙන හෝ වේවා බිඳී

විනාශ වී නොපෙනී යෑම දැක ගෙන හෝ වේවා, අනිත්‍ය යැයි දැක දැනගැනීම අනිච්චානුපස්සනා නම්වේ. මෙහෙහි කටයුතු අරමුණ අනිත්‍ය යැයි වර්තමානව දැනගන්නා මෙම ඤාණය පච්චක්ඛ අනිච්චානුපස්සනා නම්වේ.

මෙලෙස වර්තමාන ලෙස පැහැදිළිව නිපුනව දැක දැනගත් කල්හී වර්තමානව දත නොහැකි වන අතීත රූප-නාම මතද මෙලෙසට ම අනිත්‍ය යැයි සළකා බලා විනිශ්චය කරමින් භාවනා කරයි. මුළු ලෝකයේම ඇතිතාක් රූප-නාමයන් ද මෙලෙසට ම සළකා බලා විනිශ්චය කරමින් භාවනා කරයි. මෙලෙස සළකා බලා විනිශ්චය කරන ඤාණය වනාහි අනුමාන අනිච්චානුපස්සනා වේ. අන්වය ඤාණ නම් ද වේ.

පච්චක්ඛ, අනුමාන වශයෙන් දෙයාකාර වූ මෙම අනිච්චානු පස්සනා සම්මසන ඤාණයෙන් පටන්ගෙන පහළ වේ. භංග ඤාණයේ පටන් කෙළෙස් ප්‍රහානය කිරීම් වශයෙන් සමෘද්ධ වේ. එබැවින් භංග ඤාණය විග්‍රහ කරන පටිසම්භිදාමග්ගයෙහි **අනිච්චතො අනුපස්සන්තො නිච්ච සඤ්ඤං පජහති** ප්‍රහාන කෘත්‍යය ද සහිතව, සම්පූර්ණ ලෙස දේශනා කරයි. අර්ථය සඳහා මතු නිරෝධානුපස්සනා යටතේ පිටු අංක (321) හි බලන්න.

දුක්ඛානුපස්සනා ආදිය සම්බන්ධයෙන් විශේෂ කරුණු පමණක් දක්වමින්, කෙටියෙන් ලියා දක්වන්නෙමු. සියල්ලෙහි සමාන ස්ථානයන්හීද, නය ක්‍රමයට ගතයුතු ස්ථානයන්හීද මේ අනිච්චානුපස්සනා රචනය බලමින් විස්තර සළකා ගන්න

***අනිච්චානුපස්සනාව නිමියේ යැ.***

# දුක්ඛානුපස්සනාව

රූප-නාම සංස්කාර ස්වභාව ලක්ෂණ වශයෙන් මෙනෙහි කොට දැනගන්නා අතර වාරයේ ඇතිවීම-නැතිවීම මගින් අතරක් නොතබා පෙළීමද දැකගෙන දුකයැයි භාවනාකර බලන ඥාණය දුක්ඛානුපස්සනා ඥාණ නම් වේ.

ද්වාර හයෙහි ඇතිවෙමින් නැති වෙමින් පවතින්නා වූ පඤ්චස්කන්ධ රූප-නාම ධර්මයන් ඇතිවීම්-නැතිවීම් මඟින් නිතර පෙළෙන නිසා දුක්ඛ=දුක්ඛ ධර්ම නම්වේ. ඇතිවීම්-නැතිවීම් මඟින් අතරක් නොතබා පෙළීම = එසේ ඇතිවීම් - නැතිවීම් නොනිම්ව පැවතීම, දුක්ඛ ලක්ඛණ මෙනෙහි කොට දත යුතු ලක්ෂණය නම් වේ. ඇතිවීම් නැතිවීම් සහිත රූප-නාමයන් මෙනෙහි කරමින් සිටින අවස්ථාවේම දැකගන්නා එම ලක්ෂණය දුක්ඛ ලක්ෂණය නම්වේ. බිය ජනක කරුණක් ලෙසට ද, භයක් ලෙසට ද, පිළිකුල් ජනක යැයිද නරක යැයිද යන අමනාප ආකාරයන්ට අනුව එයම වටහා ගැනීම් ද දුක්ඛානුපස්සනාවම වේ.

'යදනිච්චං තං දුක්ඛං' වචනතො පන තදෙව ඛන්ධපඤ්චකං දුක්ඛං. කස්මා? අභිණ්හපටිපීළනා අභිණ්හ පටිපීළනාකාරො දුක්ඛ ලක්ඛණං [වි. ම. 480]

| | | |
|---|---|---|
| යං අනිච්චං තං දුක්ඛන්ති වචනතො | = | යම් ධර්මයක් අනිත්‍යය ද එම අනිත්‍ය ධර්මය දුක යැ’යි දේශනා කොට ඇති බැවින් |
| තදෙව ඛන්ධ පඤ්චකං | = | මෙම පඤ්චස්කන්ධය ම |
| දුක්ඛං | = | දුක් ධර්මයක් නම් වේ. |
| කස්මා | = | කෙසේද යත් |
| අභිණ්හපටිපීළනා | = | ඇතිවීම් නැතිවීම් දෙකින් අතරක් නොතබා පෙළන බැවිනි, |
| අභිණ්හ පටිපීළනාකාරො | = | ඇතිවීම් නැතිවීම් දෙකින් අතරක් නොතබා පෙළන ස්වභාවය |
| දුක්ඛ ලක්ඛණං | = | දුඛ යැයි මෙනෙහි කොට දතයුතු ලක්‍ෂණයයි. |

## දුක්ඛ ලක්‍ෂණ තුන් වර්ගය

දුක්ඛ දුක්ඛතා යැයි කියන හුදු දුක්ඛ ලක්‍ෂණය,
විපරිනාම දුක්ඛතා යැයි කියනු ලබන විපරිනාම දුකඛ ලක්‍ෂණය,
සංඛාර දුක්ඛතා යැයි කියනු ලබන සංස්කාර දුකඛ ලක්‍ෂණය,

යන ලෙසට දුකඛ ලක්‍ෂණය තුන් ආකාර වේ. ඒ තුළින් කායික චෛතසික වන්නා වූ නෝඉවසිය හැකි දුක්ඛ වේදනාවෙහි නොඉවසිය හැකි ස්වභාවය දුක්ඛ දුක්ඛතා ලක්‍ෂණය නම්වේ.

කායික චෛතසික වූ සුඛ වේදනාවේ පෙරළෙන වෙනස්වන බව විපරිනාම දුක්ඛ ලක්‍ෂණය නම්වේ. අභිණ්හ පටිපීළනාකාර යැයි කියන සංස්කාර ධර්මයන්හී ඇතිවීම්, නැතිවීම්, නොනිමි බව සංඛාර දුක්ඛ ලක්‍ෂණය නම්වේ. මේ දුකඛ ලක්‍ෂණ තුන අතුරින් අභිණ්හපටිපීළනාකාර නම් වූ සංඛාර දුක්ඛ ලක්‍ෂණය පමණක් ඉහත

අට්ඨ කථාහි දැක්වීම, එම සංඛාර දුක්ඛ ලක්‍ෂණය පමණක් තෙභූමක සංඛාර සියල්ල හා බැඳී ප්‍රධානව පවතින බැවින් යැයි දතයුතු.

**තීසු දුක්ඛතාසු සංඛාර දුක්ඛතාව බයාපිනී** [මහා. ටී.(බු.)2/362]

| | | |
|---|---|---|
| **තීසු දුක්ඛතාසු** | = | තුන් ආකාර වූ දුකඛ ලක්‍ෂණයන් තුළින් |
| **සංඛාර දුක්ඛතා එව** | = | සංඛාර දුක්ඛ ලක්‍ෂණය පමණක් ම |
| **බ්‍යාපිනී** | = | සියලු සංඛාරයන් අතර ව්‍යාපෘත වේ |

ද්වාර හයෙහි අභින්නව ඇතිවෙමින් - නැති වෙමින් පවතින්නා වූ රූප-නාමයන් මෙනෙහි කොට භාවනා නොකරන්නා, මේ ඇතිවීම්-නැතිවීම් දෙකින් නිතර පෙළන බව නොදනී. ඇතිවීම්-නැතිවීම් වලින් වනාහි නිතර පෙළන බවට සිත නොයොදා, භාවනා නොකරන්න. එක් ඉරියා පථයක දිගට ගත කිරීම නිසා. වේදනා, දාහය ආදී නොඉවසිය හැකි දුක්ඛ වේදනා පහළ වූයේ මුත් එම වේදනාවන් සංඛාර ස්වභාවයන් වශයෙන් තත්ත්වාකාරයෙන් නොදැන සැප පතා වෙනත් ඉරියව්වකට මාරුවේ. එවැනි පුද්ගලයන් සිත නොයොදා මෙනෙහි නොකොට, මාරු කරන ඉරියාපථයන් මගින් වැසීගත් බැවින්, එසේ මතු වූ නොඉවසිය හැකි දුක්ඛ වේදනාව නම් වූ එම දුක්ඛ දුක්ඛ ලක්‍ෂණය ඇති සැටියෙන් ප්‍රකට නොවේ.

විපරිනාම දුකඛ, සංඛාර දුක්ඛ ලක්‍ෂණයන් ද්වාර හයෙහි ඇතිවෙමින්-නැතිවෙමින් යන රූප - නාමයන් අතරක් නොතබා මෙනෙහි කොට භාවනා කරන්නාට නිතර පෙළන බව මේ මගින් දැනගත හැක්කේය. ඇතිවීම් මගින් නැතිවීම් මගින් නිතර පෙළෙන බවට සිත යොදා භාවනා කරන බැවින් එක් ඉරියව්වක ආරම්භයේ දැණුන සුඛ වේදනාවේ පසු කාලයකින් නොපෙනීයාම නම් වූ විපරිනාම දුක්ඛ ලක්‍ෂණය ද දත හැක්කේය. එම අවස්ථාවේ පහළ වූ අම්හිරි වේදනා දාහය ආදී නොඉවසිය හැකි දුක්ඛ වේදනාවෝද, සංඛාර ධම්ම ස්වභාව වශයෙන් මෙනෙහිකොට දැනගනී. නොඉවසිය හැකි බැවින්

ඉරියාපථ වෙනස් කිරීමට කැමති වීමද එසේ වෙනස් කිරීමද, වෙනස් කළ පසුද නොඉවසිය හැකි බව නොපෙනී ගොස් පහසු සුඛ වේදනාවට පත්වීමද ක්‍රමානුකූලව මෙනෙහිකොට දැන ගනී. මෙලෙස ඇතිවීම් හා නැතිවීම් දෙකින් නිතර පෙළීම මත සිත යොදා භාවනාකොට පහළ වූ නොඉවසිය හැකි බව, වෙනස් කිරීමට කැමති සිත, වෙනස් කරන ඉරියාපථ අනුව මෙනෙහි කරන යෝගී තෙම දුක්ඛ ලක්‍ෂණය වසාලිය හැකි මෙම ඉරියාපථය මාරු කිරීම භාවනා මනසිකාරය අනුව හැර දැමීම ඉවත්කිරීම ක්‍රමයෙන් අත්දකිනු ඇත. එවිට යෝගී හට සියුම් වූ සංඛාර දුක්ඛ ලක්‍ෂණයද ප්‍රකට පැහැදිළි වන බැවින් එයම නියම දුක්ඛානු පස්සනාව වේ.

**දුක්ඛ ලක්ඛණං අභිණ්හසම්පටිපීළනස්ස අමනසිකාරා ඉරියාපථෙහි පටිච්ඡන්නත්තා න උපට්ඨාති. අභිණ්හසම්පටිපීළනං මනසිකත්වා ඉරියාපථෙ උග්ඝාටිතෙ දුක්ඛලක්ඛණං යාථාව සරසතො උපට්ඨාති**

[වි. ම.480]

| | | |
|---|---|---|
| **අභිණ්හ සම්පටිපීළනස්ස** | = | ඇතිවීම් නැතිවීම් මඟින් නිතර පෙළීම |
| **අමනසිකාරා** | = | අනුව මනසිකාරය නොයෙදීම නිසා |
| **ඉරියාපථෙහි** | = | නිතර මාරු කළ යුතු හිඳීම, සිටීම, හොවීම, යෑම නම් වූ ඉරියාපථයන් මඟින් |
| **පටිච්ඡන්නත්තා** | = | වැසී ඇති බැවින් |
| **න උපට්ඨාති** | = | ප්‍රකට නොවේ |
| **අභිණ්හසම්පීළනං** | = | ඇතිවීම් නැතිවීම් විසින් නිතර පෙළීම |
| **මනසිකත්වා** | = | මෙනෙහි කොට |
| **ඉරියාපථෙ උග්ඝාටිතෙ** | = | වසාලන සුළු ඉරියාපථය උදුරා දැමූ කල්හී |
| **දුක්ඛ ලක්ඛණං** | = | දුක්ඛ ලක්‍ෂණය |
| **යාථාවසරසතො** | = | තමාගේ ප්‍රකෘති ස්වභාවයෙන්, තත්ත්වාකාරයෙන් |
| **උපට්ඨාති** | = | ප්‍රකට වේ. |

මෙම අට්ඨ කථාහි, "වසන ලද ඉරියාපථය හැර දමන කල්හිම දුක්ඛ ලක්‍ෂණය ප්‍රකට වේ යැ"යි කියන ලද බැවින් **දුක්ඛ දුක්ඛ** ලක්‍ෂණයේ වැසී යෑම පමණක් වනාහි ගෙනහැර පායි" යැයි සිතා ගැනීමට ඉඩතිබේ. නමුදු **අභිණ්හසම්පටිපීළනං මනසිකත්වා** යන කථාවෙන්, **සංඛාර දුක්ඛ** ලක්‍ෂණය **විපරිනාම දුක්ඛ** ලක්‍ෂණය යන මේවායේද ප්‍රකට වීම දක්වයි. මේ නිසා දුක්ඛ ලක්‍ෂණ තුනේම ප්‍රකට වීම දක්වයි. යථා ස්වභාවයෙන් ප්‍රකට දුක්ඛ ලක්‍ෂණය මගින් දුක යයි වටහා ගන්නා ලද නියම දුක්ඛානුපස්සනාව පහළ වන පහළ වන වාරයේ සුඛ සඤ්ඤා ආදී දුරු කරයි. දුරුකරන ආකාරය වනාහි, ප්‍රකට රූප-නාම අරමුණු, දුක්ඛ යැයි තත්ත්වාකාරයෙන් නොදකින්නේ නම් එම නොදත් අරමුණ මත සුඛයැයි සලකා ගන්නා සඤ්ඤා විපල්ලාසයද පහළ වීමට ඉඩ ඇත. දිට්ඨි, චිත්ත විපලලාසයන් ද පහළවිය හැක්කේය. ඉතිරි කෙළෙස්ද පහළවිය හැක්කේය. කුසලය අකුසල කර්මයෝද පහළවිය හැක්කේය. දුක්ඛයැයි තත්ත්වාකාරයෙන් දැක ගත් විට වනාහි එම අරමුණ හා බැඳී සඤ්ඤා විපල්ලාස ආදිය පහළවිය නොහැක්කේය. මෙලෙස සඤ්ඤා විපල්ලාසය ආදී කොට ඇති, විපාක ස්කන්ධයන් කෙළවර කොට ඇති ධර්මයන්හි පහළවිය නොහැකි තත්ත්වය දුකඛානුපස්සනාව මගින් වනාහි දුරුකිරීම කරයි. සමනය කරයි. එබැවින් විශුද්ධි මාර්ගයෙහි;

**දුක්ඛානුපස්සනං භාවෙන්තො සුඛ සඤ්ඤං පජහති** යැයි

**එසේම පටිසම්භිදා මග්ගයෙහි** [වි. මා. 472]

**දුක්ඛතො අනුපස්සන්තො සුඛ සඤ්ඤං පජාහති** [ප. ම. 110]

| | | |
|---|---|---|
| **දුක්ඛතො** | = | දුකයැ'යි |
| **අනුපස්සන්තො** | = | අනුපසසනා කරන්නා |
| **සුඛ සඤ්ඤං** | = | සුඛයැයි සලකා ගැනීම |
| **පජහති** | = | දුරු කරයි |

## දුක්ඛානු පස්සනාව සංක්ෂෙපයෙන්

ද්වාර හයෙහි ප්‍රකට වන රූප - නාම අරමුණු ප්‍රකෘති ස්වභාවයෙන් ම මෙනෙහි කරන අතර වාරයේ ඇතිවීම්-නැතිවීම් පෙළීම් ස්වභාවය දුක හෝ පෙරළෙන වෙනස් වන ස්වභාවය දුක හෝ, නොඉවසිය හැකි ලෙසට පෙළන ස්වභාවය දුක හෝ, දුක යැයි වටහා ගන පැහැදීම **පච්චක්ඛදුක්ඛානුපස්සනා** නම් වේ. මෙම පච්චක්ඛ ඤාණයෙන් පැහැදිළිව පිරිසිදුව වටහාගත් අවස්ථාවේ ඇස්පනා පිට නොදත හැකි නමුත් අතීත, අනාගත රූප - නාම බහිද්ධා රූප - නාම යන සකල ලොකයේම ඇති රුප-නාමයන් මේ ආකාරයටම දුක යැයි නිශ්චිත කරන ඤාණය **අනුමාන දුක්ඛානුපස්සනා** නම් වේ. අන්වය ඤාණය යැයිද නම් කෙරේ.

මේ දෙයාකාර දුක්ඛානුපස්සනාවන්ද සම්මසන ඤාණයේ පටන් පහළ වේ. භංග ඤාණයේ පටන් කෙලෙස්වල දුරුවීම් හෙවත් ප්‍රහාණ කෘත්‍යය සම්පූර්ණවේ.

*දුක්ඛානුපස්සනාව නිමියේ යැ.*

# 3 අනත්තානුපස්සනාව

රූප-නාම සංස්කාර ස්වභාව ලක්‍ෂණ වශයෙන් මෙනෙහි කරමින් සිටින විට "තමා කැමති පරිදි නොපිහිටන බවද, දූකගෙන ආණ්ඩු මට්ටු කළ හැකි, පාලනය කළ හැකි මමෙක් නැති බවද, ස්වකීය ස්වභාවය අනුව ඇතිවෙන නැතිවෙන බව පමණක් වන්නේ යැ'යි ද දූකගන්නා ඤාණය අනත්තානුපස්සනා නම්වේ.

මෙහිලා අනත්ත හි විරුදධාර්ථ වන්නා වූ අත්ත යන්න රූප සමූහ - නාම සමූහ, කාය= කය යන්නද නොවේ. සත්ත්වයෙක්, ද්‍රව්‍ය සටහනක්, දෙයක් යැයිද කිම නොහේ. ඇත්ත වශයෙන් නම් ස්වාමි, නිවාසි, කාරක, වේදක අධිට්ඨායක, සයංවසී යැයි බලා පෘතග්ජනයන් කල්පනාකොට බැඳීගෙන, සත්ත්වයෙක්, ආත්මයක් විඤ්ඤාණයක් යැයි ව්‍යාවහාර කරන ආත්මයයි.

බාල පෘතග්ජනයන් මෙහි බැඳීගන්නා ආකාරය සඳහා සම්මසන ඤාණය යටතේ පිටු අංක (115) හි තුන්වන කොටස බලන්න.

මෙම ආත්මය තෙම පඤ්චස්කන්ධය, රූප-නාම ධර්මයන්ද නොවේ. පඤ්චස්කන්ධයක්, රූප- නාම ධර්ම යන්න ඇත්තක් ද නොවේ. මෙයින් පිටත ද පවතිනවා නොවේ. දෘෂ්ඨි වලින් නිදහස් නොවූ පෘතග්ජනයින් සිතා බලා තදින් අල්ලා ගන්නා වූ ප්‍රඥප්තියක් පමණක් ම වේ. එබැවින් පඤ්චසකන්ධ- රූප - නාම ධර්ම තෙම අනත්ත නම්

වේ. (න අත්තා අනත්තා, නත්ථි අත්තා එතස්ස ඛන්ධ පඤ්චකස්සාති වා අනත්තා) හිමිකරු ආත්මයක් නොමැති ධර්ම, හිමිකරු ආත්මයක් නොවන්නා වූ ධර්ම යැයි කියනු ලැබේ. කුමක් නිසා අනත්ත නම්වේද යත්ඃ ආත්මය ඇත්ත නම් එයට තම කැමැත්ත පරිදි පැවැත්විය හැකි විය යුතුවේ. අත්ත = වසඟයෙහි පැවැත්විය හැක්කකු ඇත්තේ නම් තම කැමැත්ත පරිදි පැවැත්විය හැකි විය යුතුයි. නමුදු, පඤ්චස්කන්ධය වනාහි තම කැමැත්ත පරිදි නොපවතින නිසා අනත්ත වේ මැයි. තම කැමැත්ත පරිදි වසඟයෙහි පැවැත්විය නොහැකි ස්වභාවයක් යැ. අනත්ත යැයි අනුපස්සනා කටයුතු ලක්ෂණය බැවින් අනත්ත ලක්ෂණ නම් වේ. මතුවන තාක් රූප- නාම ස්කන්ධයන් මෙනෙහි කොට දූනගත් යෝගී තෙම ස්වකීය සවභාවය අනුව ඉබේ ඇතිවෙමින් - නැතිවෙමින් පවතින ධර්ම පමණක්ම ඇස්පනාපිට දූකගනී. කැමැත්ත පරිදි පැවැත්විය හැකිවූ වසඟයෙහි පවත්වන්නා වූ පාලනය කරන්නා වූ, යැයි කීමට වටනා ආත්මයක් යන්න දූකගත නොහැක්කේය. එබැවින් මෙනෙහි කොට දතයුතු රූප-නාමයන් "වසඟයෙහි පැවැත්විය හැකි ආත්මයක් නොවේ. ධර්ම ස්වභාවයක් පමණකැ"යි දූක දූන පහදී. මෙලෙස දූක දූන ගැනීම අනත්තානුපස්සනා නම්වේ.

යං දුක්ඛං තදනත්තාති පන වචනතො තදෙව ඛන්ධපඤ්චකං අනත්තා. කස්මා? අවසවත්තනතො, අවසවත්තනාකාරො අනත්ත ලක්ඛණො [වි. ම. 480]

| | | |
|---|---|---|
| තදෙව ඛන්ධ පඤ්චකං | = | එම පඤ්චස්කන්ධය ම |
| අනත්ත | = | අනාත්මය යැයි කියනු ලැබේ |
| කස්මා | = | කුමක් නිසාද යත් |
| අවසවත්තනතො | = | වසඟයෙහි පැවැත්විය නොහැකිනිසාය |
| අවසවත්තනතො | = | වසඟයෙහි පැවැත්විය නොහැකි ආකාරය |
| අනත්තලක්ඛණ | = | අනත්ත ලක්ෂණය නම්වේ. ද්වාර හයෙහි පහළවන තාක් ධර්මයෝ මෙනෙහිකොට |

භාවනා නොකරන්නා එම ධර්මයන්, ඛණ, ස්වභාව, කෘත්‍ය, අරමුණු වශයෙන් වෙන් වෙන්ව බෙදී ප්‍රකටව නොපැණේ එකක් පිඩුවක් ඒකකයක්, එකෙක් වශයෙන් පැණේ.

මෙලෙස එකක් ලෙසටම ප්‍රකට වන ඝන ප්‍රඥප්තිය මගින් වනාහි වැසී ඇති බැවින් භාවනා නොකරන පුද්ගලයනට අනත්ත ලක්ෂණය ප්‍රකට නොවී, ආවරණය වී පවතින්නේය. අනත්ත ලක්ෂණය ප්‍රකට නොවූ පුද්ගලයාට නියම අනත්තානුපස්සනා ඤාණ පහළ විය නොහැක්කේය.

ද්වාර හයෙහි පහළ වන තාක් ධර්මයන් මෙනෙහි කොට භාවනා කරන්නාට එම ධර්මයන්, සති-සමාධි ධර්ම බලවත් වූ අවස්ථාවේදී ඛණ, ස්වභාව, කෘත්‍යය, අරමුණු වශයෙන් වෙන වෙනම ප්‍රකටව වේ. උපමාවක් ලෙස දකින අවස්ථාවේ හුදු දැකීම් ස්වභාවයම පමණක්, විසදව, වෙන් වෙන්ව ප්‍රකටවන්නා සේය. මෙලෙස යෝගී හට එකක්ම වශයෙන් පැනුනු ඝන ප්‍රඥපති සම්බාධ භාවය සිඳී බිඳී යන බැවින් කැමැත්ත පරිදි නොපවතින බව නම් වූ අනත්ත ලක්ෂණය තත්ත්වාකාරයෙන් ඉබේටම මෙන් ප්‍රකට වේ. මෙලෙස තත්ත්වාකාරයෙන් අනත්ත ලක්ෂණය ප්‍රකට වූ යෝගී හට පමණක් නියම අනත්තානු පස්සනාව පහළ විය හැක්කේය.

**අනත්ත ලක්ඛණං නානාධාතුවිනිබ්භොගස්ස අමනසිකාරා ඝනෙන පටිච්ඡන්නත්තා න උපට්ඨාති නානා ධාතුයො විනිභුජ්ජිත්වා ඝන විනිබ්භොගෙ කතෙ අනත්ත ලක්ඛණං යාථාව සරසතො උපට්ඨාත**

[වි. ම. 480]

| | | |
|---|---|---|
| **නානාධාතුවිනිබ්භොගස්ස** | = | නානා විධ රූප ධාතු සවභාවයන්ගේ නාම ධාතු ස්වභාවයන්ගේ විවිධ ලෙස විචිත්‍ර ලෙස පැතිරීම |
| **අමනසිකාරො** | = | අනුව මනසිකාරය නොපැවත්වීම නිසා |

| | | |
|---|---|---|
| වා | = | එලෙස දැන ගැනීම සඳහා මෙනෙහි කොට භාවනා නොකරන නිසා |
| ඝනෙන | = | ඝනයක්, එකක් ලෙස සළකන ඝන ප්‍රඥප්තිය මඟින් |
| පරිච්ඡන්නත්තා | = | වසන ලද බැවින් |
| අනත්ත ලක්ඛණං | = | ආත්ම ස්වභාවය නොවේයැයි මෙනෙහි කොට දත යුතු අනත්ත ලක්ෂණය |
| න උපට්ඨාති | = | ප්‍රකට නොවේ. |
| නානා ධාතුයො | = | නා නා විධ රූප - නාම ධර්‍ම ස්වභාවයෝ |
| විනිබ්භුජ්ජිත්වා | = | වෙන් වෙන්ව බෙදා වෙන් කොට සිතයොදා බලා |
| ඝන විනිබ්භොගෙ | = | ඝන ප්‍රඥප්තිය, ඝනබධ භාවය වෙන් වෙන් වන සේ සිඳ බිඳ ලීම |
| කතෙ | = | සිදුකළ විට |
| අනත්ත ලක්ඛණං | = | තම කැමැත්ත අනුව නොපවතින, ආණ්ඩු මට්ටු කළ නො හැකි බව යන අනත්ත ලක්ෂණය |
| යාථාව සරසතො | = | ස්වකීය මූල ස්වභාවය වශයෙන් |
| උපට්ඨාති | = | පැනේ |

අනත්ත ලක්ෂණය වසාලන ඝන ප්‍රඥපතිය වනාහි සනත්ති ඝන, සමූහ ඝන, කිච්ච ඝන ආරම්මණ ඝන, යන ලෙසට සතරාකාරයට බෙදා දක්වයි. සන්තති ඝනය සඳහා පිටු අංක (238,289) හි නැවත බලන්න. සනත්ති ඝනයෙන් වැසෙන ආකාරය අනත්ත ලක්ෂණය ප්‍රකට වන ආකාරය දැක්වීමේදී මතුකරදැක්වීම මෙහිලා විශේෂයයි.

## සන්තති ඝනයෙන් වැසෙන ආකාරය

දකින අවස්ථාවේ දැකීමට කැමැත්ත, දැකීම, බැලීම, නැවත, නැවතත් බැලීම, සළකාබැලීම යන මේවා වෙන වෙනම ම සිදුවන බව නොදන්නා තැනැත්තා, එම ධර්ම සියල්ලම එකක්ම ලෙස, එකෙක් ම ලෙස සළකයි. එසේ එකෙක් යැයි සිතාගන්නා සන්තති ඝනයෙන් වැසීගත් බැවින් "දැකීමට කැමති කැමති වාරයේ රිසිසේ දැකිය හැක්කේය. බැලීමට කැමති කැමති තාක් කල්පනා කළ හැක්කේය. දැකගත හැක්කේය, දැනගත හැක්කේ යැයි" සිතා "කැමැත්ත පරිදි පැවැත්විය හැකි ආත්මයක් ඇත්තේයැ"යි අදහා ගනී. අසන අවස්ථාවේ ආදියෙහි ද මේ දැක්වූ ක්‍රමයම ම බව වටහා ගන්න. නවන, දිගහරින ක්ෂණයෙහි නැවීමේ කැමැත්ත, දිග හැරීමේ කැමැත්ත අනුපිළවෙල හා නැවීමේ දිග හැරීමේ අනුපිළිවෙල වෙන වෙනම බෙදා වටහා නොගත් තැනැත්තා ද යන, හිඳින, සිටින, හොවින ක්ෂණයෙහි යෑමට කැමැත්ත හිඳීමේ කැමැත්ත, සිටීමේ කැමැත්ත, හොවීමේ කැමැත්ත අනුපිළිවෙල හා යන, හිඳින, සිටින, හොවින පියවරවල් වෙන වෙනම බෙදා වෙන්කොට නොදත් පුද්ගලයා ද "කැමැත්ත පරිදි නැවිය හැකි, දිග හැරිය හැකි, යා හැකි, හිඳිය හැකි, සිටිය හැකි, හොවිය හැකි ආත්මයක් ඇත්තේමයැ"යි වරදවා අල්ලාගනී, ක්ෂණ වශයෙන් බෙදා දැක්වූ රූප-නාම අනුපිළිවෙල බෙදා වෙන් කළ නොහැක්කේ සන්තති ඝනයෙන් වැසීගත ඇති නිසාය. පෙර පසු රූප නාම වෙන්කර නොගෙන ආත්මය යැයි සිතා අල්ලා ගැනීම් ඇතිතාක් මේ ලෙසටම සිදුවෙත්.

## සන්තතිය බිඳගත අනත්ත ලක්ෂණය මතුවීම

යෝගී තෙම වනාහී 'දැකීමට කැමැත්ත එකකි' දැකීම එකකි යන ලෙසට වෙන වෙනම ම බෙදා වෙන්කොට වටහා ගනී. එම ධර්ම සියල්ලම එකක් යැයි, එකෙක් යැයි නොසළකයි. එම නිසා සන්තති ඝනය බිඳීයයි. සන්තති ඝනය බිඳී විනාශ වී ගිය නිසා "බැලීමට

කැමැත්ත නමැති චෙතනාවට වනාහී බැලීම ලබා දීමට අපොහොසත්ය. බැලීමද වනාහී බැලීමට කැමැත්ත, දැකීම ආදිය සිදුකර දීමට අපොහොසත් වේ. දැකීමද වනාහි බැලීමට කැමැත්ත හා බැලීම යන මේවා කරදීමට අපොහොසත් වේ." යනාදී ලෙසටද වටහා ගනී. එබැවින් "කැමති පරිදි බැලිය හැකි, දැකිය හැකි, සිතිය හැකි, දැනගත හැකි කිසි ආත්මයක් නොමැත්තේය. හේතු පැනෙන කල්හී ප්‍රකටවන ධර්ම ස්වභාවයන් පමණක් ඇත්තේ යැ"යි අනත්ත ලක්ෂණය දත හැක්කේමය. ඇසීම කරන ක්ෂණයෙහිදු මෙලෙසටම යැයි වටහා ගනිත්වා. නවන දිගහැරීමේදී ද, නැවීමේ කැමැත්ත, දිගහැරීමේ කැමැත්ත අනුපිළිවෙල හා නැවීම, දිග හැරීම පිළිවෙල වෙන වෙනම බෙදා වෙන්කරගෙන දැනගන්නා නිසා නැවීමේ කැමැත්තට වනාහි නැවීම කරදීමේ හැකියාවක් නැත්තේය. නැවීමට ද නැවීමේ කැමැත්තක් ඇතිකරදීමට නොහැක්කේය. දිගහැරීමේ කැමැත්තට වනාහි දිගහැරීම ඉටුකරදිය නොහැක්කේය. දිග හැරීමටද වනාහි දිග හැරීමේ කැමැත්තක් ඇතිකරලීමට නොහැක්කේයැ"යි වටහා ගනී. එබැවින් කැමැත්ත පරිදි නැවිය හැකි, දිගහැරිය හැකි ආත්මයක් නොමැත්තේය. හේතු කරුණු සමෘධ වීමෙන්ම පහළවිය හැකි ධර්ම ස්වභාව පමණකැයි" කියන අනත්ත ලක්ෂණය දැනගත හැක්කේය. යන-එන අවස්ථාව ආදියෙහිදු මේ ක්‍රමයටම වටහා ගනිත්වා.

## සමූහ ඝන

ද්වාර හයෙහි පහළ වෙමින් පවතින රූප - නාමයන් විපස්සනාවට අනුව මෙනෙහි නොකරන, පිරිසිඳීම නොකරන්නහු විසින් නාම හා රූප සමූහ එකක්, එකෙක් ලෙසට සිතයි. මතයි. නාම එකකි-රූප එකකි යැයි බෙදා ගැනීමට අපොහොසත් වේ. උපමාවක් ලෙස, අත් පා නවන දිගහරින විට නැවීම දිග හැරීම කරන අවස්ථාවේ නාම හා නවන දිගහරින රූප යන මේවා එකක්ම යැයි සිතයි. එක් කෙනෙකුගේ සන්තානයේ ඇති චක්ඛු රූප සෝත රූප, ආදියද වර්ණ රූප සද්ද රූප

යනාදිය ද එක් කෙනෙක්ම යැයි සිතා ගනී. මේ නිසා තම අත ආදිය දක ගැනීමෙන් පසු අල්ලන කාලය අල්ලා පසුව බලන කාලය ආදියෙහි දකගන්නා වර්ණ රූපය හා හැපෙන පොට්ඨබ්බ රූප යන මේවා එකක්ම යැයි හා හැපෙන පොට්ඨබ්බ රූප යන මේවා එකක් ම යැයි සිතයි, මේ වනාහී න්‍යාය දක්වන සරල නිදර්ශනයෝය. වරදවා සිතාගත බැඳීගන්නා ආකාරයන් වනාහී විවිධය, විචිත්‍රය. මේ ක්‍රමයෙන් රූප සමූහයන්ද, නාම සමූහයන්ද, රූප - නාම සමූහයන්ද අල්ලා බදාගත එකක් ලෙස, එකෙක් ලෙස සිතා බැඳීගන්නා ප්‍රදේශය සමූහ ඝන ප්‍රඥප්ති නම් වේ, ස්වභාවිකවම විවිධ විචිත්‍රවන ධර්මයන් විපස්සනා මඟින් වෙන වෙනම විභාග කළ නොහැකි නිසා එවැනි පුද්ගලයනට ද්වාර හයෙන් පැනෙන රූප-නාමයන්ගේ අනත්ත ලක්ෂණය සමූහ ඝනය මඟින් සදාකාලිකව මෙන් වසා ගෙන සිටී.

ද්වාර හයෙහි පහළවන නාම-රූපයන් අතරක් නොතබා මෙනෙහි කරන යෝගී හට අඩුතරමින් නාම හා රූප එක එකක් වශයෙන් වෙන්වී ප්‍රකටව පැනේ. ප්‍රකට වන ආකාරය වනාහි නවන අවස්ථාවේ නැවීමෙ කැමැත්ත සිත එකකි, නැවීමේ රූප එකකි, යැයි වෙන් වෙන්ව පැනේ. 'පිම්බීම' යැයි මෙනෙහි කරන සිත එකකි, පිම්බීම ක්‍රියාව එකකි යැයි වෙන් වෙන්ව පැනේ. අනෙක් මෙනෙහි කිරීම් වලදී ද මෙලෙසටම වෙන් වෙන්ව පැනේ. ප්‍රකට වේ. මෙපමණකට ප්‍රකට වී නම් රූප - නාම සමූහ, ඝන බිඳීම සිදුවී "නැවීම හෝ දිගහැරීම කැමති සිත නැවීම හෝ දිග හැරීම කර දීමට අපොහොසත් වේ. නැවෙන රූප හා දිග හැරෙන රූප වලටද පිළිවෙලින් නැවීමේ කැමැති සිත, දිගහැරීමේ කැමති සිත නොමැතිව ස්වකීය ලෙස ක්‍රියාත්මක විය නොහැක්කේය. පිම්බීම-හැකිළීම් රූපයන් ද, මෙනෙහි කොට දනගැනීම සිදුකර දීමට අපොහොසත් වේ. හැකිලෙන රූප ආදිය නොමැතිව ඉබේම පහළ විය නොහැක්කේය" යනාදී ලෙසට වටහා ගන්නා නිසා කැමැත්ත පරිදි නොපවතින බව නම් වූ අනත්ත ලක්ෂණය තත්ත්වාකාරයෙන් ඔහුට/ඇයට ප්‍රකට

වන්නේය. තව දුරටත්.. දැකීම, ඇසීම, පහස ලැබීම යනාදිය දිගින් දිගට අතරක් නොතබා මෙනෙහි කරන අවස්ථාවේදී "දකින වර්ණ රූපය එකකි, අසන සද්ද රූපය එකකි, පහස ලබන පොට්ඨබ්බ රූප එකකි යැ"යි වෙන් වෙන්ව ප්‍රකට වේ. දැකීමේදී ඇසුර ලබන චක්ෂුරූපය අනෙකකි. ඇසීමේ ඇසුර ලබන සෝත රූපය අනෙකකි. හැපීම විඳීමේදී ඇසුර ලබන කාය ප්‍රසාදය අනෙකකි යැයිද වෙන වෙනම ප්‍රකට වේ. දැකීම (සිත) එකකි, වර්ණ රූපය හා දැකීම එක්වීම (ඵස්සය) එකකි. දැක (විඳින) සුඛ-දුක්ඛ වේදනා එකකි" යන ලෙසටද වෙන වෙනම පිරිසිඳ ප්‍රකට වේ. මෙලෙස වෙන වෙනම ප්‍රකටවන යෝගීහට සමූහ ඝන ප්‍රඥප්තිය මනාසේ බිඳී යයි. එබැවින් "කායික ක්‍රියා, වාචසික ක්‍රියා මානසික ක්‍රියා එකකටවත් තම කැමැත්ත පරිදි සිදුවිය නොහැක්කේය. අදාල හේතු සම්පාත වීමෙන්ම ක්‍රියාකාරකම් එකක් සමෘධ විය හැක්කේය යැයි" දැන ගන පහදී. එවන් යෝගී හට අවසවත්තනාකාර යන අනත්ත ලක්ෂණය තත්ත්වාකාරයෙන් ඇති සැටියෙන් ප්‍රකට වේ.

## කිච්ච ඝන

රූප-නාම ධර්ම කෘත්‍යය වශයෙන් විවිධය. විචිත්‍රය, නමුදු විපස්සනා වශයෙන් බෙදා වෙන්කර නොගත් පුද්ගලයා එම රූප-නාමයන් එකක්, එකෙක් ලෙසට සිතාගනී. සිතන ආකාරය වනාහි... දකින විට චක්ෂුරූපය මගින් වර්ණ රූපය දකිනු ලබයි. චක්ඛු විඤ්ඤාණය තෙමේ දකියි. වර්ණ රූපය දැකීමට ලක්වේ. මෙලෙස කෘත්‍යය වශයෙන් බෙදීගියේ වී නමුදු එක සන්තානයක පහළවන එම චක්ෂු රූප, වර්ණ රූප දකින නාම යන මේවා එකෙක්ම යැයි සිතත්. අසන අවස්ථාවේදී ද මෙලෙසටම වේ. තවදුරටත්,... චක්ඛු විඤ්ඤාණයට දැකිය හැක්කේය. සොත විඤ්ඤාණයට ඇසිය හැක්කේය. ඝාන විඤ්ඤාණයට ආඝ්‍රාණය කළ හැක්කේය. ජිව්හා විඤ්ඤාණයට රස දැනගත හැක්කේය. කාය විඤ්ඤාණයට පහස වටහාගත හැක්කේය. මනො විඤ්ඤාණයට විවිධ සංකල්පනා කල්පනා කළ හැක්කේය. මෙලෙස කෘත්‍යය වශයෙන්

විවිධව පැතිර ගියද එක සන්තානයක පහළවන එම රූප-නාමයන් එකෙක්ම යැයි සිතයි. දකින්නේ ද මමය. අසන්නේ, ආඝ්‍රාණය කරන්නේ, රස බලන්නේ, පහස විඳින්නේ. සිතන්නේද මමම යැයි සිතත්. තව දුරටත්... සුඛ වේදනාව සිත නැවුම් බවට පත් කරයි. දුක්ඛ වේදනාව සිත මිලාන බවට පත් කරයි. උපෙක්ඛා වේදනාව සිත නැවුම් බවක් හෝ මිලාන බවක් ඇතිනොකර සම බවට පත් කරවයි. මෙලෙස කෘත්‍ය වශයෙන් බෙදී ගියේ වී නමුදු එකම සන්තානයක පහළවන මේ වේදනා වර්ග තුන විඳින්නේ එකෙක්ම යැයි සිතා ගනී. සුඛ - සතුටු වේදනා විඳින්නේද මම ම යැ, දුක්- දොම්නස් වේදනා විඳින්නේ ද මම ම යැ. දුක් - සුඛ නැති උපේක්ෂා බව විඳින්නේද මම ම යැයි සිතයි. මෙයට අමතරව නැවීමට කැමති සිත, නැවීම් ක්‍රියා වශයෙන් චලනය කරවීම් රූප පහළ කරවයි. නවන රූප තමා කැමති ලෙසට තමා දෙසට චලනය වෙමින් පහළ විය හැකිය. මෙලෙස කෘත්‍ය වශයෙන් විවිධ වුවද එම සිත හා එම රූප අත් දකින්නේ එකෙක්ම යැයි සිතයි. "මම ම නැවීමට කැමති වන්නෙමි. මම ම නවන්නෙමි, නැවීමට කැමති වූයේ මම වෙමි." යැයි සිතයි. දිග හැරීම, යෑම ආදියෙහි ද මෙලෙසට මයැ. මෙලෙස කෘත්‍ය වශයෙන් වෙන්ව පැනුනද රූප - නාමයන් විපස්සනා වශයෙන් වෙන වෙනම, බෙදා වෙන්කොට දැනගෙන නොමැති බැවින් එකෙක් එකක් ලෙස සිතා - මතා ගැනීම කිච්ච ඝන ප්‍රඥප්තියට යටවීම නම් වේ. මෙලෙස කෘත්‍ය ඝනය සත්‍යය මුවහ කරන බැවින් සාමාන්‍ය පුද්ගලයනට අනත්ත ලක්‍ෂණය ප්‍රකට නොවී වැසී යයි.

පහළවන රූප-නාම එවිටම මෙනෙහි කිරීම නම් වූ විපස්සනාව මඟින් වෙන වෙනම බෙදා දැක දැනගත හැකි යොගීහට වනාහි කෘත්‍ය වශයෙන් බෙදීගිය එම රූප-නාමයන් එකිනෙකට නොපැටලැවී, වෙන වෙනම පැනී ප්‍රකට වේ. එබැවින් එකක්, එකක් ලෙස පෙර සිතා මතා ගත් කෘත්‍යය ඝනය බිඳීයයි. මෙලෙස ඝනය බිඳලූ යොගී හට "එක් කෘත්‍යයක් සම්පූර්ණ කරන ස්වභාව ධර්මයකට අනෙකුත් කෘත්‍යයක්

සම්පූර්ණ කළ නොහැක්කේය යැ"යි දැක දැන ගන්නා බැවින්, තම කැමැත්ත අනුව පැවැත්විය නොහැකි බව නම් වූ අනත්ත ලක්‍ෂණය තත්ත්වාකාරයෙන් මනාලෙස ප්‍රකට වේ.

## ආරම්මණ ඝන

නාම ධර්මයෝ වනාහි අරමුණු කිරීම් වශයෙන් විවිධ වේ. නමුත් විපස්සනා මගින් විසිතුරුව විභාගකොට නොගත් පුද්ගලයා තම බෙදීගිය නාමයන් එකක් එකෙක් ලෙසටම සිතා ගනී. සිතා-මතා ගන්නා ආකාරයට වනාහි... චක්ඛු විඤ්ඤාණ සිත වර්ණ රූපයක් දැක අරමුණු කරයි. සෝත විඤ්ඤාණය ශබ්දයක් අසා අරමුණු කරයි. ඝාන විඤ්ඤාණය ගන්ධයක් ආඝ්‍රාණය කොට අරමුණු කරයි. ජිව්හා විඤ්ඤාණ සිත රසයක් විඳ අරමුණු කරයි. කාය විඤ්ඤාණය පහසක් විඳ අරමුණු කරයි. මනෝ විඤ්ඤාණය විවිධ අරමුණු සිතා දැනගනිමින් අරමුණු කරයි. එබැවින් දකින සිත අසන සිත හා සම නොවේ. අසන සිත දකින සිත නොවේ. වර්ණ එක එකක් දැකීමෙහිදී ද, සුදු වර්ණය දකින සිත කළු නිල්, කහ ආදිය දකින සිත, නොවේ. කළු නිල් කහ ආදිය දකින සිතද සුදු දකින සිත නොවන්නේමය. විවිධ සද්ද අසන අවස්ථාව ද මෙලෙසටම විස්තර වශයෙන් වටහා ගන්න. එකම වර්ණයක් වුව දිගින් දිගට දැකීමේදී ද ප්‍රථමයෙන් පහළ වූ සිත, ද්විතීය තෘතීයය වශයෙන් දිගට පහළවන සිත් නොවේ. ද්විතීය, තෘතිය ආදි දිගට දකින සිත්ද දකින එම ප්‍රථම සිත නොවේ. එකම ශබ්දයක් ද දිගින් දිගට අසන අවස්ථාවේදී මෙලෙසටම විස්තර වශයෙන් වටහා ගන්න. මෙලෙස අරමුණු කිරීම වෙනස්වන වාරයකම නාම ධර්ම අළුත් වෙමින් මාරු වෙමින් පහළ වේ. නමුදු එකම සන්තානයක පිහිටන එම නාම සියල්ලම එකක්ම ලෙස, එකෙක්ම ලෙස පෘතග්ජනයා සිතා ගනී. "මම දකිමි දකි. ඇසීම අසයි" යනාදි ලෙසටද "මම ම බලන්නට සිතයි, දැකීමද දකී" යන ලෙසටද, "මම ම සුදුපාට ද දකී, කළු, නිල්, කහ, වර්ණද දකී යන ලෙසටද" මම ම දිගින් දිගට බලයි-අසයි" යන ලෙසටද,

එක්කෙනෙක් ම යැයිද සිතා ගනී. මෙලෙසට අරමුණු කිරීම වශයෙන් වෙන් වෙන් නාම ධර්මයන් සියල්ල සළකා එක්කෙනෙක් ලෙසට සිතා ගැනීම ආරම්මණ ඝන නම් වේ. මෙම ඝනය මගින් වසාලන බැවින්ද සාමාන්‍ය පුද්ගලයන්ට අනත්ත ලක්‍ෂණය ප්‍රකට නොවී, ගිලී සැඟවී පවතී.

දකින - අසන අවස්ථාවන්හී ද දකියි අසයි ආදී වශයෙන් දිගින් දිගට මෙනෙහි කරන යෝගී හට වනාහි, සති සමාධි ඥාණ මුහුකුරා ගිය අවස්ථාවේ එම ආරම්මණ ඝන ප්‍රඥප්ති මනා ලෙස බිඳී යයි. දකින අවස්ථාවේ. බැලීමට කැමති සිත එකකි. බැලීමට කැමැත්තයැයි මෙනෙහි කරන සිත එකකි. දකින සිත එකකි, "දකියී" යැයි මෙනෙහි කරන සිත එකකි." යැයි බෙදී වෙන් වී ප්‍රකටවීම සිදුවන්නේමය. අසන අවස්ථාව ආදියෙහිදු මේ ලෙසටම වේ. තව දුරටත්, .... "දකින සිත එකකි, අසන සිත එකකි, පහස විඳින සිත එකකි, සිතන සිත එකකි, මෙනෙහි කරන සිත එකකි," යන ලෙසට වෙන වෙනම පැනේ. විවිධ වර්ණ එක එකක් දකින විටදී ද "සුදු පාට දකින සිත එකකි. මෙනෙහිකොට දැන ගන්නා සිත එකකි. කළුපාට සිත එකකි, මෙනෙහිකොට දැන ගන්නා සිත එකකි," යන ලෙසට වෙන වෙනම ප්‍රකට වේ. විවිධ ශබ්ද ඇසීමේදී ද මෙලෙසටම වේ. එකම වර්ණයක් දිගට බැලීමේදී "ප්‍රථමයෙන් දකින සිත එකකි. ප්‍රථම මෙනෙහි කරන සිත එකකි. ද්විතීය දකින සිත එකකි, ද්විතීය මෙනෙහි කිරීම එකකි." යන ලෙසටම විවිධව වෙන වෙනම පැනේ. එකම ශබ්දයක් දිගට අසන විට ද මෙලෙසටම වේ. මෙලෙස අරමුණු කිරීම වශයෙන් බෙදී යන වාරයක් වාරයක් පාසා වෙන වෙනම බෙදී ප්‍රකට වන නාම ධර්ම බෙදා වෙන්කර ගත හැකි යෝගී හට "එකම ආකාරයක අරමුණු ගනිමින් පහළවන නාම ධර්ම වනාහි අනෙකුත් ආකාරයට අරමුණු ගැනීමක් කළ නොහැකි යැයි වටහාගෙන පහදින බැවින්" තම කැමැත්ත අනුව සිදුනොවීම නම් වූ අනත්ත ලක්‍ෂණය තත්ත්වාකාරය

මනාලෙස ප්‍රකට වේ. පහත දැක්වෙන්නේ එම විශුද්ධි මාර්ගය විවරණය කරන මහා ටීකා පාඨයකි.

යා හෙසා අඤ්ඤමඤ්ඤූපත්ථද්ධෙසු සමුදිතෙසු රූපා රූප ධම්මෙසු ඒකත්තාභිනිවෙස වසෙන අපරිමද්දිත සංඛාරෙහි ගය්හමානා සමූහ ඝනතා, තථා තෙසං තෙසං ධම්මානං කිච්ච භෙදස්ස සතිපි පටිනියතභාවෙ එකතො ගය්හමානා කිච්චඝනතා, තථා සාරම්මණ ධම්මානං සතිපි ආරම්මණ කරණ භෙදෙ එකතො ගයහමානා ආරම්මණඝනතා ච, ධාතුසු ඤාණෙන විනිබ්භුජ්ජිත්වා, විනිබ්භුජ්ජිත්වා දිස්සමානාසු "හත්ථෙන පරිමජ්ජියමානො ඵෙන පිණ්ඩො විය" විලයං ගච්ඡන්ති, යථා පච්චයං පවත්තමානා සුඤ්ඤා එතෙ ධම්මා ධම්මමත්තාති අනත්ත ලක්ඛණං පාකටතරං හොති [මහා.ටී. (බු). 2/437]

නි = ඝනය බිඳී නම් වූ අනාත්මය ප්‍රකටවන ආකාරය දක්වන්නට

අඤ්ඤමඤ්ඤූපත්ථද්ධෙසු = අන්‍යොන්‍ය ලෙස ආධාර කිරීම් වශයෙන් පැවති

සමුදිතෙසු = එක සන්තානයක සමූහයක් ලෙස පහළ වූ

රූපාරූප ධම්මෙසු = රූප-නාම ධර්මයන්හි

ඒකත්තාභිනිවෙස වසෙන = එකක්ම ලෙස, එකෙක්ම ලෙස සිතා ගැනුම් වශයෙන් (ගය්හමානා හා බැඳේ)

අපරිමද්දිත සංඛාරෙහි = සංඛාර ධර්මයන් විපස්සනා වශයෙන් නොවැඩූ, නොබිඳි පුද්ගලයා,

ගයහමානා = සිතාමතාගත් පිළිගත්

යා එසා සමූහඝනතා ච = සමූහයක්, එකක්ම ලෙස එකෙක්ම ලෙස සිතාගන්නා එම සමූහ ඝන ප්‍රඥප්තියද
("අත්ථි" හා බැඳේ, තා ප්‍රත්‍යය වනාහි විශේෂ අර්ථයක් නොදේ)

| | | |
|---|---|---|
| **තථා** | = | එයින් පිට |
| **තෙසං තෙසං ධම්මානං** | = | ඒ ඒ රූප - නාම ධර්මයන්ගේ |
| **කිච්ච භෙදස්ස** | = | කෘත්‍යය භේදයාගේ |
| **පටිනියතභාවෙ සතිපි** | = | නියත ලෙසට, වෙන වෙනම ඇත්තේ නමුදු |
| **එකතො ගය්හමානා** | = | එකක් ම ලෙසට, එකෙක්ම ලෙසට ගන්නා.. සිතාගත්තා. |
| **යා එසා කිච්චඝනතා ච** | = | කෘත්‍ය වශයෙන් එකක් ම, එකෙක් ම යැයි ගන්නා එම කෘත්‍ය ඝන පඤ්ඤත්තිය ද (අත්ථි හා පමණක් බැදේ) |
| **තථා** | = | එයට වඩා |
| **සාරම්මණධම්මානං** | = | අරමුණු කළහැකි නාම ධර්මයන්ගේ |
| **ආරම්මණකරණ භෙදෙ සතිපි** | = | අරමුණු කිරීම විශේෂිතව ඇත්තේ වී නමුදු |
| **එකතො ගය්හමානා** | = | එකක් ලෙස, එකෙක් ලෙස ගන්නා, සිතාගන්නා |
| **යා එසා ආරම්මණ ඝනතා ච** | = | ආරම්මණ වශයෙන් එකක් ම, එකෙක් ම යැයි සිතාගන්නා එම ආරම්මණ ඝන පඤ්ඤත්තිය ද |
| **අත්ථි** | = | ඇත්තේය. |
| **තා** | = | මෙම තුන් ආකාර ඝන ප්‍රඥප්තීහු (**විලායං ගච්ඡන්ති** හා බැදේ) |
| **ධාතුසු** | = | රූප ධාතු- නාම ධාතු ස්වභාව |

ඤාණෙන විනිබ්භජ්ජිත්වා

| | | |
|---|---|---|
| විනිබ්භුජ්ජිත්වා දිස්සමානාසු | = | විපස්සනා වශයෙන් වෙන වෙනම බෙදමින් බෙදමින් දක ගත්තා වූ |
| විලයං ගච්ඡන්ති විය | = | කොටස් වලට කැඩී විසිරී යන්නාක් මෙනි |
| වා | = | විනාශ වී නැතිවී යත් |
| කිං විය | = | කෙසේදයත්:- |
| ඵෙන පිණ්ඩා | = | පෙන පිඬුවක් |
| හත්ථෙන පරිමජ්ජියමානො | = | අතින් පිරිමදින කල්හි |
| විලයං ගච්ඡති විය | = | කොටස් වලට කැඩී බිඳී විසිරී යන්නාක් මෙනි |
| අථ | = | එම සත ප්‍රඥප්ති බිඳීගිය කල්හී |
| යථා පච්චයංපවත්තමානා | = | හේතූන්ට අනුව පහළ වූ |
| එතෙ ධම්මා | = | එම |
| සුඤ්ඤා | = | හිමිකරුවෙකුට පාලනය කළහැකි, කැමති පරිදි වසඟයෙහි පැවැත්විය හැකි පුද්ගලයකු ආදී වශයෙන් සිතා අල්ලා ගන්නා ආත්ම ග්‍රහණයෙන් මිදේ. |
| ධම්ම මත්තා | = | ධර්ම මාත්‍රයක් පමණකි. |
| ඉති | = | මෙසේ දක දන පහදින බැවින් |
| අනත්ත ලක්ඛණං | = | තමා කැමති පරිදි නොපවතී යන අනත්ත ලක්ෂණය |
| පාකටතරං | = | විශේෂයෙන් ප්‍රකට වීම |
| හොති | = | වේ. |

මේ අට්ඨ කථා ටීකාවන්ට අනුව ඝනප්‍රඥප්තිය බිඳ තත්ත්වාකාරයෙන් පහළවන අනත්ත ලක්ෂණයට අනුව මෙනෙහි කටයුතු රූප නාම අරමුණු පාලනය කළ හැක්කක් නොවේ. හුදු ධම්තාවයන් පමණි" යැයි දක දැනගන්නා නියම අනත්තානුපස්සනාව පහළ වන පහළ වන වාරයේ අත්ත සඤ්ඤා ආදිය දුරු කරයි. දුරු කරන ආකාරය වනාහි: ප්‍රකට වූ රූප - නාම අරමුණ අනාත්මයැයි යථා පරිදි නොදකී නම් එසේ නොදත් අරමුණ මම යැයි, ආත්මය යැයි සිතා ගන්නා වූ සඤ්ඤා විපල්ලාසද පහළ විය හැක්කේය. දිට්ඨි, චිත්ත විපල්ලාසයන්ද පහළ විය හැක්කාහුය. එම විපල්ලාසයන් ඇසුරු කොට වෙනත් කෙලෙස්, කම් අකුසල කුසල කම්ද පහළවිය හැක්කේය. එම කම්යන් හි විපාක වන්නා වූ විපාකස්කන්ධයන් ද පහළවිය හැක්කේය. අනාත්ම යැයි තත්ත්වාකාරයෙන් දක දැන ගත් කල්හි වනාහි එම අරමුණ හා බැඳී සඤ්ඤා විපල්ලාස ආදිය පහළවිය නොහැක්කේය. මෙලෙස සඤ්ඤා විපල්ලාසයෙන් පටන්ගත විපාක ස්කන්ධයක් පාසා වන වට්ට දුක් ධම්යන්ගේ පහළ නොවිය හැකිවීම අනත්තානුපස්සනාව මගින් වනාහි එම විපල්ලාස දුරු කරන සංසිද්ධවන නිසාම වේ. මේ නිසා විසුද්ධි මාගීයෙහි "**අනත්තානු පස්සනං භාවෙන්තො අත්ත සඤ්ඤං පජහති**" යැයි දක්වයි.

**අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති** [ප.ම.110]

| | | |
|---|---|---|
| **අනත්තතො** | = | ආත්ම නොවන්නාවූ හුදු ධම් පමණක් යැයි |
| **අනුපස්සන්තො** | = | අනුපස්සනා කරන්නා වු තැනැත්තා |
| **අත්ත සඤ්ඤං** | - | ආත්මයැයි වැරදි ලෙස සිතා මතා ගැනීම |
| **පජහති** | - | දුරු කරයි, බැහැර කරයි |

## අනත්තානුපස්සනාව කෙටියෙන්

ද්වාර හයෙහි ප්‍රකටවන්නා වූ රූප-නාම අරමුණු පහළ වන විටම ස්වභාවානුරූපව මෙනෙහි කරමින් සිටින විට පමණක්, තමාගෙ

කැමැත්ත පරිදි නොපැවතීම හෝ දැක, පාලනයක්, ආණ්ඩු මට්ටු කිරීමක් කළ නොහැකි බව හෝ දැක, අනිත්‍යය-දුක හෝ දැක "ආත්මයක් නැත. හුදු ධර්මතා පමණකැයි" දැක දැන පැහැදීම, **පච්චක්ඛඅනත්තානු පස්සනා** නම් වේ. මේ ප්‍රත්‍යක්ෂ ඤාණයෙන් ප්‍රවීන ලෙස නිපුන ලෙස, දැක දැනගත් අවස්ථාවෙහි, වර්තමාන වශයෙන් නොදැකිය හැකි අතීත නාම - රූප අනාගත නාම රූප, බහිද්ධා නාම-රූප ලෙසට ලෝකයේ ඇතිතාක් නාම-රූප ද මේ ක්‍රමයටම "ආත්මයක් නොවේ, සත්තවයෙක් නොවේ. හුදු ධර්මයකි" යැයි සහතික ලෙස නිශ්චිත ලෙස සළකා භාවනා කර බලයි. මෙලෙස සළකා බලා තීරණය කරන විශේෂ ඤාණය වනාහි **අනුමාන අනත්තානුපස්සනාව** වේ. **අන්වය ඥානයද** නම් වේ.

මේ දෙයාකාර අනත්තානු පස්සනාවෝ සම්මසන ඤාණයේ පටන් පහළ වේ. භංග ඤාණයේ පටන් කෙලෙස් ප්‍රහාන කිරීමේ කෘත්‍ය වශයෙන්, සමෘධ වේ.

*අනත්තානුපස්සනාව නිමියේ යැ.*

## අනුපස්සනා තුන සම්බන්ධ විශේෂ සටහන

විසෙසතො ධම්මානං ඛණික නිරොධෙ අනිච්චතා වොහාරොති දස්සෙන්තො හුත්වා අභාවො වා තං ආදිමාන [මහා ටී. (බු.) 2/334]

අනිච්චතො තාව අනුපස්සනා භංගානුපස්සකස්ස යුත්තා, භඞ්ගො නාම අනිච්චතාය පරමා කොටි [මහා ටී. (බු.) 2/441]

| | | |
|---|---|---|
| විසෙසතො | = | විශේෂයෙන් |
| ධම්මානං | = | ධර්මයන්ගේ |
| ඛනික නිරොධෙ | = | ක්‍ෂණය හා බැඳුනු නිරොධයෙහි |
| වා | = | කණික භංගයෙහි |
| අනිච්චතා වොහාරො -අනිච්චතා | = | අනිච්ච ලක්‍ෂණ නම් වූ නම |
| හොති | = | වේ |
| ඉති | = | මෙලෙස |
| දස්සෙන්තො | = | දැක්වීමට අටඨ කථාචාර්යයන් වහන්සේ |
| හුත්වා අභාවො වාති ආදිං | = | හුත්වා අභාවො වා යනාදී කථාව |
| ආහ | = | ගෙනහැර දක්වයි |
| භංගො නාම | = | භංගය නම් |
| අනිච්චතාය | = | අනිත්‍යයැයි දැනගත් බැවින් පහළ වූ අනිච්ච ලක්‍ෂණයෙහි |
| පරමා කොටි | = | අවසාන ඉහළ කෙළවරයි |
| ඉති | = | මේ නිසා |
| අනිච්චතො අනුපස්සනා | = | අනිත්‍යයැයි අනුපස්සනා කරන අනිච්චානුපස්සනාව |
| භංගානුපස්සකස්ස | = | බිඳීම අනුපස්සනා කරන්නාට |
| තාව යුත්තා | = | යුක්ති යුක්ත වේ |

මේ ටීකා දැක්වීම අනුව අනිච්චානුපස්සනා කොටසෙහි දැක්වූ අනිච්ච ලක්ෂණ දෙක තුළින් හුත්වා අභාව-මතුවී අභාවයට යෑම නම් වූ දෙවැනි ලක්ෂණය ප්‍රත්‍යුත්පන්න රූප- නාමයන්හි බිඳී යෑම නම් වූ භංග ලක්ෂණයම වේ. එම ලක්ෂණය විශේෂ අනිච්ච ලක්ෂණය වේ. එබැවින් භංග ඤාණය අතින් සම්පූර්ණ යෝගී හට ඇති වෙමින් නැති වෙමින් පවතින රූප නාමයන්ගේ ආභාවය, බිඳී යෑම, විනාශ වී යෑම මෙනෙහිකොට භාවනා කිරීමෙන්ම අනිච්චානුපස්සනාව සම්පූර්ණ වේ යැයි දත යුතු. ඇතිවෙමින්-නැතිවෙමින් පවතින රූප - නාමයන්, නිරෝධවීම, බිඳීයෑම යැයි දැන ගන්නා යෝගී තෙම බිඳී විනාශ වී ගිය එම රූප - නාමයන් සුබ යැයි, ආශ්වාදයක් යැයි ද ප්‍රියමනාප යැයිද නොසිතයි. ඇත්ත වශයෙන් වනාහි භංගය මගින් අතරක් නොතබා පෙළෙන බැවින්, බිඳී බිඳී යන බැවින් දුක්ඛ ධම්ම, නරක ධම්ම, ප්‍රියමනාප භාව නැති ධම්ම යැයි ම දැක දැන පහදී. එවැනි අවස්ථාවේ දුක්ඛානු පස්සනා වේ. තව දුරටත්: එම රූප නාම ධර්මයන්ට විනාශ නොවී නොබිඳී සිටීම පිණිස, හැකියාවක් නොමැති බවද, නිත්‍ය භාවය පිණිස, සුබය පිණිස පැවතිය නොහැකි බවද, දැක දැන පහදින අවස්ථාවේ අනත්තානුපස්සනාව පහළ වේ. මේවා වනාහි ප්‍රත්‍යුත්පන්න රූප නාමයන්ගේ බිඳීම මෙනෙහි කොට දැන ගැනීමේ මනසිකාරයට අනුව අනුපස්සනා තුන එක එකක් වශයෙන් පහළවන ආකාරයයි. පහත දැක්වෙන්නේ අදාල විශුද්ධි මාර්ග උද්‍ධෘතයයි.

**යස්මා භංගො නාම අනිච්චතාය පරමා කොටි, තස්මා සො භංගානුපස්සකො යොගාවචරො සබ්බං සංඛාරග තං අනිච්චතො අනුපස්සති නො නිච්චතො, තතො අනිච්චස්ස දුක්ඛත්තා, දුක්ඛස්ස අනත්තතා, තදෙව දුක්ඛතො අනුපස්සති නො සුඛතො, අනත්තතො අනුපස්සති නො අත්තතො** [වි.ම.]

**යස්මා** = යම්හෙයකින්

**භංගොනාම** = බිඳීම නම්

| | | |
|---|---|---|
| අනිච්චතාය | = | අනිච්ච ලක්‍ෂණයෙහි |
| පරමා කොටි | = | අන්තිම ඉහළ කෙළවරයි. |
| තසමා | = | ඒ හෙයින් |
| භංගානුපස්සකො | = | බිඳීම දකින්නා වූ |
| සො යොගාවචරො | = | එම යෝගී තෙම |
| සබ්බං සංඛාරගතං | = | සියළු සංස්කාර |
| අනිච්චතො අනුපස්සති | = | අනිත්‍ය යැයි බලයි |
| නො නිච්චතො | = | නිත්‍ය යැයි නොබලයි |
| තතො | = | මෙලෙස අනිත්‍යයැයි බැලුපසු |
| අනිච්චස්ස දුක්ඛතතා | = | අනිත්‍ය වූ නාම-රූප දුකක් ම වන බව ද |
| දුක්ඛස්ස අනත්තතා | = | දුක් වූ නාම-රූප ආත්ම ස්වරූප නොවන බව ද |
| තදෙව | = | අනිත්‍ය යැයි භාවනා කළ එම සංස්කාරයන්ම |
| දුක්ඛතො අනුපස්සති | = | දුකක්ම වේ යැයි බලයි |
| නො සුඛතො | = | සුඛයක් ලෙස නම් නොබලයි |
| අනත්තතො අනුපස්සති | = | ආත්ම ස්වභාවයක් නැති ලෙස බලයි. |
| නො අත්තතො | = | ආත්මයක් ඇති ලෙසට නොබලයි |

මසථකප්‍රාප්ත භංගඥාණයෙන් පසු භංගය දැකීම මඟින් අනුපස්සනා සියල්ලම සම්පූර්ණ කළා වන්නේය. මෙපමණකින් සංක්‍ෂිප්ත දැක්වීම හමාර කරන්නෙමු.

# 04 නිබ්බිදානුපස්සනාව

නිබ්බිදානුපස්සනාව යන්න භයවන පරිච්ඡේදයෙහි ආදීනව ඤාණයට අනතුරුව දැක්වූ නිබ්බිදා ඤාණයම වේ. භංග ඤාණයේ ශක්තියෙන් මෙනෙහි කරන කරන වාරයේ බිඳීම ම හමුවේ. රූප-නාම සංස්කාරයන්, බිය ජනක බව, ආදීනව ස්වභාවය යැයි දැක දැනගත් අවස්ථාවෙහි මෙනෙහි කරන කරන වාරයේ "බිඳීයයි, විනාශ වී යයි" යැයි දතයුතු රූප-නාම සංස්කාරයන් ද සළකා බැලූ සංඛාර අරමුණු කෙරෙහිද කලකිරවන බව ප්‍රකට වී මෙම නිබ්බිදානුපස්සනාව පහළවේ.

මෙම අනුපස්සනාවට අනුව, නොදන්නා තාක් කල් එම සංඛාරයන් මත නන්දිය පහළ විය හැකිය. එම නන්දිය ඇසුරු කොට කෙළෙස් හා කර්ම පහළ විය හැක්කේය. එම අනුපස්සනාව මගින් "කලකිරවන සුළු" යැයි සිතාගන්නා සංඛාරයන් මත වනාහි එම නන්දිය ආදී තණ්හාව පහළවිය නොහැක්කේ ය. මෙලෙස පහළවිය නොහැකිවීම නිබ්බිදානුපස්සනාව මගින් දුරුකිරීම, බැහැර කිරීම නිසාම වේ. එබැවින් විසුද්ධි මාර්ගයේ හි "**නිබ්බිදානුපස්සනං භාවෙන්තො නන්දිං පජහති**" **නිබ්බිදානුපස්සනාය නන්දිතො** යන විසුද්ධි මාර්ග පාඨය විග්‍රහ කරන මහා ටීකාහී ද, පහත දැක්වෙන ලෙසට දක්වයි.

**නිබ්බිදානුපස්සනායාති සංඛාරෙසු නිබ්බින්දනාකාරෙන පවත්තාය අනුපස්සනාය, නන්දිතොති සප්පීතික තණ්හාතො.**

| | | |
|---|---|---|
| නිබ්බිදානුපස්සනායාති | = | නිබ්බිදානුපස්සනා යන්න වනාහි |
| සංඛාරෙසු | = | සංඛාරයන්හී |
| නිබ්බිදනාකාරෙන | = | කලකිරවන ආකාරයෙන් |
| පවත්තාය | = | පවතින්නාවූ |
| අනුපස්සනාය | = | අනුපස්සනා කිරීමය. |
| නන්දිතොති | = | නන්දිතො යන්න |
| සප්පීතික තණ්හාකො | = | පීතිය හා සමග යෙදෙන තණ්හාවෙන්... |
| වා | = | නන්දනය කිරීමෙන්... |
| (චිත්තං මොචෙනෙතා | = | සිත මුදාගනී) |

*නිබ්බිදානුපස්සනාව නිමියේ යැ*

# 05 විරාගානු පසසනාව

**විරාගානුපස්සනායාති තත්ථ විරජ්ජනාකාරෙන පවත්තාය අනුපස්සනාය**

| | | |
|---|---|---|
| **විරාගානුපස්සනායාති** | = | විරාගානුපස්සනාය යන්න වනාහි |
| **තත්ථ** | = | එම සංඛාරයන් |
| **විරජ්ජනාකාරෙන** | = | ඇල්ලීම් රැඳීම් වලින් දුරුවීම් වශයෙන් |
| **පවත්තාය** | = | පවතින්නා වූ |
| **අනුපස්සනාය** | = | අනුපස්සනා කිරීමයි. |

මෙම ටීකා දැක්වීමට අනුව නිබ්බිදා ඤාණයෙන් සංඛාරයන් කෙරෙහි කලකිරුණු යෝගීහට මෙනෙහි කරන කරන වාරයේ සංඛාරයන්ගේ ආදීනව පමණක් හමුවන බැවින් එම සංඛාරයන් කෙරෙහි ඇලීම, රැදීම දුරු වී යන ලෙසට සිදු කරන බැලීම විරාගානු පස්සනාව නම් වේ. එබැවින් විශුද්ධි මාර්ගයෙහි පහත සඳහන් ලෙසට දක්වයි.

**ඛය විරාගොති සංඛාරානං ඛණ භංගො, අච්චන්ත විරාගොති නිබ්බානං, විරාගානුපස්සනාති තදුභයදස්සන වසෙන පවත්තා විපස්සනා ච මග්ගො ච**

| | | |
|---|---|---|
| ඛය විරාගොති | = | ක්ෂය වීම අනුව, දුරුවීම යන්න වනාහි |
| සංඛාරානං | = | මෙනෙහි කොට භාවනා කටයුතු සංඛාරයන්හි |
| ඛණ භංගො | = | ක්ෂණය වශයෙන් බිඳීයෑමය |
| අච්චනත විරාගොති (අච්චනත විරාග) | = | සදාකාලික විරාගය යන්න වනාහි |
| නිබ්බානං | = | සංස්කාරයන්ගේ සදාකාලික නිරොධය නම් වූ නිවනයි |
| තදුභය දස්සන වසෙන | = | එම විරාග දෙක දැකීම් වශයෙන් |
| පවත්තා | = | පවතින්නා වූ |
| විපස්සනා ච | = | විපස්සනාව ද |
| මග්ගො ච | = | ආර්ය මාර්ගය ද |
| විරාගානුපස්සනාති | = | විරාගානුපස්සනා නම් වේ. |

මෙනෙහි කටයුතු භාවනා කටයුතු සංඛාරයන්ගේ ක්ෂණික බිඳීම ඛයවිරාග නම්වේ. මෙනෙහි කොට භාවනා කරන විපස්සනාව මෙම ඛයවිරාගය අරමුණු කොට දැනගනිමින් දැනගනිමින් සිටී. සියලු සංස්කාරයන්ගේ සදාකාලික නිවීයෑම නම් වූ නිවන අච්චන්ත විරාග නම්වේ. අච්චන්ත විරාග නම් වන මෙම නිවන වනාහි විපස්සනාවට අරමුණු කොට ගැනීම් වශයෙන් නොදැකිය හැක්කේය. නමුදු නිබ්බිදා ඤාණයට අනතුරුව පහළවන මේ මුඤ්චිතුකම්‍යතා විපස්සනාව සංඛාරයන්ගෙන් මිදීමට කැමැත්ත ඇතිව පහළවේ. සංස්කාරයන් ගෙන් මිදෙනු කැමැත්ත, සංස්කාරයන්ගේ දුරුවූ නිවනට නැමීම නම් වේ. එබැවින් මුඤ්චිතුකම්‍යතා නම් වූ මේ විපස්සනාව අච්චන්ත විරාග නම් වූ නිවනට නැමීම වශයෙන් දැකීම නම් වේ. දකින තැනට ළඟා වේ. මෙලෙස වූ විරාග දෙක යථා පරිදි අනුපස්සනා කරන බැවින්

මුඤ්චිතුකම්‍යතා ඥාණය විරාගනුපස්සනා නම් වේ. " එම සංඛාරයන්හි බැඳීම් වෙලීම් වල ගෙවීයැම් ආකාර වශයෙන් පහළ වේ" යැයි කියන මහා ටීකා කථාව "නිවනට නැවීම් වශයෙන් දකී" යන මේ කථාව සමඟ අර්ථ වශයෙන් සමාන වේ මැයි. ආර්ය මාර්ගය වනාහි අච්චන්ත විරාග නම් වූ නිවන අරමුණු කොට දැක දැන ගනී. ඛය විරාග නම් වූ සංස්ඛාරයන් ගේ ක්‍ෂණික බිඳීම වනාහි නොමුළා බව දැන ගැනීමේ කෘත්‍ය සම්පූර්ණ කිරීම වශයෙන් දැක ගැනීමට නම් වේ. ලෞකික විපස්සනාවන් විභාග කොට දක්වන මෙහිලා විපස්සනාවම විරාගානුපස්සනාව යැයි දත යුතු. **ආරම්මණතො වා විපස්සනාය ඛය විරාගානුපස්සනා වසෙන පවත්ති. තන්නින්නභාවතො අච්චන්තවිරාගානු පස්සනා වසෙන, මග්ගස්ස පන අසම්මොහතො ඛය විරාගානුපස්සනා වසෙන, ආරම්මණතො අච්චන්ත විරාගානුපස්සනාවසෙන පවත්ති වෙදිතබ්බා.** මහ ටීකා දැක්වීමට අනුව මෙ අර්ථය දක්වා ඇත.

යට දක්වන ලද නිබ්බිදානුපස්සනා හා මෙම විරාගානු පස්සනා යන මේවා භංගඥාණය මුහුකුරාගිය යෝගීනට පමණක් පහළවෙත්. එබැවින් පටිසම්භිදා මග්ග භංග ඥාණ අවස්ථාවේ දේශනා කරන ලද **නිබ්බින්දති නො නන්දති, විරජ්ජති නො රජ්ජත** (වි. ම. 402)- යන පදයන්හි විවරණය වන විසුද්ධිමග්ග දැක්වීම පහත දැක්වේ.

**යස්මාපන යං අනිච්චං දුක්ඛං අනත්තා, න තං අභිනන්දි තබ්බං, යඤ්ච අනභිනන්දිතබ්බං න තත්ථ රජ්ජිතබ්බං, තස්මා එතස්මිං භංගානුපස්සනානුසාරන අනිච්චං දුක්ඛං අනත්තාති දිට්ඨෙ සංඛාරගතෙ නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති නො රජ්ජති** [මහා ටී. (බු.) 2/276]

| | | |
|---|---|---|
| **යං** | = | යම් ධර්මයක් තෙම |
| **අනිච්චං** | = | අනිත්‍ය යැ |
| **දුක්ඛං** | = | දුක් යැ |
| **අනත්තා** | = | ආත්ම නොවේද |
| **තං** | = | එවැනි ධර්මයක් |

යස්මා = යම් හෙයකින්

න අභිනන්දි තබ්බං = අභිනන්දනය නොමනායැ.

යං = යම් ධර්මයක්

අනභිනන්දි තබ්බං = අභිනන්දනය නොකළ යුතු ද

තත්ථ = එවැනි ධර්මයන්

න ච රජ්ජිතබ්බං ච = අභිනරමනය නොකළ යුතු ද

තස්මා = අනිච්ච දුක්ඛ අනත්තවන සංඛාරයන් කැමති නොවන, රජ්ජනය නොකරන බව යන මේ කරුණු නිසා (නිබ්බින්දති ආදිය හා බැඳේ)

භංගානුපස්සනා
නුසාරෙන = ආදීනව දකින භංග ඤාණතෙක් අනුගමනය කරන නිසා

අනිච්චං දුක්ඛං
අනත්තාති දිට්ඨෙ = අනිත්‍යයැ දුක්යැ, අනාත්මයැයි දුටු

එතස්මිං සංඛාර
ගතෙ = මේ සංඛාර ධර්ම කෙරෙහි

නිබ්බින්දති = කළකිරේ

නො නන්දති = අභිනන්දනය නොකරයි

විරජ්ජති = රමනයට නොයයි

නො රජ්ජති = රමනය නොකරයි.

අනුපස්සනා ආදිය මත "අනිච්ච- අනිච්ච" යැයි වචනයෙන් කියන මනසිකාරය පැවැත්වීම ගැළපෙන නමුත් මෙම නිබ්බිදා විරාගානුපස්සනා අවස්ථාවන්හි වනාහි "නිබ්බිදා - නිබ්බිදා" යැයි "විරාගා - විරාගා" යැයිද වචනයෙන් කියා මෙනෙහි නොකළ යුතු බව ප්‍රකට යැ. එබැවින් ඉහත දක්වූ අට්ඨ කථාහී දක්වූ ලෙසට භංග ඤාණය තෙක් ක්‍රමානුකූලව අනිච්ච, දුක්ඛ, අනාත්ම යැයි දුටු එම සංඛාරයන්

මත මෙනෙහි කරන, සළකා බලන වාරයක් වාරයක් පාසා ප්‍රියමනාප නොවී, කලකිරීම් කරවන විශේෂ ඥාණය නිබ්බිදානුපස්සනාව නම්වේ. දුඩිව ගැනීම් දුරුවීම වශයෙන් පහළ වන ඥාණය විරාගානුපස්සනාව යැයි සළකාගත යුතු. තවදුරටත් අනිච්චානුපස්සනා ආදීන්හිද "අනිච්ච -අනිච්ච"යැයි වචන කිම අත්‍යවශ්‍ය නොවේ. මෙනෙහි කොට භාවනා කරන රූප නාමයන් අනිච්ච යන ආකාරයන් දැක දැන ගැනීමම අත්‍යවශ්‍ය දේ වෙයි.

*විරාගානුපස්සනාව නිමියේ යැ.*

# 06 නිරොධානුපස්සනාව

නිරොධානුපස්සනායාති සංඛාරානං නිරොධස්ස අනුපස්සනායා. යථා සංඛාරා නිරුජ්ඣන්තියෙව, ආයතිං පුනබ්භවවසෙන න උප්පජ්ජති. එවං වා අනුපස්සනා නිරොධානුපස්සනා. මුඤ්චිතුකම්‍යතා හි අයං බලප්පත්තා
[මහා ටී. 2/43]

නිරොධානුපස්සනායාති = 'නිරොධානුපස්සනා' යන්න
සංඛාරානං = සංස්කාරයන්ගේ
නිරොධස්ස = පැවැත්මේ අභාවය
අනුපස්සනාය = අනුපස්සනාවෙන්
වා = වෙනත් ආකාරයට වනාහි
යථා = යම් ලෙසකින්
අනුපස්සියමානා = අනුපස්සනා කරන කල්හි
සංඛාරා = සංස්කාරයො
නිරුජ්ඣන්තියෙව = අභාවයට ගියේ
ආයතිං = මත්තෙහි
පුනබ්භව වසෙන = පුනර්භව වශයෙන්
න උප්පජ්ජන්ති = නැවත නොඋපදිත්
එවං = මේ ආකාරයට
අනුපස්සනා = අනුපස්සනා කරන ඥාණය
නිරොධානුපස්සනා = නිරොධානුපස්සනා නම් වේ.

| | | |
|---|---|---|
| හි | = | ඇත්තටම |
| අයං | = | මේ නිරොධානුපසසනාව |
| බලපපතතා | = | බලවත් වූ |
| මුඤ්චිතුකමානතා | = | මුඤ්චිතුකමානතා ඥාණයම වේ. |

මෙම මහා ටීකාහි ප්‍රථම ක්‍රමය මඟින් **"නිරොධසස, නිරොධතොවා අනුපස්සනා"** යන වචනාර්ථය දක්වයි. දෙවැනි ක්‍රමයෙන් **නිරොධාය අනුපස්සනා, නිරොධෙතීති නිරොධො, නිරොධො ච සො අනුපසසනා චාති වා නිරොධානුපසසනා"** යන වචනාර්ථ දක්වයි. මෙලෙස වචනාර්ථ බෙදා දැක්වුව ද සාරාර්ථ වශයෙන් නිරොධානුපසසනා දෙවර්ගයකට බෙදා දක්වනවා නොවේ. එකක්ම වේ. එබැවින් මෙලෙස වටහාගත යුතුවේ. මෙනෙහි කටයුතු සංස්කාරයන්ගේ නිරුද්ධ වීම මනාලෙස දැකගෙන නමුත් එම සංඛාරයන්ගේ ආදීනව නොදක්නේ නම් එම ආදීනව නොදත් සංස්කාරයන් හා බැඳී පසු කාලයේ නව භවයක සංස්කාරයන් පහළ වෙත්. මේ නිරොධානුපස්සනාවට අනුව භාවනා කොට බලන කල්හි වනාහි එම මෙනෙහි කටයුතු සංස්කාරයන් හා බැඳී එලෙස පසු කාලයක නව භවයක සංස්කාරයන් පහළවිය නොහැක්කේය. මෙලෙස නව භවයක සංස්කාරයන් පහළ නොවන ආකාරයට භාවනාකොට බැලීම එම නව භවයක සංස්කාරයන් නිරෝධ කිරීමට, පැවැත්ම අභාවයට පත් කිරීමට සම වේ, එබැවින්, ටීකාහි ප්‍රථම ක්‍රමයෙහි සංස්කාරයන්ගේ නිරෝධය අනුව භාවනා කරන අනුපසසනා, සංස්කාරයන් නිරෝධ වී යැයි භාවනා කරන අනුපස්සනා යැයිද - දෙවැනි ක්‍රමයෙහි නව භවයක සංස්කාරයන් නිරොධ වනු පිණිස භාවනා කරන අනුපස්සනා හෙවත් නව භවයක සංස්කාරයන් නිරෝධ කරනු පිණිස භාවනා කරන අනුපස්සනා යැයිද යන ලෙසට අර්ථය දක්වයි.

වෙනත් ආකාරයකටඃ ආනාපාන කථා විවරණය කරන අට්ඨ කථා හි විරාගානුපසසනා පදයෙහිදී මෙන් නිරොධානුපසසනා පදයෙහිද එලෙසටම දැනගැනීම යුතු යැයි කරන අනුශාසනාවට, ඛය නිරොධ නම් වූ, මෙනෙහි කරමින් සිටින සංඛාරයන්ගේ ක්‍ෂණික නිරුද්ධ වීම ඇස්පනා පිට දැක දැනගන්නා අවස්ථාව මෙන්ම **අච්චනත නිරොධ** නම් වූ,

සංස්කාරයන්ගේ සදාකාලික නිරුද්ධ වීම හෙවත් නිවනට නැවී බලවත්ව පහළ වන මුඤ්චිතුකම්‍යතා ඤාණය නිරෝධානුපස්සනාව නම් වේ යැයි දක්වයි. මෙහිදීද "බය නිරෝධය දැක දැන ගනිමින් සිටී" යන කථාව ප්‍රථම ටීකා ක්‍රමය හා සමාන වේ. අවවනක නිරෝධ වෙත නැමීගත් දැකීම පහළ වීම සංඛාරයන්ගෙන් මිදීමට කැමති වීමම වේ. එබැවින් එය ටීකාහි දෙවැනි ක්‍රමය හා අර්ථය වශයෙන් සමානම වේ.

**"නිරෝධෙති නො සමුදෙති, නිරොධෙනෙතා සමුදයං පජහති"** යැයි නිරෝධානුපසසනා දක්වන පටිසමභිදාමගග පාලිය විසුදධි මගග මෙලෙස විස්තර වශයෙන් දක්වයි.

**සො එවං අවජ්ජනෙතා ලොකිකෙනෙව තාව ඤාණෙන රාගං නිරොධෙති නො සමුදෙති, සමුදයං න කරොතීති අත්ථො. අථවා සො එවං විරතෙථා යථා දිට්ඨං සංඛාරගතං, තථා අදිට්ඨම්පි අන්වයඤාණ වසෙන නිරොධෙති නො සමුදෙති, නිරොධතොව මනසිකරොති, නිරොධමෙවසස පස්සති නො සමුදයනති අත්ථො**

## පටිසම්භිදා මගග පාලියේ අර්ථය

| | | |
|---|---|---|
| **නිරෝධෙති** | = | රාගය නිරුද්ධ කරයි |
| **නො සමුදෙති** | = | රාගය පහළ නොකරයි |

## වෙනත් ක්‍රමයකට

| | | |
|---|---|---|
| **නිරෝධෙති** | = | ප්‍රත්‍යක්ෂ ලෙස නොදුටු අතීත, අනාගත සංස්කාරයන් ද නිරුද්ධ වී යැයි බලයි |
| **නො සමුදෙති** | = | පහළවන්නේය, නිත්‍යය, සුඛයැ යි නොබලයි. |
| **නිරොධෙනෙතා** | = | නිරුද්ධ කරන්නාහු |
| **වා** | = | නිරුද්ධ වේ යැයි බලන ලද |
| **සමුදයං** | = | රාගය පහළ වීම |
| **වා** | = | පහළ වන්නේය, නිත්‍යය, සුඛයැයි සිතාගන්නා කෙලෙස් |
| **පජහති** | = | දුරු කරයි, බැහැර කරයි. |

## අට්ඨ කථාහි අර්ථය වනාහි

එවං = අනිච්ච, දුක්ඛ, අනත්ත යැයි දැක දැනගත් සංස්කාරයන් කෙරෙහි කලකිරීම, දැඩිව අල්ලා ගන්නා ගතිය දුරුකිරීම යන මේ දක්වන ලද ආකාරයට

අරජ්ජනෙතා = රංජනය නොකරන්නා වූ

සො = එම යෝගී තෙම

තාව = ලොකුත්තර මග්ග ඤාණයට ප්‍රථම

ලෞකිකෙනෙව ඤාණෙන = හුදු ලෞකික *විපස්සනා ඤාණයෙන්* පමණක්

රාගං = සංස්කාරයන් කෙරෙහි බැඳෙන රාගය

නිරොධෙති = නිරුද්ධ කරයි.

නො සමුදෙති = පහළ නොවේ.

සමුදයං න කරොති = රාගය පහළවීම සිදු නොකරයි

වා = දැඩිව ගැනීම සිදුවන අයුරින් සිත නොයොදයි

ඉති අත්ථො = මෙය වනාහි නො සමුදෙති යන වාක්‍යයේ අර්ථයයි.

අථ වා = වෙනත් ආකාරයකට වනාහි,

එවං විරතෙතා = මේ දක්වන ලද ක්‍රමයෙන් දැඩිව ගැනීම දුරු කළා වූ

සො = එම යෝගී තෙම

දිට්ඨං = වර්තමානව ඇස්පනාපිට දැක බලාගත යුතු

සංඛාරගතං = ප්‍රත්‍යුත්පන්න සංස්කාරයන්

නිරොධෙති යථා = නිරුද්ධවීම මත භාවනා කරන්නේ යම්සේ ද

තථා = එලෙසටම

අදිට්ඨමපි = ප්‍රත්‍යක්ෂ ලෙස, වර්තමාන ලෙස නොදුටු අතීත- අනාගත සංඛාරයන් ද

අන්වයඤාණවසෙන = ප්‍රත්‍යක්ෂ ඤාණයට අනුව යන අන්වය

ඤාණයෙන්, අනුමාන ඤාණයෙන් සළකා

| | | |
|---|---|---|
| **නිරොධෙති** | = | නිරුද්ධ වේ යැයිම භාවනා කරයි |
| **නො සමුදෙති** | = | පහළ වේ, පවතී, වැඩේ යන්න අනුව වනාහී සිතීමක් නැත |
| **නිරොධතොව** | = | නිරුද්ධ වේ යැයිම |
| **මනසිකරොති** | = | මනසිකාරය පවත්වයි. |
| **අසස** | = | ප්‍රත්‍යක්ෂ ලෙස නොදුටු එම අතීත අනාගත සංස්කාරයන්ගේ |
| **නිරොධමෙව** | = | නිරුද්ධයම |
| **පසසති** | = | භාවනා කොට බලයි. |
| **සමුදයං** | = | පහළවීම - පැවතීම - වැඩීම - වර්ධනය |
| **නො පසසති** | = | නොබලයි. |
| **ඉති අත්‍ථො** | = | මේවා වනාහි නිරොධෙති, නො සමුදෙති යන වාක්‍යයේ අර්ථයයි. |

මේ අට්ඨ කථාහි විවරණය වන ක්‍රම දෙක තුළින් ප්‍රථම ක්‍රමය

**'නි'** **පුබ්බ** රුධ ධාතුයා, කාරිත **'ණෙ'** **පච්චයෙන**, **'ති'** **විභත්තියා** යන ක්‍රමයෙන් (පදසිද්ධිය) **'නිරොධෙති'** පදය හැදෙන හැටි දක්වයි. දෙවන ක්‍රමය **නිරොධ** යන නාම ධාතුව **මනසිකාරත්‍ථ** **දස්සනත්‍ථ** ක්‍රියා වාචී **'ණෙ'** **පච්චය** (හෝ **'ඉ'පච්චය**)+ **'ති'** **විභත්ති** යන ක්‍රමයට **'නිරොධෙත'** යන්න හැදෙන හැටි දක්වයි. මෙලෙස පදය හැදෙන හැටි දෙයාකාර කොට දක්වුවත්, ඒ අනුව පද අර්ථ බෙදීගියත්, නිරෝධානුපස්සනා වශී දෙකක් ඇත්තේ යැයි ගතයුතු නොවේ. එකම **බලපපතන මුඤ්චිතුකම්‍යතා ඤාණ** ම වේ. එබැවින් අර්ථය වශයෙන් එකක්ම වන බැව් සළකා ගත යුතු. සමාන වන ආකාරය; ප්‍රථම ක්‍රමයෙහි 'රාගය නිරෝධ කරයි' යන්න පමණක් කියයි. කුමන ධර්මයක්, කෙසේ දැක, කුමන ධර්මයක් ඉපදවීමට සුදුසු රාගයක් නිරෝධ වේ යැයි නොකියයි. නමුදු දෙවන ක්‍රමයෙහි වනාහි මෙලෙසට ප්‍රත්‍යක්ෂ ලෙස දතයුතු ප්‍රත්‍යුත්පන්න සංස්කාරයන් හා, ප්‍රත්‍යක්ෂ ලෙස නොදැකිය හැකි අතීත- අනාගත සංඛාරයන් නිරුද්ධ වේ යැයි බලා,

එම සංඛාරයන්හි "නිත්‍යය, සුඛය" යැයි සිතා ගැනීමට තරම් වන රාගය නිරුද්ධ වීම යැයි සම්පූර්ණ ලෙස දත යුතු.

දෙවැනි ක්‍රමයෙහි 'කුමන කෙලෙස් නිරුද්ධ වේද'යි නොදක්වයි. නමුදු ප්‍රථම ක්‍රමයෙහිලා දක්වන්නාක් මෙන් 'රාගය නිරුද්ධ වේයැ'යි දතයුතු. මක්නිසාදයත්: 'සංස්කාරයන් නිරුද්ධ වේ යැයි' ම බලමින් භාවනා කරන්නේ නම් එසේ නිරුද්ධ වනු දැක 'නිත්‍යය,සුඛයැ'යි යැයි සිතා ගැනීමක්, දෘඪිව අල්ලා ගැනීමක් සිදුවිය නොහැකි නිසාය. එබැවින් නය ක්‍රම දෙකම අර්ථය වශයෙන් සමාන වේමැයි. 'රාගය නිරුද්ධ වේයැ'යි කියන තැනද රාගය මුල් වූ කෙලෙස් හා කර්මයන් ද, එම කර්මයන්ගේ විපාක වන්නා වූ විපාකස්කන්ධ සංස්කාරයන්ද, යන මේ ධර්මයන්ද නිරුද්ධ වේ යැයි දත යුතු. එබැවින් යට දැක්වූ *ටීකා පඨම- දුතිය* ක්‍රමයන්ද මෙම *අට්ඨකථා පඨම- දුතිය* ක්‍රම හා සමානම යැයි දත යුතු.

මෙහිලා ප්‍රත්‍යුත්පන්න සංස්කාරයන් නිරුද්ධ වීම, විනාශ වීම, යැයි මෙනෙහි කොට දැනගන්නා අවස්ථාවේ පහළවන *නිරොධානුපස්සනාව පච්චක්ඛ ඤාණය* නම් වේ. මෙම *පච්චක්ඛ ඤාණ* බලවත් වූ විට, ප්‍රත්‍යක්ෂ ලෙස නොදත හැකි අතීත- අනාගත සංස්කාරයන්ද "ප්‍රත්‍යුත්පන්න සංස්කාර ධර්මයන් මෙන්ම" නිරොධ වන්නේමය, විනාශව යන්නේම යැයි මෙනෙහි කොට සළකා බැලීමෙන් පහළ වන *නිරොධානුපස්සනාව* අන්වය ඤාණ- අනුමාන ඤාණ නම්වේ පහත දැක්වෙන්නේ *අදාල මහා ටීකා උද්‍ධෘතයකි.*

**යථා දිට්ඨං සම්පති උපට්ඨිතං සංඛාරගතං නිරොධෙති. නිරොධං මනසිකරොති. එවං අදිට්ඨම්පි අතීතානාගතං අන්වයඤාණවසෙන "යථා ඉදං එතරහි, එවං ඉතරෙපීති" අනුමිනනෙනා නිරොධෙති, මනසිකතස්සාපි නිරොධං මනසිකරොති.**

| | | |
|---|---|---|
| **සම්පති උපට්ඨිතං** | = | දැන් මෙන් ඤාණයෙහි ප්‍රකට වී |
| **දිට්ඨං** | = | ඇස්පනාපිට දැකගත යුතු |
| **සංඛාරගතං** | = | *පච්චුප්පන්න සංඛාරයන්* |
| **නිරොධෙති යථා** | = | නිරුද්ධ වේ යැයි භාවනා කොට බලන්නාසේ |
| **නිරොධං** | = | **පච්චුප්පන්න සංස්කාරයන්ගේ නිරෝධය** |

| | | |
|---|---|---|
| **මනසිකරොති යථා** | = | මෙනෙහි කරන්නා සේ |
| **එවං** | = | මෙලෙස |
| **අදිට්ඨං** | = | වර්තමාන ලෙස දැකිය නොහෙන |
| **අතීතානාගතංපි** | = | අතීත-අනාගත සංඛාරයන් ද |
| **අන්වය ඤාණ වසෙන** | = | අන්වය ඤාණ වශයෙන් = අනුමාන ඤාණ වශයෙන් |
| **එතරහි** | = | වර්තමානයේ |
| **ඉදං යථා** | = | මේ දකින සංස්කාරයන් මෙන් |
| **ඉතරෙහි** | = | මෙයින් බාහිර සංස්කාරයෝ ද |
| **එවං** | = | මේ ක්‍රමයටම නිරුද්ධ වෙත් |
| **ඉති** | = | මෙලෙස |
| **අනුමිනනෙතා** | = | සසඳා බලා |
| **නිරොධෙති** | = | නිරුද්ධ වේ යැයි බලයි |
| **නිරොධං** | = | නිරුද්ධවීම |
| **මනසිකරොති** | = | මනසිකාරයට හසුකර ගනී |

මේ නිරොධානුපස්සනාව **බලප්පත්ත මුච්චිතුකම්‍යතා ඤාණය** යැයි ටීකාහි දක්වන බැවින් පෙර විරාගානුපස්සනාව, **තරුණ මුච්චිතුකම්‍යතා ඤාණ** යැයි සැළකිය යුතුය. තවදුරටත් අනුමාන වශයෙන් සළකා බලා භාවනා කරන සංස්කාරයන් මත පහළ වියහැකි රාග ආදිය දුරු කිරිම වික්ඛම්භන ප්‍රහාන වශයෙන් දුරු කිරීම පමණක් යැයි සළකාගත යුතු. එම නිසා මහා ටීකාහි **"රාගං නිරොධෙති රාගං වික්ඛම්භන නිරොධං පාපෙති වික්ඛම්භෙතීති අත්‍ථො"** යැයි දක්වයි, මක්නිසාදයත් ප්‍රත්‍යක්ෂ ලෙස නොදුටු එම අතීත- අනාගත සංස්කාරයන් මත දුරු වූ, දුරු වන්නා වූ *අනුසය* කෙලෙස් ලෞකික *විපස්සනාව* මගින් සදාකාලික ලෙස නිත්‍ය ලෙස ප්‍රහාණය කළ නොහැක්කේය. ලෝකුත්තර මාර්ග ඥානය මගින් පමණක් සදාකාලික ලෙස ප්‍රහාණය කළහැකි බැවිනි.

*නිරෝධානුපස්සනාව නිමියේ යැ.*

# 07 පටිනිසසගගානුපසසනාව

සංඛාරානං පටි නිසසජජනාකාරෙන පවතතා අනුපසසනා පටිනිසසගගානු -පසසනා පටිසංඛා සනතිටඨනා හි අයං

[මහා ටී. (බු) 1/79,343]

| | | |
|---|---|---|
| සංඛාරානං | = | සංස්කාරයන් |
| වා | = | සංස්කාරයන්හි *නිච්ච- සුඛ- අත්ත* යැයි දැඩිව සිතා ගන්නා කෙළෙස් |
| පටිනිසසජජනාකාරෙන | = | නැවතත් අතහැරීම්-පහකිරීම් ආකාර වශයෙන් |
| පවතතා | = | වන්නා වූ |
| අනුපසසනා | = | අනුපස්සනාව, අනුව භාවනා කිරීම |
| පටිනිසසගගානුපසසනා | = | පටිනිසසගගානුපසසනා නම් වේ. |
| හි | = | ඇත්ත යැ |
| අයං | = | මේ *පටිනිසසගගානුපසසනාව* |
| පටිසංඛා සනතිටඨනා | = | සංස්කාරයන් අතහැර දැමීමට නැවත භාවනා කරන පටිසංඛාඤාණය හා මධ්‍යස්ථ වී මනාලෙස තැන්පත් වූ සංඛාරුපෙක්ඛා ඤාණය වේ. |

මේ ටීකාහි සංස්කාරයන් 'නැවත අතහැර දැමීම් වශයෙන් පහළ වන්නේ, යැයි කියන කථාව සංඛාරුපෙක්ඛා = මුඛ්‍ය වූ කථාවක් නොවේ. නෙය්‍යත්ථ =උපමාකාරයෙන් දක්වන කථාවකි ( =ඖපචාරික කථාවකි) ඇත්ත වශයෙන් වනාහි එම සංස්කාරයන්ම *නිච්ච, සුඛ, අත්ත,* යැයි *මඤ්ඤනා* කිරීම නිසා මතු පහළ විය හැකි කෙළෙස්, නැවත මනාලෙස

අතහැරීම හෙවත් පහ කිරීම් වශයෙන් පහළ වේ යැයි අදහස් කෙරේ. එබැවින් වා ශබ්දය අනුව, විවරණය කොට වෙනත් අර්ථ කථනයක් දෙන්නේ නම්, කෙසේද යත්: **රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ** = මහණෙනි, රූප තොපගේ හෝ තොපට අයිති දේවල් නොවේ. එය දුරු කරව! යැයි අනුශාසනා කරන අනුශාසනාව මෙනි. මෙහි රූප වනාහි අතහැර දැමිය යුතු යැයි කියන්නේ නමුදු රූපය ප්‍රහාණය කළ හැකි ධර්මයක් නොවේ. රූපයක් මත බැඳී එයම අල්ලාගෙන මතු පහළ වන රාගයම ප්‍රහාණය කළ හැකි පහාතබ්බ ධර්මයක් වන්නේය. එබැවින් රූපය දුරුකරව! යන කථාව මගින් එම රූපය මත පහළ වන ඡන්දරාගය දුරුකරව යැයි යන්න බුදුරජාණන් වහන්සේගේ අදහස බව එම පාළිය හා සම්බන්ධ අට්ඨ කථාහි දක්වයි.

## උපමා

බලවත් වූ දුකක් නැවත නැවතත් ගෙනදිය හැකි වූ මෝඩ- නරක පුතෙකු බැහැර කිරීමට කැමති තැනැත්තේ එම පුතා කෙරෙහි ඇති පිළිකුල් ජනක, නරක වැරදි ඇතිතාක් සළකා බලා ඔහු මත 'තම පුතායැ'යි සළකා කටයුතු කළ පුත්‍ර සංඥාව සහමුලින්ම දුරු කරයි නම්, එම අවස්ථාවේ පටන් එම නරක- මෝඩ පුතා හා සම්බන්ධව තම සිත්හි ඇති දුකද දුරු කළා වන්නේය. එම නරක පුතා ද දුරු කළා නම් වන්නේය. එබැවින් තමාගේ පුත්‍රයා නම් වූ සංඥාව දුරුකළ හැකිවූ පුද්ගලයා එම පුත්‍රයා ද දුරු කළා නම් වන්නේ යම්සේද, එසේම සංස්කාරයන් *නිච්ච-සුඛ-අත්ත* යැයි දැඩිව ගන්නා කෙලෙස් එසේ දුරු කළේ නම්- බැහැර කළේ නම්, නැවත පහළ නොවන ආකාරයෙන් *අනිච්ච දුක්ඛ අනත්ත* යැයි පෙරළා මනාසේ මෙනෙහි කොට දුරු කිරීම හෙවත් එම කෙළෙස් වල දුරු කිරීමෙන් අදාළ සංස්කාරයන් ද දුරු කළ බවට පත්වන්නේය. එබැවින් ටීකාහි කෙළෙස් දුරු කළ හැකි අනුපස්සනාවම "සංස්කාරන් නැවත වරක් බැහැර කරන" ආකාරයම වන්නේය යැයි ප්‍රකාශ කරයි. පහත දැක්වෙන්නේ **නීතත්ථ** = මුඛ්‍ය වශයෙන්, විවරණය කරන විසුද්ධි මාර්ග දැක්වීමයි

**අයමපි අනිච්චානුපස්සනා තදංගවසෙන සද්ධිං ඛන්ධාභි සංඛාරෙහි කිලෙසානං පරිච්චජෙනතො සංඛතදොස දස්සනෙනච තබ්බීපරීතෙ**

නිබ්බානෙ තන්නින්නතාය පක්ඛන්දනතො "පරිච්චාග පටිනිස්සග්ගො චෙව පක්ඛන්දන පටිනිස්සග්ගොචා"ති වුච්චති තස්මා තාය සමන්නාගතො, භික්ඛු යථාවුත්තෙන නයෙන කිලෙසෙච පරිච්චජති, නිබ්බානෙච පක්ඛන්දති, නාපි නිබ්බත්තනවසෙන කිලෙසෙ ආදියති, න අදොස දස්සිතාවසෙන සංඛතාරම්මණං, තෙන වුච්චති "පටිනිස්සජ්ජති නො ආදියතී"ති.

| | | |
|---|---|---|
| ඛන්ධාභිසංඛාරෙහි සද්ධිං | = | නව භව ස්කන්ධයන්, අභිසංඛාර කර්ම සමඟ |
| කිලෙසානං | = | නිච්ච,සුඛ, අත්තයැයි තදින් ගැනීම අනුව පහළ වීමට ඉඩ ඇති |
| තදංගවසෙන | = | තදංග ප්‍රහාන වශයෙන් |
| පරිච්චජනෙතා ච | = | දුරුකළ හැකි බැවින් ද |
| සංඛත දොස දස්සනෙන | = | සංස්කාරයන්ගේ අනිත්‍ය බව දුක් සහිත බව, ආදී දෝස දකින බැවින් (තන්නින්නතාය හා බැදේ) |
| තබ්බිපරීතෙ | = | එම සංස්කාරයන් කෙරෙහි විපරීත වූ |
| වා | = | නිච්ච සුඛ පරමත්ත වන්නා වූ |
| නිබ්බානෙහි තන්නින්නතාය | = | එම නිවනට නැමීම් වශයෙන් |
| පක්ඛන්ධනෙතාච | = | වැදගන්නා, බැසගන්නා බැවින්ද |
| අයම්පි අනිච්චාදි අනුපස්සනා | = | අනිච්ච ආදී වශයෙන් භාවනා කරන මෙම විපස්සනාවද, ('පි' සද්දය මඟින් ආර්ය මාර්ගය පිඬු කොට දක්වයි.) |
| පරිච්චාග පටිනිස්සග්ගො චෙව | = | වැදගන්නා, බැසගන්නා බැවින් ද |
| පක්ඛන්ධන පටිනිස්සග්ගොච | = | පක්ඛන්ධන පටිනිස්සග්ග යැයි |
| ඉති | = | මෙසේ කියනු ලබයි. |

## අර්ථය වනාහි...

පටිනිස්සග්ගානුපස්සනා යන පදයෙහි *පටිනිස්සග්ග* ශබ්දය= 'නැවත අතහැරීම' යන අර්ථය ගෙනදේ. මෙහිලා නැවත අතහැරීම යන්න අකමැති

වස්තුවක් නැවත පරිත්‍යාග කිරීම, කැමති තැනකට එය පිටත්කොට හැරීම යන අර්ථ විසින් පරිච්චාග පටිනිසසගග යැයි කියනු ලැබේ. කැමති තැනකට නැවත පිටත් කොට හැරීම පක්ඛන්‍දන පටිනිසසගග යැයි කියනු ලැබේ. **පටිසංඛා, සංඛාරුපෙක්ඛා** යන මේ තන්හි වනාහි යෙදෙන විපස්සනාව මගින්, භාවනා කටයුතු සංස්කාරයන් මත නිච්ච -සුඛ- අත්ත යැයි තදින් බැඳීගැනීම හේතුවෙන් පහළ වීමට සූදුසු කෙළෙස් ද, එම කෙළෙස් හේතු කරගෙන පහළවන අකුසල කර්ම හා කුසල කර්ම ද, එම කර්මවල ඵල වන විපාක ස්කන්ධයන් ද තදංග පහාන වශයෙන් නැවත වරක් බැහැර කළ හැක්කේය. එබැවින් ද පටිනිසසගග නම් වේ. යම් තැනෙක අනතුරක් හමු වූ තැනැත්තේ, අනතුරු රහිත වෙනත් ස්ථානයක් ම සොයා යන්නට කැමතිවන්නේ යම්සේද ,එසේම සංස්කාරයන්ගේ ආදීනව මත භාවනා කරන මෙම විපස්සනාව ආදීනව සහිත මෙම සංස්කාරයන්ට හාත්පසින් විරුද්ධ වූ (සංඛාරයන්ගෙන් තොර වූ නිච්ච, සුඛ, පරමත්ථ වන්නා වූ නිවනට නැමී පහළ වේ හෙවත් නැමී සිටී යන්න සංස්කාරයන්ගේ අභාවය කැමතිවීම ම වේ. නිවන අරමුණු කිරීම නොවේ. මෙලෙස නැමී සිටීම් වශයෙන් නිවනට වැඳගැනීමට හැකි තමා මුදා හැරීමට හැකි නිසාද පටිනිසසගග නම් වේ එබැවින් පටිනිසසගගො එව අනුපසසනා **පටිනිස්සග්ගානුපස්සනා** යන අට්ඨ කථා වචනාර්ථයට සමානවේ. පටිසංඛා, සංඛාරුපෙකඛා යන විපස්සනාවන්ට කෙළෙස් නැවත බැහැර කොට භාවනා කළ හැකි බැවින් ද, නිවනට නැමී සිටීම වශයෙන් වැඳගැනීම සඳහා පිටත් කර හරිමින් භාවනා කළ හැකි බැවින්ද **පටිනිස්සග්ගානුපස්සනා** නම් වේ.

| | | |
|---|---|---|
| **තස්මා** | = | එලෙස කෙළෙස් ද නැවත බැහැර කරමින් නිවනට ද වැඳගැනීමට පිටත් කොට හැරිය හැකි, පටිනිස්සග්ග යැයි කිව යුතු බැවින් |
| **ඤාය** | = | පටිනිස්සග්ග නම් වූ එම අනුපස්සනා හා |
| **සමන්නාගතො** | = | සමන්විත වූ |
| **භික්ඛු** | = | යෝගී භික්ෂුව |
| **යථා වුත්තෙනන නයෙන** | = | දක්වන ලද නය ක්‍රමයෙන් (තදංග ප්‍රහාන මගින් නිවනට නැමීම දක්වයි) |

| | | |
|---|---|---|
| කිලෙසෙච | = | නිච්ච, සුඛ, අත්ත යැයි තදින් ගැනීම නිසා පහළවන කෙළෙස් ද, |
| පරිච්චජති | = | තදංග ප්‍රහාන වශයෙන් සම්පූර්‍ණයෙන් බැහැරලයි |
| නිබ්බානෙච | = | නිවනෙහි ද |
| වා | = | නිවනට ද |
| පක්ඛන්දති | = | නැමී සිටීම් වශයෙන් වැදගනී |
| නිබ්බත්තන වසෙන | = | පහළ කිරීම වශයෙන් |
| වා | = | පහළ වීමට ඉඩ දීම් වශයෙන් |
| කිලෙසෙපි | = | කෙලෙස් ද |
| න ආදියති | = | නොගනී |
| සංඛාරම්මණම්පි | = | සංස්කාර අරමුණු ද |
| අදොස දස්සිතාවසෙන | = | ආදීනව නොදැකීම් වශයෙන් |
| න ආදියති | = | නොගනී |

අනිච්ච, දුක්ඛ, අනත්ත යැයි බලමින් භාවනා නොකරන්නේ නම් එම නොදුටු අරමුණු මත කෙළෙස් පහළ වීමේ ඉඩ ලබයි. එසේ ඉඩ ලබන්නේ නම් එම කෙළෙස් පහළ කළා හා සමාන වන්නේය. ගනියි, භාර ගනී නම් වේ. නමුත් මේ යොගී තෙම වනාහි, "අනිච්ච, දුක්ඛ, අනත්ත යැයි මනාලෙස බලමින් භාවනා කරන බැවින් එම මෙනෙහි කළ අරමුණු මත කෙලෙස් පහළ වීමට අවසරයක් නොදෙයි. අවසරයක් නොලබන බැවින් එම කෙළෙස් පහළ කළා නම් නොවන්නේය. ගත්තා නොවේ. භාරගත්තා නම් නොවේ. එබැවින් "**නාපි නිබ්බත්තන වසෙන කිලෙසෙ ආදියති**" යැයි දක්වයි. තවදුරටත්,... අනිච්චතා ආදී ආදීනවයක් නොදක්නා සුළුව සංස්කාරයන් මත මනසිකාරය පවත්වා සළකා බලමින් සිටින්නේ නම්, එවන් සළකා බැලීමක් පාසා කෙළෙස් වශයෙන් තදින් බැඳීගන සංස්කාර අරමුණු ගනිමින් සිටී නම් වේ. මේ යෝගීතෙම අනිත්‍යයතා ආදී ආදීනවයක් දැක භාවනා කරන බැවින් එම සංඛාර අරමුණු, අරමුණු කරමින් සිටිය ද ඒවා ගැනීම හෝ භාර ගැනීම කළා නම් නොවන්නේය. කෙළෙස් වශයෙන් ඇලීම්- බැඳීම් නැති නිසා මෙනෙහි කර භාවනා කරන වාරයක් පාසා එම සංස්කාර අරමුණු භාර නොගෙන බැහැර කිරීම කළා නම්

වන්නේය. නොගත්තා නම් වන්නේය. එබැවින් "න අදොස දස්සිතාවසෙන සංඛතාරම්මණං" යැයි දක්වයි.

තෙන= කෙළෙස් නැවත වරක් බැහැර කිරීම, නිවනට නැමීම් වශයෙන් පිටත් කර හැරීම, කෙළෙස් සඳහා අවසරයක් දී නමුත් නොගැනීම, සංස්කාර අරමුණු ආදීනව නැතැයි නොගැනීම යන මේ හේතු කරුණු නිසා "**පටිනිස්සජ්ජති නො ආදියති**" යැයි,

වුත්තං = *පටිසම්භිදා මග්ගයෙහි* දේශනා කරන ලදී.

මුලින් දක්වන ලද මහා ටීකා දැක්වීමට අනුව පටිනිස්සග්ගානු පස්සනා යන්න සාරාංශ වශයෙන් **පටිසංඛා, සංඛාරුපෙක්ඛා ඤාණයම** යැයි සළකාගත යුතු

*පටිනිස්සග්ගානු පස්සනාව නිමියේ යැ.*

# සංක්ෂේපයෙන් දැක්වීම

අනිච්චානුපස්සනා මුල් කරගත්, පටිනිස්සග්ගානුපස්සනාව අවසාන කොට ඇත්තා වූ මෙම සත්තානුපස්සනාවෝ සමෘධ වුවහොත්, මතු විස්තර කරන්නා වූ විපස්සනාවන් එකොලහද එහිලා ඇතුළත් වූනාම වන්නේය. එම නිසාම අට්ඨ කථාවන්හි "විපස්සනා යොගී තෙම මෙම විපස්සනා හත අනුව භාවනා කටයුතු බව" කීප වතාවක්ම දක්වත්. පටිසම්භිදා මග්ගයෙහිද මෙම අනුපස්සනා හත බොහෝ වාර ගණනක් දේශනා කොට ඇත්තේමය. තව දුරටත් අනිච්ච, දුක්ඛ, අනත්තානුපස්සනා යන මේ තුන අතින් සමෘධ වී නම් නිබ්බිදා, විරාග, නිරෝධ, පටිනිස්සග්ගානු පස්සනා යන මේ හතරද ඇතුළත්ව අංග සම්පූර්ණ උනාම වන්නේ යැ. එම නිසාම ත්‍රිපිටක පාළියෙහි සෑම තැනම අනිච්ච, දුක්ඛ අනත්ත යන මේ තුන පමණක් බොහෝ වාර ගණනක් දේශනා කොට ඇත්තේය. වඩාත් තහවුරු ලෙස විශ්වාසය පහළ වීම පිණිස පහත දැක්වෙන ටීකාව සාධකයක් වන්නේය.

**සත්තධා, අට්ඨාරසධාති ආදිනා විභත්තාපි හි අනුපස්සනාපකාරා අනිච්චානුපස්සනාදී සෙවව තීසු අනෙතාගධාති මත්තකප්පත්තා විපස්සනාදී සෙවම තීසු අනෙතාගධාති මත්තකප්පත්තා විපස්සනා තාසං එව වසෙන තිට්ඨති.** [මහා ටී.(බු)2/460]

සත්තධා = සත් ආකාර වූ අනුපස්සනා

අට්ඨාරසධා = දහ අට ආකාරවූ අනුපස්සනා

ඉති ආදිනා = මේ ආදී ලෙසට

| | | |
|---|---|---|
| විභත්තාපි අනුපස්සනාකාරා | = | විභාග කරන අනුපස්සනාකාරයෝද |
| තිසු අනිච්චානුපස්සනාදීසු එව | = | තුන් ආකාර වූ අනිච්චානුපස්සනා ආදියෙහිම |
| අනෙතාගධා | = | ඇතුළත්වේ. බැසගෙන සිටී. |
| ඉති | = | මෙලෙස බැසගෙන සිටින බැවින් |
| මත්තකපත්තා | = | මස්තකප්‍රාප්ත වූ |
| වා | = | මස්තක ප්‍රාප්ත වූ විපස්සනාව |
| තාසං එව වසෙන | = | එම තුන් ආකාර අනිච්ච, දුක්ඛ, *අනත්තානුපස්සනාවන්* වශයෙන්ම |
| තිට්ඨති | = | පවතී. |

*අනුපස්සනා* හත, මහා විපස්සනා දහ අට, චත්තාලීස විපස්සනා ආදී වශයෙන් විවිධ ලෙස විභාග කොට දක්වතත් ඒ ඒ විපස්සනා ආදී වශයෙන් *අනිච්ච, දුක්ඛ, අනත්තානුපස්සනා* යන මේ තුනෙහිම බැසගෙන සිටිත්. මෙම *අනුපස්සනා* තුන අතින් සම්පූර්ණ වී නම්, සියලුම අනෙකුත් *විපස්සනාවන්ද* ඇතුළත්ව සම්පූර්ණ වීම වෙත්. එබැවින් *'විපස්සනා ඥාණ* බලවත්වී මුදුන්පත් වී *අනිච්ච, දුක්ඛ, අනත්තානුපස්සනා* යන තුන පහළ වී නම් ප්‍රමාණවත්ය' යන්න මෙහි සරල අදහසයි.

## ඇතුළත් වී සම්පූර්ණ වන ආකාරය

**යා ච අනිච්චානුපස්සනා, යා ච අනිමිත්තානු පස්සනා ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජන මෙව නානං. යා ච දුක්ඛානුපස්සනා, යා ච අප්පණිහිතානු පස්සනා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජන මෙව නානං, යා ච අනත්තානපස්සනා යා ච සුඤ්ඤතානුපස්සනා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං** [මහා ටී. ]

| | | |
|---|---|---|
| යා ච අනිච්චානුපස්සනා | = | යම් අනිච්චානුපස්සනාවක්, |
| යාච අනිමිත්තානුපස්සනා | = | යම් අනිමිත්තානුපස්සනාවක්, |
| අත්ථි | = | ඇත්තේද? |
| ඉමෙ ධම්මා | = | මේ දෙයාකාර අනුපස්සනාවන් |

| | | |
|---|---|---|
| එකතතා | = | සමාන ධර්ම ස්වභාවයන් ඇත්තාහ. |
| වා | = | අර්ථය වශයෙන් සමාන වෙත් |
| බ්‍යඤ්ජන මෙව | = | සද්ද වශයෙන්, නාම වශයෙන් පමණක් |
| නානං | = | වෙනස් වේ |

(ඉතිරි පාළි අර්ථයන් ද මෙලෙසට ම සිංහලට පෙරළාගන්න)

එබැවින් *අනිච්චානුපස්සනාව* සම්පූර්ණ වී නම් *අනිමිත්තානුපස්සනා* ද සම්පූර්ණ වේ. *දුක්ඛානුපස්සනාව* සම්පූර්ණ වී නම් *අප්පණිහිතානුපස්සනා* ද සම්පූර්ණවේ. *අනත්තානුපස්සනාව* සම්පූර්ණ වී නම් සුඤ්ඤතානුපස්සනාවද සමෘධ වේ.

**අධිපඤ්ඤාධම්ම විපස්සනා පන සබ්බාපි විපස්සනා යථාභූතඤාණ දස්සනං කඞ්ඛාවිතරණ විසුද්ධියා එව සංගහිතං** [මහා. ටී. 2/269]

| | | |
|---|---|---|
| සබ්බාපි | = | සම්පූර්ණ වූ |
| විපස්සනා | = | අනිච්ච, දුක්ඛ, අනත්ත විපස්සනාව අධිපඤ්ඤා විපස්සනා නම් වේ. |
| යථාභූත ඤාණ දස්සනං | = | තත්ත්වාකාරයෙන් දැකීම |
| කංඛාවිතරණවිසුද්ධියා එව | = | කංඛාවිතරණ විසුද්ධි වශයෙන් |
| සංගහිතං | = | ගණන් ගැනේ |

එබැවින් අනිච්ච, දුක්ඛ, අනත්තානුපස්සනා යන තුන අතින් සම්පූර්ණ නම් අධිපඤ්ඤා ධම්ම විපස්සනාවද සමෘධ වේ. මෙම අනුපස්සනා වන්ට හේතුවන බැවින් යථාභූත ඤාණ දස්සනය වනාහි පෙරාතුවම සම්පූර්ණ වේ. ඉතිරි විපස්සනා දහයත් ඇතුළත්වී සම්පූර්ණ වන ආකාරය පහත සඳහන් මහා ටීකා දැක්වීම මාර්ගයෙන් දතයුතු.

**අනිච්චානුපස්සනාය හි සිද්ධාය නිරොධානුපස්සනා, ඛයානුපස්සනා වයානුපස්සනා, විපරිනාමානුපස්සනාච එකදෙසෙන සිද්ධානාම හොන්ති, දුක්ඛානුපස්සනාය සිද්ධාය නිබ්බිදානුපස්සනා විරාගානුපස්සනා ආදීනවානුපස්සනා ච අනත්තානුපස්සනාය සිද්ධාය ඉතරා** [මහා ටී.]

| | | |
|---|---|---|
| අනිච්චානු පස්සනාය | = | අනිච්චානුපස්සනාව |
| සිද්ධාය | = | සිද්ධ වීමෙන් |

| | | |
|---|---|---|
| නිරොධානුපසසනාය | = | නිරොධානුපස්සනාව ද |
| ඛයානුපසසනාය | = | ඛායානුපස්සනාව ද |
| වායානුපසසනාය | = | වයානුපස්සනාව ද |
| විපරිනාමානු පසසනාව | = | විපරිනාමානුපස්සනාව ද |
| එකදෙසෙන | = | එක් දේශයක් වශයෙන් |
| සිද්ධානාම | = | සමෘධවීම සිද්ධ වූනා නම් |
| හොනති | = | වෙත් |
| දුකඛානුපසසනාය | = | දුක්ඛානුපස්සනාව |
| සිද්ධාය | = | සම්පූර්ණ වූ කල්හි |
| නිබබිදානුපසසනාය | = | නිබ්බිදනුපස්සනාව ද |
| විරාගානුපසසනා | = | විරාගානුපස්සනාව ද |
| ආදීනවානුපසසනාව | = | ආදීනවානුපස්සනාව ද |
| සිද්ධානාම | = | සම්පූර්ණවීම සිද්ධවූනා නම් වේ. |
| අනතතානුපසසනාය | = | අනත්තානුපස්සනාව මගින් |
| ඉතරා | = | මෙයින් බාහිර වූ පටිනිස්සගගානුපස්සනා පටිසංඛානුපස්සනා, විවට්ටානුපස්සනා යන මේවා |
| සිද්ධානාම | = | සිද්ධ වූනා නම් වේ. |

මෙම ටීකාවෙහි "එකදෙස වශයෙන් සම්පූර්ණ වූනා" යැයි කියන කථාව වනාහි පවතින සම්මසනඤාණ ක්ෂෙත්‍රය වන බැවින් කියන්නකි. භංගඤාණ ආදී ඉහළ ඤාණ අවස්ථාවන්හි සිදුවන අනිච්චානුපස්සනා ආදීන් වනාහි අදාල අනුපස්සනා සම්පූර්ණ වශයෙන් සමෘධවේ යැයි සළකා ගත යුතු.

තවදුරටත් ටීකා ග්‍රන්ථයන්හි දුකඛානුපසසනාවෙහිලා විරාගා-නුපසසනා යන පදය යොදා ඇත්තේය. මක්නිසාද යත්?. පටිසමභිදා මගගයෙහි මෙම විරාගානුපසසනාව 'දුකඛානුපසසනාව මෙන් කාමුපාදාන පමණක් දුරු කරයි' යැයි දක්වයි. අනතතානුපසසනාව මෙන් දිට්ඨි- සීලබබත-අතතවාද යන උපාදනයන් දුරුකිරීම නොදක්වයි., එබැවින් එම

විරාගානුපස්සනාව පහාන කෘත්‍යය අතින් සම වූ දුක්ඛානුපස්සනා හි ඇතුළත් වීම සුදුසු වේ. මෙලෙස ඇතුළත් වීමට සුදුසු නමුත් සම්මත ග්‍රන්ථයන්හි එම පදය එසේ හමුනොවන බැවින් අතහැරදමන ලද බව මෙහිලා සළකා ගතයුතු.

මේ ටීකා දැක්වීමට අනුව අනිච්චානුපස්සනාව සම්පූර්ණ නම් නිරොධ- ඛය- වයා- විපරිණාමානුපස්සනා යන මේ හතර ද සමෘධ වෙත්. දුක්ඛානුපස්සනාව සම්පූර්ණ වීනම් නිබ්බිදා, විරාග, ආදීනව යන අනුපස්සනා තුනද සමෘධ වෙත්. අනත්තානුපස්සනාව සම්පූර්ණ නම් පටිනිස්සග්ගානුපස්සනා, පටිසංඛානුපස්සනා, විවට්ටානුපස්සනා යන මේ තුනද සමෘධ වෙත්. මේ වනාහි අනිච්චානුපස්සනා ආදී අනුපස්සනා තුන මඟින් සියලු විපස්සනාවන් සමෘධවන ආකාරයයි.

අනිච්ච, දුක්ඛ, අනත්තානුපස්සනා යන මේ තුනද සංස්කාරයන්ගේ භංගය දකිමින් භාවනා කරන ඥාණ බලවත් වූ අවස්ථාවේ වනාහි, මෙනෙහි කොට භාවනා කරන නාම- රූපයන්හි භංගය දකිමින් භාවනා කිරීම මාර්ගයෙන් පමණක් සම්පූර්ණ වෙත්. එබැවින් මහාටීකාවෙහි මෙලෙස දක්වයි.

**කෙචි පනෙත්ථ අනිච්චතො අනුපස්සති නො නිච්චතොති ආදිනා විසුං දස්සන කිච්චං නත්ථි, භංගදස්සනෙනෙව සබ්බං දිට්ඨං හොතීති වදන්ති, තං භංගානුපස්සනාය මත්ථකප්පත්තියං යුත්තං තතොපන පුබ්බභාගෙ අනෙකාකාරවොකාරා අනුපස්සනා ඉච්ඡිතබ්බාව.**

[මහා ටී.(බු)2/443]

| | | |
|---|---|---|
| **කෙචි පන** | = | සමහර ආචාර්යයන් වහන්සේලා වනාහි |
| **එත්ථ** | = | මේ භංග ඥාණ අවස්ථාවෙහි |
| **අනිච්චතො අනුපස්සති** | = | අනිච්ච යැයි පමණක් දකී. භාවනා කරයි. |
| **නො නිච්චතො** | = | නිත්‍යයැයි නොදකියි, එසේ භාවනා නොකරයි |
| **ඉති ආදිනා** | = | මේ ආදී ලෙසට |
| **විසුං දස්සන කිච්චං** | = | වෙන් වෙන්ව බැලීමේ කටයුත්තක් |
| **නත්ථි** | = | නොමැත්තේය |

| | | |
|---|---|---|
| භංග දසසනෙනෙව | = | සංස්කාරයන්ගේ බිඳීම මත භාවනා කිරීම මගින් පමණක් |
| සබබං | = | සියලු අනිත්‍ය ස්වභාවය ආදිය |
| දිටඨං | = | දැකීම සම්පූර්ණ වීම |
| හොති | = | වේ යැයි |
| ඉති වදනති | = | මෙසේ කියත්, |
| තං | = | මෙම කෙචිත් වාද කථාවන් |
| භංගානුපසසනාය | = | බිඳීම දකින ඤාණය |
| මතථකපපතතියං | = | මස්ථකප්‍රාප්තවීම |
| පුබබභාගෙ පන | = | පූර්ව භාගයේදී වනාහි |
| අනෙකාකාරවොකාරා | = | බොහෝ ආකාර වශයෙන් මිශ්‍ර වූ |
| අනුපසසනා | = | අනුපස්සනා වනාහි |
| ඉචඡිතබබාව | = | කැමතිවිය යුතු වන්නේම ය. |

මෙම ටීකාවෙහි *කෙචි වාද* වශයෙන් මෙසේ පෙන්වා ඇතත් භංග ඤාණ තරුණ අවස්ථාවට  පමණක් මෙම කෙචි වාද අදාල වේ. භංගානුපසසනා බලවත් වූ අවස්ථාවෙහි වනාහි ටීකාචාර්‍යයන් විසින් "සුදුසු"යැයි අනුමත කරන බැවින් එයම ටීකාචාර්‍යයන්ගේ මතාප වාදය වන්නේය. එබැවින්ම පටිසමභිදා මගගය හි වයලකඛනුපටඨානෙකතතඤච විපසසකානං යැයි දක්වයි.

| | | |
|---|---|---|
| වයලකඛණුපටඨානෙකතතඤච | = | සංස්කාරයන්ගේ බිඳීයැම් ලක්‍ෂණය ප්‍රකට වූ එකත්තය වනාහි |
| විපසසකානං | = | විපස්සනා වඩන යෝගීන්ගේ |
| එකතතං | = | කෙළෙස් සහායකින් තොරව එකැතින් විපසසනා සිත වඩයි. |

*අටඨා රස මහා විපස්සනා සංක්ෂිප්ත ලෙස දැක්වීම නිමියේ යැ.*

# 08 ඛයානුපසසනාව

**ඛයානුපසසනනති සංඛාරානං ඛණභංගානුපසසනං** යන මහා ටීකා දැක්වීමට අනුව සවභාව ලක්‍ෂණය වශයෙන් සළකා ගතයුතු. බිඳෙමින් පවතින රූප- නාම සංස්කාරයන්හි ක්‍ෂයවී යෑම නම් වූ ක්‍ෂණ භංගය බලමින් භාවනා කරන ඤාණය ද, එසේ බලන භාවනා සිතෙහි ක්‍ෂය වී යෑම නම් වූ ක්‍ෂණ භංගය භාවනාවෙන් බලන ඤාණය ද ඛයානුපස්සනා නම් වේ. මේ අනුපස්සනාව ඤාත - අරමුණ හා ඤාණ - විපස්සනාවන්ගේ ක්‍ෂයවීම, නැතිව යෑම දැක දැනගන්නා භංග ඤාණය වේ. එබැවින් කායික රූප- සණ්ඨාන ස්වරූප වශයෙන් සිතාමතා සළකා ගන්නා ඝන- නිමිති ප්‍රඥප්ති දුරුවී, විඥප්ති ආකාර වන්නා වූ රූප- නාමයන්ගේ ක්‍ෂයවීමම ප්‍රකටවන අවස්ථාවෙහි මෙම අනුපස්සනාව සම්පූර්ණවේ.

**ඛයානුපසසනාති පචචුපපනනානං රූපකඛනධාදීනං භංගදසසන ඤාණ ඤච, තං තං ඛනධභංගදසසනානතරං තදාරමමණචිතත චෙතසික භංගදසසන ඤාණඤච** [ප. අ. 1/74]

| | | |
|---|---|---|
| **ඛයානුසෙසනාති** | = | *ඛයානුපසසනා* යනු |
| **පචචුපපනනානං** | = | ප්‍රත්‍යුත්පන්න වන්නා වූ |
| **රූපකඛනධාදීනං** | = | අරමුණු කරන්නා වූ රූපස්කන්ධ ආදීන්ගේ |
| **භංගදසසන ඤාණඤච** | = | භංගය දක්නා ඤාණය ද |
| **තං තං ඛනධභංග දසසනානතරං** | = | ඒ ඒ ස්කන්ධයන්ගේ භංගය දැකීමත් හා සමගම |

තදාරම්මණ චිත්ත චෛතසික

| | | |
|---|---|---|
| භංග දස්සන ඤාණයෙන් | = | එම ස්කන්ධ භංගය අරමුණු කරන්නා වූ විපස්සනා සිත්, චෛතසිකයන්ගේ භංගය දක්නා ඤාණය ද |
| භයානුපස්සනා | = | භයානුපස්සනා නම් වේ. |

භයානුපස්සනාති පන ඝනවිනිභොගං කත්වා අනිච්චං ඛයටෙඨ්නාති එවං ඛයං පස්සතො ඤාණං [වි. ම. 522]

| | | |
|---|---|---|
| භයානුපස්සනා ති | = | භයානුපස්සනාව යන්න |
| ඝන විනිබ්භොගං | = | එකක්, එකෙක් යැයි සිතාගන්නා ඝන ප්‍රඥප්තිය- පිඬුව වෙන් වෙන් වශයෙන් බෙදා වෙන් කිරීම |
| කත්වා | = | භංග ඤාණය මඟින් සිදුකොට |
| අනිච්චං ඛයටෙඨ්නාති | = | ක්ෂය වන බැවින් අනිත්‍ය යැයි |
| එවං | = | මෙසේ |
| ඛයං | = | ක්ෂයවීම |
| පස්සතො | = | දකින්නා වූ යොගීගේ |
| ඤාණං | = | ඤාණය වේ. |

ඝන වර්ග හතර බිඳලන ආකාරය අනිච්චානුපස්සනා, අනත්තානු පස්සනා යන අවස්ථාවන්හි දක්වන ලදී. භංග ඤාණය බලවත් ලෙස පහළවී ඝන සංඥාව බිඳින ලද යොගී හට, අත නවමින් සිටින අවස්ථාවේ නැවීමේ ඉරියව් වශයෙන් පහළ වූ සියලුම කුඩා ක්‍රියාකාරකම් පියවරින් පියවර, කොටසින් කොටස බෙදී පැනේ. එබැවින් එම කුඩා චලනයන් ක්ෂයවී, ක්ෂයවී යන්නේ යැයි දැක- දැන ගනී. එසේ දැක දැනගන්නා සිත ද ඔහුගේ අරමුණුත් හා සමඟම "පෙර පියවර පසු පියවර අනුගමනය කරමින් ක්ෂයවී- ක්ෂයවී යන්නේ යැ"යි අතරක් නොතබාම, අතරක් නොතබාම දැක දැනගනී. එබැවින් 'නවනවා' යැයි කියන රූප සාමාන්‍ය මනුෂ්‍යයන්ට මෙන් අත්බාහුව, ඇඟිල්ල ආදී එක ඝනයක් සටහනක් වශයෙන් ද

නොපැනේ. එම අතම දිගට පිහිටන්නක් හෝ දිගට පවතින්නක් ලෙසටද නොපැනේ. තවදුරටත්, මෙනෙහි කොට දැනගන්නා සිත්ද සාමාන්‍ය පුද්ගලයන්ගේ මෙන් එක් කෙනෙක් ලෙස සළකා ඇතැයි සිතා ගත යුත්තක් වශයෙන් ද නොපැනේ. ඇත්ත වශයෙන් වනාහි....., ඒ ඒ ක්‍ෂණයෙහිම කොටස් කොටස් වෙන් වී ක්‍ෂය වෙමින් ක්‍ෂය වෙමින් යන ස්වරූපයෙන්ම පැනේ. යෝගීතෙම 'එම රූප- නාමයන් ප්‍රකටවන ආකාරයටම ක්‍ෂයවී යන්නේය, ක්‍ෂයවී යන්නේ යැයි දැනගනී. දිගහරින, බලන අවස්ථාවේ ආදියෙහි ද මෙලෙසටම යැ. මෙලෙස දැනගන්නා බැවින් මෙනෙහි කොට දතයුතු එම රූප- නාමයන් එකක්- එකෙක් යැයි සළකා ගන්නා සඤ්ඤා විපල්ලාස ආදිය පහළවිය නොහේ. එබැවින් "මේ විපස්සනා වඩන්නා ඝන සඤ්ඤාව බැහැර කරයි" යැයි කියනු ලැබේ.

**භංගානුපස්සනාතො පට්ඨාය තස්සා පාරිපූරිති ඝන සඤ්ඤාය පහානං හොති, තතො පුබ්බෙ අපරිපුණ්ණතාය තං න හොති, එව මඤ්ඤත්‍රාපීති පරිපුණ්ණාපරිපුණ්ණතා පහාන තීරණ පරිඤ්ඤාසු විපස්සනාය දට්ඨබ්බා** [මහා ටී. (බු.)2/417]

| | | |
|---|---|---|
| **භංගානුපස්සනාතො පට්ඨාය** | = | භංග ඤාණයේ පටන් |
| **තස්ස** | = | එම කායානුපස්සනාවේ |
| **පාරිපූරී** | = | සම්පූර්ණලෙස මේරීම |
| **හොති** | = | වේ. |
| **ඉති** | = | එබැවින් |
| **වා** | = | භංග ඤාණය ම පරිපූර්ණ වූ බයානුපස්සනාව වන බැවින් |
| **ඝන සඤ්ඤාය** | = | එකක්, ඒකකයක්, එක් කෙනෙක් යැයි සිතාගන්නා ඝන සඤ්ඤාව |
| **පහානං** | = | ප්‍රහානය |
| **හොති** | = | වේ. |
| **තතො** | = | එම භංග ඤාණයට |
| **පුබ්බෙ** | = | පෙර |
| **අපරිපුණ්ණතාය** | = | බයානුපස්සනාව අංග සම්පූර්ණ නොවූ බැවින් |

තං සන සඤ්ඤං පහීනං = එම සන සඤ්ඤා ප්‍රහාණය

න හොති = නොවේ. (මේ කථාව මගින් භංග ඤාණයට තවම පත් නොවූ යොගී හට සණ්ඨාන- ද්‍රව්‍ය යන මේවා මත සන ප්‍රඥප්ති පහළ වීම තවම බාධාවකින් තොරව පවතින බව කෙළින්ම කියයි. මේ ගැන ඔබේ දැඩි අවධානය යොමුවිය යුතු.)

අඤ්ඤත්ථාපි = අනෙකුත් අනිච්චානුපස්සනා ආදියෙහිදු

එවං = මේ භයානුපස්සනාව මෙලෙසට වේ.

ඉති = මෙසේ භංග ඤාණයේ පටන් විපස්සනාව බලවත් වන බැවින්

පහාන තීරණ පරිඤ්ඤාසු = *පහාන පරිඤ්ඤා, තීරණ පරිඤ්ඤාවන්* කෙරෙහි

විපස්සනා පඤ්ඤාය = විපස්සනා ඤාණයේ

පරිපුණ්ණාපරිපුණ්ණතා = පරිපූර්ණතාව, අපරිපූර්ණතාව

දට්ඨබ්බා = දතයුතු

සම්මසන- උදයබ්බය ඤාණ යැයි කියන තීරණ පරිඤ්ඤා අවස්ථාවෙහි විපස්සනා ශක්තිය තවම බලවත් නැත. සම්පූර්ණ නැත. එබැවින් එම අවස්ථාවෙහි පහළ වන අනිච්චානුපස්සනා ආදියට නිච්චසඤ්ඤා ආදිය සම්පූර්ණව නිමවන තෙක් බැහැර කිරීමට නොහැක්කේය. භංග ඤාණය ආදී පහාන පරිඤ්ඤා අවස්ථාවෙහි විපස්සනාව බලවත්වේ. සපිරේ. එබැවින් එම අවස්ථාවෙහි සිදුවන අනිච්චානුපස්සනා ආදියට වනාහි නිච්ච සඤ්ඤා ආදී ප්‍රතිවිරුද්ධ ධර්මයන් සම්පූර්ණයෙන් නිමවන තැන දක්වා දුරුකළ හැක්කේය යන්න මෙහි අදහසයි.

*භයානුපස්සනාව නිමියේ යැ.*

# 9 වයානුපසසනාව

"ආරමමණ අනවයෙන- උභො එකවවතථානා
නිරොධෙ අධිමුතතතා- වය ලකඛනා විපසසනා"ති

එවං වුතතා, පචචකඛතො චෙව අනවයතොච සංඛාරානං භංගංදිසවා තසමිඤෙඤව භංගසංඛාතෙ නිරොධෙ අධිමුතතතා. තාය ආයුහනසස පහානං හොති. යෙසඤහි අතථාය ආයුහෙයය, තෙ එවං වය ධමමාති විපසසතො ආයුහනෙ චිතතං න නමති. [වි. ම. 522]

| | | |
|---|---|---|
| වයානුපසසනාති | = | වයානුපස්සනා යන්න, වනාහි |
| ආරමමණ අනවයෙන | = | ඇස්පනාපිට දැකිය යුතු ප්‍රත්‍යුත්පන්න අරමුණට අනුව ගමන් කරන අන්වය ඤාණ මඟින් |
| උභො | = | ඇස්පනාපිට දැකිය හැකි ප්‍රත්‍යුත්පන්න හා එසේ නොදැකිය හැකි අතීත, අනාගත යන අරමුණු දෙවර්ගය |
| එකවවතථානා | = | භංග සංඛ්‍යාත විසින් සමාන ස්වභාවයන් ඇත්තාහු යැයි වවත්ථානය කිරීම |
| වා | = | බිඳී යා හැකි ස්වභාවය අතින් සමාන ගති ඇත්තාහු යැයි විශේෂ වීම ද යන |
| සො | = | මේ අංග දෙක අතින් සම්පූර්ණ වූ ඤාණය |

| | | |
|---|---|---|
| වයලක්ඛණ විපසසනා | = | වියෝවීමේ ලක්‍ෂණය දකින විපස්සනාව නම් වේ. |
| ඉති එවං | = | මෙලෙස |
| වුත්තා | = | පටිසම්භිදා මගග භංග ඤාණ කොටසෙහි දේශනා කොට |
| | | (මෙම විශේෂණය අධිමුත්තතා යන පදය හා බැඳේ) |
| පච්චක්ඛතො චෙව | = | ප්‍රත්‍යක්‍ෂ ඤාණ වශයෙන් ද |
| අන්වයතොච | = | ප්‍රත්‍යක්‍ෂ ඤාණයට අනුව යන අන්වය ඤාණයෙන් ද |
| සංඛාරානං | = | ඇස්පනාපිට වන මෙන්ම එසේ නොවන සංස්කාරයන්ගේ |
| භංගං | = | බිඳී යෑම |
| දිසවා | = | දැක |
| භංග සංඛාතෙ | = | බිඳීයෑම යැයි කිවයුතු |
| තසමිංයෙවැව නිරොධෙ | = | එම නිරුද්ධ වීමෙහිම |
| අධිමුත්තතා | = | නතුවී සිත යොදන ඤාණය |
| වයානුපසසනා | = | වයානුපස්සනා නම් වේ. |
| තාය | = | සියලු සංස්කාරයන් බිඳෙන සුළු යැයි සිත යොදන එම වයානුපස්සනාව මඟින් |
| ආයූහනසස | = | සමෘධිමත් මනා අභිවෘද්ධිය පිණිස උත්සාහය |
| පහානං | = | ප්‍රහානය කිරීම |
| හොති | = | වේ |
| හි | = | විවරණය කොට දක්වතොත්, |
| යෙසං | = | සදාකාලිකය, තහවුරුව පවතී යැයි සිතා මතා ගන්නා එම සංස්කාරයන්ගේ |
| අත්ථාය | = | සමෘධිමත් මනා අභිවෘද්ධිය නම් වූ ප්‍රතිඵල අපේක්‍ෂාවෙන් |
| ආයූහෙයා | = | සංස්කාරයන්ගේ බිඳීම නොදක්නා තැනැත්තා තෙමේ උත්සහා කරයි. |

| | | |
|---|---|---|
| තෙ සංඛාරා | = | නිත්‍ය යැයි පෙර සිතූ එම සංස්කාරයන් |
| වා | = | සුවසේ අභිවෘද්ධිය අපේක්ෂා කරන එම සංස්කාරයන් |
| එවං වයධම්මාති | = | මෙලෙස වහා වියොවන සුළු ස්වභාවය ඇත්තාහු ම යැයි කියා |
| විපස්සතො | = | විපස්සනා කරන යෝගීගේ |
| චිත්තං | = | සිත |
| ආයූහනෙ | = | සමෘධිය අභිවෘද්ධිය පිණිස උත්සාහ කිරීමෙහිලා |
| න නමති | = | සිත නොනමයි. කල්පනා නොකරයි. |

වර්තමානව මෙනෙහි කොට දතයුතු රූප නාමයන් ක්‍ෂණයකුදු නොනැවතී බිඳී බිඳී යෑම දැක- දැනගත් යෝගීතෙම, වර්තමාන ලෙස නොදත හැකි අතීත- අනාගත රූප නාමයන් ද "වර්තමාන රූප- නාම මෙන්ම ක්‍ෂණයකුදු නොනැවතී බිඳී බිඳීයන ස්වභාවය ඇත්තේයැ" යි නය ක්‍රමය අනුව "සියලුම සංස්කාරයන් ක්‍ෂණයකුදු නතර නොවී බිඳී බිඳී යන්නාහු වෙත්මැයි. නොඉපදී, නොබිඳී, නිත්‍යලෙස පැවතිය හැකි තත්ත්වයක් නැත්තේයැ"යි නිරෝධය දෙසටම නැවී, නතුවී මනසිකාරය පවත්වන සළකා බලන අධිමුච්චන පඤ්ඤාව පහළවේ. මෙම ඤාණය වයානුපසස්සනා නම් වේ. මෙම අනුපස්සනාව තම හිත සුව පිණිස බලවත් ලෙස සංස්කාර රැස්කිරීමේ උත්සාහ කිරීමේ කැමැත්ත නම් වූ ආයූහනය දුරු කරයි.

දුරු කරන ආකාරය වනාහි; නාම- රූපයන් ක්‍ෂණයකුදු නොනැවතී දිගින් දිගට බිඳී බිඳී පවතින්නේ යැයි සම්‍යක් ලෙස දැක දැන නැත්නම් එම යෝගාවචරයා "නොබිඳී- ස්ථිර ලෙස පවතින්නා වූ මගේ කය, අන් අයගේ කය" යැයි වරදවා සිතා ගනී. 'නිත්‍ය වූ මගේ කය- අනුන්ගේ කය යැ'යි සිතා ගනී. මෙලෙස "නිත්‍ය වූ මගේ කය- අනුන්ගේ කය යැ,යි සිතා ගන්නා සංස්කාරයන්ගේ හිත-සුව පිණිස මෙලොවත් උත්සුක වෙයි. පරලොව වැඩ සඳහාත් උත්සුක වෙයි.නමුත් මෙම වයානුපස්සනාව මගින්" සංස්කාරයන් වනාහි මොහොතෙකුදු නොනැවතී, දිගින් දිගට බිඳෙමින් පවතී" යැයි සම්‍යක් ලෙස දැක දැනගත් විට වනාහි,... නිත්‍ය යැයි පෙර

සිතාගත් එම සංස්කාරයන්ගේ හිත-සුව පිණිස ව්‍යාපාර කිරීමක් කැමති නොවේ. උත්සුක වීමට සිත නොදෙයි. උපමාවක් ලෙස.... ඉතාමත් ප්‍රිය මනාප වූ තම දූ පුතුන් කල වයස් පැමිණි කළ හොඳට හැඳ- පැළඳ සැපසේ ගත කරවීමේ තද බල බලාපොරොත්තු ඇතිව, වස්තු- භෝග උපයා- සපයා ගැනීමට උත්සුකව සිටින දෙමව්පියන් එම දයාබර දූ පුතුන් මියගිව බවක්, වියෝවී ගියබවක් දැනගත් මොහොතේ පටන් උත්සුකව ව්‍යාපාර කරන බවෙහි කළකිරී- උනන්දු නොවී යන්නේ යම්සේද එලෙස පොහොසත්ව සුඛිතව- මුදිතව සිටීමට උනන්දු නොවීම, ව්‍යාපාර විෂයෙහි කළ කිරීම සිදුවන්නේ වයානුපස්සනාව මඟින් මේ ආයූහනය බැහැර කළ නිසාම වේ.

*වයානුපස්සනාව නිමියේ යැ.*

# 10 විපරිනාමානුපස්සනාව

විපරිනාමානුපස්සනාති රූප සත්තකාදි වසෙන නං තං පරිච්ඡෙදං අතික්කම්ම අඤ්ඤතාපවත්තිදස්සනං,උප්පන්නස්ස වා ජරාය චෙව මරණෙනව ද්විහාකාරෙහි විපරිනාම දස්සනං. [වි. ම. 522]

| | | |
|---|---|---|
| විපරිනාමානුපස්සනාති | - | විපරිනාමානුපස්සනාව යන්න |
| රූප සත්තකාදි වසෙන | - | රූප සත්තක ආදී වශයෙන් |
| තං තං පරිච්ඡෙදං අතික්කම්ම | - | ඒ ඒ පර්යන් ඉක්ම වූ |
| අඤ්ඤතාපවත්ති දස්සනං | - | අන්‍ය වූ ඉරියව්, හැසිරීම් වලට පත්වීම දක්නා වූ ඥාණයයි |
| අථවා | = | වෙනත් ආකාරයකට දක්වතොත් |
| උප්පන්නස්ස | = | පහළ වූ නාම රූපයන්ගේ |
| ජරාය චෙ ව | - | දිරීම, මේරීම වශයෙන් ද |
| මරණෙන ච | = | මරණය, වියෝවීම වශයෙන් ද |
| ද්විහි ආකාරෙහි | - | දෙයාකාරයකින් |
| විපරිනාම දස්සනං | = | මුල් ස්වරූපයෙන් නොපැවතී මාරුවන-පෙරළෙන බව දක්නා ඥාණයයි |

## භාවනා කිරීම. ප්‍රථම ක්‍රමය

එක එක භවයක පටිසන්ධි සිතේ සිට චුති සිත දක්වා පහළ වන රූප මරණ අවස්ථාවෙහි සමස්ථයක් ලෙස විනාශ වන්නාහු යැයිද වයස් කාල තුන තුළින් ප්‍රථම වයස තුළ වන රූප දෙවැනි වයසට පත්වේ නම් එම

රූප පෙර රූප හා සමාන නොවී, පෙරළී- වෙනස් වෙත් යැයිද, දෙවැනි වයසේ රූප තෙවැනි වයසට පත්වේ නම් පෙර තිබූ ආකාරයට සම නොවී පෙරළී- වෙනස් වෙත් යැයිද, තෙවැනි වයසේ රූප මරණ අවස්ථාවේදී පෙර හා සම නොවී පෙරළී- වෙනස් වෙත් යැයිද, එසේම මුල් වයස අවුරුදු දහයක් තුළ පැවති රූප දස වස් ගත වීමත් සමඟ පෙර හා සම නොවී පෙරළී, වෙනස්වී යත් යැයිද, අවුරුදු විස්සක් තුළ රූප අවුරුදු විස්ස ගත වීමත් සමඟ පෙර රූප හා සම නොවී වෙනස් වී පෙරළී යත් යැයිද, (*සම්මසන ඤාණ* අවස්ථාවේ දක්වූ ක්‍රමයට අනුව විස්තර කර ගන්න) රාත්‍රියේ තිබූ රූප දිවා කාලයට පත්වී නම් රාත්‍රියේ මෙන් නොවී වෙනස්වී පෙරළීයත් යැයිද, දිවා කාලයේ රූප රාත්‍රිය තෙක් පත්වී නම් දිවා කාලයේ රූප හා සම නොවී වෙනස් වී පෙරළීයත් යැයිද, උදය කාලයේ රූප මධ්‍යාහ්නය තෙක් පැවතුන හොත්, උදේ හා සමනොවී වෙනස්වී, පෙරළීයයි යැයිද, මධ්‍යාහ්නයේ රූප හවසට පත්වී නම්, රාත්‍රී රූප මධ්‍යම රාත්‍රියට පත්වීනම්, මධ්‍යම රාත්‍රී රූප පැසුළුයමට පත්වී නම්, පැසුළුයම් රූප උදයට පත්වී නම්, පෙර අවස්ථාවේ රූප හා සමනොවී වෙනස්වී, පෙරළීයයි යැයිද සළකා බලා භාවනා කරයි. මේ වනාහි සළකා බලා භාවනා කරන සංක්ෂිප්ත ක්‍රමයයි.

## සවිස්තරව භාවනා කරන ක්‍රමය

ඉදිරියට ගමන් කිරීමේ රූප ආපසු එන තෙක්, බලන තෙක් ආදීයෙහි පෙර හා සමනොවී වෙනස් වී- පෙරළී යත් යැයිද, ආපසු හැරී ඒමේ රූප, බැලීමේ හෝ පවතින රූප, නවන අවස්ථාවේ ආදී පවතින රූපද ඉදිරියට ගමන් කිරීමේ ආදියෙහි පෙර හා සම නොවී වෙනස්වී- පෙරළී යයි යැයිද, තැන්පත් අවස්ථාවේ රූප චංචල අවස්ථාවේ රූප, චංචල අවස්ථාවේ රූප තැන්පත් අවස්ථාවේ රූප පෙර හා සම නොවී වෙනස්ව- පෙරළී යත් යැයිද, පය එසවීමේ රූප යවන අවස්ථාවේදී, පය යවන අවස්ථාවේ රූප තබන අවස්ථාවේදී, තබන අවස්ථාවේ රූප තද කරන අවස්ථාවේදී, තද කරන අවස්ථාවේ රූප නැවත පය ඔසවන අවස්ථාවේදී, පෙර හා සමනොවී- පෙරළේ යැයිද, සිසිල් අවස්ථාවේදී රූප උණුසුම් අවස්ථාවේ රූපවලට පෙර හා සම නොවී වෙනස්ව- පෙරළේ යැයිද, බඩගිනි අවස්ථාවේ රූප බඩපිරී ඇති අවස්ථාවේ රූප, බඩගිනි අවස්ථාවේ රූප

බඩපිරී ඇති අවස්ථාවේ රූප පෙර හා සම නොවී වෙනස්ව- පෙරළේ යැයිද, සතුටු අවස්ථාවේ රූප කණගාටු අවස්ථාවේ, දුක්ඛිත අවස්ථාවේදී, කණගාටු අවස්ථාවේ රූප, සතුටු අවස්ථාවේ රූප පෙර හා සමනොවී වෙනස්ව- පෙරළේ යැයිද යනාදී ලෙසට රූප අවස්ථා විවිධ වන වාරයක් වාරයක් පාසා වෙනස් වේ- පෙරළේ යැ"යි බලයි. තව දුරටත්, පෙර පෙර සිත්ද පසු පසු සිත් පහළ වන තෙක් " පෙර හා සමනොවී වෙනස්ව පෙරළේයැ"යි බලයි. මේ වනාහි ප්‍රථම ක්‍රමයට විපරිනාමානුපසසනාව කරන ආකාරයයි.

## දෙවැනි ක්‍රමයට භාවනා කරන ආකාරය

රූප- නාම දිරීම- මේරීම නිසා වෙනස්වන- පෙරළෙන බවට පත්වෙත්. මැරෙන බැවින්ද වෙනස් බවට පෙරළේ. මේ ආකාර දෙක මගින් මුලින් පැවතී ආකාරයට සමනොවී වෙනස්වී පෙරළී විනාශවෙත් යැයි සළකා බලා භාවනා කරයි. මේ වනාහි සංෂේපයෙන් සළකා බලන ආකාරයයි.

## එයම සවිස්තරව භාවනා කරන ආකාරය

පහළවන තාක් රූප- නාම අතරක් නොතබා මෙනෙහි කරමින් සිටින යෝගී තෙම ඥාණය මුහුකුරා ගිය කල මෙනෙහි කටයුතු එම නාම - රූපයන්ගේ ජරාව නම් වූ මැද කොටස හෙවත් ධීති ක්‍ෂණය පහළ වීමේ මුල හා සමනොවී වෙනස් වී- පෙරළී යැමද, මරණ නම් වූ අවසාන භංග ක්‍ෂණය වශයෙන් අවසන් වීම, විනාශ වී යැමද, ඇස්පනාපිට දැක දැනගනී. එබැවින් මෙනෙහි කරන කරන වාරයේ එම රූප නාමයන් "මැද කොටස, අග කොටස වශයෙන් පහළ වීමේ ආරම්භක අවස්ථාව හා සමනොවී වෙනස් වී පෙරළී යත් " යැයි, වර්‍තමාන වශයෙන් දැකබලා ගනී. මෙනෙහි කොට දත යුතු ප්‍රත්‍යුත්පන්න නාම- රූප මුල් ස්වරූපය ලෙසට නොපැවතී වෙනස්වීම- පෙරළීම වේ යැයි මනා ලෙස දැක- දැනගත් අවස්ථාවේ එසේ ඇස්පනාපිට දතනොහැකි වූ අතීත අනාගත රූප- නාම සකල ලෝකයේ ඇති රූප- නාමද "මේ ලෙසටම මුල් ස්වරූපයෙන් නොපැවතී මැද පවිය, අග පවිය පැවැත්ම, බිඳීයෑම, මේරීම, මිය යෑම තව දුරටත්

වෙනස්වී පෙරළී යන්නේම යැයි අන්වය ඤාණයෙන් සළකා තීරණයකට එළඹ බලයි. මේ වනාහි දෙවැනි ක්‍රමයට විපරිනාමානුපස්සනාව සිදුවන ආකාරයයි.

මුල් ස්වකීය ස්වභාවය එලෙසින් නොපැවතී වෙනස්වී- පෙරළී යන්නේ යැයි භාවනා කොට බලන මෙම ප්‍රත්‍යක්ෂ ඤාණය හා අන්වය ඤාණ යන දෙක විපරිණාමානුපස්සනාව නම්වේ. මෙම අනුපස්සනාව රූප- නාම සංස්කාරයන් "මුල් සවකීය ස්වභාවය අනුව නොවෙනස්ව ද තහවුරුව ද කල්පවත්නා ලෙසටද පවතී" යැයි සිතා ගන්නා ධ්‍රැව සඤ්ඤාව දුරු කරයි.

## විශේෂ වාද

පටිසම්භිදා මගග අට්ඨ කථා හි පෙර බයානුපස්සනාව හා පසු අධිපඤ්ඤා ධම්ම විපස්සනාවත් සළකා බලා අනුමාන කරන අන්වය භංග ඤාණයට වයානුපස්සනා යැයිද, එම වයානුපස්සනාව හේතු කොටගෙන සියලු ධම්යන් "වෙනස් වී විනාශවී යෑමේ ස්වභාවය ඇත්තානු යැ" යි දැක දැනගන්නා ඤාණය විපරිනාමානුපස්සනා යැයිද විවරණය කරයි. පහත දැක්වෙන්නේ මේ විවරණයයි.

**වයානුපසසනාති පචචුපපනනකඛනධානං භංගදසසනානනතරං ච තදනවයෙනෙව අතීතානාගතකඛනධානං භංගදසසන ඤාණං, විපරිනාමානුපසසනාති තසමිං භංග සංඛාතෙ නිරොධෙ අධි මුතතතා අථ සබෙබපි අතීතානාගත පචචුපපනනා ඛනධා විපරිනාමවනෙතාති සබෙබසං විපරිනාමදසසන ඤාණං** [ප. අ.1/ ]

**වයානුපසසනාති** = වයානුපස්සනා යන්න

**පචචුපපනනකඛනධානං භංග දසසනානනතරං**
= ප්‍රත්‍යුත්පන්න සකන්ධයන්ගේ භංගය දැකීමට අනතුරුව

**තදනවයෙනෙව** = එම ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයන්ගේ භංගය දක්නා ප්‍රත්‍යක්ෂ ඤාණය තෙක් පිළිවෙල අනුගමනය කිරීම් වශයෙන්ම

අතීතානාගතකඛනධානං

භංග දසසන ඤාණං = අතීත අනාගත පත්‍යුත්පන්න ස්කන්ධයන්

විපරිනාමානුපසසනාති = විපරිනාමානුපස්සනාව යන්න

තසමිං භංග

සංඛාතෙ නිරොධෙ = භංග යැයි කිවයුතු එම නිරුද්ධවීම

අධිමුතතතා = සැලකිල්ලෙන් එදෙසට නැමී මනසිකාරය පැවැත්වීම් හේතුවෙන්

අථ = එම අවස්ථාවෙහි

සබෙබපි = සියලුම

අතීතානාගත

පචචුපපනනාකඛනධා = අතීත අනාගතපත්‍යුත්පන්න ස්කන්ධයන්

විපරිනාමවනෙතාති = වෙනස්වී පෙරළී විනාශ වී යෑමේ ස්වභාවය ඇත්තාහු යැයි

සබෙබසං විපරිණාමදසසන ඤාණං

= සියලු ධර්මයන්හි වෙනස් වීම විනාශ වීම දැක බලාගන්නා ඤාණය වේ.

(මේ කාරණයට අනුව විපරිනාමානුපස්සනාව භංග ඤාණය මුහුකුරා ගිය අවස්ථාවේ පමණක් පහළ වේ යැයි සලකා ගත යුතු.)

*විපරිනාමානුපස්සනාව නිමියේ යැ.*

# 11 අනිමිත්තානුපස්සනාව

අනිමිත්තානුපස්සනාව යන්න අනිච්චානුපස්සනාව පහළ වන අවස්ථාව සංක්ෂෙපයෙන් දක්වූ තැන සඳහන් කරන්නට යෙදුනි. නමුදු නම වශයෙන් වෙනස් වන බැවින් ව්‍යාකරණ අර්ථය අතින් විශේෂ වන ආකාරය දක්වන්නෙමු.

**නිමිත්තන්ති සංඛාර නිමිත්තං** [වි. ම.]

**සංඛාර නිමිත්තන්ති සංඛාරානං සමූහාදිඝනවසෙන සකිච්ච පරිච්ඡෙද-තායච සවිග්ගහානං විය උපට්ඨානං** [මහා ටී.]

**නිමිත්තන්ති** = 'නිමිත්ත' යන්න වනාහි

**සංඛාර නිමිත්තං** = සංස්කාරයන් ප්‍රකට කෙරෙන පිළිබිඹු කරන ආකාරය වේ [වි. ම.]

**සංඛාර නිමිත්තන්ති** = *සංඛාර නිමිත්ත* යන්න වනාහි,

(අනු ටීකාව හා සසඳන කළ උපට්ඨානං හා බැඳේ)

**සමූහාදිඝන වසෙන** = සමූහ ආදී ඝන ප්‍රඥප්ති වශයෙන්

**සවිග්ගහානං විය** = දේහයක්- ද්‍රව්‍යයක් වැනි වූ වස්තූන්ගේ ප්‍රකට භාවයෙන් ම

**වා** = දේහයක්- ද්‍රව්‍යයක් ඇත්තා සේ

**සංඛාරානං උපට්ඨානඤ්ච** = සංස්කාරයන්ගේ ප්‍රකට භාවයෙන් ම

| | | |
|---|---|---|
| **භාවිත භාවනසස** | = | වඩන ලද විපස්සනා භාවනා සහිත යොගී හට (ඉහත ක්‍රමයටම යොදන්න) |
| **සකිච්චපරිචෙඡදතාය** | = | තම කෘත්‍යය නම් වූ පිරිසිඳීම ඇති බැවින් |
| **වා** | = | ස්වකීය කෘත්‍යය, ස්වකීය ස්වභාවය, ස්වකීය ක්‍ෂණය, ස්වකීය අරමුණ නම් වූ පිරිසිඳීම ඇති බැවින් |

(ලක්‍ඛණාගාර නය ක්‍රමයට අනුව කෘත්‍යය, ස්වභාව, ක්‍ෂණ, අරමුණු යන මේවාද ඇතුළත් කර ගන්නා ලදී.)

| | | |
|---|---|---|
| **අවිගගහානං විය** | = | දේහයක්- ද්‍රව්‍යයක් ඇත්තාක් සේ |
| **සංඛාරානං උපට්ඨානඤ්ච** | = | සංස්කාරයන්ගේ ප්‍රකට වීම ද |
| **සංඛාර නිමිත්තං** | = | සංඛාර නිමිත්ත නම් වේ. |

**විපස්සනා භාවනා** නොවඩන ලද සාමාන්‍ය පුද්ගලයනට යෑම, සිටීම, හිඳීම, හොවීම, නැවීම, දිගහැරීම, ආදී කායික ඉරියව් හෙවත් රූප සංස්කාරයෝ ද, දැකීම, ඇසීම ආඝ්‍රාණය කිරීම, රස විඳීම, පහස විඳීම, කල්පනා කිරීම ආදී නාම සංස්කාරයෝ ද, ද්වාර හයෙහි ප්‍රකට වන වණ්ණ, සද්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම ස්වභාවය යන ආරම්මණ සංස්කාරයෝ ද ඉරියව් හෝ ධර්ම ස්වභාවයන් වශයෙන් ද ප්‍රකට නොවෙත්. වෙන වෙන එක එකක් වශයෙන් බෙදී ද ප්‍රකට නොවේත්. හුදු ක්‍ෂණ අවස්ථා පමණකැයි යන ලෙසටද ප්‍රකට නොවේත්. ඇත්ත වශයෙන් ම වනාහි ද්‍රව්‍ය, සටහන් ආදී වශයෙන් පමණක් ප්‍රකටවෙත්... එකක්, ඒකකයක්, එක ඝනයක්, එක් කෙනෙක් වශයෙන්ම ප්‍රකට වෙත්. නිත්‍ය ලෙස පවතින දේහයක් සටහනක් වස්තුවක් වශයෙන් සිතා සළකා බලන වාරයක් පාසා සිතෙහි ප්‍රකට වූ මෙම ඝන ප්‍රඥප්තිය ද 'සංස්කාර නිමිත්ත' නම් වේ. නිච්ච නිමිති, ධුව නිමිති, සස්සත නිමිති යැයිද ව්‍යවහාර කරයි.

සංස්කාරයන් අනිත්‍ය යැයි දැන- දැක ගන්නා අනිච්චානුපස්සනාව නිච්ච, නිමිත්ත, ධුව නිමිත්ත, සස්සත නිමිත්ත නම් වන මේ සංස්කාර නිමිති වල ප්‍රති විරුද්ධ පැත්ත වන්නා වූ අනිමිත්ත නම් වේ. අනිත්‍ය යැයි භාවනා කළ හැකි බැවින් අනුපස්සනා නම් වේ. එබැවින් මෙම නම් දෙක එකතුකොට අනිමිත්තානුපස්සනා යැයි කියනු ලැබේ. සංස්කාර ඝන නිමිත්ත යන්නෙහි විරුද්ධ පැත්ත වන්නා වූ භාවනාවක් යැයි යන්න මෙහි අදහසයි.

සංස්කාර නිමිතිවල ප්‍රතිවිරුද්ධ පැත්ත වන ආකාරය වනාහි : පහළ වන ක්‍ෂණයෙහි නාම- රූප අතරක් නොතබා මෙනෙහි කරමින් භාවනා කරන යෝගී හට ද්වාර හයෙහි පැණෙන, ප්‍රකටවන විට එම සංස්කාරයන් ද්‍රව්‍යයක් සටහනක් වශයෙන් ද ප්‍රකට නොවෙත්. එකක්, ඒකකයක්, කෙනෙක් වශයෙන් ද ප්‍රකට නොවෙත්. නිත්‍ය ලෙස පවත්නා ලෙසටද ප්‍රකට නොවෙත්. දිගින් දිගට ස්ථිරව පවතින ලෙසටද ප්‍රකට නොවෙත්. ඇත්ත වශයෙන් වනාහි,... ඉරියව්- ධර්ම ස්වභාව වශයෙන් පමණක් ප්‍රකට වෙත්. වෙන වෙන එක එකක් ලෙසට බෙදීගෙනම ප්‍රකට වෙත්. කාලය වශයෙන් එකම ක්‍ෂණයක් පමණක් පවතින ආකාරයෙන් ම ප්‍රකටවෙත්. පහළ වී ක්‍ෂණයක් ක්‍ෂණයක් තුළ විනාශ වී යන ආකාරයෙන්ම ප්‍රකටවෙත්. මෙලෙස ප්‍රකට වන බැවින් *භංග ඤාණය* සමෘධ වූ යෝගී තෙම එම සංස්කාරයන් මෙනෙහි කොට භාවනා කරන වාරයෙහි ප්‍රකටවන ආකාරයට ම විනාශ වී යයි යැයිද, නැතිවියන්නේ යැයිද, බිඳීයන්නේ යැයිද, අභාවයට යැයිද, නැතිවී යන්නේ යැයිද, අනිත්‍ය යැයිද භාවනා කොට බලයි. මෙලෙස භාවනා කොට බලන බැවින්, එසේ බැලිය යුතු එම සංස්කාරයන් මත " නිත්‍ය දේහයක්, වස්තුවක්" යැයි තදින් බැඳී ගන්නා කෙළෙස්ද පහළ විය නොහැක්කාහුය. මෙලෙස ඊට ප්‍රති විරුද්ධ පැත්ත පහළවී නම් සංස්කාර ඝන නිමිති බැහැර කළ හැකි බැවින් විසුද්ධි මාර්ගයෙහි පහත දැක්වෙන ලෙසට අදාල කථා කොටස දක්වයි.

**යස්මා පනෙස අනිච්චානුපස්සනාය සංඛාරානං ඝනවිනිබ්භොගං කත්වා නිච්චනිමිත්ත ධුව නිමිත්ත සස්සත නිමිත්තානි පජහන්තො ආගතො, තස්මා අනිමිත්තො** [වි. ම.]

| | | |
|---|---|---|
| **එස** | = | මේ මාර්ගය |
| **යස්මා** | = | යම් හෙයකින් |
| **අනිච්චානුපස්සනාය** | = | අනිච්චානුපස්සනාවෙන් |
| **සංඛාරානං ඝන විනිබ්භොගං කත්වා** | = | සංස්කාරයන්ගේ එකක්, පිඬුවක් ලෙසට ප්‍රකට වෙන ඝන ප්‍රඥප්තිය කඩා බිඳීම සිද්ධකොට |

නිච්චනිමිත්ත
ධුව නිමිත්ත, සස්සත
නිමිත්ත පජහනෙතා = නිච්ච නිමිත්ත, ධුව නිමිත්ත, සස්සත නිමිත්ත යන මේවා බැහැර කොට (දත යුතු කොටස මේ තාක් වේ.)

ආගතො = පැමිණියේය

තස්මා = එබැවින්

අනිමිත්තො = අනිමිත්ත නම් වේ.

විපස්සනා යොගී හට, ප්‍රකට වූ සංඛාර නිමිත්ත අතරක් නොතබා මෙනෙහි කරමින් සිටින යොගීහට මෙනෙහි කරන තාක් සංස්කාරයෝ ඒවායේ කෘත්‍යය වශයෙන් විශේෂිතව ප්‍රකට වෙනවා පමණකුදු නොවේ. ඒවායේ ස්වභාව ලක්‍ෂණ නම් වූ පෞද්ගලික ලක්ෂණයන් ද විශේෂිතව ප්‍රකටවේ. ඒවා පහළවන ක්‍ෂණ වශයෙන් ද එකිනෙකා වෙනස්ව කැපී පෙනේ. නාම සංස්කාරයන් වන්නේ නම් ඒවා අරමුණු වශයෙන් ද වෙනස්ව ප්‍රකටවෙත්. කැපී පෙනෙත්. ප්‍රකටවන ආකාරය සවිස්තරව "අනිච්චානුපස්සනා, අනත්තානුපස්සනා ක්ෂෙත්‍රයෙහි ඝන වගී සතර බිඳ ලූ පසු ප්‍රකට වන ආකාරය නැවත බලා භාවනා කොට" දත යුතු. මෙලෙස මෙනෙහි කරන කරන වාරයේ සංස්කාරයන්ගේ කෘත්‍යය, ස්වභාව ලක්ෂණය, ක්‍ෂණය, අරමුණු වශයෙන් වෙනස්ව ප්‍රකටවීම ද සංඛාර නිමිති නම් වේ. විපස්සනාව ඒ ඒ කෘත්‍යය, ස්වභාවය, ක්‍ෂණය, යන මේවා අරමුණු කොට දැක- දැන ගනිමින් වැඩේ. එබැවින් අනිච්චානුපස්සනාව වනාහි කෘත්‍යය, ස්වභාවය, ක්‍ෂණය, අරමුණු වශයෙන් පිරිසිඳ ප්‍රකට වන්නාවූ මෙම සංඛාර නිමිති සමඟ ප්‍රතිවිරුද්ධ නොවෙත්. එයින් තොරද විය නොහැක්කේය. එබැවින් යට විස්තර කළ ලෙසට නිච්ච, ධුව, සස්සත වශයෙන් ප්‍රකට වූ සංස්කාර ඝන-නිමිති වලට විරුද්ධ පාක්‍ෂික වන බැවින් ද එම සංඛාර ඝන-නිමිති අරමුණු වලින් බාහිර වූ බැවින් ද මෙහිලා මෙය අනිමිත්තානුපස්සනා නම් වේ යැයි සළකා ගත යුතු.

මෙම අනිමිත්තානුපස්සනා නම් වූ අනිච්චානුපස්සනාව අතින් සමෘද්ධ වූ යෝගීහට මෙනෙහිකොට බැලිය යුතු සංඛාරයන් ක්‍ෂය වී යන්නා වූ ආකාරයන්ම ප්‍රකටවෙත්. එබැවින් නිත්‍ය ලෙස තහවුරුව පවතින්නා වූ

දේහ-ද්‍රව්‍ය මෙන් පෙර ප්‍රකට වූ සංඛාර නිමිති එම යෝගී තෙම දත් තත්ත්වාකාරයෙන් අවබෝධ කරගනී. ඒ කෙසේද යත් ; අදක්‍ෂ වූ නොදන්නා වූ තැනැත්තා සාරයක් ඇත්තේ යැයි සිතාගත ඉඹුල් පුළුන් ගසක කඳක් කොටසින් කොටස පතුරින් පතුර වෙන් කොට බැලුවහොත් එලය පමණක්ම දැකගන්නා බැවින් ඉඹුල් පුළුන් කඳ පිළිබඳව මෙලෙස මනාලෙස වටහාගන්නේ යම්සේද එලෙසටම යෝගී තෙමේ ද සංස්කාරයන් ස්ථිරසාර නිත්‍ය දෙයක් යැයි පෙර කාලයේ වනාහි සිතාගත සිටියේය. අනිච්චානු පස්සනාව පහළ වූ අවස්ථාවෙහි අකුණු විදුලියක් කොටන සැණින් පවා නොපැවතී කොටසින් කොටස බිඳෙමින් බිඳෙමින් ක්‍ෂය වෙමින් යන සංස්කාරයන් පමණක් දැකගන්නා බැවින්, නිත්‍ය ස්ථිර සාර වූ ද්‍රව්‍යයක් නොමැත්තේය. ක්‍ෂණය කුදු නොනැවතී ක්‍ෂය වී විනාශ වී යා හැකි වූ ඉරියව් ආකාර ස්වභාවයන් පමණක් ඇත්තේ යැයි සංඛාර නිමිති සම්බන්ධ උසස් ලෙස තත්ත්වාකාරය දැනගනී. මෙලෙස තත්ත්වාකාරය දැනගන්නා බැවින් ස්ථිර සාර නිත්‍ය දේවල් වස්තු වශයෙන් පැණෙන සංස්කාර ඝන නිමිති ද, නිත්‍ය දේවල්- වස්තු යැයි තදින් බැඳී ගන්නා කෙලෙස්, කම් ආදීන්ද දුරු කරන්නේය. බැහැර කරන්නේය.

අනිච්චතො මනසිකරොතො ඛයතො සංඛාරා උපට්ඨහන්ති. අනිච්චතො මනසිකරොතො නිමිත්තං යථාභූතං පජානාති පස්සති.

[ප. ම.]

| | | |
|---|---|---|
| අනිච්චතො | = | අනිත්‍ය යැයි |
| මනසිකරොතො | = | මෙනෙහි කරන යෝගී තෙම |
| නිමිත්තං | = | නිත්‍ය දෙයක් ද්‍රව්‍යයක් ලෙස සිතාගත් සංස්කාර නිමිති |
| යථාභූතං | = | තත්ත්වාකාරයෙන් |
| පජානාති | = | දැනගනී |
| පස්සති | = | දකියි |

*අනිමිත්තානුපස්සනාව නිමියේ යැ.*

# 12 අපපණිහිතානුපසසනාව

ගමන් කිරීම, සිටීම, හිඳීම, නැවීම, දිගහැරීම, දැකීම, ඇසීම, හැපීම, කල්පනා කිරීම, ආදී රූප-නාම සංස්කාරයන් සැපයැයි, හොඳයැයි, සතුට උපදන සුළුයැයි සිතා ගෙන ඇලී බැඳී ගන්නා තණ්හාව ප්‍රාර්ථනා - පණිධි යැයිද නම් කෙරේ. පණිහිත යැයිද නම් කෙරේ. එම සංස්කාරයන්ගේ ඇතිවීම-නැතිවීම මොහොතකුදු නතර නොවී දිගින් දිගට සන්තානය පෙළන බව දැකගෙන "දුකක් ම වේ, නරක ම වේ, සතුටක් නැත්තක් ම වේ යැයි පහළ වන දුක්ඛානුපස්සනාව පණිහිත නම් වූ දැඩිව ඇලී- බැඳී ගැනීම ප්‍රතිපක්ෂ වන බැවින් අප්පණිහිතානුපස්සනා නම් වේ. එබැවින්ම මේ අනුපස්සනාව වඩන්නා වූ තැනැත්තා පණිධි හෙවත් ඇලී- බැඳී ගැනීම දුරු කරයි, නිම කරයි යන්න මෙහිලා අදහස් කෙරේ.

*අප්පණිහිතානුපස්සනාව නිමියේ යැ.*

# 13 සුඛදුඛදතානුපස්සනාව

අනත්තානුපස්සනාව සමෘද්ධ නොවුන තැනැත්තා හිඳ ගැනීමේ, සිට ගැනීමේ ආදියේදී ද, නැවීමේ, දිගහැරීමේ ආදියෙහි ද, දෑකීම, ඇසීම ආදියෙහි ද තමා කැමති පරිදි කටයුතු කිරීමට හැකි ආත්මයක් සත්ත්වයෙක් ඇත්තේය යන්න සිතාගනී. භංග ඤාණයේ ශක්තියෙන් ඝන හතර බිඳ අනත්තානුපස්සනාව මනාකොට වැඩූ තැනැත්තා වනාහි මෙනෙහි කරන කරන වාරයේ පවතින ස්වභාවයට අනුව යුහුසුළුව ඇතිවෙමින් නැතිවෙමින් යන්නා වූ ඉරියව් ආකාර පමණක්ම දකගනී. "තම අභිමතය පරිදි කළ හැකි, පැවැත්විය හැකි ආත්මයක් තිබේ යැ"යි ව්‍යවහාර කිරීමට සුදුසු තැනක් හෝ නොදකියි. අදාල හේතු ධර්ම සම්පාත වී නම් පහළ වනවාට අකමැති වස්තුවෙහි පහළ වීමද දක ගනී. නැතිවනවාට අකමැති වස්තුවෙහි නැතිවී- නොපෙනී යෑමද දක ගනී. ස්වාමී වූ මමෙක්- සතෙක්- ආත්මයක් යන්න නොදකියි. එබැවින් මෙනෙහි කොට දතයුතු අරමුණු ද හුදු ධර්මතා පමණකි. මෙනෙහි කොට දැනගැනීම ද ධර්මතා පමණකි. යුහුසුළුව ඇතිවෙමින්- නැතිවෙමින් යන්නා වූ මෙම ධර්ම ස්වභාවයක් පමණක් මිස ඉඳ ගැනීම, නැගිටීම, නැවීම, දිග හැරීම, දෑකීම, ඇසීම ආදීය කළ හැකි- නිම කළ හැකි මමෙක්- ආත්මයක් යන්න නැත්තේය. භාවනා කළ හැකි මනසිකාරය පැවැත්විය හැකි මමෙක්- ආත්මයක්- සතෙක් යන්න නොමැත්තේය. මමෙක්- සත්ත්වයෙක් කෙරෙන් තොරවූ, අතරක් නොතබා නැතිවෙමින් යන ධර්මතා පමණක් ඇත්තේයැ"යි දක- දැන පහදී. මෙලෙස

දැක- දැන පැහැදුනු අනත්තානු පස්සනාව මගින් ආත්මයෙන් තොර යැයි දැක බලා ගැනීම සිදුවන බැවින් සුඤ්ඤතානුපස්සනා නම්වේ. එම නිසාම මෙම අනුපස්සනාවට "තම අභිමතය පරිදි යමක් කළ හැකි- නිම කළ හැකි ආත්මයක්- සතෙක් ඇත්තේ යැ"යි සිතා ගෙන තදින් බැඳීගන්නා ආකාරයේ කෙළෙස් දුරු කළ හැක්කේය.

*සුඤ්ඤතානුපස්සනාව නිමියේ යැ.*

# 14 අධිපඤඤා ධමමවිපසසනා

අධිපඤඤාධමම විපසසනාති:

ආරමමණඤච පටිසංඛා, භංගඤච අනුපසසති

සුඤඤතො ච උපටඨානං, අධිපඤඤා විපසසනා"ති

එවං වුතතා රූපාදි ආරමමණං ජානිතවා තසසච ආරමමණසස තදාරමමණසස ච චිතතසස භංගං දිසවා "සංඛාරාව භිජජනති, සංඛාරානං මරණං න අඤඤං කොචි අතථී"ති භංගවසෙන සුඤඤතං ගහෙතවා පවතතා විපසසනා, සා අධිපඤඤා ච ධමෙමසු ච විපසසනාති තසමා අධිපඤඤාධමමවිපසසනාති වුචචති. තාය නිචචසාරාභාවසස ච අතතසාරාභාවසස සුටඨුදිටඨතතා සාරාදානාභිනිවෙසසය පහානං හොත
[වි. ම. 522]

| | | |
|---|---|---|
| අධිපඤඤා ධමම විපසසනාති | = | අධිපඤඤා ධමම විපසසනා යන්න |
| ආරමමණඤච | = | එක්තරා අරමුණක් |
| පටිසංඛා | = | බිඳෙන්නේ යැයි දැන |
| භංගඤච | = | එම දැනගන්නා විපස්සනාවේ බිඳීම ද |
| අනුපසසති | = | අනුපස්සනා කරයි |
| සුඤඤතොච | = | ආත්මයක් සත්ත්වයෙක් යන මෙයින් ශූන්‍ය යැයිද |
| උපටඨානං | = | (ඤාණයෙහි) පැණෙන |
| එසා | = | මේ ප්‍රඥාව |

| | | |
|---|---|---|
| අධිපඤ්ඤා විපස්සනා | = | අධිපඤ්ඤා විපස්සනා නම් වේ |
| ඉති එවං වුත්තං | = | පටිසම්භිදා මග්ගයෙහි භංග ඤාණ අවස්ථාවෙහි මෙලෙස දේශනා කළ (පවත්තා විපස්සනා හා බැඳේ) |
| රූපාදි ආරම්මණං ජානිත්වා | = | රූපාදී එක එකක් අරමුණු දැන |
| තස්ස ආරම්මණස්ස භංගඤ්ච | = | එම අරමුණෙහි බිඳීම ද |
| දිස්වා | = | යුගල යුගල වශයෙන් දැක |
| සංඛාරාව නිජ්ජන්ති | = | සංස්කාරයෝම බිඳෙත් |
| සංඛාරානං එව මරණං | = | සංස්කාරයෝම මියයත් |
| අඤ්ඤ | = | සංස්කාරයන්ගෙන් බාහිර අනෙකුත් |
| කොචි | = | මැරෙන බිඳෙන කෙනෙක් පුද්ගලයෙක් |
| න අත්ථීති | = | නැත්තේ යැයි කියා |
| භංගවසෙන | = | බිඳීම දැක දැන ගැනීම් වශයෙන් |
| සුඤ්ඤතං | = | ස්ථිර ආත්ම සාර යන මෙයින් තොර බව |
| ගහෙත්වා | = | ඤාණයෙන් ගෙන, දැක- දැන පැහැදී |
| පවත්තා | = | පහළ වූ |
| විපස්සනා | = | *විපස්සනාවයි.* |

භංග ඤාණය බලවත් වූ විට ද්වාර හයෙහි ප්‍රකට වන යම් අරමුණක් බිඳී යන්නේ යැයි මෙනෙහි කොට බැලීමෙන්ම දැනගනී. එම මෙනෙහි කිරීම ද බිඳීයන්නේ යැයි මෙනෙහි කොට බැලීමෙන්ම දැනගනී. එම මෙනෙහි කිරීමද බිඳීයන්නේ යැයි නැවත දැනගනී. මේ ක්‍රමයට අරමුණ හා මෙනෙහි කරන සිත යන දෙකම පෙර පසු පිළිවෙලින් යුහුසුළුව ක්‍ෂණයක් අතනැර බිඳීයෑම භාවනාවෙන් දැක ගන්නා යෝගී තෙම මෙනෙහි කොට දැනගන්නා අරමුණ ද සංස්කාර ධර්මයකි. මෙනෙහි කිරීමේ කටයුත්තත් සංස්කාර ධර්මයකි. පෙර පසු පිළිවෙලින් බිඳෙමින් පැවතීම සියල්ල හුදු සංස්කාරයෝ යැ. මියයෑම, බිඳීයෑම යනු මේ සංඛාර ධර්මයන්ගේ මියයෑම ම, බිඳී යෑම ම වේ. මෙම සංස්කාරයන්ගෙන් පරිබාහිර ආත්මයක්- සතෙක්- මමෙක් නොමැති

යැයි නිච්ච ස්වභාවය, ආත්ම ස්වභාවය, සත්ත්වභාවය යන මේවායින් බැහැර වීම, දුරු වීම නිපුන ලෙස දැක දැන ගැනීම අධි පඤ්ඤාධම්ම විපස්සනා නම්වේ.

| | | |
|---|---|---|
| සා | = | නිච්ච සාර ආත්මයකින් තොරවේ යැයි දැන දැන පහදින එම විපස්සනාව |
| අධිපඤ්ඤාව | = | බලවත් ප්‍රඥාවක් වන බවද සැබව |
| ධම්මෙසු | = | ධර්මයන් කෙරෙහි |
| විපස්සනාච | = | විපස්සනා ඤාණ වන බව ද සැබව |
| ඉති කත්වා | = | මෙලෙස සිත යෙදීම කොට |
| අධි පඤ්ඤා ධම්ම | | |
| විපස්සනාති | = | අධි පඤ්ඤා ධම්ම විපස්සනා යැයි |
| වුච්චති | = | කියනු ලැබේ |
| යාය | = | මෙම අධිපඤ්ඤා ධම්ම විපස්සනාවෙන් |
| නිච්චසාර භාවස්සච | = | නිත්‍ය සාර භාවයක් නැති බව ද |
| අත්තසාර භාවස්සච | = | ආත්මයක් සාරයක් නොමැති බව ද |
| සුට්ඨු දිට්ඨත්තා | = | මනාලෙස දුටු බැවින් |
| සාරාදානාභිනිවෙසස්ස | = | නිත්‍ය, සාර, ස්වාමී වූ ආත්ම සාරයක් ඇත්තේ යැයි භාරගෙන බැඳී ගැනීම |
| පහානං | = | ප්‍රහාණය |
| හොති | = | වේ. |

මේ *විපස්සනාව* මඟින් නිත්‍ය- සාර බවකින් තොරවේ යැයි ද, ස්වාමී වූ සත්ත්වයෙක් යැයි කිව හැකි ආත්ම සාරයකින් තොරවේ යැයි ද, සංස්කාරයන්හී නිත්‍ය- සාර ආත්ම- සාර ඇත්තේ යැයි සළකා බැඳීගන්නා කෙලෙස් දුරු කරයි.

*අධිපඤ්ඤා ධම්ම විපස්සනාව නිමියේ යැ.*

# 15 යථාභූතඤාණ දසසනය

**යථාභූත ඤාණ දසසනනති සපපචචයා නාම රූප පරිගගහො, තෙන අහොසි නුඛො අහං අතීතමද්ධානනති ආදීවසෙන මෙව ඉසසරතො ලොකො සමෙභාතීති ආදී වසෙනව පවතත සමෙමාහාභිනිවෙසසස පහානං හොති** [වි. ම. 522]

**යථාභූත ඤාණ දසසනනති** = තත්ත්වාකාරයෙන් දැක දැන ගැනීම යනු

**සපපචචය නාම රූප**

**පරිගගහො** = ප්‍රත්‍යය ද සහිතව නාම රූප පරිග්‍රහ කොට භාවනා කිරිමයි.

**තෙන** = එම යථාභූත ඤාණ දස්සනය මඟින්

**අහොසි නුඛො අහං අතීතමද්ධානනති ආදී වසෙන චෙව**

= මම පෙර භවයෙහි ඇත්තටම සිටියෙම්ද? ආදී වශයෙන් සැළකීම් වශයෙන් ද?

**ඉසසරතො ලොකො**

**සමෙභාතීති ආදීවසෙනව** = මැවුම්කාර දෙවියෙක් නිසා සත්ත්වයන් පහළ වීයැ යනාදී ලෙස පහළ වන වැරදි ඇදහීම් විශ්වාසයන් වශයෙන් ද

**පවතතා සමෙමාහාභිනිවෙසසස** = පහළ වූ වැරදි ඇදහීම්, විශ්වාස, වැටහීම් අනුව සිත යෙදීම

පහානං = පහකිරීම

හොති = වේ

හේතු නාම - රූප හා ඵල නාම- රූප පරිග්‍රහ කොට භාවනා කළ *පච්චය පරිග්ගහ ඤාණයම යථාභූත ඤාණ දසසනය* නම් වේ. මෙම ඤාණය සමෘධ වූ යෝගී තෙම දුන් වර්තමානය හා හේතු-ඵල සම්බන්ධ වී පවත්නා වූ, මේ පහළ වන්නාවූ නාම - රූපයන් පමණක්ම දැක ගන්නා බැවින් "මෙම භවයෙහි නාම- රූප සමූහ පෙර භවයේදී සිදුකළ *අවිජජා, තණ්හා උපාදාන, කම* නම් වන හේතු පවත්නා බැවින් පහළ වේ. එම පෙර භවයේදීද *අවිජජා, තණ්හා, උපාදාන කම*යන් ඇසුර ලැබූ රූප- නාම පැවතියේය. මෙම භවයෙහිදු සිදුකරන *අවිජජා, තණ්හා, උපාදාන කම්* නිසා පසු කාලයෙහි නව භවයක පහළ කරවනු ඇති" යනාදී ලෙසට තුන් කාලයෙහි හේතු රූප- නාමයන්, ඵල රූප- නාමයන් පමණක් ඇත්තාහ යැයි තීරණ කළ හැක. එබැවින් අතීතයෙහි මම සිටියෙම් ද යනාදී ලෙසට වරදවා වටහා ගැනීම් පහළ විය නොහැක. සත්ත්වයන් මැවුම්කාර දෙවියන් වහන්සේ විසින් මවන ලදී. බ්‍රහ්ම, දේව, ශක්‍ර යන අය විසින් මවන ලදී, සුදුසු කල් පැමිණී විට සත්ත්වයන් පහළවෙත්. හේතු ධම් නොමැතිවද ඉබේ මෙන් පහළවෙත්" යනාදී ලෙසට වරදවා වටහා ගැනීම්, ඇදහීම් මතුවිය නොහැක්කේය එබැවින් "වරදවා වටහාගැනීම්, වැරදි ඇදහීම් දුරු කරයි"

**සංසය මිච්ඡාඤාණනං වසෙන සම්මුයහනං සම්මොහො**

[මහා ටී.]

**සංසය මිච්ඡාඤාණනං** = වැරදි ඇදහීම්, වරදවා වටහා ගැනීම්, වැරදි විනිශ්චය යන මේවා

**වසෙන** = වශයෙන්

**සම්මුයහනං** = ඝන බහල වූ මෝහය

**සම්මොහො** = සම්මොහ නම් වේ

***යථාභූත ඤාණ දස්සන ය නිමි යැ.***

# 16 ආදීනවානු පසසනාව

ආදීනවානුපසසනාති භයතුපටඨාන වසෙන උපපනනං සබබ භවාදීසු ආදීනවදසසන ඤාණං, තෙන කිඤචි අලලියිතබබං න දිසසතීති ආලයාභිනිවෙසසස පහානං හොති [වි. ම. 522]

| | | |
|---|---|---|
| ආදීනවානුපසසනාති | = | ආදීනවානුපස්සනාව යනු වනාහි |
| භයතුපටඨාන වසෙන | = | භයතුපට්ඨාන ඤාණය වශයෙන් |
| උපපනනං | = | පහළ වූ |
| සබබභවාදීසු ආදීනව | | |
| දසසන ඤාණං | , | සකල භවයෙහිම ආදීනව දකින ඤාණයයි |
| තෙන | = | එම ආදීනව දක්නා ඤාණය මඟින් |
| කිඤචි අලලියිතබබං න | | |
| දිසසතීති | = | බැඳී ගැනීමට, ඇලී ගැනීමට කිසිවක් තොදකින බැවින් |
| ආලයාභිනිවෙසසස පහානං | = | භව සංස්කාරයන් හී බැඳී ගැනීමට, ඇලී ගැනීමට දෙයක් ඇත්තේ යැයි වැරදි ලෙස අදහා ගැනීම දුරු කිරීම |
| හොති | = | වේ. |

භය වැනි පරිච්ඡේදයෙහි දක්වූ ලෙසට භය ඤාණය බලවත් වූ අවස්ථාවෙහි රූප- නාම සංස්කාරයන්ගේ ආදීනව දකිමින් පහළ වන ආදීනව ඤාණය ආදීනවානුපස්සනා නම් වේ. මෙම ඤාණය පහළ වී නම් මෙනෙහි කටයුතු ආරම්මණ සංඛාර මෙනෙහි කොට දැනගන්නා විපස්සනා

සංඛාර, ප්‍රත්‍යවේක්ෂා කොට බැලිය යුතු ආරම්මණ සංඛාර, ප්‍රත්‍යවේක්ෂා කොට බැලීම නම් වූ සංඛාර යන මේ සංස්කාරයන් තුළින් කුමන සංස්කාරයක් නමුත් විශ්වාස කට හැකි නොවේ යැයි සිතයි. භවයක් භවයක් පාසා මනුෂ්‍ය ආත්මයක්ම ලබා ගතහැකි නම් හොඳයැ, සිටුවරයෙක් වන්නේ නම් මැනවැයි, රජවන්නේ නම් මැනවැයි, දේව භවය ලබන්නේ නම් මැනව, බ්‍රහ්මත්වය ලබන්නේ නම් මැනවැයි යනාදී ලෙසට, ආදීනව ඤාණ පහළ වීමට කලින් නම් විශ්වාස කළයුතු යම් භව සංස්කාරයන් ඇතැයි ඇදහීය. දැන් වනාහී එවැනි විශ්වාස කළ හැක්කක් නොදකී. එබැවින් නාම- රූප- අරූප භවයන් හා බැඳුනු සංස්කාරයන් මත 'ඇදහිය යුතුයැ'යි සළකා බැඳීගන්නා කෙලෙස් මෙම ඤාණය මගින් දුරු කරයි. මෙම අට්ඨ කථාහි ආලයාභිනිවෙස යන්න, එක් ලෙසකට දක්වතොත්, ඇත්ත වශයෙන් භවයෙහි බැඳෙන ඇලෙන භව තණ්හාවම වෙයි.

**සංඛාරෙසු ලෙණ, තණ. භාවගගහනං අලයාභිනිවෙසො අතථතො භව නිකනති** [මහා ටී.]

| | | |
|---|---|---|
| **සංඛාරෙසු** | = | සංස්කාරයන්හි |
| **ලෙණ. තාණ භාවගගහණං** | = | දුකින් මිදීම පිණිස සැඟවීමට තැනක් වශයෙන් , ආරක්‍ෂා රැකවරණ දියහැකි ලෙසට ඇදහීම හෝ සිතා බැඳී ගැනීම |
| **අලයාභිනිවෙසො** | = | ආලයාභිනිවෙස නම් වේ |
| **අතථතො** | = | අර්ථ වශයෙන් |
| **භවනිකනති** | = | භවයෙහි බැඳෙන, ඇලෙන තණ්හාව වේ |

ආදීනවානු ඤාණය සම්පූර්ණ නැති තැනැත්තා කොපමණ දුප්පත් වුවද, භව සංස්කාර සියල්ල දුරු කිරීමට සමත් නොවේ. භවයෙහිම යම් ක්‍රමයකට පොහොසත් විය හැකියැයි සිතාගෙන වර්තමාන දුකින් මිදීමට පමණක් කැමතිවේ. උපමාවක් ලෙස... අසණීපවී උණ ගැනී සිටින විට සනීප වීමට කැමති වේ. දුප්පත් වී නම් වස්තුව, භව- භොග සම්පත් වලින් සමෘධ වීමට කැමති වේ. මෙම මුළු භවයෙහිම බලාපොරොත්තු

තැබිය නොහැකි නම් මීළඟ භවයේ හොඳ වීම කැමතිවෙයි. මනුෂ්‍ය භවය දුක් යැයි සිතන්නේ නම් දිව්‍ය භවය බ්‍රහ්ම භවය කැමති වෙයි. රූප- නාම, සංඛාර භව සියල්ලෙන් මිදීම වනාහී කැමති නොවේ. මෙලෙස භව සංස්කාරයන්ගෙන් ඈත් නොවී, වෙන් නොවී පවතිනු පිණිස සමීපව සිටීමේ, ඇලීසිටීමේ තණ්හාව ආලයාභිනිවෙස නම් වේ. එය මෙම විපස්සනාව මඟින් දුරුකරයි. මේ නිසාම මෙම ඤාණය බලවත් වූ විට නිබ්බිදානුපස්සනාව ආදිය පහළ වේ.

*ආදීනවානුපස්සනාව නිමියේ යැ.*

# 17 පටිසංඛානුපස්සනාව

පටිසංඛානුපස්සනාති මුඤ්චනස්ස උපායකරණං පටිසංඛාඤාණං තෙන අප්පටිසංඛාය පහානං හොති [වි. ම. 522]

| | | |
|---|---|---|
| පටිසංඛානුපස්සනාති | = | පටිසංඛානුපස්සනාව යන්න |
| මුඤ්චනස්ස | = | සංස්කාරයන්ගෙන් මිදීමට |
| උපාය කරණං | = | හේතුවිය හැකි |
| පටිසංඛා ඤාණං | = | නැවත භාවනා කරන ඤාණයයි |
| තෙන | = | එම නැවත භාවනා කරන ඤාණයෙන් |
| අප්පටිසංඛාය පහානං | = | නැවත භාවනා නොකරන මෝහය බැහැර කිරීම |
| වා | = | නැවත දිගටම භාවනා කිරීමට ප්‍රතිවිරුද්ධ වූ මෝහය දුරු කිරීම |
| හොති | = | වේ. |

සංඛාරානං මුඤ්චනස්ස උපායභූතං පටිසංඛා ඤාණං පටිසංඛානුපස්සනා, තාය අනිච්චාදීසු අප්පටිසංඛානං, තත්ථ පටිසංඛානස්ස පටිපක්ඛභූතං අවිජ්ජං පජහති [මහා ටී.(බු)2/418]

| | | |
|---|---|---|
| සංඛාරානං මුඤ්චනස්ස | = | සංඛාරයන්ගේ බැහැර කිරීමෙහි |
| උපාය භූතං | = | නියම හේතුව වන්නා වූ |
| පටිසංඛා ඤාණං | = | නැවත භාවනා කරන ඤාණය |
| පටිසංඛානුපස්සනා | = | පටිසංඛානුපස්සනා නම්වේ. |

| | | |
|---|---|---|
| තාය | = | එම පටිසංඛානුපස්සනාවෙන් |
| අනිච්චාදීසු අපපටිසංඛානං | = | අනිච්චාදිය කෙරෙහි නැවත භාවනා කොට බැලීම නම් වූ |
| තත්ථ පටිසංඛානස්ස පටිපක්ඛභූතං | = | එම අනිච්චාදියෙහි මත නැවත භාවනා කොට බැලීමෙහි ප්‍රතිවිරුද්ධ පැත්ත වූ |
| අවිජ්ජා | = | නොදැනීම නම් වූ අවිද්‍යාව |
| පජහති | = | දුරු කරයි. |

සංස්කාරයන් දුරුකරලීම සඳහා, සංස්කාරයන්ගෙන් මිදීම සඳහා මුඤ්චිතුකම්‍යතා ඤාණය සම්‍ෘධ වූ යෝගී තෙම නැවත භාවනා කොට බලන පටිසංඛාඤාණය පටිසංඛානුපස්සනාව නම්වේ. මෙහිලා 'සංස්කාරයන් දුරු කිරීම යැ'යි කියන කථාව හා සංඛාරයන්ගෙන් මිදීම යන කථා යන මේ දෙක අර්ථ වශයෙන් සමානම යැයි සළකා ගතයුතුය. එබැවින් අටුව කථාවන් හී මුඤ්චිතුකම්‍යතා ඤාණ අවස්ථාවෙහි මිදීම, බැහැර කිරීම යන මේ කථා දෙක එකිනෙකට සමාන බව දක්වයි.

සංස්කාරයන්ගෙන් කෙසේ මිදෙයිද යත්; මතුවන මතුවන සංස්කාරයන් "අනිච්ච - දුක්ඛ - අනත්ත" යැයි දක්ෂ ලෙස සම්පූර්ණ ලෙස නොදනී නම් එම සංස්කාරයන් කෙරෙහි ඇලී බැඳී ගැනීම විය හැක්කේය. දුක්ඛ වේදනාවේ නොඉවසිය හැකි බව, සුඛ වේදනාවෙහි පහවීම- දුරු වීම ඇතිතාක් සංස්කාරයන්ගේ ඇතිවීම - නැතිවීම දැක බලාපොරොත්තු සුන්කර ගැනීම, බිය ජනක බව, අප්‍රිය බව යන මේවාද පහළවිය හැක්කේය. එලෙස පහළ වන්නේ නම් එය එම සංස්කාරයන් සමඟ බැඳීගෙනම පහළ වන බැවින් එම සංස්කාරයන් වෙතින් බැහැර කිරීමට නොහැක්කේය. සංස්කාරයන්ගෙන් නොමිදේ. පහළ වනතාක් සංස්කාරයන් මෙනෙහි කොට භාවනා කොට දක්ෂ ලෙස දැක - දැනගත් තැනැත්තා වනාහි කිසිම සංස්කාරයක් මත මනාප බවක් නොදකී. මම, මට අයත් වස්තු යැයිද නොපෙනේ. එබැවින් එම සංස්කාරයන් මත සුඛයක්- හොඳක් බලාපොරොත්තු නොවේ. කැමති සංස්කාරයන්ගේ නැතිවී යෑමද බලා පොරොත්තු නොවේ. කැමති නොවේ. සංස්කාරයන්ගේ සුඛයක් නැති

බව, නොහොඳ බව අනුව සිතට දුක් නොගනී. අකමැති සංස්කාරයන් පහළ වීමෙන්ද සිත කරදර නොගනී.

උපමාවක්; තමාට කිසිම සම්බන්ධයක් නැති බොරළු, වැලි, පස්, කොල, කසල යන මේවා හේතු කොටගෙන ඇලී, බැඳී ගැනීමක්, සිත කරදර කර ගැනීමක් පහළ නොවන්නාක් මෙනි. මෙලෙස බලාපොරොත්තු සහිත උත්සුක භාව දුරු වී සංස්කාරයක්, හැකිතාක් මෙනෙහි කරමින් සිටින්නේ නම් සංස්කාරයන් හා බැඳීම හේතුකොටගෙන දුෂ්කරතා, බාධක පහළ නොවන බැවින් එම සංස්කරණ බැහැර කරන ලද්දේම වන්නේය. එම සංස්කායන්ගෙන් මනාසේ මිදුනා වන්නේය. පටිනිස්සගගානුපස්සනා අවස්ථාවෙහි දක්වූ නරක පුත්‍රයා බැහැර කිරීම නම් උපමාව මගින්ද මෙම දක්වන ලද අදහස දැකගත යුතු.

මෙලෙස සංස්කාරයන්ගෙන් මනාකොට මිදීම රහත් භාවයට පත්වූ විටම අංග සම්පූර්ණවේ. විපස්සනා වඩන අවස්ථාවෙහි වනාහි ජළංගුපෙක්ඛා මට්ටමට පත් සංඛාරුපෙක්ඛාවට පත් වූ යෝගී තෙමේද සංස්කාරයන්ගෙන් මනාකොට මිදේ. එබැවින් සංස්කාරයන්ගෙන් මිදීමේ කෘත්‍යය මුඤ්චිතුකම්‍යතා ඤාණය ඉපද වූ පමණින් අංග සම්පූර්ණ නොවේ. එම සංස්කාර කෙරෙහි මනසිකාරය නොයෙදා සිටීමෙන්ද සිද්ධ නොවේ. ඇත්ත වශයෙන්ම වනාහි පහළ විය හැකි සංස්කාරයන් "අනිච්ච, දුක්ඛ, අනත්ත" යැයි ස්ථිර ලෙස, දක්ෂලෙස දැක දැන ගැනීමට නම් එම සංඛාරයන් නැවත නැවතත් ඉදිරිපත් කරගෙන අතරක් නොතබා මෙනෙහි කිරීමෙහිම නියැලිය යුත්තේය. එබැවින්, මුඤ්චිතුකම්‍යතා ඤාණය මගින් උපන්, සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති යෝගී හට නැවත භාවනා කොට බැලීම නම් වූ පටිසංඛා ඤාණය වනාහි කෙරෙන් සංස්කාරයන් මුදා හැරීමේ උපාය වේ. එබැවින්ම මුඤ්චිත කම්‍යතා ඤාණයෙන් එලෙස සංස්කාරයන්ගෙන් මිදෙනු කැමති යෝගී තෙම පහළවන තාක් එම සංස්කාරයක් නැවත වරක් මෙනෙහි කරමින් වටහාගත යුතුවේ. එලෙස මෙනෙහි කොට දැනගන්නා යෝගී හට සංස්කාරයන් කෙරෙහි මෙලෙසට පෙර උපේක්ෂා කළ නොහැකි වූ බව මෙනෙහි කොට දැකගන්නා විපස්සනාව පටිසංඛානුපස්සනාව නම් වේ.

මෙම ඤාණය නොමේරූ අවස්ථාවේ සමහර යොගීන් මෙනෙහිකොට දත යුතු සංස්කාරයන් කෙරෙහි බියවී, අප්‍රිය ජනක වී මුදාහරිනු කැමතිව 'මෙනෙහි කරමින් සිටින විට, බිඳී බිඳී යන නරක ධර්ම නිරන්තරයෙන් හමුවෙමින් සිටින බැවින්, එසේ මෙනෙහි නොකර සිටින විට සංස්කාරයන්ගෙන් මිදිය හැකිවේ යැයි සළකා මෙනෙහි කිරීම නොකර, කටයුත්ත අමතක කර දමයි. මෙලෙස අමතක කරන්නන්ට යෑම නිසා මෙනෙහි නොකරන එම සංස්කාර ධර්ම මත "අනිච්ච දුක්ඛ අනත්ත" යැයි නොදන්නාවූ අවිජජානුසය පහළ වේ. මේ අවිජ්ජා තත්වය, නැවත හැරී බලා මෙනෙහි නොකරන නිසාම ඉඩක් ලබයි. නැවත හැරී බලා මෙනෙහි කරන්නේ නම් ඉඩක් නැතිවන්නේය. පැමිණිය නොහැක්කේය. එබැවින් "අනිචච දුකඛ අනතත"යැයි නොදැකීම නම් වන මේ අවිද්‍යාව නැවත බලා භාවනා කිරීම නම් වන පටිසංඛා ඤාණයට ප්‍රතිවිරුද්ධ පැත්ත  අප්පටි සංඛාන නම් වේ. මෙම අප්පටිසංඛාන නම් වූ මේ අවිද්‍යාව පටිසංඛා ඤාණයෙන් බැහැර කරයි.

***පටිසංඛානුපස්සනාව නිමියේ යැ***

# 18 විවට්ටානුපස්සනාව

විවටටානුපසසනාති සංඛාරුපෙකඛා චෙව අනුලොමඤාව, තදාහිසස චිත්තං ඊසකපොණෙ පදුමපලාසෙ උදක බිංදු විය සබබසමා සංඛාරගතා පතිලීයති පතිකුටති පතිවතතතීති වුතතං, තසමා තාය සංයොගාභිනිවෙසසස පහානං හොති. [වි. ම. 522]

| | | |
|---|---|---|
| විවටටානුපසසනාති | = | විවට්ටානුපස්සනා යන්න වනාහි |
| සංඛාරුපෙකඛා චෙව අනුලොමඤාව | = | සංඛාරුපෙකඛා ඤාණය හා අනුලෝම ඤාණය වේ. |
| හි | = | ඇත්තය. |
| තදා | = | සංඛාරුපෙකඛා හා අනුලොම ඤාණය පහළ වන එම අවස්ථාවෙහි |
| අසස චිතතං | = | එම යෝගාවචරයාගේ සිත |
| ඊසකපොණෙ පදුම පලාසෙ උදක බිංදු විය | = | මදක් නැමුණු පියුම් පතෙහි වැටුණු දියබිඳ මෙන් |
| සබබසමා සංඛාරගතා | = | සියලු සංස්කාරයන් කෙරෙන් |
| පතිලීයති | = | සැඟවී ගනී |
| පති කුටති | = | හැකිළී ගනී |

පති වතතති = පෙරළී එයි

ඉති = මෙසේ

වුතතං = දේශනා කොට ඇත

තසමා = එබැවින්

තාය = එම විට

සංයොගාභිනිවෙයසස පහානං = සංස්කාරයන් කෙරෙහි බැඳී ඇලී වැදගන්නා කෙළෙස් දුරු කිරීම

හොති = සිදුවේ

යථා චිතතං සංඛාරෙ මුඤචිතවා විවටටං නිබබානං පකඛනදති, තථා පවතතනතො සංඛාරුපෙකඛා අනුලොමඤාණ විවටටානුපසසනාති වුතතං නිවිටඨභාවෙන ඔගාළහභාවෙන පවතතා සංයොජනාදිකිලෙසා එව කිලෙසාභිනිවෙසො [මහා ටී. (බු) 2/510]

යථා = යම් සේ

විපසසනාඤාණෙ පවතතමානෙ = විපස්සනා ඤාණ පහළ වේ නම්

චිතතං = ගොත්‍රභූ, මග්ග, ඵල සිත්

සංඛාරෙ මුඤචිතවා = සංස්කාරයන්ගෙන් මිදී

විවටටං නිබබානං = වට්ට නිශ්‍රිත සංස්කාරයන්ගෙන් තොර වූ නිවනට

පකඛනදති = බැස ගනී.

තථා පවතතනතො = මෙසේ පවත්වන බැවින්

සංඛාරුපෙකඛා අනුලෝමඤාණ = සංඛාරුපෙකඛා , අනුලොම ඤාණ

විවට්ටානුපසසනාති = විවටටානුපසසනාව යැයි

වුතතං = කියනු ලැබේ

(විවටටං පකඛනදනාය පකඛනදාපෙනතිවා, අනුපසසනා විවටටානුපසසනා යන මේ වචනාර්ථය පැහැදිලි කරයි.)

නිවිටටනාභාවෙන = සංස්කාරයන්ට වැදගැනීම් වශයෙන්

ඔගාළ්හ භාවෙන = සංස්කාරයන් කෙරෙහි බැසීම් වශයෙන්

| | | |
|---|---|---|
| **පවතතා** | = | පහළ වන්නා වූ |
| **සංයොජනාදි කිලෙසා එව** | = | සංයෝජන ආදි කෙලෙස්ම |
| **කිලෙසභිනිවෙසො** | = | කිලෙසාභිනිවෙස නම් වේ. (සංයොගාභිනිවෙසයම වේ) |

සංඛාරුපෙක්ඛා, අනුලොම යන මේ ඤාණ දෙක විවට්ටානුපස්සනා නම් වේ. මෙම ඤාණ දෙක පහළ වූ අවස්ථාවෙහි අරම්මණ සංඛාර හා විපස්සනා සංඛාරයන්ගේ බිඳීම අරමුණු කොට දැනගනිමින් සිටිය ද, පහළ ඤාණයන්හි මෙන් එම සංස්කාරයන් මත ආශ්වාද කිරීමක් නැත. භය ඤාණය ආදිය මෙන් බියජනක, ජුගුප්සා ජනක, කළකිරෙන, මිදෙනු කැමති බව යන මේවාද පහළ නොවේ. අරමුණ ප්‍රකට වේවායි ප්‍රාර්ථනා කිරීම්, ඒ ගැන ව්‍යාපාර කිරීම්ද නැත. නරක අරමුණු ප්‍රකට වීම නිසා ශෝක ජනක බව, බිය ජනක බවද නැත. ඇත්ත වශයෙන් වනාහි මතුවන ඕනෑම සංස්කාරයන්ගේ බිඳීම ම ඉතා පිරිසිදු ප්‍රසන්න ඤාණයෙන් දැන ගැනීමට අඛණ්ඩ ලෙස සිදුවෙමින් පවතී. එම අවස්ථාවෙහි විපස්සනා සිත එම සංස්කාරයන් කෙරෙන් සැඟවී ගනිමින් මෙන් පවතී. මඳක් නැමුණු නෙළුම් පතකට වැටුණු දිය බිංදු නොපැතිර, තහවුරු නොවී ගිලිහී යන්නා සේ, සිත මෙනෙහි කරමින් සිටින අරමුණ මත තහවුරු නොවී ලත් තැනම පවතී. ඉතා හොඳ අරමුණක් වේවා, ඉතා නරක අරමුණක් වේවා දිගින් දිගට කල්පනා නොකරයි. දැක දැන ගැනීමම දිගට සිදුවෙමින් පවතී. මෙලෙස සංස්කාරයන් කෙරෙන් සැඟවී ගන්නා ස්වභාවයෙන් පවතින බැවින්, බලවත් වූ සංඛාරුපෙක්ඛාව සමඟම අනුලෝම ඤාණය පහළ වී නම් ගෝත්‍රභූ සිත හා මාර්ග සිත සංස්කාර අරමුණු සියල්ල දුරුකරන්නේ, සංස්කාරයන් කෙරෙන් විමුක්ත නිර්වාන අරමුණට වැදගනී. විවට්ට නම්වූ නිවන් අරමුණට ගෝත්‍රභූ සිත, මාර්ග සිත වැදගතහැකි වනු පිණිස මෙලෙස භාවනාකරමින් පවතින බැවින් එම අදාල ඤාණ දෙකට විවට්ටානුපස්සනාව යැයි කියනු ලැබේ. මෙම විවට්ටානුපස්සනාව හොඳ කාම අරමුනු අපේක්ෂාවෙන් පහළ වන කාමරාග සංයොජන, නරක අරමුණු කෙරෙහි පහළ වන පටිඝ සංයෝජන, යන මෙවා මුල් කොට ඇති, බැසගන්නා සූළු කෙළෙස් සියල්ල දුරු කරයි. ඇතුල්වීමට ඉඩක් නොතබයි.

එම නිසා සංඛාරුපෙකඛාවට පත්වී සිටින පුද්ගලයා ඒ ඒ ලෞකික අරමුණු කෙරහි සිත යොදා සළකා බැලුව හොත් එතරම් ආශා කරන බවක්, ආශ්වාද කරන බවක් නැති බව වටහා ගනී. උනන්දුවක් නැතිව, දිගට කල්පනා කිරීමට අකමැති බව පවතී. විපස්සනාව අතහැර කල්ගත කරන්නේ නම් ඒ ඒ ලෞකික අරමුණු මත දිගින් දිගට කල්පනා කිරීමට හැකි බව පත්වන්නේය.

විශේෂ වාද

**පටිසම්භිදා මගග අටඨ කථාහි අනුලොමඤාණ වසෙන උපපනනං ගොත්‍රභූ ඤාණං විවට්ඨානුපසසනා නාම** [ප. අ.1/]

"අනුලොම ඤාණ හේතුවෙන් පහළ වූ ගොත්‍රභූ ඤාණය විවටටානුපසසනා නම් වේ" යැයි තමා කැමති අර්ථය ගෙනහැර දක්වන මෙය යට දක්වූ විසුදධි මාගී විවරණය "පටිසමභිදා මගග පාළිය හා ප්‍රතිවිරුද්ධ වන්නාක්සේ පවතී යැ"යි දක්වා මෙලෙස වූ යුක්තියක් දක්වයි. පටිසම්භිදා මග්ග චරියා කථාහි "අනිච්චානුපස්සනත්ථාය ආවජ්ජන කිරියා අබ්‍යාකත විඤ්ඤාණචරියා -පෙ- පටිසංඛානුපස්සනාය ආවජ්ජන කිරියා අබ්‍යාකතා විඤ්ඤානචරියා, පටිසංඛානුපසසනා ඤාණ චරියා'ති". ඒ ඒ ඤාණයේ ආවජ්ජනය වෙන වෙනම ලැබේ. ඒ ඒ ඤාණයේ ආවජ්ජනය වෙන වෙනම දේශනා කරයි. විවිට්ටානුපස්සනාවෙහි වනාහි ආවජ්ජනය දේශනා නොකර විවට්ටානුපස්සනාව ඤාණචරියාව යැයිම දැක්වේ. ඉදින් සංඛාර උපෙකඛා, අනුලොම ඤාණ යන මේවා විවට්ටානුපස්සනා යැයි නම් කරන්නේ නම්, එවිට එම ඤාණ වලට ආවජ්ජනයන් ඇති බැවින්, එම විවට්ටානුපස්සනාව සඳහාද ආවජ්ජනයක් දේශනා කටයුතු වේ. නමුදු එලෙස විවට්ටානුපස්සනාව සඳහා ආවජ්ජනයක් පාළියෙහි දේශනා වී නැත. යුක්තිය වනාහිඃ අනුලොම වීථියෙහිම ලා පහළ වන බැවින් ගොත්‍රභූ ඤාණයේ ආවජ්ජනයක් වෙනම ම නොමැත. එසේම විවට්ටානුපස්සනාව සඳහා ආවජ්ජනයක් දේශනා නොකෙට ඇති බැවින් "ගොත්‍රභූ ඤාණයම විවට්ටානුපස්සනා නම්වේ" යැයි සළකාගැනීම ගැළපේ යැයි යුක්ති යුක්ත කරමු. සළකා බලා ගැළපෙන්නක්, සුදුස්සක් භාරගන්න.

භාවෙතබ්බා යොගීහි යා - දට්ඨබ්බාව පච්චක්ඛතො
වණ්ණිතාව තා අට්ඨාරස - මහාවිපස්සනා මයා
දුබ්බොධං සුබොධෙතුන - යොගීනං සුත විසුද්ධියා

යා = යම් මහා විපස්සනාවක්
යොගීහි = විපස්සනා යෝගීන්
භාවෙතබ්බා ච = තම සන්තානයන්හි වැඩීම කළ යුතුවෙත්
පච්චක්ඛතො දට්ඨබ්බාච = ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දැකගත යුතුවෙත්
අට්ඨාරස = දහ අටක් වන්නා වූ
තා = එම මහා විපස්සනාවන් (වණ්ණිතා හා බැඳේ
මයා = ම’විසින්
දුබ්බොධං සුබොධෙතුන = දුර්බොධ අර්ථ ඇති ස්ථාන සුබොධ කොට

(විලුත්තනිද්දිට්ඨ, සුබොධ + නාම ධාතු + ණෙ ප්‍රත්‍යය + තුන ප්‍රත්‍යයයන් මගින් සුබොධෙතුන යැයි සිද්ධයි)

යොගීනං සුත විසුද්ධියා = විපස්සනා යොගී පුද්ගලයන්ගේ සුතමය ඤාණ පිරිසිදු වීම සඳහා
වණ්ණිතා = වර්ණනා කරන ලදි

*විවට්ටානුපස්සනාව නිමියේ යැ.*

# නිගමන ගාථා

1.නගරෙ මොලම්‍යයිං නාමෙ - මණ්ඩලා වල පාදකෙ
ගිඤ්ජකාවාස ආරාමං - යෙ ථෙරො චිර මාවසී

| | | |
|---|---|---|
| යෙ ථෙරො | = | <u>විපස්සනා නය පකරණය</u> නම් වූ මෙම ග්‍රන්ථය කළ සද්ද නීති- ඤාණ-ධිති සම්පන්න මහා තෙරුන් |
| මෞල ම්‍යයසිං නාමෙ | = | මොලම්‍යයින් නම් වූ |
| නගරේ | = | නගරයෙහි |
| මණ්ඩලාවල පාදකෙ | = | ටොං වෙයිං නම් වූ (මණ්ඩලාකාර) කඳු පාමුල |
| සණ්ඨිතං | = | මනාකොට පිහිටියා වූ |
| ගිඤ්ජකාවාස ආරමං | = | ගිඤ්ජකාවාස නම් වූ උළු මුවා සේනාසනය |
| වා | = | එම සේනාසනයෙහි |
| චිරං | = | බුරුම වර්ෂ 1291 යේ සිට 1303 දක්වා (වර්ෂ දොළහක) කාලයක් |
| ආවාසි | = | ග්‍රන්ථ- විපස්සනා යන ධුර දෙකෙහි සිත අලවා වාසය කළ සේක |
| 2. පුරනතු යං ජය ඨානං | = | අයය ඔෘං ජෙයය රාජිනො |
| තසස පච්ඡිම භාගෙ යො | = | ආවසො නිගමො සතං |
| තු | = | මෙම ග්‍රන්ථය කරන අවස්ථාවේ වාසස්ථානය කළ ආවාසය |
| අයය ඖෘං ජෙයය රාජිනො | = | ම්‍යන්මා රාජ වංශයෙහි ඉතිහාසගත ඖෘං ජෙය්‍යය රජ යන නමින් ප්‍රකට වූ අලෞං මිං මයාගේ |
| ජය ඨානං | = | සතුරු බල, මුළු සෙනහ බල, බිඳ එලවා හැර ජය ටැඹ පිහිටවූ තැන |
| යං පුරං | = | 'ෂෙව බු' යැයි කියන එම පුරයක් |

| | | |
|---|---|---|
| අත්ථි | = | ඇත්තේය. |
| තස්ස | = | එම ඍෂි බූ නගරයේ |
| පච්ඡිම භාගෙ | = | පශ්චිම දිසාවේ සැතපුම් හතක් පමණ ඈත |
| සතං - සතතානං | = | සද්ධා - සීල ආදී ගුණ අතින් ගුණ පිඬුවක් වැනි වූ සත්පුරුෂයාගේ |
| ආවාසො | = | සිත් ගන්නා සුළු, නිසසල, අනය දෙන්නා වූ සතුටු දනවමින් විසිය හැකි |
| යො නිගමො | = | සෙයිකුන් ග්‍රාමය නමින් හැඳින් වූ ළග ඈත බහුල ලෙස ප්‍රකට වූ නගරයක් වැනි වූ යම් නිගමයක් ඇත්තේය. |

(මෙම ග්‍රාමයේ මෙම ග්‍රන්ථය කළ මහා ථෙර නමගේ පියතුමාං වන ඌ. කාතො හා මවුතුමිය දො - මඋයත දෙපලට 12 මේ බුරුම වර්ෂහි නිකිනි අධිමාසයේ සාවන අධිමාසා අම කියවකලත් තිථිය ලත් ක්‍රිස්තු වර්‍ෂ 1904 ජුලි 27 වැනි දින පාන්දර 3.00ට පමණ මෙලොව එළිය දිටීය)

3. මහාභෙරි විහාරස්සම්ං - එතස්මා පච්ඡිමුත්තරෙ
සාලදය මහාථූප - වරස්සාපි උපනතිකෙ

4. වසනෙතා සොභනො නාම - වී සවසෙසා සතෙසකෙ
උපාසකෙහි සද්ධම්ම රත විතෙතානි විතෙතහි යාවිතො

5 හිතතාය නිතෙසිනො - බුද්ධියා සාසනස්සච
විපස්සනා නයං නමා යං ගනථං කතුමාරභි

| | | |
|---|---|---|
| එතස්මා | = | මේ සෙයි බුන් ගමෙන් |
| පච්ඡිමුත්තරෙ දියා භාගෙ | = | දුනු හාරසියයක් පමණ ඈශින් වයඹ දෙසින |
| සාලදාස මහාථූපවරස්සාපි | = | සාලවනය නම් මහා ස්ථූපයට |
| උපසන්තිකෙ | = | දක්ෂිත දිසාවට එතරම් ඈත නොවූ ආසන්න ස්ථානයක |
| සනධීතෙ | = | මනාකොට පිහිටි |

| | | |
|---|---|---|
| මහාභෙරි විහාරස්මිං | = | මහා බෙරය විහාරයෙහි |
| වසනෙතා | = | වැඩ වාසය කරන |
| වීස වසෙසා | = | උප සම්පදාවෙන් විසිවස් පිරුණු මේ මහා ථෙර 1278 බුරුම වර්ෂයේ පොසොන් මාසයේ හි සාමණේර භූමියට පත්වූසේක. 1285 වර්ෂයෙන් ඉල්මස් පසලොස්වක පසුවී දින 05කින් ගරු උපසම්පදාව ලැබූසේක.1305 වන විට උපසමපදාවෙන් විසිවස් සම්පූර්ණවී තිබුණි. |
| තතෙ සකො | = | පරම්පරාගත, සම්ප්‍රදායානුකුල ක්‍රමයෙන් ම සතුටු නොවී, තහවුරු පරියත්ති දැනීම අගය කරමින් හරි ක්‍රමය සොයමින් |
| වා | = | මතුපිට යාන්තම් දැනුම පිටුදැක සම්ප්‍රදයානුකුල හනමිටි බැහැරකොට, තත්ත්වාකාරයම අගය කරමින් |
| සොභන නාම | = | සොභන නාම ධාරී |
| සො ථෙරො | = | එම මහා ථෙර (ආරභී හා බැඳේ) |
| සද්ධම්මරත චිතෙතහි | = | පරියත්ති, පටිපත්ති, ප්‍රතිවේධ යන සත් ධර්මයෙහි බැඳුනු, ඇලුනු සතුටුවන සිත් ඇති |
| උපාසකෙහි | = | ඕකපපන අධිගම යනාදී තහවුරු සද්ධාවෙන් තෙරුවන් කෙරෙහි සරණ සොයන උපාසක |
| හිතෙසීනං | = | හිතෛෂී පුද්ගලයන්ට |
| හිතතථායච | = | මග - ඵල - නිවන් යන අර්තයන් අපේක්ෂාවෙන්ද |
| සාසනසස | = | පරියතති, ප්‍රතිපතති, ප්‍රතිවේධ සීල සමාධි, පඤ්ඤා යන ශාසනයන්ගේ |
| වුද්ධියාච | = | වර්ෂ දෙදහස් පන්සියයක් ඉහත යුගයේ මෙන් ශාසනය සමෘධමත් කිරීමේ අපේක්ෂාවෙන් ද |

යාචිතො = සංක්ෂෙප රුචි, මධ්‍යස්ථ රුචි, විස්තාර රුචි සියලු දෙනාට අවබෝධ වන ලෙසට සවිකාරයන්ගෙන් යුක්තව අංග සම්පූර්ණ ලෙස විපස්සනා ග්‍රන්ථයක් ලිවීමට ආරාධනා ලැබ

විපස්සනා නයං නාම = විපස්සනා භාවනා ගුරුපොත නම් වූ

යං ගන්ථං = යම් ග්‍රන්ථයක්

කාතුං = කිරීමට

ආරභි = ආරම්භ කරන ලදී

5. සො නිබ්බුතෙ සත්ථරි අතික්කන්තෙ වස්සානං චතුබ්බීස සතෙහි පවෂතො සාකෙත පඤ්ඤාවඩ්ඪක තෙර තෙ මායස්ස සම්පුණ්ණ දිනමහි නිට්ඨිතො

සො = එම විපස්සනා භාවනා ගුරුපොත (නිට්ඨිතො හා බැඳේ)

සත්ථරි = දේව, මනුෂ්‍ය, බ්‍රහ්ම සියලු සත්ත්වයන්ගේ වරදින් වළකා, හොඳෙහි යොදවන එකට උතුම් වරදින් වළකා, හොඳෙහි යොදවන එකම උතුම් නියම ගුරුවර වන්නා වූ ශාස්තෘන් වහන්සේ තෙම

නිබ්බුතෙ = මලල රජ දරුවන්ගේ උපවර්තන නම් සාල වනයෙහිදී සියලු දුකෙහි කෙළවර. සියලු නාම රූප ජාතිය උගුළුවා දමා නිවීමට පත්වීම වශයෙන් මුදුන් පත්ව ශූන්‍ය වූ නිවන් පුරට වැදගැනීමෙන් පසු

අතික්කන්ත වස්සානං = වසරින් වසර ගෙවීගිය කාලය (සම්බන්ධ කොට යොදන ලදී)

චතුබ්බීස සතෙහි = වර්ෂ හාරසියයකට

වා = බුද්ධ වර්ෂ 2487 වැනි වර්ෂයෙහි

| | | |
|---|---|---|
| සාකෙත | = | ශාක රාජ වර්ෂ ප්‍රමාණයෙන් ගණන් ගෙන ව්‍යවහාර කරන ශක රාජ වර්ෂයෙන්, බුරුම වර්ෂ ප්‍රමාණයෙන් |
| පඤ්චවාමික තෙරස සතෙ | = | වර්ෂ 1305 ක් වූ |
| වා | = | වර්ෂ 1305ක් වූ |
| මාසසස | = | නවම් මස |
| සමප්‍රණණ දිනමහි | = | පුර පසලොස්වක්දා |
| නිටඨිතො | = | පරිච්ඡෙද හතම නිමාවට පත්විය |

## සැළකිය යුතු

බුදුරජාණන් වහන්සේගේ මහා පරිනිර්වාණයේ පටන් මහා කස්සප මහාථෙර හා අජාසත්ත රජතුමා පිහිටුවන ලද බුද්ධ වර්ෂ 624ක් වන අවස්ථාවේ සුමුන්දරී රජ වර්ෂ 622ක් අහොසිකොට දෙකක් (2) ඉතිරි කළේ යැයි බුරුම රාජාවලියෙහි සඳහන්ව ඇත. ඒ අවස්ථාවෙහි ඉන්දියා රාජ්‍යයේ වයඹ දිග මහත් තෙජවන්ත කණිෂ්ක රජතුමාද නව වර්ෂ ප්‍රමාණයක් ආරම්භ කළේය. එම කණිෂ්ක වර්ෂය එම ඉන්දියාවේ වයඹ දිග වසර හාරසියයක් රජකළ සත රාජ පරම්පරාව භාවිතා කළ බැවින් සක රාජ වර්ෂ යැයි නම්වේ. ඉන්දියාවෙ වර්තමානය තෙක්ම සකාරාජ වර්ෂ ප්‍රමාණය යැයි භාවිතයේ පවතී. එම සකරාජ වර්ෂ සුමුන්දර රජ විසින් පිහිටුවන ලදැයි කියන වර්ෂ ප්‍රමාණය අතර වෙනස දෙවසරකි. තවදුරටත් පේගු නුවර කල්‍යාණි ශිලා ලිපියෙහිද සකරාජෙ යැයි ලියා ඇති වග දැක ගත හැක. එම නිසා සකරාජ යන බුරුම ව්‍යවහාරය එම සක රාජමරුන්ගේ වර්ෂය මත පිහිටා ව්‍යවහාරයට පත්විය එම සකරාජ වර්ෂ සුමුන්දරී වර්ෂ 562 ඇතිවිට " පුබ්බා චො රහත්" යැයිද කියන සිංහරාජ රජ වර්ෂ 560ක් අහෝසි කොට (නිශ්ප්‍රභා කොට) වර්ෂ දෙකක් පිහිටුවන ලදැයි රාජාවලියෙහි දැක්වේ. දැන් බුරුම වර්ෂ 1305 යන්න එම සිංහරාජ රජ විසින් පිහිටුවන ලද වර්ෂ දෙකින් පැවත ආ වර්ෂ ප්‍රමාණය වේ. තමුදු සකරාජ වර්ෂ යන ව්‍යවහාරය අනුව යමින් මෙහි "සාකෙත" යැයි ලියන ලදී. දැන් පවතින 1305 වර්ෂයට සිංහරාජ

විසින් අහොසි කරන ලද වර්‍ෂ 560 එක්කළ විට සත වර්‍ෂ 1865 ලැබේ. එයට සුමුනුදරී විසින් අහොසි කරන ලද 622 එක්කල විට බුද්ධ වර්‍ෂය 2487 ලැබෙන්නේය.

7. යථා වා යං ගතො සිද්ධිං - නනතරායෙන කෙවලී
 තථා කල්‍යාණ සංකප්පා - සි ඣනතං සබ්බජනතුනං

| | | |
|---|---|---|
| ච | = | අපේක්‍ෂාවෙන්, කැමැත්තෙන් |
| අයං | = | විපස්සනා භාවනා ගුරුපොත නම් මේ මහා ග්‍රන්ථය |

(කෙවලං අනවසෙසං වත්තබ්බං එතස්සත්ථී කෙවලී)

| | | |
|---|---|---|
| අනන්තරායෙන | = | අනතුරක් නැතිව |
| සිද්ධිං | = | සිද්ධ වීමට, සමෘධ වීමට |
| ගතො යථා | = | පත්වුනෝ යම්සේද |
| තථා | = | එසේ |
| සබ්බජනතූනං | = | සියලු සත්ත්වයන්ට |
| කල්‍යාණ සංකප්පා | = | තමා අනුන් කවුරුත්, හිංසාවට පත් නොකර සුවපත් කළ හැකි කල්‍යාණ වූ සංකල්පයෝ |
| කෙකවලී | = | සිත්සේ කිවයුත්ත සියල්ල ඉදිරිපත් කොට |
| අනන්තරායෙන | = | අනතුරකින් තොරව |
| සිජ්ඣනතං | = | සම්පූර්‍ණ කරනලද සේක. |

න පඨමාසවා, දුතිය චතුත්ථෙසු රොච, යන සිංහල ආකාර සූත්‍රයට අනුව, සමපාද මුල් පාදයට පසුව ර භණය වැළැක්වීමට අනන්තං විභක්තියෙන් නිමකරන ලදී

8. යාවෙකො ප්‍රානති ලොකසමිං පඤ්ඤුනං මිගමාරහො
 තාවයං දසසයං සුජුං - නයං ලොකස්ස තිට්ඨතනති

| | | |
|---|---|---|
| ලොකසමිං | = | ලෝකයෙහි |
| පඤ්ඤුනං | = | විපස්සනා පඤ්ඤා මග - ඵල පඤ්ඤ යන මේවා |

| | | |
|---|---|---|
| අධිගමාරභො | = | ලැබීමට සුදුසු |
| එකොපි | = | එක් පුද්ගලයෙක් හෝ |
| යාව | = | යම්තාක් කාලයක් |
| අත්ථි | = | ඇත්තේ ද |
| තාව | = | එතාක් |
| අයං ගන්ථො | = | විපස්සනා භාවනා ගුරුපොත නම් මේ ග්‍රන්ථය |
| ලොකස්ස | = | ලෝකයාට |
| සුජුං | = | මනාලෙස ඍජු වූ |
| නයං | = | විපස්සනා භාවනා නය ක්‍රමය |
| දස්සයං -දස්සයන්තො | = | හිරු සඳුමෙන් ප්‍රකට කොට |
| තිට්ඨතං, තිට්ඨතු | = | විනාශ නොවී පිහිටා වා |
| ඉති | = | නිමියේය. |

*විපස්සනා නය භාවනා ගුරුපොත නිමියේ යැ.*

*විපස්සනා නය භාවනා ගුරු පොත*

# ශුද්ධි පත්‍රය

| පිටු අංකය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| i | 23 | ඉසිළනු | උසුලනු |
| iv | 29 | ශාසන ලැති | ශාසක ලැදි |
| 01 | 17 | පරිචෙඡදයේ ලා | පරිච්ඡේදයේ ලා |
| 01 | 18 | ටිකා | ටීකා |
| 03 | 19 | මාධ්‍යම | මධ්‍යම |
| 20 | 14 | සතුරකු අවතාරයක් | සතුරකු හෝ අවතාරයක් |
| 21 | 8 | තිරණය කිරිම | තීරණය කිරීම |
| 21 | 19 | පටිසන්ධිභයනති | පටිසන්ධි භයනති |
| 22 | 14 | ඇත්තාක | ඇත්තාක් |
| 23 | 27 | සාන්ත | ශාන්ත |
| 24 | 07 | දැනගන්න | දැනගන්නා |
| 26 | 01 | කළ | කල |
| 26 | 22 | කාලෙයහි | කාලයෙහි |
| 26 | 27 | කළ කිරවන | කලකිරවන |
| 32 | 07 | මිදෙනු | මීදෙනු |
| 42 | 18 | නොහැක | නොහැකි |
| 43 | 07 | විදිය | වීදිය |
| 44 | 03 | අභාණහ | අභිණහ |
| 47 | 19 | දිවිකෝටික | ද්විකෝටික |
| 59 | 03 | යැය | යැයි |
| 61 | 04 | සාසනවල | ශාසනවල |
| 61 | 21 | මුසාවතුකාම්‍යතා | මුසාවිතුකම්‍යතා |
| 61 | 27 | මුචිතුකම්‍යතා | මුසාවිතුකම්‍යතා |
| 83 | 02 | උපමාසාධක | උපමාන සාධක |
| 92 | 09 | ඛන්ධාතං | ඛන්ධානං |
| 93 | 27 | නිබ්බාතනති | නිබ්බානයති |
| 94 | 22 | ඛන්ධාතං | ඛන්ධානං |
| 95 | 01 | ඛනතතිං | ඛන්තිං |
| 95 | 14 | නුලොමිකං | අනුලොමිකං |
| 95 | 25 | පරමතත | පරමත්තං |
| 99 | 14 | දැන ගැනිම | දැනගැනිම |
| 105 | 10 | ධම්මාපි-ප | ධම්මාපි- පෙ |
| 112 | 23 | පුගගලසස | පුග්ගලස්ස |

| පිටු අංකය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 114 | 09 | සුභයැය | සුභයැයි |
| 120 | 10 | ගගංණෙන | ගහංණෙන |
| 121 | 07 | අදාළ | අත්හරින්න |
| 121 | 08 | මගින | මගින් |
| 121 | 15 | සද්ධා සීල | ශ්‍රද්ධා ශීල |
| 123 | 08 | බුද්ධෙස අවෙච්චපසාදෙන | බුද්ධෙ අවෙච්චප්පසාදෙන |
| 123 | 11 | අවෙජාදෙන | අවෙච්චප්පසාදෙන |
| 123 | 16 | සංසා | සංඝෙසා |
| 124 | 04 | දි-සං-නි 52/164 | දී.නි 2/146, |
| 125 | 20 | සීල | ශීල |
| 126 | 01 | නිර්වානයට | නිර්වාණයට |
| 126 | 02 | සීල - සික්‍ෂා | ශීල - ශික්‍ෂා |
| 126 | 28 | ශක්තියකත් | ශක්තියකින් |
| 128 | 25 | පිළිපත් | පිළිපන් |
| 130 | 18 | සීලයෙන් | ශීලයෙන් |
| 130 | 21 | සීලය | ශීලය |
| 130 | 23 | සික්‍ෂාපදයන් | ශික්‍ෂාපදයන් |
| 130 | 26 | සික්‍ෂාපද | ශික්‍ෂාපද |
| 130 | 28 | සික්‍ෂාපද | ශික්‍ෂාපද |
| 130 | 32 | සීලයක් | ශීලයක් |
| 131 | 04 | නොගත | නොගත් |
| 131 | 12 | සීලය ද | ශීලය ද |
| 131 | 16 | සීල | ශීල |
| 131 | 17 | සීලයෙන් | ශීලයෙන් |
| 134 | 27 | සීලය | ශීලය |
| 135 | 19 | ලගට | ළඟට |
| 136 | 01 | ලගට | ළඟට |
| 136 | 04 | සීල | ශීල |
| 136 | 10 | සීල | ශීල |
| 136 | 21 | තමාට | තමා ම |
| 145 | 08 | සතනකබනතු | සතනකබනතු |
| 153 | 05 | දිට්යා | දිට්ඨියා |
| 153 | 06 | පුථුජ්ජනෙහ | පුථුජ්ජනෙහි |
| 154 | 16 | ලග හෝ | ළඟ හෝ |
| 154 | 17 | ලග හෝ | ළඟ හෝ |
| 154 | 19 | ලදරු | ළදරු |
| 154 | 19 | ගින | ගිණි |
| 155 | 23 | පුථුජ්ජනෙහ | පුථුජ්ජනෙහි |
| 156 | 07 | සීල | ශීල |

| පිටු අංකය | පේළිය | වරද | නිවරද |
|---|---|---|---|
| 156 | 25 | පුථුජ්ජනෙහ | පුථුජ්ජනෙහි |
| 158 | 16 | ප්‍රාත්‍යවේක්ෂා | ප්‍රත්‍යවේක්ෂා |
| 168 | 03 | සබබූපදධි | සබබූපධි |
| 169 | 06 වෙනි පේළියේ කෙළවරට | | "නාසඤ්ඤායතන" යන්න ඇතුළත් කරන්න. |
| 183 | 06 | නකඛනතං | නිකඛනතං |
| 184 | 12 | පමාණං ව | පමාණං වා |
| 189 | 24 | නො වදරන්නෙමි | නො වදරමි |
| 189 | 26 | නො වදරන්නෙමි | නො වදරමි |
| 190 | 02 | නො වදරන්නෙමි | නො වදරමි |
| 209 | 02 | නිරුද්ධ වේ | විරංජනය වේ |
| 240 | 20 | පරච්ඡේදයේ | පරිච්ඡේදයේ |
| 241 | 02 | පරිගගහහෙතවා | පරිගගහෙතවා |
| 241 | 18 | සනතකියා | සනතතියා |
| 242 | 08 | උගඝටිතාය | උගඝටිතාය |
| 242 | 09 | උපටඨහනති | උපටඨහනති |
| 245 | 05 | මේ | වේ |
| 260 | 08 | නොවනු | නොවූනු |
| 260 | 27 | විචිකිච්ඡානුසයෙයාවා | විචිකිච්ඡානුසයොව |
| 262 | 01 | අනුසයොව | අනුසයද |
| 263 | 06 | යමහි | යමහි |
| 266 | 18 | පහළ වී | පහළ වූ |
| 266 | 22 | -එම- | -එම- |
| 273 | 17 | හැක්කොසේ | හැක්කාසේ |
| 288 | 19 | සනතති | සනතති |
| 288 | 22 | -එම- | -එම- |
| 297 | 07 | සිතාගත්තා | සිතාගන්නා |
| 324 | 16 | වැදගනීමට | වැදගැනීමට |
| 324 | 20 | -එම- | -එම- |
| 324 | 24 | -එම- | -එම- |
| 333 | 15 | ඛයානුසෙසනාති | ඛයානුපසසනාති |
| 369 | 23 | මූදූ හැරීමේ | මූද හැරීමේ |
| 372 | 06 | සංයොගාභිනිවෙයසස | සංයොගාභිනිවෙසසස |
| 373 | 06 | අරමමණ | ආරමමණ |
| 374 | 26 | නොකෙට | නොකොට |
| 377 | 14 | කියවකලත් | තියවකලත් |
| 380 | 17 | සකාරාජ | සකරාජ |
| 380 | 24 | නිශ්ප්‍රභා | නිශ්ප්‍රභ |

සැ. යු

මෙහි මුල් බුරුම පොතේ පරිච්ඡෙද අංක 6හි මුල් කොටස මීට කලින් අප විසින් පළ කරන ලද සිංහල ග්‍රන්ථයේ පිටු අංක 53 හි සිට 200 දක්වා පළකර ඇත. එහි ඉතිරි කොටසමෙම ග්‍රන්ථයට ඇතුළත්කර පිටු අංක 1 සිට ඉදිරියට දක්වා ඇත.



## අති පූජ්‍ය මහා සී සයාඩෝ හිමිපාණන්ගේ විදර්ශනා භාවනා ක්‍රමය

සසර දුකින් මිදී නිවන් පසක් කරගැනීමේ මග සීල, සමාධි, ප්‍රඥා වැඩීමයි. සීලයෙහි පිහිටා සමාධියෙන් සන්සුන් කරගත් සිත ප්‍රඥාව වැඩීමෙන් නිවන් කරා යොමු කරන්නේ විදර්ශනා භාවනාවෙනි.

අනුබුදු මිහිඳු හිමියන්ගේ සමයෙහි සිට මෙරට දියුණුව පැවති මෙම විදර්ශනා භාවනා ක්‍රමය, ශාසනික පරිහාණියත් සමග අපරටින් නැතිවී ගියත්, ශ්‍රී ලංකාවෙන් බුරුමයට බුදුසමය ගෙන ගිය අවදියේ සටම එරට නොනැසී පැවතුණි.

අද බුරුම රට (මියන්මාරයෙහි) එම භාවනා ක්‍රමය පිළිබඳ ප්‍රසිද්ධව සිටින කම්මට්ඨානාචාරීන් වහන්සේලා අතර මහා සී සයාඩෝ මාහිමිපාණන් සුවිශේෂ වෙති. උන්වහන්සේ බුරුම රට ආරණ්‍යවාසී අභිඥාලාභි රහත් පරපුරෙහි විසූ ශ්‍රේෂ්ඨ කර්මස්ථානාචාරයන් වහන්සේ නමකි.

බුරුම රට පැවති හයවැනි ධර්ම සංඝායනාවේ පඤ්හ - පුච්ඡක (ප්‍රශ්න ඇසීමේ) ස්ථානාන්තරය දැරූ මහා සී නායක මාහිමිපාණන් වහන්සේ සම්භාවනීය ග්‍රන්ථ කීපයක කර්තෘ වරයාණෝය.

මහා සී මාහිමියන් වහන්සේ විසින් පුහුණු කරවනු ලබන සතිපට්ඨාන භාවනා ක්‍රමය බුරුමය, සියමය, ශ්‍රී ලංකාව,ඉන්දියාව, කාම්බෝජය යන රටවල පැතිරී ඇත.

ශ්‍රී ලංකාවේ කඳුබොඩ විපස්සනා භාවනා මධ්‍යස්ථානය ඇතුළු භාවනා මධ්‍යස්ථාන තිහක පමණ එම භාවනා ක්‍රමය ප්‍රගුණ කරවති. මීතිරිගල නිස්සරණ වනයසෙනසුනෙහි අතිපූජ්‍ය උඩඊරියගම ධම්මජීව ස්වාමීන්වහන්සේ ද මෙම භාවනා ක්‍රමය බුරුම රටෙහි දී පුහුණු වී ඒ අනුව කමටහන් දෙනු ලබති. උන්වහන්සේ අති පූජ්‍ය මහා සී සයාඩෝ මාහිමි පාණන්ගේ "විපස්සනා නයප්පකරණය" නම් ග්‍රන්ථය මහා-සී විපස්සනා භාවනා ක්‍රමය යනුවෙන් හෙළබසට නගා මෙසේ ඉදිරිපත් කර ඇත.

Printed in Sri Lanka by Lithira Printing Industries
lithira2008@yahoo.com

මහා-සී විපස්සනා භාවනා ක්‍රමය දෙවන භාගය - දෙවන කොටස (පරිච්ඡේද 6 සහ 7)